# මජ්ඣිම නිකාය අටුවාව
# උපරිපණ්ණාසකය

**ඒ භාග්‍යවත්, අරහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා !**

## 1.4.1

**එවමෙමෙසුතං** මා විසින් දේවදහ සූත්‍රය මෙසේ අසන ලදී. එහි **දෙවදහං නාමාති** දේව යන්න රජුන්ට කියත්. ප්‍රාසාදයෙන් යුත් මනා ආරක්ෂා සංවිධාන ඇති ශාක්‍ය රජුන්ට මඟුල් පොකුණෙක් විය. එය රජුන්ට අයත් හෙයින් දේවදහ යන නාමයෙන් ප්‍රසිද්ධ වූයේය. ඒනිසා ඒ නියම් ගමට ද දේවදහ යන නාමය ලැබිණ. බුදුරදුන් ඒ නියම් ගම් ඇසුරුකොටගෙන ලුම්බිණි වනෝද්‍යානයෙහි වැඩ වාසය කරන සේක. **සබ්බංතංපුබ්බෙකතහෙතූති** පෙර කරන ලද කර්මයන්ගේ හේතුවයි. මේ කර්ම වේදනාව ද ක්‍රියා වේදනාව ද ප්‍රතික්ෂේප කොට එකම විපාක වේදනාව ම පිළිගනිත් යැයි දක්වත්.

**එවංවාදි භික්ඛවෙ නිගණ්ඨාති** මෙයින් මුලින් අනියමින් කියන ලද දෙය නියම ලෙස දක්වයි. අභුවා මෙව මයන්ති, අකරාමෙව මයන්ති යන මෙය බුදුරදුන් ඔවුන් නොදන්නා බව දැනගෙන ම හුදෙක් දොස් දැක්වීම කැමතිව විචාරති. යමෙක අපි වූයෙමුයි නොදනිත් ද ඔවුහු කර්මයාගේ

කළ බව හෝ නොකළ බව කෙසේනම් දැන ගනිත් ද? විචාරීමෙහි ද මේ ක්‍රමයයි. **එවංසන්තෙති** චූලදුක්ඛක්ඛන්ධ සූත්‍රයෙහි මහා නිගණ්ඨනාථගේ වචනය ඇති කල්හි යන අර්ථයයි. මෙහි වනාහි මෙතෙක් තොපගේ නොදන්නා බව ඇති කල්හි යන අර්ථයයි. **න කල්ලන්ති** සුදුසු නොවේ. **ගාළ්හුපලෙපනෙනාති** බහුල වශයෙන් ආලේප කිරීමෙන් නැවත නැවත විස රැඳවීමෙන් නුසුදුසු විදියට ගැල්වීමක් නොකළා මෙන් **එසනියා** නිඵසනින් පරීක්ෂණ පිණිස ගන්නා ඉරටුවකින් යටත් පිරිසෙන් රෙදි වැටියකින් **එසෙය්‍යාති** ගැඹුරු හෝ නොගැඹුරුදැයි විමසන්නේය. **අගදඞ්ගාරන්ති** දවන ලද අරළුවල හෝ නෙල්ලිවල හෝ සුණු. **ඔදහෙය්‍යාති** බහාලන්නේ ය. **අරොගොති** මුලින් මාගන්ධිය සූත්‍රයෙහි කියන ලදී. **එවමෙවඛොති** මෙහි මේ උපමා සංසන්දනයයි. හුලින් විද්දහුට වැදුණු කාලයෙහි වේදනාව දැනෙන කාලය මෙන් මොවුන්ට අපි පූර්වයෙහි වූයෙමුයි හෝ නොවූයෙමුයි හෝ මෙබඳු පාපයක් කළෙමුයි හෝ නොකළෙමුයි හෝ දන්නා කාලය වන්නේ ය. වන මුඛය කසන කාලයෙහි වේදනාව ප්‍රකට වන්නාක් මෙති. අපගේ දුක් මෙපමණක් නිර්ජීර්ණයය. මෙපමණක් නිර්ජීර්ණ වූ විට සියළුම දුක් නිර්ජීර්ණ වන්නේ ය. සුද්ධාන්තයෙහි පිහිටියේ යැයි දන්නා කාලය ඇති වන්නේ ය. පසුව පහසුබව දන්නා කාලය මෙන් මෙලොව අකුසල ධර්මයන්ගේ ප්‍රහීනයන් කුසල ධර්මයන්ගේ සංසිඳීමත් දන්නා කාලය වන්නේ ය.

මෙහි මෙසේ එක් උපමාවකින් අර්ථ තුනක් ද උපමා හතරකින් එක් අර්ථයක් ද දක්වන ලදී. මොවුහු වනාහි එයින් එකක්වත් නොදනිත්. ඊල වැරදිව ගිය කල්හි නොවිද්දේ ම විදින ලද්දේය. **මයාති** පසමිතුරාගේ වචන ප්‍රමාණයෙන් ම විදින ලද්දෙමියි සිත් උපදවා දුකට පත් පුරුෂයෙකු මෙන් හුදෙක් මහා නිගණ්ඨයාගේ වචන ප්‍රමාණයෙන් මේ සියල්ල අදහන්නාහු මෙසේ හී උපමාවෙන් බුදුරදුන් විසින් නිග්‍රහ කරන ලද්දාහු මඟහරින්නට නොහැක්කේ යම්සේ ද දුබල සුනඛයෙක් මුවා නැගිටුවා ස්වාමියාගේ සමීපයට පමුණුවා තමා පසු බසී. මෙසේ මහා නිගණ්ඨයාගේ මතවාද ප්‍රතික්ෂේප කරමින් ඇවත්ති නිගණ්ඨ තෙමේ යනාදිය කීහ.

ඉක්බිතිව බුදුරදහු ආචාර්යයන් ඇතුළු ඔවුනට නිග්‍රහ කරන්නාහු **පඤ්චඛො ඉමෙති** යනාදිය කීහ. **තත්‍රායස්මන්තානන්ති** ඒ පංච ධර්මයන් කෙරෙහි ආයුෂ්මතුන්ගේ **කා අතීතංසෙ සත්ථරි සද්ධාති** අතීතය ගැන වාදයන්හි ශාස්තෘන් වහන්සේ ශ්‍රද්ධාව කවරී ද? අතීතය ගැන වාදය අදහන්නා වූ තොපගේ මහා නිගණ්ඨයාගේ ශ්‍රද්ධාව කෙබඳු ද? සිදු වූ

දෙයකින් සිදුනොවූ විපාකයෝ වෙත් ද? සිදුනොවූ දෙයකින් සිදුවූ විපාකයෝ වෙත්දැයි අසයි. සෙසු පදයන්හි ද මේ ක්‍රමයයි.

**සහධම්මිකනති** හේතු සහිතව කරුණු සහිතව **වාදපටිහාරනති** ආපසු හැරී එන වාදය. මෙපමණකින් ඔවුන්ගේ ශ්‍රද්ධාව පහකරමි. මොහු සියල්ලන්ගෙන් දුර්වල යැයි ශ්‍රද්ධාවෙහි සිදීම් වාරය දක්වයි. **අවිජ්ජා අඤ්ඤාණාති** අවිද්‍යාවෙන් නොදනීමේ **සම්මොහාති** මුළාවෙන්. **විපච්චථාති** විපරීත වශයෙන් අදහව්. විපර්යාස වශයෙන් හෝ ගනිව් යන තේරුමයි. **දිට්ඨධම්මවෙදනීයනති** මේ ආත්ම භවයෙහි ම විපාක දෙන්නා වූ **උපක්කමෙනාති** ප්‍රයෝගයෙන් **පධානෙනාති** වීර්යයෙන්. **සම්පාරාය වෙදනීයනති** දෙවන හෝ තෙවන ආත්ම භවයෙහි විපාක දෙන්නා වූ. **සුඛ වෙදනීයනති** ඉෂ්ටාරම්මණයෙහි විපාක දෙන කුසල කර්මයයි. විපරීත දුක් වශයෙන් වින්දයුතු වූ. **පරිපක්කවෙදනීයනති** මුහුකුරා යාමෙන් නිපන් ආත්ම භවයෙහි වින්ද යුතු වූ. දිට්ඨධම්මවෙදනීය යනුද මෙයට නමකි. **අපරිපක්කවෙදනීයනති** මුහුකුරා නොගිය ආත්ම භවයෙහි වින්දයුතු වූ සම්පරායවේදනීය යනු ද මෙයට නමකි.

මෙසේ ඇති කල්හි එහි විශේෂය මෙසේය. ප්‍රථම වියෙහි කළ යම් කර්මයක් වේද එය ප්‍රථම වියෙහි හෝ මධ්‍යම වියෙහි හෝ අවසාන වියෙහි හෝ විපාක දෙයි. මධ්‍යම වියෙහි කරන ලද්ද මධ්‍යම වියෙහි හෝ අවසාන වියෙහි හෝ විපාක දෙයි. අවසාන වියෙහි කරන ලද්ද අවසාන වියෙහි හෙවත් එහිම විපාක දෙයි. එය දිට්ඨධම්මවේදනීය කර්ම නම් වේ. යම් කර්මයක් වනාහි හත් දවසක් ඇතුළත විපාක දෙයි ද එය පරිපක්කවේදනීය කර්ම නම් වේ. එය කුසල් හෝ අකුසල් විය හැකිය. මේ එහි කථා වස්තු වෙත්.

පුණ්ණ නම් දුප්පත් මිනිහෙක් රජගහ නුවර සිටුවරයා ඇසුරු කරමින් වාසය කරයි. එක් දිනක් නගරයෙහි නැකැත් උත්සවය දනුම් දුන් කල්හි සිටුවරයා ඔහුට මෙසේ කීය. ඉදින් අද සීසාන්නේ නම් ගොනුන් දෙදෙනෙක් හා නඟුලක් ලැබෙයි. කිමෙක් ද? නැකැත් ක්‍රීඩා කරන්නේ ද? සී සාන්නේද ඇසීය. ස්වාමීනි. මට නැකැත් ක්‍රීඩා කිරීමෙන් කවර ප්‍රයෝජනයක් ද? සී සාන්නෙමියි කීය. එසේනම් තොප කැමැති ගොන් බානක් ගෙන සී සාන්න යැයි සිටුවරයා කීය. ඔහු සී සාන්නට ගියේය. ඒ දිනයෙහි සැරියුත් තෙරුන් වහන්සේ නිරෝධ සමාපත්තියෙන් නැගී සිට කාහට සංග්‍රහ කරන්නෙමදැයි බලනසේක් පුණ්ණයා දැක පාසිවුරු ගෙන ඔහු සීසාන තැනට වැඩියහ. පුණ්ණ තෙමේ සීසෑම නවතා තෙරුන්ට

දෑහැටි දී මුව දොවන්නට පැන් දුන්නේය. තෙරණුවෝ සිරුර පිළිදැගුම් කොට සීසාන තැනට නුදුරෙහි ආහාර ගෙනඒම බලමින් වැඩසිටියේය. ඉක්බිති ඔහුගේ (පුණ්ණගේ) බිරිඳ බත් ගෙන එනු දැක අතරමඟ තමන් වහන්සේ වැඩ සිටින බව දැක්වූහ. ඈය තම ස්වාමියාට ගෙනෙන ලද බත තෙරුන් වහන්සේගේ පාත්‍රයට දමා නැවත ගොස් වෙනත් බතක් සකසාගෙන දහවල් වී පැමිණියාය. පුණ්ණ තෙමේ එක් වරක් සීසා සිටියේය. බත් ගෙන එන ඇය මෙය කීවාය.

ස්වාමීනි, උදයෙන් ම නුඹට බත් ගෙන ආවෙමි. අතරමඟ දී සැරියුත් තෙරුන් දැක එය උන්වහන්සේට දී වෙනත් බතක් පිසගෙන ඒම නිසා දහවල විය. ස්වාමීනි මට නොකිපෙවයි කීවාය. ප්‍රිය සොඳුර, මා විසින් උදෑසන දෑහැටි දඬු හා මුවදෝනා පැන් තෙරුන්ට දෙන ලදී. උන්වහන්සේ වැළඳූ පිණ්ඩපාත දානය ද අපගේ ය. තෙරුන් වහන්සේ අද කළ ශ්‍රමණ ධර්මයන්ට අප ද කොටස්කාරයෝ වූයෙමු යි සිත පහදාගත්තේය. එක්වර සී සෑ තැන ස්වර්ණමය වූයේය. හෙතෙම අනුභව කොට සී සෑ තැන බලන්නේ දිළිසෙන බව දැක නැගිට කෙවිටෙන් ගසා රත්තරන් බව දැන රජුට නොදන්වා පරිභෝග කිරීම නොහැකි යැයි ගොස් රජුට දැන්වීය. රජ තෙමේ ඒ සියල්ල ගැල්වලින් ගෙන්වා රජ මිදුලෙහි ගොඩ ගස්වා මේ නගරයෙහි කවරෙකු ළඟ මේ තරම් රත්තරන් ඇද්දැයි ඇසීය. කවරෙකුටත් නැතැයි කී කල්හි ඔහුට සිටු තනතුර දුන්නේය. ඔහු පුණ්ණ සිටුවරයා නමින් ප්‍රසිද්ධ විය.

තවත් කථා වස්තුවකි. ඒ රජගහ නුවරෙහි ම කාළවිලංගික නම් දුප්පත් මිනිහෙක් ඇත. ඔහුගේ බිරිඳ ඇඹුල් කොළ කැඳක් පිසුවාය. මහාකාශ්‍යප තෙරුන් වහන්සේ නිරෝධ සමාපත්තියෙන් නැගිට කවරෙකුට සංග්‍රහ කරන්නෙම් දැයි සිතන්නේ කැඳ පිසූ බව දැන ගොස් ගේදොර වැඩසිටියහ. ඇය පාත්‍රය ගෙන කැඳ සියල්ල පාත්‍රයට බෙදා තෙරුන් වහන්සේට දුන්නාය. තෙරුන් වහන්සේ විහාරයට ගොස් ශාස්තෲන් වහන්සේට පිළිගැන්වූහ. ශාස්තෲන් වහන්සේ යැපෙන ප්‍රමාණයක් ගත් සේක. ඉතිරි කැඳ පන්සීයක් භික්ෂූන් වහන්සේලාට ප්‍රමාණවත් විය. කාළවිලංගියා ද ඒ ස්ථානයට පැමිණි හෙයින් කැඳ ස්වල්පයක් ලැබුවේය.

මහාකාශ්‍යප තෙරුන් වහන්සේ බුදුරදුන්ගෙන් කාළවිලංගියාට ලැබෙන විපාක ඇසූහ. මෙයින් හත්වෙනි දවස ඔහුට සිටු තනතුර ලැබෙන්නේ යැයි බුදුරදුන් වදාළහ. කාළවිලංගියා ඒ කථාව අසාගොස් බිරිඳට කිවේය. එකල්හි රජතුමා නගරයෙහි සංචාරය කරන්නේ පිට

නගරයෙහි පණ පිටින් හුල සිටුවා ඇති මිනිහෙක් දැක්කේය. මිනිසා රජු දැක දේවයන් වහන්ස ඔබ වහන්සේ වළඳනු ලබන ආහාරයක් එවනු මැනවයි මහත් බියෙන් කීවේය. රජතුමා එවන්නෙමි යි කියා ආහාරය එළඹි කල්හි මේ ආහාරය ගෙන යෑමට සමර්ථයෙකු දනුවයි කී නගරයෙහි දහසක් බැඳි පියල්ලක් දෙන බවට අඩබෙර ගැස්සූහ. තුන්වන වාරයෙහි කාළවිලංගියාගේ බිරිඳ අඩබෙරය නවතාලූහ. ඇය රජුට දක්වන ලදී. ඇය පුරුෂ වේෂයක් ගෙන පංචායුධයන්ගෙන් සමන්විතව බත් පාත්‍රය ගෙන නගරයෙන් නික්මුණාය. පිටත නගරයෙහි තල් ගසට අධිගෘහිත දීඝතළල නම් යක්ෂයා ගස මුලින් යන්නා වූ ඇය දැක නවතිනු. තී මාගේ ගොදුර යැයි කීය. මම නුඹේ ගොදුර නොවෙමි. මම රාජ දූතයෙක්මි. කොහි යන්නේදැයි ඇසූ කල්හි ජීව සූලයෙහි සිටිනා පුරුෂයාගේ සමීපයට යැයි කී කළ මාගේ ද එක් පණිවිඩයක් ගෙන යන්නට හැකිදැයි ඇසූ කල්හි එසේය, හැකියැයි කීවාය. දීඝතළලයාගේ බිරිඳ වූ සුමන දෙව්රජුගේ දියණිය වූ කාළිය පුතෙකු වැදුවා යැයි දක්වවයි කීය. මේ තල්ගස මුල නිධන් කළ හතක් ඇත. නුඹ ඒවා ගනුවයි කීය. ඇය දීඝතළලායාගේ බිරිඳ වූ සුමන දෙව්රජුගේ දියණිය වූ කාළිය පුතෙකු වැදුවා යැයි මහත් හඬින් කියමින් ගියා. යක්ෂ සමාගමෙහි සිටියා වූ සුමන දිව්‍යරාජයා එය අසා එක් මනුෂ්‍යයෙක් අපට ප්‍රිය පුවතක් ගෙන එයි. ඔහු කැඳවන්න යැයි කීය. පණිවිඩය අසා පැහැදී මේ වෘක්ෂයේ පරිමණ්ඩල ඡායාව පැතිරුණු තැන්වල ඇති නිධන් කළ නුඹට දෙමියි කීය. ජීව සූලයෙහි සිටින පුරුෂයා බත් කා මුව පිස්නා කල ස්ත්‍රියක් බව දැන කෙස් වැටියෙන් ඩැහැගත්තේය. ඇය කඩුවෙන් තමන්ගේ කෙස් වැටිය කපා දමා රජු ළඟට ම ගියා. පුරුෂයා බත් අනුභව කළ බව කෙසේ දැනගත්තේදැයි ඇසූ කල්හි කෙස් වැටිය කැපූ සළකුණින් යැයි කියා රජුට දන්වා ඒ ධනය ගෙන්වා ගත්තේය. මෙතරම් ධනයක් අන් අයෙකුට නැති බව දැන ඒ නගරයෙහි සිටු තනතුර රජු විසින් දෙන ලදී. මල්ලිකා දේවියගේ කථා වස්තුව ද කිව යුතුයි. මේ කියන ලද කථා වස්තු කුසල කර්ම ඒවායි.

නන්ද මාණවක තෙමේ උප්පලවණ්ණා තෙරණිය හා වැරදි ලෙස හැසිරුනේය. ඔහු ඇඳෙන් නැගිට නික්මෙත් ම මහපොළොව බිඳී විවරව මහා නරකයට පිවිසියේය.

නන්ද නම් ගවඝාතකයා අවුරුදු පණහක්ම ගවයන් මැරීම කොට එක් දවසක් කෑමකන වේලාවෙහි මස් නොලබන්නේ ජීවත්වන්නා වූ එක් ගවයෙකුගේ දිව සිඳ අඟුරුවලින් පුළුස්සා කන්නට පටන් ගත්තා

පමණි. ඔහුගේ දිව මුලින්ම සිඳී බත් භාජනයට වැටුනේය. ඔහු මහත් හඬින් විලාප දෙමින් කළුරිය කොට නිරයෙහි උපන්නේය.

නන්ද නම් යක්‍ෂයා තවත් යක්‍ෂයෙකු සමඟ අහසින් යන්නේ කෙස් කැපූ අළුත, රාත්‍රියෙහි වැඩ සිටි සැරියුත් තෙරුන් වහන්සේ දැක හිසට පහර දෙනු කැමැතිව අනෙක් යක්‍ෂයාට දන්වා ඔහු වළක්වද්දීම පහරදී දැවෙමි දැවෙමි දැවෙමියි මහත් හඬින් විලාප දෙමින් ඒ ස්ථානයෙහි ම පොළොවට පිවිස මහ නිරයෙහි උපන්නේය. මේ අකුසල කර්ම වස්තුන්ය.

යටත් පිරිසෙයින් මරණාසන්න කාලයේ දී කරන ලද යම් කර්මයක් වේනම් එය භවන්තරයෙහි දී විපාක දෙයි. සියල්ල පරලොව දී විඳිය යුතුයැයි විචාරය නොකළ යුතුය. කුමක්නිසා විචාරය නොකළ යුතු ද? මෙය ඉහතාත්මයෙහි විඳිය යුතුයැයි දතයුතුයි. ප්‍රථම මාර්ගාදීන්ගේ භවයන්හි යම් ඵල සමාපත්ති විපාකයක් වේ ද? මෙහි උපදවන ගුණ වශයෙන් කියන ලදී. මෙහි කියන ලද මාර්ග කර්මය මුහුකුරාගිය දැනීම ඇත්තේ යැයි දත යුතුය. මාර්ග චේතනාදිය සියල්ලට ම සැහැල්ලුය. ඵල දීම අතුරුව විපාක දෙන බැවිනි.

**බහුවෙදනීයන්ති** සංඥා භවයට පැමිණියා වූ **අප්පවෙදනීයන්ති** අසංඥා භවයට පැමිණියා වූ **වෙදනීයන්ති** විපාක සහිත කර්ම **අවෙදනීයන්ති** විපාක රහිත කර්ම **එවං සන්තෙති** මේ දිට්ඨධම්මවේදනීය කර්මයන්ගේ උක්‍රමයන් සම්පරායවේදනීය කර්මයන්ගේ උපක්‍රමයෙන් භවකාරණයාගේ නොලැබීමක් ඇති කල්හි **අඵලොති** නිශ්ඵල වූ නිරර්ථක වූ මෙතෙකින් නෛර්යානික නොවූ ශාසනයෙහි යෙදීමෙහි නිෂ්ඵලභාවය දක්වා වීර්යයේ ප්‍රධාන ජේදක වාරය දක්වන ලද්දේ යැයි දත යුතුයි.

**සහධම්මිකා වාදානුවාදාති** අනුන් විසින් කියන ලද කරුණින් කරුණු සහිතව නිගණ්ඨකයන්ගේ වාදයෝ ද අනුවාදයෝ ද **ගාරය්හං ඨානං ආගච්ඡන්ති** නුවණැත්තන් විසින් නින්දා කටයුතු කරුණට පැමිණෙත්. වාදයට පැමිණියෝ නින්දා කටයුතු ස්ථානයට ම පැමිණියෝ යනු ද පාඨයකි. අනුන් විසින් කියන ලද කරුණින් කරුණු සහිතව නිගණ්ඨයාගේ වාදයට පැමිණ ඒ වාදය වියළමින්, මලානික කරමින් යන තේරුමයි. **දුක්කතකම්මකාරිනොති** මුල් වූ දස ගර්හ කොට්ඨාශ පැමිණෙත්. **සංගතිභාවහෙතූති** නියතභාවය කාරණාවෝය. **අභිජාතිහෙතූති** සය වැදෑරුම් වූ උප්පත්ති හේතුයි. **පාපසංගතිකාති** පානය හා එක් වූ ඔහුගේ මහා නිගණ්ඨයන්ගේ උපක්‍රමයෙන් ඵල රහිතබව දක්වා දැන් නෛර්යානික

ශාසනයේ උපක්‍රමයන්ගේ සඵලභාවය දක්වන්නට කථඤ්ච භික්ඛවෙති යනාදිය කීය. එහි අනද්ධභූතන්ති යනු දුකින් නොවැඩිය හැකි මනුෂ්‍ය ආත්මභාවය යැයි කියනු ලැබේ. එය නොයෙක් ආකාර වූ දුෂ්කර කාර්යන්ගෙන් යොදන්නේ දුකින් මාර්ගයට පැමිණි බව නම් වේ. යමෙක් සසුනෙහි පැවිදිව වනවාසී රුක්මුල් වාසී වෙත් ද ඔහු අත් බව දුකින් වසන්නෝ වෙත් නිවරදි සසුනෙහි වඩන වීර්යය සම්මා වායාම නම් වේ. තෙරහු මෙසේ කීහ.

යමෙක් ඉසුරු කුලයෙහි උපන්නේ හත් අවුරුදු වියේ දී අලංකාරව පියාගේ ඇකයෙහි සිටින්නේ සිය ගෙදර දන් වළඳා අනුමෝදනාව කරන භික්ෂූන් ත්‍රිවිධ සම්පත්තිය දක්වා සත්‍ය දේශනා කරන කල්හි රහත් බවට පැමිණෙත්. මව්පියන් විසින් පුත පැවිදි වන්න යැයි කී කල්හි එසේය පැවිදි වන්නෙමියි කියා නහවා අලංකාර කොට විහාරයට පමුණුවන ලද්දේ තච පංචකය ඉගෙන කෙස් කපද්දී කරගෙයිදී ම රහත්බවට පැමිණෙයි.

මේ දුකින් තොරව තමා පැමිණි බව නම් වේ. මෙය වනාහි උත්කෘෂ්ඨ සත්කාරයයි. යමෙක් දාසියකගේ කුසින් උපන්නේ යටත් පිරිසෙයින් රිදී මුද්‍රිකාවක් පැළඳ පුවඟු මාත්‍රයකින් ශරීරය ආලේප කොට මොහු පැවිදි කරවනු මැනවියි පමුණුවනු ලද්දේ කරඅග දී හෝ පසුදින හෝ රහත් බවට පැමිණෙයි. මෙය අද්ධභූත නම් වෙයි. තමා දුකින් පැමිණි බවයි. ධාර්මික සුවය නම් සංඝයා කෙරෙන් හෝ ගණ සමූහයා කෙරෙන් හෝ උපන් සිව්පස සැපයයි.

අනධිමුච්ඡිතොති තෘෂ්ණාදි ආශාවන්ගෙන් මුළානොවී ධම්මිකං හි සුඛං න පරිච්චජාමීති එහි ඇලීම නොකොට යුතුයි. සංඝයාගෙන් උපන් සළාක බත හෝ වස්සාවාසිකයක් හෝ මෙපමණක් පරිච්ඡින්දය කොට සංඝයා මැද භික්ෂූන් අතර අනුභව කරන්නේ පත්‍ර අතුරින් පියුමක් මෙන් සීල සමාධි විදර්ශනා මාර්ගඵල වැඩෙයි.

**ඉමස්සාති** වර්තමාන පංචස්ඛන්ධයට මූලික වූ **දුක්ඛනිදානස්සාති** තෘෂ්ණාවයි. එය පංචස්ඛන්ධ දුකට නිධානයයි. **සංඛාරං පදහතොති** සප්‍රයෝග වීර්ය කරන්නාට **විරාගොහොතීති** මාර්ගයෙන් විරාගය වෙයි. මෙය කියන ලද්දේ වෙයි. සංස්කාර ප්‍රදානයෙන් මේ දුක්ඛ නිදානයෙන් නොඇලීම වෙයි. මෙසේ දකියි.

මේ සුඛ ප්‍රතිපදාවෙන් වහා අවබෝධය කියන ලදි. දෙවන වාරයෙන් ඒ ප්‍රයෝග සහිත වීර්යයේ මජ්ඣත්තබව කියන ලදී. **සො යසසඛවසසාති** මෙහි මේ කෙටි තේරුමයි. මේ පුද්ගල තෙමේ යම් දුක්ඛ නිදානයක සංස්කාර ප්‍රදානයෙන් විරාගය වෙයි. එහි සංස්කාර නම් වීර්ය කිරීමයි. මාර්ග ප්‍රදානයෙන් උත්සහ කිරීමයි. යම් දුක්ඛ නිදානයක බැලීම හේතුකොටගෙන උපේක්ෂාව වඩන අයට විරාගය වේ. එහි උපේක්ෂාව වඩන්නේ මාර්ග භාවනාව වඩන්නේ වෙයි. **තසසතීති** ඒ පුද්ගලයාට **පටිබද්ධචිත්තොති** ඡන්ද රාගයෙන් බැඳුණු සිත් ඇත්තේ. **තිබ්බච්ඡන්දොති** බහුල ඡන්දයයි. **තිබ්බාපෙඛොති** මහත් වූ ප්‍රාර්ථනාවයි. **සන්තිට්ඨන්තීති** එකතුව සිටිත්. **සංජග්ඝන්ති** මහත් සේ සිනාසෙමින් **සංහසන්තීති** මඳ සිනහව පවත්වමින්. **එවමෙව ඛො භික්ඛවෙති** මෙහි මේ උපමාව විස්තර කිරීමයි.

එක් මිනිහෙක් ගැහැනියක් කෙරෙහි සිත් බැඳුණේ කෑම ඇඳුම් ආභරණ ආදිය දී ගෙහි වාසය කරයි. ඇය ඒ පුරුෂයා ඉක්මවා වෙනත් පුරුෂයෙකු සේවනය කරයි. මැය ඒකාන්තයෙන් ම මා ඉක්මවා හැසිරෙන්නේ මම සත්කාර නොකරන්නෙමියි සිතා සත්කාර වැඩි කළේය. ඇය බොහෝ සෙයින් වරදෙහි හැසිරුණේය. ඔහු මැයට මෙතරම් සත්කාර කළත් වරදෙහි ම හැසිරුණාය. ගෙයි වසමින් අනතුරක්ම කරන්නේ ය. බැහැර කරන්නෙමියි සිතා තුඹගෙන් වැඩක් නැත. නැවත ගෙදර නොඑන්න යැයි පිරිස මැද දී පවසා අත හැරියේය. ඇය කිසිම උපායකින් ඔහු සමඟ එකතු වන්නට අසමත් වන්නේ නැටුම් නටන්නෙක් සමඟ හැසිරෙයි. එම පුරුෂයා ඇය දැක දොම්නසක් නො උපදී. සොම්නසක් ම උපදී. මේ භික්ෂුව ආත්මය කෙරෙහි ඇලීම ඒ පුරුෂයා ස්ත්‍රිය කෙරෙහි ඇලුණු කාලය මෙන් ය. ආත්මභවය පෝෂණය කරන කාලය කෑම ඇඳීම ආභරණ ආදිය දී ගෙහි විසීම් කාලය මෙනි. ආත්මභාවයාගේ පිත් කිපීම් ආදියෙන් රෝගාබාධවන කාලය ඇය වරදෙහි හැසිරෙන කාලය මෙනි. බෙහෙත් ආදිය නොලැබීමෙන් මෙසේ වේයැයි සළකා බෙහෙත් ආදිය කරන කාලය තමාගෙන් සුදුසු සත්කාර නොලබන හෙයින් මෙසේ වරදෙහි හැසිරේ යැයි සළකා ලාභ සත්කාර දියුණු කිරීම මෙන් ය. පිත් ආදි යමකට බෙහෙත් කළත් තව තවත් වරදෙහි හැසිරුණු කාලය මෙන්ය. මම දැන් තුඹේ දාසයෙක් හෝ වැඩකාරයෙක් හෝ නොවෙමි. කෙළවරක් නැති සසර තුඹට උපස්ථාන කරමින් හැසිරුණෙමි. දැන් තොපගෙන් ඇති එලය කුමක් ද? සිඳෙව බිඳෙවයි සිරුරෙහි අපේක්ෂාවක් නොකොට වීර්යය තර කොට මාර්ග ඥානයෙන් කෙලෙස් උපුටා දැමීම පිරිස් මැද

තිගෙන් වැඩක් නැතැයි ගෙයින් පිට කිරීම මෙන්ය. අර්හත්වයට පත් භික්ෂුවට පිත් කිපීම් ආදි වශයෙන් රෝගී වූ මේ සිරුර බලා දොම්නසක් නො උපදී. ස්කන්ධ පරිහරණ දුකෙන් මිදුනෙමියි සොම්නසක් ම උපදියි. යනු නාට්‍යකරුවන් හා හැසිරෙන ස්ත්‍රිය දැක ඒ පුරුෂයාට දොම්නසක් නොඋපදී. සොම්නසක් උපදී ද එසේමය. මේ උපමාව අනුව සිත් බැඳුණු අයට දොම්නසක් උපදී. සිත් නො බැඳුණු අයට එසේ නොවේ යැයි දැක ස්ත්‍රීන් කෙරෙහි ආලය අත්හරී. සංඛාර අත්හැර උපේක්ෂාව වඩන්නහුගේ දුක්ඛ නිරෝධය ප්‍රහීන වෙයි. අන් අයුරකින් නොවන බව දැන ඒ දෙකම සපයනු ලබන්නේ දුක්ඛ නිධානය දුරු කරයි. මේ අර්ථය පැහැදිලි කරනු වස් පැමිණි බව දත යුතුයි.

යථා සුඛං ඛො මෙ විහරතොති යම් සුවයකින් වාසය කිරීමට කැමැති වෙමි ද එයින් වාසය කරන්නා වූ මට. පදහතස්සාති යවන්නහුට. මෙහිද යමෙකුට සුඛ ප්‍රතිපදාව අසත්ප්‍රාය වේද සියුම් සිවුරු දරන්නහුට සෑම අතින් ම ප්‍රසන්න වූ සෙනසුන්වල වසන්නහුට සිත අවුල් වෙයි. දුක්ඛ ප්‍රතිපදාව සත්ප්‍රාය වූවහු කැඩුණු බිඳුණු විශාල සිවුරු දරන්නහුට සොහොන් ගස්මුල් ආදියෙහි වසන්නහුට සිත එකඟ වෙයි. ඒ සඳහා මෙය කියන ලදී. එවමෙවඛොති මෙහි මේ උපමාව සැසඳීමයි. හීවඩුවෙකු මෙන් ජාති ජරා මරණයන්ගෙන් බිය වූ යෝගියා දත යුතුය. නැවුණ ඇද හී දණ්ඩක් මෙන් නැවුණු ඇද කපටි සිත් දත යුතුයි. ගිනි පෙනෙලි දෙකක් මෙන් කායික හා චෛතසික වීර්ය දත යුතුයි. හීය ඍජු කරන්නහුට කැඳ තෙලක් මෙනි ශ්‍රද්ධාව. ලෝකෝත්තර මාර්ගය නැමෙන දණ්ඩක් මෙනි. හී වඩුවාගේ නුවණ ඇද නැමුණු කපටි සිත හීය කැඳ තෙලින් හා ගිනිපෙනෙලිවල රත්කොට නවන දණ්ඩයෙන් ඍජු කරන්නා මෙන් මේ භික්ෂුවගේ ඇද නැවුණු කපටි සිත ශ්‍රද්ධාවෙන් සතපවා කාය චෛතසික වීර්යයෙන් තවා ලෝකෝත්තර මාර්ගයෙන් ඍජු කරන්නේය. හී වඩුවාගේ මෙසේ ඍජු කරන ලද හී දණ්ඩෙන් සතුරා විද සම්පත් අනුභව කරන්නාක් මෙන් යෝගියාගේ එසේ ඍජු කරන ලද සිතෙන් කෙලෙස් සමූහය විඳ ප්‍රසාද ඇති සෙනසුනෙහි නිරෝධ ඵල නැමති උතුම් ගොඩබිමට පැමිණියහුගේ ඵල සමවත්සුව විඳීම දත යුතුයි.

මෙහි තථාගතයන් වහන්සේ සුඛ ප්‍රතිපදාවෙන් වහා අවබෝධ වන භික්ෂුවගේ ප්‍රතිපදාව ද, දුක්ඛ ප්‍රතිපදාවෙන් වහා අවබෝධ වන භික්ෂුවගේ ප්‍රතිපත්තිය ද කියන ලදී. ඉතිරි දෙකෙහි නොකියන ලදී. එය කීමට මේ දේශනය ඇරඹූහ. මේ දෙක කී කල්හි ඉතිරි ඒවා ද කියන ලද්දේ ම වෙයි. ආගමික ප්‍රතිපදාව නොකියන ලදී. එය කීමට මේ දේශනය

ඇරඹීය. සග ගාමිනී ප්‍රතිපදාව හෝ කියන ලදී. නොදන්වන ලද එක් බුද්ධෝත්පාදයක් දක්වා එක් කුලපුත්‍රයෙකුට නිෂ්ක්‍රමණ දේශනය රහත්බවෙන් පෙරළෙමියි දැන්වීමට මේ දේශනය ඇරඹීය. ඉතිරිය හැමතැන්හි ම ප්‍රකටය.

**දේවදහසූත්‍ර වර්ණනාව නිමි.**

## 1.4.2

**එවමෙමසුතනතිං** පංචත්තය සූත්‍රය මා විසින් මෙසේ අසන ලදී. එහි **එකෙති** සමහරුය. **සමණ බ්‍රාහමණාති** පරිබ්‍රාජක බවට පැමිණි බැවින් ශ්‍රමණයෝය. ජාතියෙන් බමුණෝය. ලෝකයා විසින් මහණ බමුණෝයැයි මෙසේ සම්මත කරන ලදි. අපරාන්තය විශේෂයෙන් කල්පනා කොට ගන්නවුන් අපරාන්ත කප්පික නම් වේ. මෙහි අන්ත නම් ''සක්කා යො බො ආවුසො එකො අන්තොති'' ආදියෙහි මෙන් මෙහි දී කොටස කැමතිවන ලදී. කප්ප නම් තෘෂ්ණා දෘෂ්ටියයි. මෙය කියන ලදී. කප්ප නම් උදාන වශයෙන් තෘෂ්ණා කල්පය, දෘෂ්ටි කල්පය යැයි කල්ප දෙකකි. එහෙයින් තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් නොපැමිණි ස්කන්ධ කොටස කල්පනා කොට සිටියේ අපරාන්ත කල්පය යැයි මෙහි මෙසේ අර්ථය දත යුතුයි. ඔවුන්ගේ මෙසේ අපරාන්තය කල්පනා කොට සිටියවුන්ගේ නැවත නැවත ඉපදීම් වශයෙන් අපරාන්තය අනුව ගිය දෘෂ්ටියම අපරාන්ත දෘෂ්ටිය වේ. ඔවුහු මෙසේ දෘෂ්ටි ඇත්තෝ ඒ අපරාන්තය අරඹයා පැමිණි නිසා අනෙත් ජනයා ද දෘෂ්ටි ගත කරන්නාහු අනෙකවිහිත අධිවුත්ති පද යැයි කියත්. **අනෙකවිහිතානීති** නොයෙක් වැදෑරුම්ය. **අධිවුත්ති පදානීති** නාමපද යි. නොහොත් සිදු වූ අර්ථය මැඩ පවත්වා ස්වභාව වශයෙන් නොගෙන පවතින හෙයින් අධිවෘත්ති දෘෂ්ටිය යයි කියත්. අධිවෘත්තීන්ගේ පද අධිවෘත්ති පදයි. දෘෂ්ටිය ප්‍රකාශ කරන වචනය අර්ථයයි.

**සඤඤීති** සංඥාවෙන් සමන්විතය. **අරොගොති** නිත්‍ය බව, **ඉතෝකෙති** මෙසේ සමහරය යනුයි. මෙයින් සොළොස් සඤඤීවාද කියන ලදහ. **අසඤඤීති** මෙයින් අට වැදෑරුම් අසඤඤී වාදයෝ කියන ලදහ. **නෙවසඤඤී නාසඤඤීති** මෙයින් නෙවසඤඤී නාසඤඤී වාදයෝ අට

දෙන කියන ලදහ. **සතො වා පන සත්තසසාති** මෙයින් උච්ඡේද වාද හත කියන ලදී. එහි සතොති විද්‍යමාන වන්නහුගේය. **උචෙඡදන්ති** නම් සිඳීමයි. **විනාසනති** නොපෙනීමයි. **විභවනති** භවයාගේ පහවීමයි. මේ සියල්ල ඔවුනොවුන්ට පර්යාය වචනයෝය.

**දිට්ඨධම්ම නිබ්බානං වා පනාති** මෙයින් දිට්ඨධම්ම නිබ්බාන වාද පහ කියන ලදි. එහි **දිට්ඨධම්මොති** ප්‍රත්‍යක්ෂ ධර්මය යැයි කියනු ලබයි. ඒ ඒ තැන්හි තබන ලද ආත්මභාවයට මෙය වචනයකි. ප්‍රත්‍යක්ෂයෙහි වූ දිට්ඨධම්ම නිබ්බාන නම්. මේ ආත්මභවයේ දීම දුක් සංසිඳීම යන අර්ථයි. **සන්තංවාති** සංඥා ආදි වශයෙන් තුන් ආකාරයකින් ශාන්තය. **තීණිහොන්තීති** සංඥා ආත්මය ආදි ශාන්ති වශයෙන් එකය. අනිකය. දෙකය යැයි මෙසේ තුනකි. රූපීවාති කරජ රූපයෙන් හෝ කසිණ රූපයෙන් හෝ රූපීය. එහි ලැබුයේ කසිණ රූපය ආත්මය යයි ගනී.

තර්කයෙන් රූප දෙක ගන්නේමය. අරූපී වූ අරූප සමාපත්තිය හෝ නිමිත්ත හෝ හැර සංඥා ස්ඛන්ධය සෙසු අරූපී ධර්මයන් හෝ ආත්මය යයි පණවති. ලාභීහු ද තර්කයෝ ද මෙසේ පණවත්. තුන්වන දෘෂ්ටිය ද මිශ්‍රක ග්‍රහ වශයෙන් පවතී. හතරවැන්න තර්ක ග්‍රහයෙන් ද පවතී. දෙවැනි චතුෂ්කයෙහි පළමු දෘෂ්ටිය සමාපන්නක වාරයෙන් කියන ලදි. දෙවන දෘෂ්ටිය අසමාපන්නක වාරයෙන් ද තුන්වන දෘෂ්ටිය සුප්පමත්තව හෝ සරාවමත්තව හෝ කසිණ පරිකර්ම වශයෙන් ද සිව්වන දෘෂ්ටිය විපුල කසිණ වශයෙන් ද කියන ලදහයි දත යුතුයි. **එතං වා පනෙකෙසං උපාතිවත්තතං සංඥී** යන පදයෙන් කෙටියෙන් කියන ලද සඤ්ඤ සත්තකය ඉක්මවන ලද්දවුන්ගේය යන අර්ථයයි. ඇතැම්හු අට්ඨක යැයි ද ප්‍රකාශ  කරති. ඒ දෙක මතුවෙහි ප්‍රකාශ වෙයි. මේ එහි සංක්ෂේප අර්ථයයි. සමහරු මේ සංඥා හත හෝ අට ඉක්මවන්නට සමත් වෙති. සමහරු අසමත් වෙති. එහි යමෙකුට හැකිවෙත් ද ඔහුම ගත යුතුය. ඔවුන්ගෙන් එක් අයෙක් සංඥාවන් ඉක්මවන්නට සමත් වන්නේද එපරිද්දෙන්ම යම්සේ ගංගාව එතර කරන මනුෂ්‍යයන් අතරෙන් එක් අයෙකු දීර්ඝ වූ ගඟට ගොස් සිටියි. එක් අයෙක් එයින් මතු මහ ගමට ගොස් සිටියි. එපරිද්දෙනි. සමහරු විඤ්ඤාණඤ්චඤ්ඤායතනය අප්‍රමාණ වූ ආනංජය යැයි කියා සිටිති. සමහරු ආකිඤ්චඤ්ඤායතනය යැයිද කියා සිටිති. එහි විඤ්ඤාණඤ්චායතනය පළමුකොට දක්වන්නට සමහරු විඤ්ඤාණ කසිණය යැයි කියන ලදි. පසුව ආකිඤ්චඤ්ඤායතනය කියයි. **තයිදං** ඒ මේ දෘෂ්ටිගතිය ද දෘෂ්ටිප්‍රත්‍යය ද දෘෂ්ටිආරම්මණය ද තථාගතයන්

වහන්සේ දන්නාසේක. මේ හේතුයෙන් මේ නම් දර්ශනයක් ගන්නා ලද්දේයැයි විශිෂ්ඨ ඤාණයෙන් දැනගනියි. දැන් එයම විස්තර කරන්නේ යෙ බො තෙ හොනෙතා යනාදිය කීය. **යා වා පනෙසං සංඥාන** යැයි මෙසේ කියන ලද සංඥානයි. **පරිසුද්ධා** කෙලෙස් රහිත, **පරමා** උතුම්, **අග්ගා** ශ්‍රේෂ්ඨ, **අනුත්තරියා අක්ඛායති** අසදෘශ යැයි කියනු ලැබේ. **යදි රූපසඤ්ඤාණං** මෙයින් රූපාවචර සංඥා සතර කියන ලදි. **යදි අරූපසඤ්ඤාණං** මෙයින් ආකාසානංඤ්චායතන, විඤ්ඤාණඤ්චායතනය සංඥාවන් කියන ලදි. අනෙත් පද දෙකෙන් සමාපන්නවාරය ද අසමාපන්නවාරය ද කියන ලදි. මෙසේ කොටස් වශයෙන් අටකි. අර්ථ වශයෙන් සංඥාවෝ හතක් වෙති. සමාපන්නක වාරය පළමු ජාතියෙහි සංගෘහිතයි.

**තයිදං සංඛතං** ඒ මේ සියල්ල සංඥාගතිය හා දෘෂ්ටිගතිය සමග ප්‍රත්‍යයන්ට පැමිණ කරන ලදි. **ඔළාරිකං** සංඛත හෙයින් ඕළාරිකය. **අත්ථි බො පන සංඛාරානං නිරොධො** සංඛත යැයි කියන ලද මේ සංස්කාරයන්ගේ නිරුද්ධවීම යැයි සංඛ්‍යාවට පැමිණි නිර්වාණයක් නම් ඇත. **අත්ථෙතනති ඉති විදිත්වා** ඒ නිර්වාණය ඇත්තේ යැයි දැන, **තස්ස නිස්සරණ දස්සාවී** ඒ නිස්සරණ දර්ශී සංඛ්‍යාත නිර්වාණය දකීමයි. **තථාගතො තදුපාතිවත්තො** ඒ සංඛතය ඉක්මවීම යන අර්ථයි. **තත්‍ර** ඒ අසංඥීවාද අටෙහි, රූපිං වා යනාදිය සංඥී වාදයෙහි කියන ලද ක්‍රමයෙන් දත යුතුය. යම්හෙයකින් මෙය අසංඥී වාද ද එහෙයින් මෙහි දී දෙවැන්න හා හතරවැන්න නොකියන ලදි. **පටිසඞ්ඛොනති** වළකත්, **සඤ්ඤාරොගො** යනාදියෙහි ආබාධ අර්ථයෙන් රෝග නම්. දෝෂ සහිත බැවින් ගඩු නම්. ඇතුළට වදින හෙයින් උල නම් වෙයි.

**ආගතිං වා ගතිං වා** යනාදියේ ප්‍රතිසන්ධි වශයෙන් ආගතියයි. ගමන් වශයෙන් ගතියයි. චුතවීම වශයෙන් චුතියයි. ඉපදීම් වශයෙන් උත්පත්තියයි. නැවත නැවත ඉපදී අනෙත් අනෙත් භවයන් හා ගැටෙන හෙයින් වෘද්ධියයි. මහත්බවයි. චතුවෝකාර භවයෙන් රූපය හැර විඤ්ඤාණයාගේ පැවැත්ම ඇතිවෙයි. ඉතිරි ස්කන්ධ තුන නැතිව විද්‍යමාන නොවෙයි. මෙම ප්‍රශ්නය පංචවෝකාර වශයෙන් කියන ලදි. පංචවෝකාරයෙහි ස්කන්ධ හතර හැර විඤ්ඤාණයාගේ පැවැත්මක් නැත. විතණ්ඩවාදීහු රූපය හැර යැයි යනාදි කීමෙන් අරූප භවයෙහි රූපය ද අසංඥී භවයෙහි විඤ්ඤාණය ද ඇත. එසේම නිරෝධ සමවතට පිළිපන් අයට යැයි කියති. එයට මෙසේ කිවයුතුයි. ආගතිං යනාදි වචනයෙන් ඒ

විඤ්ඤාණය පක්ෂීහු දෙපා සිව්පා සතුන් මෙන් පැන පැන යාම ද කකුල් වලින් දිවීම ද හරක් අං වැල් ආදිය මෙන් වැඩීමට ද පැමිණෙයි. යම්හෙයකින් භාග්‍යවතුන් වහන්සේ බොහෝ සූත්‍රයන්හි භවත්‍රයක් ගැන දේශනා කරන ලද්දේ ද, අරූප භවයාගේ නොවීමෙන් දෙකක්ම සිද්ධවෙති. එහෙයින් මෙසේ නොකියා පෙර කියන ලද්දම ධාරණය කරගනුව. **තත්‍ර** නේවසංඥීනාසංඥී වාද අට කෙරෙහි, මෙහි ද රූපං වා යනාදියෙහි කියන ලද ක්‍රමයෙන්ම දත යුතුය. **අසඤ්ඤා සම්මොහො** සංඥා රහිත බවයි. මූලාවට පැමිණෙන ස්ථානයයි. යම්කිසිවක් නොදන්නේ නම් එය අසංඥී යැයි කියති. **දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බස්ස සංඛාරමත්තෙන** දැකීමෙන් ඇසීමෙන් ගන්ධරස ස්පර්ශයෙන් දැනගත යුතු දේ දැනගත්තේය යන්න මෙහි විඤ්ඤාතබ්බ නම් වේ. පංචද්වාරයෙහි පැවැති සංඥාමාත්‍රය යනු මෙහි අර්ථයයි. සංඛාරමත්තෙන ඖළාරික සංස්කාරයාගේ පැවතීම යන අර්ථයයි. **එතස්සායතනස්ස** මේ නේවසංඥානාසංඥායතනයාගේ, **උපසම්පදන්ති** ප්‍රතිලාභයයි. **බ්‍යසනං හෙතං** විනාශයන්ගේ නැගිටීම යන අර්ථයි. පංචද්වාරික සංඥා පැවතීම් හෝ ලාමක සංඥා පැවතීම් හෝ නොපැවතීම් කොට එයට පැමිණිය යුතුයි. ඒ පැවැත්මෙන් එයින් නැගිටීම වන්නේයැයි දක්වයි. **සසංඛාරසමාපත්ති පත්තබ්බමක්ඛායති** ලාමක සංස්කාරයාගේ පැවැත්මෙන් පැමිණිය යුතුයැයි නොකියයි. **සංඛාරාවසෙස සමාපත්තිපත්තබ්බං** සංස්කාරයන්ගේ යම් ඉතිරියක් භාවනා වශයෙන් සියළු සියුම්භාවයට පැමිණි සංස්කාරයෝ ඔවුන්ගේ පැවැත්මෙන් මෙයට පැමිණිය යුතුය යන අර්ථයි. මෙබඳු සංස්කාරයන් පැවැති කල්හි මෙයට පැමිණිය යුතුවෙයි. **තයිදං** ඒ මේ සියුම් වූයේ ද සංඛත හෙයින් ඖළාරිකය. **තත්‍ර** උච්ඡේද වාද හතෙහි, **උද්ධං සරා** අනාගතය උද්ධ යැයි කියයි. සසර වාදය සැරිසරන්නේය යන අර්ථයි. **ආසත්තිංයෙව අභිවදන්ති** ඇලීමම කියයි. ආපත්ති කියා ද පාඨයයි. තෘෂ්ණාවම කියන්නේය යන අර්ථයි. **ඉතිපෙච්ච භවිස්සාම** මෙසේ පරලොව ගොස් ක්ෂත්‍රියයෙක් වන්නෙමු. බ්‍රාහ්මණයෙක් වන්නෙමුයි මෙහි ක්‍රමය දත යුතුයි. **වාණිජූපමා මඤ්ඤෙ** වාණිජ උපමාව මෙවන් වාණිජ පටිභාගයෙන් වෙළෙන්දන් සමානයැයි මාහට අවබෝධ වෙයි. **සක්කාය භයා** සක්කාය දෘෂ්ටියට ඇති භයය, භය නොවිය යුතු දෙයට සතරදෙනෙක් භය වෙති. ඒ හතරදෙනා කවුරුද යත්, ගැඩවිල් පණුවා පොළොවේ පස් ඉවරවේය යන භයෙන් පස් නොකයි. කොස්වාලිහිණියා උගේ බරට පොළොව පාත්වේය යන භයෙන් එක පයින් සිටියි. කිරල්පක්ෂියා අහස පාත්වේය යන භයෙන් උඩුකුරුව නිදයි. බ්‍රාහ්මණ ධර්මය රකින්නා ලොව විනාශවේය යන භයෙන් බ්‍රහ්මචර්යාවේ නොහැසිරෙයි. මේ හතරදෙනා භය නොවිය යුතු තැන්හි භය වෙති.

Scanned with CamScanner

මෙසේ සක්කායට භය වෙති. **සක්කාය පරිජ්ගුඡ්ඡා ත්‍රිභූමික** යැයි කියන ලද සක්කායටම නින්දා කරන්නේ, **සාගද්දුලබද්ධො** දණ්ඩක රැහැනක් යවා බඳින ලද සුනඛයාය. **එවමෙව්මෙ** මෙහි දැඩි ස්තම්භයක් මෙන් කීලයක් මෙන් ඒ ත්‍රිභූමික සංඛ්‍යාත සක්කාය දෘෂ්ටිය දත යුතුය. දෘෂ්ටිගතිය සුනඛයා මෙනි. දෘෂ්ටිය දණ්ඩ මෙනි. තෘෂ්ණාව රැහැන මෙනි. බලුදමින් බැඳ ටැඹෙහි හෝ උලෙහි හෝ බඳින ලද සුනඛයාට තම බලයෙන් සිඳ යෑමට නොහැකිව වටේට ගමන් කරන්නාක් මෙන් දෘෂ්ටිගතිකයාට දෘෂ්ටි දණ්ඩෙහි ඇතුල්ව තෘෂ්ණා රැහැනින් බැඳ සක්කායෙහි විශේෂයෙන් බැඳී වටේට දිවීම දත යුතුයි. **ඉමායෙව පඤ්චායතනානි** මේ කාරණා පහයි. මෙසේ මාතෘකා තබන්නවුන් පහක්ම තබන ලදි. නිගමනය කරන්නවුන් පහක්ම නිගමනය කරන ලදි. බෙදන්නවුන් හතරකට බෙදන ලදි. ඉහතාත්මයෙහි නිර්වාණය කොතැනක පිවිසෙත් දැයි ඒකත්ත නානත්ත වශයෙන් පද දෙකෙහි පිවිසෙත් යැයි දත යුතුය. මෙසේ අපරාන්ත කල්පික හතළිස් හතරක් දක්වා දැන් පූර්වාන්ත කල්පික දහඅටක් දක්වන්නට, සන්ති භික්ඛවෙ යනාදිය කීය. එහි අතීත කොටස යැයි කියන ලද පූර්වාන්තය සළකා විශේෂයෙන් ගන්නේ යැයි පුබ්බන්ත කප්පික නම් වෙයි. පූර්වාන්ත කල්පය හෝ මොවුන්ට ඇත්තේයැයි පුබ්බන්ත කප්පික නම්. මෙසේ ඉතිරිය ද පෙර කියන ලද ක්‍රමයෙන් දත යුතුය. **සස්සතො අත්තාච ලොකො** ච රූපාදීන් කෙරෙන් වෙනත් එකක් ආත්මය යැයි ගෙන නිත්‍ය යැයි ස්ථිර යැයි කියති. එහෙයින් කීහ. **රූපං අත්තාචෙව ලොකො ච සස්සතො** ච තමා ද ලෝකය ද පණවත්ය යන විස්තරයි. අසාස්වතාදියෙහි ද මේ ක්‍රමයයි.

මෙහි පළමු වාදයෙන් ශාස්වතවාද හතර ද දෙවන වාදයෙන් උච්ඡේදවාද හත ද කියන ලදි. මොවුන් යට ආවාහු නොවේද? මෙහි කුමක් නිසා නැවත ගන්නා ලද්දේ ද? යට ඒ ඒ තැන දන්නා ලදි. ඒ ඒ තැන්වලම සිඳේ යැයි දැක්වීම පිණිස පැමිණියේය. මෙහි පෙරවිසූ කඳ පිළිවෙළ දත් දෘෂ්ටිගතිකයා අතීතය දකියි. අනාගතය නොදකියි. ඔහුට මෙබඳු සිතක් වෙයි. පූර්වාන්තයෙන් පැමිණියේ තමා මෙහි නැසෙයි. මින්මතු නොයයි. මේ කාරණය දැක්වීම පිණිස ගන්නා ලදි. තුන්වන වාදයෙන් ඒකච්චශාස්වත වාද හතර ද සිව්වන වාදයෙන් අමරාවික්ෂේප වාද හතර ද කියන ලදි. අන්තවාදී හාත්පසින් පිරිසිඳිනා ලද පරිවටුමයයි. නොවැඩුණු කසිණයාගේ ඒ කසිණය ආත්මය යැයි ද ලෝකයා යැයි ද ගෙණ මෙබඳු වෙයි. දෙවන වාරය වඩන ලද කසිණයාගේ වශයෙන් කියන ලදි. තුන්වන වාරය සරස් අතට වඩා උඩ හා යට නොවැඩූ

කසිණයාගේ, සිව්වන වාරය පෙළේ වශයෙන් කීය. අනතුරුව චතුෂ්කයම යට කියන ලද ක්‍රමයමයි. **එකන්ත සුඛී** නිරන්තර සුවයයි. මේ දෘෂ්ටිලාභියාට ජාතිස්සර තර්ක වශයෙන් උපදියි. ලාභීහුගේ පුබ්බේනිවාසානුස්සති ඥානයෙන් ක්‍ෂත්‍රියාදි කුලයක ඒකාන්ත සුවයම තම ජාතිය සිහිකරන අයට මෙබඳු දෘෂ්ටියක් උපදියි. එසේම ජාතිස්සරය සිහිකරන අයට ද වර්තමාන සැපය විඳින අයට අතීතය ආදි ජාති හතක ආත්ම භවය සිහිකරන තාර්කිකයාට සුවයෙන් යුතුව ඒ අතීතයේ ද මම මෙසේ වූයෙමියි තර්කයෙන් උපදියි. **එකන්ත දුක්ඛී** මේ දෘෂ්ටි ලාභියාට නූපදියි. ඔහු ඒකාන්තයෙන්ම මෙහි ධ්‍යාන සුවයෙන් සැප ඇත්තේ වෙයි. මෙහි දුකෙන් ස්පර්ශ කරන ලද ජාතිස්සර නුවණ ඇත්තාට එය උපදියි. තුන්වැන්නෙක් සැප දුක් මිශ්‍ර වූ සියළු දෙනාට උපදියි. එසේ සිව්වැනි දෘෂ්ටි ලාභියාට චතුර්ථධ්‍යාන වශයෙන් ද අදුක්ඛමසුඛයාට පූර්වයෙහි චතුර්ථධ්‍යානයම බඹලොව සිහිකරන ජාතිස්සරයාට වර්තමානයෙහි මධ්‍යස්ථයාට ශ්‍රැතියෙන් මධ්‍යස්ථව සිහිකරන අයට වර්තමානයෙහි ද මධ්‍යස්ථ අයට අතීතයෙහි ද ඔෙසේ වන්නේයැයි තර්කයෙන් ගන්නා අයට ද ඒ දෘෂ්ටිය උපදියි. මෙතෙකින් ශාස්වතවාද හතර ද ඒකච්ච ශාස්වතවාද හතර ද අන්තානන්තික හතර ද අමරාවික්ෂේප හතර ද අධිච්චසමුප්පන්න දෙකදැයි යන දහඅට වැදෑරුම් පුබ්බන්ත කල්පිකයෝ කීහ. දැන් දෘෂ්ටිය උදුරන්නේ **තත්‍ර භික්ඛවෙ** යනාදිය කීය. එහි **පච්චත්තඤ්ඤෙව ඤාණං** ප්‍රත්‍යක්‍ෂ නුවණයි. **පරිසුද්ධං** කෙලෙස් නැති, **පරියොදාතං** බැබලීම් සහිත, සියළු පදයන්ගෙන් විදර්ශනා ඥානයම කියන ලදි. ශ්‍රද්ධාව ආදී ධර්ම පහ බාහිර සමයෙහි වෙයි. විදර්ශනා ඥානය ශාසනයෙහිම වේ. එහි **ඤාණභාගමත්තමෙව පරියොදපෙන්ති** අපි මෙය දනිමු. අපි මෙය දනිමු යි මෙසේ ඒ ඥාන කොටසට බැසීමයි. **උපාදානමක්ඛායති** මේ නුවණ බොරු දැකීමක් නම් නෙමේ. එබැවින් එය ඒ භවයන්ගේ දිට්ඨූපාදානයැයි කියනු ලැබේ යන අර්ථයයි. නැවත ද දැනීම් මාත්‍රයක් ලක්‍ෂණ කොට ඇති බැවින් ඥානභාග මාත්‍රයමය. එසේම ඒ දැකීම් අනුව පවතින බැවින් ද උපාදාන ප්‍රත්‍ය වශයෙන්ම උපාදානමය. **තදුපාතිවත්තො** ඒ දෘෂ්ටිය ඉක්ම වූ, මෙතෙකින් ශාස්වතවාද හතර ද ඒකච්චශාස්වත හතර ද අන්තානන්තික හතර ද අමරාවික්ෂේප හතර ද අධිච්චසමුප්පන්න දෙක ද සංඥීවාද දහසය ද අසංඥීවාද අට ද නේවසංඥීනාසංඥීවාද අට ද උච්ඡේදවාද හත ද දිට්ඨධම්ම නිබ්බානවාද පහදැයි බ්‍රහ්මජාල සූත්‍රයේ ආ දෙසැටක් දෘෂ්ටීහු කියන ලදහ. බ්‍රහ්මජාලයෙහි මේ සූත්‍රය නොකියන ලදි. මෙහි එයට වැඩි අතිරේක සක්කාය දෘෂ්ටියක් ආ හෙයිනි. මෙය කියන ලද කල්හි බ්‍රහ්මජාලයම කියන ලද්දේමය. දැන් මේ දෙසැටක්

සක්කාය දෘෂ්ටීහු උපදින්නේ සක්කාය දෘෂ්ටියම මුල්ව උපදිති. එය දක්වීමට **ඉධ භික්ඛවෙ එකච්චො** යනාදිය කීය. එහි **පටිනිස්සග්ගා** පරිත්‍යාගයෙන්, **කාමසංයොජනානං අනධිට්ඨානා** පංචකාම ගුණ තෘෂ්ණාවන්ගේ හැරීමය.

**පවිවෙකම්පීති** පීති සහිත ධ්‍යාන දෙකෙහි ප්‍රීතියයි. **නිරුජ්ඣති** ධ්‍යාන නිරෝධයෙන් නැති කිරීමයි. සමවතින් නැගිට්ටුහුගේ නිරුද්ධය නම් වෙයි. යම්හෙයකින් අදුක්ඛමසුඛ වේදනාවගේ නිරෝගයෙන් උපදියි. නිරාමිස සුවය නිරාමිස සුවයාගේ නිරෝධයෙන් උපදියි. අදුක්ඛමසුඛ වේදනාව යනු මෙහි අර්ථය නොවේ.

චතුර්ථධ්‍යාන නිරෝධයෙන් තෘතීයධ්‍යානයට පැමිණ වාසය කරයි යන්න මෙහි අර්ථයයි. සතරවන ධ්‍යානයෙන් නැගිට තුන්වන ධ්‍යානයට සමවදියි. තුන්වන ධ්‍යානයෙන් නැගිට සතරවන ධ්‍යානයට සමවදියි. මෙසේ මෙය දතයුතුයි. **උප්පජ්ජති දොමනස්සං** ධ්‍යානය පරියාදානක සිතේ ඇති නොසතුට නොවේ. සමවතින් නැගී සිටි සිතේ කර්මන්‍ය බව කියන ලදි. **පවිවෙකා පීති** ඒ ධ්‍යාන දෙකේ ප්‍රීතියයි. **යං ඡායා ජහති** යම් තැනක සෙවන හරියි. කුමක් නිසා කියන ලද්දේ ද? යම් තැනක සෙවන ඇත්තේ ද එතන අව්ව නැත. යම් තැනක අව්ව ඇත්තේ ද එතැන සෙවන නැත. **නිරාමිසං සුඛං** තෘතීයධ්‍යාන සැපයයි. **අදුක්ඛමසුඛං** හතරවන ධ්‍යානය දූනීමයි. **අනුපාදානො** හමසම් නිග්‍රහ කරන්නෙමි. **නිබ්බාන සප්පායං** නිවනට උපකාරයි. **අභිවදති** අභිමානයෙන් කියයි. **පුබ්බන්තානුදිට්ඨිං** දහඅට වැදෑරුම් පූර්වන්තානු දෘෂ්ටියයි. **අපරන්තානුදිට්ඨිං** හතළිස් හතරාකාර වූ අපරන්තානු දෘෂ්ටියයි. **උපාදාන මක්ඛායති** මම වෙමි කියා ගන්නහුගේ සක්කාය දෘෂ්ටිය පරියායෙන් දෘෂ්ටි උපාදානය කියනු ලැබේ. **සන්තිවර පදං** සංසිඳුණු කෙලෙස් ඇති හෙයින් ශාන්ත වූ උතුම් පදයයි. **ජනනං ඵස්සායතනං** භාග්‍යවතුන් වහන්සේ විසින් යම්තැනක ඇස නිරුද්ධ වේද රූප සංඥාවෙහි නොඇලේ ද යමක් ආයතනයන්ගෙන් දැනගත යුතු වේද මෙහි ආයතන දෙදෙනාගේ ප්‍රතික්ෂේප කිරීමෙන් නිවන දක්වන ලදි.

යම් තැනක ආ්පෝධාතුව පඨවිධාතුව තේජෝධාතුව වායෝධාතුව පිහිට නොවේ ද එයින් විල් නවතිත්. එහි ව්‍රතය ව්‍රතය නොවෙයි. මෙහි නාමයත් රූපයත් නරවශේෂව වැළකීම කරයි.

මෙහි ප්‍රදේශ සංස්කාරයන්ගේ ප්‍රතික්ෂේප කිරීමෙන් ලද නිවන දක්වන ලදි.

කොතැනක ආපෝධාතුව තේජෝධාතුව වායෝධාතුව පිහිට නොවේ ද කොතැනක දීර්ඝ ද කෙටි ද සියුම් ද සණ ද සුභ ද අසුභ ද කොතැනක නාම රූප දෙක නිරවශේෂව වැළකීම කරයි.

එහි ව්‍යාකරණය වේ. විඤ්ඤාණය අනිදර්ශනයය. අනන්තයය. මෙහි සර්ව සංස්කාරයන්ගේ ප්‍රතික්ෂේපයෙන් නිවන දක්වන ලදි. මේ සූත්‍රයෙහි ෂඩායතනයන්ගේ ප්‍රතික්ෂේපයෙන් දක්වන ලදි. අනෙත් තැනක **අනුපාදා විමොක්ඛො** නිවනම දක්වන ලදි. මෙහි රහත් ඵලය දක්වන ලදි. ඉතිරිය සියළුම තැන්වල ප්‍රසිද්ධය.

**පංචත්තය සූත්‍ර වර්ණනාව නිමි.**

# 1.4.3

**එවමෙමසුතනති කිත්ති** සූත්‍රය මා විසින් මෙසේ අසන ලදි. එහි **කුසිනාරායං** යනු මේ නම ඇති මණ්ඩල පෙදෙසයි. **බලිහරණෙ** ඒ වන ලැහැබෙහි භූතයන්ට බලි ගෙන එත්. එහෙයින් ඒ පෙදෙස බලිහරණය යැයි කියන ලදි. **චීවරහෙතු** සිවුරුවලට කාරණායි. සිවුරු කැමතිවේය යන අර්ථයි. **ඉතිභවාභවහෙතු** ඒ දේශනා පුණ්‍යක්‍රියා වස්තුව නිසා ඒ ඒ භවයෙහි සැප විඳින්නෙමියි ධර්මය දේශනා කරයි. කුමක්ද? තොපට මෙසේ වේය යන අර්ථයයි. **චත්තාරො සතිපට්ඨානා** සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන් ලෞකික ලෝකෝත්තර යැයි කියන ලදි. **තත්‍ථ** ඒ සත්තිස් බෝධිපාක්ෂික ධර්මය කෙරෙහි **සියුං** වූහ. **අභිධම්මෙ** විශිෂ්ඨ ධර්මයෙහි මේ සත්තිස් බෝධිපාක්ෂික ධර්මයෙහි යන අර්ථයි. **තත්‍ර** චෙති මේ බෝධිපාක්ෂික ධර්ම හැඳින්වීමේ ආධාර විභක්තියයි. **අත්‍ථතො චෙව නානං ව්‍යඤ්ජනතො චාති** මෙහි ශරීරයම සතිපට්ඨානයයි. වේදනාව සතිපට්ඨානය යැයි කී කල්හි අර්ථයෙන් නානත්වය වෙයි. **තදමිනාපි** නුඹලා මේ කාරණයෙන් ද එය දැනගනිව්. අර්ථයත් ව්‍යඤ්ජනයත් එක්කොට අර්ථයාගේ අනෙත් පරිද්දකින් ගන්නා ලද බැවින් ව්‍යඤ්ජනයාගේ වරදවා තබන බව **දක්විය** යුතුයි. **යො ධම්මො යො විනයො** මෙහි අර්ථයත් **ව්‍යඤ්ජනයත් අඟවන කරුණම ධර්මයත් විනයත් අර්ථ වශයෙන් සමවෙයි. සිහියම සතිපට්ඨානය යැයි ගන්නා ලද කල ව්‍යඤ්ජන වශයෙන් නා නා**

Scanned with CamScanner

බවයි. හුදෙක් ව්‍යඤ්ජනයම සතිපට්ඨානයෙන් සතිපට්ඨානය යැයි වැරදි ලෙස නඟන ලද්දේ වෙයි. අප්පමත්තකං බො සූත්‍රයට පැමිණ ව්‍යඤ්ජන අල්පමාත්‍ර වෙයි. ධනිත වශයෙන් ආරෝපනය කළ කල්හි නිවීමට පැමිණෙන්ට හැකිවෙයි. එයට මේ උදාහරණ කථාවකි. විජයාරාම විහාර වාසි එක් රහතන් වහන්සේ නමක් භික්‍ෂූන් වහන්සේලා දෙනමකට සූත්‍රයක් ගෙන කමටහන් කියන්නේ අව්‍යක්ත පෘථජ්ජන තෙමේ සමුද්දො සමුද්දො යැයි ධනිත කොට කීයයි කීය. එක් භික්‍ෂුවක් ස්වාමීනි, සමුද්ද යැයි අල්පව කීය. ඇවැත්නි, සමුද්ධ යැයි කී කල ද සමුද්ද යැයි කී කල ද අපි ලුණුසාගරයම යැයි දනිමු. නුඹලා අර්ථය නො සොයන්නාහුය. ව්‍යඤ්ජන සොයන්නාහුය. යව. මහා විහාරයෙහි ව්‍යඤ්ජන ප්‍රගුණ කළ භික්‍ෂූන් සමීපයෙහි ව්‍යඤ්ජන ශුද්ධ කරව් යැයි කමටහන් නුගන්වා නැගිටවූයේය. උන්වහන්සේ පසුව මහා විහාරයෙහි බෙරය ගස්වා භික්‍ෂුසංඝයාට සතර මඟෙහි ප්‍රශ්න කියා පිරිනිවීය. මෙසේ සූත්‍රයට පැමිණ ව්‍යඤ්ජනයන්ගේ අල්පමාත්‍රය නම් වෙයි. විනයට පැමිණ අල්පමාත්‍රයක් නොවේය. සාමණේර ප්‍රව්‍රජ්‍යාව උභතො ශුද්ධියෙන් වටියි. උපසම්පදා ආදී වූ කර්මයෝ සිථිල ධනිතාදීන්ගේ කිරීම් පමණකින් කෝප්‍ය වෙත්. මෙහි මෙය සූත්‍ර ව්‍යඤ්ජන සඳහා කියන ලදි. සතරවෙනි වාරයෙහි විවාදයයි. කුමක් ද? සංඥා විවාදයයි. මම සිහියම සතිපට්ඨානය යැයි කියමි. මේ ශරීරය සතිපට්ඨානයයි කියන්නේ ඔවුන්ගේ සංඥාව නොවේ. ව්‍යඤ්ජනය ද නොවේ. මේ න්‍යායයි. න චොදනාය තරිතබ්බං චෝදනා පිණිස නොයායුතුයි. ඇතැම් පුද්ගලයෙක් තොපගේ නලලෙහි අබ ඇටයක් පමණ කැළලක් ඇතැයි කී කල්හි. මගේ නලලෙහි අබ ඇටයක් පමණ කැළැල පෙනෙයි. තමාගේ නලලෙහි තිබෙන තල්ගෙඩියක් පමණ ගඩුව නොපෙනේ යැයි කියයි. එබැවින් පුද්ගලයා පරීක්‍ෂා කළ යුතුයි. අදන්ධදිට්ඨී නොගන්නා දෘෂ්ඨියයි. කිඹුලන්ගේ හදවතෙහි බහා දමන්නාක් මෙන් දැඩිව නොගණියි. උපඝාතො නපුරු භාවයෙන් වණසට්ටිතයක් මෙන් දුකට හේතුය. සුප්පටිනිස්සග්ගි කෙසේ නම් මම පැමිණියේ ද කවදා පැමිණියේ ද හෝ තොප පැමිණියේ ද තොපගේ උපාධ්‍යායයන් වහන්සේ පැමිණියේදැයි අසවල් නමය අසවල් දවසයැයි එකසැරය දෙසැරය කියා වහා සිහිකොට එකෙනෙහිම අත්හැරීමයි. විහෙස බොහෝ අර්ථ ද කාරණා ද ගන්නවුන්ගේ කාය චිත්ත දෙකේ ක්ලාන්තයයි. සකෙකාමි මෙබඳු පුද්ගලයෙක් අවකාස කොට ආපත්තීන්ට පැමිණීම පිණිස - ස්වාමීණී යි කී කළ කවදා කුමන වස්තුවක්දැයි කියා අසවල් දවසෙහි අසවල් වස්තුවේයැයි කී කල්හි ඇවැත්නි සිහි නොකරමියි කියයි. එයින් හෙමින් සිහි කරවයි බොහෝ සේ කියා සිහිකොට අත්හරියි. එහෙයින් හැකිවෙමියි

කීය. මේ ක්‍රමයෙන් හැමතැන්හිම තේරුම් දත යුතුයි. උපෙඛා නාතිමඤ්ඤිතබ්බා උපේක්ෂාව අත්හැරීම නොකටයුතුයි. දත යුතුයි.

මෙබඳු පුද්ගලයෙක් සිටගෙනම මුත්‍ර පහකරන්නේ දකම ඇවැත්ති. හිඳගන්න යැයි කියයි. ඔහු උපේක්ෂාව ඉක්මවන්නේ වෙයි. වචීසංඛාරො වචන සංස්කාරයයි. දිට්ඨිපලාසො යනාදියෙන් සිතේ නොසතුටුභාවය කියන ලදි. තං ජානමානො සමානො ගරහෙය්‍ය

එය ශාස්තෘන් වහන්සේ දන ගත්තේ අපට නින්දා කරන්නේය. එතං පනාවුසො ධම්මං මේ දබර කරන ස්වභාවයයි. තං වෙ ඒ පැණවීම් කරන භික්ෂුවයි. එවං ව්‍යාකරෙය්‍ය මා විසින් මේවා සුද්ධකොට පිහිටුවන ලද්දේ යැයි නොකියා යම් කාරණයකින් සංඥාව කරන ලද්දේ එකෙනෙහිම දක්වන්නේ මෙසේ ප්‍රකාශ කරන්නේය. තාහං ධම්මං සුත්වා මෙහි සිහිකටයුතු ධර්ම අභිප්‍රායයි. න ච කොචි සහධම්මිකො අනුන් විසින් කියන ලද හේතු සහිත කිසියම් වාදයක් හෝ අනුවාදයක් හෝ නින්දා කළයුතු බවට පැමිණීමක් නම් නැත. සෙසු සියල්ල ප්‍රකටය.

කින්ති සූත්‍ර වර්ණනාව නිමි.

# 14.4

එවමෙමසුතන්ති මා විසින් සාමගාම සූත්‍රය මෙසේ අසන ලදි. එහි සාමගාමෙති සාමය කැමැත්තන් වැඩි හෙයින් ලබන ලද නම් ඇති ගමෙහි, අධුනා කාලකතොති එකනෙහි කළුරිය කළ, ද්වෙධික ජාතාති දෙකොටසකට බිඳුන භණ්ඩනාදීන්හි පූර්වභාග කලහයයි. ඉමං ධම්මවිනයං අජානාති මේ ආදි විරුද්ධ වචනකීම විවාදයයි. විතුදන්තාති විඳින සහිතමෙමති මාගේ වචනය අර්ථ සහිතය. අචිණ්ණනෙත විපරාවත්තන්ති යම් වචනයක් බොහෝ කල් සේවනය කිරීමෙන් ප්‍රගුණ ද එය මාගේ වාදය නිසා නැවතුනේය. ආරොපිතො තෙ වාදොති නුඹගේ මුත්තෙහි මා විසින් වරද ආරෝපනය කරන ලදි. චරවාදප්පමොක්ඛායාති බත් කබල ගෙන ඒ ඒ තැන්වල ගොස් වාදයෙන් මිදීම පිණිස මත්තෙහි පරීක්‍ෂා කර බලමින් හැසිරෙව. නොහොත් මා විසින් ආරෝපනය කරන ලද වාදයෙන් තමා නිදහස් වෙව. සචෙ පහොතීති ඉදින් හැකිනම් චධොයෙවාති

මැරීමමයි. නාතපුත්තියෙසූති නාතපුත්තයාගේ ශිෂ්‍යයන් කෙරෙහි නිබ්බින්න රූපාති කලකිරුණු ස්වභාව ඇත්තේ වැඳීම් ආදිය ද නොකරති. විරත්තරූපාති ප්‍රේමය නැති පටිවානරූපාති ඔවුන්ගේ සත්ක්‍රියාවෙන් නතරවුණු ස්වභාව ඇති යථාතත්ති යම් පරිදි වරදවා කියන ස්වභාව ඇති ධර්මවිනයෙහි කලකිරුණ ප්‍රේමය නැති විද එසේ වූහ යන තේරුමයි. දුරක්ඛාතෙති වරදවා කියන දුප්පවෙදිතෙති වරදවා දැනගත් අනුපසමසංවත්තනිකෙති රාගාදීන්ගේ සංසිඳීම කරන්නට අසමර්ථ භින්නථූපෙති වෙන්ව පිහිටියා වූ. එහි ඔවුන්ගේ නාතපුත්තම පිහිට වූ අර්ථයෙන් ථූපයයි. ඔහු වෙන්ව මැරුණි. එහෙයින් භින්නථූපෙති යැයි කියන ලදි. අප්පටිසරණෙති ඔහුගේ අභාවයෙන් පිහිටක් නැති. මේ නාතපුත්‍ර තෙමේ නාලන්දා වැසියෙකි. කුමක්නිසා ඔහු පාවානුවර කළුරිය කළේ ද? ඔහු උපාලි ගෘහපතියා විසින් අවබෝධ කරගත් සත්‍යයෙන් ගාථා දහයකින් කියන ලද බුදුගුණ අසා උණු ලේ දැමීය. පසුව අපහසු වූ ඔහු ගෙන පාවා නුවරට ගියාහ. ඔහු එහිදී කළුරිය කළේය. කළුරිය කරන්නේ මාගේ ලබ්ධිය අනිර්යානිකය. හරයක් නැත. අපි ද විනාශ වීමු. සෙසු ජනයා මා විසින් අපායගාමී කරන ලදි. ඉදින් මම මාගේ සසුන අනිර්යානික යැයි කීවත් නොඅදහති. මම ඒකාන්තයෙන් දෙන්නෙකුට එක ආකාරයෙන් නොඋගන්වන්නේය. මොවුහු මාගේ ඇවෑමෙන් ඔවුනොවුන් වාද කරති. බුදුරදුන් ඒ විවාදය නිසා එක ධර්මයක් කියන්නේය. එයින් ඔවුහු ශාසනයේ මහත්බව දැනගනිති. එකල අතවැසියෙක් ඔහු වෙත පැමිණ කියන්නේය. ස්වාමීනි, නුඹ වහන්සේ දුර්වලය. මේ ධර්මයෙහි සාරය මට කියව. ඇවත නුඹ මාගේ ඇවෑමෙන් ශාස්වතය ගනුව. අනෙකෙකු පැමිණ ඇසූ කල්හි උච්ඡේදය ගනුවයි කියයි. මෙසේ දෙන්නෙකු එක ලබ්ධිකයන් නොකොට බොහෝ ආකාරයෙන් උගන්වා කළුරිය කළේය. ඔවුහු ඔහුගේ ආදාහනය කොට රැස් වූවාහු ඔවුනොවුන් විචාළහ. ඇවැත්නි ආචාර්යන් වහන්සේ කවරෙකුට හරය කීවේද? එක් අයෙක් නැගිට මට යැයි කීය. කුමක් කීයේද? ශාස්වතයයි. වෙනකෙක් එය ප්‍රතික්ෂේප කොට මට හරය කීවේයැයි කීය. මෙසේ සියල්ලෝම මට හරය කීවේය යැයි කීය. මම ජ්‍යෙෂ්ඨයා වෙමියි ඔවුනොවුන් වාද කරගෙන ඇනුම් බැනුම් ඇති කරගෙන අත් පා ආදියෙන් පහර ගසාගෙන එක මඟෙහි යෑමට බැරිව නොයෙක් දිශාවන්හි ගියාහ. සමහරු ගිහි වූහ. භාග්‍යවතුන් වහන්සේ ධරමාන කාලයෙහි භික්ෂු සංඝයාගේ වාදයක් නොඉපදුණි. එසේ වාද කාරණයක් උපන් කල්හි බුදුරදුන් ම ගොස් හෝ භික්ෂූන් ගෙන්වාගෙන හෝ ඉවසීම මෛත්‍රිය අවිහිංසා ආදි සිහිකළයුතු ධර්මයන්හි එක් කොටසක් කියා වාදය සංසිඳුවති. මෙසේ ධරමාන කාලයෙහි සංඝයාට පිහිටක්ම විය. පිරිනිවියේ ද අවිවාදයට

කරුණු දේශනා කොටය. භාග්‍යවතුන් වහන්සේ සූත්‍රයෙහි දේශනා කරන ලද සතර මහාපදේශ අද තෙක් භික්ෂූන්ට අවශ්‍යයෙන්ම පිහිට වෙයි. එසේම ඛන්ධකයෙහි ද සතර මහාපදේශ දේශනා කරන ලදි. සූත්‍රයෙහි සතර ප්‍රශ්නවිඳීම් ක්‍රමය ද දේශනා කරන ලදි. එහෙයින් කියන ලදි. ''ආනන්ද මා විසින් නුඹලාට යම් ධර්මයක් විනයක් දේශනා කරන ලද ද පණවන ලද ද එය නුඹලාට මාගේ ඇවෑමෙන් ශාස්තෘ වන්නේය.''

**අථ ඛො චුන්දො සමණුද්දෙසොති** මේ තෙරුන් වහන්සේ ධර්ම සේනාපති සැරියුත් තෙරුන්ගේ කනිටු සහෝදරයායි. ඒ භික්ෂුව උපසම්පදා නැති කාලයෙහි චුන්ද සමණුද්දෙස යැයි ව්‍යවහාර කොට ස්ථවිර කාලයේ ද එසේම ව්‍යවහාර කළහ. එහෙයින් චුන්දො සමණුද්දෙසොති යන්න කියන ලදි. **උපසංකමීති** කුමකට පැමිණියේ ද? නාතපුත්‍ර තෙමේ කළුරිය කළ කල්හි දඹදිව මිනිස්සු ඒ ඒ තැන්වල කතා පැවැත්වූහ. නිගණ්ඨ නාතපුත්‍ර තෙමේ එක ශාස්තෘවරයෙක් යැයි ප්‍රසිද්ධය. ඔහුගේ කළුරිය කිරීමෙන් ශ්‍රාවකයන්ට මෙබඳු වාදයක් උපන. ශ්‍රමණ ගෞතම තෙමේ දඹදිව හිරු සඳු මෙන් ප්‍රසිද්ධය. උන්වහන්සේ පිරිනිවි කල්හි කෙබඳු වාදයක් ඇතිවන්නේ ද? තෙරුන් වහන්සේ ඒ කතාව අසා සිතීය. මේ කතාව බුදුරදුන්ට දන්වන්නෙමි. බුදුරදුන් මේ හේතුකොට එක් දේශනයක් කරන්නාහ. උන්වහන්සේ නික්මී සාමගාමය යම් තැනක ද ආනන්ද තෙරුන් යම් තැනක ද එතනට පැමිණියේය. එනවිටම බුදුරදුන් වෙත නොගොස් උපාධ්‍යාය වූ ආනන්ද තෙරුන් වෙතට පැමිණියේය යන තේරුමයි. උන්වහන්සේට මෙබඳු සිතක් විය. මාගේ උපාධ්‍යායයන් වහන්සේ මහත් නුවණ ඇත්තෙකි. උන්වහන්සේ මේ පණිවුඩය බුදුරදුන්ට දන්වන්නාහ. ඉක්බිතිව බුදුරදුන් සුදුසු පරිදි ධර්මය දේශනා කරති. **කථාපාභතන්ති** කථා මූලයයි. මූලයට පාභතං යැයි කියයි. එහෙයින් කීය.

නුවණැති විචක්ෂණ පුද්ගලයා ස්වල්ප මූලයෙන් ද තමාගේ නැගිටීම ඇති කරගනී. කුමක් සෙයින්ද? ස්වල්ප වූ ගින්න පිඹීමෙන් මහත් ගින්නක් ඇතිකරගත්තා මෙනි.

**දස්සනායාති** දැකීම පිණිස කිමෙක්ද? භාග්‍යවතුන් වහන්සේ දැක්කේ ද නොදැක්කේ ද මේ ආයුෂ්මත් තෙමේ දවල්ට නව වාරයක් ද රාත්‍රියට නව වාරයක් දැයි එක් දවසකට දහඅට වාරයක් උපස්ථානයට යයි. දවසකට සිය වාරයක් හෝ දහස් වාරයක් හෝ යෑමට කැමති වුවත් කාරණයක් නැතිව නොයයි. එක් ප්‍රශ්නයක් අරගෙනම යයි. උන්වහන්සේ එදවසසෙහි එසේ යෑමට කැමතිව මෙසේ කීය. **අභිතාය දුක්ඛාය දෙවමනුස්සානන්ති**

Scanned with CamScanner

එක වෙහෙරෙහි සංඝයා මැද උපන් වාදය කෙසේ දෙව්මිනිසුන්ට අහිත පිණිස දුක් පිණිස පවතී ද? කොසඹෑ නුවර මෙන් භික්ෂූන් දෙදෙනෙක් අතර වාදයක් ඇති වූ විට ඒ විහාරයෙහි ඔවුන්ගේ අතවැසියෝ වාද කරත්. ඔවුන්ගෙන් අවවාද ගන්නා භික්ෂුණීහු වාද කරත්. එයින් ඔවුන්ගේ උපස්ථායකයෝ වාද කරත්. ඉක්බිතිව මිනිසුන් ද ආරක්ෂක දෙවියෝ වෙත්. අධර්මවාදීන්ට අධර්මවාදී ආරක්ෂක දෙවියෝ වෙත්. එයින් ආරක්ෂක දෙවියන්ගේ මිත්‍ර භූමස්ථ දෙවියෝ බිඳෙත්. මේ ක්‍රමයෙන් බ්‍රහ්මලෝකය දක්වා ආර්යශ්‍රාවක සියළු දෙව්මිනිසුන් කොටස් දෙකක් වෙත්. ධර්මවාදීන්ට වඩා අධර්මවාදීන් බොහෝ වෙත්. එයින් යමක් බොහෝ අය ගන්නා ලද්දේද එය ගනිත්. ධර්මය අතහැර බොහෝ දෙනා අධර්මය ගනිත්. ඔවුහු අධර්මය පතුරුවමින් වාසය කරන්නේ අපායෙහි උපදිත්. මෙසේ එක විහාරයක සංඝයා මැද උපන් වාදය බොහෝ අයගේ අහිත පිණිස දුක් පිණිස වෙයි. **අභිඤ්ඤාදෙසිතාති** මහාබෝධි මූලයෙහි වැඩසිටියේ ප්‍රත්‍යක්ෂ කොට කියන ලදි. **පතිස්සයමානරූපා විහරන්තීති** ආශ්‍රය හේතුවෙන් වාසය කෙරෙත්. **භගවතො පච්චයෙනාති** දැන් බුදුරදුන් ජ්‍යෙෂ්ඨ කොට ගෞරව සහිතව වාසය කරන්නේ ස්වාමීනි. ඔබ වහන්සේගේ උසස් තේජස හේතුකොටගෙන වාදයක් ඇති කරන්නට නොහැකිය. බුදුරදුන්ගේ ඇවෑමෙන් එය උපදවන්නාහු යැයි කියයි. වාදය ඇති වන්නේ යම් තැනක ද එතන දක්වන්නේ **අජ්ඣාජීවෙ වා අධිපාතිමොක්ඛෙ වාති** එහි අජ්ඣාජීවෙ යනු ජීවිකාව හේතුකොටගෙන ජීවිකාව කරණකොටගෙන භික්ෂූන්ගේ උතුරු මිනිස්දම් උල්ලංඝනය කරයි. පාරාජිකාපත්ති ආදි ක්‍රමයෙන් පරිවාරයෙහි පනවන ලද ශික්ෂාපද සය තබා ඉතිරි සියළු ශික්ෂාපද අධිප්‍රාතිමෝක්ෂය නම් වෙයි. **අප්පමත්තකො සො ආනන්දාති** අජ්ඣාජීවය ද අධිප්‍රාතිමෝක්ෂය ද අරඹයා උපන් වාදය නම් යම්හෙයකින් අනුන්ගේ කථාවක් තමන්ගේ ස්වභාවයෙන් සළකා අත්හැරීමට පහසු ද එබැවින් අප්පමත්තකය යැයි කියන ලදි.

මෙහි මේ ලෝකයෙහි සමහරෙක් උතුරුමිනිස් දම් රැවා දක්වා කීම නොකිරීමෙන් කිසිවක් ලබන්නටය ආදි වශයෙන් සිතා ආජීවය හේතුකොටගෙන උතුරු මිනිස්දම් හෝ උල්ලපනය කරා ද සංචාරිත්‍රයට හෝ පැමිණියේ ද යමෙක් ඒ විහාරයෙහි වසමින් ඒ භික්ෂුව රහත් යැයි ආදි වශයෙන් කනට කොඳුරා කියත් ද නොගිලන්ව තමාට වැඩ පිණිස ප්‍රණීත ආහාර ගෙන්වාගෙන වළඳා ද භික්ෂුණීන්ට හෝ එය දන්වා පාටිදේසනීයට පැමිණේ ද යම්කිසිවෙක් බත් ව්‍යංජන දූන්වීම් ආදි දුක්කට වස්තුවක් කරා ද ඔහු සබ්‍රහ්මචාරීහු මෙසේ හඳුනාගනිති. මොහුට මෙසේ

ලබන ලාභයෙන් කවර ප්‍රයෝජන ද? යමෙක් මේ ශාසනයෙහි පැවිදි වී මිථ්‍යා ජීවයෙන් ජීවිකාව කෙරේ ද? පැණවීම් ඉක්මවීම් කරයි. මෙසේ තමාගේ ස්වභාවයෙන් වන්නේ යැයි මට මේ ලාභයෙන් කවර ප්‍රයෝජනයක් ද? මම මෙසේ මැනවින් දේශනා කරන ලද ධර්මවිනයෙහි පැවිදි වී මිථ්‍යාජීවයෙන් ජීවත්වෙමියි පැණවීම් ඉක්මවමියි සළකා එයින් මිදෙයි. මෙසේ අනුන්ගේ කතාවෙන් හෝ තමාගේ ස්වභාවයෙන් හෝ කල්පනා කොට නොකොට අත්හරී.

එහෙයින් ඔහුට භාග්‍යවතුන් වහන්සේ අප්පමත්තකොති යනුවෙන් කීහ. මග්ගෙ වාපි ආනන්ද පටිපදාය වාති ලෝකෝත්තර මාර්ගයට පැමිණ වාද කිරීම නම් සියළු ආකාරයෙන් සංසිඳෙයි. අවබෝධ කරගත් මාර්ග ඇත්තන්ට වාදයක් නැත. පූර්වභාග මාර්ගයත් පූර්වභාග මාර්ග ප්‍රතිපදාවත් සඳහා මෙය කියන ලදි. එහි මේ ක්‍රමයයි. මිනිස්සු භික්ෂුවට මෙසේ ලෝකෝත්තර ධර්මයෙන් ගරු කරති. ඔහු අතවැස්සන් සමග පැමිණ වැඳ සිටි කල්හි අසයි. කුමකට පැමිණියේ ද? ස්වාමීනි, කමටහන් ඇසීමටයි. හිඳුව. මොහොතකින් රහත් වන්නට හැකි කමටහනක් කියන්නෙමියි කියා කියයි. භික්ෂුව තමා වාසය කරන ස්ථානයට පැමිණ සිටින්නේ මුල කමටහන සිහි කරයි. උන්වහන්සේ එය සිහිකරමින් සිටින කල ආලෝකය උපදියි. මේ ප්‍රථම මාර්ගයයි. ඔහු දෙවැනි ඕභාස නුවණ උපදවයි. දෙවැනි මාර්ගය අවබෝධ කළේ වෙයි. පැමිණියේ ද වෙයි. එකල්හි ඒ භික්ෂූන් වහන්සේලා රහතන් වහන්සේලා නොවූහ. මෙසේ කමටහන් කීමට ද නොහැකිය. ඒකාන්තයෙන්ම මේ අය රහත් වෙතියි නිෂ්ඨාවට පැමිණෙයි. ඔහු පසුකාලයේ දී කළුරිය කරයි. අසල්වැසි මිනිස්සු පැමිණ අසත්. කිසිවෙකු විසින් තෙරුන්ගෙන් ප්‍රශ්නයක් අසන ලදදූයි. උපාසකවරුනි, පළමුව අපහට තෙරුන් වහන්සේ විසින් ප්‍රශ්නය කියන ලදි. ඔවුහු මල් වලින් කුළු ගෙයක් සාදා රනින් ඇස්වලට මුඛයට පියන් සාදා සුවඳ මල් ආදියෙන් පූජාකොට සතියක් සාධුක්‍රීඩා කොට දවා ඇටගෙන සෑයක් කරති. වෙන ආගන්තුකයෝ විහාරයට පැමිණ පා දොවා මහතෙරුන් දකින්නෙමුයි. ඇවැත්නි, මහතෙරුන් කොහිදූයි අසත්. ස්වාමීනි. පිරිනිවියේය. ඇවැත්නි තෙරුන් විසින් දුෂ්කර දෙයක් කරන ලදි. මාර්ගඵල උපදවන්නහු විසින් ප්‍රශ්න අසන ලදි. ස්වාමීනි, භික්ෂූන්ට කමටහන් කියන්නේ මේ ආකාරයටයි කීවේය. ඇවත මේ මාර්ගය නොවෙයි. මේ විදර්ශනා උපක්ලේශයයි.තොපි නොදන්නහුද? තෙරුන් වහන්සේ පෘථග්ජනය. ඔවුහු කෝලාහල කරත්නාහු නැගිට සියළු විහාරයන්හි භික්ෂූන් ද ගොදුරු ගමෙහි මිනිස්සු ද නොදනිත්. කුමන මඟකින් නුඹලා ආවේදූයි

නුඹලා ම දැනගනිව්. කිමෙක් ද? නුඹලා විහාර දොරටුවෙහි සෑය නොදක්කෙහු ද? මෙබඳු වාද ඇති භික්ෂූන් සියයක් හෝ දහසක් හෝ සිටියද ඔවුන්ගේ දෘෂ්ටිය අත්නොහරිති. ස්වර්ග මාර්ග දෙක ම වළකන ලදි. අනෙක් කෙනෙක් එලෙසම කර්මස්ථානයක් කියන්නේ මෙසේ කියයි. සිතින් ම උඳුන් තුනක බඳුන් තුනක් ආරෝපනය කොට යට ගිනි කොට සිතින් ම තමාගේ ද්වාතිංසාකාරය උපුටා කබලයන්හි දමා සිත නැමැති දණ්ඩෙන් පෙරළා පෙරළා බැදිය යුතුයි. දැවෙන කල යම් අළු හරියක් වේද එය කටින් පිඹ හැරිය යුතුයි. මෙපමණකින් මහණ තෙමේ නසන ලද පාපකර්ම ඇත්තෙක් වෙයි. ඉතිරිය පළමු පරිද්දෙන් විස්තර කළ යුතුයි. තවකෙනෙක් මෙසේ කියයි. සිතින් ම මහ සැළියක් තබා මෝරු යොදා සිතින් තමාගේ ද්වත්තිංසාකාරය උපුටා එහි දමා මෝරුවලට බැස මැඩිය යුතුයි. මඩිනු ලබන්නේ වියලෙයි. වියලුණු කළ මත්තෙහි පෙණ නගියි. ඒ පෙණ අනුභව කළ යුතුයි. මෙපමණකින් අමෘතය කළ යුතුයි. දූත් යමෙක් මෙසේ යම් වාදයක් උපදවන්නේ ද ඊට මුල දක්වමින් ඡයිමාතීති ආදිය කීය.

එහි අගාරවොති ගෞරව නැති අප්පතිස්සොති යටත් නැති පැවතුම. යම් භික්ෂුවක් බුදුරදුන් වැඩසිටි කාලයෙහි තුන් කාලයන්හි උපස්ථානයට නොයයි ද බුදුරදුන් පාවහන් නැතිව සක්මන් කරන කළ පාවහන් සහිතව සක්මන් කරයි ද, පහත ස්ථානයක සක්මන් කරන කළ උස් ස්ථානයක සක්මන් කරයි ද, පහත ඉන්නා කළ උසක හිඳියි ද, බුදුරදුන් ස්නානය කරන ස්ථානයෙහි මළමුත්‍රා කරයි ද, පිරිනිවි කල්හි චෛත්‍යය වැඳීමට නොයයි ද, චෛත්‍යය පෙනෙන ස්ථානයෙහි බුදුරදුන් දකින තැන කියන ලද සියල්ල කරයි ද, අනෙත් භික්ෂූන් විසින් කුමක්හෙයින් මෙසේ කරයි ද, මෙය නොවටියි. බුදුරදුන්ට ලැජ්ජා කරන්නට වටීදැයි කී කළ නිශ්ශබ්ද වෙයි. කුමක් නිසා බුද්ධ බුද්ධ යැයි කියයි ද, මෙය බුදුරදුන්ට කරන අගෞරවය නම් වේ. යමෙක් බණ ඇසීමෙහි ගෙඩිය ගැසූ කළ සකසා නොයයි ද, සකසා බණ නොඅසයි ද, නිදාගනී ද, කථා කරමින් හෝ සිටී ද, සකසා නොගනියි ද, නොදරයි ද, ධර්මයට අගෞරව කුමක් නිසා ද යැයි කී කළ නිශ්ශබ්ද වෙයි. ධර්මය ධර්මය යැයි කියයි ද එය ධර්ම අගෞරවයයි. යමෙක් ස්ථවිර භික්ෂුව විසින් නොවිචාරණ ලදුව ධර්මය දේශනා කරයි ද හිඳියි ද ප්‍රශ්න කියයි ද වැඩිමහළු භික්ෂූන්ගේ ඇඟේ ගැටෙමින් යයි ද සිටියි ද හිඳියි ද සඟ මැද දෙවුර වසා හිඳියි ද කුඩ හා පාවහන් දරා ද භික්ෂු සංඝයාට ලැජ්ජා කරන්නට වටීදැයි ඇසූ කළ නිශ්ශබ්ද වෙයි. සංඝයා සංඝයා යැයි කෑ ගසයි. මොන සංඝයා ද මිගසංඝ අජසංඝ

ආදිය කියා ද මෙය සංඝ අගෞරවය නම් වේ. එක භික්ෂුවකට කරන අගෞරවය ද සංඝයාට ම කරන අගෞරවයක් වෙයි. ත්‍රිවිධ ශික්ෂාවන් සම්පූර්ණ නොකිරීම ශික්ෂා අගෞරවය නම් වේ. **අජ්ඣත්තං වාති** තමා කෙරෙහි හෝ තම පිරිසෙහි **බහිද්ධාති** අනුන්ගේ හෝ අනුන්ගේ පිරිසෙහි දුන් මේ ස්ථාන හය නිසා උපන් වාදය වැඩෙමින් යම් අධිකරණයන්ට පැමිණේ ද එය දැක්වීමට **චත්තාරිමානීති** ආදිය කීය.

එහි සංසිඳීම පිණිස පැවැති සමථයන්ගෙන් අධික යනුයි. විවාදය ද අධිකරණය ද **විවාදාධිකරණං** ඉතිරියෙහි ද මේ ක්‍රමයයි. දුන් මේ සතර අධිකරණයන්ට පැමිණ මතු වැඩෙන්නේ ඒ විවාදය යම් සමථයන්ගෙන් සංසිඳේ ද ඔවුන්ගේ දැක්වීම පිණිස **සත්ත ඛො පනිමෙති** ආදිය කීය. එහි අධිකරණ සංසිඳුනේය යනු අධිකරණ සමථයි. **උප්පන්නුප්පන්නාති** උපන් උපන් **අධිකරණානන්ති** මේ විවාදාධිකරණය ආදි කොට ඇති සතරෙහි **සමථාති වූපසමායාති** සමානවීම හා සංසිඳීම යන තේරුමයි. **සම්මුඛා විනයො - පෙ- තිණවත්ථාරකොති** මේ සත්ත සමථයෝ දත යුතුයි.

මෙහි මේ විස්තර කථාවයි. අධිකරණ අතුරින් පළමුකොට ධර්මය හෝ අධර්මය හෝ දහඅටක් වස්තූන්ගෙන් වාද කරන භික්ෂූන්ගෙන් යම් වාදයක් වේ ද මෙය විවාදාධිකරණය නම් වේ. සීල විපත්තියෙන් හෝ ආචාර දෘෂ්ටි ආජීව විපත්තියෙන් හෝ අනුව වාද කරන්නවුන්ගේ යම් කීමක් හෝ චෝදනාවක් වේ නම් මෙය අනුවාදාධිකරණය නම් වේ. මාතිකාවෙහි ආ පහ ද විභංගයෙහි දෙක ද යන ඇවැත් කඳු හත ආපත්තාධිකරණයයි. සංඝයාගේ අපලෝකනය ආදි සතර කර්මයන්ගේ යම් කිරීමක් වේ ද මෙය කිච්චාධිකරණය නම් වේ. එහි විවාදාධිකරණය සම්මුඛ හා යෙභුය්‍යසික යන සමථ දෙකෙන් සංසිඳෙයි. යම් විහාරයක උපන් විවාදය ඒ විහාරයෙහි හෝ වෙනත් තැනක හෝ සංසිඳවන්නට යන්නවුන් අතරමඟ දී හෝ යම් තැනකට ගොස් හෝ සංඝයාට භාර දෙයි ද එහි දී එය සංඝයාට හෝ සමූහයාට හෝ සංසිඳවන්නට නොහැකි වන්නේ එහිම කාරක සභාවෙහි පුද්ගලයන් විසින් තීරණය කිරීමෙන් සංසිඳෙයි. මෙසේ සංසිඳවීම එහි සංඝසම්මුඛ, ධම්ම සම්මුඛ, විනයසම්මුඛ, පුද්ගලසම්මුඛ යන මෙය සම්මුඛාවිනයයි. එහි කාරකසංඝයාගේ සංඝසාමග්‍රියෙන් සම්මුඛීභාවය සංඝසම්මුඛතාවයයි. සංසිඳවිය යුතු වස්තුවක් වීම ධම්මසම්මුඛතාවයයි. සංසිඳවීම යම්සේ ද එසේම කිරීම විනයසම්මුඛතාවයයි. යමෙක් වාද කරයි ද යමකින් වාද කරයි ද ඒ දෙදෙනාම හමුවීම පුද්ගලසම්මුඛතාවයයි.

සම්මුඛාවිනයෙනෙව ඉදින් මෙසේ ද නොසන්සිඳේ නම් සම්මත කරන ලද භික්ෂූහු අපට සංසිඳවන්නට නොහැකි වෙමුයි සංඝයාට භාර දේද නැවත කරුණු පහකින් යුතු භික්ෂුවක් සළාක ගැනීමෙන් සම්මත කොට ඔහු විසින් රහසින්, විවෘතව, කණට කොඳුරා යන සළාක ගැනීම් තුනෙන් වෙනත් වශයෙන් සළාකයක් ගෙන රැස් වූ පිරිසෙන් ධර්මවාදීන්ගේ විනයෙන් ද, යෙභුය්‍යසිකා විනයෙන් ද සංසිඳුනේ වෙයි. එහි සම්මුඛා විනය කියන ලද ක්‍රමයෙන් ම යමක් යෙභුය්‍යසිකා විනයෙන් සිදු කරයි ද මෙය යෙභුය්‍යසිකා නම් වේ. මෙසේ විවාදාධිකරණය සමථ දෙකෙන් සංසිඳෙයි. අනුවාදාධිකරණය සමථ හතරකින් සංසිඳෙයි. සම්මුඛාවිනයෙන් ද සතිවිනයෙන් ද අමූළ්හවිනයෙන් ද තස්සපාපියාසිකාවිනයෙන් ද සම්මුඛාවිනයෙන් ද යමෙක් අනුව කියා ද යමක් නිසා කියා ද ඔවුන්ගේ වචන අසා ඉදින් කිසිදු ඇවැතක් නැත්ද දෙදෙනාම ක්ෂමා කරවා ඉදින් ඇත්නම් මේනම් ඇවැත යැයි මෙසේ විනිශ්චය කරන ලද්දේ සංසිඳෙයි. එහි සම්මුඛාවිනය ලක්ෂණ කියන ලද ක්‍රමයමයි. රහත් භික්ෂුවකට අමූලික සීල විපත්තියකින් චෝදනා කරන ලද්දෙකුට සතිවිනය ඉල්ලන්නේ සංඝයා ඤත්තිචතුර්ථ කර්මයෙන් සතිවිනය දෙයි. එකළ සම්මුඛාවිනයෙන් ද සතිවිනයෙන් ද සංසිඳෙයි. සතිවිනය දුන් කල්හි නැවත ඒ පුද්ගලයා කෙරෙහි කිසිදු වාදයක් හටනොගනියි. යම්කලක ද උමතු භික්ෂුවක් උමතු වශයෙන් කරන ලද අශ්‍රමණ වරදකට මෙබඳු ඇවැතකට පැමිණියේ යැයි භික්ෂූන් විසින් කියන ලද කල උමතුවෙන් මෙය කරන ලදි. සිහි නැතැයි කියන්නේ නමුත් භික්ෂූන් විසින් චෝදනා නගන්නේ නම් නැවත චෝදනා නොකිරීම පිණිස අමූළ්හවිනය ඉල්ලා ද සංඝයා ඤත්තිචතුර්ථ කර්මයෙන් අමූළ්හවිනය දෙයි. එකල්හි සම්මුඛාවිනයෙන් ද අමූළ්හවිනයෙන් ද සංසිඳෙයි. අමූළ්හවිනය දුන් කල්හි නැවත ඒ පුද්ගලයා කෙරෙහි කිසිදු වාදයක් හටනොගනියි. යම්කලෙක පාරාජිකාවෙන් හෝ පාරාජිකාවට සමාන හෝ චෝදනා ලබන පාපී පුද්ගලයාට ඉදින් මෙය නොසිඳුණු මුල් ඇත්තේ වෙයි. මනා පැවැත්මෙන් අවසරයක් ලබයි. ඉදින් සිඳුණු මුල් ඇත්තේ ඔහු නැසුනෙක් වන්නේ යැයි සිතන්නේ සංඝයා ඤත්තිචතුර්ථ කර්මයෙන් ඔහුට පාපියාසිකාව කරයි. එකල්හි සම්මුඛාවිනයෙන් ද තස්සපාපියාසිකා විනයෙන් ද සංසිඳුණේ වෙයි. මෙසේ අනුවාදාධිකරණය සමථ හතරෙන් සංසිඳෙයි. ආපත්තාධිකරණය සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද තිණවත්ථාරකයෙන් ද යන සමථ තුනෙන් සංසිඳෙයි. එය සම්මුඛාවිනයෙන් ම තස්සපාපියාසිකාවෙන් ම සංසිඳීමක් නැත. යම් කලෙක සංඝ සමූහයා මැද එක් හෝ භික්ෂුවක් සැහැල්ලු ඇවැත් දෙසයි. එකල්හි ආපත්තාධිකරණය සම්මුඛාවිනයෙන් ද

පටිඤ්ඤාතකරණයෙන් ද සංසිඳෙයි. එහි සම්මුඛාවිනය පළමුව යමෙක දේශනා කරයි ද යමෙකුට දේශනා කරයි ද ඔවුන්ගේ හමුවීම පුද්ගල සම්මුඛතාවයයි. ඉතිරිය කියන ලද ක්‍රමයම වේ. පුද්ගලයාට ද සමූහයට ද දේශනා කරන කාලයෙහි සංඝසම්මුඛතාවය පිරිහෙයි. මෙහි යම්හෙයකින් ස්වාමීනි, මම මේ නම් ඇති ඇවැතට පැමිණියෙමි. එසේම දකිමියි ප්‍රතිඥා කෙරේ ද ආයති සංවරයට පැමිණේ ද මෙය පටිඤ්ඤාතකරණය නම් වේ. සඟවෙසෙස් ආදියෙහි පරිවාස ඉල්ලීම් ප්‍රතිඥාදීම් පරිවාසදීම් ආදිය ද පටිඤ්ඤාතකරණයයි. දෙපක්‍ෂය ගත් කලහකාරී භික්‍ෂූහු බොහෝ අශ්‍රමණ දුසිරිතෙහි හැසිරී නැවත ලැජ්ජාව උපන්නේ ඉදින් අපි මේ ආපත්තීහු ඔවුනොවුන් විසින් කෙරුවෙමුයි ඒ අධිකරණයට පැමිණීමට ඔවුනොවුන් ඇවැත් කිරීමෙහි දොස් දක යම් කලෙක තිණවත්ථාරක කර්මය කරත්. එකල්හි ආපත්තාධිකරණය සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන් ද සංසිඳෙයි. කිච්චාධිකරණය සම්මුඛාවිනයෙන් ම එකම සමථයකින් සංසිඳෙයි. මේ අධිකරණ හතර සුදුසු පරිදි සමථ හතෙහි සංසිඳෙත්. එහෙයින් කියන ලදි. **උප්පන්නුප්පන්නානං අධිකරණානං සමථාය වූපසමාය සම්මුඛාවිනයො දාතබ්බො**

-පෙ- **තිණවත්ථාරකොති** මේ මෙහි විනිශ්චය ක්‍රමයයි. විස්තර සමථක්ඛන්ධකයෙහි ආ පරිදිය. **සමන්තපාසාදිකායං** විනිශ්චය සමන්තපාසාදිකාවෙහි කියන ලදි. **ඉධානන්ද භික්ඛූ විවදන්තීති** ආදියෙහි විස්තර කියන ලදි. එය එක් ක්‍රමයකින් කෙටියෙන් කියන ලද යැයි දත යුතුය.

එහි **ධම්මොති** ආදියෙහි සූත්‍ර ක්‍රමයෙන් දස කුසල ධර්මයයි. අකුසල අධර්මයයි. එසේම සතර සතිපට්ඨානයයි. යට ආ සත්තිස් බෝධිපාක්‍ෂික ධර්මසතිපට්ඨාන තුන සම්‍යක්ප්‍රධාන තුන, ඍද්ධිපාද තුන, ඉන්ද්‍රිය හය, බල හය, බොධ්‍යංග අට, මාර්ග නවය, උපාදාන හතර, නීවරණ පහ යනාදිය කිළුටු ධර්ම හෙයින් අධර්ම වේ. යම්කිසි එක් අධර්ම කොටසක් ගෙන මේ අධර්මය ධර්මය කරන්නෙමු. මෙසේ අපගේ ආචාර්ය කුලය නිර්යානික වන්නේය. අපි ද ලෝකයෙහි ප්‍රසිද්ධ වන්නෙමුයි. ඒ ධර්මය යැයි මේ ධර්මය යැයි කියමින් වාද කරති. එසේම ධර්ම කොටස්වලින් එකක් ගෙන මේ ධර්මය යැයි කියමින් වාද කරති. විනය පර්යායෙන් සිදු වූ වස්තුවෙන් චෝදනා කොට සිහිකොට යම්සේ පිළියම් කළයුතු කර්ම ධර්ම නම් වේ. සිදු නොවූ වස්තුවෙන් චෝදනා නොකොට සිහිනොකොට නොපිළියම් කළයුතු කර්ම අධර්මයයි. එයින් ද මේ අධර්මය ධර්මය යැයි

කියමින් වාද කරති. ධර්මය අධර්මය යැයි කියමින් වාද කරති. සූත්‍ර පර්යායයෙන් රාග විනය දෝශ විනය, මෝහ විනය, ප්‍රහීන කිරීම විනය නම් වේ. රාගාදීන්ගේ අවිනය ප්‍රහීන නොකිරීම අවිනය නම් වේ. විනය පර්යායෙන් වස්තු සම්පත්තිය, ඤත්ති සම්පත්තිය, අනුසාවන සම්පත්තිය, සීමා සම්පත්තිය යැයි යන මෙය විනය නම් වේ. **වත්ථු විපත්ති** - පෙ - **පරිස විපත්ති** මෙය අවිනය නම් වේ. අවිනය විනය යැයි කියමින් වාද කරති. විනයට අවිනය යැයි කියමින් වාද කරති. **ධම්මනෙත්ති සමනුමජ්ජිතබ්බාති** ධර්මය නැමති රැහැන පොඩි කළ යුතුයි. නුවණින් සැළකිය යුතුයි. ඒ ධම්මනෙත්තිය වනාහි "ඉති ඛො වච්ඡ ඉමෙ දස ධම්මා අකුසලා දසධම්මා කුසලා ති" මෙසේ මහා වච්ඡගොත්ත සූත්‍රයෙහි ආ පරිදි කියන ලදි. එසේම හෝ වේවා යම් සේ හෝ වේවා මෙහි ධර්මය ද විනයද කියන ලදි. **යථාතත්‍ථ සමෙතීති** යම් සේ ඒ ධර්මනෙත්තියට සමවේ ද ධර්මය ධර්මය යැයි අධර්මය අධර්මය යැයි විනය විනය යැයි අවිනය අවිනය යැයි **තථාතනති** මෙසේ ඒ අධිකරණය සංසිඳවිය යුතුයි. **එකච්චානං අධිකරණානති** මෙහි විවාදාධිකරණයම දක්වන ලදි. සම්මුඛාවිනය කිසියම් අධිකරණයකින් නො ලබයි. එය සම්මුඛාවිනය හා යෙභුය්‍යසිඛා විනය යන සමථ දෙකෙන් සංසිඳේ. එයින් යට මාතෘකා තබන ලද පිළිවෙළින් දූන් සතිවිනය වාරයෙහි පැමිණි එය නොකියා පළමුව විවාදාධිකරණයම දක්වන්නේ, කුමක් නිසා යෙභුය්‍යසිඛාදිය කීවේ ද එහි **බහුතරාති** යටත් පිරිසෙයින් දෙන්නෙකුට තුන්දෙනෙකුට වැඩි වූ මෙහි ඉතිරිය යට කියන ලද ක්‍රමයෙන්ම දත යුතුයි. දූන් යට විස්තර නොකරන ලද සති විනය මුල්කොට විස්තර ද ඉතිරිය සමථයෙහි පිළිවෙළින් විස්තර කිරීමට ද කුමක් හෙයින් සතිවිනය යැයි කීවේ ද එහි **පාරාජිකසාමනෙතන වාති** සාමන්ත දෙකයි. ඛන්ධ සාමන්තය හා ආපත්ති සාමන්තයයි. පාරාජිකාපත්ති ඛන්ධකය. සංඝාදිසේසාපත්ති ඛන්ධකය. ථුල්ලච්චය. පාචිත්තිය. පාටිදේසනීය. දුක්කට. දුබ්භාසිත ආපත්ති ඛන්ධකයන් යන මේවා මෙසේ සාමන්ත නම් වේ. පළමු පාරාජිකාවේ පූර්වභාගය දුක්කටයි. ඉතිරිය ථුල්ලච්චයයි. පාචිත්තිය. පාටිදේසනීය. දුක්කට. දුබ්භාසිත ආපත්ති ඛන්ධකයන් යන මේවා මෙසේ සාමන්ත නම් වේ. පළමු පාරාජිකාවේ පූර්වභාගය දුක්කටයි. ඉතිරිය ථුල්ලච්චයයි. මේ ආපත්ති සාමන්තය නම් වේ. එහි ඛන්ධ සාමන්තයෙහි පාරාජිකා සාමන්තය ගරුකාපත්ති නම් වේ. **සරතායසමාති** ආයුෂ්මතුන් වහන්සේ සිහි කරයි. **එකච්චානංඅධිකරණානනති** මෙහි අනුවාදාධිකරණයම දක්වන ලදි. **භාසිතපරිකනතනති** වචනයෙන් කියන ලද දෙය කයින් කිරීමයි. උත්සාහවත් කොට කරත් යන තේරුමයි. **එකච්චානනති** ආපත්තාධිකරණය දක්වන

ලදි. දවාති වහා රවාති අනිකක් කියනු කැමැතිව වෙනත් දෙයක් කියන ලදි. **එවං ඛො ආනන්ද තස්ස පාපියාසිකා හොතීති** ඒ පුද්ගලයාට පාපය උත්සන්න වෙයි. මෙයින් කර්මයාගේ වස්තුව දක්වන ලදි. මෙබඳු පුද්ගලයාට ඒ කර්මය කළ යුතුයි. කර්මයෙන් අධිකරණයාගේ සංසිඳීම වෙයි. පුද්ගලයාගේ පාපය උත්සන්න නොවේ. මෙහි ද අනුවාදාධිකරණය ම අධිකරණය යැයි දත යුතුයි. **කථඤ්චානන්ද තිණවත්ථාරකොති** මෙය තිණවත්ථාරය හා සමාන නිසා තිණවත්ථාරකය යැයි කියන ලදි. මළ හෝ මූත්‍රා හෝ තණවලින් වැසීමෙන් ගඳ අඩුවෙයි. එසේම යම් අධිකරණයක් අමාරු බවට ගොස් භේදයට හේතු වෙයි. එය මේ කර්මයෙන් වැසුවාම තණවලින් වැසුවාක් මෙන් සංසිඳීම වෙයි. මේ කර්මය තිණවත්ථාරකය හා සමාන බැවින් තිණවත්ථාරකය යැයි කියන ලදි. **තස්ස ඉධානන්ද භික්ඛූනං භණ්ඩණජාතානන්ති**'' ආදි වචනයෙන් ආකාරමාත්‍රයක් ම දක්වන ලදි. ඛන්ධකයෙහි ආපරිදිම මෙහි කර්මවාක්‍ය ප්‍රමාණයි. **ඨපෙත්වා ථුල්ලවජ්ජං ඨපෙත්වා ගිහිපටිසංයුත්තන්ති** මෙහි ථුල්ලවජ්ජ නම් පාරාජිකා හා සංඝාදිසේසයි. **ගිහිපටිසංයුත්තන්ති** යනු ගිහියන්ගේ ගැරහීමෙන් ඇතිවන ආපත්තියයි. **අධිකරණානන්ති** මෙහි ආපත්තාධිකරණයම දත යුතුයි. කිච්චාධිකරණ වශයෙන් මෙහි කිසිවක් නොකියන ලදි. නොකියන ලද මුත් සම්මුඛාවිනයෙහි සංසිඳීම දත යුතුයි. **ඡයිමෙ ආනන්ද ධම්මා සාරාණීයාති** යට කලකෝලාහල වශයෙන් සූත්‍රය අරඹන ලදි. මත්තෙහි සිහි කළයුතු ධර්මයෝ ආවාහුය. මෙසේ යම්සේ සුදුසු පරිදි දේශනාව පැමිණියේ වෙයි. යට කෝසම්බිය සූත්‍රයෙහි සෝවාන් මාර්ග සම්මාදෘෂ්ටිය කියන ලදි. මේ සූත්‍රයෙහි සෝවාන් ඵල සම්මාදෘෂ්ටිය කියන ලද බව දත යුතුයි. **අණුන්ති** අල්ප සාවද්‍යයි. **ථූලන්ති** මහාසාවද්‍යයි. ඉතිරිය සියළු තැන්හි ප්‍රකට වන්නේය.

**සාමගාම සූත්‍ර වර්ණනාව නිමි.**

# 1.4.5

**එවමෙමසුතන්ති** සුනක්ඛත්ත සූත්‍රය මාවිසින් මෙසේ අසන ලදි. එහි **අඤ්ඤා** රහත් බව **ව්‍යාකතා ඛීණාශ්‍රව** ජාති ආදි පදයෙන් කියන ලදි. **අධිමානෙන** පැමිණිය යුතු සංඥාවට නොපැමිණ අවබෝධ නොකොට

අවබෝධ සංඥාවෙන් වී මා විසින් අවබෝධ කළේයැයි යන මානයෙන් ප්‍රකාශ කළහ. **එවං වෙත්‍ථ සුනක්ඛත්ත තථාගතස්ස හොති** සුනක්ඛත්තය, මෙහි මේ භික්ෂූන්ගේ ප්‍රශ්න විසඳීමෙහි මෙතැන මොවුන්ට නොවූ අඳුරෙකි. එබැවින් මොවුහු අවබෝධ නොකර අවබෝධ කරගත් සංඥා ඇත්තේය. එබැවින් එය පිරිසිදු කොට ප්‍රසිද්ධ කොට ධර්මය දේශනා කරන්නෙමියි මෙසේ ද තථාගතයන් වහන්සේට වෙයි. **අථ ච පනිධෙකච්චෙ -පෙ- පුථුජ්ජනනි තස්සපි හොති අඤ්ඤථත්තං** භාග්‍යවතුන් වහන්සේට පිළිපන්නවුන්ට ධර්මය දේශනා කරයි. යම් තැනක කැමති වාරයක සිටියා වූ සමහරු හිස් පුරුෂයෝ වෙති. එහිදී භාග්‍යවතුන් වහන්සේ මොවුහු මේවා ඉගෙන නොදැනම දත්නාක් මෙන් නොපැමිණීම පැමිණි සංඥා ඇත්තාහු වී ගම් නියම්ගම්වල ආදියෙහි විශේෂයෙන් කියන්නාහු හැසිරෙත්ය යන්න දකියි. එය ඔවුන්ට බොහෝ කල් අහිත පිණිස දුක් පිණිස වෙයි. මෙසේ කැමති වාරයෙහි සිටින්නවුන්ගේ කාරණා ද පිළිපන්නවුන්ට වැඩ පිණිස ධර්මය දේශනා කරන්නෙමියි උපන් සිතේ වෙනස් භාවයක් වෙයි. මෙය ඒ සඳහා කියන ලදි. **ලොකාමිසාධිමුත්තො** පංචකාමයෙහි ඇලුණු, එහිම නිමග්න වූ එහිම බර වූ **තප්පති** රුචියයි. කාමගුණ සභාගයි. **ආනඤ්ජ පටිසංයුත්තාය** ආනඤ්ජ සමාපත්තියෙන් යුතු **සංසෙය්‍ය** කියන්නේ **ආනඤ්ජ සංයොජනෙන හි බො විසංයුත්තො** ආනඤ්ජ සමාපත්ති සංයෝජනයෙන් යුතු ලොකාමිසාධිමුත්තො මෙබඳු වූ රළු සිවුරු ඇතිව මැටි පාත්‍රයක් ගෙන තමා සමානයන් සමඟ පිටිසර ගමට යයි. ගමට පිඬු පිණිස පැමිණි කල මිනිස්සු දැක මහා පාංශුකූලිකයෝ පැමිණියාහුය. කැඳ බත් ආදිය පිළියෙළ කොට සකසා දන් දෙති. බත්කිස නිම වූ කල්හි අනුමෝදනාව අසා ස්වාමීනි හෙට ද මෙහිම පිඬු පිණිස වඩින්න යැයි කියයි. උපාසකවරුනි, කම් නැත. අද ද බොහෝ සේ දුණි. ස්වාමීනි, මේ වස් කාලය මෙහිම වැඩ සිටින්න යැයි කී කල එය ඉවසා විහාරයට යන මාර්ගය අසා විහාරයට යති. එහි සෙනසුන් ගෙන පාත්‍ර සිවුරු තැන්පත් කරති. සවස් කල ආවාසිකයෙක් ඒ භික්ෂූන් විචාරයි. පිඬු පිණිස හැසිරුනේ කොහේද? අසවල් ගමය. ආහාර ලැබුනේ ද? එසේය, ඒ මිනිස්සු ශ්‍රද්ධා ඇත්තේ වෙයි. මොවුහු අද පමණක් මෙබඳු ශ්‍රද්ධා ඇත්තේද? හැමදාම මෙබඳුමද? ශ්‍රද්ධා සම්පන්න මිනිස්සු හැමදාම එබඳුය. මේ විහාරය ඔවුන් නිසාම දියුණු වෙයි. එයින් එයින් ඒ පාංශුකූලිකයෝ නැවත නැවත ඔවුන්ගේ ගුණ කියති. දවසේ ඉතිරියෙහි ද කියා රාත්‍රියෙහි ද කියති. මෙපමණකින් කැමති වාරයෙහි සිටියහුට වෙයි. මෙසේ ලෝකාමිසාධිමුත්තිය දත යුතුය. දැන් ආනඤ්ජ සමාපත්ති ලාභියා දක්වන්නේ **ඨානං බො පනෙතං** යනාදිය කීහ. **ආනඤ්ජාධිමුත්තස්ස**

කෙලෙස් සිඳීමෙන් තොර යට සමාපත්ති හයෙහි ඇලුණු. සෙපවුතෙන එය කියන ලදි. සමාපත්ති හය ලාභී අධිමානසික පංචකාම ගුණයෙන් බැඳුණු පණ්ඩුපලාසයා මෙන් පැමිණෙයි. එහෙයින් කියන ලදි. දැන් ආකිඤ්චඤ්ඤායතන සමාපත්ති ලාභියාගේ අධිමානසිකත්වය දක්වන්නට ඨානං බො පන යනාදිය කීහ. එහි ඓවධා ගිනනා මැදින් බිඳුණු අපාටි සන්ධිකා ලාකඩවලින් හෝ ඇලවිය නොහැකි සෙහින්නෙ බිඳුණු. මතුවෙහි මතුවෙහි සමාපත්තිලාභීන් විසින් පහත් සමාපත්ති දෙකෙන් බිඳුණු සීලයෙන් මෙන් වෙයි. එය සමාදන් වන්නෙමියි සිත නො උපදවන්නේ ම ය. එහෙයින් කියන ලදි. ආනඤ්ජ සංයොජනෙහි බො විසංයුතෙනා ආනඤ්ජ සමාපත්ති සංයෝජනයෙන් වෙන්ව, දැන් නේවසංඥානාසංඥායතන ලාභීන්ට අධිමානසිකයාගේ දොස් දක්වන්නේ ඨානං බො පන යනාදිය කීය. එහි සෙවන්තෙ අෂ්ට සමාපත්තිලාභීන්ට යට සමාපත්ති පිළිකුල්ව වැටහෙති. නැවත සමාදන් වන්නෙමියි සිතක් නූපදියි. එහෙයින් කියන ලදි. දැන් ක්ෂීණාශ්‍රවයන්ගේ දක්වන්නේ ඨානං බො පන යනාදිය කීහ. එහි සෙ උච්ඡිනෙන එය නසන ලද, මතු සමාපත්තිලාභීන්ට යට යට සමාපත්ති මුලින් සිඳින ලද තල්ගසක් මෙන් වැටහෙයි. තං සමාපජ්ජිස්සාමි එහි සිත නූපදියි. එහෙයින් කියන ලදි. සමණෙන බුද්ධ ශ්‍රමණයා ජන්දරාගව්‍යාපාදෙන ඔහු අවිද්‍යා සංඛ්‍යාත වූ විසෙන් ජන්ද රාගයෙන් ද ව්‍යාපාදයෙන් ද කිපෙයි. අසප්පායානි අරමුණු අනුද්ධංසෙය්‍ය වියැලෙන්නේය. මැලවෙන්නේය. සඋපාදිසෙසං ගැනීම් සහිතව ඉතිරිය ගත යුතුයි. ගැනීම් සහිත අර්ථයෙන් උපාදීති යැයි කියන ලදි. අනලඤ්ච තෙ අන්තරායාය ඒවා නුඹගේ ජීවිතයට අන්තරායක් කරන්නට අසමත් රජොසුකං දූවිලි ආදිය සූක නම්. අසුචි විස දොසො එය ද විස දෝෂයයි. තදූභයෙන යම් ඒ අසැපයට ක්‍රියාවක් වේද එය ද විස දෝෂයයි. ඒ දෙකෙන් පුථුත්තං මහත් බව එවමෙව බො මෙහි සඋපාදානය උලක් ගලවන්නාක් මෙන් ප්‍රහීන නොවූ අවිද්‍යා විෂ දෝෂය දැකිය යුතුයි. අසප්‍රාය ක්‍රියාවෙන් සිටි බැවින් මෙන් දොරටු හයෙහි අසංවුත කාලයයි. ඒ දෙකෙන් වණය මහත් වී ගිය මරණය මෙන් ශික්ෂා සිහි කිරීමෙන් පහත් බවට පැමිණියේ වෙයි. මරණ මාත්‍ර දුකක් මෙන් වෙනත් මහත් කිළිටි බවට පැමිණීමෙන් ආපජ්ජනය දත යුතුයි. ශුක්ලපක්ෂයෙන් මෙන් මේ ක්‍රමයෙන් උපමා සංසන්දනය දත යුතුයි. සතියා එතං අධිවචනං මෙහි සිහිය ප්‍රඥාගතිකයයි. ලෞකික ප්‍රඥාවෙන් ලෞකික වෙයි. ලෝකෝත්තරයෙන් ලෝකෝත්තර වෙයි. අරියායෙතං පිරිසිදු විදර්ශනා ඥානයෙන් පෙනෙයි. දැන් ක්ෂීණාශ්‍රවයන්ගේ බලය දක්වන්නේ සො වතාති යනාදිය කීහ. එහි සංවුතකාරී වසන ලද ඉති විදිත්වා නිරූපධී මෙසේ දැනගෙන කෙලෙස් නැති කිරීම නිරූපදානයයි.

උපධිසංඛයෙ විමුත්තො උපධි යැයි කියන ලද නිවන ගැන අරමුණු ගැනීමෙන් මිදීම උපධිසඞ්ඛ කාමුපධියෙහි, නිවනෙහි අරමුණු වශයෙන් මිදුණු රහතන් වහන්සේ පස්කම් සෙවුනා ලද සිරුර හෝ සංසිඳුවන්නේය. සිත හෝ උපදවන්නේය. යන මේ කාරණය විද්‍යාමාන නොවෙයි. ඉතිරිය සියළු තැන්හිම ප්‍රසිද්ධය.

සුනක්ඛත්ත සූත්‍ර වර්ණනාව නිමි.

## 1.4.6

එවමෙමසුතනති මාවිසින් ආනඤ්ජසප්පාය සූත්‍රය මෙසේ අසන ලදි. එහි අනිච්චාති ඇතිවී නැති වන බැවින් අස්ථිර වූ. කාමාති වස්තු කාමය හා ක්ලේශ කාමයයි. තුච්ඡාති නිත්‍ය සාර ස්ථිරසාර ආත්ම සාරයක් විරහිත බැවින් හිස්ය. නොවේයැයි නොගන්න යැයි හිස් මිටක් යැයි කීකල මිටක් නම් නැතැයි කියන ලද්දේ වෙයි. යමෙකුගේ අභ්‍යන්තරයෙහි කිසිවක් නැත. ඔහු හිස්යැයි කියයි. මුසාති විනාශය. මොසධම්මාති නැසුණු ස්වභාවයයි. කුඹුරක් මෙන් වස්තුවක් මෙන් රත්තරන් රන් අමුරන් මෙන් පෙනී කිහිප දවසකින් සිහිනයක් දැක්කාක් මෙන් නැසෙත්. නොපෙනෙත්. එහෙයින් මෝසධර්මය යැයි කියන ලදි. මායාකතමෙතනති යම්සේ මායාවෙන් ජලය මැණිකක් කොට දක්වන ලදි. දෙබරකොළය කහවණුවක් කොට දක්වන ලදි. වෙනත් මෙබඳු හෝ රූපයක් දක්වන්නේ සිටියහුට එසේම පෙනෙයි. ඒ ස්ථානයෙන් ඉවත්වුනාම ප්‍රකෘතියෙන්ම පෙනෙයි. පංචකාමයෝ ද එසේමය. පච්චුපට්ඨාන අර්ථයෙන් මායාකතන්ති යැයි කියන ලදි. යම්සේ මායාකාරයෙක් ජලය ආදියෙහි මැණික් ආදි වශයෙන් පෙන්වන්නේ වංචාකරයි. මෙසේ කාමය ද අනිත්‍යාදි ස්වභාවයෙන් නිත්‍යාදි ස්වභාවය දක්වන්නේ වංචාකරත්. වංචනික අර්ථයෙන් මායාකතන්ති යැයි කියන ලදි.

බාලලාපනනති මාගේ පුතා මාගේ දූව මාගේ රත් අමුරන් යැයි මෙසේ බාලයන්ගේ බාල කථායි. දිට්ඨධම්මිකාකාමාති පංචකාම ගුණයෝ මානුෂිකය. සම්පරායිකාති ඒවාහැර ඉතිරි ඒවා මේ ආත්මයේම විඳින සුළුයි. කාමසඤ්ඤාති මානුෂික කාමයන් අරබයා උපන් සංඥාවයි.

**උභයමෙතං මාරධෙය්‍යන්ති** යන්න කියන ලදි. **මාරස්සෙස විසයොති** යනාදියෙහි යම්සේ වස්ත්‍රයේ විෂය වස්ත්‍ර විෂයයි. පාණ්ඩයාගේ විෂය පාණ්ඩව විෂයයි. පැවතීම් ස්ථාන වශයෙන් විෂය යැයි කියයි. යමෙක් විසින් මේවායෙහි කැමැත්ත ගන්නේ ද ඒවා මත්තෙහි මාරයා විෂය පවත්වයි. ඒ සඳහා **මාරස්සෙස විසයොති** යි කියන ලදි. පංච කාමගුණයන්හි සතුන්ට කෑම දමන්නාක් මෙන් මාරයා ගමන් කරයි. යමෙක් විසින් මේවායෙහි කැමැත්ත ගන්නේ ද ඒවා මත්තෙහි මාරයා විෂය පවත්වයි. ඒ සඳහා **මාරස්සෙස නිවාපොති** යන්න කියන ලදි. යම්සේ යම්තැනක ඇත් ආදීන් විෂය පවත්වත් ද එය ඇත් ගෝචරයි. අශ්ව ගෝචර එළු ගෝචර යැයි කියයි. යමෙක් විසින් මේවායෙහි කැමැත්ත ගන්නේ ද ඒවා මත්තෙහි මාරයා විෂය පවත්වයි. ඒ සඳහා **මාරස්සෙස ගොචරොති** යි කියන ලදි. **එත්ථාති** මේ කාමයන් කෙරෙහි. **මානසාති** සිතින් රැස් කරන ලද. එහි පළමුව දෙවැදෑරුම් කාමය අරබයා අභිධ්‍යාදි ලක්‍ෂණ අභිධ්‍යාවයි. කාරනුත්තරිය ලක්‍ෂණයන්ගෙන් සාරම්භ ද ඉපදීම් ව්‍යාපාදයයි. කෙසේ උපදී ද? මමායිත වස්තු සිඳුණේ ශෝක කරත්. ඔහු මෙසේ රූප සිතේ පරිසාතනය වේයැයි මෙසේ උපදියි. **තෙව අරියසාවකස්සාති** ආර්ය ශ්‍රාවකයාගේ ඒවා.

ච කාරය ආගම සන්ධි මාත්‍රයක් වෙයි. **ඉධ මනුසික්ඛතොති** මේ ශාසනයෙහි හික්මෙන තැනැත්තාට ඒ කෙලෙස් තුන ම අන්තරායකර වේ. **අභිභූය්‍ය ලොකන්ති** කාමගුණ නැමැති ලෝකය මැඩගෙන. **අධිට්ඨාය මනසාති** ධ්‍යාන ආරම්බන සිතින් අධිෂ්ඨාන කොට. **අපරිත්තන්ති** කාමාවචර සිත පරිත්ත නම්. එය ප්‍රතික්‍ෂේප කිරීමෙන් මහග්ගතය අපරිත්ත නම්. **පමාණන්ති** කාමාවචරමය. අප්‍රමාණ රූපාවචරය අරූපාවචරයයි. **සුභාවිතන්ති** මෙය කාමාවචරාදීන්ට නමක් නොවෙයි. මෙය ලෝකෝත්තරයන්ටම නමකි. එහෙයින් මේ වශයෙන් අපරිත්තය අප්‍රමාණය සුභාවිතය යන සියල්ල ලෝකෝත්තරයට ම වටියි. **තබ්බහුලවිහාරිනොති** කාමය ප්‍රතිබාහනයෙන් ප්‍රතිපදාව ම බොහෝ කොට වාසය කරන්නහුගේ **ආයතනෙ චිත්තං පසීදතීති** කාරණයෙහි පහදියි. මෙහි කාරණය නම් කුමක් ද? රහත්බව හෝ රහත්වීමට විදසුන් වැඩීම හෝ හතරවන ධ්‍යානය හෝ හතරවන ධ්‍යානයෙහි උපචාර හෝ **සම්පසාදෙ සතීති** මෙහි සම්ප්‍රසාදය දෙයාකාරයි.

අධිමෝක්‍ෂ සම්ප්‍රසාදය හා ප්‍රතිලාභ සම්ප්‍රසාදයයි. රහතන් වහන්සේ විසින් විදර්ශනාව පිහිටුවා වාසය කරන්නේ මහාභූතාදීන්හි එළඹ සිටීම් අත්හරින්නේ මහාභූතයි. **උපට්ඨහන්ති** උපාදාරූපය එළඹ සිටියි. නාම

රූපය එළඹ සිටියි. සියළු ආකාරයෙන් ප්‍රත්‍යයන් එළඹ සිටිත්. ලක්‍ෂණ ආරම්මණ විදර්ශනාව එළඹ සිටියි. අද ම රහත් බව ගන්නෙමි යි නොලද්දේ ම ආශ්‍රවයෝ සිටියි. අධිමෝක්‍ෂය ලබයි. තුන්වන ධ්‍යානය පාදක කොට හතරවන ධ්‍යානය සඳහා කසිණ පරිකර්ම කරන්නාට නීවරණ විෂ්කම්භනාදිය බලන්නාට යමකින් මේ අත්හරින්නේ නීවරණ විෂ්කම්භනයයි. කෙලෙස් ඇති කල්හි පිහිටයි. සංස්කාරයන් අනුව ගිය විභූතිය ප්‍රකට කොට දිවැස් ඇත්තාට පරලොව මෙන් එළඹ සිටියි. චිත්තුප්පාදයෙන් ලේප පිඩෙහි ඇලෙන්නාක් මෙන් උපචාරයෙන් සමාධිය වේ. අද ම හතරවන ධ්‍යානය උපදවන්නෙමි යි නොලද්දේ ආස්‍රවයෝ පිහිටත්. අධිමෝක්‍ෂ ලබයි. මේ අධිමෝක්‍ෂ සම්ප්‍රසාදය නම්. මේ සම්ප්‍රසාදය ඇති කල්හි යමෙක් රහත්බව හෝ ලබයි. ඔහුට හතරවන ධ්‍යානය හෝ විදර්ශනාව හෝ වෙයි.

**ඉධ පන ආයතනෙ චිත්තං පසීදතීති** රහත්වීමට විදර්ශනාවේ ද හතරවන ධ්‍යාන උපචාරයන්ගේ ද ලැබීම් ප්‍රතිලාභ සම්ප්‍රසාදය යැයි දතයුතුයි. විදර්ශනා ප්‍රඥාවෙන් විශේෂයෙන් මිදෙන්නහුගේ කාරණා උපචාර ආනඤ්ජ සමාපත්තියයි. **එතරහි වා ආනඤ්ජං සමාපජ්ජති පඤ්ඤාය වා අධිමුච්චතීති** මෙහි දූන් හෝ ප්‍රඥාවෙන් මිදෙයි. ආනඤ්ජයට හෝ පැමිණෙයි. මෙසේ පද පෙරලීම් කොට අර්ථය දත යුතුයි. මෙය කියන ලද්දේ වෙයි. එහි සම්ප්‍රසාදය ඇති කල්හි දූන් හෝ ප්‍රඥාවෙන් මිදෙයි. රහත්බව සාක්‍ෂාත් කරයි යන තේරුමයි. එය ආනඤ්ජයට හෝ පැමිණෙයි. නොහොත් ප්‍රඥාවෙන් මිදෙන්නේ යැයි අර්හත් මාර්ගය වඩයි. එය ආනඤ්ජයට හෝ පැමිණෙයි. අර්හත් මාර්ගය වඩන්නට අසමත් වන්නේ දූන් චතුරාර්ය සත්‍ය හෝ සාක්‍ෂාත් කරයි. එය ආනඤ්ජයට හෝ පැමිණෙයි. එහි මේ ක්‍රමයයි. මෙහි භික්‍ෂුව තුන්වන ධ්‍යානය පාදක කොට හතරවන ධ්‍යානයේ කසිණ පරිකර්මය කරයි. ඔහුගේ නීවරණයන් නැතිවෙත්. සිහිය පිහිටුවත්. උපචාරයෙන් සිත සමාධිගත වෙයි. ඔහු රූප අරූප හාත්පසින් ගනියි. ප්‍රත්‍ය හාත්පසින් ගනියි. ලක්‍ෂණ අරමුණු විදර්ශනා වශයෙන් ව්‍යවස්ථා කරයි. ඔහුට මෙසේ වෙයි. උපචාරයෙන් මට ධ්‍යාන විශේෂභාගියක් වන්නේය. සිටීවා. විශේෂභාගියෙන් නිබ්බේධභාගිය කරන්නෙමියි විදර්ශනාව වඩා රහත්බව සාක්‍ෂාත් කිරීම. මෘගයන් මැරීමට නොහැකිව අතරමඟ හාවුන් වැනි කුඩා සතුන් මරා ඕජස් පූරවන ගමන මෙන් රහත්බව සාක්‍ෂාත් කරන්නට නොහැකි වන්නේ එයින් හතරවන ධ්‍යානයට සමවදින බව දත යුතුයි. මාර්ග භාවනාවෙන් චතුරාර්ය සත්‍ය සාක්‍ෂාත් කිරීමෙහි ද මේ ක්‍රමයයි. දූන් රහත්බව සාක්‍ෂාත් කිරීමට නොහැකිවූවහුගේ උපදින ස්ථාන දක්වන්නේ **කායස්ස භෙදාති** යනාදිය

කීය. එහි යන්ති යම් කරුණකින් තං සංවත්තනික විඤ්ඤාණං අස්ස ආනඤ්ජූපගං ඒ කාරණය පවතීය යන තේරුමයි. මෙහි ද තං සංවත්තනිකන්ති ඒ භික්ෂුවගේ පැවතීම යම් විපාක ඥානයකින් ඒ භික්ෂුව එය උපදවා ද ඒ විඥානය ආනඤ්ජයට පැමිණියේ යැයි කුසලයන්ගේ ආනඤ්ජ ස්වභාවයටම පැමිණ ඔහුට එසේම වන්නේ යැයි යන තේරුමයි. සමහරු කුසල විඥානය යැයි කියත්. යම් එය ඒ භික්ෂුවගේ පැවතීම් උප්පත්තියට හේතුවක් වේද කුසල විඥානය ආනංජයට පැමිණීම ඔහුගේ විපාක කාලයෙහි ඒ නාමයයයි යන තේරුමයි. ඒ මේ අර්ථයෙන් පුණ්‍ය සංස්කාරයන් ද ආනංජය සංස්කාරයන් ද අභිසංස්කාරයන් යැයි ආනංජයට පැමිණියේ වෙයි. විඥානය ද මේ ක්‍රමයෙන් දත යුතුයි.

**ආනඤ්ජ සප්පායති** හතරවන ධ්‍යානයට සැපයයි මෙහි හුදෙක් ආනඤ්ජය ම රහත් බවට සැප නොවේ. උපකාර නොවේ යැයි දත යුතුයි. මෙසේ මේ පළමු ආනඤ්ජයෙහි සමාධි වශයෙන් ඔසක්කනයෙන් කියන ලදි. **ඉති පටිසඤ්චික්ඛති** හතරවන ධ්‍යානයට පැමිණ මෙසේ සිතයි. මේ භික්ෂුව යට කියන ලද භික්ෂුවට වඩා ප්‍රඥාවන්තය. ඒ භික්ෂුවත් තමාත් යන දෙදෙනා ම එක්ව කර්මස්ථානය සිහිකරයි. **තබ්බහුලවිහාරිආනඤ්ජං සමාපජ්ජතීති** ආකාසානඤ්චායතන ආනඤ්ජයට පැමිණෙයි ඉතිරිය මුලින් කීම හා සමානය. යම්සේ මෙහි සියළු තැන්හි ම මෙසේය. විශේෂ මාත්‍රයෙන් කියමි. මෙසේ මේ දෙවන ආනඤ්ජයෙහි විදර්ශනා වශයෙන් ඔසක්කනයෙන් කියන ලදි. **යං කිඤ්චි රූපන්ති** මෙසේ විදර්ශනා මාර්ගය පෙන්වා කියන ලදි යන තේරුමයි. **ඉති පටිසඤ්චික්ඛතීති** ආකාසානඤ්චායතනයට පැමිණ මෙසේ සිහිකරයි. මෙතෙමේ යට කී දෙදෙනාටම වඩා ප්‍රඥාවන්තය. ඒ භික්ෂූන්ට ද තමාට ද යන තිදෙනාටම එකට කර්මස්ථානය සිහිකරයි.

**උභයමෙතං අනිච්චන්ති** මෙහි මොනවට එක එක කොටස් දිට්ඨධම්මික සම්පරායික වශයෙන් සංක්ෂේප කොට උභය යැයි කියන ලදි. **නාලං අභිනන්දිතුන්ති** තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් සතුටු වන්නට යුතු නැත. සෙසු පද දෙකේ ද මේ ක්‍රමයයි. **තබ්බහුලවිහාරිනොති** කාම ප්‍රතිබාහනය රූප ප්‍රතිබාහනය යන එම ප්‍රතිපදාවන් බහුල කොට වාසය කරන්නහුගේ **ආනඤ්ජං සමාපජ්ජති** විඤ්ඤාණඤ්චායතන ආනඤ්ජයට පැමිණෙයි. මේ තුන්වන ආනඤ්ජයෙහි විදර්ශනා වශයෙන් ඔසක්කනයෙන් කියන ලදි. **ඉති පටිසඤ්චික්ඛතීති** විඤ්ඤාණඤ්චායතනයට පැමිණ මෙසේ සිහිකරයි. මෙතෙමේ යට කී තිදෙනාටම වඩා ප්‍රඥාවන්තය. ඒ භික්ෂූන්ට ද තමාට ද යන හතර දෙනාටම එකට කර්මස්ථානය සිහිකරයි. **යත්ථේතා අපරිසෙසා නිරුජ්ඣන්තීති** යම් ආකිඤ්චඤ්ඤායතනයකට පැමිණ යට

කියන ලද සියළු සංඥා නිරුද්ධ වෙත්. **එතං සන්තං එතං පනීතන්ති** මේ අංග ශාන්තභාවය ද අරමුණු ශාන්තභාවය ද ශාන්තිය අතප්ප අර්ථයෙන් ප්‍රණීතය. **තබ්බහුලවිහාරිනොති** ඒ සංඥාවන්ගේ ප්‍රතිබාහනයෙන් එම ප්‍රතිපදාවන් බහුල කොට වාසය කරන්නහුගේ මේ පළමු ආකිඤ්චඤ්ඤායතනයෙහි සමාධි වශයෙන් ඕසක්කනයෙන් කියන ලදි. **ඉති පටිසඤ්චික්ඛති** විඤ්ඤාණඤ්චායතනයට පැමිණ මෙසේ සිහිකරයි. මෙතෙමේ යට කී භික්ෂූන් හතර දෙනාට ම වඩා ප්‍රඥාවන්තය. ඒ භික්ෂූන්ට ද තමාට ද යන පස්දෙනාටම එකට කර්මස්ථානය සිහිකරයි. **අත්තෙන වා අත්තනියෙන වාති** මම මාගේ යැයි ගැනීමෙන් ශූන්‍යය. තුච්ඡය හිස්ය. මෙසේ මෙහි ද්වි කෝටික ශූන්‍යතාව දක්වන ලදි.

**තබ්බහුලවිහාරිනොති** යට කියන ලද ප්‍රතිපදාව ද මේ ශූන්‍යතා ප්‍රතිපදාව ද බහුල කොට වාසය කරන්නහුගේ මේ දෙවන ආකිඤ්චඤ්ඤායතනයෙහි සමාධි වශයෙන් ඕසක්කනයෙන් කියන ලදි. **ඉති පටිසඤ්චික්ඛති** විඤ්ඤාණඤ්චායතනයටම පැමිණ මෙසේ සිහිකරයි. මෙතෙමේ යට කී භික්ෂූන් පස්දෙනාටම වඩා ප්‍රඥාවන්තය. ඒ භික්ෂූන්ට ද තමාට ද යන හයදෙනාටම එකට කර්මස්ථානය සිහිකරයි. **නාහං ක්වචිති කස්සචි කිඤ්චන තස්මිං න ච මම ක්වචිති කස්සචි කිඤ්චන නත්ථි** කෙසේ ද? මේ මම ක්වචිති යැයි කිසිවක් තමාගේ යැයි නොබලයි. කිසිවෙක් කිසිවක් වී යැයි තමතමන්ගේ කිසිවක් අනුන්ගේ කිඤ්චනභාවයක් එළඹවන්නේ ද නොබලයි. තමාගේ සහෝදර ස්ථානයෙහි සහෝදරයා ද යහලුවාගේ ස්ථානයේ යහලුවා ද පිරිකර ස්ථානයෙහි පිරිකර යැයි දූන සමීපයට පැමිණ එළඹවන්නේ ද නොබලයි යන තේරුමයි. මෙහි පළමුව මාගේ ශබ්දය තබා අනුන්ගේ ද තමන්ගේ ද කිසිවක් බලන්නේය යන මේ තේරුමයි. දූන් මාගේ ශබ්දය ගෙන මාගේ කිසියම් කිඤ්චනයක් නැතැයි යමෙක් අනුන්ගේ ආත්මය මාගේ කිසියම් කිඤ්චනභාවයක් ඇතැයි නොබලයි. තමාගේ සහෝදර ස්ථානයෙහි සහෝදරයා ද යහලුවාගේ ස්ථානයේ යහලුවාද පිරිකර ස්ථානයෙහි පිරිකර ද හෝ කිසියම් ස්ථානයක අනුන්ගේ හා තමන්ගේ මේ කිඤ්චනභාවයන් එළඹවන්නේ ද නොබලන්නේය යන තේරුමයි. එහෙයින් මේ චතුෂ්කෝටික ශූන්‍යතාවය යැයි දත යුතුයි.

**තබ්බහුලවිහාරිනොති** යට කියන ලද ප්‍රතිපදාව ද මේ චතුෂ්කෝටි ශූන්‍යතාව ද බහුල කොට වාසය කරන්නහුගේ මේ තුන්වන ආකිඤ්චඤ්ඤායතනයෙහි සමාධි වශයෙන් ඕසක්කනයෙන් කියන ලදි. **ඉති පටිසඤ්චික්ඛතීති** විඤ්ඤාණඤ්චායතනයට පැමිණ මෙසේ සිහිකරයි. මෙතෙමේ යට කී භික්ෂූන් හයදෙනාටම වඩා ප්‍රඥාවන්තය. ඒ භික්ෂූන්ට ද

Scanned with CamScanner

තමාට ද යන හත්දෙනාටම එකම කර්මස්ථානය සිහිකරයි. **යත්ථෙතා අපරිසෙසා නිරුජ්ඣන්තීති** යම් නේවසංඥානාසංඥායතනයකට පැමිණ මෙහි යට කියන ලද මේ සියලු සංඥා නිරුද්ධ වෙත්. **තබ්බහුලවිහාරිනොති** ඒ සංඥාවන්ගේ ප්‍රතිබාහනයෙන් ඒ ප්‍රතිපදාවම බහුල කොට වාසය කරන්නහුගේ මේ නේවසංඥානාසංඥායතන වශයෙන් ඕසක්කනයෙන් කියන ලදි. **නො චස්ස නොච මෙ සියාති** ඉදින් පූර්වයෙහි මාගේ පස් වැදෑරුම් කර්ම වැට රැස් නොකරන ලද්දේ දැන් යම් මේ පස් වැදෑරුම් විපාක වැටක් වේ ද මාහට මෙය නො පවතින්නේ ය යන තේරුමයි. **න මෙ භවිස්සතීති** එහි නො වන්නේ ය. අනාගතයෙහි මම පස්වැදෑරුම් විපාක වැට නො වන්නේ ය. **යදත්ථි යං භූතං තං පජහාමීති** යමක් ඇත් ද යමක් වීද දැන ඒ ස්බන්ධ පංචකය හරිමි. **එවං උපෙක්ඛං පටිලභතීති** ඒ භික්ෂුව මෙසේ විදර්ශනානුපේක්ෂය ලබන්නේය යන තේරුමයි. **පරිනිබ්බායි නු ඛො එසො භන්තෙති.** ස්වාමීනි ඒ භික්ෂුව පිරිනිවන් පාන්නේ දැයි අසමි. තුන්වන ධ්‍යානය පාදක කොට සිටිය තැනැත්තාට රහත්බව ද ඕසක්කනය ද ප්‍රතිපදාව ද ප්‍රතිසන්ධිය ද කියන ලදි. එසේ හතරවන ධ්‍යානාදිය පාදක කොට සිටිය තැනැත්තන්ට ද නේවසංඥානාසංඥායතන පාදක කොට සිටිය තැනැත්තාට ද කිසිවක් නොකියන ලදි. එය අසමි. **අපෙත්ථාති** නැවත මෙහි. **සො තං උපෙක්ඛං අභිනන්දති** ඔහු ඒ විදර්ශනාව අනුව බැලීමෙන් තෘෂ්ණා දෘෂ්ටි අභිනන්දනාදියෙන් සතුටු වෙයි. සෙසු පද දෙකෙහි ද මේ ක්‍රමයයි.

**තන්නිස්සිතං හොති විඤ්ඤාණන්ති** විදර්ශනාව නිශ්‍රිත වෙයි. **තදුපාදානන්ති** ඒ උපාදානයාගේ ගැනීම නම් වෙයි. **ස උපාදානොති** ගැනීම සහිත **න පරිනිබ්බායති** විදර්ශනාවෙහි අලස භික්ෂුව මාගේ ශාසනයෙහි පිරිනිවන් පාන්නේ නැත. යමෙක් විහාර පිරිවෙන් උපස්ථාන කිරීම ආදියෙහි ආලය සහිත නම් එහි කිවයුතු දෙයක් නැතැයි දක්වයි. **කහං පනානි** කොතන ද? **උපාදියමානො උපාදියතීති** පිළිසිඳ ගැනීම ගන්නේ වෙයි. **උපාදාන සෙට්ඨං කිර සො භන්තෙති.** ස්වාමීනි ඒ භික්ෂුව ගතයුතු ශ්‍රේෂ්ඨ උතුම් භවයම ගනියි. ශ්‍රේෂ්ඨ භවයෙහි පිළිසිඳ ගැනීමය යන තේරුමයි. මෙයින් ඒ භික්ෂුවගේ ප්‍රතිසන්ධිය කියන ලදි. දැන් ඔහුගේ රහත් බව කියන්නට **ඉධා නන්දාති** යනාදිය කීය. **නිස්සාය නිස්සායාති** ඒ ඒ සමාපත්තීන් නිසා **ඔඝස්ස නිත්ථරණා අක්ඛාතාති** ඕඝයෙන් එතරවීම් කියන ලදි. තුන්වන ධ්‍යානය පාදක කොට සිටි භික්ෂුවගේ ඕඝයෙන් එතරවීම කියන ලදි. -පෙ- නේවසංඥානාසංඥායතනය පාදක කොට සිටි භික්ෂුවගේ ඕඝයෙන් එතරවීම් කියන ලද්දේ යැයි කියයි. **කතමො**

**පන භනෙත අරියො විමොකෙඛාති** මෙහි කුමක් අසයි ද? සමාපත්තිය පළමුකොට පදස්ථානය කොට විදර්ශනාව වඩා රහත්වන භික්ෂුව නැව හෝ පහුර හෝ නිසා මහා ඕසය එතර වී එතරට යන්නාක් මෙන් වෙහෙස නොවෙයි. ශුෂ්ක විදර්ශක තෙමේ ප්‍රකීර්ණ සංස්කාර සිහිකොට රහත්බව ගන්නේ බාහු බලයෙන් සැඩ පහර සිඳ එතරට යන්නාක් මෙන් වෙහෙස වෙයි. මෙසේ මේ ශුෂ්ක විදර්ශකයාගේ රහත් බව ඇසීමයි. **අරියසාවකොති** ශුෂ්ක විදර්ශක ආර්ය ශ්‍රාවකයායි. මෙතෙමේ යට කියන ලද භික්ෂූන් අටදෙනා අතුරෙන් වඩාත් ප්‍රඥාවන්තය. ඒ භික්ෂූන්ගේ ද තමාගේ ද යන නව දෙනාගේ ම කමටහන එකට සිහිකරයි. **එසසකකායො යාවතා සකකායොති** යම් ප්‍රමාණ ත්‍රෛභූමික වෘතයැයි කියන සත්කාය ඇත. ඒ සියළු සත්කායෝ මෙයින් මතු සත්කායක් නොව ඇතැයි සිතයි. **එතං මෙ අමතං යදිදං අනුපාදා චිත්තසස විමොකෙඛාති** සිතේ අල්ලා නොගන්නේ විමෝක්‍ෂය නම් වෙයි. මෙය අමෘතයි මෙය ශාන්තයි. ප්‍රණීතයි යැයි සිහි කරයි. **අඤ්ඤතථා ච අනුපාදා චිත්තසස විමොකෙඛාති** නිවන යැයි කියයි. මේ සූත්‍රයෙහි ශුෂ්ක විදර්ශකයාගේ රහත්බව කියන ලදි. ඉතිරිය සියළු තැන්හිම ප්‍රකට ය.

හුදෙක් මේ සූත්‍රයෙහි හත් තැනක ඔසක්කනය කියන ලදි. අට තැනක ප්‍රතිසන්ධිය ද නව තැනක රහත් බව ද කියන ලද්දේ යැයි දත යුතුයි. කෙසේ ද? තුන්වන ධ්‍යානය පළමුව පාදක කොට සිටිය භික්ෂුවගේ ඔසක්කනය කියන ලදි. ප්‍රතිසන්ධිය කියන ලදි. රහත් බව කියන ලදි. හතරවන ධ්‍යානය ද එසේමය. ආකාසානඤ්චායතනය ද එසේමය. විඤ්ඤාණඤ්චායතනය පාදක කොට සිටිය භික්ෂූන් දෙදෙනාගේ ඔසක්කනය කියන ලදි. ප්‍රතිසන්ධිය කියන ලදි. රහත් බව කියන ලදි. ආකිඤ්චඤ්ඤායතනය පාදක කොට සිටිය භික්ෂුවගේ ද එසේමය. නේවසංඥානාසංඥායතනය පාදක කොට සිටියහුගේ ඕසක්කනය නැත. ප්‍රතිසන්ධිය ද රහත් බව ද කියන ලදි. ශුෂ්ක විදර්ශකයාගේ රහත්බව ම කියන ලදි. මෙසේ ගත් තැනක ඕසක්කනය කියන ලදි. අට තැනක ප්‍රතිසන්ධිය ද නව තැනක රහත් බව ද කියන ලද්දේ යැයි දත යුතුයි. මෙය ද හත් තැනක ඕසක්කනය අට තැනක ප්‍රතිසන්ධිය ය. නව තැනක රහත්බව එකතුකොට කියන්නේ මේ ආනඤ්ජසප්පාය සූත්‍රය මනාකොට කියන ලද්දේ වෙයි.

**ආනඤ්ජ සප්පාය සූත්‍ර වර්ණනාව නිමි.**

## 1.4.7

එවමෙමසුතනති ගණකමොග්ගල්ලාන සූත්‍රයයි. එහි **පච්ජිමා සොපානකළෙබරාති** යම්තාක් පළමු සෝපාන ඵලකයෝයි. එක් දවසකින් සත්මහල් ප්‍රසාදයක් තනන්නට නොහැකිය. භූමිය ශුද්ධ කරවා ටැඹ ඉස්සීමේ පටන් සිත්කම් කිරීමාදී පූර්ව අනුක්‍රියා මෙහි පෙනෙන්නේ යැයි දක්වයි. **යදිදං අජ්ඣෙනෙති** වේදත්‍රය එක් දවසකින් හදාරන්නට නොහැකිය. මොවුන්ගේ හැදෑරීම ද පූර්ව අනුක්‍රියාවෙන්ම පෙනෙන්නේ යැයි දක්වයි. **ඉස්සත්ථෙති** ආයුධ විද්‍යාවෙන් එක් දවසකින් වාලවේධිය තත්ත්වයට පත්වන්නට නොහැකිය. ස්ථාන පිළියෙළ කිරීම් ආදි පූර්ව ක්‍රියාවන් පෙනෙන්නේ යැයි දක්වයි. **සඞ්ඛානෙනාති** ගණන් කිරීමයි. එහි පූර්ව ක්‍රියාවන් තමාම දක්වන්නේ මෙසේ ගන්නේ යැයි කීය. **සෙය්‍යථාපි බ්‍රාහ්මණොති** යම් හෙයකින් බාහිර ආගම්වල යම් යම් ශාස්ත්‍ර ඉගෙන ගනිත් ද එසේම කෛරාටික වෙති. එහෙයින් තම ශාසනය බාහිර ශාසනත් සමඟ උපමා නොකොට යහපත් අජානීය අශ්වයා සමඟ උපමා කරමින් සෙය්‍යථාපි යනාදිය කීහ. යහපත් අජානීය අශ්වයා යම් දෙයක හික්මවන ලද්දේ ද එය ජීවිත හේතුව නිසාවත් නොඉක්මවයි. එපරිද්දෙන්ම ශාසනයෙහි මනාකොට පිළිපන් භික්ෂුව සීලය නැමති සීමාව නොඉක්මවයි. **මුඛාධානෙති** මුඛයෙහි තබා ගැනීමයි. **සති සම්පජඤ්ඤායචාති** සති සම්පජඤ්ඤයෙන් සමන්විත භාවය පිණිසයි. රහතන් වහන්සේලා දෙනමකි. එක් නමක් නිතර සිහි කරයි. අනෙත් නම නිතර සිහි නොකරයි. එහි නිතර සිහි කරන නමට යම්කිසි කටයුත්තක් කොට ඵල සමවතට සමවැදීමට හැකිය. අනෙත් නමට ස්වල්ප කටයුත්තක් ඇත්තේ ඵල සමවතට සමවැදීමට නොහැකිය. එහි මේ වස්තුවයි. එක් රහතන් වහන්සේ නමක් රහත් සාමණේරයන් වහන්සේ නමක් සමඟ ආරණ්‍යයෙහි විසීමට වැඩියේය. එහි දී මහ තෙරුන්ට සෙනසුනක් ලැබුණි. සාමණේරයන්ට නොලැබුණි. එය කල්පනා කරන්නේ තෙරුන් වහන්සේ එකදු දවසක් ද ඵල සමවතට පැමිණීමට නොහැකි විය. සාමණේරයන් තුන් මසක් ඵල සමවතින් කල් යවා ස්වාමීනි, ආරණ්‍ය වාසය සැපදැයි ඇසීය. ඇවැත්නි, සැප නැතැයි තෙරුන් වහන්සේ කීහ. මෙසේ මෙබඳු වූ රහතන් වහන්සේ ද මේ ධර්මය මුල පටන් ආවර්ජනය කොට සමවැදීමට නොහැක්කේ යැයි දක්වමින් සති සම්පජඤ්ඤය කීහ. **යෙ මෙ භො ගොතමාති** තථාගතයන් යැයි කියන කියන කළ බමුණාට මේ පුද්ගලයෝ සිත් සතුටු නොකරෙත් යැයි යන ක්‍රමය පහළ විය. **පරමජ්ජධම්මෙසු** අජ්ජධර්ම නම් ශාස්තෘවරු හය දෙනාගේ ධර්මයයි. ඒ අතරින් ගෝතම වාදයම උතුම්ය යන තේරුමයි. ඉතිරිය ද සියළු තැන්හිම ප්‍රකටය.

**ගණකමොග්ගල්ලාන සූත්‍ර වර්ණනාව නිමි.**

# 1.4.8

එවමෙමසුතනති ගෝපකමොග්ගල්ලාන සූත්‍රයයි. අචිරපරිනිබ්බුතෙ භගවතීති භාග්‍යවතුන් වහන්සේ පිරිනිවී ධාතු බෙදීම් කොට ධර්ම සංගායනා කරන්නට රජගහ නුවරට ආ කාලයෙහි **රඤ්ඤෝ පජ්ජෝතස්ස** ආසංකමානොති චණ්ඩපජ්ජෝත නම් රජු බිම්බිසාර රජුගේ යහළුවෙකි. ජීවක යවා බෙහෙත් කරවන ලද කල පටන් අතිශයින් මිත්‍ර විය. ඔහු අජාසත්ත විසින් දේවදත්තගේ වචනය ගෙන පියා මැරුවේ යැයි අසා මාගේ ප්‍රිය මිත්‍රයා මරා මොහු රාජ්‍ය කරන්නේ යැයි සිතයි. මාගේ යහළුවාගේ මිත්‍රභාවය ඇති බව දැනුම් දෙමියි මෙසේ කීය. එය අසා ඔහුට සැකයක් ඉපදුනි. එහෙයින් රඤ්ඤෝ පජ්ජෝතස්ස ආසංකමානොති යන්න කියන ලදි. **කම්මනෙතාති** පිට නගරයෙහි නගර අළුත්වැඩියා කිරීම පිණිස කටයුතු කරන තැනට **උපසඞ්කමීති** අපි ධර්ම විනය සංගායනා කිරීමට හැසිරෙමු. මොහු මහේශාක්‍ය රාජ වල්ලභයෙකි. සංග්‍රහ කළාම වේළුවනය ආරක්ෂා කරන්නේ යැයි සිතමින් පැමිණියේය. **තෙහි ධම්මෙහීති** ඒ සර්වඥතා ඥානයෙහි **සබ්බෙන සබ්බනති** සියළු ආකාරයෙන් සියල්ල **සබ්බථා සබ්බනති** සියළු කොටස් වලින් සියල්ල කුමක් අසම්දැයි අසයි. ශාස්තෘවරු හයදෙනා පළමුව උපන්නේ ය. අප්‍රසිද්ධ කුල වලින් නික්ම පැවිදි විය. ඔවුහු තථාගතයන් වහන්සේ වැඩ සිටිද්දීම කළුරිය කළහ. ඔවුන්ගේ ශ්‍රාවකයෝ ද අප්‍රසිද්ධ කුල වලින් නික්ම පැවිදි විය. ඔවුහු තථාගතයන් වහන්සේ වැඩසිටිද්දීම කළුරිය කළහ. ඔවුන්ගේ ශ්‍රාවකයෝ ද අප්‍රසිද්ධ කුල වලින්ම පැවිදි විය. ඔවුන්ගේ ඇවෑමෙන් මහත් වාදවිවාද කළහ. මහණ ගොයුම්තෙමේ උසස් කුලයෙන් නික්මව පැවිදි විය. උන්වහන්සේගේ ඇවෑමෙන් ශ්‍රාවකයන්ගේ මහත් විවාදයක් වන්නේ යැයි මේ කථාව සියළු දඹදිව පැතිර ගියේය. බුදුරදුන් වැඩසිටිද්දී භික්ෂූන්ගේ වාදයක් නොවීය. යම් වාදයක් වුණි ද එය එහිම සංසිඳුණි. පරිනිර්වාන කාලයෙහි යොදුන් හැට අටදහස් සියයක් වූ සිනේරු පර්වතය සොලවන්නට සමර්ථ වූ සුළඟ ඉදිරියෙහි පැරණි කොලයක් කෙසේ සිටින්නේ ද? දස පාරමිතා පුරා සර්වඥ බවට පත්වූ ශාස්තෘන් වහන්සේට අලජ්ජී වූ මරු කවරෙක් අනෙකෙක් ලැජ්ජා කරන්නේ යැයි මහත් සංවේගයක් උපදවා බොහෝ භික්ෂූන් සමගිව සංසිඳුණාක් මෙන් **කිනනු නො එතනති** මෙය විචාරන්නෙමියි ප්‍රශ්න කරයි. **අනුඤ්ඤායමානොති** කළ නොකළ දෙය දන්නේය යන තේරුමයි. **අත්‍ථි නු බොති** මෙයින් යට ප්‍රශ්නයම අසයි. **අප්පටිසරණෙති** අප්‍රතිසරණ ධර්ම විනයෙහි **කො හෙතු සාමග්ගියාති** තොපගේ සමගියට හේතු කවරේද? ප්‍රත්‍ය කවරේද?

ධම්මපටිසරණාති අපට ධර්මය පිහිටයි. ධර්මය අවශ්‍යයයි ප්‍රකාශ කරයි. වත්තතීති ප්‍රගුණව පැමිණෙයි. ආපත්ති හොති වීතික්කමොති මේ දෙකම බුදුරදුන්ගේ පැණවීම් ක්‍රමයමයි. යථා ධම්මං යථා සත්‍ථං කාරෙමාති යම් සේ ධර්මය අනුසාසනා අනුව සිටියාහු ද එසේම කරණ යන තේරුමයි. න කිර නොභවන්තො කාරෙන්ති ධම්මො න කාරෙතීති පද දෙකෙහිම නො කාරය නිපාතයකි. මෙසේ ඇති කළ පින්වත්හු නොකරවත්. ධර්මය ද කරවත්. මෙය මෙහි තේරුමයි. තග්ඝාති ඒකාංස නිපාතයකි. කහං පන භවං ආනන්දෙති කිමෙක් ද? තෙරුන් වහන්සේ වේළුවනයෙහි වාසය කරන බව නොදනී ද. දනියි. මොහු විසින් වේළුවනයට ආරක්ෂාව දෙන ලදි. එහෙයින් තමාගේ උසස් බව කැමතිව විචාරයි. කුමක් හෙයින් ඔහු විසින් එහි ආරක්ෂාව දෙන ලද ද? හෙතෙම එක් දිනක් මහා කාත්‍යායන තෙරුන් ගිජුකුළු පර්වතයෙන් බසිනු දැක මොහු වඳුරෙක් මෙනැයි කීය. භාග්‍යවතුන් වහන්සේ ඒ කතාව අසා කමා කරගනුව. නැතිනම් මේ වේළුවනයෙහිම ගොනගුල් වඳුරෙක් වේයැයි කීය. ඔහු ඒ කතාව අසා ශ්‍රමණ ගෞතමයන්ගේ කතාවෙහි දෙවිදියක් නම් නැත. පසුව වඳුරුව උපන්නා වූ මට ආහාර පිණිස යැයි වේළුවනයෙහි නොයෙක් නොයෙක් වෘක්ෂයන් වවා ආරක්ෂාව දුන්නේය. පසුකාලයෙහි කළුරිය කොට වඳුරුව ඉපිද වස්සකාර යැයි කී කළ පැමිණ ළඟ සිටියි. තග්ඝ භො ආනන්දාති මෙසේ තෙරුන් වහන්සේ විසින් පිරිස මැද තමාගේ උසස් බව දැන මම ද තෙරුන් වහන්සේ උසස් කරන්නෙමි යි මෙසේ කීය. න බො බ්‍රාහ්මණාති තෙරුන් වහන්සේ සිතීය. බුදුරදුන් විසින් වර්ණනා කළ ධ්‍යාන ඇත. වර්ණනා නොකළ ධ්‍යාන ද ඇත. මේ බ්‍රාහ්මණයා වනාහි සියල්ලම වර්ණනා කරයි. ප්‍රශ්න විසඳන්නට නොහැකිය. ප්‍රශ්නය ඍජු කොට කියන්නෙමියි මෙය කීමට පටන් ගත්තේය. මොහුගේ මුඛය බලන්නට නො හැක්කේ ය. පිණ්ඩපාතය රකින්නට ද නො පුළුවන. ප්‍රශ්නය ඍජුකොට කියන්නෙමියි එය කියන්නට ආරම්භ කළේය. අන්තරං කරිත්වා ඇතුළත් කොට එවරූපං බො බ්‍රාහ්මණ සො භගවා ඣානං වණ්ණෙසීති මෙහි සාමූහික ධ්‍යාන අදහස කියන ලදි. යං නො මයන්ති මේ බමුණා වස්සකාර බමුණාට ඊර්ෂ්‍යා කරයි. ඔහු විසින් අසන ප්‍රශ්න නැවත ඔහුගේ නාමය ගෙණ විස්තර කොට කීයේය. මා විසින් අසන ලද ප්‍රශ්න සැරයටි කොනින් පෙළන්නක් මෙන් ටිකක්ම කියන්නේ යැයි නොසතුටු විය. එහෙයින් මෙසේ කීහ. සෙසු ඉතිරි සියල්ල පෙර කී නයින් දන්නේ ය.

ගෝපකමොග්ගල්ලාන සූත්‍ර වර්ණනාව නිමි.

# 1.4.9

එවමෙමසුතනති මහා පුණ්ණම සූත්‍රය මා විසින් මෙසේ අසන ලදි. එහි තදහුති ඒ දවසෙහි මෙහි වෙසෙත්ය යන තේරුමයි. සීලයෙන් හෝ ආහාර වර්ජනයෙන් හෝ වෙසෙත්ය යනු උපෝසථයට නමකි. මෙහි මෙය අත්ථුද්වාරයයි. "ඇවැත් කප්පිනය. උපෝසථයට යමු" ආදීන්හි ප්‍රාතිමෝක්ෂය දේශනා කිරීම උපෝසථයයි. "විසාඛාවෙනි, මෙසේ අංග අටකින් සමන්විත උපෝසථයෙහි වසව්" ආදියෙහි සීලයයි. හැමකල්හිම ඒකාන්තයෙන් පිරිසිදු වීම ආහාර වර්ජනයයි. උපෝසථ නම් නාග රාජයාය ආදියෙහි නාමයයි. "මහණෙනි, උපෝසථ දිනයෙහි භික්ෂූන් සමඟ ආවාසයෙහි නොවසව්" ආදියෙහි විසිය යුතු දවසයි. මෙහි ද එම වාසය කරන දවසම ගත යුතුයි. මෙහි ද අට්ඨමිය. චාතුද්දසිය පණ්ණරසිය යැයි ත්‍රිවිධාකාරයි. එහෙයින් අනෙත් දෙකෙහි නිවාරණය පිණිස පණ්ණරස යැයි කියන ලදි. මාසය සම්පූර්ණ වීම පුණ්ණාය ලෙස ද චන්ද්‍රයා සම්පූර්ණ වීම පුණ්ණමාය ලෙස ද ගැනේ. මෙසේ පුණ්ණාය. පුණ්ණමාය යන පද දෙකෙහි තේරුම දත යුතුයි. තෙනහි ඛො අඤ්ඤතරො භික්ඛු සකෙ ආසනෙ නිසිදිත්වා පුච්ඡති කුමක් නිසා භාග්‍යවතුන් වහන්සේ සිටගෙන සිටියාහුට නොකියා වාඩිකරවූයේ ද? මේ භික්ෂුව සැටක් පමණ භික්ෂූන්ට ප්‍රධාන වූ සංඝස්ථවිර නමයි. භික්ෂූන් සැටක් සමඟ ආරණ්‍යයෙහි වාසය කරයි. ඔවුහු උන්වහන්සේ වෙතින් කමටහන් ගෙන වීර්ය කරති. මහාභූත රූප, උපාදාය රූප, නාම රූප, ප්‍රත්‍ය ලක්ෂණ, ආරම්මණික විදර්ශනා පරිග්‍රහණය කරති. ඔවුන් සවස ආචාර්ය උපස්ථාන සඳහා පැමිණ වැඳ හුන්කල්හි තෙරුන් වහන්සේ මහාභූත පරිග්‍රහාදිය විචාරයි. ඔවුහු සියල්ල කියත්. මාර්ගඵල ප්‍රශ්න ඇසූ විට කියන්නට නොහැකි වෙත්. ඉක්බිතිව තෙරුන් වහන්සේ සිතීය. මාගේ සමීපයෙහි දී මොවුන්ගේ අවවාදවල පිරිහීමක් ද නැත. මොවුන් පටන්ගත් වීර්යයෙන්ම වාසය කරති. කුකුළෙක් වතුර බොන පමණ කාලයකවත් ප්‍රමාදයක් නැත. එසේ වුවත් මාර්ගඵල උපදවන්නට නොහැකි වෙත්. මම මොවුන්ගේ අදහස් නොදනිමි. මොවුන් බුදුරදුන් විසින් හික්මිය යුතු වන්නේ ය. මොවුන් ගෙන ශාස්තෲන් වහන්සේ ළඟට යමි. ශාස්තෲන් වහන්සේ මොවුන්ට චරිත වශයෙන් ධර්මය දේශනා කරන්නේ ය. තෙරුන් වහන්සේ එම භික්ෂූන් වහන්සේලා ගෙන බුදුරදුන් සමීපයට ආවේය. බුදුරදුන් ද සවස් කාලයෙහි ආනන්ද තෙරුන් විසින් එලවන ලද ජලය ගෙන ශරීරය සෘතු ගන්වා මිගාරමාතෘ ප්‍රාසාද පිරිවෙණෙහි පණවන ලද බුද්ධාසනයෙහි වැඩ සිටියේය. භික්ෂු සමූහයා ද උන්වහන්සේ පිරිවරාගෙන සිටියේය. ඒ වේලාවෙහි හිරු බැස යයි. සඳ නැගෙයි. සඳ එළිය නැත.

හිරු එළිය නැත. සඳ හිරු එළිය මකා ෂට්වර්ණ බුදු රැස් යුග්මව බබලමින් දිසා අනු දිසාවන්හි දුවති. සියල්ල යට කී පරිදි විස්තර කළ යුතුයි. ධර්ම කථිකයාගේ ශක්තිය හා ප්‍රමාණය යම්තාක් ද ඒතාක් කිව යුතුයි. මෙසේ වැඩහුන් පිරිසෙන් තෙරුන් වහන්සේ නැගිට ශාස්තෘන් වහන්සේගේ ප්‍රශ්නයට ඉඩ තැබීය. එවිට භාග්‍යවතුන් වහන්සේ ඉදින් මොහු සිටගෙන විචාරණ කළ අපේ ගුරුවරයා සිටගත්තේ යැයි සෙසු භික්ෂූන් ද සිටගනිත්. එයින් තථාගතයන් වහන්සේට අගෞරව කළාක් වන්නේය. වාඩි වී සිටියොත් ගුරුවරයාට අගෞරව කළාක් වන්නේය. එකඟව ධර්ම දේශනාව ශ්‍රවණය කිරීමට නොහැකි වෙති. ගුරුවරයා හුන් කළ ඔවුහු ද හිඳිති. එවිට එකඟව ධර්ම දේශනාව ශ්‍රවණය කළ හැකි වෙත්. මේ කාරණය නිසා භාග්‍යවතුන් වහන්සේ සිටගෙන සිටියහුට නොකියා වාඩි කරවීය. **ඉමෙ නු ඛෙට භනෙතති** සැක සහිත ප්‍රශ්නය මෙන් කරන ලදි. තෙරුන් වහන්සේ පංචස්ඛන්ධයන්ගේ ඉපදීම විනාශය ගෙන රහත් භාවයට පත් රහතන් වහන්සේ නමකි. එහෙයින් විමතියක් නැත. දැනගත්තත් නොදන්නාක් මෙන් ඇසිය යුතුය. ඉදින් දන්නෙකු මෙන් ඇසුවහොත් මොහු දන්නේ යැයි එය විසඳමින් කෙටියෙන්ම කියයි. නොදන්නෙකු මෙන් ඇසුවහොත් එයින් ද මෙයින් ද කරුණු ගෙන විස්තර කරමින් කියයි. සමහරු නොදන්නා දේ දන්නාක් මෙන් ඇසුවේ යැයි දත යුතුයි. **ඡන්ද මූලකාති** තෘෂ්ණාව මුල්කොට **එවරූපො සියනති** ඉදින් කාමය ශ්වේත වර්ණ හෝ හරිතාල වර්ණ හෝ කාල වර්ණ හෝ නිලුපුල් වර්ණ හෝ සඳුන් වර්ණ හෝ යනුවෙන් මේ ආකාර වන්නේ යැයි ප්‍රාර්ථනා කරයි.

**එවං වෙදනොති** කුසල වේදනාවක් හෝ සුඛ වේදනාවක් හෝ වේයැයි ප්‍රාර්ථනා කරයි. සංඥාදීන්හි ද මේ ක්‍රමයයි. යම් හෙයකින් අතීතයෙහි ප්‍රාර්ථනාවක් නැත ද ප්‍රාර්ථනා කළා ද එය ලැබීමට නොහැකිය. වර්තමානයෙහි ද නොවෙයි. සුදෙන් කළු බව ප්‍රාර්ථනා කළ ද වර්තමානයෙහි එය නොවෙයි. කළු බවෙන් සුද ද නොවෙයි. දිග හෝ කෙටි ද කෙටි හෝ දිග ද නොවෙයි. දන් දී සිල් සමාදන් වී අනාගතයෙහි ක්ෂත්‍රියයෙක් හෝ වෙමි. බ්‍රාහ්මණයෙක් හෝ වෙමියි ප්‍රාර්ථනා කරන්නහුගේ ප්‍රාර්ථනාව සමෘද්ධ වෙයි. එහෙයින් අනාගතයෙන්ම ගන්නා ලදි. **ඛන්ධාධිවචනනති** ස්ඛන්ධයන්ගේ ස්ඛන්ධ නාම කොතෙක් වේදැයි අසයි. **මහාභූතා හෙතූති** ත්‍රිවිධ කුසල හේතූන් ආදියෙහි හේතුහේතු කියන ලදි. අවිද්‍යා පුණ්‍යාභි සංස්කාරාදීන්ගේ සාධාරණ බැවින් සාධාරණ හේතුයි. කුසලාකුසලයන් තමතමන්ට විපාක දීම් වශයෙන් උතුම් හේතුයි. මෙහි ප්‍රත්‍යහේතු අපේක්ෂිතයි. එහි පෘථිවිධාතු මහාභූතයෙන් ඉතිරි භූත තුනේ උපාදාය

Scanned with CamScanner

රූප පැණවීම් දක්වීම පිණිස හේතු හා ප්‍රත්‍ය ද මෙසේ සෙසු යෙදීම් ද දත යුතුයි. **එසොති මහණෙති,** ස්පර්ශය විදියි. මෙහි ස්පර්ශය යනු හැඳින ගැනීමේ ස්පර්ශය යයි වචනයෙන් ස්ඛන්ධ තුනෙහි පැණවීමට හේතු මෙන්ම ප්‍රත්‍යයයි. **විඤ්ඤාණක්ඛන්ධස්සාති** ප්‍රතිසන්ධි විඥානයෙන් ගැබෙහි වෙසෙන සත්වයාගේ අන්තිම පිරිසිඳීමෙන් සමතිස් රූපයෝ උපදිත්. ඒ නාමරූපය ප්‍රතිසන්ධි විඥානයාගේ පැණවීමට හේතුව මෙන්ම ප්‍රත්‍ය ද වේ. චක්ඛුද්වාරයෙහි චක්ඛුප්‍රසාදය ද රූපාරම්මණය ද රූපයයි. සම්ප්‍රයුක්ත ස්කන්ධ තුන නාමයයි. ඒ නාම රූපය චක්ඛු විඥානයාගේ පැණවීමට හේතුව මෙන්ම ප්‍රත්‍යයයි. සෙසු විඥාන කෙරෙහි ද මේ ක්‍රමයයි. **කථං පන භන්තෙති** කොතකින් වෘතය විචාරන්නේ මෙසේ කීය. **සක්කායදිට්ඨී න හොතීති** මේ වෘත විචාරමින් මෙසේ කීය. **අයං රූපෙ අස්සාදොති** මෙයින් පරිඤ්ඤා ප්‍රතිවේදය ද දුක්ඛ සත්‍යය ද **අයං රූපෙ ආදීනවොති** මෙයින් ප්‍රහාණ ප්‍රතිවේදය ද සමුදය සත්‍යය ද **ඉදං රූපෙ නිස්සරණන්ති** මෙයින් සාක්ෂාත් ප්‍රතිවේදය ද නිරෝධ සත්‍යය ද කියන ලදි. ඒ ස්ථාන තුනෙහි සම්‍යක් දෘෂ්ටි ආදි ධර්මයෝ වෙත් ද මේ භාවනා ප්‍රතිවේධ මාර්ග සත්‍යය ය. සෙසු පදයන්හි ද මේ ක්‍රමයයි. **බහිද්ධාති** අනුන්ගේ විඤ්ඤාණය සහිත ශරීරයෙහි **සබ්බ නිමිත්තෙසූති** මෙයින් ඉන්ද්‍රියබද්ධ නොවූවන් ගණියි. **සවිඤ්ඤාණකෙ කායෙති.** වචනයෙන් තමාගේ ද අනුන්ගේ ද ශරීරය ගන්නේ ය. බාහිර සර්ව නිමිතිග්‍රහනයෙන් ඉන්ද්‍රිය බද්ධනොවූවන් ම ගණියි. **අනත්ත කතානීති** ආත්ම නොවූවන්හි සිට කරන ලදි. **කමත්තානං ඵුසිස්සන්තීති** කවර ආත්මයක සිට විපාක දක්වන්නේ දැයි ශාස්වත දර්ශනය මඩිමින් මෙසේ කීය. **තණ්හාධි පතෙය්‍යනාති** තෘෂ්ණාව ජ්‍යෙෂ්ඨ කර **තත්‍ර තත්‍රාති** ඒ ඒ ධර්මයන්හි **සට්ඨී මත්තානන්ති** මේ භික්ෂූහු ප්‍රකෘති කමටහන අත්හැර අනෙත් අළුත් කමටහනක් සිහිකරමින් ආසනයක් බැඳ ඒ ආසනයෙහිම රහත් බවට පැමිණියාහුය. ඉතිරිය සියළු තැන්හිම ප්‍රකටය.

**මහා පුණ්ණම සූත්‍ර වර්ණනාව නිමි.**

# 1.4.10

**එවමෙමසුතන්ති** චූළපුණ්ණම සූත්‍රය මා විසින් මෙසේ අසන ලදි. එහි **තුණ්හීභූතං තුණ්හීභූතන්ති** යම් යම් දිශාවක් බලයි ද ඒ ඒ දිශාවන්හිම නිශ්ශබ්දතාවයයි. **අනුවිලොකෙත්වාති** පස් ආකාර පැහැදීමෙන් යුක්ත වූ ඇස් හැර ඒ ඒ තැන් බලා යටත් පිරිසෙයින් අත් පා හැකිලීමක්වත් නොදක **අසප්පුරුසොති** පවිටු පුරුෂයා **නොහෙතං භනෙතති** යම්හෙයකින් අන්ධයා නොදකින්නාක් මෙන් ඔහු එය දැනගැනීමට නොහැකි වෙත්. එහෙයින් මෙසේ කීහ. මේ ක්‍රමයෙන්ම මතු දක්වන තැන්හි ද තේරුම දත යුතුයි. **අසද්ධම්ම සමන්නාගතොති** පවිටු ධර්මයෙන් යුතු වූ **අසප්පුරිස භත්තීති** අසත්පුරුෂ සේවනයයි. **අසප්පුරිස චින්තීති** අසත්පුරුෂ සිතින් සිතන්නා **අසප්පුරිස මන්තීති** අසත්පුරුෂ මන්ත්‍රණයෙන් මන්ත්‍රණය කරන්නා **අසප්පුරිස වාචොති** අසත්පුරුෂ වචන කියන්නා **අසප්පුරිස කම්මන්තොති** අසත්පුරුෂ කටයුතු කරන **අසප්පුරිස දිට්ඨීති** අසත්පුරුෂ දෘෂ්ටියෙන් යුතු **අසප්පුරිස දානන්ති** අසත්පුරුෂයන් විසින් දෙනු ලබන දන් **ත්‍යාස්ස මිත්තාති** ඔවුහු මොහුගේ යහළුවෝය. **අත්තව්‍යාබාධායපි චෙතෙතීති** ප්‍රාණඝාතය කරමි. අදින්නාදානය කරමි. මිථ්‍යාචාරයෙහි හැසිරෙමි. දස අකුසල කර්ම පථයෙහි සමාදන්ව පවතිමි. මෙසේ තමන්ට දුක් පිණිස සිතයි. **පරව්‍යාබාධායාති** යම් සේ අසවලා අසවලා මරයි. අසවලාගේ දෙය සොරා ගනියි. දස අකුසල කර්ම පථයෙහි සමාදන්ව පවතියි. මෙසේ ඔහු අණ කරමියි අනුන්ගේ දුක් ගැන සිතයි. **උභයව්‍යාබාධායාති** මම අසවලා ද අසවලා ද ගෙන දස අකුසල කර්ම පථයෙහි සමාදන්ව පවතිමියි මෙසේ දෙදෙනාගේම දුක් පිණිස සිතයි. **අත්තව්‍යාබාධායපි මනෙතති** මම දස අකුසල කර්ම පථයෙහි සමාදන්ව පවතිමියි කියමින් තමාගේ හානිය පිණිස කතා කරයි. අනෙකා සමඟ අපි දෙදෙනාම එක් වී දස අකුසල කර්ම පථයෙහි යෙදෙන්නෙමුයි කියමින් දෙදෙනාගේම හානිස පිණිස කතා කරයි. **අසක්කච්චං දානං දෙතීති** දෙන දේ (දෙය්‍යධර්මය) කෙරෙහිත් පුද්ගලයා කෙරෙහිත් සැලකිළිමත් නොවෙයි. වී කුඩු වැලි ආදී දොස් සහිත සහලින් බත් පිසා නොපිරිසිදු ලෙස දීම දෙය්‍යධර්මය කෙරෙහි සැලකිලිමත් නොවීමයි. වැඩහිඳිනා තැන් හැමදීම් ආදිය නොකොට එතන හෝ මෙතන හෝ හිඳුවා එය හෝ මෙය හෝ ආධාරකයක් සේ තබා දන් දෙයි ද එය පුද්ගලයා කෙරෙහි සැලකිළිමත් නොවීමයි. **අසහත්ථාති** තමාගේ අතින් නොදෙයි. දැසිදස්සන් කම්කරුවන් ලවා දෙවයි. **අචිත්තිකත්වාති** යට කී ක්‍රමයෙන් දෙය්‍යධර්මය කෙරෙහිත් පුද්ගලයා කෙරෙහිත් ගරුසරු නැතිව දීමයි. **අපවිද්ධන්තීති** බැහැර කරනු

කැමැත්තෙන් තුඹසෙහි සර්පයා එළවන්නාක් මෙන් දෙයි. **අනාගමනදිට්ඨිකොති** ඵල විපාක බලාපොරොත්තුවක් නැතිව දෙයි. **තත්ථ උප්පජ්ජතීති** දන් දී නිරයෙහි නූපදියි. එහෙත් යට කී ක්‍රමයෙන් පවිටු අදහස් නිසා මිථ්‍යාදෘෂ්ටි ගෙන එයින් නිරයෙහි උපදියි. යහපත් පැත්ත මෙයට විරුද්ධ අයුරු දත යුතුයි. **දෙවමහත්තතාති** කාමාවචර සදෙව් ලොව දෙවියෝ **මනුස්සමහත්තතාති** ත්‍රිවිධ කුලයන්ගේ සම්පත්ය. ඉතිරිය සියළු තැන්හිම කී පරිදිය. මේ සූත්‍රය හුදෙක් භවය සඳහාම දේශනා කරන ලදී.

**චූළ පුණ්ණම සූත්‍ර වර්ණනාව නිමි.**

**පළමුවැනි දේවදහ වර්ගය සමාප්තයි.**

## 2.4.1

**එවමෙමසුතනති** යනු අනුපද සූත්‍රය මා විසින් මෙසේ අසන ලදි යන්නයි. එහි **එතදවොචාති** යන්නෙන් මොහු පණ්ඩිතයෙකි යි ආදී ක්‍රමයෙන් දහම් සෙනෙවි සැරියුත් තෙරුන්ගේ ගුණ කතාව කීය. සෙසු තෙරුන් අතුරෙන් මහමුගලන් තෙරුන්ගේ සෘද්ධි ගුණය ප්‍රකටය. මහකසුප් තෙරුන්ගේ ධුතාංග ගුණය ද අනුරුද්ධ තෙරුන්ගේ දිවැස් ගුණය ද උපාලි තෙරුන්ගේ විනයධර ගුණය ද රේවත තෙරුන්ගේ ධ්‍යාන සුවයෙන් පසුවන ගුණය ද අනඳ තෙරුන්ගේ බහුශ්‍රැත ගුණය ද ප්‍රකට විය. මෙසේ ඒ ඒ තෙරවරුන්ගේ ඒ ඒ ගුණයන් ප්‍රකටය. සැරියුත් තෙරුන්ගේ ගුණ අප්‍රකටය. කුමක්හෙයින් ද යත්? ප්‍රඥාවන්තයින්ගේ ගුණ නොකී කල්හි දැනීමට නොහැකිය. බුදුරදුන් සැරියුත් තෙරුන්ගේ ගුණ කියන්නෙමියි සභාග පිරිස් කැඳවූහ. මෙදින සැරියුත් තෙරුන්ගේ සභාග පිරිස රැස්වූවාහ. ඔවුන් රැස්වුණු බව දැක බුදුරදුන් ගුණ කියමින් මේ දේශනාව ඇරඹූහ.

එහි **පණ්ඩිතොති** ධාතු කුසලතාව, ආයතන කුසලතාව, ප්‍රතීත්‍යසමුප්පාද කුසලතාව, ඨානාඨාන කුසලතාව යන මේ කරුණු සතරෙන් පණ්ඩිත වූයේ යනුයි. **මහාපඤ්ඤොති** යනාදීන්හි මහා නුවණින් යුතු වූයේ යන තේරුමයි. එහි මේ මහා ප්‍රඥා ආදීන්ගේ නානත්වයයි. එහි මහාප්‍රඥා යනු කවරේද? මහත් වූ සීලස්ඛන්ධය පිළිගන්නේ මහා ප්‍රඥාවයි. මහත් වූ සමාධිස්ඛන්ධය, ඥානස්ඛන්ධය, විමුත්තිස්ඛන්ධය, විමුත්තිඥානදර්ශනස්ඛන්ධය පිළිගැනීම ද මහා ප්‍රඥාව වේ. මහාඨානාඨාන, මහා විහාරසමාපත්ති, මහා ආර්යසත්‍ය, මහා සතිපට්ඨාන, සම්‍යක් ප්‍රධාන ඉද්ධිපාද, මහා ඉන්ද්‍රිය බල, බොජ්ඣංග, මහා ආර්ය මාර්ග, මහා ශ්‍රාමණ්‍යඵල, මහා අභිඥා, මහා පරමාර්ථය වන නිර්වානය පිළිගැනීම ද මහා ප්‍රඥාව වේ. පුථුපඤ්ඤා යනු කවරේ ද? වෙන් වෙන්ව නොයෙක් නොයෙක් ස්කන්ධයන්හි පවත්නා නුවණ පුථුපඤ්ඤා නම් වේ. නොයෙක් ධාතුන්හි, නොයෙක් ආයතනයන්හි, නොයෙක් අර්ථයන්හි, නොයෙක් ප්‍රතීත්‍යසමුප්පාදයන්හි, නොයෙක් ලබන ලද සුඤ්ඤත ධර්මයන්හි, නොයෙක් සීලස්ඛන්ධයන්හි, නොයෙක් සමාධි පඤ්ඤා විමුත්ති විමුත්තිඥානදර්ශනස්ඛන්ධයන්හි, නොයෙක් ඨානාඨානයන්හි, නොයෙක් විහාරසමාපත්තීන්හි, නොයෙක් ආර්යසත්‍යයන්හි, නොයෙක් සතිපට්ඨානයන්හි, නොයෙක් සම්‍යක් ප්‍රධානයන්හි, ඉර්ධිපාදයන්හි ඉන්ද්‍රියන්හි, බලයන්හි, බොජ්ඣංගයන්හි, නොයෙක් ආර්ය මාර්ගයන්හි, ශ්‍රාමණ්‍යඵලයන්හි අභිඥාවන්හි, නොයෙක් දෙනාට සාධාරණ ධර්මයන්

ඉක්ම වූ පරමාර්ථ නිවනෙහි නුවණ පවතින්නේ පුථුපඤ්ඤා නම්. හාසු පඤ්ඤාව කවරේද යත්? මෙහි යම්කිසිවෙක් ප්‍රීතිය බහුලව විඳීම් බහුලව සතුට බහුලව ප්‍රමෝදය බහුලව සිල් පිරීම කරයි ද? ඉන්ද්‍රිය සංවරය පුරයි ද? භෝජනයෙහි පමණ දැනීම, නිදි වර්ජනය, සීල සමාධි පඤ්ඤා විමුත්ති විමුත්තිඤාණදර්ශන ස්කන්ධයන් පුරයි ද? ප්‍රීතිය බහුලව ප්‍රමෝදය බහුලව ඨානාඨානය අවබෝධ කරයි ද එය හාසු ප්‍රඥාවයි.

ප්‍රීතිය බහුලව විහාර සමාපත්තිය පුරයි ද එය හාසු ප්‍රඥාවයි. ප්‍රීතිය බහුලව ආර්ය සත්‍ය අවබෝධ කරයි ද සතිපට්ඨාන, සම්‍යක් ප්‍රධාන, ඉර්ධිපාද, ඉන්ද්‍රිය බල, බොජ්ඣංග, ආර්ය මාර්ගය වඩන්නේ වේද හෙතෙම හාසු පඤ්ඤා පුද්ගලයා නම් වේ. ප්‍රීතිය බහුලව ශ්‍රාමණ්‍යඵලයන් සාක්‍ෂාත් කරයි ද අභිඥාවන් අවබෝධ කරයි ද පරමාර්ථ සංඛ්‍යාත නිවන සාක්‍ෂාත් කරන්නේ නම් එය හාසු පඤ්ඤා නම්.

ජවනපඤ්ඤා යනු කවරේද යත්? අතීත හෝ අනාගත හෝ වර්තමාන හෝ යම්කිසි දුර වූ හෝ සමීපයෙහි වූ හෝ රූපයක් වේද ඒ සියළු රූප වහා අනිත්‍ය ස්වභාවයට දිවෙයි යැයි දැනගන්නා නුවණ ජවනපඤ්ඤා නම් වේ. වහා දුක්ඛිත ස්වභාවයටත් අනාත්ම ස්වභාවයටත් දිවෙනුයි ජවනපඤ්ඤා නම්. යම්කිසි වේදනාවක් ඇති වේද -පෙ- අතීත හෝ අනාගත හෝ වර්තමාන හෝ යම්කිසි විඤ්ඤාණයක් වේද ඒ සියළු විඤ්ඤාණය අනිත්‍ය දුක්ඛ අනාත්මභාවයන්ට වහා දුවන හෙයින් ජවනපඤ්ඤා නම් වේ. ඇස -පෙ- අතීත හෝ අනාගත හෝ වර්තමාන හෝ ජරා මරණයන් අනිත්‍ය දුක්ඛ අනාත්මභාවයන්ට වහා දුවන හෙයින් ජවනපඤ්ඤා නම් වේ. අතීතානාගත වර්තමාන වූ රූපය ක්‍ෂයවීම් ස්වභාව නිසා අනිත්‍ය යැයි ද බියජනක ස්වභාවය නිසා දුක්ඛ යැයි ද අසාර ස්වභාවය නිසා අනාත්ම යැයි ද තුළනය කොට තීරණය කර සිත දියුණු කර දැන වඩා රූප නිරෝධ සංඛ්‍යාත නිවනෙහි වහා දිවෙනුයේ ජවනපඤ්ඤා නම් වේ. අතීතානාගත වර්තමාන වූ රූපය -පෙ- විඤ්ඤාණය ඇස -පෙ- ජරාමරණ අනිත්‍ය සංඛ්‍යාත ප්‍රතීත්‍යසමුප්පන්න ක්‍ෂයවන ස්වභාවය වැයවන ස්වභාවය විරාග ස්වභාවය නිරෝධ ස්වභාවය තුළනය කොට තීරණය කර වඩා ජරාමරණ නැති නිවනෙහි වහා දිවෙනුයේ ජවනපඤ්ඤා නම්.

තික්ඛපඤ්ඤාව යනු කවරේද යත්? වහාම කෙලෙස් සිඳිනුයි තික්ඛ ප්‍රඥා නම්. උපන්නා වූ කාමවිතර්ක නොඉවසයි. උපන්නා වූ ව්‍යාපාද විතර්ක, උපන්නා වූ විහිංසා විතර්ක, උපනුපන් පවිටු අකුසල ධර්ම, උපන් රාග, ද්වේෂ, මෝහ, ක්‍රෝධ, උපනාහ. මක්ඛ, පලාස, ඉස්සා,

Scanned with CamScanner

මච්ඡරිය, මායා, සාඨෙය්‍ය, ථම්භ, සාරම්භ, මාන, අතිමාන, මද, පමාද, සියළු කෙලෙස්, සියළු දුසිරිත්, සියළු අභිසංස්කාර, සියළු භවගාමී කර්ම නොඉවසයි. දුරුකරයි. විනාශ කරයි. අවසානයට පමුණුවයි. මෙය තික්ඛ ප්‍රඥා නම් වේ. එකම ආසනයක දී සතර ආර්යමාර්ග, සතර ශ්‍රාමණ්‍යඵල, සතර පටිසම්භිදා, අභිඥා හා අවබෝධ කළේ වෙත් ද සාක්‍ෂාත් කළේ වෙත් ද දක්නා ලද්දේ වෙත් ද ඒ නුවණ තික්ඛ ප්‍රඥා නමි.

නිබ්බේධික පඤ්ඤාව කවරේද යත්? මෙහි ඇතැම් කෙනෙක් සියළු සංස්කාර කෙරෙහි උද්වේග බහුල වෙයි ද, උත්‍රාසය බහුල වෙයි ද, කලකිරීම බහුල වෙයි ද, අරතිය බහුල වෙයි ද, අනභිරතිය බහුල වෙයි ද පිටතින් නොඇලෙයි. සියළු සංස්කාරයන්හි නොබිඳුණු විරූ නොපැලූ විරූ, ලෝභ සමූහය මුලසුන් කර දමන නුවණ නිබ්බේධික නුවණයි. නොබිඳුණු විරූ නොපැලූ විරූ ද්වේෂ සමූහය, මෝහ සමූහය, ක්‍රෝධය, උපනාහය -පෙ- සියළු භවගාමී කර්ම බිඳ දමනුයේ පලා දමනුයේ නිබ්බේධික ප්‍රඥාව නමි.

අනුපදධම්මවිපස්සනන්ති සමාපත්ති වශයෙන් හෝ ධ්‍යාන වශයෙන් හෝ පිළිවෙළින් ධර්මය විදර්ශනාවෙන් බැලීය. මෙසේ විදර්ශනාව වඩන කළ අඩමසකින් රහත්බවට පත්විය. මහමුගලන් තෙරුන් සත් දිනකින් ය. මෙසේ ඇතිකල්හි ද සැරියුත් තෙරුන් මහා නුවණැත්තෙකු වී නමුදු මහමුගලන් තෙරණුවන් ශ්‍රාවක වූ සිහිකිරීම් වාරය සැරයටි කොනෙන් පෙළන්නා සේ එක එක කොටස බැගින් සිහිකරමින් සත් දිනක් තුළ උත්සාහ කොට රහත් බවට පත්විය. සැරියුත් තෙරුන් බුදු පසේ බුදුවරයන්ගේ සිහිකිරීම් වාර ද ශ්‍රාවකයන්ගේ සිහිකිරීම් වාර ද සිහි කළේය. මෙසේ සිහිකිරීමේ දී අඩමසක් උත්සාහ කළෙමි. රහත් බවට පැමිණ මනාව වැටහිණි. බුදුපසේබුදුවරයන් හැර අන් කිසිදු ශ්‍රාවකයෙකු උන්වහන්සේ හා සමාන නුවණින් මහත්බවට නොගියේමය. තවත් එවැනි සමතෙක් නොවීය. යම්සේ පුරුෂයෙක් උණ ගසකින් දණ්ඩක් තනාගන්නෙමියි මහා අවුල් සහිත උණ ගසක් දක අවුල් සිඳින්නට කාලය ගතවන්නේ යැයි දන අතරතුරෙන් අත යවා ඒ උණගසෙහි මුල අග පමණක් සිඳ එය ගෙන යන්නේ ය. ඔහු පළමුව යයි. නමුත් දණ්ඩෙහි පිරිසිදු බව හෝ ඍජුබව නොලබයි. තවකෙක් එබඳුම උණ ගසක් දක ඉදින් පිරිසිදු නොකර ගතහොත් හරය හෝ ඍජුබව නොලබමි. කැසපට බැඳ මහත් ආයුධයකින් උණ ගසෙහි අවුල් සිඳ පිරිසිදු ඍජු උණ දණ්ඩක් ගෙන යන්නේ ය. ඔහු පසුව යයි. නමුත් පිරිසිදු ඇද නැති උණ දණ්ඩක් ලබා ගනියි. මේ කරුණු ද මෙසේම දත යුතුයි.

මේ තෙරුන් දෙදෙනාවහන්සේ ප්‍රධන්වීර්ය වැඩීමෙහිලා අඩමසක් උත්සාහවත් කොට දම්සෙනෙවි සැරියුත් තෙරුන් වහන්සේ සූකරකත නම් ලෙන් දොර දී සිය බෑනණුවන් වූ දීඝනඛ නම් පිරිවැජියාට වේදනාපරිග්‍රහ සූත්‍රය දේශනා කරමින් සිටිය බුදුරදුන්ට පවන් සළමින් සිටියේ දේශනාවට නුවණ යවා පැවිදිවීමෙන් පහළොස් වන දවසෙහි ශ්‍රාවක පාරමී ඥානය මස්තකප්‍රාප්තයට පැමිණ සත්සැට නුවණ අවබෝධ කොට සොළොස් වැදෑරුම් ප්‍රඥාවන්ට පත් විය.

**තත්‍රිදං භික්ඛවෙ සාරිපුත්තස්ස අනුපදධම්මවිපස්සනායාති** යම් අනුපිළිවෙළින් ධර්මය විදර්ශනාවෙන් බැලීමක් වේද අනුපදධම්ම විපස්සනාව කියන ලදි. මෙහි අනුපදධර්ම විදර්ශනාවෙන් සැරියුත් තෙරුන්ට මෙය වෙයි. දැන් මෙසේ කිව යුතුය. ඒ ඒ විදර්ශනා කොටස් සඳහා මෙය කියන ලදි. **පඨමෙ ඣානෙති** පළමු ධ්‍යානයෙහි සමාපත්තිය තුළ වූ ධර්මයෝයි. **ත්‍යාස්සාති** ඔවුහු වත්නාහුය. **අනුපදවවත්ථිතා හොන්තීති** අනුපිළිවෙළින් ව්‍යවස්ථාපනය හෙවත් පිරිසිඳීම, දැනීම වෙත්. කෙසේද යත්? තෙරුන් වහන්සේ ඒ ධර්මයන් බලන්නේ ආරෝපනය කිරීමේ ස්වභාවයක් විතර්කයක් පවතී යයි දනිති. එසේම පිරිමැදීම් නම් විචාරය ද පැතිරවීම් නම් ප්‍රීතිය ද ඉවසීම් නම් සැපය ද, අවික්ෂේප ලක්‍ෂණයෙන් යුත් වේදනාව ද, හැඳිනීම් ලක්‍ෂණයෙන් යුත් සංඥාව ද, චේතසික ලක්‍ෂණයෙන් යුත් වේදනාව ද, දැනගැනීම් ලක්‍ෂණයෙන් යුත් විඤ්ඤාණය ද, කරනු කැමැති ලක්‍ෂණයෙන් යුත් ජන්දය ද, උසස් මිදීම් ලක්‍ෂණයෙන් යුත් අධිමොක්ඛය ද, දැඩිලෙස අල්ලා ගැනීමේ ලක්‍ෂණයෙන් යුත් වීර්ය ද, එළඹ සිටීම් ලක්‍ෂණයෙන් යුත් සතිය ද, මධ්‍යස්ථ ලක්‍ෂණයෙන් යුත් උපේක්ඛාව ද, පිළිවෙළ සිහිකිරීම් ලක්‍ෂණයෙන් යුත් මනසිකාරය ද, පවතින බව දනියි. මෙසේ දන්නේ පිහිටුවීම් ක්‍රමයෙන් විතර්ක ස්වභාව ලක්‍ෂණ වශයෙන් ව්‍යවස්ථාපනය කරයි. -පෙ- පිළිවෙළ මෙනෙහි කිරීම් ක්‍රමයෙන් මනසිකාර ස්වභාව ලක්‍ෂණ වශයෙන් ව්‍යවස්ථාපනය කරයි. ඒ ධර්මයෝ අනුපදවර්තීව පවතීයැයි එහෙයින් කියන ලදි. **විදිතා උප්පජ්ජන්තීති** උපදින විට දැනගෙන ප්‍රකටව ම උපදිති. **විදිතා උපට්ඨහන්තීති** සිටිනා විට ද දැනගෙන ප්‍රකටව ම සිටිත්. **විදිතා අබ්භත්ථං ගච්ඡන්තීති** නිරුද්ධ වන විට ද දැනගෙන ම ප්‍රකටවම නිරුද්ධ වෙති. මෙහි දී එය නැණවත් බවෙන් හා ඥානය බොහෝ කොට ඇති සිතින් ද මිදිය යුතුයි. යම්සේ එම ඇඟිලි අගින් එම ඇඟිලි අගම ස්පර්ශ කරන්නට නොහැකිය. එපරිද්දෙන් ම ඒ සිතින් ම ඒ සිතේ ඉපදීම හෝ පැවතීම හෝ විනාශය හෝ දැනගැනීමට නොහැකිය. මෙසේ පළමුව ඒ ඥානයෙන් මිදිය යුතුය. ඉදින් සිත් දෙකක්

එකවිට උපදින්නේ නම් එක සිතකින් ඉපදීම හෝ පැවතීම හෝ විනාශය හෝ දැනගැනීමට හැකි වන්නේ ය. ඵස්ස දෙකක් හෝ වේදනා දෙකක් හෝ සඤ්ඤා දෙකක් හෝ චේතනා දෙකක් හෝ සිත් දෙකක් හෝ එකට උපදින්නේ නම් නැත. එකවිට එක සිතක්ම උපදියි. මෙසේ බොහෝ සිත් ඇතිබවෙන් මිදිය යුතුයි.

මෙසේ ඇති කල්හි කෙසේනම් මහතෙරුන්හට සමාපත්තිය ඇතුළත සොළොස් ධර්මයක් ප්‍රකට වී ගියේ ද යත්? වස්තු අරමුණු මනාව ගත් බැවිනි. තෙරුන් විසින් වස්තුවත් අරමුණත් මනාව ගන්නා ලදි. එහෙයින් උන්වහන්සේට ඒ ධර්මයන්ගේ ඉපදීම් සිහිකිරීමෙන් ඉපදීම ප්‍රකට විය. කරුණ සිහිකරන්නහුට කරුණ ප්‍රකට විය. භේදය සිහිකරන්නහුට භේදය ප්‍රකට විය. එහෙයින් දැනගෙන ම උපදිත්. දැනගෙනම වැටහෙත්. දැනගෙන ම අභිමතාර්ථය කරා යති යී යන්න කියන ලදි. **අහුත්වා සම්භොන්තීති** මෙයින් ඉපදීම දකියි. **හුත්වාප තිසෙවෙන්තීති** මෙයින් ක්‍ෂයවීම දකියි. **අනුපායොති** ඇලීම් වශයෙන් අනුව ගොස් **අනපායොති** ක්‍රෝධ වශයෙන් නොගියේ **අනිස්සිතොති** තෘෂ්ණා දෘෂ්ටීන්ගෙන් යුතු වූයේ **අපටිබද්ධොති** ඡන්ද රාගයෙන් නොබැඳුණේ **විප්පමුත්තොති** කාමරාගයෙන් මිදුණේ **විසංයුත්තොති** සතර යෝගයෙන් ද සියළු කෙලෙසුන්ගෙන් ද වෙන්වූයේ **විමරියාදි කතෙනාති** වෙනස්කර ගැනීමෙන් **චෙතසාති** මෙබඳු සිතෙන් වාසය කරයි. එහි ක්ලේෂ මර්යාදාව ද ආරම්මණ මර්යාදාව ද යනුවෙන් මර්යාදා දෙකකි. ඉදින් ඔහුට සමාපත්ති කාලය තුළ පවතින සොළොස් දහම් අරඹයා රාගාදිය උපදින්නේ ද ක්ලේෂ මර්යාදාවෙන් කරන ලද්දේ වන්නේ ය. එහිදී ඔහුට එකක්වත් නොඋපන්නේ නමුදු ක්ලේෂ මර්යාදාවක් නැත්තේය. ඉදින් ඔහුට සමාපත්තිය තුළ පවතින සොළොස් ධර්මය සිහි කරන කළ ඇතැමෙක් ඇස් හමුවට එන්නේ, ඇතැමෙක් නො එන්නේ ය. මෙපරිද්දෙන් ඔහුට ආරම්මණ මර්යාදාව වන්නේය. ඒ ධර්මයන් සිහිකරන ඔහුට ඇස් හමුවට නොඑළඹෙන ධර්මයක් නැත් ද ආරම්මණ මර්යාදාවක් ද නැත.

තව ද විෂ්කම්භන මර්යාදාවය සමුච්ඡේද මර්යාදාවය යනුවෙන් මර්යාදාවන් දෙකක් ඇත. එයින් සමුච්ඡේද මර්යාදාව මත්තෙහි එන්නේ ය. මෙතැන විෂ්කම්භන මර්යාදාව අදහස් කරන ලදි. ඔහුට මැඩපවත්වන ලද පච්චනික ස්වභාවයක් නැත්තේ විපරීත සිතින් වාසය කරයි. **උත්තරිං නිස්සරණන්ති** මෙයින් මිදීම නිස්සරණයයි. වෙනත් සූත්‍රයන්හි ද නිස්සරණය නිර්වාණය යැයි කියන ලදි. මෙහි අනතුරුව විශේෂයක් අදහස් කරන ලදුයි දත යුතුයි. **තබ්බහුලීකාරොති** එම දැනගැනීම බහුලව කරන ලද

බැවින් අජ්ඣත්තෙවසස හොතීති ඒ තෙරුන්ට ඇතැයි යන දැඩි ගැනීම වෙයි. මේ ක්‍රමයෙන් සෙසු වාරයන්හි ද අර්ථය දත යුතුයි. දෙවන වාරයේ දී සම්ප්‍රසාදනාර්ථයෙන් සම්ප්‍රසාදය ස්වභාව භාව වශයෙන් ව්‍යවස්ථාපනය කරයි. සතරවන වාරයෙහි උපේක්‍ෂාව සුඛස්ථානයෙහි වේදනා උපේක්‍ෂාව ද වෙයි. **පසාදත්‍ථා චෙතසො අනාභොගොති** යමෙක් එහි සැපයැයි සිතින් ගන්නේ නම් ඒ එකිනෙක ඕලාරික වශයෙන් පෙනෙයි. මෙසේ පැහැදීමෙන් සිතින් නොගන්නේ යැයි කියන ලදි. එහි නොවීමය යන තේරුමයි. **සතිපාරසුද්ධිති** පිරිසිදු සිහියමයි. පිරිසිදු උපේක්‍ෂාවමයි. **සතොවුට්ඨහතීති** සිහියෙන් යුක්තව නුවණින් මනා සේ දැන නැගී සිටියි. **තෙ ධම්මෙ සමනුස්සරතීති** යම්හෙයකින් නේවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි බුදුවරයන්ට පිළිවෙළ ධර්ම විදර්ශනාව වෙයි. ශ්‍රාවකයන්ට නොවේ. එහෙයින් එහි කොටස් වශයෙන් විදර්ශනා ක්‍රමය දක්වමින් මෙසේ කීය.

**පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්තීති** මාර්ග ඥානයෙන් චතුරාර්ය සත්‍යයන් දැක ආශ්‍රව සතර ක්‍ෂය වෙත්. සැරියුත් තෙරුන් සමථ විදර්ශනා වැඩීමට පටන් ගෙන රහත්බවට පත් කාලය ද නිරෝධසමාපත්ති සමවැදුණු අවස්ථාව ද යන දෙකම මෙහි දී ගන්නා ලදි. බොහෝ කලක් පුරුදු කරන ලද හෙයින් නිරෝධයට ඔබිනොබ සමවදින්නේ යැයි කියති. එහි දී ඔහුට යම් කාලයක නිරෝධසමාපත්ති ශීර්ෂවේද නිරෝධයේ වාරය පැමිණියේ යැයි ඵලසමාපත්තිය සැඟවෙයි. යම්කලෙක ඵලසමාපත්තිය ශීර්ෂවේද ඵලසමාපත්තියේ වාරය පැමිණියේ යැයි නිරෝධසමාපත්තිය සැඟවෙයි. දඹදිව වැසි තෙරවරු මෙසේ කියති. සැරියුත් තෙරුන් සමථ විදර්ශනා වැඩීමට පටන්ගෙන අනාගාමී ඵලය ප්‍රත්‍යක්‍ෂ කර නිරෝධයට සමවැදුණේය. නිරෝධයෙන් නැගිට රහත්බවට පැමිණියේය. **තෙ ධම්මෙති** සමාපත්තිය තුළ පවතින ත්‍රිසමුට්ඨානික ධර්මයන්හි යට නේවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තීන්හි පවතින ධර්ම හෝ මේ වාරයෙහි විශේෂයෙන් බැලිය යුතු දේ වෙති. එහෙයින් ඒවා හෝ බලන්නේ යැයි දැක්වීමට මෙය කියන ලද යැයි දත යුතුයි.

**වසිප්පත්තොති** ප්‍රගුණ කරන ලද වසීබවට පැමිණි **පාරමිප්පත්තොති** කෙළවරට පැමිණියේ **ඔරසොති** තෙරුන් වහන්සේ බුදුරදුන්ගේ හදවත තුළින් උපදින හඬ අසා දැනගන්නා හෙයින් ඖරස නම් වෙයි. මුවින් වඩනා ලද ශබ්දය අසා දැනගන්නා හෙයින් **මුඛතො ජාතො** නම් වෙයි. ධර්මයෙන් දැනගත් හෙයින් ද මවන ලද හෙයින් ද **ධම්මජො ධම්මනිම්මිතො** නම් වෙයි. ධර්මයේ පරිද්දෙන් ගන්නා ලද හෙයින් **ධම්මදායාදො** නම්

වෙයි. ආමිස දායාදයාගේ වශයෙන් නොගන්නා ලද බැවින් නො ආමිසදායාදොති යන්න දත යුතුයි. ඉතිරිය සියළු තැන්හි දී විස්තර කළ පරිදි වෙයි.

**අනුපදසූත්‍ර වර්ණනාව නිමි.**

## 2.4.2

**එවමෙමසුතනති** ජබ්බිසොධන සූත්‍රය මා විසින් මෙසේ අසන ලදි යන්නයි. එහි **ඛීණාජාතීති** එක පදයකින් රහත්බව ප්‍රකාශ කරන ලද්දේ වෙයි. දෙපදයෙන් මෙහි අදහස දක්වයි. සතර පදයකින් රහත් බව පවසයි. **දිටෙඨ දිට්ඨවාදිතාති** යම් චේතනාවකින් දක්නා ලද්ද දක්නා ලද්දක් සේ කියයි ද එය දක්නා ලද්දෙහි දක්නා ලද බව කීම නමි. ඉතිරි පද ද මේ ක්‍රමයෙන් ම වේ. **අයමනුධම්මොති** මෙය ස්වභාවයයි. **අභිනන්දිතබ්බනති** හුදෙක් සතුට පමණක් නොවේ. මොහු පිරිනිවන් පෑ කල්හි රහතන්වහන්සේ නමකට දැක්විය යුතු සියළු සත්කාර කළ යුතුයි. **උත්තරිං පඤ්හාති** ඉදින් පැවසීමෙන් නොසතුටු සිත් ඇත්තෝ වෙව්. මත්තෙහි ද මේ ප්‍රශ්නය ඇසිය යුත්තේ යැයි දත යුතුයි. මෙයින් අන්‍ය වූ වාර පිළිබඳව ද මේ ක්‍රමයමයි. **අබලනති** දුර්වල **විරාගනති** නොඇලීම් ස්වභාවය **අනස්සාසිකනති** ආශ්වාද රහිත **උපායුපාදානාති** තෘෂ්ණා දෘෂ්ටි දෙකට මෙය තවත් නමකි. තෘෂ්ණා දෘෂ්ටීහු ත්‍රෛභූමික ධර්මයන් කරා පමුණුවත් යනු **උපායා** නමි. ඒවා දැඩිකොට ගන්නේ **උපාදානා** නමි. **චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයාති** මෙයටම නමකි. සිත වනාහි තෘෂ්ණා දෘෂ්ටීන්ගෙන් ස්වකීය ධර්මයන්හි ඇලී සිටියි. තෘෂ්ණා දෘෂ්ටි දෙක සිතින් බැඳී පවතියි. ඒවා කරනකොටගෙන වෙසෙනුයේ **අභිනිවෙසා** නමි. ඒවා කරනකොටගෙනම අනුශයනය කෙරෙනුයේ **අනුසයාති** නමියි කියන ලදි. **ඛයාවිරාගාති** ක්ෂයවීමෙන් හා නොඇලීමෙන් යන තේරුමයි. මේ සියල්ල එකිනෙකට පර්යාය පදයි. **පඨවිධාතූති** පිහිටීමේ ධාතුවයි. **ආපොධාතූති** ආබන්ධන ධාතුවයි. **තෙජොධාතූති** පරිපාචන ධාතුවයි. **වායොධාතූති** විත්ථම්භන (ආධාර කිරීම) ධාතුවයි. **ආකාසධාතු** අසම්පුට්ඨ ධාතුවයි. **විඤ්ඤාණධාතු** විජානන (අවබෝධ) ධාතුවයි. **අනත්තතො උපගඡ්ඡනති** මම ආත්මය වෙමියි ආත්ම කොටස් බවට නොඑළඹියෙමි.

න ච පඨවිධාතුනිස්සිතනති පෘථිවි ධාතුව නිශ්‍රිත සෙසු ධාතුහු උපාදා රූපයන් ද අරූපයෝ ද අරූපස්ඛන්ධ ද ඔවුන් විසින් ඇසුරු කරන ලද වස්තු රූපයන්ගේ පෘථිවි ධාතු නිශ්‍රිත බැවින් එක් ක්‍රමයකින් එසේ කියන ලදි. එහෙයින් පෘථිවි ධාතු නිශ්‍රිත නොවේ යැයි කියන්නහු අනෙත් රූපාරූප ධර්මවල ද තමාගේ නොඑළඹීම කියයි. ආකාස ධාතුව ඇසුරු කළ පදයෙහි අවිනිර්භෝග වශයෙන් සියළු භූත උපාදාය රූප ආකාස ධාතුව ඇසුරු කළ පදයෙහි අවිනිර්භෝග වශයෙන් සියළු භූත උපාදාය රූප ආකාස ධාතු නිශ්‍රිත නම් වේ. එසේම එය ඇසුරු කළ රූපවස්තු ද අරූප කඳු ද මෙසේ මෙහි ද රූප අරූප භේදය ගන්නා ලද්දේ ම වෙයි. විඥාන ධාතු ඇසුරු කරන ලද පදයෙහි සහජාත ස්ඛන්ධ තුන ද චිත්ත සමුට්ඨාන රූපය ද විඥානධාතු නිශ්‍රිත නමින් රූප අරූප භේදය ගන්නා ලද්දේ ම වෙයි. **රූපෙ චක්ඛුවිඤ්ඤාණෙ චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසුති** මෙහි පසුගිය යමක් චක්‍ෂුද්වාර හමුවට පැමිණ නිරුද්ධ වෙයි ද යමක් අනාගතයෙහි චක්ෂුද්වාර හමුවට පැමිණ විනාශ වෙයි ද යමක් දැන් චක්ෂුද්වාර හමුවට පැමිණ විනාශ වෙයි ද ඒ සියල්ල රූප නම් වේ. යමක් වනාහි අතීතයෙහි හෝ අනාගතයෙහි හෝ වර්තමානයෙහි හෝ චක්ෂුද්වාර හමුවට නොපැමිණ නිරුද්ධ වෙයි ද එය චක්‍ෂුර්විඥානයෙන් ම දැනගත යුතු වූ ධර්මයන් අතුරෙහි සංග්‍රහ වෙතියි කී කළ ත්‍රිපිටක චූල අභය තෙරුන් වහන්සේ කීහ.

මෙබඳු තැනක දී දෙපරිද්දකින් කරවි. ජන්නෝවාදයෙන් මත්තෙහි කුමක් කරහු ද? මෙය මෙසේ නො ලැබෙයි. එහෙයින් තුන් කල්හි ඇස් හමුවට පැමිණියා වූ හෝ නොපැමිණියා වූ හෝ ඒ සියල්ල රූප ම වේ. චක්‍ෂුර්විඥානය සම්ප්‍රයුක්ත ස්කන්ධ තුන ම චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බ ධර්මයන් හැටියට දත යුතුයි. මේ මෙහි තේරුමයි. **ඡන්දොති** තෘෂ්ණා ඡන්දයයි. **රාගොති** තෙමේම ඇලීම් වශයෙන් රාගයයි. **නන්දීති** තමා කෙරෙහි ම සතුටුවීම් වශයෙන් නන්දයයි. **තණ්හාති** තමා කෙරෙහි ම තෘෂ්ණා කිරීම් වශයෙන් තණ්හාවයි. සෙසු ද්වාරයන්හි ද මේ ක්‍රමයමයි. **අභිංකාර මමිංකාරමානානුසයාති** මෙහි අහංකාර යනු මානයයි. මමිංකාර යනු තෘෂ්ණාවයි. තමත් ම මානානුසයයි. **ආසවානං ඛයඤාණායාති** පුබ්බේනිවාසානුස්සතියත් දිබ්බචක්ඛුවත් නොකියා කුමක් නිසා මෙය කියන ලද්දේ ද? භික්‍ෂුහු ලෞකික ධර්මයන් නොවිමසත්. ලෝකෝත්තර ධර්ම ගැනම විමසත්. එහෙයින් අසන ලද පැණයන්ට ම පිළිතුරු සපයමින් මෙසේ කීහ.

මේ ඒකවිසර්ජක සූත්‍රයට ඡබ්බිසෝධනය යන නාමය ද වේ. මෙහි ව්‍යවහාර සතර, පංචස්ඛන්ධය, ධාතු හය, අධ්‍යාත්මික හා බාහිර ආයතන හය, තමා පිළිබඳ සවිඥානක ශරීරය හා අනුන් පිළිබඳ සවිඥානක ශරීරය යන මේ කොටස් හය පිරිසිදුය. එහෙයින් ඡබ්බිසෝධනීය යැයි කියන ලදි. පරසමුද්‍රවාසී තෙරවරු තමාගේ ද අනුන්ගේ ද සවිඥානක ශරීරය එකක් කොට ආහාර සතරත් සමඟ කොටස් හයකැයි කියත්. මේ කොටස් හය තොප අවබෝධ කළේ ද? කවරදාක තොප මෙය අවබෝධ කළහු ද? කොතනක දී තොප විසින් මෙය අවබෝධ කළෙහි ද? තොප කෙළෙස් කොපමණ ප්‍රහීණ කළේ ද? තොප කිනම් ධර්මයක් ලැබුවෙහි ද? මෙසේ විනයෙහි දක්වන ලද ක්‍රමයෙන් පිරිසිඳ කරගත යුතුයි. මෙහි තොප කුමක් ලබන ලදදැයි ලබන ලද දේ ගැන ඇසීමෙන් ධ්‍යාන විමොක්ෂාදියෙහිත් සෝවාන් මාර්ගාදිය කෙරෙහිත් කුමක් තොප අවබෝධ කළහු ද? ඔබ ලැබූ දේ කුමක් ද? යනු උපාය ප්‍රශ්නයකි. මේ එහි අදහසයි. කිමෙක් ද? ඔබ අනිත්‍ය ලක්ෂණය ඉදිරිපත් කොට අවබෝධ කළේ ද? දුක්ඛ අනාත්ම ලක්ෂණ දෙකෙන් එකක් ඉදිරිපත් කළේ ද? සමාධි වශයෙන් ද නැතහොත් විදර්ශනා වශයෙන් ද? නැතහොත් රූප අරූප පෙරදැරි කොට ලැබුවෙහි ද? නැතහොත් අධ්‍යාත්මය හෝ බාහිරය පෙරදැරි කොට ලැබුවෙහි ද? කවරදාක ඔබ විසින් ලබන ලද්දේ ද යන්න කාල ප්‍රශ්නයකි. පෙරයම මැදියම ආදි කාල අතරෙන් කවර කාලයක දැයි කියන ලද්දේ වෙයි. කොහිදී ඔබ අවබෝධ කළේදැයි යන්න අවකාශ ප්‍රශ්නයයි. කිනම් අවකාශයක ද? රාත්‍රී ස්ථානයක ද? දහවල් ස්ථානයක ද? ගසක් මුල ද? මණ්ඩපයක ද? කවරනම් විහාරයක දී දැයි යනුයි. **කතමෙ තෙ කිලෙසා පහීනාති** ප්‍රහීන කළ කෙලෙස් ගැන විචාරීමයි. කවර මාර්ගයන් හරනා ලද්දේ ද? ඔබ විසින් කෙලෙස් ප්‍රහීන කළේ දැයි කියන ලද්දේ වෙයි. **කතමෙසං ත්වං ධම්මානං ලාභීති** ලබන ලද ධර්ම ගැන විචාරීමයි. පළමුවන මාර්ගාදිය අතුරෙන් ඔබ කවර නම් ධර්මයක් ලැබුවේ ද? යනුයි. එහෙයින් කිසියම් භික්ෂුවක් දැන් තමා උතුරු මිනිස් ධර්මයන්ට පත්වී යැයි කියන්නේ ද එපමණකින්ම ඔහුට සත්කාර නොකළ යුතුයි. මේ කාරණා හය පිරිසිඳු කර ගැනීම සඳහා ඇසිය යුතුයි. ඔබ අවබෝධ කරගත්තේ කිනම් ගුණයක් ද? එය ධ්‍යානයක් ද නැතහොත් විමෝක්ෂයන් අතරෙන් යමක් ද? යමෙක් යම් විදියකින් අවබෝධ කරන ලද ධර්මයක් වේද එය ඔහුට ප්‍රකට වෙයි. ඉදින් මෙනම් ගුණය මාවිසින් අවබෝධ කරන ලද යැයි කියයි නම් එහි දී කුමක් ඔබ අවබෝධ කළේ දැයි ඇසිය යුතුයි. අනිත්‍ය ලක්ෂණාදියෙන් හෝ අටතිස් අරමුණුවලින් හෝ රූප අරූප අධ්‍යාත්මික බාහිර යන මේ ධර්ම භේදයන්ගෙන් කුමක් මුල්කරගෙන ලබන ලද්දේ දැයි සෙවීමයි.

කෙන මුඛෙන අභිනිවිසිත්වාති යමෙක් යමෙකුට නිවේස වීද එය ඔහුට ප්‍රකට වෙයි. ඉදින් මෙය මට නිවේස වීයැයි දනී ද මා විසින් මෙය අවබෝධ කරගන්නා ලදි යි පවසයි. එහිදී කවරදාක ඔබ විසින් එය ලැබුවේදැයි ඇසිය යුතුය. පෙරවරු කාලයෙහි ද මැදියම් කාලයෙහි ද නැතහොත් වෙනත් කාලයකදැයි යනුවෙනි. සියළුදෙනාට ම තමා අවබෝධ කළා වූ කාලය පැහැදිළිය. ඉදින් අසවල් වේලාවේ දී මා විසින් අවබෝධ කළේ යැයි පවසයි. අනතුරුව කොතනක දී ඔබ අවබෝධ කළේ දැයි ඇසිය යුතුය. දහවල් ස්ථානයක ද රාත්‍රී ස්ථානයක ද නැතහොත් වෙනත් ස්ථානයක දැයි යනුවෙනි. සියළුදෙනාට ම තමා අවබෝධ කළා වූ ස්ථානය පැහැදිළිය. ඉදින් අසවල් ස්ථානයක දී මා විසින් අවබෝධ කළේ යැයි පවසයි. එහිදී කොපමණ කෙලෙස් ඔබ විසින් ප්‍රහීන කළේ දැයි ඇසිය යුතුයි. පළමුවන මාර්ගයෙන් ප්‍රහීන කරන ඒවා ද? දෙවන මාර්ගයෙන් ප්‍රහීන කරන ඒවා ද? සියළු දෙනාට තමා විසින් ප්‍රහීන කළ කෙලෙස් තමාට ඉතා පැහැදිළිය. ඉදින් මේ කෙලෙස් මාවිසින් ප්‍රහීන කළේ යැයි කියයි. අනතුරුව ඔබ කිනම් ධර්මයක් ලැබුවේ දැයි ඇසීය. සෝවාන් මාර්ගය ද, සකෘදාගාමි මාර්ගය ද නැතහොත් වෙනත් මාර්ගයක් දැයි යනුවෙනි. සියළු දෙනාට තමා ලැබූ ධර්මය තමාට පැහැදිළිය. මම මේ ධර්මයෙන් ලැබුවෙමියි කියයි. මෙපමණකින් ම ඔහුගේ කීම නොඇදහිය යුතුයි. බොහෝ ඇසූපිරූ තැන් ඇති ප්‍රශ්නෝත්තර ක්‍රමයෙහි දක්ෂ වූ භික්ෂුවට මේ කරුණු හය පිරිසිදු කිරීමට හැකි වෙත්.

ඉදින් භික්ෂුවගේ ආගමන ප්‍රතිපදාව පිරිසිදු කරගත යුතුය. ඉදින් ආගමන ප්‍රතිපදාව පිරිසිදු නොවේ නම් මේ ප්‍රතිපදාවෙන් ලෝකෝත්තර ධර්මයක් ලැබිය නොහැකි යැයි ඉවත් කළ යුතුය. ඉදින් ඔහුගේ ආගමන ප්‍රතිපදාව පිරිසිදු නම් බොහෝ කාලයක් ත්‍රිවිධ ශික්ෂායෙහි අප්‍රමාදව යෙදුණේ නිදි වර්ජනයෙහි ඇලුණේ සිව්පසයෙහි නොඇලුණේ අහසෙහි පාවෙන අත්ල සේ සිත් ඇතිව වාසය කෙරේ යැයි හැඟෙයි. ඒ භික්ෂුවගේ ප්‍රකාශ කිරීමත් ප්‍රතිපදාවත් යන දෙකම සැසඳෙයි. ගැළපෙයි. කෙසේද යත්? ගංගා නදියෙහි ජලය යමුනා නදියෙහි ජලය හා සැසඳෙන්නාක් මෙනි. මෙපරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් ශ්‍රාවකයන්ගේ නිර්වානගාමී ප්‍රතිපදාව සංසන්දනය කරයි. නිවන ද ප්‍රතිපදාව ද කියන ලද පරිදි ම වෙයි. තවද මෙපමණකින්ම සත්කාර නොකළ යුතුයි. කුමක්හෙයින් ද යත්? ඇතැම් සිහිඇති පෘථග්ජනයා කෙරෙහි ද රහතන් වහන්සේගේ පිළිවෙතට සමාන පිළිවෙත් පවතියි. එහෙයින් ඒ භික්ෂුව ඒ ඒ උපායයෙන් තැති ගැන්විය යුතුයි. රහතන් වහන්සේ නමකට නම්

හෙණයක් හිස මත වැටුණ ද බියක් හෝ තැති ගැනුමක් හෝ ලොමුදැහැගැන්මක් හෝ නොවෙයි. පෘථග්ජනයාට අල්පමාත්‍ර කාරණයක දී ද එසේ වෙයි. එයට මෙය සාධකයකි.

දීඝභාණක අභය තෙරුන් වහන්සේ එක් පිණ්ඩපාත භික්ෂුවකගේ පුහුදුන් බව ඒත්තු ගැනීමට නොහැකි වූ විට දහර සාමණේරයෙකුට සංඥාවක් දුන්නේය. පිණ්ඩපාතික භික්ෂුව කැළණි ගඟ මුවදොර නාමින් සිටිය දී සාමණේරයා දිය යට ගිලී උන්වහන්සේගේ පාදයෙන් ඇද්දේය. පිණ්ඩපාතිකයා කිඹුලෙකැයි සිතා උස් හඬින් කෑ ගැසීය. එවිට ඔහු පෘථග්ජනයෙකැයි දැනගත්තාහ.

චන්දමුඛ තිස්ස නම් රජු දවස මහා විහාරයේ සංඝස්ථවිර වූ රහතන් වහන්සේ දුබල ඇස් ඇත්තේ විහාරයෙහිම වාසය කරයි. රජු තෙරුන් වහන්සේ පරීක්ෂා කරන්නෙමියි භික්ෂූන් පිඩුසිඟා ගිය කළ නිශ්ශබ්දව ළඟට පැමිණි සර්පයෙකු මෙන් පා ඇල්ලීය. තෙරුන් වහන්සේ ගල් ටැඹක් මෙන් නිශ්චලව සිට මෙහි කවරෙක්දැයි ඇසීය. ස්වාමීනි, මම තිස්ස වෙමි. තිස්සය අපට සුවඳ දැනුනේ යැයි පැවසීය. මෙසේ රහතුන්ට බියක් නැත. ඇතැම් පෘථග්ජනයෙක් ඉතා දක්ෂ වෙයි. නිර්භය වෙයි. ඔහු ඇලුම් කරන අරමුණුවලින් පරීක්ෂා කළ යුතුය. වසභ රජු ද එක් තෙරුන් වහන්සේ නමක් පරීක්ෂා කර බලන්නේ ගෙහි වැඩහිඳුවා උන්වහන්සේගේ ඉදිරියෙහි දෙබර එල මිරිකමින් සිටියේය. මහතෙරුන්ට කෙළ ඉනීය. එයින් තෙරුන්ගේ පුහුදුන් බව ප්‍රකට විය. රහතුන්ට රස තෘෂ්ණාවක් නැත. දිව්‍ය රසයෙහි ද ඇල්මක් නැත. එහෙයින් මේ උපායෙන් පරීක්ෂා කර බලා ඉදින් ඔහුට බියක් හෝ තැති ගැන්මක් හෝ රස තෘෂ්ණාවක් හෝ උපදියි ද ඔබ රහතෙක් නොවේ යැයි ඉවත් කළ යුතුය. ඉදින් බිය නොවේ ද තැති නොගනී ද සිංහයෙකු මෙන් සිටියි ද දිව්‍ය අරමුණෙහි ද ආශා නූපදවයි ද මේ භික්ෂුව මනා සත්‍ය ප්‍රකාශ කිරීම් ඇත්තෙකි. රාජ රාජ මහාමාත්‍යාදීන් විසින් කරනු ලබන සත්කාර ලැබීමට සුදුසුය.

ඡබ්බිසෝධන සූත්‍ර වර්ණනාව නිමි.

## 2.4.3

**එවමෙමසුතනති** සප්පුරිසධම්ම සූත්‍රය මා විසින් මෙසේ අසන ලදි. එහි **සප්පුරිසධම්මනති** සත්පුරුෂයන්ගේ ධර්මයන්ය. **අසප්පුරිසධම්මනති** පවිටු පුරුෂයන්ගේ ධර්මයන්ය. මෙසේ මාතෘකා තබා නැවතත් මාර්ගයෙහි දක්‍ෂ පුරුෂයෙක් වම මුදා දකුණ ගනියි ද පළමුව මිදිය යුත්ත කියයි. මෙසේ අත්හළයුතු ධර්ම පළමුව දක්වමින් **කතමො ච භික්ඛවෙ අසප්පුරිසධම්මාති** යනාදිය කීය. එහි **උච්චාකුලාති** ක්‍ෂත්‍රිය කුලය බ්‍රාහ්මණ කුලය යන මේ කුල දෙක උසස් කුල යැයි කියයි. **සො තත්‍ථ පුජෙතාති** ඔහු ඒ භික්‍ෂූන් අතරෙහි පූජාවට සුදුස්සෙක් වේ. **අන්තරං කරිත්වාවාති** ඇතුළතට කොට **මහාකුලාති** ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණ වෛශ්‍ය යන මේ කුල තුන මහාකුල යැයි කියයි. **මහාභොගකුලාති** මහත් භෝගයන්ගෙන් සමන්විත කුලයන් **උළාරභොගකුලාති** මහත් සේ ප්‍රණීත වූ භෝගයන්ගෙන් සමන්විත කුලයන්. මේ පද දෙකෙන් සතර කුලයම ගනු ලැබෙත්. යම්කිසි කුලයක උපන්නෙක් පින් බලයෙන් මහා භෝගයන්ගෙන් ද උළාර භෝගයන්ගෙන් ද යුක්ත වෙයි.

**යසස්සීති** පිරිවර සහිත වූයේ **අප්පඤ්ඤාතාති** රාත්‍රියෙහි යවන ලද හීයක් මෙන් සංඝයා මැද ආදි තැන්හි නොදක්නා ලැබෙත්. **අප්පෙසක්ඛාති** ස්වල්ප වූ පිරිවර ඇත්තේ **ආරඤ්ඤකොති** සමාදන් වූ ආරණ්‍යක ධුතාංගය ඇති. සෙසු ධුතාංගයන් ගැන ද මේ ක්‍රමයමයි. මේ සූත්‍ර පෙළෙහි ධුතාංග නවයක් ආවේය. ඒවා විස්තර වශයෙන් දහතුනක් වෙයි. ඒවා අතුරෙන් යමක් ගැන කිවයුතු ද ඒ සියල්ල සියළු ආකාරයෙන් විසුද්ධිමාර්ගයෙහි ධුතාංග නිර්දේශයේ දී කියන ලදි. **අතම්මයතාති** තම්මයතා යනු තෘෂ්ණාවයි. තෘෂ්ණාවක් නොමැතිබව තේරුමයි. **අතම්මයතං යෙව අන්තරං කරිත්වාති** තෘෂ්ණා රහිතබව ම කාරණා කොට එය ඇතුළත් කොට සිත උපදවා යන තේරුමයි. නිරෝධවාරයේ දී අනාගාමීහු හා රහත්හු ඒ සමාපත්තියට සමවදිත්. පෘථග්ජනයාට එය නැත. එහෙයින් අසප්පුරිසවාරය පිරිහුණේය. **න කිඤ්චි මඤ්ඤතීති** කිසියම් පුද්ගලයෙක් ත්‍රිවිධ මඤ්ඤනාවෙන් නොහඟියි. **කුහිඤ්චි න මඤ්ඤතීති** කිසියම් අවකාශයක යැයි නොහඟියි. **න කෙනචි මඤ්ඤතීති** කිසියම් වස්තුවක් නිසා හෝ පුද්ගලයෙක් නිසා හෝ නොහඟියි. ඉතිරිය සියළු තැන්හිම දක්වූවා මෙන්ය.

**සප්පුරිසධම්මසූත්‍ර වර්ණනාව නිමි.**

# 2.4.4

එවමෙමසුතනති සෙවිතබ්බනසෙවිතබ්බ සූත්‍රය මා විසින් මෙසේ අසන ලදි. එහි **අසෙවිතබ්බම්පිං කායසමාචාරනති** සේවනයට සුදුසු කාය සමාචාරය අනිකකි. සේවනයට නුසුදුසු කාය සමාචාරය අනිකකි යි පවසමි. සේවනය කළ යුත්ත ම යම්කිසි ක්‍රමයකින් සේවනය නොකටයුතු යැයි ද සේවනය නොකටයුත්ත සේවනය කළ යුතු යැයි ද නොකියමි යි යන තේරුමයි. වාග් සමාචාරාදිය ගැන ද මේ ක්‍රමයමයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ පද හතකින් මාතෘකා තබා විස්තර වශයෙන් නොබෙදා ම දේශනාව නිමවීය. කුමක් නිසා ද යත්? සැරියුත් තෙරණුවන්ට අවකාශ දීම සඳහාය. මනෝ සමාචාරයේ දී මිථ්‍යාදෘෂ්ටි සම්‍යක් දෘෂ්ටීහු දෘෂ්ටීන්ගේ ලැබීම් වශයෙන් වෙන්වීමෙන් යුතුව සිටියේ යැයි නොගන්නා ලදි. චිත්තෝප්පාදයෙහි කර්මපථ බවට නොපත් බැවින් අභිධ්‍යාදිය දත යුතුයි. සංඥා ප්‍රතිලාභ වාරයේ දී අභිධ්‍යා සහගත බැවින් සඤ්ඤායාති ආදිය කාමසංඥා ආදිය දැක්වීම සඳහා කියන ලදි.

**සව්‍යාපජ්ඣනති** දුක් සහිත **අපරිනිට්ඨිතභාවායාති** භවයන් පිළිබඳව කෙළවරක් නොමැති බවයි. මෙහි ව්‍යාපාද සහිත බව නම් සතර වැදෑරුම් වෙයි. පෘථග්ජනයා එම ආත්මභාවයේ ම භවය අවසන් කිරීමට නොහැකි වෙයි ද ඔහුගේ ප්‍රතිසන්ධියේ පටන් අකුසල ධර්මයෝ ම වැඩෙත්. කුසල ධර්මයෝ පිරිහෙත්. දුක් සහිත ආත්ම භාවයක් උපදවා ගන්නේම ය. සෝවාන් සකෘදාගාමි අනාගාමීහු ද එසේමය. පෘථග්ජන ආදීන් එහිම වෙත්වා. අනාගාමියා දුක් සහිත ආත්ම භාවයක් උපදවා ගන්නේ කෙසේද? ඔහු පිළිබඳ අකුසල ධර්ම වැඩෙන්නේ කෙසේද? කුසල ධර්ම පිරිහෙන්නේ කෙසේද යත්? අනාගාමියා සුද්ධාවාසයෙහි උපන්නේ උයන්විමන් කප්රුක් ආදිය බලා අනේ සැපයි! අනේ සැපයි! යනුවෙන් උදන් අනයි. අනාගාමියා භව ආශාව භව තෘෂ්ණාව ප්‍රහීණ නොකළේ වෙයි. තෘෂ්ණාව ප්‍රහීණ නොකළ බැවින් ඔහුට අකුසල ධර්ම වැඩෙත්. කුසල් පිරිහෙත්. දුක් සහිත ආත්ම භාවයක් ලැබුවේ වෙයි. එහෙයින් කෙළවර නොකළ භවයක් ඇත්තෙකැයි දත යුතුයි. **අව්‍යාපජ්ඣනති** දුක් නැති මෙය ද මුලින් කී සතරදෙනා වශයෙන් දත යුතුයි. යම්කිසි පෘථග්ජනයෙක් එම ආත්ම භවයේදීම භවය අවසන් කරන්නට හැකිවෙයි. නැවත ප්‍රතිසන්ධියක් ද නොගණියි. ඔහුගේ පිළිසිඳ ගැනීමේ පටන් අකුසලය පමණක් පිරිහෙයි. කුසලය පමණක් වැඩෙයි. දුක් නැති ආත්ම භාවයක ම උපදියි. භවය අවසන් කළේ වෙයි. සෝවාන් සකෘදාගාමි අනාගාමීහු ද එසේමය. සෝවාන්

ආදීන් එහිම වෙත්වා. පෘථග්ජනයා කෙසේනම් දුක් නැති ආත්ම භාවයක උපදියි ද? ඔහුගේ අකුසල ආදිය පිරිහෙන්නේ කෙසේද? පශ්චිමභවික පෘථග්ජනයා ඒ ආත්ම භාවයෙන් තම භවය අවසන් කිරීමට සමත් වෙයි. ඔහුට නවසිය අනූනවයක් සත්ත්වයන් ඝාතනය කළ අංගුලිමාලයාට මෙන් දුක්නැති ආත්ම භාවයක් ලැබෙයි. භවය අවසන් වේ. අකුසලය පිරිහෙයි. විදර්ශනාව ම ගැබ්කර ගනියි.

**චක්ඛුවිඤ්ඤෙය්‍යන්ති** යම්හෙයකින් යමෙකුගේ රූපයෙහි රාගාදීහු උපදිත් ද ආශා කරයි ද ආශ්වාද කරයි ද එසේ ආශා කරන්නා වූ ආශ්වාද කරන්නා වූ ඔහු මහත් කරදරයට පැමිණේ. ඇතැමෙකුට එසේ නොඋපදිත්. කළකිරෙයි. නොඇලෙයි. කළකිරෙන්නා වූ නොඇලෙන්නා වූ ඔහු නිවනට පැමිණෙයි. එහෙයින් එය ද ඔවුනොවුන්ගේ වශයෙන් නොකියන ලදි. හැම තැන්හිම මේ ක්‍රමයයි. **එවං විත්ථාරෙන ආජානෙය්‍යුන්ති** මෙහි දී කවරෙක් බුදුරදුන්ගෙන් මේ දේශනාව දැනගත්තේ ද? කවරෙක් දැන නොගත්තේ ද? යමෙක් මේ සූත්‍ර පෙළත් අට්ඨකථාවත් ඉගෙන එය පිළිපදින්නෝ නොවෙත් ද? කියන ලද පරිදි අනුලොම් පිළිවෙත නොපිළිපදිත් ද? ඔවුහු නොදන්නෝ නම් වෙත්. යමෙක් පිළිපදිත් ද කියන ලද පරිදි අනුලොම් පිළිවෙත පිළිපදිත් ද ඔවුහු දන්නෝ නම් වෙත්. **එවං සන්තෙපි සප්පටිසන්ධිකානං තාව දීඝරත්තං හිතාය හොතු අප්පටිසන්ධිකානං කථං හොතීති.**

ප්‍රතිසන්ධි රහිතයෝ ඉන්ධන රහිත ගින්න මෙන් නිවෙත්. කල්ප ලක්ෂයකගේ ඇවෑමෙන්වත් ඔවුන්ට නැවත දුකක් නම් නැත. මෙසේ ඒකාන්තයෙන් ම ඔවුන්ට දීර්ඝ කාලයක් හිත සැප පිණිස වෙයි. ඉතිරිය සියළු තැන්හිම දක්වූවා මෙන් ය.

**සෙවිතබ්බාසෙවිතබ්බ සූත්‍ර වර්ණනාව නිමි.**

## 2.4.5

**එවමෙමසුතන්ති** බහුධාතුක සූත්‍රය මාවිසින් මෙසේ අසන ලදි. එහි **භයානීති** බිය වූ සිත්හි හටගන්නා තැති ගැන්මයි. **උපද්දවොති** අස්වැසිල්ලක් නැති **උපසග්ගොති** ලතවන ආකාරය. ඒ ඒ තැන්වල ඇලෙන ගතිය.

ඒවායේ වෙනස් ස්වභාවය ද දත යුතුයි. පර්වත ආදී විෂමභාවයෙන් යුත් තැන්වල දී සොරු දනව් වැසියන් කරා යෙති. අපි අසවල් දවසෙහි නුඹලාගේ ගම පහරන්නෙමු යි කියත්. ඒ පුවත ඇසූ කාලයේ පටන් බියට තැති ගැනීමට පැමිණෙත්. මේ චිත්තුත්‍රාසය නම් වේ. මෙහිදී සොරු අප හා කිපී අනතුරු කරතැයි බියෙන් හස්තසාර වස්තූන් හා දෙපා සිව්පා සතුන් ද සමඟ වනයට පිවිස ඒ ඒ තැන්හි හිඳිත්. මැසි මදුරුවන් කනු ලබන්නේ ද වන ලැහැබට පිවිසෙත්. කණකටු හුල් ඇනෙත්. මොවුන්ගේ මේ හැසිරීම අස්වැසිල්ලක් නැති බව දක්වයි. ඉක්බිති සොරුන් විසින් කියන ලද දවසෙහි නොපැමිණි විට එය බොරු පුවතක් වන්නේ යැයි ගමට යමුයි සපිරිවරින් සියළු දේ ගෙන ගමට පිවිසෙත්. අනතුරුව ඔවුන් පැමිණි බව දැන ගම පිරිවා දොර ගිනි තබා මිනිසුන් මරා සොරු සියළු සම්පත් පැහැරගෙන යති. ඔවුන් අතරෙන් මරණයෙන් බේරුණු අය ගිනි නිවා කොටු සෙවන බිත්ති සෙවන ආදි ඒ ඒ තැන්වල ලැග හිඳිත්. නැසුණු අය ගැන දුක්වෙති. මේ පිවිසෙන ආකාරය හා තැවෙන ආකාරයයි.

**නළාගාරාති** හුණදඬු ආදියෙන් සෙවන ඇති කරගත් ගෙවල්. අනෙත් උපකරණ දුවමය වෙයි. තණකොළවලින් සෑදූ ගෙවල් ද මේ ක්‍රමයමයි. **බාලතො උප්පජ්ජන්තීති** බාලයන් නිසාම උපදිත්. බාලයා යනු මෝඩයායි. රාජ්‍යයක් හෝ උප රාජ්‍යයක් හෝ වෙනත් බලවත් තනතුරක් හෝ බලාපොරොත්තු වන්නෙක් සොර අඹුවකගේ පුතුන් කීපදෙනෙක් තමාට සමාන අයගෙන් තෝරාගෙන එව්, මම නුඹලා පොහොසතුන් කරන්නෙමියි පර්වත ගුහා ආදිය ඇසුරු කොටගෙන ඇතුළු ගම් පහරමින් දාමරිකයන් බව හඟවා පිළිවෙළින් නියම්ගම් ද ජනපදයන් ද පැහැරිය යුතුය. මිනිස්සු ගෙවල් අතහැර බිය නැති තැන් සොයා යති. ඔවුහු නිසා විසූ භික්ෂු භික්ෂුණීහු ද තමතමන් වසන තැන් අතහැර දමා යති. ගිය ගිය තැන ආහාර ද සෙනසුන් ද දුර්ලභ වෙයි. මෙසේ සිව්පිරිසට බියේ පැමිණියේ වෙයි. පැවිද්දන් අතරෙහි මෝඩ මහණුන් දෙදෙනෙක් ඔවුනොවුන් විවාදයක් ඇතිකොට චෝදනාවක් ඇති කරයි. මෙසේ කොසඹෑනුවර වැසි මහණුන් අතර මෙන් මහත් කලහයක් උපදියි. **චතුන්නං පරිසානං භයං ආගතමෙව හොතීති** මෙසේ යම්කිසි බියක් උපදියි ද ඒ සියල්ල මෝඩයා නිසාම ඉපදුණේ යැයි දතයුතුයි. **එතදවොචාති** බුදුරදුන් ධර්මදේශනාව අවසන් නොකොට නිමවූහ. මම බුදුරදුන් විමසා සර්වඥතා ඥානයෙන් දේශනාවගේ කෙළවර කරන්නේ නම් ඉතා යෙහෙකියි සිතා **මේ කිත්තාවතා නු බො භන්තෙ** යනාදී වචන කීය. අටළොස් ධාතූන්හි එකොළොස් හමාරක් ධාතූහු රූප පිළිගන්නාහුය. ධාතූන් අට හමාරක්

අරූප පිළිගන්නාහුය. මින් රූපාරූප පරිග්‍රහය කියන ලදි. සියල්ල ස්කන්ධ වශයෙන් පංචස්කන්ධයෝ වෙත්. පංචස්කන්ධය දුක්ඛ සත්‍යයයි. ඒවායේ ඇලෙන ගතිය සමුදය සත්‍යයයි. දෙදෙනාගේ නොපැවැත්ම නිරෝධ සත්‍යයයි. නිරෝධය දැන ගැනීම් ප්‍රතිපදාව මාර්ග සත්‍යයයි. මෙසේ චතුරාර්ය සත්‍ය කර්මස්ථානය එක් භික්ෂුවකගේ නික්ම යෑම කුළු ගන්වමින් දේශනා කළේ වෙයි. මේ මෙහි සංක්ෂේපයයි. විස්තර වශයෙන් මේ ධාතු පිළිබඳව විසුද්ධිමාර්ගයේ දී කියන ලදි.

**ජානාති පසසතීති** විදර්ශනාව සමඟ ම මාර්ගය කියන ලදි. පෘථිවිධාතු ආදිය සවිඥානක ශරීරය ශූන්‍ය වශයෙන් නිශ්‍රිය වශයෙන් දක්වනු සඳහා කියන ලදි. පළමු අටළොස් ධාතුන්ගෙන් පිරිය යුතු කොටස් පුරන්නහු විසින් විඥානධාතුන් වශයෙන් ගෙන පිරිය යුතුයි. සෙසු විඥානධාතුහු චක්ෂුර්විඥානාදී වශයෙන් සයවැදෑරුම් වේ. එහි චක්ෂුර්විඥාන ධාතුවෙන් පිළිගත් එහි වස්තුව චක්ෂුර්ධාතු ආරම්මණයයි. රූපධාතු දෙකක් පිළිගන්නා ලද්දේ වෙයි. සියළු තැන්හිම මේ ක්‍රමයයි. මනෝවිඥාන ධාතුවෙන් ගන්නා ලද එහි පෙර පසු වශයෙන් මනෝධාතු ආරම්මණ වශයෙන් ධම්මධාතුන් දෙදෙනෙක් ගන්නා ලදි. මෙසේ මේ අටළොස් ධාතුන්හි එකොළහ හමාරක් ධාතුහු රූප ගනියි. මුලින් කී පරිදි මෙය ද එක් භික්ෂුවකගේ නික්ම යෑම නිසා කියන ලදි.

**සුඛධාතුති** සැපය ද නිශ්‍රිත ශූන්‍යාර්ථයෙන් ධාතු ද සුඛධාතු නම් වේ. සියළු තැන්හිම මේ ක්‍රමයයි. මෙහි පළමු ධාතු සතර ප්‍රතික්ෂේප සහිතව ගන්නා ලදි. පසුව කී දෙක සමාන වශයෙන් ද අවිභූත වශයෙන් ද ගැනේ. උපේක්ෂාධාතුව අවිද්‍යාධාතුව කෙරෙන් සමානය. මෙහි සුඛදුක්ඛ ධාතුන් කෙරෙහි ගත් කළ කායවිඥාන ධාතුව ගන්නා ලද්දේ වේ. ඉතිරිය ගත් කළ මනෝවිඥාන ධාතුව ගත්තේ වෙයි. මේ ධාතු හය යට කී අටළොස් ධාතුන්ගෙන් ම පිරවිය යුතුය. පුරවන්නහු විසින් උපේක්ෂා ධාතුවෙන් බැහැර කර පිරවිය යුතුය. මෙසේ මේ අටළොස් ධාතුන් අතරෙහි එකොළහ හමාරක් ධාතුහු රූප පරිගෘහිතය. මුලින් කී පරිදි මෙය ද එක් භික්ෂුවකගේ නික්ම යෑම නිසා කියන ලදි. කාමධාතු ආදීන් පිළිබඳව දෙපරිද්දකින් විතර්කනය කිරීමෙන් කාමවිතර්කාදියෙහි කී ක්‍රමයෙන්ම අර්ථය දතයුතුය. අභිධර්මයෙහි ද **තත්‍ථ කතමා කාමධාතු කාමපටිසංයුත්තො තක්කො විතක්කොති** ආදී ක්‍රමයෙන් මෙය විස්තර කරන ලදි. මේ ධාතු හය යට කී අටළොස් ධාතුන්හි ම පිරවිය යුතුය. එසේ පුරන්නහු විසින් කාමධාතුවෙන් බැහැර කර පිරවිය යුතුය. මෙසේ මේ අටළොස් ධාතුන් අතරෙහි එකොළහ හමාරක් ධාතුහු රූප පරිගෘහිතය. මුලින් කී පරිදි

මෙය ද එක් භික්ෂුවකගේ නික්ම යෑම නිසා කියන ලදි. කාමධාතු ආදීන්හි කාමාවචර ස්කන්ධ පහ කාමධාතු නම් වේ. රූපාවචර ස්කන්ධ පහ රූපධාතු නම් වේ. අරූපාවචර ස්කන්ධ හතර අරූපධාතු නම් වේ. අභිධර්මයේ දී එහි කාමධාතු කවරේද යත්? යටින් අවීචි නිරය මායිම් කර යනාදී ක්‍රමයෙන් මෙහි විස්තර දැක් වේ. මේ ධාතු තුන යට කී අටළොස් ධාතූන්හි පිරවිය යුතුයි. පුරන්නහු විසින් කාමධාතුවෙන් බැහැර කර පිරවිය යුතුයි. මෙසේ මේ අටළොස් ධාතූන් අතරෙහි එකොළහ හමාරක් ධාතූහු රූප පරිග්‍රහිතය. මුලින් කී පරිදි මෙය ද එක් භික්ෂුවකගේ නික්ම යෑම නිසා කියන ලදි.

**සංඛතාති** ප්‍රත්‍යයන්ගෙන් සකස් වී. මෙය පංචස්කන්ධයට තවත් නමකි. සංඛත නොවූයේ අසංඛතයි. මෙය නිවනට තවත් නමකි. මේ ධාතු දෙක යට කී අටළොස් ධාතූන්හි පිරවිය යුතුයි. පුරන්නහු විසින් සංඛත ධාතුවෙන් බැහැර කර පිරවිය යුතුයි. මෙසේ මේ අටළොස් ධාතූන් අතරෙහි එකොළහ හමාරක් ධාතූහු රූප පරිග්‍රහිතය. මුලින් කී පරිදි මෙය ද එක් භික්ෂුවකගේ නික්ම යෑම නිසා කියන ලදි. **අජ්ඣත්තිකබාහිරානීති** අධ්‍යාත්මික වූ ද බාහිර වූ ද වේ. මෙහි ඇස් ආදී ද්වාර හය අධ්‍යාත්මිකයි. රූප ආදී අරමුණු හය බාහිර නම් වේ. මෙය ද දනියි දකියි යනුවෙන් විදර්ශනා මාර්ගයෙන් කියන ලදි. **ඉමස්මිං සති ඉදන්ති** යනාදිය මහා තණ්හාසංඛ්‍ය සූත්‍රයේ විස්තර කරන ලද්දේ වේ. **අට්ඨානන්ති** හේතු ප්‍රතික්ෂේපයයි. **අනවකාසොති** ප්‍රත්‍ය ප්‍රතික්ෂේපයයි. මේ දෙකින් ම කාරණය ප්‍රතික්ෂේප කරයි. කාරණය යනු එයට අයත් පැවැත්ම නිසා සිය ඵලයට කරුණු වේ ද අවකාශය යැයි කියයි. **යන්ති** යම් කරුණකින් **දිට්ඨිසම්පන්නොති** මාර්ග දෘෂ්ටියෙන් යුතු වූ සෝවාන් ආර්ය ශ්‍රාවකයා.

**කඤ්චි සංඛාරන්ති** චාතුර්භූමික සංස්කාරයන් අතරෙහි කිසියම් එක් සංස්කාරයක්, **නිච්චතො උපගච්ඡෙය්‍යාති** නිත්‍ය යැයි පිළිගනියි. **නෙතං ඨානං විජ්ජතීති** මෙනම් කරුණක් නැත. නොලැබෙයි. **යං පුථුජ්ජනොති** යම් කරුණකින් පෘථග්ජනයා **ඨානං මෙතං විජ්ජතීති** මෙයට කරුණක් ඇත. ශාස්වත දෘෂ්ටියෙන් ත්‍රෛභූමික සංස්කාරයන්හි කිසියම් සංස්කාරයක් නිත්‍ය වශයෙන් ගන්නේය යන තේරුමයි. සතරවන භූමිගත සංස්කාරයෝ තේජසින් උණුසුම්ව පවත්නා බැවින් දවස මුළුල්ලේ තැවුණු ලෝහ ගුලියක් සේ අනෙක් අකුසල අරමුණු නොවෙත්. මේ ක්‍රමයෙන් කිසියම් සංස්කාරයක් සැප යැයි ආදී තැන්වල අර්ථ දත යුතුයි. **සුඛතො උපගච්ඡෙය්‍යාති** ඒකාන්ත සැපවත් ආත්මයක් වෙයි. දතයුතුයි. **අරොගො පරමමරණාති** මෙසේ ආත්මදෘෂ්ටි වශයෙන් සැප යැයි ගැනීම සඳහා මෙය කියන ලදි. දෘෂ්ටි විප්‍රයුක්ත සිතින් ආර්ය ශ්‍රාවකයා පරිදාහයෙන්

මඩනා ලද්දේ එය සංසිඳවීම සඳහා මත් ඇතෙකුගේ තැති ගැනීමක් මෙන් චොක්ක නම් බමුණා අසූචි සංඛ්‍යාත කෙලෙස් සැප වශයෙන් ගනියි. ආත්ම වාරයේ දී කසින ආදී ප්‍රඥප්තීන් සංග්‍රහ කිරීම් වස් සංස්කාරයන් යැයි නොකියා කිසියම් ධර්මයක් යැයි කීය. මෙහි ද ආර්ය ශ්‍රාවකයාගේ චතුභූමික වශයෙන් පිරිසිඳීම දත යුතුය. පෘථග්ජනයාගේ ත්‍රෛභූමික වශයෙන් හැම වාරයන්හි ම හෝ ආර්ය ශ්‍රාවකයාගේ ත්‍රෛභූමික වශයෙන් පිරිසිඳීමයි.

**යං හි යං පුථුජ්ජනො ගණ්හාති** පෘථග්ජනයා යමක් යමක් ගනී ද ආර්ය ශ්‍රාවකයා එයින් ගැනීම විපරීතව දකී. පෘථග්ජනයා යමක් නිත්‍ය සැප ආත්මයක් යයි ගනී ද ආර්ය ශ්‍රාවකයා එය අනිත්‍ය දුක්ඛ අනාත්ම යැයි ගනිමින් ඒ ගැනීම විපරීතව දක්වයි. **මාතරන්ති** ආදියෙහි උපදවන්නී මවයි. උපදවන්නා පියායි. මනුෂ්‍ය වූ කෙලෙස් ක්ෂය කරන ලද රහතෙක්ය යන අදහසයි. ආර්ය ශ්‍රාවකයා අනෙකෙකු ජීවිතයෙන් තොර කරන්නේ ය යන මේ කරුණ නො වන්නේම ය. ඉදින් භවාන්තරගත ආර්ය ශ්‍රාවක බව නොදන කිසිවෙක් මෙසේ කියන්නේය. මේ කුඩා කුහුඹුවා මරා සියළු සක්වළෙහි සක්විති රාජ්‍ය පිළිගනුවයි කියයි ද ඒ රහත් උතුමා ඒ සතා නො මරන්නේම ය. ඉදින් මේ සතා නොමරන්නේ නම් නුඹගේ හිස සිඳින්නෙමු යි කියයි. ඔහුගේ හිස සිඳුවත් ඔහු ඒ සතා නො මරන්නේම ය. පෘථග්ජන බවෙහි මහා වැරදි බව දක්වීම සඳහා ද ආර්ය ශ්‍රාවකයාගේ බලය දක්වීම සඳහා ද මෙය කියන ලදි. පෘථග්ජන ගතිය වැරදි සහිතය. යම්හෙයකින් පෘථග්ජනයා මව මැරීම් ආදී ආනන්තරිය අකුසලයක් කරන්නේය. මහා බලවත් වූ ආර්ය ශ්‍රාවක තෙමේ මේ කර්ම නොකරයි.

**දුට්ඨචිත්තෙනාති** වධක චේතනාවෙන් දූෂණය වූ සිත **ලොහිතං උප්පාදෙය්‍යාති** ප්‍රාණය සහිත ශරීරයෙහි කුඩා මැස්සෙක් බොන ප්‍රමාණයේ ලේ බිඳක්වත් සොලවන්නේ ද යනුයි. **සංඝං භින්දෙය්‍යාති** සමාන සංවාසක වූ සමාන සීමාවෙහි සිටි සංඝයා කරුණු පහකින් බිඳින්නේය. එහෙයින් මෙය කියන ලදි. උපාලිය, කරුණු පහකින් සංඝභේදය වන්නේය. කර්මයෙන්, උදෙසීමෙන්, ව්‍යවහාරයෙන්, අනුසාවනයෙන්, ලාභබත් ගැනීමෙන් යනුයි. එහි **කම්මෙනාති** අපලෝකනාදි කර්ම හතරින් එක්තරා කර්මයකින්, **උද්දෙසෙනාති** පස්වැදෑරුම් පාමොක් උදෙසීම් අතරෙන් එක්තරා උද්දේසයකින්. **වොහරන්තොති** කීමෙන්ය. ඒ ඒ උප්පත්තීන්ගෙන් ධර්මය අධර්මය යැයි ආදී අටළොස් භේදකර වස්තූන් දක්වමින්. **අනුසාවනෙනාති** කිම නුඹලා දන්නහු ද? මා උසස් කුලයකින් පැවිදි වූ බව ද බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව ද ධර්මය විනය ආදී ශාස්ත්‍ර

Scanned with CamScanner

ශාසනය මා සේ උගනිව්. සිත් ඉපදවීම් මා සේ කරව්. මට අවීචිය නිලුපුල් වනයක් සේ සිහිල්ය. එහෙයින් මම අවීචියට බිය නොවෙමි. යනාදි ක්‍රමයෙන් කනට ලංකර කියා පෑමෙන්. **සලාකගාහෙනාති** මෙසේ කියා ඔවුන්ගේ සිත් ප්‍රමාණය ඉක්මවීම් ස්වභාවයට පමුණුවා ගනුවයි. **ඉමං සලාකනති** සලාකග්‍රහය දක්වයි. මෙහි කර්මය හෝ උදෙසීම පමණි. ව්‍යවහාර, අනුසාවන, සලාකග්‍රාහ යන මේ දේ පූර්වභාග නම් වේ. අටළොස් වස්තූන් දැක්වීම් වශයෙන් ව්‍යවහාර කරන්නහු විසින් එහි රුචිය උපදවනු සඳහා අනුසාවනය කර ලාභබත් ගත්තාහු සංඝයා ඉක්මවා සිටියි. යම්විටෙක මෙසේ හතර දෙනෙක් හෝ හයට වඩා හෝ ලාභබත් ගන්වා පුරුදුකර පවත්වාගෙන කර්මයක් හෝ උදෙසීමක් හෝ කරත් ද එකළ සංඝයා බිඳුණේ වෙයි. මෙසේ දෘෂ්ටි සම්පන්න පුද්ගලයා සංඝයා බිඳින්ණේය යන මේ කරුණ විද්‍යාමාන නොවෙයි. මෙපමණකින් මව මැරීම් ආදි පංච ආනන්තරිය කර්ම දක්වන ලදි. මින් යමක් පෘථග්ජනයා ම කරයි. ආර්ය ශ්‍රාවකයා නොකරයි. එය ප්‍රකටවීම සඳහා කර්මයෙන් ද ද්වාරයෙන් ද කල්පස්ථායි ක්‍රමයෙන් ද විපාක සාධාරණය අනුව ද මෙහි විනිශ්චය වටහාගත යුත්තේය.

එහි කර්මයෙන් යන්න පළමුකොට දක්වයි. මෙහිදී මනුෂ්‍ය වූවෙකුගේ ම මනුෂ්‍ය වූ ම මව හෝ පියා හෝ ලිංග පරිවර්තනය වූ අයකු දිවිතොර කරන්නහුට ආනන්තරිය කර්මයක් වෙයි. එහි විපාකය වළකමියි සිතා සියළු සක්වළ ම මහා චෛත්‍ය ප්‍රමාණයෙන් රත්තරං චෛත්‍යයෙන් පිරෙව්ව ද සියළු සක්වළ ම පුරවා වැඩ හිඳ වූ භික්ෂු සංඝයාට මහා දන් දුන්න ද බුදුවරයෙකුගේ සිවුරු කොණ අතනොහැර හැසිරුණේ ද කාබුත් මරණින් පසු නිරයෙහි ම උපදියි. යම් විදියකින් තමා මනුෂ්‍යයෙකු වී මව හෝ පියා හෝ තිරිසන්ව උපදී සිටිත් ද නැතහොත් තමා තිරිසන්ව උපත ලබා සිටිද්දී මව හෝ පියා හෝ මනුෂ්‍යව ඉපදී සිටිත් ද නැතහොත් තමාත් තිරිසන් වූයේ මව්පියනුත් තිරිසන්ව ඉපදී සිටිය දී තිරිසන් වූ මව්පියන් මරා ද ඒ කර්මය ආනන්තරිය කර්මයක් නොවේ. බරපතල කර්මයක් වේ. ආනන්තරිය කර්මයට සමාන වශයෙන් සිටී.

මනුෂ්‍ය ජාතීන් වශයෙන් ගෙන මේ ප්‍රශ්නය කියන ලදි. එහිදී ඒළක චතුෂ්කය ද සංග්‍රාම චතුෂ්කය ද චෝර චතුෂ්කය ද කිව යුතුයි. එළුවෙකු මරමි යි එළුවා බැඳ තබන තැන සිටි මනුෂ්‍ය වූ මවක හෝ පියෙකු හෝ මරන්නේ ද ආනන්තරිය කර්මයට අසුවෙයි. එළුවෙකු හසුකොට ගනිමියි එළුවෙකු ම ගතහොත් ආනන්තරිය කර්මයට හසු නොවෙයි. මව්පියන් නොවුවහොත් ද එම කර්මයට හසු නොවෙයි.

Scanned with CamScanner

මව්පියන් දෙදෙනා එම චේතනාවෙන් හසුකොට ගතහොත් ආනන්තරිය කර්මයට හසුවන්නේමය. ඉතිරි චතුෂ්ක දෙකෙහි ද මේ ක්‍රමයමයි. මව්පියන් රහතුන් වේද එවිට ද මේ චතුෂ්ක හතර දත යුතුයි. මිනිසෙක්ව සිට රහතෙකු මැරීමෙන් පමණක් ආනන්තරිය කර්මය වේ. යක්ෂයෙක්ව සිට එසේ කිරීමෙන් ආනන්තරිය කර්මය නොවේ. ඒ කර්මය ඉතා බරපතලය. ආනන්තරිය කර්මය හා සමානය. මිනිස් රහතෙකුට ද පෘථග්ජන කාලයේ දී ම අවි පහර දුන් කළ ද විෂ හෝ දුන් කළ ද ඔහු රහත් බවට පැමිණ ඒ උවදුරෙන් ම මැරෙයි. එය අරහත්ත ඝාතනයක් ම වෙයි. පෘථග්ජන කාලයේ දෙන ලද යම් දානයක් රහත් බවට පැමිණ වළඳයි ද එය පෘථග්ජනයාට ම දෙන ලද්දේ වෙයි. සෙසු ආර්ය පුද්ගලයන් මරන්නට ආනන්තරිය අකුසලයක් නැත. ඒ කර්ම ආනන්තරිය කර්මයන් හා සමානව බරපතලය. **ලොහිතුප්පාදෙති** බුදුරදුන්ට නොබිඳිය හැකි ශරීරයක් ඇති බැවින් වෙනත් උපක්‍රමයකින් හම සිඳීම කොට ලේ වැගිරීමක් නම් නැත. ශරීරය ඇතුළතම එක් ස්ථානයක ලේ වැගිරීමක් ඇත. දේවදත්ත විසින් විසිකරන ලද ගලින් බුදුරදුන්ගේ පාදය තුවාල වී ලේ ගැලීය. පොරවෙන් පහර ලද කළ සේ පාද අභ්‍යන්තරයෙහි ම ලේ ගැලුවේය. එසේ කළ අයට ආනන්තරිය කර්මය වේ. ජීවක තෙමේ බුදුරදුන්ගේ කැමත්ත අනුව සැතකින් හම කපා එතනින් අපිරිසිදු ලේ ඉවත් කර පහසුව සැළසීය. එසේ කරන්නහුට පිනක් ම සිදු වේ.

තව ද යමෙක් බුදුරදුන් පිරිනිවි කල්හි සෑයවල් බිඳිති. බෝ ගස් සිඳිති. ධාතුන් උදුරා දමති. මෙසේ කරන්නන්ට කුමක් සිදුවේ ද? ආනන්තරිය කර්මය හා සමාන බරපතල අකුසල කර්මයක් වේ. ධාතු සහිත සෑයකට හෝ ප්‍රතිමාවකට අවහිර වන බෝ අතු කැපුවාට කම් නැත. තවද ඒ බෝ අතුවල සැඟවුණු පක්ෂීහු පිළිමාදියෙහි අපවිත්‍ර කරත් ද ඒවා කැපුවාට ද කම් නැත. පාරිභෝගික චෛත්‍යයට වඩා ශාරීරික චෛත්‍යය උතුම් වේ. චෛත්‍ය වස්තුන් බිඳගෙන යන බෝ මුල් සිඳ දැමීම ද සුදුසුය. යම් බෝ අත්තක් බෝධිඝරයට බාධා වෙයි ද එය ගෙය රැකීම පිණිස සිඳීමට ඉඩ නොලැබෙයි. මක්නිසාද යත්? ඒ ගෙය තනා ඇත්තේ බෝධියේ ප්‍රයෝජනය සඳහාය. ගෙහි ප්‍රයෝජනය සඳහා බෝධිය කළේ නොවන හෙයිනි. බෝධි ආසන ගෘහය කෙරෙහි ද මේ ක්‍රමයයි. යම්කිසි ආසන ගෘහයක ධාතු තැන්පත් කර ඇද්ද එහි ආරක්ෂාව උදෙසා බෝ අතු සිඳීම සුදුසුය. බෝධියේ ආරක්ෂාව සඳහා කුණු දිරූ අතුපතර ආදිය ඉවත් කිරීම ද සුදුසුය. ශරීරය පෝෂණය කිරීම මෙන් පිනක් එයින් ලැබෙයි.

**සංඝභෙදෙති** ඒ සීමාවට අයිති සංඝයා නොපැමිණි කළ වෙනත් තැනක වාසය කරන සඟ පිරිසක් ගෙන කරනු ලබන කර්ම, ව්‍යවහාර ලාභබත් ගැනීමාදිය කරන්නන්ට ද උද්දේසාදිය කරන්නන්ට ද සංඝභේදය වේ. ආනන්තරිය කර්මය ද වේ. එහෙත් සමඟිය යන හැඟීමෙන් කරන්නන්ට සංඝභේදය වේ. ආනන්තරිය කර්මය නොවේ. තව ද නව දෙනෙකුට අඩු පිරිසෙන් යුතුව ද අන්තිම පරිච්ඡේදයෙන් නව දෙනෙකුගෙන් යුතුව සංඝයා බිඳුවයි ද ඔහුට ආනන්තරිය කර්මය වේ. අනුවර්තක අධර්මවාදීන්ට මහා සාවද්‍ය කර්මය වේ. ධර්මවාදීන්ට අනවද්‍ය කර්මය වේ. එහි නව දෙනෙකුගෙන් අඩු වූ කළ ද නව දෙනෙකුගෙන් පිරුණු කළ ද සංඝභේදය වන බව මේ සූත්‍රයෙන් පැවසෙයි. උපාලිය, හතර දෙනෙක් එකතු වෙත් ද නව වැන්නා අස්වා ද ලාභබත් ගන්නවා ද මේ ධර්මයයි. මේ විනයයි. මේ ශාස්තෘ ශාසනයයි. මෙය ගනිව්. මෙයට රුචි කරව්. උපාලිය, මෙසේ කිරීමෙන් සංඝයා අතර පලුද්දක් ඇති වේ. සංඝභේදයක් වෙයි. උපාලිය, නව දෙනෙකු හෝ එයට අඩුව හෝ විනය කර්මයක් කළහොත් සංඝයා අතර පලුද්දක් ඇති වෙයි. සංඝභේදයක් ඇති වෙයි. මේ පහ අතරෙන් සංඝභේදය වචී කර්මයයි. ඉතිරි ඒවා කාය කර්මයයි. මෙසේ කර්ම වශයෙන් විනිශ්චයන් දතයුතුයි. ද්වාරතොති මේ සියල්ල කාය දොරටුවෙන් සිදුවෙයි. වචන දොරටුවෙන් නැගී සිටියි.

මෙහි කී මුල් හතර ආණත්තික, විජ්ජාමය යන ප්‍රයෝග වශයෙන් වචන දොරටුවෙන් නැගී සිට කාය දොරටුවෙන් ම පුරවයි. සංඝභේදය හස්තමුද්‍රා වශයෙන් කරන්නහුට කාය දොරටුවෙන් නැගිට වචන දොරටුවෙන් පුරවයි. මෙහිදී දොරටු යනුවෙන් විනිශ්චය දත යුතුයි. **කප්පට්ඨිතියතොති** මෙහි සංඝභේදය ම කල්පයක් පවත්නේය. **සණ්ඨහනෙතති** කල්පයෙහි හෝ කල්පයේ මැද හෝ සංඝභේදය කොට කල්ප විනාශයෙහි ම මිදෙයි. ඉදින් හෙට ම කල්ප විනාශය වෙයි ද අද සංඝභේදය කරයි ද හෙට ම මිදෙයි. එකම දවසක් පමණක් නිරයෙහි පැසෙයි. මෙබඳු කරුණක් නම් නැත. සෙසු කර්ම හතර ම ආනන්තරිය වෙයි. කල්පයක් පවත්නා ස්වභාවයක් නැත්තේය. මෙහි මෙසේ ද කල්පයක් පවත්නා ස්වභාවය දත යුතුයි. **පාකතොති** යමෙකු විසින් පස් වැදැරුම් නම් කර්ම කළාහු වෙත්. එහි සංඝභේදය ම පිළිසිඳීම් වශයෙන් විපාක දෙයි. ඉතිරිය විපාකය අහෝසි වීමේ කර්මය විපාකය අහෝසි නොවීමේ කර්මය යන මේ ආදීන්ගේ සැකයට යත්. සංඝභේදය නොවූ තැන්හි බුදුරදුන්ගේ ඇඟේ ලේ සෙලවීම එයද නොවූ කල්හි රහතුන් නැසීම එයද නොවූ කල්හි ඉදින් පියා සිල්වත් වී මව දුසිල්වත් නම් හෝ පියා

දුසිල්වත් වී මව සිල්වත් නම් හෝ එබන්දෙකු නැසීමෙන් පිළිසිඳීම් වශයෙන් විපාක දෙයි. ඉදින් මව්පිය දෙදෙනා ම නැසූ කල්හි දෙදෙනා ම සිල්වත් බවින් හෝ දුසිල්වත් බවින් එක හා සමාන නම් මව නැසීමේ කර්මය පිළිසිඳීම් වශයෙන් විපාක දෙයි. මව වනාහි බොහෝ සෙයින් දුක ඉවසන බැවින් හා දරුවන්ට බොහෝ උපකාරී වන බැවිනුත් යැයි මෙහි මෙසේ ප්‍රකට වූ විනිශ්චය දත යුතුයි. **සාධාරණාදීහීති** පළමු හතර ගිහි පැවිදි සියළු අයට සාධාරණයය. සංඝභේදය වනාහි උපාලිය, භික්ෂුණීහු සංඝභේදය නොකරයි. සික්ඛමානාවෝ ද සාමණේරයෝ ද සාමණේරියෝ ද උපාසකයෝ ද උපාසිකාවෝ ද සංඝභේදය නොකරයි. උපාලිය, භික්ෂුව වනාහි ප්‍රකෘති පැවතුම් ඇත්තේ සමානව එකට වාසය කරන්නේ සමාන සීමාවෙහි සිටින්නේ සංඝභේදය කරයි යන වචනයෙන් කී ආකාරයට භික්ෂූන්ට ම වෙයි. අන්‍යයන්ට නොවේ. එහෙයින් අසාධාරණො ආදි ශබ්දයෙන් මේ සියලු දුක් වේදනා සහිත වූ ද්වේෂ මෝහයන් සමඟ යෙදුනා වූ ද යන මෙහි මෙසේ සාධාරණාදීන්ගේ විනිශ්චය දත යුතුයි. **අඤ්ඤං සත්ථාරන්ති** මේ මාගේ ශාස්තෘන්ය. ශාස්තෘන්ගේ කෘත්‍ය කිරීමට අසමත්යැයි භවාන්තරයෙහි අන්‍යතීර්ථකයන්ට මේ මාගේ ශාස්තෘන්ය. මෙසේ ගන්නෙහිය යන මේ කාරණය නොවන්නේමය යන තේරුමයි. **එකිස්සා ලොකධාතුයාති** දස දහසක් ලෝක ධාතුන්ය. **තීනි හි ඛෙත්තානීති** ජාති ක්ෂේත්‍ර, ආඥා ක්ෂේත්‍ර, විෂය ක්ෂේත්‍ර යනුයි. එහි ජාති ක්ෂේත්‍රය නම් දස දහසක් ලෝක ධාතුන්මය. යමක් වනාහි බුදුරදුන් මව්කුස පිළිසිඳ ගන්නා වේලාවෙහි, බිහිවන වේලාවෙහි, බුදුවන වේලාවෙහි, දම්සක් පවත්වන වේලාවෙහි, ආයුසංස්කාරය හළ වේලාවෙහි පිරිනිවන්පාන වේලාවෙහි කම්පා වන්නේ එයය. කෝටි දස දහසක් සක්වළ ආඥා ක්ෂේත්‍රය නම් වේ. ආටානාටිය. මෝර පිරිත, ධජග්ග පිරිත, රතන පිරිත ආදීන්ගේ එහි අණ පැවැත්මය. විෂය ක්ෂේත්‍රයෙහි ප්‍රමාණයක් නැත. බුදුවරුන්ගේ ඤාණය යම් පමණක ද අවබෝධය ද එපමණය. අවබෝධය යම් පමණක ද ඤාණය ද එපමණය. ඤාණය කෙළවර කොට ඇති අවබෝධය ය. අවබෝධය කෙළවර කර ඇති ඤාණය යන වචනයෙන් අවිෂය වූවක් නම් නැත. මේ ත්‍රිවිධ විෂය ක්ෂේත්‍රයන් හැර මේ සක්වළෙන් අන්‍ය වූ සක්වළක බුදුවරු උපදිත්ය යන කීමක් නැත. නූපදිත් යනුවෙන් ම ඇත. **තීනිපිටකානීති** විනය පිටකය, සූත්‍ර පිටකය, අභිධර්ම පිටකය යනුයි. **තිස්සො සංගීතියොති** මහකසුප් තෙරුන්ගේ සංගීතිය, යස තෙරුන්ගේ සංගීතිය, මොග්ගලීපුත්තතිස්ස තෙරුන්ගේ සංගීතිය යන ත්‍රිවිධ සංගීතීන්ය. ආරූඪ වූ ත්‍රිපිටක බුද්ධ වචනයෙහි මේ සක්වළ හැර අන්තැනක බුදුවරු උපදිත්ය යැයි කීමක් නැත. නූපදිත්ය යනුවෙන් ම

ඇත. අපුබ්බං අචරිමන්ති පෙර පසු නොවී එකවර නූපදිත්. පළමුව හෝ පසුව හෝ උපදිත් යැයි කියන ලදි. එහි බෝ පළඟෙහි ගැනීම සිදුවීද ඒතාක් පෙර නොනැගිටින්නෙමියි හුන්තැන් පටන් යම්තාක් මව්කුස පිළිසිඳ ගැනීම සිදුවීද ඒතාක් පෙර යැයි නොදත යුතුයි. බෝධිසත්වයන්ගේ පිළිසිඳ ගැනීමෙන් දස දහසක් සක්වළ කම්පාවෙන් ම ක්ෂේත්‍ර පරිග්‍රහය කරන ලදි. අන් බුදු කෙනෙකුගේ උපත වළක්වන ලද්දේ වෙයි.

පිරිනිවනේ පටන් යම්තාක් අබ ඇටයක් තරම්වත් ධාතු පිහිටා ද ඒතාක් පසුයැයි නොදත යුතුයි. ධාතූන් ඇති කල්හි බුදුවරු සිටියාහු ම වෙත්. එහෙයින් මේ අතරතුර අන් බුදු කෙනෙකුගේ උපත වළක්වන ලදි. ධාතු පිරිනිවන් පෑ කළ අන් බුදු කෙනෙකුගේ උපත නොවළක්වන ලදි. පර්යාප්ති අන්තර්ධානය, ප්‍රතිවේධ අන්තර්ධානය, ප්‍රතිපත්ති අන්තර්ධානය යනුවෙන් අන්තර්ධාන තුනෙකි. එහි **පරියත්තීති** තුන් පිටකයයි. **පටිවෙධාතීති** සත්‍ය ප්‍රතිවේධයයි. **පටිපත්තීති** ප්‍රතිපදාවයි. එහි ප්‍රතිවේදය ද ප්‍රතිපත්තිය ද වෙයි ද නොවෙයි දැයි එක් කළෙක ප්‍රතිවේධධර භික්ෂූහු බොහෝ වෙත්. මේ භික්ෂූහු පෘථග්ජන යැයි ඇඟිලි දික්කර පෙන්විය යුත්තේ වෙයි. මේ දිවයිනෙහි එක් වරක් පෘථග්ජන භික්ෂූන් නොවීය. කිසිකළෙක පිළිවෙත් පුරන්නෝ ද බොහෝ වෙත්. කිසිකළෙක ස්වල්ප වෙත්. මෙසේ ප්‍රතිවේධය ද ප්‍රතිපත්තිය ද වෙයි ද නොවෙයි දැයි සසුන පැවැත්මෙහි පර්යාප්තිය ම ප්‍රමාණවත්ය. පණ්ඩිතයා ත්‍රිපිටකය අසා දෙකම පුරයි. යම්සේ අපේ බෝසත් තෙමේ ආළාරගේ සමීපයෙහි පංච අභිඥා හා සප්ත සමාපත්ති උපදවා නේවසංඥානාසංඥායතනයෙහි පරිකර්ම ඇසුවේය. ඔහු නොදනිමියි කීය. එතනින් උද්දකගේ සමීපයට ගොස් අධිගත විශේෂය සංසන්දනය කොට නේවසංඥානාසංඥායතනයෙහි පරිකර්ම ඇසුවේය. ඔහු කීය. ඒ වචනයට අනතුරුව බෝසත් තෙමේ එය ඉපිදවීය. එපරිද්දෙන් ම ප්‍රඥාවත් භික්ෂුව පර්යාප්තිය අසා දෙකම පුරයි. එහෙයින් පර්යාප්තිය ඇති කල්හි සසුන ඇත්තේ වෙයි. යම්කලෙක එය අතුරුදහන් වී සෙසු පිටක දෙක ඇති කල්හි ද සසුන අතුරුදන් වේ ද පළමුකොට අභිධර්ම පිටකය නැසෙයි. එහි පළමු පට්ඨානප්පකරණය සියල්ලට කලින් අතුරුදහන් වෙයි. පිළිවෙළින් පසුව ධම්මසංගණියයි. අතුරුදහන් වී සෙසු පිටක දෙක ඇති කල්හි ද සසුන පවත්නේම වෙයි. එහි සූත්‍ර පිටකය අතුරුදහන් වීමෙහි පළමුව අංගුත්තර නිකායේ එකොළොස් වැන්නෙහි පටන් එක දක්වා ම අතුරුදහන් වෙයි. අනතුරුව සංයුත්ත නිකායේ චක්කපෙය්‍යාලයෙහි පටන් ඕඝතරණයන් දක්වා අතුරුදහන් වෙයි. අනතුරුව මජ්ඣිම නිකායේ ඉන්ද්‍රියභාවනාවේ පටන්

මූලපරියාය දක්වා අතුරුදහන් වෙයි. අනතුරුව දීඝනිකායේ දසුත්තරයෙහි පටන් බ්‍රහ්මජාලය දක්වා අතුරුදන් වෙයි. එකක් දෙකක් ගාථා අසා කල්ගිය ද සසුන දැරීමට නොහැකි වෙයි. සභියගේ හා ආලවකගේ විමසීම් මෙනි. මේ වනාහි කාශ්‍යප බුදුරදුන්ගේ කාලයෙහි අතර සසුන දැරීමට නොහැකි වීමය. පිටක දෙකක් අතුරුදහන් වූ කල්හි විනය පිටකය තිබේනම් සසුන පවතින්නේ වෙයි. පරිවාර ඛන්ධකය අතුරුදහන් වූ කල්හි උභයවිභංගය ඇති නම් සසුන ඇත්තේම වේ. උභය විභංගය අතුරුදන් වූ කල්හි මාතිකා ඇතිනම් සසුන ඇත්තේ ම වෙයි. මාතිකා අතුරුදහන් වූ කල්හි පාමොක් පැවිදිවීම් උපසම්පදාවීම් ඇතිනම් සසුන පවතියි. ශ්‍රමණ ලිංගය බොහෝ කලක් පවතී. සුදු වස්ත්‍ර පෙරවූ ශ්‍රමණ වංශයකට කාශ්‍යප බුදුරදුන්ගේ කාලයේ පටන් සසුන දැරීමට නොහැකි විය. පසුව වූවහුගේ සත්‍ය ප්‍රතිවේදයෙන් හා පසුව වූවහුගේ සීල භේදයෙන් ද පටන් සසුන පසුබසින්නේ වෙයි. එතැන්පටන් අන් බුදුවරයෙකුගේ උපත නොවළක්වන ලදි. පිරිනිවීම් තුන නම් ක්ලේශ පිරිනිවීම, ස්කන්ධ පිරිනිවීම හා ධාතු පිරිනිවීමයි. එහි ක්ලේශ පිරිනිවීම් බෝධි පර්යංකයෙහි දී විය. ස්කන්ධ පිරිනිවීම කුසිනාරාවේ දී ධාතු පිරිනිවීම අනාගතයේ දී වන්නේ ය.

සසුන පසුබසින කාලයෙහි මේ තම්බපණ්ණි දීපයෙහි ධාතු රැස්ව මහාසෑයට යෙත්. මහාසෑයෙන් නාගදීප රාජායතන සෑයට ද එතනින් මහාබෝධි පර්යංකයට ද යෙත්. නාගභවනෙන් ද දිව්‍ය ලෝකයෙන් ද ධාතුහු මහාබෝධි පර්යංකයට ම යෙත්. අබ ඇටයක් තරම්වත් ධාතුවක් අතරතුර නොනැසෙත්. මහාබෝධි පර්යංකයෙහි එකතු වූ ධාතුහු රන් කඳක් මෙන් එකතු වී සවනක් රැස් විහිදුවත්. එය දස දහසක් ලෝක ධාතුවෙහි පැතිරෙත්. එයින් දස දහසක් සක්වළ දෙවියෝ රැස්ව අද ශාස්තෘන් වහන්සේ පිරිනිවන් පාන්නේය. අද සසුන නැසෙන්නේය. දැන් අපේ මේ අවසාන දැකීමයි. බුදුරදුන් පිරිනිවන් පෑ දිනයෙහි මහත් වැළපීම් සිදුවී ද ක්ෂීණාශ්‍රවයන් හා අනාගාමීන් හැර සෙස්සවුන්ට ප්‍රකෘතියෙන් සිටීමටවත් නොහැකි වෙත්. ධාතුන් කෙරෙන් තේජෝ ධාතුව පැණ නැගී බඹලොව දක්වා උඩට නගියි. අබ ඇටයක් තරම්වත් ධාතුවක් පවතී නම් එකට එක්වීම පවතියි. මෙසේ මහත් ආනුභාව දක්වා ධාතු අතුරුදහන් වූ කල්හි සසුන අතුරුදහන් වූයේ නම් වෙයි. යම්තාක් මෙසේ අතුරුදහන් නොවේ ද ඒතාක් කල් අචරිම නම් වෙයි. මෙසේ පෙර පසුනොවී උපදින්නේය යන කරුණ විද්‍යමාන නොවේ. කුමක් හෙයින් ද යත්? පෙර පසු නොවී නූපදින්නේ ද යනු ආශ්චර්යයක් නොමැති හෙයිනි. බුදුවරු වනාහි ආශ්චර්යවත් මනුෂ්‍යයෝය. යම්හෙයකින් කීය. මහණෙනි,

Scanned with CamScanner

එක් පුද්ගලයෙක් ලෝකයෙහි ආශ්චර්ය මනුෂ්‍යයෙක්ව උපදියි. ඒ එක් පුද්ගලයා කවුරුද යත්? තථාගත අර්හත් සම්‍යක් බුදුරජාණන් වහන්සේමය යනුයි. ඉදින් දෙදෙනෙක් හෝ හතර දෙනෙක් හෝ අට දෙනෙක් හෝ සොළොස් දෙනෙක් හෝ එක්විට උපදින්නාහු ද ආශ්චර්යයක් නොමැත. එකම විහාරයක චෛත්‍ය දෙකක් වූ විට ද ලාභයක් හෝ සත්කාරයක් හෝ මහත් නොවෙයි. භික්ෂූහු ද බොහෝ බැවින් ආශ්චර්යයක් නොවෙයි. මෙසේ බුදුවරු ආශ්චර්යවත් වන්නේය. එහෙයින් නූපදිත්. දේශනාවෙහි ද විශේෂයක් නොවන හෙයිනි. යම්තැනක සතිපට්ඨානය ආදී ප්‍රභේද ඇති ධර්ම එක් අයෙක් දේශනා කරයි. අන්අයෙක් උපදවා ද එයම දේශනා කරන ලද්දේ වේද එය ආශ්චර්යවත් නොවෙයි. එකම ධර්මයක් දේශනා කරන කල්හි දේශනාව ද ආශ්චර්යවත් වන්නේය. විවාදයන් නැතිවීමෙන් ද බොහෝ බුදුවරුන් උපන් කල්හි බොහෝ ගුරුවරුන්ගේ අතවැස්සෝ අපේ බුදුරදුන් ප්‍රාසාදිකය. අපේ බුදුරදුන් මධුරස්වරලාභීය. පින් ඇත්තේ යැයි විවාද කරන්නාහ. එහෙයින් ද මෙසේ නූපදිත්. ඉදින් මේ කරුණ මිළිඳු රජු විමසුයෙන් නාගසේන තෙරුන් විස්තර කරන ලද්දේමය කියන ලදි. ස්වාමීනි, නාගසේනයන් වහන්ස, ඒ භාසිතය ද බුදුරදුන් විසින් මහණෙනි, යම් මේ එක ලෝක ධාතුවක අර්හත් සම්‍යක් සම්බුදුවරුන් දෙදෙනෙක් පෙර පසුනොවී උපදින්නාහ යන මේ කරුණ විද්‍යමාන නොවේ. ස්වාමීනි, නාගසේනයන් වහන්ස, දේශනා කරන කල්හි ද සියලුම බුදුවරු සත්තිස්බෝධිපාක්ෂික ධර්ම දේශනා කරත්. කියන කල්හි චතුරාර්ය සත්‍යය කියත්. හික්මවන කල්හි ත්‍රිශික්ෂාවන්හි හික්මවත්. අනුශාසනා කරන කල්හි අප්‍රමාද ප්‍රතිපත්තියෙන් අනුශාසනා කරත්. ඉදින් නාගසේන ස්වාමීන් වහන්ස, සියලුම බුදුවරුන්ගේ එකම උදෙසීම, එකම කථාව, එකම ශික්ෂාව එකම අනුශාසනාව නම් කවර කරුණක් නිසා බුදුවරු දෙදෙනෙක් එකවර නූපදිත් ද? ඉදින් එක බුදුකෙනෙකුන් වහන්සේ නමකගේ ඉපදීමෙන් මේ ලෝකය ආලෝකවත් වේද? එසේනම් බුදුවරුන් දෙදෙනෙකුගේ ඉපදීමෙන් බෙහෙවින් ම ආලෝකමත් වන්නෙහිය. අවවාද කරන කල්හි බුදුවරු දෙදෙනා ම සුවසේ අවවාද කරන්නාහ. අනුශාසනා කරන කල්හි ද එසේමය. එයට කරුණු මට පහදා දෙන්න. යම්සේ මම සැක නැත්තෙක් වන්නෙම් ද? එසේ දේශනා කරන්න. මහරජතුමනි, මේ දස දහසක් ලෝක ධාතුව එකම බුදුකෙනෙකුන් දරන්නේ එකම තථාගත ගුණයක් දරන්නේ වෙයි. ඉදින් දෙවැනි බුදුවරයෙක් උපදින්නේ නම් මේ දස දහසක් ලෝක ධාතුව නොදරන්නේය. සෙලවෙන්නේය. කම්පාවන්නේය. නැමෙන්නේය. යටත් වන්නේය. හකුලන්නේය. විසුරුවන්නේය. විනාශ වන්නේය. දුරු කරන්නේය. විනාශවීම් ස්වභාවයට පත්වන්නේය. යම්සේ

මහරජතුමනි, නැව එක් මිනිසෙකු එතෙර කිරීමට සමත් නම් එක මිනිසෙකු නැගුණු කල්හි එය මනාව පැදවිය හැකි වන්නේ ද? ඉන්පසු එබඳු වූ ආයුෂයෙන් වර්ණයෙන් යසසින් ප්‍රමාණයෙන් කෘශ බැවින් හා මහත් බැවින් සියලු අඟපසඟින් යුත් දෙවැනි වූ පුරුෂයෙක් අවුත් ඔහු ද ඒ නැවට නගින්නේය. මහරජතුමනි, ඒ නැව දෙදෙනාම දරන්නේ ද? නැත ස්වාමීනි. සෙලවෙන්නේය. කම්පාවන්නේය. නැමෙන්නේය. යටත් වන්නේය, හකුලන්නේය, විසුරුවන්නේය, විනාශ වන්නේය, දුරු වන්නේය, යායුතු තැනට නොයන්නේය. දියේ ගිලෙන්නේය යනුයි. මහරජතුමනි, මෙපරිද්දෙන් ම මේ දස දහසක් ලෝක ධාතුව එක බුදුවරයෙක් ම දරයි. එක් බුදුවරයෙකුගේ ගුණ පමණක්ම දරයි. ඉදින් දෙවැනි බුදුවරයෙක් උපදින්නේ නම් දස දහසක් ලෝක ධාතුව නොදරන්නේය. සෙලවෙන්නේය. කම්පාවන්නේය. නැමෙන්නේය. යටත් වන්නේය. හකුලන්නේය. විසුරුවන්නේය. විනාශ වන්නේය. දුරු වන්නේය. යායුතු තැනට නොයන්නේය. යම්සේ මහරජතුමනි, බඩසයින් පෙළෙන්නා වූ පුරුෂයෙක් ඇතිතාක් ආහාර ගෙන ගෙළතාක් පුරවා ගත් ඔහු සතුටට පැමිණියේ පිනා ගියේ සම්පූර්ණ වූයේ නිතර තිදිබර ගති ඇත්තෙක් ව නොනැමිය හැකි දණ්ඩක් මෙන් වූයේ නැවත ද ඇතිතාක් ආහාර අනුභව කොට සිටින පුරුෂයා සැපවත් වන්නේ ද? නැත ස්වාමීනි. තනිවම අනුභව කළේ මැරෙන්නේය. මහරජතුමනි, මෙපරිද්දෙන් ම මේ දස දහසක් ලෝක ධාතුව එක බුදුවරයෙක්ම දරයි. සුදුසු තැනට නොමයන්නේය යනුයි. කිමෙක් ද? නාගසේන ස්වාමීන් වහන්ස, ධර්මයෙහි වැඩිබරින් පොළොව සෙලවෙයි ද? මහරජතුමනි, මෙහි ගැල් දෙකක් රනින් පිරවූයේ වන්නේ ද? මුදුන තෙක් රන් පිරී ඇති එක් ගැලකින් රන් ගෙන වෙනත් ගැලක දමන්නේය. මහරජතුමනි, ගැල් දෙකෙහිම වූ රන් එවිට එක ගැලක් උසුලා ද? නැත ස්වාමීනි, ගැලෙහි නැබද සෙලවෙන්නේය. ගරාදි ද බිඳෙන්නේය. නිම් වළල්ල ද බිඳෙන්නේය. එහි අලවංගුව ද කැඩෙන්නේය යනුයි.

කිමෙක් ද? මහරජතුමනි, රත්තරං බර වැඩි නිසා ගැල බිඳේ ද? එහෙමයි ස්වාමීනි, මහරජතුමනි, මෙසේ ධර්මයේ වැඩි බරින් පොළොව සෙල වේ. මේ කරුණ බුදුරදුන්ගේ බලය දැක්වීම සඳහා දක්වන ලදී. එයට සුදුසු තවත් කරුණක් අසන්න. යම් කරුණක් නිසා සම්බුදුවරුන් දෙනමක් එක් මොහොතක නූපදිත්. ඉදින් මහරජතුමනි, සම්බුදුවරුන් දෙනමක් එක් මොහොතක උපදින්නේ නම් පිරිස අතර නුඹලාගේ බුදුන්ය, අපගේ බුදුන්ය යනුවෙන් විවාද පහළ වන්නේය. දෙපිරිස ම පක්ෂයක් ගත්තෝ වන්නාහ. යම්සේ මහරජතුමනි, බලවත් ඇමතියන් දෙදෙනෙකුගේ

පිරිස අතර නුඹලාගේ ඇමතියාය අපගේ ඇමතියාය යනුවෙන් විවාදයක් වෙත්. දෙපිරිස ම පක්ෂයක් ගත්තෝ වන්නාහ. මෙපරිද්දෙන් ම මහරජතුමනි, සම්බුදුවරුන් දෙනමක් එක් මොහොතක උපදින්නේ නම් පිරිස අතර නුඹලාගේ බුදුන්ය, අපගේ බුදුන්ය යනුවෙන් විවාද පහළ වන්නේය. දෙපිරිස ම පක්ෂයක් ගත්තෝ වන්නාහ. මේ පළමු කරුණ අසව. යම්කරුණක් නිසා සම්බුදුවරුන් දෙනමක් එක් මොහොතක නූපදිත්. තවත් කරුණක් අසව. ඉදින් මහරජතුමනි, සම්බුදුවරුන් දෙනමක් එක් මොහොතක උපදින්නේ නම් අග්‍ර බුද්ධය යන යම් වචනයක් තමන් කැමති වන්නේය. ජ්‍යෙෂ්ඨ බුද්ධය, විශිෂ්ට බුද්ධය, උත්තම බුද්ධය, ප්‍රවර බුද්ධය, අසමසම බුද්ධය, අප්පටිභාග බුද්ධය, අප්පටිපුද්ගල බුද්ධය, යන යම් වචනයක් වේද එය බොරු වන්නේය. මෙය ද මහරජතුමනි, අර්ථ වශයෙන් හා කරුණු වශයෙන් යම් හේතුවකින් සම්බුදුවරුන් දෙනමක් එක් මොහොතක නූපදිත්. තවද මහරජතුමනි, බුදුවරුන්ගේ ස්වභාවය හා ප්‍රකෘති වශයෙන් මෙසේ යම් එකම බුදුවරයෙක් ලොව පහළ වේ. කුමක් නිසාද යත්? බුදුරදුන්ගේ බුද්ධ ගුණයන්ගේ මහත්බව නිසාය. තවද මහරජතුමනි, යමක් මහත්වේ ද? එය එකක්ම වේ. මහරජතුමනි, පොළොව ඉතා මහත්ය. එය එකක්මය. සාගරය ඉතා මහත්ය. එය එකක්ම වේ. මහමෙර ශ්‍රේෂ්ඨය. ඉතා මහත්ය. එය එකක්මය. අහස ඉතා මහත්ය. එය එකක්මය. ශක්‍රයා ඉතා මහත්ය. ඔහු එක් අයෙකි. බ්‍රහ්මයා ඉතා මහත්ය. ඔහු එක් අයෙකි. යම්තැනක ඔවුහු උපදිත් ද එහි අන් අයට ඉඩක් නැත. තථාගත අර්හත් සම්‍යක් සම්බුදුරදුන් ද ඉතා මහත්ය. ඔහු එක් අයෙකි. එහෙයින් තථාගත අර්හත් සම්‍යක් සම්බුදුරදුන් වහන්සේලා එක් නමක් ම ලෝකයෙහි උපදියි. ස්වාමීනි නාගසේනයන් වහන්ස, ප්‍රශ්න උපමා කරුණු ආදීන්ගෙන් මනාව කියන ලදි.

**එකිස්සා ලොකධාතුයාති** එකම සක්වළක. යට මෙම පදයෙන් දස දහසක් සක්වළ ගත්තත් එක් සක්වළකින් යැයි පිරිසිඳින්නට වටියි. බුදුවරුන් වනාහි උපදිනු ලබන්නාහු මේ සක්වළම උපදිති. උපදින තැන වැළක් වූ කල්හි මෙයින් වෙනත් සක්වළක නූපදියි. වළක්වන ලද්දේ ම වෙයි. **අපුබ්බං අචරිමන්ති** මෙහි චක්‍රරත්නයේ පහළවීමෙන් පළමුව පළමුව එහි ම අතුරුදහන්වීමට පසුව චරිම යනුයි. එහි චක්‍රරත්නයාගේ අතුරුදහන්වීම දෙපරිදි ය. සක්විති රජුගේ කළුරිය කිරීමෙන් හෝ පැවිදි වීමෙන් හෝ වෙයි. අතුරුදහන්වීම ද කළුරිය කිරීමෙන් හෝ පැවිදි වීමෙන් හෝ හත්වෙනි දවසෙහි අතුරුදහන් වෙයි. ඉන්පසු සක්විති රජුගේ පහළවීම නොවළකන ලදි. කුමක් නිසා ද යත්? එක් සක්වළක සක්විති රජවරුන් දෙදෙනෙක්

නූපදිති යන විවාදය නැති කරන ආශ්චර්යක් නිසාය. චක්‍රරත්නයේ මහත් ආනුභාවය නිසාය. දෙදෙනෙකු උපදිනු ලබන කල්හි අපේ රජු මහත්ය. අපේ රජු මහත්ය යනුවෙන් විවාදයක් උපදින්නේය. මේ දීපයෙහි සක්විති රජ මේ දීපයෙහි සක්විති රජ යැයි ආශ්චර්යයක් නො වන්නේ ය. යම් මේ චක්‍රරත්නයට දිවයින් දෙදහසක් පිරිවරන ලද සිව් මහද්වීපවල අධිපතිත්වය දීමට සමත් මහානුභාව සම්පන්න වූ ඔහු පහළට දමව් යන විවාදය නැති කිරීමෙන් ආශ්චර්ය නැති කිරීමෙන් චක්‍රරත්නයාගේ මහත් ආනුභාවයෙන් ද එක් සක්වළක දෙදෙනෙක් නූපදිත්. **යං ඉත්ථී අරහං අස්ස සම්මාසම්බුද්ධොති** මෙහි දී බුදුගුණ පිළිබඳ කීම තියේවා. ඒ බුදුගුණ උපදවාගෙන ලෝකයෙන් එතරවීමට සමත් වූ බුදු බව පිළිබඳ ප්‍රණිධාන මාත්‍රයක්වත් ස්ත්‍රියට නොලැබෙයි. මනුෂ්‍යාත්මය, ලිංග සම්පත්තිය, හේතු සම්පත්තිය, බුදුකෙනෙකු හමුවීම, පැවිද්ද ලැබීම, ගුණ සම්පත්තිය, අධිකාරකරණය, බුදුබව පැතීමේ කැමැත්ත යන මේ අට වැදෑරුම් ධර්මයන් එකතුවීමෙන් අභිනීහාරය සම්පූර්ණ වේ.

මේ ප්‍රණිධානය සම්පූර්ණ කිරීමේ කරුණුයි. මෙසේ ප්‍රණිධානයවත් සම්පූර්ණ කර ගැනීමට අසමත් ස්ත්‍රිය කෙසේනම් බුදු වන්නේ ද? ස්ත්‍රියක් අර්හත් සම්‍යක් සම්බුද්ධභාවය ලබාගනීය යන මේ කරුණ නොසිදුවන්නේ යැයි කියන ලදි. සියලු ආකාරයෙන් පුරන ලද පුණ්‍ය ඵලය සියලු ආකාරයෙන් පිරිපුන් ආත්මභාවයක් ලබාදෙයි යන මෙහි පුරුෂයෙක් ම අර්හත් සම්‍යක් සම්බුද්ධභාවය ලබයි. ස්ත්‍රියක් නොවේ. සක්විති රජ නොවෙයි ආදි තැන්වල ද යම්හෙයකින් ස්ත්‍රියට කෝසෝහිත වස්ත්‍ර ගුහ්‍යතාව නැති හෙයින් ලක්‍ෂණ සම්පූර්ණ නොවේ. ස්ත්‍රී රත්නයාගේ අභාවයෙන් සප්ත රත්නයන්ගේ සම්පූර්ණ බව සිදු නොවෙයි. සියලු මිනිසුන් වැඩියෙන් ආත්මභාවයක් නොවෙයි. එහෙයින් ස්ත්‍රියක් සක්විති රජවන්නේය යන මේ කරුණ සිදු නොවන්නකි. අවකාශ නොලබන්නකි යි කියන ලදි. යම්හෙයකින් ශක්‍රබව ආදී තුන් ස්ථානයක් උතුම් වන්නේ ද ස්ත්‍රී ආත්මය පහත් වන්නේ ද එහෙයින් ශක්‍ර බව ප්‍රතිසිද්ධය. ස්ත්‍රී ලිංගය මෙන්ම පුරුෂ ලිංගය ද බ්‍රහ්ම ලෝකයෙහි නැත. එහෙයින් පුරුෂ තෙමේ බ්‍රහ්මබවට පැමිණෙන්නේය යැයි මේ කරුණ සිදු වන්නේ යැයි නොකිව යුතු වන්නේය. නොකිය යුතු ද නොවන්නේය. කුමක් නිසා ද යත්? මෙහි පුරුෂව සිටියෙක් ම එහි උපදින බැවිනි. බ්‍රහ්මත්වය යන්නෙන් මෙහි දී මහාබ්‍රහ්මයා ම අදහස් කරන ලදි. ස්ත්‍රියක් මෙහි ධ්‍යාන වඩා කළුරිය කොට බ්‍රහ්ම පිරිසට එකතු වෙයි. මහා බ්‍රහ්මයාට එකතු නොවේ. පුරුෂයෝ වනාහි එහි නූපදින්නේ යැයි නොකිව යුතුය. මෙහි උභය

ලිංගයාගේ අභාවය ඇති කල්හි ද බ්‍රහ්මයෝ පුරුෂ සටහන් ඇත්තෝ වෙත්. ස්ත්‍රී සටහන් ඇත්තෝ නොවෙත්. එහෙයින් මෙය මනාකොට කියන ලදි. **කායදුච්චරිතස්සාති** ආදියෙහි යම්සේ කොහොඹ ඇට වැටකොලු ඇට ආදිය රසවත් ගෙඩි නොඋපදවත්. අමිහිරි ගෙඩිම නිපදවන්නේ යැයි කී ලෙස ම කාය දුෂ්චරිත ආදීහුට මිහිරි විපාක නූපදවත්. යම්සේ උක් හැල් බීජාදීහු මිහිරි යහපත් රස ම උපදවත් ද අමිහිරි කටුක රස නූපදවත් ද එසේ ම කාය සුචරිතවාදීහු යහපත් විපාකයක් ම ගෙන දෙන්නේය. අමිහිරි විපාක නොදෙන්නේය. එහෙයින් කියන ලදි.

යම්සේ බීජ වපුරයි ද එපරිද්දෙන් ම ඵලය ගනියි. යහපත කරන්නාට යහපත ද අයහපත කරන්නාට අයහපත ද ලැබේ.

එහෙයින් කාය දුශ්චරිතයාට නොතැනය. අවකාශ නැත යනාදිය කියන ලදි. **කායදුච්චරිතසමංගීති** ආදියෙහි යුක්තබව පස් ආකාර වේ. රැස්කිරීමෙන් යුක්ත බව සිතුවිලිවලින් යුක්ත බව, කර්මයෙන් යුක්ත බව, විපාකයෙන් යුක්තබව හා වැටහෙන ආකාරයෙන් යුක්ත බව යනුවෙනි. එහි කුසල් අකුසල් රැස්කරන ලද විපාක දීමට සුදුසු කර්ම සඳහා කර්මයෙන් යුක්තබව යැයි කියයි. විපාකයෙන් යුක්ත බව නම් විපාක දෙන මොහොතෙහි දත යුතුය. යම්තාක් සත්වයෝ රහත් බවට නොපැමිණෙත් ද ඒතාක් ඔවුන් ඒ ඒ තැන්වලින් චුතව නිරයේ උපදින්නේ නම් ගිනිදැල් ලොහොකුඹු ආදිය ගැන වැටහේ. කුස තුළක උපදින්නේ නම් මව්කුස සිහි වේ. දෙව්ලොව උපදින්නහුට කප්රුක් විමාන ආදිය වැටහේ. මෙසේ උපදින තැන්වල නිමිති වැටහේ. මෙසේ ඔවුන් උපතට යන තැන් පිළිබඳව නිමිති පහළවීමෙන් නොමිදුණු වැටහෙන බැවින් වැටහෙන ආකාරයෙන් යුක්තබව යැයි කියයි. එය සැලෙයි. ඉතිරි ඒවා නොසැලෙයි. නිරයෙහි නිමිති එළඹුණු කල්හි දෙව්ලොව නිමිති එළඹෙයි. දෙව්ලොව නිමිති එළඹුණු කල්හි නිරයෙහි නිමිති එළඹෙයි. මනුෂ්‍ය ලෝකයෙහි නිමිති එළඹුණ කල්හි තිරිසන්ගත යෝනියෙහි නිමිති එළඹෙයි. තිරිසන්ගත යෝනියෙහි නිමිති එළඹුණ කල්හි මනුෂ්‍ය ලෝකයෙහි නිමිති එළඹෙයි. ඒ සඳහා මේ කථා වස්තුවකි.

සෝණ පර්වත පාදයෙහි පාචේලි නම් විහාරයෙහි සෝණ නම් ධර්මකථික භික්ෂුවක් වෙයි. උන්වහන්සේගේ පියා බල්ලන් ගෙන දඩයම් කරන්නෙක් විය. තෙරුන්වහන්සේ ඔහු වැළකූ නමුත් සංවරයෙහි පිහිටුවන්නට නොහැකි වූයේ අසරණයා නොනැසේවයි. මහලු කාලයෙහි නොකැමැත්තෙන් පැවිදි කළේය. දැඩි සේ ගිලන්ව හොත් ඔහුට නිරයෙහි

නිමිති එළඹ සිටියි. සෝණ පර්වත පාදයෙන් මහත් බල්ලන් දෙදෙනෙක් පැමිණ කනු කැමැතිව වටකළහ. ඔහු මහත් බිය වූයේ දරුව සෝණය, බල්ලන් වළකව. දරුව සෝණය. බල්ලන් වළකව යැයි කීය. මහා තෙරුන්වහන්සේ කුමක්දැයි ඇසුවේ දරුව, නොපෙනේදැයි අසා ඒ ප්‍රවෘත්තිය කීය. සෝණ තෙරුන්වහන්සේ මා වැන්නෙකුගේ පියා කෙසේ නම් නිරයේ උපදින්නට හරින්නේ ද? මොහුට පිහිට වන්නෙමියි සාමණේරයන් ලවා නොයෙක් නොයෙක් මල් ගෙන්වාගෙන සෑ මළුව හා බෝ මළුව අතුරවා ගොඩ අතුරන පූජාවත් ආසන පූජාවත් කරවා පියා ඇඳක තබා සෑ මළුවට ගෙනවිත් ඇඳෙහි හිඳවා මහා තෙරුන් වහන්සේ මේ පූජාව ඔබ සඳහා කරන ලදහ. මෙය භාග්‍යවතුන් වහන්සේට දුප්පත් පඬුරක් යැයි කියා බුදුන් වැඳ සිත පහදා ගනුවයි කීය. මහා තෙරුන්වහන්සේ පූජාව දැක එසේ කරන්නේ සිත පහදා ගත්තේය. එකෙණෙහි ඔහුට දෙව්ලොව නිමිති එළඹෙන්නට විය. නන්දන උයන, චිත්තලතා උයන, මිස්සක උයන, ඵාරුසක උයන හා දෙව්විමන් ද නළඟනන් ද පිරිවරා සිටියාක් මෙන් විය. ඔහු සෝණය ඉවත් වෙව. සෝණය ඉවත් වෙව යි කීය. කිමෙක් ද? තෙරුන් වහන්ස, මේ තොපගේ මව්වරු එත් යැයි කීය. තෙරුන්වහන්සේ පියාට ස්වර්ගය එළඹ සිටියේ යැයි සිතූහ. මෙසේ එළඹ සිටි නිමිති සෙළවෙන අයුරු දත යුතුය. මේ යුක්ත වෙත්. මෙහි කර්ම රැස්කිරීම් වශයෙන් කාය දුශ්චරිතයෙන් යුත් පුද්ගලයායි යනාදිය කියන ලදි.

**එවං වුත්තෙ ආයස්මා ආනන්‍දොති** මෙසේ භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය දේශනා කළ කල්හි තෙරුන් වහන්සේ මුල පටන් සියලු සූත්‍රය ගෙනහැර දක්වා මෙසේ සශ්‍රීක කොට දේශනා කරන ලද සූත්‍රයට භාග්‍යවතුන් වහන්සේට මෙය කීය. **තස්මාතිහ ත්‍වන්ති** ආදියෙහි මේ අර්ථ යෝජනාවය. ආනන්දය, යම්හෙයකින් මේ ධර්ම පර්යායෙහි මේ අටළොස් ධාතුහුය. මේ ෂඩ් ධාතුහුය යැයි බොහෝ සෙයින් බෙදන ලදි. **තස්මා තිහ ත්‍වං ඉමං ධම්මපරියායං බහුධාතුකොති** එහෙයින් ඔබ මේ ධර්ම පර්යායෙහි බොහෝ සෙයින් ධාතූන් බෙදන ලද හෙයින් බහුධාතුක යැයි දරන්න. යම්සේ මෙහි ධාතු ආයතන ප්‍රතීත්‍යසමුප්පාද පදට්ඨාන වශයෙන් සතර පරිවට්ටයන් කියන ලදි. එහෙයින් චතුපරිවට්ටය යැයි දරන්න. යම්සේ කණ්ණාඩියෙන් මුහුණ බලන්නහුගේ මෙන් මේ ධර්ම කොට්ඨාශ බලන්නහුට මේ ධාතු ආදීහු අර්ථ වශයෙන් ප්‍රකට වෙත්. එහෙයින් **ධම්මාදාසොති** යැයි දරන්න. යම්සේ සතුරු සෙනඟ මර්දනය කරන්නා වූ යෝධයෝ හේවිසි ගෙන සතුරු මුලට පැමිණ සතුරන් මැඩ තමහට ජය

ගනිත් ද එපරිද්දෙන් කෙලෙස් මඩනා යෝගීහු මෙහි කියන ලද ක්‍රමයෙන් විදර්ශනාව දෘඪිකොට ගෙන කෙලෙසුන් මැඩ තමා රහත්බව නැමැති ජය ගනිත්. එහෙයින් **අමතඳුන්දුභීති** යැයි දරන්න. යම්සේ යුදසෙබළෝ ආයුධපහ ගෙන සතුරන් විනාශකොට ජය ගනිත් ද එසේ යෝගාවචරයෝ ද මෙහි කියන ලද විදසුන් අවි දරා කෙලෙස් සතුරන් විනාශ කොට ජය ගනිත් ද එහෙයින් **අනුත්තරො සංගාම විජයොති** යැයි දරන්න.

**බහුධාතුක සූත්‍ර වර්ණනාව නිමි.**

## 2.4.6

**එවමෙමසුතනති** ඉසිගිලි සූත්‍රය මාවිසින් මෙසේ අසන ලදි. එහි **අඤ්ඤාව සමඤ්ඤා** අහොසීති ඉසිගිලියට සෘෂීන් ගිලින්නා යැයි නම උපන් කල්හි වේභාර නමින් එය ප්‍රකට නොවීය. වෙනත් නමකින් ම ප්‍රකට විය. **අඤ්ඤාපඤ්ඤත්තීති** මෙය මුලින් කී පදයට පර්යායකි. ඉතිරියෙහි ද මේ ක්‍රමයයි. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි සමවතින් නැගී සිට ගඳකිළියෙන් නික්මී යම් තැනක සිටිනවුන්ට පංච පර්වතයන් පෙනෙත් ද එතැන භික්‍ෂු සංඝයා පිරිවරා වැඩහිඳ මේ පර්වත පහ පිළිබඳව පිළිවෙළින් දෙසූහ. එහි දී භාග්‍යවතුන් වහන්සේට පර්වතයන්ගෙන් වැඩක් නොවීය. මෙසේ මේ පර්වත පහ ගැන පිළිවෙළින් කියනු ලබන කල්හි ඉසිගිලිය සෘෂිවරුන් ගිලින බව කිවයුතු වෙයි. එසේ කියනු ලබන කල්හි පද්මාවතීගේ පුත්‍රයන් වූ පන්සියයක් පසේබුදුවරුන්ගේ නම් ද පද්මාවතියගේ ප්‍රාර්ථනාවන් ද කිවයුතු වන්නේය. භාග්‍යවතුන් වහන්සේ මේ පර්වතයන් ගැන පිළිවෙළින් දෙසූහ.

**පවිසනතා දිසසනති පවිට්ඨා න දිස්සනතීති** යම්සේ පහසු තැනක පිඬු පිණිස හැසිර නිම කරන ලද බත්කිස ඇත්තාහු අවුත් චෛත්‍ය ගර්භයෙහි යුගල මහා දොරටුව විවෘත කරන්නාක් මෙන් ඒ පර්වතය දෙකඩ කොට ඇතුළට පිවිස රාත්‍රී ස්ථාන දහවල් ස්ථාන මවා එහි විසූහ. එහෙයින් මෙසේ වදාළහ. **ඉමෙ ඉසීති** මේ පසේබුදු සෘෂිවරුන් කවරකලෙක මෙහි වාසය කළාහු ද? බුදුරදුන් නූපන් අතීතයෙහි බරණැස ඇසුරු කොටගෙන එක් ගමක එක් කුලදුවක් කුඹුර රකින්නේ පසේ

බුදුවරයන් වහන්සේ නමකට ලාජ පන්සියයක් සමඟ නෙලුම් මලක් පුදා පුතුන් පන්සියයක් පැතුවාය. ඒ මොහොතෙහි ම පන්සියයක් මුව වැද්දෝ මී හා මස් පුදා ඇයට පුතුන් වන්නෙමුයි පැතූහ. දිවි ඇතිතෙක් සිට දෙව්ලොව උපන්නී එයින් චුතව ස්වයං ජාත විලෙහි පද්ම ගර්භයක උපන්නීය. තවුසෙක් ඇය දැක පෝෂණය කළේය. ඇය ඇවිදින කල්හි පය තබන තබන තැනින් පියුම් නැගෙත්. වනයේ හැසිරෙන්නෙක් ඇය දැක බරණැස් රජුට දැන්වීය. රජු ඇය ගෙන්වාගෙන අගමෙහෙසිය කළේය. ඇයට ගැබක් පිහිටියේය. මහාපදුම කුමාර තෙමේ මව්කුසෙහි වාසය කළේය. සෙස්සෝ ගැබ්මල ඇසුරුකොට උපන්නාහ. ඔවුහු වැඩිවියට පත්වූවාහු උයනේ විලේ ක්‍රීඩා කරන්නාහු එක එක නෙලුමක හිඳ අනිත්‍යතාව සිහිකොට පසේබුදු බව අවබෝධ කළහ. මේ ඔවුන්ගේ ප්‍රකාශනයයි.

නිරන්තරයෙන් බඹර සමූහයා විසින් ඇසුරු කරන ලද විලෙහි පිපුණු පියුමක හිඳ අනිත්‍යතාව දැන මැනවින් සිහිකොට කඟවේනෙකු මෙන් තනිව ම සැරිසරයි.

එකල්හි ඔවුහු එහි වාසය කළාහුය. එකල්හි මේ පර්වතයට ඉසිගිලි යන නම ඇති විය. **යෙ සත්තසාරාති** අරිට්ඨ. උපරිට්ඨ, තගරසිඛී, යසස්සී, සුදස්සන, පියදස්සී, ගන්ධාර, පිණ්ඩෝල, උපාසභ, නීථ, තථ, සුතවා, භාවිතත්ත යන තෙළෙස් පසේබුදුවරයන් වහන්සේලාගේ නම් කියා ගාථා බන්ධනයකින් ඔවුන්ගේත් අන්‍යයන්ගේත් නම් ප්‍රකාශ කරන්නේ **යෙ සත්තසාරාති** ආදියෙන් කීහ. එහි සත්තසාරාති සත්වයන් අතුරෙන් සාරවත් වූ යන අදහසයි. **අනීඝාති** දුක් නැති **නිරාසාති** තෘෂ්ණාවන් නැති **ද්වෙ ජාලිනොති** කුඩාජාලිය මහාජාලිය යැයි දෙදෙනෙකුගේ නම් ය. **සන්තචිත්තොති** මෙය ද එක් අයෙකුගේ නමකි. **පස්සී ජහී උපධිං දුක්ඛමූලන්ති** මෙහි පස්සී නම් ඒ පසේබුදුරදුන් දුකට කාරණා වූ කෙලෙස් හළේය යන මෙය ස්තුති සඳහාය. **අපරාජිතොපි** එක් අයෙකුගේ නමකි. **සත්ථා පවත්තා සරභංගො ලොමහංසො උච්චංගමායොති** සත්ථ, පවත්ත, සරභංග, ලෝමහංස, උච්චංගමය යන පස්දෙනාගේ නම් ය. **අසිතො අනාසවො මනොමයොති** අසිත. අනාසව, මනෝමය යන තුන්දෙනාගේ නම් ය. **මානච්ඡිදොච බන්ධුමාති** බන්ධුමා නම් තැනැත්තා මානයන් සිඳ ලූ බැවින් මානච්ඡිද්ද යැයි කියන ලදි. **තදාධිමුත්තොතිපි** යනුද නමකි. **කෙතුම්බරාගො ච මාතංගො අරියොති** කේතුම්බරාග, මාතංග ආර්ය යන තුන්දෙනාය.

අථච්චුතොති අථ අච්චුත යන පද දෙකයි. අච්චුතගාමබ්‍යාමකොති අච්චුත, ගාමබ්‍යාම යන දෙදෙනායි. ඛෙමාභිරතො ච සොරතොති ඛේමාභිරත හා සෝරත යන දෙදෙනායි. සයො අනොමනික්කමොති සයෝ යනු නමයි. ඒ පසේබුදුරදුන් අලාමක වීර්ය ඇති හෙයින් අනෝමනික්කම යැයි කියන ලදි. ආනන්‍ද නන්‍දො උපනන්‍දො ද්වාදසාති ආනන්දලා හතර දෙනෙකුත් නන්දලා හතර දෙනෙකුත් උපනන්දලා හතර දෙනෙකුත් බැගින් දොළොස් දෙනෙක් වේ. භාරද්වාජො අන්තිමදෙහධාරීති භාරද්වාජ නම් ඒ පසේබුදුරදුන් අන්තිම දේහධාරීය. තණ්හච්ඡිදොති සීදරි නම් පසේබුදුරදුන්ට ස්තුතිය පිණිසය. වීතරාගොතිපි මංගල නම් පසේබුදුරදුන්ට ස්තුතිය පිණිසය. උසභච්ඡිදා ජාලිනිං දුක්ඛමූලන්ති උසභ නම් ඒ පසේබුදුරදුන් දුකට කාරණා වූ තෘෂ්ණාව සින්දේය යන තේරුමයි. සන්තං පදං අජ්ඣගමූපනීතොති උපනීත නම් ඒ පසේබුදුරදුන් ශාන්ති පදයට පැමිණියේය. වීතරාගොතිපි එක් අයෙකුගේ නමකි. සුවිමුත්තචිත්තොති මේ කණ්හ නම් පසේබුදුරදුන්ට ස්තුතිය පිණිසය. එතෙ ච අඤ්ඤෙ චාති පෙළෙහි ආවා වූ හෝ නොඅවාවූ හෝ අනෙත් අයගේ නම් ය. මේ පන්සියයක් පසේබුදුවරුන් අතරෙහි දෙතුන්දෙන දහදොළොස්දෙන ආනන්ද යනාදිය මෙන් එක නම ඇත්තෝ වූහ. මෙසේ පෙළේ ආවා වූ නම්වලින් ම සියල්ලන්ගේ නම් කියන ලදි. මින්පසු වෙන වෙනම නොකියා මොවුන් හා ඔවුන් යනුවෙන් කියයි. ඉතිරිය සියලු තැන්හිම උක්ත ප්‍රකාරමැයි.

**ඉසිගිලි සූත්‍ර වර්ණනාව නිමි.**

## 2.4.7

**එවමෙමසුතන්ති** මහාචත්තාරීසක සූත්‍රය මාවිසින් මෙසේ අසන ලදි. එහි **අරියන්ති** දොස් නැති. ලෝකෝත්තර වූ නිර්දෝෂී බව අරිය යැයි කියයි. **සම්මා සමාධින්ති** මාර්ග සමාධියයි. **සඋපනිසන්ති** ප්‍රත්‍යය සහිත. **සපරික්ඛාරන්ති** පිරිවර සහිත. **පරික්ඛතාති** පිරිවරණ ලද. **සම්මාදිට්ඨී පුබ්බඞ්ගමා හොතීති** දෙපරිද්දකින් පෙරටු වෙයි. විදර්ශනා සම්මාදිට්ඨීය ත්‍රෛභූමික සංස්කාරයන් අනිත්‍යාදි වශයෙන් සොයයි. මාර්ග සම්මාදිට්ඨීය වනාහි විමර්ශන කෙළවර භූමිලද්ධ වූ සංසාරය විනාශ කරමින් සංසිඳුවමින්

සිහිල් ජල කල දහසක් මුදුනෙහි වත්කරන්නාක් මෙන් උපදියි. යම්සේ කුඹුරක් කරන්නා වූ ගොවියා පළමුව වනයෙහි ගස් සිඳියි. පසුව ගිනි තබයි. ඒ ගින්න පළමුව සිඳින ලද ගස් සම්පූර්ණයෙන් දවයි. එපරිද්දෙන්ම විදර්ශනා සම්මාදිට්ඨිය පළමුවරට අනිත්‍යාදී වශයෙන් සංස්කාරයන් විමසයි. මාර්ග සම්මාදිට්ඨියෙන් විමසනු සඳහා සංස්කාරයන් නැවත නූපදනා පරිද්දෙන් සම්පූර්ණයෙන් විනාශ කරමින් උපදියි. ඒ දෙයාකාරය ම මෙහි දී අදහස් කරන ලදි. **මිච්ඡාදිට්ඨිං මිච්ඡාදිට්ඨීති ජානාතීති** මිථ්‍යාදෘෂ්ටිය අනිත්‍ය දුක්ඛ අනාත්ම ලක්‍ෂණ වශයෙන් අවබෝධකොට ගෙන ආරම්මණ වශයෙන් දැන ගනියි. සම්‍යක් දෘෂ්ටිය කෘත්‍ය වශයෙන් සිහිමුලා නොවී දැන ගනියි.

**සාස්ස හොති සම්මාදිට්ඨීති** එය මෙසේ මැනවින් දැන ගන්නේය යනු සම්‍යක් දෘෂ්ටිය නම් වෙයි. **ද්වයං වදාමීති** දෙකක් කියමි. දෙකොටසක් කියමි යන තේරුමයි. **පුඤ්ඤභාගියාති** පිනට කොටස්කරුවෙකු වූ. **උපධිවෙපක්කාති** උපධි නම් විපාකය දෙන්නා වූ. **පඤ්ඤා පඤ්ඤින්ද්‍රියන්ති** ආදියෙහි බෙදා බෙදා අමෘතද්වාරය පණවයි. දක්වයි. ප්‍රඥාව ඒ අර්ථයෙහි අධිපතිකම කෙරෙනුයේ පඤ්ඤින්ද්‍රිය නම්. අවිද්‍යාවෙන් කම්පා නොවන්නේ **පඤ්ඤාබල** නම් වේ. බොජ්ඣංග ධර්මයන්ට පැමිණ චතුරාර්ය සත්‍ය ධර්මයන් සොයනුයේ **ධම්මවිචය සංබොජ්ඣංගො** නම්. මාර්ග සම්පත්තියෙන් ප්‍රශංසා කරන ලද ශෝභන වූ දෘෂ්ටිය **සම්මාදිට්ඨී** යයි. ආර්ය මාර්ගයට කරුණු **මග්ගංගං** නම්. **සොති** ඒ භික්ෂුවයි. **පහානායාති** හැරීම සඳහා **උපසම්පදායාති** ප්‍රතිලාභය පිණිස **සම්මාවායාමොති** නෛර්යානික කුසල වීර්යයයි. **සතොති** සිහියෙන් යුක්තව හාත්පසින් ධාවනය කරත්. **අනුපරිවත්තන්තීති** එක්ව ඉපිද පුරෙජාතව පිරිවරත්. මෙහි සම්මාවායාමයත් සම්මාසතියත් ලෝකෝත්තර සම්මාදිට්ඨිය සමග එක්ව ඉපිද පිරිවරත්. හරියට රජු හා එකම රථයෙහි සිටි කඩු ගත්තවුන් මෙනි. විදර්ශනා සම්‍යක් දෘෂ්ටිය වනාහි පුරේජාතව කරත්තයට පෙරටුව යන පාබල සෙනඟ මෙන් පිරිවරයි. දෙවන කොටසෙහි පටන් සම්‍යක් සංකල්පනා අදි තුන්දෙන එක්ව ඉපිද පිරිවරත් යැයි දතයුතුයි. **මිච්ඡාසංකප්පොති පජානාතීති** අනිත්‍ය දුක්ඛ අනාත්ම ලක්‍ෂණ ප්‍රතිවේධයෙහි ආරම්මණ වශයෙන් දැනගනියි. සම්‍යක් සංකල්පනාව කෘත්‍ය වශයෙන් සිහිමුලා නොවී දැනගනියි. මෙයින් මතු සම්‍යක් වචනාදියෙහි දැනීම මෙපරිද්දෙන් දැනගත යුතුයි. කාම සංකල්පනාදිය ද්වෙධාවිතක්ක සූත්‍රයෙහි කියන ලද්දේය. **තක්කොති** යනාදියෙහි තර්ක කිරීම් වශයෙන් තක්ක නම් වෙයි. එයම උපසර්ගයකින් පදය වැඩිකොට **විතක්කො** යැයි කියන ලදි.

එයම යහපත් සංකල්පනාදිය වශයෙන් **සංකප්පො** නම් වෙයි. එකඟව අරමුණු කරා පමුණුවන්නේ **අප්පනා** නම් වෙයි. එයම උපසර්ගයකින් පදය වැඩිකොට **ව්‍යප්පනා** යැයි කියන ලදි. **චෙතසො අභිනිරොපනාති** සිතට නැංවීමයි. විතර්කය ඇති කල්හි ඒ විතර්කය අරමුණට සිත නංවයි. විතර්කය නැති කල්හි ස්වකීය ධර්මතා වශයෙන් සිත අරමුණට නංවයි. රජ ගෙදර හොඳින් දන්නා කුලවත් පුරුෂයෙකු මෙනි. නොදන්නා සේවකයෙකු මගින් හෝ දොරටු පාලයා මගින් හෝ පිහිට ලැබිය යුතුය. හොඳින් දත්නාවූත් කුලවත්වූත් පුරුෂයා සියලු මහාමාත්‍යාදීන් දනියි. එනිසා තමාට උවමනා පරිදි පිවිසීමත් නික්මීමත් කරයි. මේ කරුණ මෙසේ දත යුතුයි. වචන සංස්කරණය **වචීසංඛාරො** නම්. මෙහි ලෞකික විතර්කය වචන සංස්කරණය කරයි. ලෝකෝත්තර විතර්කය නොකරයි. කිසිවකුත් සංස්කරණය නොකරන්නේ වචී සංස්කාර යන නමක් ඔහුට වෙයි. **සම්මාසංකප්පං අනුපරිධාවන්ති** ලෝකෝත්තර සම්‍යක් සංකල්පනාව පිරිවරත්. මෙහි නෙක්ඛම්ම සංකප්පය ආදී තුන්දෙන පූර්වභාගයේ දී නොයෙක් නොයෙක් සිත්වල ලැබෙත්. මාර්ගක්ෂණයෙහි වනාහි ත්‍රිවිධ කාම සංකල්පනාදීන්ගේ පරිච්ඡේදය සම්පූර්ණ නැසීම කරන්නේ මාර්ගාංගය පුරවමින් එකම සම්‍යක් සංකල්පය ඉපිද නෙක්ඛම්ම සංකල්පය ආදීන් වශයෙන් ත්‍රිවිධ නාමයන් ලබයි. මින්පසු සම්‍යක් වචනය ආදියෙහිත් මේ ක්‍රමයයි. **මුසාවාදා වෙරමණීති** ආදියෙහි විරතියත් චේතනාවත් යන දෙකම වටී. **ආරතීති** යනාදියෙහි වාක් දුෂ්චරිතයන්ගෙන් දුරින් රමණය කරන්නේ ආරතියයි. ඔවුන්ගෙන් තොරව රමණය කරන්නේ විරතියයි. එයින් එයින් ආපසු හැරී ඔවුන්ගෙන් තොරව රමණය කරන්නේ පටිවිරතියයි. උපසර්ග වශයෙන් පදය වැඩිකරන ලදි. මේ සියල්ල වෙන්වීමට පර්යාය වචනයි. වෛරය විනාශ කරන්නේ **වෙරමණී** යි. මෙය ද වෙන්වීමට පර්යාය වචනයි. **පාණාතිපාතා වෙරමණී** ආදියෙහි චේතනාවෙන් වෙන්වීම යන දෙකම වටින්නේමය. **කුහනාති** ත්‍රිවිධාකාර කුහන වස්තුවෙන්. මෙය කරණකොටගෙන ලෝකය කුහකවේය විශ්මයට පත්වේය යනු කුහනාවයි. ලාභසත්කාර කැමතිව මෙය කියන්නේය යනු ලපනාවයි. නිමිතිකීම් ස්වභාවය ඇත්තේ මොවුන්ටය යනු නෙමිත්තික නම්. ඔවුන්ගේ ස්වභාවය නෙමිත්තිකතී නම්. පණිවිඩ ගෙනයන ස්වභාව ඇති මොවුන් නිප්පෙසික නම්. ඔවුන්ගේ ස්වභාවය නිප්පෙසිකතා නම්. ලාභයෙන් ලාභය සොයත් ද ඒ සඳහා මාර්ග සොයත් ද මොවුන්ගේ ස්වභාවය නිජිගිංසනතා නම්. මේ මෙහි සංක්ෂේපයයි. මේ කුහනකාදිය විස්තර වශයෙන් විසුද්ධිමාර්ගයේ සීල නිර්දේශයේ පෙළ හා අටුවාවලින් ගෙන කියන ලදි. **මිච්ඡාආජීවස්ස පහානායාති** මෙහි හුදෙක් පාළියෙහි

ආචා වූ මිච්ඡාජීවය පමණක් නොවේ. දිවිපැවැත්ම සඳහා පවත්වන ලද ප්‍රාණඝාතාදි වූ සප්තකර්මපථ චේතනාත් මිථ්‍යාජීවයත් ඔවුන් පිළිබඳ සප්ත චෛතසිකයන්ගේ සිඳීම් කරමින් මාර්ගාංගයන් පුරමින් උපන් විරතිය සම්‍යක් ආජීවය නම් වේ.

**සම්මාදිට්ඨිස්සාති** මාර්ග සම්‍යක් දෘෂ්ටියෙහි සිටියා වූ පුද්ගලයාට, **සම්මාසංකප්පො පහොතීති** මාර්ග සම්‍යක් සංකල්පනාවට සුදුසු වෙයි. ඵල සම්‍යක් දෘෂ්ටිකයාට ඵල සම්‍යක් සංකල්පනාව සුදුසු වෙයි. මෙසේ සියලු පදයන්හි අර්ථය දත යුතුයි. **සම්මාඤාණං සම්මාවිමුත්තීති** මෙහි මාර්ග සම්‍යක් සමාධියෙහි සිටියහුගේ ඵල ප්‍රත්‍යවේක්ෂාව සම්‍යක් ඥානයට සුදුසු වෙයි. ඵල සමාධියෙහි සිටියහුගේ ඵල ප්‍රත්‍යවේක්ෂාව සම්‍යක් ඥානයට සුදුසු වෙයි. මාර්ග ප්‍රත්‍යවේක්ෂා ඥානයෙහි සිටියහුට මාර්ග සම්‍යක් විමුක්තිය සුදුසු වෙයි. ඵල ප්‍රත්‍යවේක්ෂා ඥානයෙහි සිටියහුට ඵල සම්‍යක් විමුක්තිය සුදුසු වෙයි යන තේරුමයි. මෙහි ඵලඅංගයන් අට හැර සම්‍යක් ඥානය ප්‍රත්‍යවේක්ෂා කොට සම්‍යක් විමුක්තිය ඵලය කරන්නට වටින්නේ යැයි කියන ලදි. **සම්මාදිට්ඨිස්ස භික්ඛවෙ මිච්ඡාදිට්ඨි නිජ්ජිණ්ණා හොතීති** යනාදියෙහි සෙසු නිකාය භාණකයෝ ඵලය කියන ලද යැයි කියත්. **මජ්ඣිම භාණකයෝ** වනාහි දස වැදෑරුම් විනාශකර වස්තූන් දක්වූ තැන මාර්ගය කියන ලදැයි කියත්. එහි දර්ශනාර්ථයෙන් සම්‍යක් දෘෂ්ටිය දත යුතුයි. ප්‍රකට කරන අර්ථයෙන් සම්‍යක් ඥානය වෙයි. එය දැඩි මිදීම යන අර්ථයෙන් සම්‍යක් විමුක්තිය නම් වෙයි. **වීසතිකුසල පක්ඛාති** සම්‍යක් දෘෂ්ටිය ආදී වූ දස වැදෑරුම් සම්‍යක් දෘෂ්ටි ප්‍රත්‍යයෙන් ද නොයෙක් කුසල ධර්මයෝය යනාදියෙහිත් කියන ලද ක්‍රමයෙන් දහය යැයි ද මෙසේ විසි වැදෑරුම් කුසල පක්ෂයෝ වෙති. විසි වැදෑරුම් අකුසල පක්ෂයෝ නම්. **මිච්ඡාදිට්ඨි නිජ්ජිණ්ණා හොතීති** ආදී ක්‍රමයෙන් කියන ලද මිථ්‍යා දෘෂ්ටිය මුල්කර ගත් දහය ද **යෙ මිච්ඡාදිට්ඨිපච්චයා අනෙකෙ පාපකාති** යනාදියෙන් කියන ලද දහය දැයි මෙසේ විසි වැදෑරුම් අකුසල පක්ෂයෝ දත යුතුයි.

**මහාචත්තාරීසකො** මහත් වූ විපාක දීමේ මහත් වූ කුසල පාක්ෂිකයෝ ද අකුසල පාක්ෂිකයෝ දැයි හතළිස් ධර්මයක් ප්‍රකාශිත බැවින් මහාචත්තාරීසකො යැයි කියන ලදි. මේ සූත්‍රයෙහි සම්‍යක් දෘෂ්ටි පහක් කියන ලදි. විදර්ශනා සම්‍යක් දෘෂ්ටිය කර්මස්වකත සම්‍යක් දෘෂ්ටිය, මාර්ග සම්‍යක් දෘෂ්ටිය, ඵල සම්‍යක් දෘෂ්ටිය, ප්‍රත්‍යවේක්ෂා සම්‍යක් දෘෂ්ටිය වශයෙනි. එහි මිථ්‍යා දෘෂ්ටිය මිථ්‍යා දෘෂ්ටිය යැයි දැනගනී ආදි ක්‍රමයෙන් කියන

ලද්දේ විදර්ශනා සම්‍යක් දෘෂ්ටියයි. දෙන ලද දෙයෙහි සැප විපාක ඇත යනාදි ක්‍රමයෙන් කියන ලද්දේ කම්මස්සකතා සම්‍යක් දෘෂ්ටියයි. **සම්මාදිට්ඨිස්ස හි භික්ඛවෙ සම්මාසංකප්පො පහොතීති** මෙහි මාර්ග හා ඵල සම්‍යක් දෘෂ්ටි දෙක ගැනම කියන ලදි. **සම්මාඤාණං පහොතීති** මෙහි ප්‍රත්‍යවේක්ෂා සම්‍යක් දෘෂ්ටිය කියන ලද්දේ යැයි දතයුතුයි. **සම්මාදිට්ඨිං ච භවං ගරහතීති** මේ මිථ්‍යා දෘෂ්ටිය ලක්ෂණ යැයි කියන්නෝ ද මේ සම්‍යක් දෘෂ්ටිය අවලක්ෂණ යැයි කියන්නෝ ද සම්මා දෘෂ්ටිය ගරහන්නෝ නම් වෙත්. **ඔක්කලාති** ඔක්කල නම් ජනපද වාසීහුයි. **වස්සභඤ්ඤාති** වස්ස හා භඤ්ඤ යන දෙදෙනායි. **අහෙතුවාදාති** සත්වයන්ගේ විසුද්ධියට හේතු නැත. ප්‍රත්‍ය නැත. මේ ආදී ලෙසින් කියන්නෝය. **අකිරියවාදාති** කරන්නා පව් නොකරයි ආදී ලෙසින් මෙසේ ක්‍රියා ප්‍රතික්ෂේප කරන්නෝය. **නත්ථිකවාදාති** දුන් දෙයෙහි විපාක නැත ආදී ලෙස කියන්නෝය. ඔවුහු මේ ත්‍රිවිධ දර්ශනයන්හි බැසගත් නිසාම ඇත්තෝ වූහ. ඔවුන් අතර කෙසේනම් නියාම වෙයි ද යමෙක් මෙබඳු ලබ්ධි ගෙන රාත්‍රිස්ථාන හා දිවාස්ථානයන්හි සිටියේ සජ්ඣායනා කරයි. විමසයි. එහි හේතුවක් නැත. ප්‍රත්‍යයක් නැත. කරන්නෙක් නැත. කරවන්නෙක් නැත. පවක් නැත. කයේ බිඳීමෙන් පසු නැසෙයි. ඒ අරමුණෙහි මිථ්‍යා ස්මෘතිය පිහිටයි. සිත එකඟ වෙයි. ජවනයක් දුවත් පළමු ජවනයෙහි පිළියම් සහිත වෙයි. දෙවන ජවනාදියෙහිත් එසේමය. සත්වැන්නෙහි බුදුරදුන්ටවත් පිළියම් කළ නොහැකි වෙයි. අරිට්ඨකණ්ඨක හා සමාන වෙයි. එහි කිසිවෙක් එක් දර්ශනයකට බැස ගනියි. කිසිවෙක් දෙක තුනකට බැස ගනියි. නියත වශයෙන් ම මිථ්‍යා දෘෂ්ටිකයෙක් වෙයි. ස්වර්ග මෝක්ෂ ආවරණය කර ගත්තෙකු බවට පත්වෙයි. ඒ ආත්මභවයේ දී හෝ අන්තරා ආත්මභාවයක දී හෝ ස්වර්ගයට හෝ මෝක්ෂයට නුසුදුසු වෙයි. ස්වර්ගයට සුදුසුනම් මෝක්ෂයක් ගැන කියනු කිම? මේ පුද්ගලයා පොළොවට පොහොර වෙන්නෙකි. සසරට කණුවකි. මෙබන්දන්ට සසරින් ගැලවීමක් බොහෝ සෙයින් නැත. වස්ස හා භඤ්ඤ යන දෙදෙනා ද මෙබන්දෝ වූහ. **නින්දාව්‍යාරොසඋපාරම්භභයාති** තමාට නින්දා බියෙන් සට්ටන බියෙන් දෝෂාරෝපණ බියෙන් යන තේරුමයි. ඉතිරි සියල්ල ද පෙර කියන ලද පරිදිමය.

**මහාචත්තාරීසක සූත්‍ර වර්ණනාව නිමි.**

# 2.4.8

**එවමෙමෙසුතනති** ආනාපානසති සූත්‍රය මා විසින් මෙසේ අසන ලදි. එහි· **අඤ්ඤෙහි** චාති පෙළෙහි ආ දස තෙරුන් හැර වෙනත් ප්‍රසිද්ධ වූ බොහෝ ශ්‍රාවකයන් සමඟ එකල්හි වනාහි පිරිසිඳිය නොහැකි ගණනින් මහත් වූ භික්‍ෂුසංඝයා විය. **ඔවදනති අනුසාසනතීති** ආමිෂ සංග්‍රහය ධර්ම සංග්‍රහය යන දෙවැදෑරුම් සංග්‍රහයන්ගෙන් සංග්‍රහ කොට කර්මස්ථාන අවවාද අනුශාසනාවන්ගෙන් අවවාද කරත්. අනුශාසනා කරත්. **තෙ චාති** චකාරය ආගම සන්ධි මාත්‍රයක් පමණි. **උළාරං පුබ්බෙනාපරං විසෙසං ජානනතීති** සීලය සම්පූර්ණ කිරීම් ආදියෙන් විශේෂයෙන් උළාර වූ අනෙක් කසින පරිකර්මාදී විශේෂය දනිත් යන තේරුමයි. **ආරද්ධොති** සතුටු වූයේ **අප්පත්තසස පත්තියාති** නොපැමිණි රහත්බවට පැමිණීම පිණිස සෙසු පද දෙකේ ද මේ තේරුමයි. **කොමුදීචාතුමාසිනීති** ඉල් මස මැදි පොහෝ දා ඒ කාලයෙහි කුමුදු ඇති නිසා කොමුදී යැයි කියයි. වස් හාරමස අවසානයෙහි පිහිටි හෙයින් **චතුමාසීති** යැයි කියනු ලැබේ. **ආගමෙසාමි** බලාපොරොත්තු වන්නෙමි. අද නොපවරා යම්තාක් ඕ පැමිණෙන්නේ ද ඒතාක් කිසිතැනක නොගොස් මෙහිම වසමියි යන තේරුමයි. මෙසේ භික්‍ෂූන්ට පවාරණ සංග්‍රහය අනුදන වදාරන්නේ මෙසේ කීය. පවාරණ සංග්‍රහය ඤත්ති දුතිය කර්මයෙන් දෙනු ලබන්නකි. කවරෙකුට එය දෙන්නේ ද? කවරෙකුට නොදෙන්නේ ද? නොකරන්නාටත් මෝඩ පෘථග්ජනයාටත් නොදෙයි. එසේම ආරද්ධ විදර්ශකයාටත් ආර්ය ශ්‍රාවකයාටත් නොදෙයි. යමෙකුට වනාහි සමථයත් විදර්ශනාවත් තරුණ නම් ඔහුට දෙනු ලැබෙයි. භාග්‍යවතුන් වහන්සේ ද එදා භික්‍ෂූන්ගේ චිත්තාචාරය විමසන්නේ සමථ විදර්ශනාවන්ගේ තරුණ බව දැන මා අද පවරනු ලබන කල්හි නොයෙක් නොයෙක් දිසාවල වස්විසූ භික්‍ෂූහු මෙහි රැස්වන්නාහුය. එයින් මේ භික්‍ෂූහු වයසින් වැඩි භික්‍ෂූන් සෙනසුන් ගත් කල්හි විශේෂයක් උපදවන්නට නොහැකි වෙත්.

ඉදින් චාරිකාවෙහි හැසිරෙන්නේ නම් මොවුන්ට වාසස්ථාන දුල්ලභ වන්නේය. මා පවාරණය නොකරන කල්හි භික්‍ෂූහු මේ සැවැත්නුවරට නොරැස්වන්නාහුය. මා චාරිකාවේ නොයන්නේ නම් මෙසේ මේ භික්‍ෂූන්ට වාසස්ථාන පළිබෝධ නොවන්නේය. ඔවුහු තම තමන්ගේ වාසස්ථානවල සුවසේ වසන්නාහු සමථ විදර්ශනා ශක්තිමත් කොට විශේෂයක් උපදවන්නට හැකිවන්නෝ යැයි උන්වහන්සේ එදින නොපවරා ඉල් මස පුණුපොහෝදා පවාරණය කරන්නෙමියි භික්‍ෂූන්ට පවාරණ සංග්‍රහය අනුදන

වදාළහ. පවාරණ සංග්‍රහය ලද කල්හි නිස සමාදන්ව ගත්තහුගේ ආචාර්ය උපාධ්‍යායන් වහන්සේලා ආපසු එත්. ඔහුත් ඉදින් සුදුසු වූ නිස දෙන්නෙක් එන්නේ නම් ඔහුගේ සමීපයෙහි නිස ගන්නෙමියි ග්‍රීෂ්ම ඍතුවේ අවසන් මාසය දක්වා වාසය කරන්නට ලබයි. ඉදින් සැටවස් ඇති භික්ෂූන් එත් ද උන්වහන්සේලාට සෙනසුනක් ලබන්නට නොහැකි වෙත්. මේ පවාරණ සංග්‍රහය එක් අයෙකුට දුන් කල්හි සියල්ලන්ට ම දුන්නේ වෙයි. **සාවත්ථිං ඔසරන්තීති** භාග්‍යවතුන් වහන්සේ විසින් පවාරණ සංග්‍රහය දෙන ලදැයි සූත්‍රය ඇසූ තැනම යථාස්වභාවයෙන් එක් මාසයක් වාසය කොට ඉල් පුණු පොහෝ දා පොහොය කොට පැමිණෙන්නවුන් සඳහා මෙය කියන ලදි.

**පුබ්බෙනාපරන්ති** මෙහි තරුණ විදර්ශනාව කොට සමථ විදර්ශනාව ශක්තිමත් කළාහුය. මේ පූර්ව විශේෂයයි. ඉක්බිත්තෙන් එකඟ වූ සිතින් සංස්කාරයන් සිහිකොට සමහරෙක් සෝවාන් ඵලය -පෙ- සමහරෙක් රහත්බව සාක්‍ෂාත් කළාහුය. මෙය තවත් උදාර වූ විශේෂයකි. අලන්ති යුතුවෙයි. **යොජනගණනානීති** එක් යොදුනත් යොදුනමය. දස යොදුනත් යොදුනමය. එයින් මත්තේ යොදුන් ගණනැයි කියත්. මෙහි යොදුන් සියයක් යොදුන් දහසක් අදහස් කරන ලදි. **පුටොසෙනාපීති** පුටෝසං යැයි මාර්ගෝපකරණවලට කියයි. ඒ මාර්ගෝපකරණ ගෙන එළඹෙන්නට සුදුසුය යන තේරුමයි. පුටංසේන යන පදයක් ද ඇත. මාර්ගෝපකරණ අංශයක ඇත්තේ ද ඔහු පුටංස නම්. ඔහු විසින් අංශයකින් මාර්ගෝපකරණ උසුලන හෙයින් පුටංසෙ යනුවෙන් කියන ලදි. දැන් මෙබඳු ගුණයන්ගෙන් සමන්විත වූ භික්ෂූහු මෙහි ඇත්තාහු යැයි දැක්වීමට **සන්ති භික්ඛවෙති** යනාදිය කීහ.

**එහි චතුන්නං සතිපට්ඨානානන්ති** ආදිය ඒ භික්ෂූන් විසින් වඩන ලද කර්මස්ථාන දැක්වීම සඳහා කියන ලදි. එහි සත්තිස් බෝධිපාක්ෂික ධර්මයෝ ලෞකික ලෝකෝත්තර යැයි කියන ලදි. එහි යම් භික්ෂුවක් එකෙණෙහි ම මාර්ගය වඩත් ද ඔවුන්ට ලෝකෝත්තර වෙත්. පටන්ගන්නා ලද විදර්ශනා ඇත්තවුන්ට ලෞකිකය. **අනිච්චසඤ්ඤාභාවනානුයොගන්ති** එහි සංඥා ශීර්ෂයෙන් විදර්ශනාව කියන ලදි. යම්හෙයකින් මෙහි බොහෝ භික්ෂූහු ආනාපානය කර්මස්ථාන වශයෙන් වඩන ලදි. එහෙයින් සෙසු කර්මස්ථාන කෙටියෙන් කියා ආනාපාන කර්මස්ථානය විස්තර වශයෙන් කියන්නේ **ආනාපාන සති භික්ඛවෙ** යනාදිය කීහ. මේ ආනාපාන කර්මස්ථානය සියලු ආකාරයෙන් විසුද්ධිමාර්ගයෙහි විස්තර කරන ලදි. එහෙයින් එහි කියන ලද ක්‍රමයෙන් මෙහි පෙළේ තේරුම ද භාවනා ක්‍රමය ද දතයුතුය. **කායසඤ්ඤතරන්ති** පෘථිවි කායාදි හතර කයෙහි එකක් යැයි කියමි.

වායොකායං වදාමීති වායෝකාය කියමියි යන තේරුමයි. නැතහොත් රූපායතනය -පෙ- කබලිංකාර ආහාරය යන පස්විසි රූප කොට්ඨාශය රූපකාය නම්. ඒ අතරෙහි ආනාපානය පොට්ඨබ්බායතනයෙහි සංගෘහිත බැවින් එක්තරා කයක් වෙයි. එහෙයින් ද මෙය කීහ. **තස්මාතිහාති** යම්හෙයකින් කයවල් හතර අතුරෙහි වායෝ කය ද එකකි. වායෝ කය පස්විසි වැදෑරුම් කොට්ඨාශයෙහි හෝ එක්තරා රූප කයක හෝ ආනාපානය අනුව දකියි. එහෙයින් කයෙහි කය අනුව බලන්නේ යැයි යන තේරුමයි. මෙසේ සියලු තැන්හිම තේරුම දතයුතුයි. **වෙදනඤ්ඤතරන්ති** විවිධ වේදනාවන් අතුරෙන් එක්තරා සුඛ වේදනාවක් සඳහා මෙය කියන ලදි, **සාධුකං මනසිකාරන්ති** ප්‍රීතිපටිසංවිදිතාදි වශයෙන් උපන් යහපත් මනසිකාරයයි. කිම මනසිකාරය සුඛ වේදනා වේද? නොවේ ද? මේ වනාහි දේශනා ශීර්ෂයයි. යම්සේ අනිත්‍ය සංඥා භාවනානු යෝගයෙහි යෙදුනේ යන මෙතැන සංඥා නාමයෙන් ප්‍රඥාව කියන ලදි. මෙසේ මෙහි මනසිකාර නාමයෙන් වේදනාව කියන ලද යැයි දතයුතුයි. පළමු චතුෂ්කයෙහි පළමු පදයෙහි ප්‍රීති ශීර්ෂයෙන් වේදනාව කියන ලදි. දෙවන පදයෙහි සුඛ යැයි ස්වරූපයෙන් ම කියන ලදි. චිත්ත සංස්කාර යන පද දෙකෙහි සංඥා හා වේදනා යන චෛතසිකයෝය. මේ ධර්මයෝ සිතෙහි එකට බැඳුණු බැවින් චිත්ත සංස්කාර යන වචනයෙන් විතර්ක විචාරයන් හැර සියලු චිත්ත සම්ප්‍රයුක්ත ධර්මයෝ චිත්ත සංස්කාරයෙහි සංගෘහිත යැයි කී හෙයින් චිත්ත සංස්කාර නාමයෙන් වේදනාව කියන ලදි. ඒ සියල්ල මනසිකාර නාමයෙන් සංග්‍රහ කොට මෙය යහපත් මනසිකාරය යැයි කීය. මෙසේ ඇති කල්හි යම් හෙයකින් මේ වේදනාවෝ අරමුණු නොවෙයි. එහෙයින් වේදනානුපස්සනාව නොයෙදේ ද? නොයෙදෙන්නේ නොවේ ද? සතිපට්ඨාන වර්ණනාවේත් ඒ ඒ සුඛාදීන්ට වස්තු වූ දේ අරමුණු කොට වේදනාව විඳියි. ඒ වේදනාව වනාහි ප්‍රවෘත්ති පටන් කොට මම විඳිමි ව්‍යවහාර මාත්‍රයෙන් වේ යැයි කියන ලදි. තවද ප්‍රීතිපටිසංවේදී යනාදීන්ගේ අර්ථ වර්ණනාවත් එයට පිළිතුරක් කියන ලද්දේමය. එහෙයින් විසුද්ධිමාර්ගයෙහි කියන ලදි. දෙයාකාරයකින් ප්‍රීතිය විඳින්නේ වෙයි. අරමුණු වශයෙන් හෝ සිහිමුළා නොවී වශයෙන් හෝ යනුවෙනි. අරමුණු වශයෙන් ප්‍රීතිය විඳින්නේ කෙසේ ද? ප්‍රීතිය සහිතව ධ්‍යාන දෙකට සමවදියි. එයට සමවැදුණු කෙණෙහිම ධ්‍යාන ප්‍රතිලාභය වන හෙයින් අරමුණු වශයෙන් ප්‍රීතිය විඳින්නේ වෙයි. අරමුණ මැනවින් දත් හෙයිනි. සිහිමුළා නොවී ප්‍රීතිය විඳින්නේ කෙසේ ද? ප්‍රීතිය සහිත ධ්‍යාන දෙකට සමවැද නැගිට ධ්‍යාන සහිත ප්‍රීතිය ක්‍ෂයවීම් වැයවීම් වශයෙන් සිහිකරයි. ඔහුට විදර්ශනා ක්‍රමයෙහි ලක්‍ෂණ ප්‍රතිවේධයෙන් සිහිමුළා නොවී ප්‍රීතිය විඳියි.

එහෙයින් පටිසම්භිදාවෙහි කියන ලදි. දීර්ඝ ආශ්වාස වශයෙන් සිතේ එකඟබව වික්ෂේප රහිත බව දන්නවුන්ට සිහිය එළඹ සිටියේ වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් ප්‍රීතිය විඳින්නේ වෙයි. මේ ක්‍රමයෙන්ම අනෙත් පදයන්හි ද තේරුම දත යුතුයි. මෙසේ ධ්‍යාන ප්‍රතිලාභයෙන් අරමුණු වශයෙන් ප්‍රීති සුඛ චිත්ත සංස්කාර දැනගන්නා ලද්දාහු වෙත්. මෙසේ මෙයිනුත් ධ්‍යාන සම්ප්‍රයුක්ත වූ වේදනා සංඛ්‍යාත මෙනෙහි කිරීම් ප්‍රතිලාභයෙන් අරමුණු වශයෙන් වේදනාව දැනගත්තේ වෙයි. එහෙයින් භික්ෂුව වේදනාවෙහි වේදනාව අනුව බලමින් වාසය කරයි යනු ඒ වේලාවෙහි මනාකොට කියන ලදි. **නාහං භික්ඛවෙ මුට්ඨස්සතිස්ස අසම්පජානස්සාති** මෙහි මේ අදහසයි. යම්හෙයකින් ආශ්වාස කරන්නෙමියි සිතින් දැන ගන්නේය යනාදි ක්‍රමයෙන් පවතින භික්ෂුව කිසියම් ආශ්වාස ප්‍රාශ්වාස නිමිත්තක් අරමුණු කරයි. ඒ සිතේ අරමුණෙහි සිහියත් සම්ප්‍රජන්‍යයත් උපදවා පවතින හෙයින් මෙය චිත්තේචිත්තානුපස්සී නම් වෙයි.

මුළා වූ සිත් ඇත්තාටත් නොදන්නාහටත් ආනාපානසති භාවනාවක් නැත. එහෙයින් අරමුණු වශයෙන් ද සිත මනාකොට දැනගැනීම් වශයෙන් ද එකල්හි භික්ෂුව සිතෙහි සිත අනුව බලමින් වාසය කළේ යැයි කියයි. හෙතෙම යම් ඒ අභිධ්‍යා දෝමනස්සයන්ගේ ප්‍රහාණයක් වේද **තං පඤ්ඤාය දිස්වා සාධුකං අජ්ඣුපෙක්ඛිතා හොතීති** මෙහි අභිධ්‍යාව කාමච්ඡන්ද නීවරණයමයි. දෝමනස්ස වශයෙන් ව්‍යාපාද නීවරණය දක්වන ලදි. මේ චතුෂ්කය විදර්ශනා වශයෙන් කියන ලදි. ධම්මානුපස්සනාව ද නීවරණ පබ්බාදීන්ගේ වශයෙන් සය වැදෑරුම් වේ. එහි නීවරණ පබ්බය ආදී නීවරණ දෙකක් මුල් වෙයි. මෙසේ ධම්මානුපස්සනාව පළමුකොට දැක්වීමට **අභිජ්ඣාදොමනස්සානන්ති** යන්න කීය. **පහානන්ති** අනිත්‍යානුපස්සනාවෙන් නිත්‍ය සංඥාව දුරුකෙරේ යැයි ප්‍රහාණකර නුවණ අදහස් කරන ලදි. **තං පඤ්ඤාය දිස්වා දිස්වාති** ඒ අනිත්‍ය විරාග නිරෝධ පටිනිස්සග්ගිඥාන සංඛ්‍යාත ප්‍රහාණ ප්‍රඥාව අනෙත් විදර්ශනා ප්‍රඥාවට වඩා වෙනත් එකකැයි මෙසේ විදර්ශනා පරම්පරාව දක්වයි. **අජ්ඣුපෙක්ඛිතා හොතීති** යම් සමථයකට පිළිපදින්නේ ද එහි මධ්‍යස්ථ වේද යම්කිසිවක් තනිකොට වැටහුණේ ද මධ්‍යස්ථ වේද මෙසේ අජ්ඣුපෙක්ඛණය දෙයාකාරයි. එහි එක්ව හටගත්තවුන් මනාව බැලීම වේ. අරමුණ ම මනාව බැලීම වේ. මෙහි අරමුණම මනාකොට බැලීම අදහස් කරන ලදි. **තස්මාතිහ භික්ඛවෙති** යම්හෙයකින් අනිත්‍ය අනුව බලන්නේ ආශ්වාස කරන්නෙමියි ආදී ක්‍රමයෙන් පැවතීම හුදෙක් නීවරණ ධර්ම නොවේ. අභිධ්‍යා දෝමනස්ස

ශීර්ෂයෙන් කියන ලද ධර්මයන්ගේ ප්‍රහාණ ඥානය ද නුවණින් දැක දැක මනාව වටහාගන්නේ වෙයි. එහෙයින් භික්ෂුව ධර්මයෙහි ධර්මය අනුව බලමින් එවිට වාසය කරන්නේ යැයි දතයුතුය. **පවිචිනතීති** අනිත්‍යාදී වශයෙන් සොයයි. සෙසු පද දෙක මෙයට ම පර්යායයි. **නිරාමිසාති** කෙලෙස් නැති **පස්සමහතීති** කායික වූත් චෛතසික වූත් කෙලෙස් කරදර සන්සුන් හෙයින් කයත් සිතත් සංසිඳෙයි. සමාධිගත වූවාක් මෙන් මනාව පිහිටයි. අර්පණාවට පැමිණි කලක මෙන් වෙයි.

**අජ්ඣුපෙක්ඛිතා විය හොතීති** හටගත් මධ්‍යස්ථ බවින් මධ්‍යස්ථ වෙයි. මෙසේ දහහතර විදියකින් කාය පරිග්‍රහය ඇති භික්ෂුවට ඒ කය ඇති කල්හි සතිසංබොජ්ඣංගය ද සිහියෙන් යුතු ඥානය ද ධම්මවිචය සංබොජ්ඣංගය ද ඒ හා සම්ප්‍රයුක්ත කායික හා චෛතසික වීර්ය ද විරිය සංබොජ්ඣංගය ද පස්සද්ධි ඒකාග්‍රතා සමාධි සංබොජ්ඣංගය යැයි යන මේ සය වැදෑරුම් බොජ්ඣංගයන් ගේ නොපසුබස්නා නොනවතින සංඛ්‍යාත මධ්‍යස්ථ වූ උපේක්ෂා සංබොජ්ඣංගයයි. යම් සේ අශ්වයාත් සමව පවත්නා කල්හි අශ්වාරෝහකයා මොහු පසුබස්නේ යැයි තැලීමක් හෝ මොහු වේගයෙන් දුවන්නේ යැයි ඇදීමක් හෝ නැත්ද හුදෙක් බලාසිටීම් මාත්‍රයක්ම වෙයි. එපරිද්දෙන් ම මේ බොජ්ඣංග හයේ නොපසුබස්නා නොනවතින තත්ත්වය මධ්‍යස්ථ බව උපේක්ෂා සංබොජ්ඣංගය නම් වෙයි. මෙපමණකින් කුමක් කියන ලදී ද? ඒක චිත්තක්ෂණික වූ නා නා රස ලක්ෂණ වූ විපස්සනා නම් බොජ්ඣංගය කියන ලදී. **විවෙක නිස්සිතනති** යනාදියෙහි පෙර කියන ලද තේරුම් ඇත්තේ වෙයි. මෙහි වනාහි ආනාපානයන් පරිග්‍රහණය කරන්නා වූ සිහිය ලෞකික වෙයි. ලෞකික ආනාපානය ලෞකික සතිපට්ඨානය සම්පූර්ණ කරයි. ලෞකික සතිපට්ඨානය ලෝකෝත්තර බොජ්ඣංගයන් සම්පූර්ණ කරයි. ලෝකෝත්තර බොජ්ඣංගයන් විද්‍යා විමුක්ති ඵල නිර්වාණය සම්පූර්ණ කරයි. මෙසේ ලෞකික වශයෙන් ආ තැන ලෞකික යැයි කියන ලදී ලෝකෝත්තර යැයි ආ තැන ලෝකෝත්තර යැයි කියන ලදී. තෙරුන් වහන්සේ කීහ. සෙසු තැන් ද මෙසේම වෙයි. මේ සූත්‍රයෙහි ලෝකෝත්තර බව ප්‍රථමයෙන්ම ආවේ ය. ලෞකික ආනාපානසතිය ලෞකික සතිපට්ඨානයෙහි සම්පූර්ණ කරයි. ලෞකික සතිපට්ඨානය ලෞකික බොජ්ඣංගයන් සම්පූර්ණ කරයි. ලෞකික බොජ්ඣංගයන් ලෝකෝත්තර විද්‍යා විමුක්ති ඵල නිර්වාණය සම්පූර්ණ කරයි. විද්‍යා විමුක්ති පදයෙන් එහි විද්‍යා ඵල නිර්වාණය අදහස් කරන ලදී.

**ආනාපානසති සූත්‍ර වර්ණනාව නිමි.**

# 2.4.9

එවමෙමසුතනති කායගතාසති සූත්‍රය මාවිසින් මෙසේ අසන ලදී. එහි **ගෙහසිතාති** පංචකාම ගුණයන් ඇසුරු කළ. **සරසඞකපපාති** දුවන ස්වභාව ඇති අරමුණු සර නම් වේ. දුවත් යන තේරුමයි. **අජ්ඣත්තමෙවාති** ගොදුරු අධ්‍යාත්මයේ මය. **කායගතාසතිනති** කයින් ගත්තා වූ ද කයින් අරමුණු කොට ඇති කල්හි කාය පරිග්‍රාහක යැයි කී කළ සමථය කියන ලද වෙයි. කායාරම්මණ යැයි කී කළ විදර්ශනාවයි. දෙකෙන් ම සමථ විදර්ශනා කීවේ වෙත්. නැවත ද අනිකක් කියමි. මහණෙනි, මෙසේ භික්ෂුව කායගතාසතිය වඩයි ද සතිපට්ඨානයෙහි දහහතර ක්‍රමයකින් කායානුපස්සනාව කියන ලදී. **අනෙතාගධාති** ඇතුළත වූ. **තසසාති** ඒ භික්ෂුවට භාවනා වශයෙන් අභ්‍යන්තරගත ම වෙයි. **විජ්ජාභාගියාති** මෙහි සම්ප්‍රයෝග වශයෙන් විද්‍යාව භජනය කරත්නුයි විජ්ජාභාගී නම් වේ. විද්‍යා කොට්ඨාශයෙහි පවතින්නේ විජ්ජාභාගී නම් වේ. එහි විදර්ශනා ඥානය, මනෝමයසිද්ධිය, ෂඩ් අභිඥා, අෂ්ට විද්‍යාවෝ වෙති. පෙර කී අර්ථයෙන් ඒ විද්‍යාවෙන් ඒ විද්‍යාවත් සමඟ යෙදුණ ධර්ම ද විජ්ජාභාගී නම් වේ. පසුව කී අර්ථයෙන් ඒ කිසියම් එකක් විද්‍යාවය ඉතිරිය විජ්ජාභාගීය යැයි මෙසේ විද්‍යාවත් විද්‍යා සම්ප්‍රයුක්ත ධර්මත් විජ්ජාභාගීම යැයි දත යුතුයි. **චෙතසාඵුටොති** මෙහි පැතිරවීම දෙයාකාරයි. ආපෝ ඵරණ හා දිව්‍යචක්ෂු ඵරණ වශයෙනි. එහි ආපෝ කසිනයට සමවැද ජලය පැතිරවීම ආපෝ ඵරණයයි. මෙසේ පැතිර වූ කල්හි සියලු මුහුදු බලා යන්නා වූ කුඩා නදීහු ඇතුළත් වෙත්. ආලෝකය වඩා දිවැසින් සියලු මුහුදු බැලීම දිව්‍යචක්ෂු ඵරණයයි. මෙසේ පැතිරුණු කල්හි මුහුදු කරා යන සියලු කුඩා නදීහු මහ මුහුදෙහි ම ඇතුළත් වෙත්. **ඔතාරනති** විවරය, සිදුර **ආරම්මණනති** ක්ලේශයන්ගේ උපතට හේතුවන ලඟෙථ **ඔතාරනති** පිවිසීම ලබන්නේය. විනිවිද ගෙන අවසානය දක්වා ගමන් කරන්නේය යන තේරුමයි. **නික්ඛෙපනනති** බහා තැබීම්ය. මෙසේ නොවඩන ලද කායගතාසතිය ඇති පුද්ගලයා තෙත මැටි පිඬකට උපමා කොට දූන් කායගතාසතිය වැඩියහු හර දූවයකට උපමාකොට දක්වීමට **සෙය්‍යථාපීති** යනාදිය කීය. එහි **අගගලඵලකනති** කවුලුවය. **කාකපෙය්‍යාති** මුවවිට හිඳ කපුටා විසින් බෙල්ල නොනමා ම පිය යුතුයි.

**අභිඤ්ඤා සච්ඡිකරණීයස්සාති** අභිඥාවෙන් සාක්ෂාත් කළ යුතු. **සක්ඛි භබ්බතං පාපුණාතීති** ප්‍රත්‍යක්ෂ බවට පැමිණෙයි. **සති සති ආයතනෙති** කරුණක් ඇති කල්හි කිම මෙහි කාරණා යනු අභිඥාවම කාරණයයි.

ආළිබද්ධාති සීමා බැඳි යානිකතායාති යොදන ලද යානයක් මෙන් කරන ලද **වත්‍ථුකතායාති** පිහිටවීමට කරන ලද අනුට්‍ඨිතායාති අනුව පැවැත්ම සඳහා **පරිචිතායාති** පුරුදු කරණු පිණිස **සුසමාරද්ධායාති** මනාකොට ආරම්භ කරන ලද, මනාකොට උත්සහ කරන ලද. ඉතිරිය සියලු තැන්හිම කියන ලද ක්‍රමයයි.

**කායගතාසති සූත්‍ර වර්ණනාව නිමි.**

## 2.4.10

**එවමෙමසුතනති** සංඛාරුප්පත්ති සූත්‍රය මා විසින් මෙසේ අසන ලදි. එහි **සංඛාරුපපත්තිනති** සංස්කාරයන්ගේ ම ඉපදීමයි. සත්වයෙකුගේ හෝ පුරුෂයෙකුගේ හෝ පුණ්‍යාභිසංස්කාරයන් විසින් භවයට එවන ලද ඉපදීම නොවේ. **සද්ධාය සමනනාගතොති** ශ්‍රද්ධාදි පංච ධර්මයෝ ලෞකිකව පවතිත්. **දහතීති** තබයි. **අධිට්‍ඨාතීති** පිහිටුවයි. **සංඛාරා ච විහාරොචාති** ප්‍රාර්ථනාව සමඟ ශ්‍රද්ධාදි පංච ධර්මයෝය. **තත්‍රුපපත්තියාති** ඒ ස්ථානයෙහි ඉපදීම සඳහා **අයං මග්ගො අයං පටිපදාති** ප්‍රාර්ථනාව සමඟ පංච ධර්මයෝය. යමෙකුට පංච ධර්මයෝ ඇත්ද ප්‍රාර්ථනා නැත්ද ඔහුගේ ප්‍රතිසන්ධිය අනිබද්ධ වෙයි. යමෙකුට ප්‍රාර්ථනා ඇද්ද පංච ධර්මයෝ නැත්ද ඔහුගේ ස්වභාවය ද අනියතය. යම්කිසිවෙකුගේ ප්‍රතිසන්ධිය නිබද්ධ නම් යම්සේ අහසට දමන ලද දණ්ඩ අගින් හෝ මැදින් හෝ මුලින් හෝ වැටෙන්නේ ය යන්න නියත වේද මෙසේ සත්වයන්ගේ ප්‍රතිසන්ධි ග්‍රහණයෙහි නියමයක් නැත. එහෙයින් කුසල ක්‍රියාකොට එක් තැනක් ප්‍රාර්ථනා කළ යුතුවෙයි. **ආමණ්ඩනති** නෙල්ලි ය. එය පිරිසිදු ඇස් ඇති පුරුෂයාට සියලු ආකාරයෙන් ප්‍රකට වෙයි. එසේ ඒ බ්‍රහ්මයාට එහි උපන් සත්වයන් සහිත දහසක් සක්වළ පෙනෙයි. සියලු තැන්හි මේ ක්‍රමයයි.

**සුභොති** යහපත් **ජාතිමාති** ආකාර සම්පන්න **සුපරිකමමකතොති** දෙවීම් ආදියෙන් මනාකොට පිරියම් කරන ලද **පණ්ඩුකමබලෙ නික්ඛිත්තොති** රත් කම්බිලියෙහි තබන ලද **සතසහසසාති** ලක්‍ෂයක් ලෝකධාතූන් හි ආලෝකය පතුරුවන බ්‍රහ්මයා **නෙක්ඛනති** රුවතින් කරන ලද පළඳනා, නික්ඛ නම් පංච සුවර්ණයි. අඩු සුවර්ණයෙන් කරන ලද

පළඳනාව ගැටීම් මැඩීම් ඉවසන්නේ නොවේ. වැඩි සුවර්ණයෙන් කරන ලද පළඳනාව ගැටීම් මැඩීම් ඉවසයි. සුවර්ණවත් නොවෙයි. කර්කශ ස්වභාවයෙන් පෙනෙයි. පංච සුවර්ණයෙන් කරන ලද්ද ගැටීම් මැඩීම් ඉවසයි. එසේම වර්ණවත් ද වෙයි. **ජම්බොනදන්ති** ජම්බු නදියෙහි උපන්. මහා දඹ ගසේ එක් එක් අත්තක් පණස් පණස් යොදුනක් වැඩුණාහු ඒ අතු අතරින් මහත් මහත් ගංගාවෝ ගලා බසිත්. ඒ ගංගාවල දෙපස ඉවුරුවල ඉදුණු දඹ වැටුණු තැන්හි ස්වර්ණ පැළ හටගනිත්. ඒවා ගඟ දියෙන් ගසාගෙන යන්නේ පිළිවෙළින් මහ මුහුදට පිවිසෙත්. ඒ සඳහා ජම්බොනදන්ති යැයි කියන ලදි.

**දක්ඛකම්මාරපුත්ත උක්කාමුඛසුකුසලසම්පහට්ඨන්ති** ඉතා දක්ෂ කර්මාරපුත්‍රයා විසින් කෝවේ දමා උණු කරන ලද. **උක්කාමුඛෙති** උඳුනයි. **සම්පහට්ඨන්ති** සෝදා ගසා මඩිනා ලද. වත්ථූපම සූත්‍රයෙහි ද ධාතුවිභංග සූත්‍රයෙහි ද පිණ්ඩ සෝධනය යැයි කියන ලදි. මේ සූත්‍රයේ දී කරන ලද බඩු පිරිසිඳු කිරීමයි. යමක් වනාහි සියලු වාරවල පැතිර විශේෂයෙන් වෙන් ව කියන ලදි. එහි පැතිරීම පස් ආකාරයි. චෙතොඵරණය, කසිනඵරණය, දිබ්බචක්ඛුඵරණය, ආලෝකඵරණය, සරීරඵරණය යනුවෙනි. එහි චෙතොඵරණය නම් දහසක් සක්වළ සත්වයන්ගේ සිත් දැනගැනීමයි. කසිනඵරණය නම් දහසක් සක්වළ කසිනාලෝකය පැතිරවීමයි. දිබ්බචක්ඛුඵරණය නම් ආලෝකය වඩා දහසක් සක්වළ දිවැසින් බැලීමයි. ආලෝකඵරණයත් මෙයමයි. සරීරඵරණය නම් දහසක් සක්වළ ශරීරාවලෝකය පැතිරවීමයි. සියලු තැන්හි මේ පංච ඵරණයන් නොනසා කිවයුතුය. ත්‍රිපිටක චූලාභය තෙරුන් වහන්සේ මෙසේ කීහ. මිණි උපමාවෙහි කසිණය මෙන් පංචස්වර්ණ උපමාවෙහි ශරීර පැතිරීම පෙනේයැයි යන ඔහුගේ වාදය මෙන් අර්ථකථා නම් නැතැයි ප්‍රතික්ෂේප කොට සදාකාලික සරීරඵරණයක් නොකියයි. පැතිරවීම් හතර අඩු නොකොට කිවයුතුයැයි කියන ලදි.

**අධිමුච්චතීති** යන පදය ඵරණ යන්නට ම පර්යාය පදයකි. නැතහොත් **එරතීති** පැතිරෙයි. **අධිමුච්චති** යනු දැන ගනියි යන්නයි. **ආභාති** ආදියෙහි ආභාදී නමින් වෙන වෙනම දෙවියෝ නොවෙති. **පරිත්තාභාදී** තුන්දෙවියෝ ආභා නම් වේ. **පරිත්තසුභාදීන්** හා **සුභකිණ්ණකාදීන්** සුභා නම් වේ. වේහප්ඵලාදීන්ගේ වාරය ප්‍රකටයි. මොවුහු පළමුව පංචධර්මයන් වඩා කාමාවචර ලෝකවල උපදිත්. බ්‍රහ්මලෝකවල ඉපදීමත් රහත් බවට පැමිණීමත් කෙසේ නම් කරත් ද? මේ පංචධර්මයන්ගෙන් සීලය යැයි

යමක් වේ නම් මේ සීලයෙහි පිහිටා කසිණ පිරියම් කොට ඒ ඒ සම්පත්ති වඩා රූපීබ්‍රහ්ම ලෝකයෙහි උපදිත්. අරූපධ්‍යාන උපදවා අරූපීබ්‍රහ්ම ලෝකයෙහි උපදිත්. සමාපත්තියෙහි සිටගෙන විදර්ශනාව වඩා අනාගාමී ඵලය සාක්‍ෂාත් කොට ශුද්ධාවාසවල උපදිත්. මතු මාර්ගය වඩා රහත්බවට පැමිණෙයි.

**සංඛාරුප්පත්ති සූත්‍ර වර්ණනාව නිමි.**

**දෙවැනි අනුපද වර්ගය සමාප්තයි.**

## 3.4.1

**එවමෙමෙසුතනති** චූලසුඤ්ඤතා සූත්‍රය මා විසින් මෙසේ අසන ලදි. එහි **එකමිදනති** තෙරුන් වහන්සේ බුදුරදුන්ට වතාවත් කොට තමාගේ දිවාස්ථානයට ගොස් කාලය පිරිසිඳීම් කොට නිර්වාණය අරමුණු කොට ඇති ශූන්‍යතා ඵල සමවතට පැමිණ වැඩසිටියේ පිරිසිඳි පරිද්දෙන් නැගිට්ටේය. ඉක්බිතිව උන්වහන්සේට සංස්කාරයන්ගේ ශූන්‍යතාව වැටහුණාහ. උන්වහන්සේ ශූන්‍යතා කථා අසනු කැමති විය. ඉක්බිතිව උන්වහන්සේට මෙබඳු සිතක් විය. ධූරයෙන් ධූරයට ගැසීමෙන් ගොස් ස්වාමීනි, මට ශූන්‍යතා කථාව කියනු මැනවයි බුදුරදුන්ට කියන්නට නොහැකිය. ඒකාන්තයෙන් බුදුරදුන් යම් නගරයක් ඇසුරු කොට වසමින් එක් කථාවක් කියන්නේ ද මාවිසින් එය සිහිකරමි. මෙසේ බුදුරදුන් ශූන්‍යතා කථාව කියන්නේය. බුදුරදුන්ට සිහිකරවන්නේ එකමිදනති යනාදිය කීය. එහි **ඉදනති** යනු නිපාතයකි.

**කච්චි මෙ තං භනෙතති** තෙරුන් වහන්සේ එක් එක් පියවරක සිට හැට දහසක පද ඉගෙන ධාරණය කිරීමට සමත්ය. කිම? උන්වහන්සේ ශූන්‍යතා විහාරයෙන් එක පදයක් දරන්නට නොහැක්කේ ද? ඇසීමට කැමැත්තෙන් දන්නාක් මෙන් විචාරන්නට නොවටියි. ප්‍රකට කොට විස්තර කාරණා ශූන්‍යතා කථාව අසනු කැමැත්තේ නොදන්නාක් මෙන් මෙසේ කීය. එකෙක් නොදන්නේ ද දන්නාක් මෙන් වෙයි. තෙරුන් වහන්සේ මෙබඳු කුහකකමක් කෙසේ කරන්නේ ද? තමාගේ දන්නා ස්ථානයෙහි ද බුදුරදුන්ට ගෞරව දක්වා **කච්චිමෙතනති** යනාදිය කීය. **පුබ්බෙති** පළමු බෝධියෙහි නගරය ඇසුරු කොට වාසය කරන කාලයෙහි ද **එතරහීති** දැන් ද මෙසේ කියා සිතීය. ආනන්ද තෙරුන් වහන්සේ ශූන්‍යතා කථාව අසනු කැමැත්තේ එකෙක් අසන්නට සමත් වෙති. ඉගෙණීමට නොහැකිය. එකෙක් ඇසීමට ද ඉගෙණීමට ද සමත් වෙයි. කියන්නට නොහැකි වෙති. ආනන්ද තෙරුන්ට ඇසීමට ද ඉගෙණීමටද කීමට ද හැකිය. මොහුට ශූන්‍යතා කථාව කියන්නෙමි යි එය කියන්නේ **සෙය්‍යථාපීති** යනාදිය කීහ. එහි ශූන්‍ය වූ ඇත් අස් ගව වළස් යනාදියෙහි එහි කාෂ්ට රූප පුස්තක රූප චිත්ත රූප වශයෙන් කරන ලද ඇත් ආදීහු ඇත. වෛශ්‍රවණ මන්ධාතු ආදී රජවරුන් සිටි ස්ථානයන්හි විසිතුරු කිරීම් වශයෙන් කරන ලද රත්නයෙන් සෙවිනා ලද ජනෙල් දොරවල්වල බඳිනා ලද ඇඳ පුටු ආදී වශයෙන් තබන ලද දේද පරණ දෙය අළුත්වැඩියා කිරීම පිණිස තබන ලද රන් රිදී ද ඇත. කාෂ්ටක රූප වශයෙන් කරන ලදි. බණ ඇසීම්

Scanned with CamScanner

ප්‍රශ්න විචාරීම් ආදී වශයෙන් පැමිණි ස්ත්‍රී පුරුෂයෝ ද ඇත. ඒ නිසා උන්වහන්සේ ඔවුන්ගෙන් හිස් නැත. ඉන්ද්‍රිය ප්‍රතිබද්ධ වූ විඥානය සහිත වූ ඇත් ආදීන්ගේ කැමැති කැමැති මොහොතෙහි පරිභෝග කළ යුතු රන් රිදී රත්නයන්ගේ නිතර වාසය කරන ස්ත්‍රී පුරුෂයන්ගේ නොවීම සඳහා මෙය කියන ලදි. **භික්ඛුසංඝං පටිච්චාති** භික්ෂූන් පිඬු පිණිස පිවිසි කල්හි විහාර බත ඉවසන භික්ෂූන්ගෙන් ද ගිලනුන්ට උවටැන් කරන උද්දේස චීවර කර්මයෙහි නියුතු භික්ෂූන්ගෙන් ද හෙතෙම අශූන්‍ය වෙයි. මෙහි නිතර භික්ෂූන් ඇති බැවින් මෙසේ කීය.

**එකත්තන්ති** එකබව. එක අශූන්‍යයක් ඇතැයි යන තේරුමයි. **එකො අසුඤ්ඤභාවො අත්ථීති** යනාදිය කියන ලදි. **අමනසි කරිත්වාති** සිහි නොකොට **අනිවජ්ජිත්වාති** ප්‍රත්‍යවේක්ෂා නොකොට **ගාමසඤ්ඤන්ති** ගම යැයි පැවතීම් වශයෙන් හෝ කෙලෙස් වශයෙන් හෝ උපන් ග්‍රාම සංඥාවයි. මනුෂ්‍ය සංඥාවෙහි ද මේ ක්‍රමයයි. ආරණ්‍ය සංඥාව නිසා මෙනෙහි කරයි. **එකත්තන්ති** මේ කැලයයි. මේ ගසයි. මේ පර්වතයයි. මේ නිල් අහසයි. **වනසණ්ඩාති** මෙසේ එක් කැලයක් නිසාම ආරණ්‍ය සංඥාව මෙනෙහි කරයි. **පක්ඛන්දතීති** බසියි. **අධිමුච්චතීති** මෙසේ මිදෙයි. **යෙ අසුසු දරථාති** යම් පැවැති දාහයක් හෝ කෙලෙස් දාහයක් හෝ ග්‍රාම සංඥාව නිසා වන්නාහ. ඔවුහු මේ ආරණ්‍යයෙහි නොවෙත්. දෙවන පදයෙහි ද මේ ක්‍රමයයි. **අත්ථි චෙවායන්ති** මේ එක ආරණ්‍ය සංඥාවක් නිසා උපදින පැවැති දාහ මාත්‍රයක් ඇත. යමක් එහි නොවෙයි. මිගාර මාතෘ ප්‍රාසාදයෙහි ඇත් ආදීන් මෙන් මේ ආරණ්‍ය සංඥාවෙන් ග්‍රාම සංඥාව මනුෂ්‍ය සංඥාවන් වශයෙන් උපදින පවතින දාහය හෝ කෙලෙස් දාහය හෝ නූපදවයි.

**යං පන තත්‍ථ අවසිට්ඨන්ති** යම් හෙයකින් මිගාර මාතෘ ප්‍රාසාදයෙහි භික්ෂු සංඝයා මෙන් එහි ආරණ්‍ය සංඥාවෙන් පවත්වන ලද දාහ මාත්‍රයක් ඉතිරි වෙයි. **තං සන්තමිදං අත්ථීති පජානාතීති** එය විද්‍යාමානවම ඇතැයි මෙය දනියි. **සුඤ්ඤතාවක්කන්තීති** ශූන්‍යබව ඉපදීමයි. **අමනසි කරිත්වා මනුස්සසඤ්ඤන්ති** මෙහි ග්‍රාම සංඥාව නවතා ආරණ්‍ය සංඥාවෙන් මනුෂ්‍ය සංඥාව ද පෘථිවි සංඥාවෙන් ආරණ්‍ය සංඥාව ද ආකාසානඤ්චායතන සංඥාවෙන් පෘථිවි සංඥාව ද -පෙ- නේවසංඥානාසංඥායතන සංඥාවෙන් ආකිඤ්චඤ්ඤායතන සංඥාව ද විදර්ශනාවෙන් නේවසංඥානාසංඥායතන සංඥාව ද මාර්ගයෙන් විදර්ශනාව නවතා පිළිවෙළින් අත්‍යන්ත ශූන්‍යතාව දක්වන්නෙමි. එහෙයින් මෙසේ දේශනාව පටන් ගත්තේය. එහි **පඨවිසඤ්ඤන්ති** කුමක් හෙයින් ආරණ්‍ය සංඥාව හැර පෘථිවි සංඥාව

මෙනෙහි කරයි ද? ආරණ්‍ය සංඥාවගේ විශේෂයට නොපැමිණි හෙයින් ය. යම්සේ පුරුෂයෙකුට සිත්කළු කුඹුරකට සුදුසු තැනක් දැක මෙහි වපුරන ලද හැල් ආදිය මනාකොට සිද්ධ වන්නාහු යැයි මහත් ලාභයක් ලබන්නෙමියි සත් වරක් ම කුඹුර බලන්නහුට හැල් ආදිය සිද්ධ නොවෙයි. ඉදින් ඒ ස්ථානයේ කණු කටු ආදිය ඉවත් කොට සී සා වපුරයි. එසේ ඇතිකල්හි සිද්ධ වෙයි. එසේම මේ කැලයයි. මේ ගසයි. මේ පර්වතයයි. මේ නිල් අහසයි. මේ වන ලැහැබයි. ඉදින් සත් වරක්ම ආරණ්‍ය සංඥාව සිහි කරයි ද උපචාරයකට ද සමාධියකට ද නොපැමිණෙයි. ඔහුට පෘථිවි සංඥාව නිතර සේවනය කිරීමෙන් කමටහන පෘථිවි කසිණ පරිකර්මය කොට ධ්‍යාන උපදවා ධ්‍යාන පාදස්ථාන වූ විදර්ශනා වඩා රහත් වන්නට හැකිය. එහෙයින් ආරණ්‍ය සංඥාව හැර පෘථිවි සංඥාව සිහි කරයි. **පටිච්චාති** ප්‍රත්‍යයන් නිසා හටගත්. දැන් යම් පෘථිවි කසිනයෙක්හි ඔහුට පෘථිවි සංඥාව වෙයි. ඒ උපමාව දැක්වීම සඳහා **සෙය්‍යථාපීති** යනාදිය කීය. එහි උසභයාගේ මෙය යැයි ආසභ නම්. අනෙත් හවයන්ගේ ගඩු ද ප්‍රහාරයෝ ද වෙත්. ඔවුන්ගේ හම ප්‍රසාරණය කරනු ලබන්නේ රැළි ඇති වෙයි. උසභයාගේ ලක්ෂණ සම්පන්න හෙයින් එහි දොස් නැත. එහෙයින් ඌගේ හම ගන්නා ලදි.

**සඞ්කුසතෙනාති** උල් සියයකින් **සුවිහතනති** දිගු කොට උල් සියයකින්. උල් සියයකින් අඩුව කරන ලද්දේ නිර්බලික නොවෙයි. උල් සියයකින් දිගු කරන ලද්දේ භේරි තලයක් මෙන් රැලි නැති වෙයි. එහෙයින් මෙසේ කීය. **උක්කුලවික්කුලනති** උස් පහත් ගොඩබිම් නැති නිම්න ස්ථානයි. **නදී විදුග්ගනති** ගංගාවන් ද දුර්ග ස්ථානයන් ද පෘථිවි සංඥාව නිසා සිහි කරයි. **එකත්තනති** කසින පෘථිවි සංඥාව ම නිසා හටගත් එක් සංඥාවක් සිහි කරයි. **දරථමත්තාති** මෙතැන් පටන් සියලු වාරයන්හි පැවැති දාහ වශයෙන් ම දරථ මාත්‍රය දත යුතුයි. **අනිමිත්තං චෙතො සමාධිනති** විදර්ශනා චිත්ත සමාධියයි. එය නිතර නිමිති රහිත වූයේ අනිමිත්ත යැයි කියනු ලැබේ. **ඉමමෙව කායනති** විදර්ශනාවේ වස්තුව දක්වයි. එහි **ඉමමෙවාති** මේ සතර මහා භූතිකයයි. **සළායතනිකනති** සළායතන ප්‍රතිසංයුක්තයි. **ජීවිතපච්චයාති** ජීවිතේන්ද්‍රිය දක්වා පවතී ද ඒතාක් ජීවිත ප්‍රත්‍යයෙන් පැවැති දරථ මාත්‍රයෝ ඇතැයි කියන ලද්දේ වෙයි. **පුන අනිමිත්තනති** විදර්ශනාවේ ප්‍රතිවිදර්ශනාව දැක්වීමට කියන ලදි. **කාමාසවං පටිච්චාති** කාමාශ්‍රව නිසා ඉපදීම් පැවැති දාහයෝ මෙහි නැවෙත්. ආර්ය මාර්ගයෙහි ද ආර්ය ඵලයෙහි ද නැතැයි කියන ලද්දේ වෙයි. **ඉමමෙව කායනති** මෙය උපාදිසේස දාහය දැක්වීම පිණිස කියන ලදි. මෙසේ මනුෂ්‍ය සංඥාවෙන්

ග්‍රාම සංඥාව නවතා -පෙ- මාර්ගයෙන් විදර්ශනාව නවතා පිළිවෙළින් අත්‍යන්ත ශූන්‍යතාව දක්වන ලද්දේ වෙයි.

**පරිසුද්ධන්ති** කෙලෙස් නැති. **අනුත්තරන්ති** හැමටම උතුම්. **සුඤ්ඤතන්ති** ශූන්‍යතා ඵල සමාපත්තියයි. **තස්මාති** යම්හෙයකින් අතීතයෙහි බුදු පසේ බුදු බුද්ධශ්‍රාවක සංඛ්‍යාත මහණ බමුණෝ වූවාහු ද අනාගතයෙහි දූන් ද මොවුහු මේ පිරිසිදු උතුම් අනුත්තර ශූන්‍යතාවට පැමිණ විසූහ. වෙසෙත්. වසන්නාහ. එහෙයින් ඉතිරිය සියලු තැන්හි ප්‍රකටය.

**චූල්ලසුඤ්ඤතා සූත්‍ර වර්ණනාව නිමි.**

## 3.4.2

**එවමෙමෙසුතන්ති** මහාසුඤ්ඤතා සූත්‍රය මා විසින් මෙසේ අසන ලදි. එහි **කාළඛෙමකස්සාති** ශරීර වර්ණයෙන් ඔහු කලුය. **ඛෙමකොති** ඔහුගේ නමයි. **විහාරොති** ඒ නිග්‍රෝධාරාමයේ ම එක් පෙදෙසක පවුරකින් වට කොට දොරකොටු මවා හංසවට්ටක ආදී සෙනසුන් ද මණ්ඩලමාල භෝජනශාලා ආදිය ද පිහිටුවා කරන ලද විහාරයයි. **සම්බහුලානි සෙනාසනානීති** ඇඳ පුටු මේස කොට්ට තැටි පත්කඩ තණ ඇතිරිලි පිදුරු ඇතිරිලි ආදිය පණවන ලද්දාහු වෙත්. ඇඳෙන් ඇඳ -පෙ- පිදුරු ඇතිරිල්ලෙන් පිදුරු ඇතිරිල්ල පැතිර තබන ලද්දාහු සමූහ භික්ෂූන්ගේ වාසය කරන තැන හා සමාන විය. **සම්බහුලානුඛොති** බුදුරදුන් බෝ මැඩදීම සියලු කෙලෙස් සහමුලින් නැසූ නිසා සැකයක් නම් නැත. විතර්ක පූර්වභාග ප්‍රශ්න විතර්ක පූර්වභාග ම වෙයි. නු කාරය නිපාත මාත්‍රයකි. ප්‍රාප්ති මස්තකයට යන්නේ අවිනිශ්චිත නම් නොවෙයි. මෙයින් පෙර වනාහි බුදුරදුන් විසින් දහය දොළහ බැගින් භික්ෂූන් එක තැන වාසය කරන බව නොදක්නා ලදි. ඉක්බිතිව උන්වහන්සේට මෙබඳු සිතක් විය. මේ සමූහ වාසය නම් සසර ආචීර්ණ සමාචීර්ණය. ගංගාවට බැසගත් ජලය හා සමානය. නරකය, තිරිසන් යෝනිය, ප්‍රේතවිෂය, අසුරකාය යන මේ තැන්හි ද මනුෂ්‍යලෝක. දිව්‍යලෝක. බ්‍රහ්මලෝක යන ස්ථානයන්හි ද සමූහ වාසය ආචීර්ණය. යොදුන් දසදහසක් වූ නරකය ඊයම් සුණුවලින් බරිතය. නැළි වැනිය. සතුන් ගෙන් අතරක් නැත. පස්වැදෑරුම් බැඳුම්

කරන ස්ථානයෙහි සතුන්ගේ ප්‍රමාණයක් හෝ පිරිසිඳීමක් හෝ නැත. ආයුධවලින් සිඳීම කරන තැන්හි ද එසේමය. මෙසේ ගණභූතව හෙවත් සමූහ වශයෙන් පැසෙත්.

තිරිසන් යෝනියෙහි එක තුඹසක වේයන්ගේ පිරිසිඳීමක් නැත. එක බිලයක ආදියෙහි ද කුහුඹු ආදීන්ගේ තිරිසන් යෝනියෙහි ද සමූහ විසීම එසේමය. ප්‍රේත නගරයන් ද ගච්ච ආදිය ද අර්ධ යොදුන් වූ ද ප්‍රේතබරිත වෙත්. ප්‍රේතවිෂයෙහි සමූහ වාසය ද මෙසේමය. අසුරභවන යොදුන් දසදහසකි. කණෙහි ගසන ලද හිසෙන් කණ බිලය මෙන් වෙයි. මෙසේ අසුරභවනෙහි සමූහ වාසය වෙයි. මිනිස්ලොව සැවැත්නුවර පණස්හත් ලක්‍ෂයක් කුලයන් ද රජගහනුවර ඇතුළත හා පිටත දහඅට කෝටියක් මනුෂ්‍යයෝ ද විසූහ. මනුෂ්‍යලෝකයෙහි වෙනත් තැන්වලත් සමූහ වාසය මෙසේමය. භූමාටු දෙවියන් ආදි කොට දෙව්ලොවත් බඹලොවත් සමූහ වාසය සමානය. එක එක දිව්‍යපුත්‍රයාට නළඟනෝ කෝටි දෙකහමාරක් වෙත්. කෝටි නවයක් වෙත්. එක්තැනක දසදහසක් බ්‍රහ්මයෝ වාසය කරත්. එහෙයින් සිතීය. මාවිසින් කල්ප ලක්‍ෂයක් අධික කොට ඇති සාරාසංඛෙය්‍යයක් සමූහ වාසය නැති කිරීම පිණිස පාරමී පුරන ලදි. මේ භික්‍ෂූන් ද මෙතැන් පටන් සමූහයා කෙරෙහි බැඳී සමූහයා කෙරෙහි ඇලුණේ විය. භික්‍ෂූහු නුසුදුස්සක් කරත්. උන්වහන්සේ ධර්ම සංවේගය උපදවා නැවත මෙසේ සිතීය. ඉදින් එක ස්ථානයක භික්‍ෂූන් දෙදෙනෙක් නොවිසිය යුතුයැයි ශික්‍ෂාපදයක් පණවන්නට හැකි වන්නේය. ශික්‍ෂාපද පණවන්නෙමියි මෙය හැකි නොවෙයි. ඒකාන්තයෙන් මම මහාසුඤ්ඤතා ප්‍රතිපත්ති නම් සූත්‍රය දේශනා කරමි. ශික්‍ෂාකාමී සර්වකායික ආදාසයක් මෙන් වන්නේය. එහෙයින් යම් එක කාණ්ඩයෙහි නම් ඇති ක්‍ෂත්‍රිය ආදීහු තමන්ගේ වරද දැක එය හැර නිවැරදි අය වෙත්. එසේම මා පිරිනිවි කල්හි අවුරුදු පන්දහසක් කල් මේ සූත්‍රය ආවර්ජනය කොට සමූහයා පහකොට තනිව වාසය කිරීමෙහි ඇලුණු කුලපුත්‍රයෝ සසර දුක ගෙවා කෙළවර කරන්නාහ. බුදුරදුන්ගේ මනදොල පුරන්නාක් මෙන් මේ සූත්‍රය ආවර්ජනය කොට සමූහයා සසර දුක ගෙවා පිරිනිවි කුලපුත්‍රයන්ගේ ගණනක් නම් නැත.

වාලිකපිට්ඨි විහාරයෙහි ආභිධම්මික අභය තෙරුන් වහන්සේ වස්වසන කාලයෙහි බොහෝ භික්‍ෂූන් සමඟ මේ සූත්‍රය සජ්ඣායනය කොට බුදුරදුන් මෙසේ කරවති. අපි කුමක් කරමුදැයි කීය. ඒ සියල්ලෝම ඇතුළු වසෙහි සමූහයා හැර හුදකලා වූවාහු රහත්භාවයට පැමිණියාහ. ගණභේදය නම් මේ සූත්‍රයයි. සටායාති මෙනම් ඇති ශාක්‍යයාගේ විහාරෙහි

Scanned with CamScanner

මේ විහාරය ද නිග්‍රෝධාරාමයේ එක් පෙදෙසක කාළඛේමගේ විහාරය මෙන් කරන ලද්දේ යැයි දත යුතුයි. **චීවරකම්මන්ති** දිරූ කිළිටු වූ සිවුරුවල අණ්ඩ දැමීම් සේදීම් ආදියෙන් කළ දෙය ද සිවුරු පිණිස ලැබූ වස්ත්‍රයන්ගේ මැසීම් කඩකැපීම් ආදි නොකරන ලද විධානය ද පවත්වයි. මෙහි නොකරන ලද සංවිධානය අදහස් කරන ලදි. මිනිස්සු අනඳ තෙරුන්ට සිවුරු සඳහා සළු දුන්හ. එහෙයින් තෙරුන් වහන්සේ බොහෝ භික්ෂූන් ගෙන එහි සිවුරු කර්මය කළේය. ඒ භික්ෂූන් ද උදෑසන ඉදිකටු පාර පෙනෙන කාලයේ පටන් හුන්නාහු නොපෙනෙන කාලයේ නැගිටිත්. ඉදිකටු කර්මය නිමි කල්හි ම අපේ සිවුරු කරන කාලය යැයි සෙනසුන් සංවිධානය කරන්නෙමුයි සංවිධානය නොකළහ. තෙරුන් වහන්සේ සිතූහ. ඒකාන්තයෙන් මේ භික්ෂූන් විසින් සෙනසුන් පිළියෙල නොකරන ලදි. බුදුරදුන් විසින් ම දක්නා ලද්දාහු වෙත් යැයි නොසතුටු විය. ශාස්තෲන් වහන්සේ මනාකොට නිගාකරනු කැමැත්තේ මේ භික්ෂූන්ට උපකාර වන්නෙමියි එහෙයින් මෙය කීහ. මෙහි මේ අදහසයි. ස්වාමීනි, මේ භික්ෂූහු කටයුතුවල ඇලුනෝ නොවෙත්. සිවුරු කෘත්‍ය වශයෙන් මෙසේ වාසය කරයි.

**න ඛො ආනන්‍දාති** ආනන්දයෙනි, කටයුතු කරන කාලයෙහි හෝ වේවා නොකරන කාලයෙහි හෝ වේවා සිවුරු කරන කාලයෙහි හෝ වේවා සිවුරුනොවන දේ කරන කාලයෙහි හෝ වේවා සංගණිකාරාමය භික්ෂූන්ට නොහොබියි. නුඹ උපකාර නොවන තැන උපකාර නොවෙහිය. එහි **සංගණිකාති** ස්වකීය පිරිස හා එක්වීමයි. **ගණොති** නොයෙක් නොයෙක් දෙනාගේ එක්වීමයි. මෙසේ සංගණිකාරාමය වේවා ගණාරාමය හෝ වේවා සියලු ආකාරයෙන් ගණබාහුල්‍යයෙහි ඇලුණු ගණ බැඳුමෙන් බැඳුණු භික්ෂුව නොහොබියි. පසුබත් කාලයෙහි දිවා ස්ථානය ඇමද සෝදන ලද අත් පා ඇතිව මූලකමටහන ගෙන හුදකලා වාසයෙහි ඇලුණු භික්ෂුව බුදුසසුන බබළයි. **නෙක්ඛම්මසුඛන්ති** කාමයෙන් නික්මෙන්නහුගේ සැපය. **පවිවෙකසුඛම්පි** කාමයන්ගේ සංසිඳීම පිණිස පවතින සැපය. රාගාදීන්ගේ වූපසමනය පිණිස පවතින්නේ **උපසමසුඛං** මාර්ග අවබෝධය පිණිස පවතින්නේ **සම්බොධසුඛං නිකාමලාභීති** කැමැති දෙය ලැබීම. **අකිච්ඡලාභීති** දුක නැතිබව ලැබීම. **අකසිරලාභීති** බොහෝ ලැබීම. **සාමයිකන්ති** අර්පිත අර්පිත කාලයෙහි කෙලෙසුන්ගෙන් මිදීම. **කන්තන්ති** මනාප වූ. **චෙතොවිමුත්තින්ති** රූප අරූප සිතේ මිදීමයි. එහෙයින් මෙය කියන ලදි. ධ්‍යාන හතරයි. අරූප සමාපත්ති හතරයි. මෙය **සාමයිකො විමොක්ඛොති** **අසාමයිකන්ති** කාල වශයෙන් කෙලෙසුන්ගෙන් මිදීම නොවෙයි. අතිශයින්

මිදීම ලෝකෝත්තර බවයි. එහෙයින් කියන ලදි. ආර්යමාර්ග හතරයි. ශ්‍රමණඵල හතරයි. මේ සාමයික නොවන විමෝක්ෂයයි. **අකුප්පන්ති** කෙලෙසුන්ගෙන් කෝප නොවීමයි. මෙපමණකින් කුමක් කියන ලද ද? ගණසංසණිකාරාමයෙහි ඇලුණු භික්ෂුව ගණබන්ධනයෙන් බැඳුණේය. ලෞකික ගුණයක් හෝ ලෝකෝත්තර ගුණයක් හෝ උපදවන්නට නොහැක. සමූහයා හැර හුදකලාව විසීමෙන් හැකිය. එසේම විපස්සී බෝසත් තෙමේ අසූහාරදහසක් පැවිද්දන් පිරිවරණ ලද්දේ වර්ෂ හතක් හැසිරෙන්නේ නමුදු සර්වඥතා ගුණය උපදවන්නට නොහැකි විය. සමූහයා හැර දවස් හතක් හුදකලාව හැසිරුණේ බෝමැඩට පැමිණ සර්වඥතා ගුණය ඉපදවීය. අපගේ බෝධිසත්වයන් ද පස්වග මහණුන් සමඟ අවුරුදු හයක් හැසිරුණේ සර්වඥතා ගුණය උපදවන්නට නොහැකි විය. ඔවුන් ගිය කල්හි හුදකලාව බෝමැඩට පැමිණ සර්වඥතා ගුණය ඉපදවීය. මෙසේ සංගණිකායෙහි ඇලීමෙන් ගුණයක් ලබා ගැනීමට නොහැකි බව දක්වා දූන් දෝෂයාගේ උප්පත්තිය දක්වන්නේ **නාහං ආනන්‍දාති** යනාදිය කීය. එහි **රූපන්ති** ශරීරයයි. **යත්‍ථ රත්තස්සාති** යම් රූපයක රාග වශයෙන් ඇලුණහුගේ **න උප්පජ්ජෙය්‍යුන්ති** යම් රූපයක ඇලුණු අයට නො උපදින්නේය. එම රූපය නො බලන්නෙමි. එකල සැරියුත් මුගලන් දෙදෙනා බුදුරදුන්ගේ ශ්‍රාවකබවට පැමිණීම නම් අන්පරිද්දකින් සංජයගේ මෙන් උපාලි ගෘහපතියාගේ අන්පරිද්දකින් නාථපුත්‍රගේ මෙන් පියජාතික සූත්‍රයෙහි සිටුවරයා ආදීන්ට මෙන් උපදින්නාහ. **අයං බො පනානන්‍දාති** කිනම් අනුසන්ධියක් ද? ඉදින් යම්කිසි දුර්වල බුද්ධි ඇති අලුත පැවිදි වූවෙක් කියන්නේය. බුදුරදුන් කුඹුරට පිවිසි ගවයන් මෙන් අපව සමූහයාගෙන් බැහැර කරයි. හුදකලාවම යොදවයි. තමන් වනාහි රාජ රාජ මහාමාත්‍යයන් පිරිවරා වාසය කරයි.

උන්වහන්සේගේ වචනයට අවකාශ නැතිවීම පිණිස සක්වළ කෙළවර දක්වා ඇති පිරිස් මැද සිටියත් බුදුරදුන් හුදකලාවමැයි දක්වන්නට මේ දේශනාව පටන් ගත්තේය. එහි **සබ්බනිමිත්තානන්ති** රූපාදි සියලු නිමිතිවල. **අජ්ඣත්තන්ති** අධ්‍යාත්මික විෂය. **සුඤ්ඤතන්ති** ශූන්‍යඵල සමාපත්තිය. **තත්‍ර චෙති** උපයෝගාර්ථයෙහි සත්තමියයි. එයයැයි කියන ලදි. නැවත **තත්‍රාති** ඒ පිරිස මැද සිටියේ. **විවෙකනින්නෙනාති** නිවනට නැමුණු. **ඛ්‍යන්ති භූතෙනාති** ආසවට්ඨානීය ධර්මයන්ගෙන් වෙන්වුණු. **උය්‍යොජනිකපටිසංයුත්තන්ති** නුඹලා යව්. මෙසේ යවන වචනයෙන් යුක්ත. කොයි වේලාවක බුදුරදුන් මෙසේ කියයි ද? පසුබත් කිස වේලාවෙහි හෝ පෙරබත් කිස වේලාවෙහි හෝ බුදුරදුන් පසුබත් කාලයෙහි ගඳකිළියෙහි

සිංහසෙය්‍යාව කොට නැගිට ඵලසමවතට පැමිණ හිඳියි. එකල බණ ඇසීමට පිරිස රැස්වෙයි. ඉක්බිතිව බුදුරදුන් කල් දැන ගඳකිළියෙන් නික්මී උතුම් බුද්ධාසනයට වැඩියේ ධර්මය දේශනා කොට බෙහෙත් තෙලපාකය ගන්නාක් මෙන් කාලය නොඉක්මවා විවේකයට නැමුණු සිතින් පිරිස පිටත්කර යවයි. වාසෙට්ඨයෙනි, පළමු යාමෙහි රාත්‍රිය සිත්කළුය. දැන් කාලය සිතව් යැයි මෙසේ පිටත්කර යවයි. බුදුරදුන්ට බෝධියට පැමිණි තැන් පටන් ද්වි පංච විඥානයෝ නිවනට නැමුණාහ. **තස්මාතිහානන්දාති** යම්හෙයකින් ශූන්‍යතා විහාරය ශාන්ත ද ප්‍රණීත ද එහෙයිනි. **අජ්ඣත්තමෙවාති** ගෝචර අධ්‍යාත්මය. **අජ්ඣත්තං සුඤ්ඤතන්ති** මෙහි නියත අධ්‍යාත්මය තමාගේ පංචස්ඛන්ධයෙහි උපදීය යන තේරුමයි. **සම්පජානො හොතීති** කමටහනට නොපැමිණ දැනගන්නා සිහි ඇති. **බහිද්ධාති** අනුන්ගේ පංචස්ඛන්ධයන්හි. **අජ්ඣත්තබහිද්ධාති** කාලයකින් අධ්‍යාත්මයයි. කාලයකින් බාහිරයි. **ආනඤ්ජාති** උභතෝ භාගයෙන් මිදුණේ වන්නෙමියි ආනංජ අරූප සමාපත්තිය සිහි කරයි.

**තස්මිඤ්ඤෙව පුරිමස්මින්ති** පාදක ධ්‍යානය සඳහා කියන ලදි. නුපුහුණු පාදක ධ්‍යානයෙන් නැගිටි අයගේ අධ්‍යාත්මික ශූන්‍යතාව සිහිකරමින් සිටින අයගේ සිතෙහි මනස්කාරය සිද්ධ නොවේ. එයින් අන්‍ය සිත්හි කෙසේදැයි පිටත සිහිකරයි. **තථාපි න පක්ඛන්දතීති** ඉක්බිතිව කාලයකින් තම සිතෙහි කාලයකින් අනුන්ගේ සිතෙහි ද කෙසේදැයි අධ්‍යාත්ම බාහිර වශයෙන් සිහිකරයි. එහිද නොපැකිලෙයි. එයින් උභතෝභාග විමුත්තියට හේතු කැමැති වූයේ අරූප සමාපත්තිය යනු කෙසේදැයි ආනංජය සිහි කරයි. එහිද නොපැකිලෙයි දැන් මාගේ සිත නොපැකිලෙන්නේ යැයි වීර්යයෙන් උපට්ඨකාදීන්ගේ පසුපසින් නොහැසිරිය යුතුයි. පාදක ධ්‍යානය ම මැනවින් නැවත නැවත සිහිකළ යුතුයි. **තස්මිඤ්ඤෙවාති** යනාදිය කීය. දැන් මෙසේ පිළිපන්නහුට යමක් යමක් සිහිකරයි ද ඒ ඒ තැන්හි මනස්කාරය වේයැයි දක්වන්නේ **පක්ඛන්දතීති** යනාදිය කීය. **ඉමිනා විහාරෙනාති** මේ සමථ විදර්ශනා විහරණයෙන් **ඉතිහ තත්‍ථසම්පජානොති** මෙසේ සක්මන් කරන්නේ ද එම කමටහනෙහි සිදුවන කළ මාගේ කමටහන සිදුවීය යැයි දන්නේ වෙයි. **සයතීති** සයනය කරයි. මෙහි කිසියම් කාලයක් සක්මන් කොට දැන් මෙපමණක් කල් සක්මන් කරන්නට හැක්කෙමියි දැන ඉරියව් නොගෙවා සිටිය යුතුයි. සියලු වාරයන්හි මේ ක්‍රමයයි. **න කථෙස්සාමීති** මෙහි මෙසේ යැයි නො කියන්නෙමියි දැනීමෙන් එහි සම්පජානකාරී වෙයි. දෙවැනි වාරයෙහි ද මෙවැනි කථාවක් කියමියි දැනීමෙන් සම්පජානකාරී වෙයි. මේ භික්ෂුවගේ සමථ විදර්ශනාව අළුත්ය. එහි ආරක්ෂාව පිණිස සප්පාය හතක් කැමැති වන ලද්දාහ.

ආවාස, ගෝචර, භස්ස, පුද්ගල, භෝජන, සෘතු, ඉරියව් යන සප්පායන් සේවනය කළ යුතුය.

ඒවා දක්වීම පිණිස මෙය කියන ලදි. විතර්ක විචාරයන්හි අවිතර්කය ද විතර්කය ද දැනීමෙන් මනාකොට දැනීමෙන් දතයුතුයි. මෙසේ විතර්කයාගේ ප්‍රහාණයෙන් මාර්ග දෙක කියා දැන් තුන්වැනි මාර්ගයේ විදර්ශනාව කියන්නේ **පඤ්ච ඛො ඉමෙ ආනන්ද කාමගුණාති** යනාදිය කීය. **ආයතනෙති** ඒ කාමගුණයන්හි ම කිසියම් ක්ලේශයන්ගේ ඉපදීමට හේතුවෙක්හි. **සමුදාචාරොති** ප්‍රහීන නොවූ කෙලෙස් ඇති. **එවං සන්තන්ති** මෙසේ විද්‍යමාන වූ. **සම්පජානොති** කමටහනෙහි නොපැමිණීම දන්නේ. දෙවැනි වාරයෙහි එහි **සන්තමෙතන්ති** එසේ ඇති කල්හි මෙය. **සම්පජානොති** කමටහනට පැමිණීම දන්නේ.

පංචකාම ගුණයන්හි මාගේ ඡන්ද රාගය ප්‍රහීන වූයේ ද නොවූයේ දැයි සළකන්නේ පහනොවූ බව දැන වීර්ය ගෙන එය අනාගාමී මාර්ගයෙන් නැති කරයි. එයින් මාර්ගාන්තරයෙන් ඵලයෙන් නැගිට ප්‍රත්‍යවේක්ෂා කරන්නේ ප්‍රහීනබව දනියි. එහි දැනීමෙන් මනාකොට දන්නේ යැයි කියන ලදි. දැන් අර්හත් මාර්ගයේ විදර්ශනාව කියන්නේ **පඤ්ච ඛො ඉමෙ ආනන්ද උපාදානක්ඛන්ධාති** යනාදිය කීය. එහි **සො පහීයතීති** රූපයෙහි වෙම් මානය වෙම් ඡන්දය වෙමියි යන අනුසයන් හරියි. එසේම වේදනාදියෙහි ද දැනගන්නා බව කියන ලද ක්‍රමයෙන් ම දත යුතුයි. **ඉමෙ ඛො තෙ ආනන්ද ධම්මාති** යට කියන ලද සමථ විදර්ශනා මාර්ග ඵල ධර්මයන් සඳහා කීය. **කුසලායතිකාති** කුසලයෙන් ආවා වූ. කුසලයෝ කුසල් ද කුසලයතික ද වෙත්. කවරේද යත්? ප්‍රථමධ්‍යාන කුසලය, ද්විතීයධ්‍යාන කුසලය ද කුසලායතිකය ද ආකිඤ්චඤ්ඤායතන කුසලය, නේවසංඥානාසංඥායතන කුසලය ද කුසලායතිකය ද සෝවාන් මාර්ග කුසලය ද කුසලායතිකය ද -පෙ- අනාගාමී මාර්ග කුසලය ද අර්හත් මාර්ග කුසලය ද කුසලායතිකය ද වෙයි. එසේම ප්‍රථමධ්‍යානය කුසලයයි. ඒ හා යුක්ත වූ කුසල ධර්මයන් කුසලායතිකයයි. -පෙ- අර්හත් මාර්ගය කුසලයයි. ඒ හා යුක්ත වූ කුසල ධර්මයන් කුසලායතිකයයි.

**අරියාති** කෙලෙස් නැති. පිරිසිදු. **ලොකුත්තරාති** ලෝකයෙහි උතුම් ය. විශිෂ්ටය. **අනවක්කන්තා පාපිමතාති** පාපී වූ මාරයා විසින් නොමඩින්නාහ. විදර්ශනා පාදකය. අෂ්ට සමාපත්තීන්ට නොපැමිණ සිටියා වූ භික්ෂුවගේ සිත මාරයා නොබලයි. මේ අරමුණ නිසා පවතීයැයි දැනගැනීමට නොහැකිය. එහෙයින් **අනොක්කන්තාති** යැයි කියන ලදි. **තං කිං මඤ්ඤසීති**

මෙය කුමක් නිසා කීයේ ද? සමූහයා කෙරෙහි ද එක ආනිසංසයක් ඇත. එය දැක්වීමට මෙය කීය. **අනුබන්ධිතුන්ති** අනුවයාමට, අනුව හැසිරීමට **න බො ආනනේදාති** මෙහි කුමක්හෙයින් බුදුරදුන් මහණෙනි, සුතවත් ආර්යශ්‍රාවක තෙමේ අකුසල් දුරු කරයි. කුසල් වඩයි. වැරදි සහිත දෙය දුරු කරයි. නිවැරදි දෙය වඩයි. පිරිසිදු ආත්මය පරිහරණය කෙරේ යැයි බහුශ්‍රැත තෙමේ පංචායුධයෙන් යුක්ත යෝධයෙක් මෙන් කරන ලද්දේ. යම්හෙයකින් ඔහු සූත්‍ර පර්යාප්තිය ඉගෙනගෙන ඊට සුදුසු අනුලොම් ප්‍රතිපදාව නොපිළිපදියි. ඔහුට එය ආයුධයක් නොවේ. යමෙක් පිළිපදියි ද ඔහුට වෙයි. එහෙයින් මෙය සඳහා ලුහුබඳින්නට සුදුසු නොවේයැයි දක්වන්නේ **න බො ආනනේදාති** යි කීය. දැන් යමක් සඳහා ලුහුබැඳිය යුතු ද එය දක්වන්නට **යා ච ඛොති** යනාදිය කීය. මෙසේ මේ සූත්‍රයෙහි තුන් තැනක දස කථාවස්තූන් ආවාහ. **ඉති එවරූපිං කථෙස්සාමීති** කැප අකැප වශයෙන් ආවාහ. **යදිදං සුත්තං ගෙය්‍යන්ති** මෙහි සූත්‍ර පර්යාප්ති වශයෙන් ආවාහ. මේ ස්ථානයෙහි සම්පූර්ණ වශයෙන් ආවාහ. එහෙයින් මේ සූත්‍රයෙහි දස කථාවස්තූන් කියන්නහු විසින් මේ ස්ථානයේ සිට කිව යුතුයි. දැන් යම්හෙයකින් සමහරෙකුට එක එක වාසය යැයි තේරුමයි. නොයෙදෙයි. එහෙයින් ඒ සඳහා එක්වීමෙහි ආදීනව දක්වන්නේ **එවං සනෙත බො ආනන්‍දාති** යනාදිය කීය. එහි **එවං සනෙතති** මෙසේ එක්ව වසන බව ඇති කල්හි. **සත්ථාති** බැහැර වූ තීර්ථ කරන ශාස්තෘය. **අන්වා වට්ටන්තීති** අනුව එළඹෙත්. **මුච්ඡන්තිකාමයතීති** මූර්ජන තෘෂ්ණාව පතයි. පවත්වයි යන තේරුමයි. **ආචරියූපද්දවෙනාති** තමාගේ ඇතුළත උපන් කෙලෙස් උවදුරෙන් ගුරුවරයාගේ උවදුරයි. සෙසු උවදුරුවල ද මේ ක්‍රමයමයි. **අවධිංසුන්ති** ඔහු නැසූහ. මෙයින් ඔහුගේ ගුණ සිහිකිරීම කියන ලදි. **විනිපාතායාති** මනාකොට නැසීම පිණිස කුමක්හෙයින් බඹසර උවදුරු දුක් විපාක යැයි ද කර්කශ විපාක යැයි ද විනිපාතය පිණිස පවතීය යැයි කියන ලදි. බාහිර පැවිද්ද අල්ප ලාභයි. එහි මහත් වූ ඉපදිය යුතු ගුණයක් නැත. අෂ්ට සමාපත්ති පංච අභිඥා මාත්‍රයක් ම වෙයි. මෙසේ යම්පරිදි බූරුවාගේ පිටෙන් වැටුනහුට මහත් දුකක් නොවෙයි. ශරීරයේ පස් තැවරුනා පමණක් වෙයි. මෙසේ බාහිර ශාසනයෙහි ලෞකික ගුණ මාත්‍රයෙන් පිරිහෙයි. එයින් පළමු උවදුරු දෙක මෙසේ නොකියන ලදි. ශාසනයෙහි පැවිද්ද මහත් ලාභයකි. එහි සතර මාර්ගයන් සතර ඵලයන් ද නිවන ද අවබෝධ කළයුතු මහත් ගුණයෝය. මෙසේ යම් ආකාරයෙන් දෙපාර්ශවයෙන් පිරිසිදු වූ ක්ෂත්‍රිය කුමාරයෙක් උතුම් ඇතු පිටට නැග නගරයෙහි හැසිරෙන්නේ ඇතු පිටින් වැටුණේ මහත් දුකට පැමිණෙයි. මෙසේ සසුනෙන් පිරිහෙන්නා නවලෝකෝත්තර ගුණයන්ගෙන් ද පිරිහෙයි. එහෙයින් මේ බඹසර උවදුර මෙසේ කියන ලදි.

**තස්මාති** යම්හෙයකින් සෙසු උවදුරුවලින් බඟසර උවදුර අතිශයින් දුක් විපාක ද යම්පරිදි සතුරු ප්‍රතිපත්තිය බොහෝ කලක් අහිත පිණිස දුක් පිණිස පවතියි. මෛත්‍රී ප්‍රතිපත්තිය හිත පිණිස වේ. **තස්මාති** මෙසේ මත්තෙහි වූ ද යටින් වූ ද අර්ථය හා යෙදිය යුතුය. **මෙත්තවතායාති** මෛත්‍රී පිළිවෙතින්. **සපත්තවතායාති** වෛර පිළිවෙතින්. **වොක්කම්ම ච සත්ථුසාසනාති** දුෂ්කෘත දුර්භාසිත මාත්‍රයක් ද දූන දූන ඉක්මවන්නේ වොක්කම්ම පැවැත්ම නම්. එයම නොඉක්මවන්නේ නවොක්කම්ම පැවැත්ම නම්. **න බො අහං ආනන්ද තථා පරක්කමිස්සාමීති** මම නුඹලා කෙරෙහි එසේ පිළිනොපදින්නෙමි. **ආමකෙති** නොපැසුණු. **ආමකමත්තෙති** අමු වූ නොවේලුණු භාජනයෙහි. කුඹල්තෙමේ අමු නොවේලුණු බඳුන අත්දෙකෙන්ම නොබිඳුවයි වහා ගනියි. කුඹල්තෙමේ යම්සේ එහි පිළිපදී ද මම නුඹලා කෙරෙහි එසේ පිළිනොපදිමි. **නිග්ගය්හ නිග්ගය්හාති** එක්වරක් අවවාද කොට නිශ්ශබ්ද නොවෙමි. නිග්‍රහකොට නිග්‍රහ කොට නැවත නැවත අවවාද කරන්නෙමි. අනුශාසනා කරන්නෙමි. **පවය්හ පවය්හාති** දොස් උල්පව උල්පවා. යම්සේ වේලුණු භාජනවල කුඹල්තෙමේ සිඳුණු බිඳුණු තැන් උල්පවා එකට වේලුණු ඒවා මෙන් කොට ගනියි ද මෙපරිද්දෙන් මම ද උල්පව උල්පවා නැවත නැවත අවවාද කරන්නෙමි. අනුශාසනා කරන්නෙමි. යමක් සාර ද එය සිටින්නේය. මෙසේ මාවිසින් නුඹලාට අවවාද කරමින් සිටිය දී යමක් මාර්ග ඵලසාර ද එය සිටියි. තවද ලෞකික ගුණයෝ ම මෙහි සාර යැයි අදහස් කරන ලදි. සෙස්ස සියලු තැන්හිම ප්‍රකටය.

මහාසුඤ්ඤතා සූත්‍ර වර්ණනාව නිමි.

# 3.4.3

එවමෙමසුතනති අච්ඡරියධම්ම සූත්‍රය මා විසින් මෙසේ අසන ලදි. එහි යත්‍රහි නාමාති ආශ්චර්ය අර්ථයෙහි නිපාතයයි. යම් තථාගතයන් වහන්සේ නමක් යන තේරුමයි. ජිනනපපඤ්චෙති මෙහි ප්‍රපංච නම් තෘෂ්ණා මාන දෘෂ්ටි යන මේ කෙලෙස් තුනයි. ජිනනවටුමෙති මෙහි වටුම නම් කුසල් අකුසල් කර්ම වැටයි කියයි. පරියාදිනනවටෙටති එයට ම පර්යාය වචනයයි. සබබදුකඛවීතිවවතෙතති සියලු විපාක වෘතයැයි කියන ලද දුක ඉක්ම වූ. ජානිසසතීති මේ යත්‍ර යනු නිපාත වශයෙන් අනාගත වචනයකි. මෙහි තේරුම අතීත වශයෙන් දත යුතුයි. භාග්‍යවතුන් වහන්සේ ඒ බුදුරදුන් සිහි කළේය. දැන් සිහි නො කරන්නේ ය. එවං ජචචාති විපසසී ආදීහු ක්‍ෂත්‍රිය ජාතියහ. කකුසඳ ආදීහු බ්‍රාහ්මණ ජාතියහ. එවං ගොතතාති විපස්සි ආදීහු කොණ්ඩඤ්ඤ ගෝත්‍රිකයෝය. කකුසඳ ආදීහු කාශ්‍යප ගෝත්‍රිකයෝය. එවං සීලාති ලෞකික ලෝකෝත්තර සීලයෙන් මෙසේ සීලයයි. එවං ධමමාති එහි සමාධි පාක්‍ෂික වූ ධර්මයෝ අදහස් කරන ලදි. ලෞකික ලෝකෝත්තර සමාධියෙන් මෙසේ සමාධිය යැයි තේරුමයි. එවං පඤඤාති ලෞකික ලෝකෝත්තර ප්‍රඥාවෙන් මෙසේ නුවණ ඇති. එවං විහාරීති මෙහි වනාහි යට බෝධිපාක්‍ෂික ධර්මයන්ගේ ගන්නා ලද හෙයින් විහරණය ගන්නා ලද්දේමය. නැවත කුමක් නිසා ගන්නා ලද දෙය ගනී ද යත්? මෙය නොගන්නා ලදි. මෙය නිරෝධ සමාපත්තිය ප්‍රකාශ කිරීම සඳහා ය. එහෙයින් මෙසේ නිරෝධ සමාපත්ති විහරණය යන මෙය මෙහි තේරුමයි. එවං විමුතතාති මෙහි මෙසේ විෂ්කම්භන විමුක්තිය, තදංග විමුක්තිය, සමුච්ඡේද විමුක්තිය, පටිප්පස්සද්ධි විමුක්තිය, නිස්සරණ විමුක්තිය යැයි විමුක්තිය පස් ආකාරයයි. එහි අෂ්ටසමාපත්තීන් තෙමේම විෂ්කම්භිත නීවරණයන්ගෙන් මිදුණු හෙයින් විෂ්කම්භන විමුක්තිය යන නමට පැමිණෙත්. අනිත්‍යානුපස්සනාව ආදී අනුපස්සනා හත තෙමේම එය එයට පච්චනික අංග වශයෙන් හරින ලද නිත්‍ය සංඥාදියෙන් මිදුණු හෙයින් තදංග විමුක්තිය යන නමට පැමිණෙත්. ආර්ය මාර්ග හතර තෙමේම සිඳන ලදුව ක්ලේශයන්ගෙන් මිදුණු හෙයින් සමුච්ඡේද විමුක්තිය යන නමට පැමිණෙත්. ශ්‍රාමණ්‍ය ඵල හතර මාර්ගානුභාවයෙන් ක්ලේශයන්ගේ ප්‍රතිපස්සද්ධියෙන් උපන් හෙයින් පටිප්පස්සද්ධි විමුක්තිය යන නමට පැමිණෙත්. නිවන සියලු ක්ලේශයන්ගෙන් පහ වූ හෙයින් දුරසිටි හෙයින් නිස්සරණ විමුක්තිය යන නමට ගියේය. මෙසේ මේ පංච විමුක්තීන්ගේ වශයෙන් මෙසේ මිදුණා යැයි මෙහි තේරුම දතයුතුය.

**තස්මා තිහාති** යම්හෙයකින් එය බුදුවරු ආශ්චර්ය යැයි කියයි ද එහෙයින් එය බොහෝසෙයින් වැටහෙත්වා. බුදුරදුන්ගේ ආශ්චර්ය අද්භූත ධර්මයයි. **සතො සම්පජානොති** මෙහි මනුෂ්‍ය ලෝකයෙහි ද දිව්‍ය ලෝකයෙහි ද යන සම්පජඤ්ඤ දෙකයි. වෙස්සන්තර ජාතකයෙහි බමුණාට දරුවන් දෙන්නා දී දෙවන දිනයෙහි ශක්‍රයාට දේවිය දී ශක්‍රයා විසින් පැහැදී දෙන ලද වර අට ගන්නේ.

මම මෙයින් මිදී ස්වර්ගගාමී විෂයෙහි උපදිමි. ඉන්පසු නිර්වාණගාමී වෙමි. මේ අටවැනි උතුම්ම වරය ය. මෙසේ තුසිත භවනෙහි මාගේ ප්‍රතිසන්ධිය වේවයි වරයක් ගත්තේය. එතැන්පටන් තුසිත භවනෙහි උපදිමියි දනියි. මේ මනුෂ්‍ය ලෝකයෙහි සම්පජඤ්ඤයයි. වෙස්සන්තර ආත්මභාවයෙන් චුතව තුසිත භවනෙහි ඉපිද උපන්නෙමියි දැන ගත්තේය. මේ දිව්‍යලෝක සම්පජඤ්ඤයයි. කිමෙක්ද? සෙසු දෙවියෝ දනිත් ද? නොදනිත් ද? ඒ දෙවියෝ උයන් විමාන කල්පවෘක්ෂ බලා දිව්‍ය නාටක තූර්ය ශබ්දයෙන් සතුටු වී නිදුකාණෙනි, මේ දිව්‍ය ලෝකයයි නුඹ මෙහි උපන්නාහු යැයි සිහිකරන ලදුව දනිත්. බෝධිසත්වයන් වහන්සේ පළමු ජවන වාරයෙහි නොදනියි. දෙවැනි ජවන වාරයෙහි පටන් දනියි. මෙසේ උන්වහන්සේගේ දැනීම අන්‍යයන්ට අසාධාරණ වෙයි. **අට්ඨාසීති** මෙහි කිසියම් අනෙත් දෙවියෝ එහි සිට සිටියාහු යැයි දනිත්. ඔවුහු ද්වාර හයෙහි බලවත් ඉෂ්ටාරම්මණයෙන් මඩින ලද්දාහු සිහිය අත්හැර තමාගේ කාපු බීපුබව ද නොදන්නාහු ආහාර සිඳ ගැනීමෙන් කලුරිය කරත්. බෝධිසත්වයන් වහන්සේට එබඳු අරමුණක් ඇත්තේ ද? නැත්තේ ද? උන්වහන්සේ සෙසු දෙවියන් කරුණු දහයකින් අභිබවා සිටියි. අරමුණෙන් තමා මඩින්නට නොදෙයි. ඒ අරමුණ අභිබවා සිටියි. එහෙයින් කියන ලදි. **සතො සම්පජානො ආනන්ද බොධිසත්තො තුසිතෙ කායෙ අට්ඨාසීති යාවතායුකන්ති** කුමක්හෙයින් ඉතිරි ආත්ම භාවයන්හි ආයුෂ ඇතිතාක් නොසිටී ද? එසේය. නොසිටියි. දීර්ඝ ආයුෂ ඇති දිව්‍ය ලෝකයෙහි උපන්නේ එහි පාරමිතා සම්පූර්ණ කිරීමට නොහැකිය. ඇස් පියාගෙන අධිමුක්ති කාලක්‍රියාව කොට මිනිස් ලොව උපදියි. මේ කලුරිය කිරීම අන්‍යයන්ට නොවෙයි. එකල්හි නුදුන් දානයක් නැත. නොරකින ලද සීලයක් නම් නැත. සියලු පාරමිතා ධර්මයන් පුරන ලද බැවින් ආයුෂ ඇතිතාක් සිටියේය.

**සතො සම්පජානො තුසිතා කායා චවිත්වා මාතුකුච්ජිං ඔක්කමතීති** මෙසේ පළමුවෙන් සියලු පාරමිතා පුරා එකල්හි බෝසත් තෙමේ ආයුෂ ඇතිතාක් සිටියේය. දෙවියන්ට වනාහි මිනිසුන්ගේ ගණන් වශයෙන් දැන්

හත් දවසකින් චුතිය වන්නේ යැයි පූර්වනිමිති පහක් උපදිත්. මල් මැලවෙයි. වස්ත්‍ර කිලිටි වෙයි. කිහිලිවලින් දහඩිය ගලත්. ශරීරය දුර්වර්ණ වෙයි. දෙවිතෙමේ දෙව් ආසනයෙහි නොසිටියි. එහි මාලා නම් පිළිසිඳ ගන්නා දවසේ පළඳින ලද මල්ය. ඒවා හැට හත්දාහක් අධික කොට ඇති පණස්හත් කෝටියක් අවුරුදු මලානික නොවී එකල මැලවෙයි. වස්ත්‍ර ද මෙම ක්‍රමයයි. මෙපමණ කලක් දෙවියන්ට ශීතයක් ද උණුසුමක් ද නොවෙයි. ඒ කාලයෙහි ශරීරයෙන් බින්දු බින්දු වශයෙන් දහඩිය ගලත්. මෙතෙක් කාලයක් ඔවුන්ගේ ශරීරයෙහි කැඩුණු බිඳුණු ආදී වශයෙන් දුර්වර්ණ බවක් නොපෙනෙයි. දෙව් දූවරු දහසය වයසට පැමිණියවුන් මෙන් ද දෙව් පුතුන් විසි වයස් පැමිණියවුන් මෙන් ද වැටහෙයි. මැරෙණ කාලයෙහි ඔවුන්ගේ ශරීරය ක්ලාන්ත ස්වභාව වෙයි. මෙතෙක් කල් ඔවුන්ට දෙව්ලොව කෙරෙහි කළකිරීමක් නම් නැත. මැරෙන කාලයෙහි ඔවුන් තමන්ගේ ආසනයෙහි නොඇලෙත්. මේ වනාහී පූර්වනිමිතියි.

යම්සේ ලෝකයෙහි මහා පින් ඇති රාජ රාජ මහාඅමාත්‍යාදීන්ට උල්කාපාත භූමිකම්පා චන්ද්‍රග්‍රහණ ආදී නිමිති පෙනෙත් ද සියල්ලන්ට ම නොපෙනෙත්. එපරිද්දෙන් මහේශාක්‍ය දෙවියන්ටම පෙනෙත්. සියල්ලන්ට ම නොපෙනෙත්. යම්සේ මිනිසුන් අතරෙහි පූර්වනිමිති නැකැත් කියන්නෝ ම දනිත් ද සියලු දෙනාම නොදනිත්. එසේම ඒවා ද සියලු දෙවියෝ ම නොදකිත්. පණ්ඩිතයෝ ම දනිත්. එහි යම් දිව්‍ය පුත්‍රයෙක් මඳ කුසල කර්මයෙන් උපන්නාහු ද ඔවුහු එහි උපන් කල්හි දැන් කවරෙක් දනී ද කොහි උපන්නහුදැයි බිය වෙත්. යම්කෙනෙක් මහත් පින් ඇත්තාහු ද ඔවුහු අප විසින් දන් දෙන ලදි. සිල් රකින ලදි. භාවනා වඩන ලදි. මතු දෙව්ලොව සැප අනුභව කරන්නෙමියි බිය නොවෙත්. බෝසත් තෙමේ ද ඒ පූර්වනිමිති දැක දැන් ඊළඟ ආත්ම භාවයේ දී බුදුවන්නෙමියි බිය නොවීය. එකල උන්වහන්සේට ඒ නිමිති පහළ වූ කල්හි දසදහසක් සක්වළ දෙවියෝ රැස්ව නිදුකාණෙනි, නුඹ වහන්සේ දස පාරමිතාවන් පුරන්නහු විසින් ශක්‍ර සම්පත්තිය මාර සම්පත්තිය බ්‍රහ්ම සම්පත්තිය චක්‍රවර්ති සම්පත්තිය ප්‍රාර්ථනා නොකරන ලදි. ලෝකයා එතර කරනු පිණිස බුද්ධත්වය ප්‍රාර්ථනා කරමින් පුරන ලදහ. නිදුකාණෙනි, ඔබ වහන්සේට බුදුවීමට දැන් සුදුසු කාලය යැයි බුදුවනු මැනවයි ඉල්ලත්. එකල බෝසත් තෙමේ දෙවියන්ට පිළිතුරක් නොදී කාලය දීපය දේශය කුලය මව ආයුෂ පිරිසිඳීම් වශයෙන් පස්මහබැලුම් බැලීය. එහි කාලය ද නොකාලය දැයි පළමුව කාලය බැලීය. එහි අවුරුදු ලක්ෂයකින් මතු වැඩෙන ආයුෂ කාලය කාලය නම් නොවෙයි. කුමක්හෙයින් ද? ඒ කාලයෙහි සත්වයන්ගේ ජාති ජරා මරණයෝ

නොපෙනෙත්. බුදුවරුන්ගේ ධර්ම දේශනා නම් ත්‍රිලක්‍ෂණයන්ගෙන් මිදීමක් නම් නැත. ඔවුන්ට අනිත්‍ය දුක්ඛ අනාත්ම යැයි කිව්වත් මේ කුමක් කියන්නේදැයි ඇසීමට ඇදහීමට නොසිතත්. එහෙයින් අවබෝධ නොවෙත්. එය නැතිකල්හි ශාසනය අනිර්යානික වෙයි. එහෙයින් එය අකාලයයි. අවුරුදු සීයෙන් අඩු කාලය ද කාලය නොවෙයි. කුමක් හෙයින් ද? එකල සත්ත්වයෝ උස් කෙලෙස් ඇත්තාහු වෙත්. උස් කෙලෙස් ඇති අයට දෙන ලද අවවාද නිසි තැන නොසිටියි. දියෙහි ඇඳි ඉරක් මෙන් වහා පහවෙයි. ඒනිසා එය ද කාලය නොවෙයි. ලක්‍ෂයෙහි පටන් යට සියයේ පටන් උඩ ආයු කාලය අකාලය නම් වෙයි. එකල්හි අවුරුදු සියයේ කාලය වෙයි. එකල බෝසත් තෙමේ ඉපදිය යුතු කාලය යැයි දැක්කේය.

ඉක්බිතිව දීපය බලන්නේ පිරිවර සහිතව සතර දීපයන් බලා දීප තුනක බුදුවරු නූපදිති. දඹදිව ම උපදිතියි දීපය දැක්කේය. එයින් දඹදිව නම් යොදුන් දස දහසක් පමණ මහත්ය. කවර ප්‍රදේශයක බුදුවරු උපදිත් දැයි දේශය බලන්නේ මධ්‍යම ප්‍රදේශය දැක්කේය. මධ්‍යම ප්‍රදේශය නම් බටහිර දිශාවෙන් කජංගල නම් නියම් ගමය ආදී ක්‍රමයෙන් විනයෙහි කියන ලද්දේය. එය දිගින් යොදුන් තුන්සියයකි. පළලින් දෙකහමාරකි. වටින් යොදුන් නවසියයකි. මේ ප්‍රදේශයෙහි බුදුවරු, පසේබුදුවරු, අග්‍රශ්‍රාවකයන්, අසූ මහාශ්‍රාවකයන්. සක්විති රජවරුන්. අනෙත් මහේශාක්‍ය ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණ ගෘහපති මහාසාලයෝ උපදිති. මෙහි මේ කිඹුල්වත් නම් නුවර මා ඉපදිය යුතුයැයි නිෂ්ටාවට ගියේය. ඉක්බිතිව කුලය බලන්නේ බුදුවරු නම් ලෝක සම්මත කුලයෙහි උපදිත්. දැන් ක්‍ෂත්‍රිය කුලය ලෝක සම්මතයි. එහි උපදින්නෙමි. සුද්ධෝදන නම් රජු මාගේ පියා වන්නේ යැයි කුලය දැක්කේය. ඉක්බිතිව මව බලන්නේ බුද්ධමාතාව නම් ලොල් වූ සුරා ධූර්තයෙක් නොවෙයි. කල්ප ලක්‍ෂයක් පුරන ලද පාරමිතා ඇති ජාතියේ පටන් පන්සිල් නොකඩන ලද්දී වෙයි. මේ මහාමායා දේවිය නම් මෙබඳුය. මැය මාගේ මව වන්නීය. ඇයට ආයුෂ කොපමණක් ද? මාස දහයක් හා සත් දවසක් දැක්කේය.

මෙසේ පස් මහබැලුම් බලා නිදුකාණෙනි, මට බුදුවීමට කාලය යැයි දෙවියන්ට සංග්‍රහ කරන්නේ ප්‍රතිඥා දී නුඹලා යව යි ඒ දෙවිවරුන් යවා තුසිත දෙවියන් පිරිවරා තුසිත පුරයෙහි නන්දන වනයට පිවිසියේය. සියලු දිව්‍ය ලෝකවල නන්දන වන ඇත. එහි දී දෙවියන් ඔහුට මෙයින් චුතව සුගතියට යව මෙයින් චුතව සුගතියට යව යි කරන ලද කුසලයන්ගේ අවකාශ සිහිකරමින් හැසිරෙත්. හෙතෙම මෙසේ දෙවියන් විසින් කුසලය සිහිකරමින් ම පිරිවරා එහිම හැසිරෙන්නේ චුත විය. මෙසේ චුත වන්නේ

චුත වෙමියි දනියි. චුති සිත නොදනියි. පිළිසිඳ ගෙන ප්‍රතිසන්ධි සිත ද නොදනියි. මේ ස්ථානයෙහි මාගේ ප්‍රතිසන්ධිය ගන්නා ලද යැයි මෙසේ දනියි. සමහර තෙර කෙනෙක් ආවර්ජන පර්යාය නම් ලබන්නට වටියි. දෙවැනි සිත් වාරයෙහි ම දන්නේ යැයි කියත්. ත්‍රිපිටක මහාසිව තෙරුන් වහන්සේ කීය. බෝසතුන්ගේ ප්‍රතිසන්ධිය අන් සතුන්ගේ ප්‍රතිසන්ධිය හා සමාන නැත. ඔවුන්ගේ සති සම්පජඤ්ඤය කෙළවරට පැමිණියේය. යම්හෙයකින් ඒ සිතින් ම ඒ සිත දැනගන්නට නොහැකි ද එහෙයින් චුත සිත නොදනියි. චුත වන මොහොතෙහි ම චුත වෙමියි දනියි. පිළිසිඳ ගෙන ප්‍රතිසන්ධි සිත නොදනියි. අසවල් තැන මා පිළිසිඳ ගත්තේ යැයි දනියි. ඒ කාලයෙහි දසදහසක් සක්වළ කම්පාවෙයි. මෙසේ මව් කුසට බැසගත්තේ දහනවයක් වූ ප්‍රතිසන්ධි සිත්වල මෛත්‍රී පෙරටු සොම්නස් සහගත ඥානසම්ප්‍රයුක්ත අසංකාර කුසල් සිත සමාන මහා විපාක සිතින් පිළිසිඳ ගත්තේය. මහාසිව තෙරහු උපේක්ෂා සහගත සිතින් යැයි කීහ.

පිළිසිඳ ගැනීම ඇසළ පුන් පොහෝ දින උතුරුසැල් නැකැතින් ගත්තේය. ඒ කාලයෙහි මහාමායා දේවිය පෝයට කලින් සතියක් පටන් සුරාපානයෙන් වෙන්ව මල්ගඳ විලවුන්ගෙන් යුක්තව නැකැත් කෙළිය අනුභව කරන්නී හත්වෙනි දින උදෑසන ම නැගිට සුවඳ පැනින් ස්නානය කොට සියලු ආභරණයන්ගෙන් සැරසී උතුම් ආහාර වළඳා පෙහෙවස් ඉටා සිරියහන් ගැබට පිවිස සිරියහනෙහි වැද ඉන්නී නින්දට පැමිණ මේ සිහිනය දුක්කේය. සිව්වරම් මහ රජවරු ඇය යහන පිටින් ඔසවා අනෝතප්ත විලට පමුණුවා එකත්පසක සිටියාහ. ඉක්බිතිව ඔවුන්ගේ දෙවඟනන් පැමිණ මිනිස් කිළිටි හැරීම පිණිස නහවා දිව්‍ය වස්ත්‍ර අන්දවා සුවඳ ගල්වා දිව්‍ය මල් පළඳවා එයට නුදුරෙහි රිදී පර්වතයක එහි ඇතුළත රන් විමානයක් ඇත. එහි නැගෙනහිරට හිස දමා සයනය කරවූහ. ඉක්බිතිව බෝධිසත්වයන් වහන්සේ සුදු ඇත්පැටියෙක්ව එයට නුදුරෙහි එක් රන් පර්වතයක හැසිර එයින් බැස රිදී පර්වතයට නැග උතුරු දිශාවෙන් පැමිණ රන් විමනට පිවිස මව පැදකුණු කොට දකුණු පස පලා කුසට ඇතුලු වූවා හා සමාන විය. එවිට පිබිදියා වූ දේවිය ඒ සිහිනය රජුට දැන්විය. රජතෙමේ රාත්‍රිය පහ වූ කල්හි හැටහතරක් පමණ ප්‍රධාන බමුණන් ගෙන්වාගෙන සිරියල් හා විළඳ ඉස සරසන ලද බිම අනර්ඝ ආසන පණවා එහි උන්නා වූ බමුණන්ට ගිතෙල් මී සකුරුවලින් කරන ලද කිරිබතින් රන්තලි පුරවා රන්තලිවලින්ම වසා දුන්නේය. අන්‍යයන් විසින් ද ගෝදාන වස්ත්‍ර දීම් ආදියෙන් ඔවුහු සන්තර්පනය කළේය. එකල සියල්ලෙන් සතුටු කළ ඔවුන්ට සිහිනය සැළකොට කුමක්වන්නේදැයි ඇසීය.

බමුණෝ කීහ. මහරජතුමනි, අනිකක් නොසිතව. නුඹගේ දේවියගේ කුසෙහි දරුගැබක් පිහිටියේය. එය ද පුරුෂ ගැබකි. ස්ත්‍රී ගැබක් නොවේ. ඔබට පුතෙක් වන්නේය. ඔහු ඉදින් ගිහිගෙහි වසන්නේ නම් සක්විති රජ වන්නේය. ඉදින් ගිහිගෙයින් නික්මී පැවිදි වන්නේ නම් බුදු වන්නේය. මෙසේ සිහියෙන් යුක්තව බෝධිසත්වයන් වහන්සේ තුසිත දෙව්ලොවින් චුතව මව් කුසට පැමිණෙයි. එහි **සතොසම්පජානොති** මෙයින් හතර වැනි ගර්භවක්‍රාන්තියට පැමිණෙයි යැයි දක්වයි. ගර්භවක්‍රාන්තියෝ හතරක් වෙත්. ''ස්වාමීනි, මේ ලෝකයෙහි සමහරෙක් සිහිනැතිවම මව් කුසට පැමිණෙත්. සිහිනැතිවම මව්කුස සිටිත්. සිහි නැතිවම මව්කුසින් නික්මෙත්. මේ පළමුවන ගර්භවක්‍රාන්තියයි. නැවත ද ස්වාමීනි, මේ ලෝකයෙහි සමහරෙක් සිහි ඇතිවම මව් කුසට පැමිණෙත්. සිහිනැතිවම මව්කුස සිටිති. සිහි නැතිවම මව්කුසින් නික්මෙත්. මේ දෙවන ගර්භවක්‍රාන්තියයි. නැවත ද ස්වාමීනි, මේ ලෝකයෙහි සමහරෙක් සිහි ඇතිවම මව් කුසට පැමිණෙත්. සිහි ඇතිවම මව්කුස සිටිති. සිහිනැතිවම මව්කුසින් නික්මෙත්. මේ තුන්වන ගර්භවක්‍රාන්තියයි. නැවත ද ස්වාමීනි, මේ ලෝකයෙහි සමහරෙක් සිහි ඇතිවම මව්කුසට පැමිණෙත්. සිහි ඇතිවම මව්කුස සිටිත්. සිහි ඇතිවම මව්කුසින් නික්මෙති. මේ හතරවන ගර්භවක්‍රාන්තියයි. මෙයින් පළමුවැන්න ලෞකික මිනිසුන්ට වෙයි. දෙවැන්න අසූ මහා ශ්‍රාවකයන් වහන්සේලාටයි. තෙවැන්න අගසව් දෙනමට හා පච්චේක බෝධිසත්වයන්ටයි. මොවුහු වනාහි කර්මජ වාතයෙන් පාද උඩුකුරුව හිස යට කොට නොයෙක් සිය ගණන් පුරුෂයන් හෙළන ප්‍රපාතයක මෙන් යෝනි මුඛයෙහි වැටුණාහු යතුරු සිදුරකින් ඇතෙක් අදින්නාක් මෙන් බොහෝ සම්බාධයන්ගෙන් යෝනි මුඛයෙන් නික්මෙන්නාහු නොයෙක් දුකට පැමිණෙත්. එහෙයින් ඔවුන්ට අපි නික්මෙමුයි සිහියක් නොවෙයි. හතර වැන්නෙන් කී සර්වඥ බෝධිසත්ත්වයන් වහන්සේ තමන් මව්කුස පිළිසිඳ ගැනීම දනිත්. එහි වාසය කරන බව දනිත්. නික්මෙන කාලයෙහි ද කර්මජ වාතයෙන් ඔහු පාද උඩුකුරුවත් හිස යටිකුරුවත් කොට හෙළන්නට නොහැකි වෙත්. අත්දෙක දිගු කොට ඇස් හැර සිටගෙන ම නික්මෙත්.

**මාතුකුච්ඡිං ඔක්කමතීති** මෙහි මව් කුසින් නික්මෙන්නේ වෙයි යන තේරුමයි. නික්මෙන්නේ එහි මෙසේ වෙයි. **අප්පමාණොති** බුද්ධ ප්‍රමාණය. මහත්‍ය යන තේරුමයි. **උළාරොති** එයටම පර්යාය වචනයයි. **දෙවානං දෙවානුභාවන්ති** මෙහි දෙවියන්ගේ මේ ආනුභාවයයි. අඳින ලද වස්ත්‍රයාගේ ප්‍රභාව යොදුන් දොළහක් පැතිරෙයි. ශරීරයේ ද අලංකාරයේ ද විමානයේ ද ප්‍රභාව එසේමය. එය ඉක්මවා යන තේරුමයි. **ලොකන්තරිකාති** තුන් තුන්

සක්වළ අතර එකක් ලෝකාන්තරිකයක් වෙයි. කරත්ත රෝද තුනක් අතරට හෝ සක්‍ර තුනක් අතරට ඔවුනොවුන් මැඩ සිටිය මැද ඇතිවන අවකාශයක් මෙනි. ඒ ලෝකාන්තරික නරකය ප්‍රමාණයෙන් යොදුන් අටදාහකි. **අඝාති** නිතර විවෘතයි. **අසංවුතාති** යටට ද නොපිහිටයි. **අන්ධකාරාති** අඳුරු විය. **අන්ධකාරතිමිසාති** චක්ෂුර් විඥානයාගේ ඉපදීම වැළකීමෙන් අඳුරු බව කරන කළුවරින් යුක්ත විය. එහි වනාහි චක්ෂුර් විඥානය නොඋපදියි. **එවං මහිද්ධිකාති** සඳ හිරු එක පහරින් ම දිවයින් තුනක් පෙනෙත්. මෙසේ මහත් සෘද්ධි ඇත. එක එක දිසාවෙහි යොදුන් නව නව ලක්ෂයක් අඳුර නසා එළිය දක්වත්. **එවං මහානුභාවා ආභාය නානුභොන්තීති** තමාගේ ප්‍රභාවෙන් නොසෑහෙයි. ඔවුහු එහි එළියෙන් නොසෑහෙත්. **යෙපි තත්‍ර සත්තාති** යම් සත්වයෙක් ඒ ලෝකාන්තරික නරකයෙහි උපන්නාහු ද කිනම් කර්මයක් කොට ඒ සත්වයෝ එහි උපදිත් ද? මව්පියන්ට හා දැහැමි මහණ බමුණන්ට බරපතල හා දරුණු වූ කර්ම කොට ද දිනපතා ප්‍රාණඝාත ආදී අනෙත් දරුණු සැහැසිකම් කොට උපදිත්. තම්බපණ්ණිදීපයෙහි අභයචෝරනාග සොරා ආදීහු මෙනි. ඔවුන්ගේ ආත්මභාවය ගව් තුනක් පමණ වෙයි. වවුලන්ගේ මෙන් දිග නියපොතු වෙත්. ඔවුහු ගස්වල වවුලන් මෙන් නියවලින් සක්වළ පාදයෙහි එල්ලෙත්. යම්කලෙක හැසිරෙන්නෝ ඔවුනොවුන් අත්පසට පැමිණියාහු ද එකල අපට ආහාරයක් ලැබුණා යැයි සිතමින් එහි දුවන්නහු පෙරලී ලෝකසන්ධාරක ජලයෙහි වැටෙත්. වාතයෙන් පහරන ලද මිහිරි ගෙඩියක් මෙන් සිඳී ජලයෙහි වැටෙත්. වැටෙන්නාහු ඉතා ක්ෂාර ජලයෙහි පිටි ගුලියක් මෙන් වියලෙත්. **අඤ්ඤෙපි කිර භො සන්ති සත්තාති.** පින්වත්නි, යම්සේ අපි මහත් දුක් අනුභව කරමු ද? එසේම අන්‍ය සත්වයෝ ද මේ දුක් අනුභව කිරීම පිණිස මෙහි උපන්නාහු ද ඒ දවසක් පෙනෙත්. මේ එළිය එක කැඳක් බොන පමණක්වත් නොසිටියි. යම්තාක් නිදා අවදි වූයේ අරමුණක් වඩයි ද එපමණ කාලයක් වෙයි. දීඝභාණකයෝ වනාහි අසුරුසනක් ගසන කාලය පමණක යැයි විදුලියක් මෙන් නික්මී මේ කුමක්දැයි කියන අතරම නැතිවේ යැයි කියත්. **සංකම්පතීති** හාත්පසින් කම්පාවෙයි. මේ අනෙත් මුලින් කී පදය පර්යායයි. නැවත ද **අප්පමාණො චාති** යනාදිය නිගමනය පිණිස කියන ලදි. **චත්තාරො නං දෙවපුත්තා චාතුද්දිසං ආරක්ඛාය උපගච්ඡන්තීති** මෙහි චත්තාරො නම් සතර මහ රජුන්ගේ වශයෙන් කියන ලදි. දසදහසක් සක්වළ හතර හතර කොට හතළිස් දසදහසක් වෙති. එහි මේ සක්වළෙහි මහ රජවරු කඩු ගත් අත් ඇතිව පැමිණ බෝසතුන්ගේ ආරක්ෂාව පිණිස එළඹ සිරියහන්ගැබට පිවිසියාහ. අනෙත් අය ගැබ දොර පටන් විරුද්ධ පාංශුපිශාච ආදී යක්ෂ සමූහයා ඉවත්කොට සක්වළ තෙක් ආරක්ෂාව

ගත්තාහ. කුමක් නිසා ආරක්‍ෂාවට ආවාහු ද? ප්‍රතිසන්ධි මොහොතෙහි කළල අවස්ථාවේ පටන් ඉදින් කෙළ සියයක් මාරයෝ කෙළ සියයක් මහමෙර ඔසවා බෝසතුන්ට හෝ බෝසත් මවට හෝ අනතුරු කිරීමට ආවාහු. නමුත් සියලු අනතුරු වළක්වන්නාහ. රුහිරුප්පාද වස්තුවෙහි බුදුරදුන් මෙය කියන ලදි. ''මහණෙනි, මේ කරුණු හේතු රහිතය. අනුන්ගේ උපක්‍රමයකින් බුදුරදුන්ගේ ජීවිතය තොර කරන්නේය. අනුන්ගේ උපක්‍රමයකින් බුදුරදුන් පිරිනිවන් පාන්නේය. මහණෙනි, නුඹලා යව්. මහණෙනි. බුදුවරයෝ රැකිය නොහැකිය. මෙසේ අනුන්ගේ උපක්‍රමයකින් ඔවුන්ගේ ජීවිතයට අනතුරක් නැත. විරූප වූ දැකිය නොහැකි වූ අමනුෂ්‍යයෝ ඇත. භය ශබ්ද ඇති පක්ෂීහු ඇත. යම් කෙනෙකුන්ගේ රූප දැක හෝ ශබ්දය අසා හෝ බෝසත් මවට බියක් හෝ තැති ගැනීමක් හෝ උපදින්නේ ද ඔවුන්ගේ ආරක්ෂාව පිණිස ආරක්ෂාව ගත්තාහ. එසේ වුවත් බෝසතුන්ගේ පින් තේජසින් හටගත් ගෞරවයෙන් තමන්ගේ ගෞරවාදරය නිසා ඔවුහු මෙසේ කළාහ. කිමෙක් ද? ඔවුහු ඇතුළු ගැබට පිවිස සිටියාහු සතරවරම් මහ රජවරු බෝසත් මවට තමන් දක්වත් ද? නොදක්වත් ද? ස්නානය කරන සැරසෙන වළඳන ආදී ශරීර කෘත්‍ය කරන කාලයෙහි නොදක්වත්. සිරියහන්ගැබට පැමිණ උතුම් සයනයෙහි හුන් කාලයෙහි දක්වත්. එහි ඉදින් අමනුෂ්‍යයන්ගේ දර්ශනය මිනිසුන්ට බිය උපදවනු සුළු වෙයි. බෝසත් මව තමාගේත් පුතාගේත් පින් බලයෙන් ඔවුන් දැක බිය නොවෙයි. ප්‍රකෘති අන්තඃපුර ආරක්ෂකයන් මෙන් ඔවුන් කෙරෙහි සිතක් උපදියි. **පකතියා සීලවතීති** ස්වභාවයෙන් ම සීලයෙන් යුතු වූ. බුදුරදුන් නූපන් කල්හි මිනිස්සු තාපස පිරිවැජි ආදීන් ළඟ වැඳ උක්කුටිකයෙන් හිඳ සිල් ගණිත්. බෝසත් මව කාලදේවල ඍෂිවරයා වෙතින් සිල් ගණියි. බෝසතුන් කුසට පැමිණි කල්හි අනෙකකුගේ පාමුල ඉන්නට නොහැකිය. සම අසුනෙහි හිඳ ගන්නා ලද සීලය ද නින්දාවට කාරණයක් වෙයි. එහෙයින් **සයමෙව සීලං ගහෙසීති** යන්න කියන ලදි. **පුරිසෙසුති** බෝසත් පියා ආදී කොට කිසි මිනිසෙකු කෙරෙහි පුරුෂයන් කෙරෙහි ඇලීම් සිතක් නූපදියි. එය බෝධිසත්වයන් කෙරෙහි ගෞරවයක් නොව කෙළෙස් හීන බැවිනි. බෝසත් මවගේ රූපය ඉතා දක්‍ෂ සිත්තරුන්ට පොත්වල අඳින්නට නොහැකි වෙත්. එය දැක මිනිසුන්ට රාගය උපදින්නේ නැතැයි කීමට නොහැකිය. ඉදින් ඇය කෙරෙහි ඇලුණු සිතින් එළඹීමට කැමැති වෙයි ද පාද නොඑසවෙත්. දිව්‍ය මාංචුවලින් බැඳෙත්. එහෙයින් **අනතික්කමනීයාති** යනාදිය කීය. **පඤ්චන්නං කාමගුණානන්ති** පෙර කාම ගුණයෙන් යුතුයැයි පුරුෂ අධිප්පාය වශයෙන් වස්තු ප්‍රතික්ෂේපය කියන ලදි. මෙහි අරමුණු ප්‍රතිලාභය දක්වන ලදි. එකල්හි දේවියට මෙබඳු පුතෙක් කුසෙහි උපන්නේ යැයි අසා

හාත්පසින් රජවරු මාහැඟි ආභරණ තූර්යාදි වශයෙන් පංචද්වාරයට අරමුණු පඬුරු එවත්. බෝසතුන්ට ද බෝසත් මවට ද කරන ලද කර්ම උස්සන්න හෙයින් ලාභසත්කාරයන්හි ප්‍රමාණයක් නැත. අකිලන්තකායාති යම්සේ ස්ත්‍රීහු ගැබෙහි බරින් ක්ලාන්ත වෙත්. අත්පා ඉදිමීමට පැමිණෙත්. ඇයට මෙබඳු කිසිම ක්ලාන්තයක් නැත. තිරොකුච්ඡිගතන්ති ඇතුල් කුසට ගියේ. කළල අවස්ථාදිය නොඉක්මවා හටගත් අංග ප්‍රත්‍යංග අඩුනොවූ ඉන්ද්‍රිය බවට පැමිණියේ ම දකියි. කුමක් පිණිස දකියි ද සැපසේ වාසය කිරීම පිණිසය. යම්සේ මව පුතා සමග හුන්නේ හෝ හොත්තේ හෝ අත් පා එළඹෙන්නාහු ඔවා තබන්නෙමියි සැපසේ විසීම පිණිස පුතා බලයි. මෙසේ බෝසත් මව ද යම් ඒ මවගේ නැගිටීම යාම පෙරළීම හිඳීම ආදියෙහි ද උණුසුම ශීතල ලුණු රස තිත්ත රස කටුක ආහාර අනුභව කරන කල්හි ද ගැබට දුක් උපදියි. මගේ පුතාට එය සුවය පිණිස ඇත්දැයි බලන්නී පර්යංකයක් බැඳ හුන් බෝසතුන් බලයි. යම්සේ අනෙත් අය ඇතුල් කුසට පැමිණියාහු පක්වාසය ආමාශය ඔසවා උදර පටලයෙහි පෘෂ්ටය කොට පිටකටුව නිසා උක්කුටිකව දෙමිටෙහි හනුව තබා වැසි වසිනා කල ගස් සිදුරෙහි වඳුරෙක් මෙන් හිඳිත්. බෝධිසත්වයන් එසේ නොවේ. බෝධිසත්වයන් වනාහි පිටකටුව පිටට කොට ධර්මාසනයෙහි ධර්මකථිකයෙක් මෙන් පළඟක් බැඳ පෙරදිගට අභිමුඛව සිටියි. පෙර කරන ලද කර්මය ඔහුගේ වස්තුව පිරිසිදු කරයි. වස්තුව පිරිසිඳු වූ කල සියුම් සිවි ලකුණ උපදියි. එකල කුසට පැමිණියේ එය සමෙන් වසන්නට නොහැකි වෙයි. බලන කල පිටත සිටියාක් මෙන් පෙනෙයි. එහි තේරුම උපමාවකින් පෙන්නුම් කරන්නේ සෙය්‍යථාපි යනාදිය කීය. බෝසත් තෙමේ ඇතුල් කුසට ගියේ මව නොදකියි. ඇතුල් කුසෙහි දී චක්ෂුර් විඥානය නොඋපදියි. කළුරිය කරේනුයි ප්‍රසූත බැව් හේතුවෙන් නොවේ. ආයුෂ ක්‍ෂය වීමෙනි. බෝසතුන් විසින් වසන ස්ථානය සෑ කුටියක් හා සමාන වෙයි. අන්‍යයන්ට පරිභෝග කළ නොහැකිය. බෝසත් මව ඉවත්කොට අනෙකෙක් අගමෙහෙසි තනතුරෙහි තබන්නට නොහැකිය. බෝසත් මවට ආයුෂ එපමණම වෙයි. එහෙයින් එකල්හි ම කළුරිය කරයි. කුමන වයසේ දී කළුරිය කරයි ද? මධ්‍යම වයසේ දී ය. පළමු වයස් කාලයෙහි සත්වයන්ට ආත්මය කෙරෙහි ඡන්දරාගය බලවත් වෙයි. එහෙයින් එකල හටගත් ගැබ් ඇති ස්ත්‍රීහු ඒ ගැබ ආරක්‍ෂා කරන්නට නොහැකි වෙයි. ගැබට බොහෝ බාදා ඇති වෙයි. මැද වයස් ඇත්තියගේ දෙකොටසක් ඉක්මවා තුන්වන කොටසෙහි වස්තුව පිරිසිදු වෙයි. වස්තුව පිරිසිදු වූ කල ඉපදුන දරුවෝ නිරෝගී වෙත්. එහෙයින් බෝසත් මව පළමු වයසේ දී සම්පත් අනුභව කොට මැද වයසේ තුන්වන කොටසෙහි ප්‍රසූත කොට කාලක්‍රියා

කරයි. නව වා දස වාති මෙහි වා ශබ්දය විකල්ප වශයෙන් හත හෝ අට හෝ එකොළහ හෝ දොළහ හෝ යනාදී වශයෙන් සංග්‍රහ දත යුතුයි. එහි හත් මසින් උපන්නෝ ජීවත් වෙත්. ශීත උෂ්ණ නොවෙයි. අට මසින් උපන්නෝ ජීවත් නොවෙත්. සෙසු අය ජීවත් වෙත්. ඨිතාවාති සිටියේම වී. මහමායා දේවිය ප්‍රසූතියට ළං වූවා නෑ කුලගෙට යන්නෙමියි රජුට දැන්වීය. රජු කිඹුල්වත් නුවර පටන් දෙව්දහ නුවර දක්වා මාර්ගය සරසවා දේවිය රන්සිවි ගෙයක හිඳවූයේය. නුවරවාසීහු ඇය පිරිවරා සුවඳ මල් ආදියෙන් පුදන්නාහු දේවිය ගෙනගියාහුය. දෙව්දහ නුවරට නුදුරෙහි වූ ලුම්බිනි සල් වනය දැක උයනෙහි හැසිරීමට සිතක් ඉපදී රජුට සංඥාවක් දුන්නේය. රජු උයන පිරිසිදු කරවා ආරක්‍ෂාව යෙදවීය. උයනට පිවිසි කල්හිම දේවියගේ ශරීරය දුර්වල විය. ඉක්බිතිව ඇයට මඟුල් සල්ගස මුල සයනයක් පණවා තිරයෙන් වටකළාහ. ඇය තිරයෙන් ඇතුලට පිවිස සල් අත්තක් අතින් ගෙන සිටියාය. එකල්හි එකෙනෙහිම ඇයගේ ගැබෙහි නැගීම විය. **දෙවා පඨමං පතිගණ්හන්තීති** රහත් වූ ශුද්ධාවාස බ්‍රහ්මයෝ පිළිගත්හ. කෙසේ ද? සූති වේෂය ගෙනයැයි සමහරු කියත්. එය ප්‍රතික්‍ෂේප කොට මෙය කියන ලදී. එකල්හි බෝසත් මව රනින් කරන ලද වස්ත්‍රයක් ඇඳ මසුන්ගේ ඇස් හා සමාන දුකුල වස්ත්‍රයක් පා තෙක් පොරවා සිටියාය. එකල්හි ඇයට සැහැල්ලුව ගැබෙහි නැගීම විය. පෙරහත් කඩින් වතුර නික්මෙන්නාක් මෙනි. ඉක්බිතිව ඔවුහු ප්‍රකෘති බ්‍රහ්ම වේෂයෙන් ම එළඹ පළමුකොට රන් දැලින් පිළිගත්තාහ. ඔවුන්ගේ අතින් මිනිස්සු සියුම් රෙදි සුඹුළුවකින් පිළිගත්තාහ. **දෙවා පඨමං පතිගණ්හන්ති පච්ඡා මනුස්සාති චත්තාරො නං දෙවපුත්තාති** යන්න එහෙයින් කියන ලදී. සතර මහා රජවරුන්ය. **පටිග්ගහෙත්වාති** අඳුන් දිවි සමින් කළ ඇතිරිල්ලෙක පිළිගෙන. **මහෙසක්ඛොති** මහත් තේජස් මහත් යසස්වලින් සම්පූර්ණ යන තේරුමයි. **විසදොව නික්ඛමතීති** යම්සේ අන්‍ය සත්වයෝ යෝනි මාර්ගයෙහි ඇලෙන්නාහු කැඩී බිඳී නික්මෙත් ද? මෙසේ නොනික්මෙයි. ඇලීමක් නැතිව නික්මේය යන තේරුමයි. **උදෙනාති** ජලයෙන්. **කෙනචි අසුචිනාති** යම්සේ අන්‍ය සත්වයෝ කර්මජ වාතයෙන් පා උඩුකුරුව හිස යට කොට යෝනි මාර්ගයෙහි බහාලන ලද්දාහු සියක් පුරුෂයන් වැටෙන නරවළක වැටෙන්නාක් මෙන් ද කෙස් සිදුරකින් නික්මෙන ඇතෙකු මෙන් මහත් දුක් අනුභව කරන්නාහු නොයෙක් අපවිත්‍ර තැවරුණාහු නික්මෙත් ද? බෝධිසත්වයන් එසේ නැත. බෝසතුන් කර්ම වාතයෙන් පා උඩටත් හිස යටටත් කරන්නට නොහැකිය. මෙසේ බෝසතුන් ධර්මාසනයෙන් බසින ධර්ම කථිකයෙකු මෙන් ද හිණිමගින් බසින පුරුෂයකු මෙන් ද දෙ අත් දෙපා විහිදුවා සිටියේ ම මව්කුසින් හටගත් කිසි අශුචියක් හා අමිශ්‍රව

නික්මෙයි. උදකස්ස ධාරාති වතුර දහර එයින් සිසිල් වූ දහර රන් කටායෙහි වැටෙයි. උෂ්ණ වූවා රිදී කටායෙහි ද වැටෙයි. මෙය ද පෘථිවි තලයෙහි කිසි අශුචියක් හා අසම්මිශ්‍රයි. ඔවුන්ගේ පරිභෝග කරන ජලය ද අන්‍යයන් හා සාධාරණ නැත. ක්‍රීඩා කරන ජලය ද දක්වන්නට කියන ලදි. අන්‍යයන්ගේ රන්රිදී කළවලින් ගෙනෙන ජලයේ ද හංසවට්ටකාදී පොකුණුවලට පැමිණි ජලයේ ද පිරිසිදීමක් නැත. සම්පති ජාතොති උපන් මොහොතේ ම පෙළෙහි මව්කුසින් නික්මුණු වේලාව මෙයයි දක්වන ලදි. මෙසේ නොදත යුතුය. නික්මුණු මොහොතේම ඔහු පළමුවෙන් බ්‍රහ්මයෝ රන් දැලින් පිළිගත්තාහ. ඔවුන්ගේ අතින් සිව්වරම් රජවරු ද මඟුල් යැයි සම්මත සැප ස්පර්ශ ඇති අඳුන් දිවි සමින් ද ඔවුන්ගේ අතින් මිනිස්සු සියුම් වස්ත්‍ර දරණුවෙන් ද පිළිගත්තාහ. මිනිසුන්ගෙන් මිදී පොළොවෙහි පිහිටියේය. සෙතම්හි ඡත්තෙ අනුහීරමානෙති දිව්‍ය සේසත් දරණ කල්හි. මෙහි සේසතට පිරිවර වූ කඩුව ආදී පංචකකුධ භාණ්ඩ ආවාහ. පෙළෙහි රජුගේ ගමනෙහි රජු මෙන් කුඩය ම කියන ලදි. ඔවුන් කෙරෙහි කුඩය ම පෙනෙයි. කුඩ ගත්තෝ නොපෙනෙත්. එසේම කඩු තල්වැට මෝරහත්ථක වල්විදුනාව නලල්පට යන මොවුහු ම පෙනෙත්. ඔවුන් ගත් අය නොපෙනෙත්. ඒ සියල්ලම වනාහි නොපෙනී සිටින දෙවියෝ ගත්තාහ. එහෙයින් කියන ලදි.

නොයෙක් දහසක් මණ්ඩල ආකාශයෙහි දෙවියෝ කුඩ දැරූහ. සෙමර රන්දඬු ඇතිව සිටිත්. සෙමර සේසත් ගත්තෝ නොපෙනෙත්.

සබ්බා ච දිසාති මේ සත් පියවරින් සිටියහුගේ මත්තෙහි මෙන් සියලු දිසාවන්හි බැලීම් කියන ලදි. මෙය නොදත යුතුයි. මහා සත්ව තෙමේ මිනිසුන්ගේ අතින් මිදී පෙරදිග බැලීය. නොයෙක් ලක්ෂ ගණන් සක්වළ එක මිදුලක් විය. එහි දෙවියන් හා මිනිසුන් සුවඳ මල් ආදියෙන් පුදන්නාහු මහාපුරුෂයාණෙනි. මෙලොව නුඹ හා සමාන කෙනෙක් නැත. නුඹ හා උතුම් කෙනෙක් කොයින්දැයි කීවාහ. සිව් දිශාව ද එසේය. හතර අනුදිශාවන් ද යටට ද ඉහළ ද දස දිශාවන් බලා තමාට සමාන කෙනෙක් නොදැක උතුරු දිශාව මෙයයැයි පියවර හතක් ගියේය. මෙහි මෙසේ තේරුම දත යුතුයි. ආසභින්ති උතුම්. අග්ගොති ගුණවලින් සියල්ලන්ට ම පළවෙනිය. අනෙත් පද දෙක මෙයට ම පර්යාය වචනයි. අයමන්තිමා ජාති නත්ථිදානිපුනබ්භවොති මේ පද දෙකෙන් මේ ආත්මයේ දී පැමිණිය යුතු වූ රහත් බව ප්‍රකාශ කළේය. මෙහි සම පාදවලින් පොළොවේ පිහිටීම සතර ඍද්ධිපාදයාගේ ලැබීමට පෙර නිමිත්තය. උතුරට අභිමුඛ බව මහජනයා මැඩ පවත්වා යාමට පෙර නිමිත්තය. සත් පියවරක් ගමන්

කිරීම සප්ත බෝජ්ඣංගයන් ලැබීමට පෙරනිමිත්තය. දිව්‍ය සේසත් දැරීම විමුක්ති ඡත්‍ර ප්‍රතිලාභයට පෙරනිමිත්තය. පංචරාජකකුධ භාණ්ඩයෝ පංච විමුක්තීන්ගේ ලැබීමට පෙර නිමිත්තය. දිශාවන් බැලීම අනාවරණ ඥානය ලැබීමේ පෙරනිමිත්තය. උතුම් වචනය කීම නොපැවැත්විය හැකි දම්සක් පැවැත්වීමේ පෙරනිමිත්තය.

අයමන්තිමා ජාතීති යන සිංහ නාදය නිරුපදිසේස පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවීමට පෙරනිමිත්ත යැයි දත යුතුයි. මේ වාරයෝ පෙළෙහි ආවාහ. බොහෝ වාරයෝ පෙළෙහි නොආවාහ. ගෙනහැර දැක්විය යුතුයි. මහා පුරුෂයන්ගේ උපන් දවසෙහි දසසහස්සී ලෝකධාතුව කම්පා විය. දසදහසක් ලෝකධාතුවේ දෙවියෝ එකම සක්වළකට රැස්වූවාහ. පළමුව දෙවියෝ පිළිගත්හ. පසුව මිනිස්සු පිළිගත්හ. ඒ අනුව ම බෙර ද කිසිවෙක් වාදනය නොකර ම තුමූම වාදනය වූහ. මිනිසුන්ගේ යදම්වලින් බැඳුම් කඩ කඩ වී සිඳුනාහ. ගොයම්වල රෝග ඇඹුලෙන් සේදූ තඹවල මලකඩ මෙන් පහවූහ. ජාත්‍යන්ධයෝ රූප දුක්කාහ. උපතින් බිහිරෝ ශබ්ද ඇසූහ. පිළහු දිවීමෙන් සම්පූර්ණ වූහ. උප්පතියෙන් කෙල තොල්ලන්ට සිහිය ඇති විය. නොරටට ගිය නැව් හොඳ තොටට පැමිණියාහ. අහසෙහි හා බිම් ඇති ස්වකීය පැහැය බැබලුනාහ. විරුද්ධකාරයෝ මෛත්‍රීසිත් ඇත්තෝ වූහ. අවීචියේ ගින්දර නිවුණාහ. ලෝකාන්තර නරකයෙහි එළිය ඇති විය. ගංගාවන්හි ජලය නො ගැලීය. මහමුහුදේ ජලය මිහිරි විය. සුළඟ නොහැමූහ. අහසෙහි හා ගස් පර්වතවලට ගිය පක්ෂීහු සන්තෝෂව පොළොවට පැමිණියාහ. සඳ ඉතා බැබලුණි. ඉරු උෂ්ණ නොවීය. සිහිල් නොවීය. නිර්මල ඍතුවෙන් යුතු විය. දෙවියෝ තමතමන්ගේ විමන්වල සිට අත්පොළසන් දීම පිළිහිස වටකර කැවීමාදියෙන් මහත් ක්‍රීඩා පැවැත්වූහ.

හතර දිගින් වර්ෂාව වැස්සේය. මහජනයා බඩගිනි පිපාස දෙකින් නොපෙලුණේය. දොර කවුළු තුමූම ඇරුණාහ. ගෙඩි හා මල් හටගන්නා ගස් මල් හා ගෙඩිවලින් බරවූහ. **දසසහස්සී ලොකධාතු එකධජමාලා අහොසීති** එහි මේ දස දහසක් ලෝකධාතුව කම්පාවීම සර්වඥතා ඥානය ලැබීමට පෙර නිමිත්තය. දෙවියන්ගේ එක සක්වළ රැස්වීම දම්සක් සූත්‍රය පවත්වන කාලයෙහි එක් පැහැරින් ම රැස්වී ධර්මය පිළිගැනීමට පෙරනිමිත්තය. පළමුව දෙවියන්ගේ පිළිගැනීම රූපාවචර ධ්‍යානයන් හතර ලැබීමට පෙරනිමිත්තය. පසුව මිනිසුන්ගේ පිළිගැනීම අරූපාවචර ධ්‍යානයන් හතර ලැබීමට පෙර නිමිත්තය. එහි බඳනා ලද වීණාවන්ගේ තුමූම වාදනය වීම අනුපූර්ව විහාර ප්‍රතිලාභයට පෙර නිමිත්තය. සමින්

බඳනා ලද බෙරවල වාදනය මහත් වූ ධර්මභේරී නැමැති අනුශාසනයාගේ පෙරනිමිත්තය. බන්ධනයන්ගේ සිඳීම අස්මිමානය සිඳීමට පෙරනිමිත්තය. සියලු රෝගයන්ගේ පහවීම සියලු කෙලෙසුන්ගේ පහවීමට පෙරනිමිත්තය. ජාත්‍යන්ධයන්ගේ රූප දැකීම දිවැස් ලැබීමේ පෙරනිමිත්තය. ජාති බිහිරන්ගේ ශබ්ද ඇසීම දිබ්බසෝත ධාතුව ලැබීමේ පෙරනිමිත්තය. පිලුන්ගේ දිවීම සතර සෘද්ධිපාද ලැබීමේ පෙරනිමිත්තය. කෙලතොලුන්ගේ සිහිය ඇතිවීම සතර සතිපට්ඨානය ලැබීමේ පෙරනිමිත්තය. නොරටට ගිය නැව් යහපත් පටුනට ඒම සිව්පිළිසිඹියා ලැබීමේ පෙරනිමිත්තය. මැණික්වල ස්වකීය බැබලීම ලෝකයාට යම් ධර්මය නැමැති එළියක් පෙන්වන්නේ ද එයට පෙරනිමිත්තය. විරුද්ධකාරයන්ගේ මෛත්‍රී සිත ඇතිවීම සතර බ්‍රහ්මවිහාර ලැබීමේ පෙරනිමිත්තය. අවීචි නරකයෙහි ගිනි නිවීම එකොළොස් ගිනි නිවීමේ පෙරනිමිත්තය. ලෝකාන්තරිකයෙහි එළිය ඇතිවීම අවිද්‍යා අන්ධකාරය නසා ඥානාලෝකය දක්වීමේ පෙරනිමිත්තය. මහසයුරේ මිහිරිබව නිවන් රසයෙහි පෙරනිමිත්තය. වාතය නොහැමීම දෙසැටක් මිථ්‍යාදෘෂ්ටි බිඳීමේ පෙරනිමිත්තය. පක්ෂීන්ගේ පොළොවෙහි ගමන මහජනයා අවවාදය අසා දිවිතෙක් සරණ යාම් පෙරනිමිත්තය. සඳ ඉතා බැබලීම බොහෝ දෙනා කැමැතිවීමේ පෙරනිමිත්තය. ඉරුගේ සම ශීත බව කායික චෛතසික සැපය ඉපදීමේ පෙරනිමිත්තය. දෙවියන්ගේ විමාන ද්වාරයන්හි අත්පොළසන් දෙමින් ක්‍රීඩා කිරීම බුදුබවට පැමිණ උදම් ඇනීමේ පෙරනිමිත්තය. සතරදිග වැසි වැසීම මහත් ධර්ම වර්ෂාව වැස්සවීමේ පෙරනිමිත්තය. බඩගින්නෙන් පෙළෙන්නවුන් නොමැතිවීම කායගතාසති අමෘත ලාභයාගේ පෙරනිමිත්තය. පිපාසාවන්ගෙන් පීඩිතවූවන් නොමැතිවීම විමුක්ති සුවයෙන් සුවපත්වීමේ පෙරනිමිත්තය. දොර කවුළු ඉබේ ඇරීම අෂ්ඨාංගික නැමැති දොර ඇරීමේ පෙරනිමිත්තය. ගස්වල ගෙඩිමල් හටගැනීම විමුක්ති මල්වලින් පිපී යන බවට ද සාමාන්‍ය එලබරින් බරබවේ පෙරනිමිත්තය. දසදහසක් ලෝකධාතුව එකම කොඩි මල්වලින් ගැවසීම ආර්යධජ මල්වලින් ගැවසීමට පෙරනිමිත්ත යැයි දතයුතුය. මෙය සම්බහුල වාරය නම්. මෙහි ප්‍රශ්න අසත්. යම්කලෙක මහා සත්වතෙමේ පොළොවෙහි සිටගෙන උතුරු දිශාවට අභිමුඛව ගොස් උතුම් වචන කීයේ ද? එකල්හි කිම පොළොවෙන් ගියේ ද? නොහොත් අහසින් ගියේ ද? පෙනෙමින් ගියේ ද? නොපෙනී ගියේ ද? නග්නව ගියේ ද? නොහොත් වස්ත්‍ර ඇතිව ගියේ ද? ළදරුව ගියේ ද? නොහොත් මහළුව ගියේ ද? පසුව එසේම වූයේ ද? නොහොත් බාල දරුවෙක් ද? මේ ප්‍රශ්නය ලෝවාමහා ප්‍රාසාදයෙහි සංඝයාගේ රැස්වීමේ දී ත්‍රිපිටක චූලාභය තෙරුන් විසින් විසඳන ලදි. තෙරුන් වහන්සේ මෙහි නියම පෙර කරන

ලද කර්ම ඊශ්වර නිර්මාණවාද වශයෙන් බොහෝ සේ කියා අන්තිමේ දී ප්‍රකාශ කළේ ය. මහාපුරුෂ තෙමේ පොළොවෙන් ගියේය. මහජනයාට අහසින් යන්නාක් මෙන් පෙනුණේය. පෙනෙමින් ගියේය. මහජනයාට වස්ත්‍රයෙන් සැරසී ගියාක් මෙන් පෙනුණේය. ළදරුව ගියේය. මහජනයාට දහසය හැවිරිදි කෙනෙකු මෙන් පෙනුණේය. පසුව බාල දරුවෙක් ම වූයේය. මෙසේ කී කල්හි පිරිස පින්වත්නි, බුදුරදුන් මෙන් තෙරුන් විසින් ප්‍රශ්නය කියන ලද යැයි සතුටු විය. ලෝකාන්තරික වාරය කියන ලද ක්‍රමයටයි. **විදිතාති** ප්‍රසිද්ධ වී. යම්සේ ශ්‍රාවකයෝ ස්නානය කිරීම මුව දෙවීම කන බොන කාලයෙහි අවකාශ නැති කල අතීත සංස්කාරයන් නිප්‍රදේශ වශයෙන් සිහි කරන්නට නොහැකි වෙත්. අවකාශයක් ලැබුණු කල්හි ම සිහි කරත්. බුදුවරු එසේ නැත. බුදුවරු සතියක් ඇතුළත නියම සංස්කාරයන් මුලපටන් සිහිකොට ත්‍රිලක්ෂණයට නගා විසඳත්. ඔවුන්ට නොලබන ධර්මයක් නම් නැත. එහෙයින් විදිතාති යන්න කීය. ඉතිරිය සියලු තැන්හි ම ප්‍රකටයි.

**අච්ඡරියධම්ම[1] සූත්‍ර වර්ණනාව නිමි.**

## 3.4.4

**එවමෙමෙසුතනති** මා විසින් බක්කුල සූත්‍රය මෙසේ අසන ලදි. එහි **බක්කුලොති** යම්සේ ද්වාවීසති ද්වත්තිංසති ආදිය කිවයුතු තැන බාවීසති බත්තිංසති යනුවෙන් කියත් ද එසේම ද්වක්කුල ද්වකුල යැයි කිවයුතු තැන බක්කුල යැයි කියන ලදි. ඒ තෙරුන්ට කුල දෙකක් වූහ. උන්වහන්සේ දෙව්ලොවින් චුතව කොසඹෑ නුවර සිටුකුලයක උපන්නේය. ඒ ඔහු පස්වෙනි දවස ස්නානය කොට දිය ක්‍රීඩාව කළහ. කිරිමව දරුවා ජලයෙහි කිමිදවමින් සෙල්ලම් කරවන්නී එක් මත්ස්‍යයෙක් දරුවා දැක මේ මට ගොදුරක් යැයි සිතා කට ඇර පැමිණියේය. කිරිමව දරුවා දමා පැන ගියාය. මත්ස්‍යයා ඔහු ගිල්ලේය. පිනැති සත්වයා දුකට නොපැමිණියේය. නිදන කාමරයකට පිවිස උන්නාක් මෙනි. මත්ස්‍යයා දරුවාගේ තේජසින් රත් වූ තලයක් ගිල දමන්නාක් මෙන් වී වේගයෙන් යොදුන් තිහක

1. අච්ඡරියබ්භූත සූත්‍රය වශයෙන් සමහර තැනක සඳහන් වේ.

මාර්ගයක ගොස් බරණැස් නුවර වැසි මසුන් අල්ලන්නෙකුගේ දැලට පිවිසියේය. මහා මත්ස්‍යයෝ නම් දැලෙහි බැඳුණේ මරනු ලබන්නාහු මැරෙත්. මොහු වනාහි දරුවාගේ තේජසින් දැලෙන් ගත් පමණින් මළේය. මසුන් අල්ලන්නා ද මහත් මහත් මසුන් ලැබ කපා පලා විකුණත්. ඔහු දරුවාගේ අනුහසින් නො කපා නොපලා කදින් ගෙන් ගොස් දහසකින් දෙමු යැයි කියමින් නුවර හැසිරුණේය. කිසිවෙක් නොගනියි.

ඒ නුවර දරුවන් නැති අසූකෝටියක් වස්තුව ඇති සිටුකුලයක් ඇත. ඒ ගේ දොර මුලට පැමිණ කුමක් ගෙන දෙව්දැයි කී කළ කහවනුවකටැයි කීහ. ඔවුන් විසින් කහවණුවක් දී ගන්නා ලදි. සිටු බිරිඳ වෙනත් දවස්වල මසුන් නොපලයි. එදා මාළුවා පුවරුවේ තබා තෙමේම පැලුවාය. මසුන් නම් බඩින් පලත්. ඇය වනාහි පිට පැත්තෙන් පලන්නී මත්ස්‍යයාගේ බඩෙහි රන්වන් දරුවා දැක මත්ස්‍යයාගෙන් මට පුතෙක් ලැබුණේ යැයි නාද කොට දරුවා ගෙන ස්වාමියාගේ ළඟට ගියාය. සිටුතුමා ඒ වේලාවෙහිම බෙර හසුරුවා දරුවා ගෙන රජු ලඟට ගොස් දේවයන් වහන්ස, මා විසින් මත්ස්‍යයෙකුගේ කුසින් දරුවෙක් ලද්දේය. කුමක් කරන්නේදැයි කීය. මොහු පින් ඇත්තෙකි. මාළුවකුගේ කුසෙහි ද නිරෝගීව වාසය කළේය. මොහු පෝෂණය කරවයි රජු කීය. බරණැස් නුවර එක සිටුකුලයක් මත්ස්‍යයෙකුගේ කුසෙන් දරුවෙක් ලැබී යැයි අනෙත් කුලය ඇසුයේය. ඔවුහු එහි ගියාහ. එකල ඔහුගේ මව දරුවා සරසා ක්‍රීඩා කරන්නාහු දැක මේ දරුවා ප්‍රියමනාප යැයි ගෙන ප්‍රවෘත්තිය කීවාය. අනෙක් තැනැත්තිය මාගේ පුතා යැයි කීවාය. තී විසින් කවර තැනකින් ලබන ලද්දේ ද? මත්ස්‍යයෙකුගේ කුසින්ය. තුඹගේ පුත්‍රයා නොවෙයි. මගේ පුත්‍රයාය. තී විසින් කවර තැනකින් ලබන ලද්දේ ද? මා විසින් දස මසක් කුසෙහි දරණ ලද්දේය. එකල මොහු ගංගාවෙහි සෙල්ලම් කරවන කල මත්ස්‍යයෙක් ගිල්ලේය. තුඹේ පුත්‍රයා වෙනත් මත්ස්‍යයෙක් විසින් ගිලින ලද්දේය. මොහු වනාහි මා විසින් මත්ස්‍යයාගේ බඩින් ලබන ලදි. දෙපක්ෂයම රජු ලඟට ගියාහ. මෝ තොමේ දස මාසයක් කුසෙහි දරූ හෙයින් මව නොකරන්නට නොහැකිය. මත්ස්‍යයා ගත්තේ අතුනුබහත් බැහැරකොට ගැනීමක් නම් නැතැයි මත්ස්‍යයාගේ කුසෙන් ලත් හෙයින් මෝ තොමෝ ද මව නොකරන්නට නොහැකිය. දරුවා කුල දෙකටම දායාද වෙයි. දෙගොල්ලෝම ඔහු පෝෂණය කරවයි රජු කීය. දෙකුලයම පෝෂණය කළහ.

නුවණැති බවට පත් ඔහුට නගර දෙකේම ප්‍රාසාදයන් කරවා නාට්‍යාංගනාවන් සේවයේ යෙදවූහ. එක එක නුවර හාර මාසය බැගින් වාසය කරයි. එක නුවරක හාර මාසය බැගින් වාසය කරන ලද ඔහුට එකට බඳනා ලද නැවෙහි මණ්ඩපයක් කොට එහි ඔහු සමඟ නාට්‍යාංගනාවන් නංවත්. ඔහු සම්පත් අනුභව කරමින් අනෙක් නගරයට යයි. ඒ නගරවාසීහු නාට්‍යාංගනාවන් හා අඩමගට ගියාහ. ඔවුහු පෙරගමන් කොට ඔහු පිරිවරා තමන්ගේ ප්‍රාසාදයට පමුණුවති. අනෙත් නාට්‍යාංගනාවන් නැවතී තමන්ගේ නුවරටම යත්. එහි සාර මසක් නැවතී ඒ ක්‍රමයෙන් ම නැවත අනෙත් නුවරට යයි. මෙසේ සම්පත් අනුභව කරන ඔහුට අසූ වර්ෂයක් සම්පූර්ණ විය.

එකල බුදුරදුන් චාරිකාවෙහි හැසිරෙන්නේ බරණැසට වැඩියහ. ඔහු බුදුරදුන් වෙතින් බණ අසා ලබන ලද ශ්‍රද්ධාව ඇත්තේ පැවිදි විය. පැවිදි වී සතියක්ම පෘථග්ජන විය. අට වන දින සිව්පිළිසිඹියා සහිතව රහත්බවට පැමිණියේය. මෙසේ ඔහුට කුල දෙකක් වූහ. එහෙයින් බක්කුල යැයි හැඳින්වීමට ගියේය. පුරාණගිහීසහායොති පෙර ගිහි කාලයෙහි යහළු වූ. මේ තෙමේ ද දීර්ඝායුෂ ඇත්තේ ම පැවිදි වූ තෙරුන් බලන්නට යන්නේ අසූවෙනි වර්ෂයෙහි ගියේය. මෙථුනො ධම්මොති බාල වූ නග්න ශ්‍රමණ තෙමේ ලාමක විචාරීම අසයි. ශාසනයෙහි හැසිරීම පිණිස නොවෙයි. දූත් තෙරුන් විසින් දෙන ලද ක්‍රමයෙහි සිටියේ. ඉමෙහි පන තෙති ඇසීය. යංපායසමාති ආදි පද සියලු වාරයන්හි ධර්ම සංග්‍රාහක තෙරුන් විසින් නියම කොට තබන ලදහ. එහි සංඥාව උපන් ඇසිල්ලේ ම විතර්කය. කර්මපථ භේදය යැයි තෙරුන් වහන්සේ කීහ. කුමක් නිසා තවත් කරයි ද? මේ දෙකම කර්මපථ භේදකය.

ගහපතිචීවරනති වස්සාවාසික සිවුර. සත්ථෙනාති කතුරෙන්. සූචියාති ඉඳිකටුව ගෙන මහන බව සිහි නොකරමි යන තේරුමයි. කඨිනෙ චීවරනති කඨින සිවුරයි. කඨින සිවුර ද වස්සාවාසික සිවුරෙහි ස්වභාවයය. එහෙයින් එහි මැසීම නොදනිමියි කීය. මෙපමණ කලක් ගෘහපති සිවුරු නොඉවසන සිදුණු තැන් මැසීම් නොකරන ඔහුට කොතනින් සිවුරු ලැබුනේ ද? නුවර දෙකෙනි. තෙරුන් වහන්සේ මහත් යසස් ඇත්තාහ. ඔහුගේ දූ දරුවෝ මුනුබුරෝ සියුම් සළුවලින් සිවුරුකොට පඬු පොවා කරඬුවල දමා යවති. තෙරුන් ස්නානය කරන කාලයෙහි නාන කොටුවෙහි තබත්. තෙරුන් වහන්සේ ඒවා අඳිති. පොරවති. පරණ සිවුරු පැමිණි භික්ෂූන්ට දෙති. තෙරුන් වහන්සේ ඒවා ඇඳ පෙරවා අළුත් වැඩක් නොකරයි. කිසියම් රැස්කරන වැඩක් ද නැත. ඵලසමවතට පැමිණ සිටියි. හාර මාසයක්

පැමිණි කල්හි ලොම් කිළිටි වෙයි. එකල්හි ඔහුට එම ක්‍රමයෙන් නැවත යවා දෙත්. අඩ මසක් අඩ මසක් පෙරළා යයි ද කියත්මය. කල්ප ලක්‍ෂයක් පුරන ලද පාරමිතා ඇති මහත් පින් ඇති තෙරුන් වහන්සේගේ මෙය ආශ්චර්ය නොවෙයි.

අශෝක රජුගේ කුළුපග නිග්‍රෝධ ස්ථවිර තෙමේ දවසට තුන් වරක් සිවුරු මාරු කළේය. උන්වහන්සේගේ තුන් සිවුර ඇත් කඳෙහි තබා පන්සියයක් සුවඳ අමුණු හා පන්සියයක් මල් කරඬු සමඟ උදෑසන ම ගෙන එත්. දහවල් ද සවස ද එසේමය. රජු දවසට තුන් වරක් සළු මාරු කරන්නේ තෙරුන් වහන්සේට සිවුරු ගෙන යන ලද්දේ දැයි අසා එසේය ගෙන ගියේ යැයි අසාම මාරු කරයි. තෙරුන් වහන්සේ ද පොදි බැඳ නොතැබූයේය. පැමිණි සබ්‍රම්සරුන්ට දුන්නේය. එකල දඹදිව භික්‍ෂු සංඝයාට බොහෝ සෙයින් නිග්‍රෝධ තෙරුන් සතු සිවුරුම වූහ. කිසිවෙක් මට ආමන්ත්‍රණය කරන්නේය. කිමෙක් ද? සිතේ නොඉපදීම දුෂ්කර ද? ඉපදීමේ ප්‍රහාණය අමාරු ද? සිත නම් වහා පෙරළෙන සුළුය. එහෙයින් නොඉපදීම දුෂ්කරය. උපන් සිත ප්‍රහාණ කිරීමත් දුෂ්කරය.

**අන්‍තරඝරෙති** මහා සකුළුදායි සූත්‍රයෙහි ඉන්ද්‍රඛීලයෙහි පටන් ඇතුළු ගෙය නම් මෙහි නිම්බෝදක වැටෙන තැන සිට යැයි අදහස් කරන ලදි. කොතනින් භික්‍ෂාව උපදී ද? තෙරුන් වහන්සේ නුවර දෙකෙහි දූනීමෙන් ගෙදරට පැමිණියහුගේ පාත්‍රය ගෙන නොයෙක් රස ආහාරවලින් පුරවා දෙති. උන්වහන්සේ ලබන ලද තැනින් නවතියි. බත් කිස කරන තැනට නිරන්තර යාම විය. **අනුව්‍යඤ්ජනසොති** තෙරුන් වහන්සේ විසින් රූපයෙහි නිමිති ගෙන ස්ත්‍රියක් නොබලන ලද විරූය. **මාතුගාමස්ස ධම්මන්ති** ස්ත්‍රියකට වචන පහකින් හයකින් බණ කියන්නට වටියි. ප්‍රශ්න කළොත් ගාථා දහසක් වුවත් කියන්නට වටින්නේමය. තෙරුන් වහන්සේ මෙය කැප වුවද නොකළහ. බොහෝ සෙයින් කුළුපග භික්‍ෂූන්ට ම මේ කටයුත්ත වෙයි. **භික්ඛුනුපස්සයන්ති** භික්‍ෂුණීන්ගේ ආරාමයයි. එයට ගිලන් පෘච්ඡකයා විසින් යන්නට වටියි. තෙරුන් වහන්සේ කැප නොකළහ. සියලු තැන්හිම මේ ක්‍රමයයි. **චුණ්ණානාති** කොහොඹ චූර්ණ ආදියෙන්. **ගත්තපරිකම්මෙති** ශරීරය පිරිමැදීම් කර්මයෙහි. **ව්‍යාපජ්ජිතාති** යොදවන ලද **ගද්දුහනමත්තන්ති** දෙනගේ තනය ගෙන එක කිරි බින්දුවක් දොවන කාල ප්‍රමාණයයි. කවර කාරණයකින් තෙරුන් වහන්සේ නිරෝගී වීද? පදුමුත්තර බුදුරදුන් භික්‍ෂූන් ලක්‍ෂයක් පිරිවරා චාරිකාවෙහි හැසිරෙන කාලයෙහි හිමාලයෙහි විස ගස්වල මල් පිපුණාහ. ලක්‍ෂයක් භික්‍ෂූන්ට තිණ පුෂ්පික රෝගය ඇති විය. තෙරුන් වහන්සේ ඒ කාලයෙහි සෘද්ධි ඇති තවුසෙක් විය. ඔහු අහසින් යන්නේ

භික්ෂු සමූහයා දැක බැස ලෙඩ අසා හිමාලයෙන් බෙහෙත් ගෙන දුන්නේය. සිඹින ලද පමණකින්ම ලෙඩ සුව විය.

කාශ්‍යප බුදුරදුන්ගේ කාලයේ ද පළමු වප් මඟුල් දවසෙහි වප් මඟුල තබා භික්ෂු සංඝයාගේ පරිභෝගයට ගිනිහල් ශාලාවක් ද වැසිකිළියක් ද කරවා භික්ෂු සංඝයාට බෙහෙත් වැටක් තැබුවේය. මේ පුණ්‍ය කර්මයෙන් නිරෝගී වූයේය. මේ තෙමේ උත්කෘෂ්ට භේසජ්ජිකය. උත්කෘෂ්ට ආරණ්‍යකය. එහෙයින් නොදනිමි. **අපසෙසනකං අපසෙසතාති** යනාදිය කීය. **සරණොති** කෙලෙස් සහිතය. **අඤ්ඤා උදපාදීති** අනුපසම්පන්නයාට රහත් බව කියන්නට නොවටියි. තෙරුන් වහන්සේ කුමක් හෙයින් ප්‍රකාශ කළේ ද? තෙරුන් වහන්සේ මම රහත් යැයි නොකීය. ඤාණය පහළවීයැයි කීය. එහෙත් තෙරුන් වහන්සේ රහත් යැයි ප්‍රසිද්ධය. කුමක් හෙයින් මෙසේ කීයේ ද?

**පබ්බජන්ති** තෙරුන් වහන්සේ තෙමේ පැවිදි නොකරයි. උපසම්පදා නොකරයි. අනුන් ලවා මෙසේ කරවූහ. **ආපාපුණං ආදායාති** යතුර ගෙන. **නිසින්නකො පරිනිබ්බායීති** මම ඉන්න කාලයේ දී අනෙත් භික්ෂුවකට කරදර නොවූයෙමි. පිරිනිවි මාගේ ශරීරය ද භික්ෂු සංඝයාට කරදර නොවේවායි තේජෝ ධාතුවට සමවැද පිරිනිවියහ. ශරීරයෙන් ගිනි දැලි නැංගේය. සම් මස් ලේ ගිතෙල් මෙන් දැවී ක්ෂය වූයේය. සමන් කැකුළු හා සමාන ධාතු ඉතිරි විය. ඉතිරිය සියලු තැන්හිම ප්‍රකටය. මේ සූත්‍රය දෙවන සංගායනාවේ දී සංග්‍රහ කරන ලදි.

**බක්කුල සූත්‍ර වර්ණනාව නිමි.**

## 3.4.5

**එවමෙමසුතනති** මා විසින් දන්තභූමි සූත්‍රය මෙසේ අසන ලදි. එහි **අරඤ්ඤකුටිකායනති** ඒ වේළුවනයට එක් හිස් ස්ථානයක ප්‍රධන් කර්මය කරන භික්ෂූන් උදෙසා කරන ලද සේනාසනයෙහි. **රාජකුමාරොති** බිම්බිසාරගේ ඖරස පුත්‍රයා. **ඵුසෙයයාති** ලබන්නේ ය. **එකගගතනති** මෙසේ පිළිපදින්නේ සමාපත්තිය නම් ලබයි. ධ්‍යානය නම් ලබයි යනුවෙන් මෙය මා විසින් අසන ලද යැයි කියයි. **කිලමථොති** ශරීරයේ ක්ලාන්තයයි. විහේසාව ද ඒ ක්ලාන්තයමැයි කියන ලදි. **යථා සකෙ තිත්ථෙයයාසීති**

තමාගේ නොදන්නා කොටසෙහිම සිටින්නේය. **දෙසෙතීති** සිතේ එකඟබව නම් මෙසේ ලබයි. සමාපත්තිය මෙසේ උපදවයි. අර්පනා උපචාරයට පමුණුවා එක කසින කර්මයක් කීය. **පවෙදෙත්වාති** ප්‍රකාශ කොට. **නෙක්ඛම්මෙන ඤාතබ්බන්ති** කාමයෙන් හරින ලද ගුණයෙන් දත යුතුයි. කාමයෙන් හරින ලද ගුණයෙහි සිටි පුද්ගලයා විසින් එකඟබව නම් දත යුතුයි යන අදහසින් මෙය කියන ලදි. ඉතිරිය එයට ම පර්යාය වචනයි. **කාමෙ පරිභුඤ්ජන්තොති** දෙවැදෑරුම් කාමයන් අනුභව කරන්නේ. ඇතුන් දමනය හෝ අශ්වයන් දමනය හෝ ගවයන් දමනය හෝ මෙහි දමනය නොවූ ඇතුන් දමනය කිරීමාදිය මෙන් සිත එකඟ නැති පුද්ගලයෝ දත යුතුයි. දමනය වූ ඇතුන් දමනය කරන්නාක් මෙන් සිත එකඟ බැවින් සම්පූර්ණ වූ යම්සේ නොදමුණු ඇතුන් දමනය කරන්නවුන් ආදිහු කුළුගෙයක් නොකොට ධුරය නොදමා දමුණු ගමනට යන්නට හෝ දමුණවුන් විසින් පැමිණිය යුතු බිමට පැමිණෙන්නට නොහැකි වෙත්. **හත්ථිලංගකෙනාති** අතින් අත ගෙන. **දට්ඨය්‍යන්ති** දැකිය යුතු **ආවටොති** අවුරණ ලද. **නිවුටොති** වළකන ලදි. **ඔවුටොති** වැසුණු **නාගවනිකන්ති** ඇත් උපමාවෙහි ඇත් වනයෙහි හැසිරෙන පුද්ගලයා නාගවනිකයා යැයි කියන ලදි. මෙහි ඇතුන් හික්මවීමෙහි දක්ෂයා ඇතුන් ගැනීමට සමත් වෙයි. **අතිපස්සිත්වාති** දැක. **එතගෙධාති** මෙහි පැවැති. **සරසංකප්පානන්ති** වාක් සංකල්පයන්ගේ. **මනුස්සකන්තෙසු සීලෙසු සමාදපනායාති** මෙහි යම්සේ ඇතා ස්ත්‍රිය පුරුෂය කුමාරය කුමාරිකාව යන මොවුන් විසින් සොඬ ආදියෙන් ගෙන ක්‍රීඩා කරන්නේ විකාරයක් නොකරයි. සැපසේ වෙයි. එකල මෙම ක්‍රමයෙන් මිනිසුන්ට කැමැති සීලයන් සමාදාන නම් වෙයි. **පෙමනීයාති** දරුව. රජු නුඹට පැහැදුනේ. මඟුල් ඇතු තනතුරෙහි තබන්නේ ය. රජුන්ට සුදුසු ආහාර ලබන්නේ ය. මෙබඳු ඇතුන් විසින් ප්‍රිය උපදවන කථාවයි. **සුස්සූසතීති** ඒ ප්‍රිය උපදවන කථාව ඇසීමට කැමැති වෙයි. **තිණඝාසොදකන්ති** තණ කෑම ද ජලය ද, **තිණඝාසන්ති** යනු කෑයුතු තණ කෑ යුතුයි යන තේරුමයි. **පණවොති** බෙර විශේෂයකි. **සබ්බවංකදොස නිහිත නින්නිතකසාවොති** හරින ලද සියළු වංක දෝෂ ද හරින ලද කසට වස්ත්‍ර ඇත්තේ ද **අංගනෙතව සංඛං ගච්ඡතීති** ශරීරය සමාන වෙයි. **ගෙහසිත සීලානන්ති** පස්කම් සැප නිශ්‍රිත සීලයන්. **ඤායස්සාති** ආර්ය අෂ්ඨාංගික මාර්ගයට. **අදන්තමරණං මහලලකො රඤ්ඤො නාගො කාලකතොති** රජු මහළුය. ඇතා දමනය නොවී මරුණේය. **කාලකතොති** යනු අදන්ත මරණ කාලක්‍රියාව යන තේරුමයි. සියලු තැන්හි ම මේ ක්‍රමයයි. ඉතිරිය ප්‍රකටය.

**දන්තභූමි සූත්‍ර වර්ණනාව නිමි.**

## 3.4.6

එවමෙමසුතනති මා විසින් භූමිජ සූත්‍රය මෙසේ අසන ලදි. එහි භූමිජොති මේ තෙරුන් වහන්සේ ජයසේන රාජ කුමාරයාගේ මාමා ය. ආසඤ්ච අනාසඤ්චාති කාලයකට ආශා ඇතිව ද කාලයකට ආශා නැතිව ද සකෙන ථාලිපාකෙනාති ප්‍රකෘතියෙන් පැවැති භික්‍ෂාව ද පැවැති භික්‍ෂාව ද තමාගේ නිමවන ලද බතින් ද වැළඳුයේය. ඉතිරිය සියලු තැන්හිම ප්‍රකටය.

භූමිජ සූත්‍ර වර්ණනාව නිමි.

## 3.4.7

එවමෙමසුතනති මා විසින් අනුරුද්ධ සූත්‍රය මෙසේ අසන ලදි. එහි එවමාහංසූති ඒ උපාසකයාගේ අපහසු කාලය විය. එකල්හි පැමිණ මෙසේ කීහ. අපණ්ණකනති විරුද්ධ නොවූ. එකට්ඨාති අප්‍රමාණ වූ හෝ මහර්ඝ වූ හෝ ධ්‍යානය ම සිතේ එකඟබවමය. එවං වුච්චතීති මේ සඳහා මෙසේ කීය. යාවතා එකං රුක්ඛමූලං මහග්ගතනති එරිත්වා අධිමුච්චිතා විහරතීති එක් ගසක් මුල ප්‍රමාණස්ථාන කසින නිමිත්තෙන් පැතිර ඒ කසින නිමිත්තෙහි මහද්ගත ධ්‍යානය පැතිර මිදී වාසය කරයි. මහද්ගතයාගේ ආභෝගයක් නැත. හුදෙක් මහද්ගත ධ්‍යානයෙන් පැවතීම් වශයෙන් මෙය කියන ලදි. සියලු තැන්හි ම මේ ක්‍රමයයි. ඉමිනා ඛො එතං ගහපති පරියායෙනාති මේ කාරණයෙන්. මෙහි අප්‍රමාණ යැයි කියන ලද බ්‍රහ්ම විහරණයන්ගේ නිමිත්ත නොවැඩෙයි. ඇරීම නූපදියි. ඒ ධ්‍යාන අභිඥාවන්ගේ නිරෝධයට පාදක නොවෙත්. විදර්ශනා පාදකයෝ ද වෘත පාදකයෝ ද භවයේ ආක්‍රමයට පැමිණෙත්. මහද්ගත යැයි කියන ලද කසින ධ්‍යානයේ නිමිත්ත වැඩෙත්. ඇරීම උපදියි. සමතික්‍රමය වෙයි. අභිඥා පාදකත් නිරෝධ පාදකත් වෘත පාදකත් භවෝක්‍රමය වෙත්.

එවම්මෙ ධම්මා නානට්ඨා අප්පමාණා මහග්ගතාති මෙසේ නොයෙක් නොයෙක් ව්‍යඤ්ජනයි. දැන් මහද්ගත සමාපත්තියෙන් ගෙනහැර භවයාගේ ඉපදීමට කාරණය දක්වන්නේ චතසෙසා ඛො ඉමාති යනාදිය කීය.

**පරිත්තාභාති** පැතිර දන්නා තැනැත්තාට මේ ආභෝගය ඇත. පරිත්තසුභ දෙවියන් කෙරෙහි උපදින කාරණය ධ්‍යාන වඩන්නේ මෙසේ කියන ලදි. සියලු තැන්හිම මේ ක්‍රමයයි. පරිත්තාභයෝ කිළිටු එලිය ඇත්තෝ ද පිරිසිදු එලිය ඇත්තෝ ද වෙත්. අප්‍රමාණභා දෙවියෝ කිළිටු එලිය ඇත්තෝ ද පිරිසිදු එලිය ඇත්තෝ ද වෙත්. කෙසේද යත්? කුල්ලක් ප්‍රමාණ වූ ද නැඹිලියක් ප්‍රමාණ වූ ද කසිනයෙහි පරිකර්ම කොට සමාපත්ති උපදවා පස් ආකාරයකින් ආචීර්ණ වශීබව පච්චනීක ධර්මයන්ගේ මනාකොට පිරිසිදු නොකරන ලද බැවින් දුර්වල වූ සමාපත්තිය වළඳා ප්‍රගුණ නොවූ ධ්‍යානයෙහි සිට කළුරිය කොට පරිත්තාභයෙහි උපදියි. ඔහුගේ පැහැය ද ස්වල්පය. කිළිටි ද වෙයි. ආකාර පහෙන් ආචීර්ණයෙහි වශීබව පච්චනීක ධර්මයන්ගේ මොනවට පිරිසිදු කරන ලද හෙයින් ඉතා පිරිසිදු සමාපත්තිය වළඳා ප්‍රගුණ ධ්‍යානයෙහි සිට කළුරිය කොට පරිත්තාභයෙහි උපදියි. ඔහුගේ පැහැය ස්වල්ප වූයේ ද පිරිසිදු යැයි වැටහෙයි. මෙසේ එලිය ස්වල්ප වුවත් පිරිසිදුය. කසිනයෙහි මහත් පරිකර්මයංකාට සමාපත්තිය උපදවා ආකාර පහකින් ආචීර්ණයාගේ වශී බවයි. සියල්ල පළමු පරිද්දෙන් ම දත යුතුයි. එසේම අප්‍රමාණභා දෙවියෝ කිළිටි එලිය ද පිරිසිදු එලිය ද ඇත්තෝ වෙත්. **වණ්ණනානත්තනන්ති** ශරීර වර්ණයේ නොයෙක් බවයි. **නො ච ආභානානත්තනන්ති** එලියෙහි නොයෙක් බව නොපෙනෙයි. **අච්චි නානත්තනන්ති** දිග කොට සියුම්ගත වශයෙන් දූල්ලේ වෙනස් ආකාරයයි. **යත්‍ථ යත්‍ථාති** උයන් විමන් කප්රුක් ගං ඉවුරු පොකුණු යන මොවුන්ගේ ඉවුරුවලින් යම් යම් තැනක. **අධිවසන්තීති** වාසය කරත්. **අභිරමන්තීති** ඇලෙත්. කලනොකිරෙත්. **කාජෙනාති** කැඳබත් තෙල් පැණි මස් මාංශ යන මොවුන් අතුරෙන් යම්කිසි කඳකින්. **කාචෙනාති** යන පදයේ ද මේ තේරුමයි. **පිටකෙනාති** පැසෙන්. **තත්‍ථ තත්‍ථෙනන්ති** ගිතෙල් මීපැණි ආදීන්ගේ සුලභ ස්ථානයකින් ලුණු මස් ආදීන්ගේ උත්සන්න ස්ථානයයි. එය පෙර අපේ වසන තැන පහසුය. එහි වසමු. මෙහි ලුණු වාතයෙන් බාධා කරයි. කුණු මාලු ගඳ හිසේ ලෙඩ උපදවයි. මෙසේ සිත නූපදවා එහි එහි ම ඇලෙයි.

**ආභාති** එලියෙන් යුක්ත වූ. **තදංගෙනාති** ඒ භවයාගේ උප්පත්තියට කාරණා හෙයින් භව උත්පන්න කාරණය යන තේරුමයි. දූන් ඒ කාරණය අසන්නේ **කො නු බො භන්තෙති** යනාදිය කීය. **කායදුට්ඨුල්ලන්ති** ශරීරයේ අලස බවයි. **ඣායතොති** දිලිසෙමින්. **දීඝරත්තං බො මෙති** තෙරුන් වහන්සේ පාරමිතා පුරන්නේ සෘෂි පැවිද්දෙන් මහණව සමාපත්ති උපදවා නිතර ආත්මභාව තුන්සියයක් බඹලොව ප්‍රතිසන්ධිය ලැබීය. ඒ සඳහාම කියන ලදි. එහෙයින් කියන ලදි. ඉතිරිය සියලු තැන්හි ම ප්‍රකටය.

අනුරුද්ධ සූත්‍ර වර්ණනාව නිමි.

## 3.4.8

**එවමෙමසුතනති** මා විසින් උපක්කිලෙස සූත්‍රය මෙසේ අසන ලදි. එහි **එතදවොචාති** භේද අදහසකින් නොවේ. කැමැත්තකින් නොවේ. එකල ඔහුට මෙබඳු සිතක් වීය. මේ භික්ෂූහු මාගේ වචනය ගෙන යටත් නොවෙයි. බුදුවරු නම් හිත කැමැත්තෝය. ඒකාන්තයෙන් බුදුරදුන් මේ කාරණය කියන්නෝය යැයි එය අසා මොහු යටත් වන්නාහුය. එහෙයින් ඔවුනට සැප විහරණය වන්නේය. එහෙයින් මෙහි ඉධ භන්තෙ යනාදි වචන කීය. **මා භණ්ඩනනති** ආදියෙහි **අකෘථාති** යන පදයේ ඉතිරිය ගෙන කලහ නොකරව් යන තේරුම දතයුතුයි. **අඤඤතරොති** ඒ භික්ෂුව වනාහි බුදුරදුන්ට වැඩ කැමැතිය. මේ ඔහුගේ අදහසයි. මේ භික්ෂූහු ක්‍රෝධයෙන් මඩනා ලද්දාහු බුදුරදුන්ගේ වචනය නොගනිත්. බුදුරදුන් මොවුන්ට අවවාද කරන්නේ වෙහෙස නොවේ යැයි එහෙයින් කීය.

**පිණ්ඩාය පාවිසීති** හුදෙක් පිවිසියේ නොවෙයි. යම් මිනිසුන් විසින් නොදක්නා ලද ද ඔවුහු මා දකීවා යි අධිෂ්ඨාන කළහ. කුමක් නිසා අධිෂ්ඨාන කළේ ද? ඒ භික්ෂූන්ගේ දමනය පිණිසයි. බුදුරදුන් එකල්හි පිණ්ඩපාතයෙන් වැළකුණේ **පුථුසද්දො සමජනොති** ආදී ගාථාවන් කියා කොසඹෑ නුවරින් බාලකලෝණකාර ගමට වැඩියහ. එයින් ප්‍රාචීනවංසදායට වැඩියහ. එයින් පාරිලෙය්‍යක වන ලහැබට ගොස් පාරිලෙය්‍ය ඇතා විසින් උපස්ථාන කරන්නේ මාස තුනක් විසූහ. නුවර වැස්සෝ ද බුදුරදුන් වෙහෙරට වැඩියේය. බණ අසන්නට යමු යැයි සුවඳ මල් ගත් අත් ඇතිව වෙහෙරට ගොස් ස්වාමීනි, බුදුරදුන් කොහිදැයි ඇසූහ. නුඹලා බුදුරදුන් කොහි දී දක්කාහු ද? බුදුරදුන් මේ භික්ෂූන් සමඟි කරන්නෙමියි වැඩියහ. සමඟි කරන්නට නොහැකි වූයේ ආපසු වැඩියහ. අපි සීයක් ද දහසක් ද දී බුදුරදුන් වැඩමවන්නට නොහැක්කෙමු. උන්වහන්සේ අප ආරාධනා නොකොට ම වැඩියහ. අපි මේ භික්ෂූන් නිසා බුදුරදුන්ගේ හමුවෙන් බණ කථාවක් අසන්නට නොලැබුයෙමු. මොවුහු බුදුරදුන් උදෙසා පැවිදි වූහ. මොවුන් සමඟි කරන්නේ සමඟි නොවූහ. අන් කවරෙකුගේ වචනයක් කරත් ද? මේ භික්ෂූන්ට දානය දීම සුදුසු නැතැයි සියළු නගරයෙහි ම දඬුවම් තැබූහ. ඔවුහු දෙවන දවසෙහි සියලු නගරයෙහි පිඬු පිණිස හැසිර හැන්දක් පමණවත් ආහාරයක් නොලැබ වෙහෙරට වැඩියහ. උපාසකවරු නැවත ඔවුන්ට මෙසේ කීහ. යම්තාක් බුදුරදුන් ක්ෂමා නොකර ගනිත් ද ඒතාක් නුඹලාට මේ දඬුවමයි. ඔවුහු බුදුරදුන් ක්ෂමා කරගන්නෙමියි බුදුරදුන් සැවැත් නුවරට වැඩි කල්හි එහි ගියාහ. බුදුරදුන් ඔවුන්ට අටළොස් භේදකර

වස්තූන් දෙසුවේ යැයි මේ මෙහි පාලිමුත්තක කථාවයි. දූන් පුථුසදොති ආදී ගාථාවන්හි මහා ශබ්දය මොහුගේය. මෙය පුථුශබ්දය නම්.

**සමජනොති** සමාන වූ එක සමාන ජනයා මේ සියලු ජනයා කලහ කරන ජනයාය. හාත්පසින් ශබ්දය පැතිරීමෙන් පුථු ශබ්දය සමාන යැයි කියන ලද්දේ වෙයි. **න බාලො කොචි මඤ්ඤථාති** එහි කිසිවෙක් මම බාලයෙක් යැයි නොසිතත්. සියල්ලෝ පණ්ඩිතමානී වෙත්. **නාඤ්ඤංභියෝ‍යා අමඤ්ඤරුන්ති** කිසිවෙක් මම බාලයෙක් යැයි නොසිතයි. බොහෝ සෙයින් සංඝයා බිඳෙන කල්හි අන්‍ය වූ ද එක් අයෙක් මාගේ කාරණයෙන් සංඝයා බිඳේය යන මේ කාරණය නොසිතුවේය යන තේරුමයි. **පරිමුට්ඨාති** සිහිමුළා ඇත්තාහ. **වාචාගොචරභාණිනොති** රා කාරයට ර කාරාදේශය කරන ලදි. වචනය ම ගෝචරය. සතිපට්ඨානය ගෝචර නොවෙයි. **භාණිනොති** යනු කෙසේ හෝ කියන්නේය. යම්තාක් කැමැති වෙත් ද මුඛය ප්‍රසාරණය කරන්නට යම්තාක් කැමැති වෙත් ද ඒතාක් දිගු කොට කියන්නාහුය. එක් අයෙක්වත් සංඝ ගෞරවයෙන් මුඛය හැකිලීමක් නොකෙරේ යන තේරුමයි. **යෙන නීතාති** යම් කලහයකින් මේ ලැජ්ජා නැතිබවට පමුණුවන ලද්දේය. **න තං විදූති** එය නොදනිත්. මෙසේ මේ තෙමේ ආදීනව සහිතයි. **යෙ තං උපනය්හන්තීති** ඔහුට ආක්‍රෝශ කළේය. මේ තෙමේ මට බැන්නේය යනාදි ආකාර යමෙක් ක්‍රෝධ කරත්. **සනන්තනොති** පුරාණ **පරෙති** පණ්ඩිතයන් හැර එයින් අනෙත් කලහකාරයෝ අන්‍යයෝ නම්. ඔවහු මෙහි සංඝයා මැද කලහ කරන්නේ අපි නැසෙන්නෙමු. නිතර මරුගේ සමීපයට යන්නෙමු යැයි නොදනිත්. **යෙ ච තත්‍ථ විජානන්තීති** යම් පණ්ඩිත කෙනෙක් අපි මරුගේ සමීපයට යමු යි දනිත්. **තතො සම්මන්ති මෙධගාති** මෙය දන්නෝ යෝනිසෝමනසිකාරය උපදවා කෝලාහලයන්ගේ සංසිඳීම පිණිස පිළිපදිත්. **අට්ඨිච්ඡිදාති** මේ ගාථාව ජාතකයෙහි ආවාය. බ්‍රහ්මදත්ත හා දීඝායු කුමාරයා සඳහා කියන ලදි. මේ එහි තේරුමයි. ඔවුන්ගේ ද එසේ පැවැති වෛරයන්ගේ එක්වීම වෙයි. කුමක්හෙයින් නුඹගේ නොවෙයි ද? යම් බඳු වූ නුඹගේ මව්පියන්ගේ ඇට නොසිඳන ලද්දාහ. ප්‍රාණය නොහරින ලදහ. ගවයෝ ද වස්තුව ද පැහැර නොගන්නා ලදහ. **සචෙ ලභෙථාති** යනාදී ගාථා පණ්ඩිත යහළුවාගේ ද බාල යහළුවාගේ ද ගුණාගුණ ප්‍රකාශ කිරීම පිණිස කියන ලදි.

**අභිභුය්‍ය සබ්බානි පරිස්සයානීති** ප්‍රකට විපත ද වැසුණු විපත ද මැඩපවත්වා. ඔහු සමඟ සතුටුවූයේ සිහි ඇතිව හැසිරෙන්නේය. **රාජාව රට්ඨං විජිතන්ති** යම්සේ තමාගේ රට හැර මහාජනක රජු ද අරින්ද මහරජු ද හුදකලාව හැසිරුණාහ. එසේ හැසිරෙන්ණේය යන තේරුමයි.

**මාතංගරඤ්ඤෙව නාගොති** වනයෙහි හස්ති රාජයෙකු මෙනි. මාතංග නම් ඇතා යැයි කියයි. නාගොති මෙය මහත් අයට කියන නමි. යම්සේ මාතෘපෝෂක මාතංග තෙමේ කැලේ තනියම හැසිරුණේ ද පව් නොකළේය. යම්සේ පාරිලෙය්‍යක ද මෙසේ තනිවම හැසිරුණේ පව් නොකළේ යැයි කියන ලදි. **බාලකලොණකාරගාමොති** උපාලි ගෘහපතියාගේ භෝග ග්‍රාමයයි. **තෙනුපසංකමීති** කුමක් හෙයින් පැමිණුනේ ද? සමූහයා කෙරෙහි දෝෂය දක තනිව වාසය කරන භික්ෂූහු දකිනු කැමැත්ත පහළ විය. එහෙයින් ශීතාදියෙන් පෙලුණේ උණුසුම් ආදිය පතන්නාක් මෙන් පැමිණියාහ. **ධම්මියා කථායාති** හුදකලාබවෙහි ආනිසංසයෙන් යුතු. යෙන **පාචීනවංසදායොති** එහි කුමක්හෙයින් පැමිණියේ ද? කලහ කිරීමෙහි ඔවුන්ගේ දොස් දක සමගිව වසන භික්ෂූන් දකිනු කැමැත්ත පහළ විය. එහෙයින් ශීතාදියෙන් පෙලුණේ උණුසුම් ආදිය පතන්නාක් මෙන් පැමිණියාහ. **ආයස්මා ච අනුරුද්ධොති** ආදිය කියන ලද ක්‍රමයටයි. **අපි පන වොති** පසුව විචාරීමෙන් ලෝකෝත්තර ධර්මය විචාරන්නේය. එය වනාහි තෙරවරුන්ට නැත. එහෙයින් එය ඇසීමට නොවටියි. පරිකර්ම අවකාශය අසයි. **ඔභාසං චෙව සඤ්ජානාමාති** පරිකර්මෝභාසය හඳුනමු. **දස්සනඤ්ච රූපානන්ති** දිවැසින් රූප දැකීම ද හඳුනමු. **තඤ්ච නිමිත්තං න පටිවිජ්ඣාමාති** ඒ කාරණය ද නොදනිමු. යම්හෙයකින් අපගේ එළිය ද රූප දැකීම ද අතුරුදහන් වෙයි. එය අපගේ අනුකූලයෙන් නිමිත්ත ප්‍රතිවේධ කළයුතු යැයි අප විසින් ඒ කාරණය දත යුතුයි. **අහම්පි සුදන්ති** තුඹලා අනුකූලය. කිමෙක් ද? නො කළඹන්නාහු ද? මම ද මේ එකොළොස් ක්ලේශයන්ගෙන් කළඹන ලද විරූ යැයි දක්වන්නට මේ දේශනාව පටන් ගත්තේය. **විචිකිච්ඡා ඛො මෙති** යනාදියෙහි මහා සත්වයාට එළිය වර්ධනය කොට දිවැසින් නොයෙක් ආකාරයේ රූප දැක මේ කුමක්දැයි සැකය පහළ විය. **සමාධි චවීති** පරිකර්ම සමාධිය චුත විය. **ඔභාසොති** පරිකර්ම ඕභාසය අතුරුදහන් විය. දිවැසින් රූපය නොදැක්කේය. **අමනසිකාරොති** රූපයන් බලන්නහුට සැකය උපදියි. දැන් කිසිවෙක් සිහි නොකරන්නෙමියි අමනසිකාරය පහළ විය. **ථීනමිද්ධන්ති** කිසිවක් සිහි නොකරන්නාහට ථීනමිද්ධය පහළ විය. **ඡම්භිතත්තන්ති** හිමාලයට අභිමුඛව එළිය වඩා දානව රකුසා පිඹුරු ආදීන් දැක්කේය. එකල ඔහුට තැති ගැනීමක් විය. **උබ්බිල්ලන්ති** මා විසින් දක්නා ලද බිය ප්‍රකෘතියෙන් බැලීමක් නම් නැත. නොදක්නා ලද කල්හි කිනම් බියක් දැයි සිතන්නාහට තැතිගැනීම් ඇති විය.

CS Scanned with CamScanner

**සකිදෙවාති** එක ප්‍රයෝගයෙන් ම නිදන් සැලි පහක් බලන්නේය. **දුට්ඨුල්ලන්ති** මා විසින් වීර්ය දැඩි කොට ගන්නා ලදි. එහෙයින් මට තැතිගැනීම උපන්නේ යැයි වීර්ය ලිහිල් කළේය. එහෙයින් ශරීරයෙහි අලසබව ඇති විය. **අච්චාරද්ධවිරියන්ති** මාගේ වීර්ය ලිහිල් කරන්නේ අලසබව උපන්නේය. නැවත වීර්ය ගනිමින් සිටිය දී වීර්ය පහළ වූයේය. **පතමෙය්‍යාති** මැරෙන්නේය **අතිලීනවිරියන්ති** මාගේ වීර්ය ඉගෙන ගනිමින් සිටිය දී මෙසේ හටගත්තේ යැයි නැවත වීර්ය ලිහිල් කරමින් සිටිය දී ඉතා සැඟවුණු වීර්ය ඇති විය. **අභිජප්පාති** දිව්‍ය ලෝකයට අභිමුඛව එළිය වඩා දිව්‍ය සමූහයා බලා සිටිය දී තෘෂ්ණාව ඇති විය. **නානත්තසඤ්ඤාති** මාගේ එක් ජාතියක වූ රූපය මෙනෙහි කරමින් සිටිය දී තෘෂ්ණාව ඇතිවිය. නොයෙක් ආකාර රූප සිහි කරන්නෙමියි කලකින් දිව්‍ය ලෝකයට අභිමුඛව ද කලකින් මනුෂ්‍ය ලෝකයට අභිමුඛව ද වඩා නොයෙක් රූප සිහිකරන්නාහට නානත්ත සංඥාව පහළ වූයේය. **අතිනිජ්ඣායිතත්තන්ති** නොයෙක් ප්‍රකාර රූප සිහිකරන මාහට නානත්ත සංඥාව පහළ විය. ඉෂ්ට වූ ද අනිෂ්ට වූ ද එකම ජාතියක රූප සිහි කරන්නෙමියි එසේ සිහි කරන්නාහට අතිනිජ්ඣායිත රූපය පහළ විය. **ඔභාසනිමිත්තං මනසිකරොමීති** පරිකර්ම ඕභාසය ම සිහි කරමි. **න ච රූපානිපස්සාමීති** දිවැසින් රූප නොබලන්නෙමි. **රූපනිමිත්තං මනසිකරොමීති** දිවැසින් විෂය රූපය ම සිහි කරමි. **පරිත්තං චෙව ඔභාසන්ති** ස්වල්ප කමටහනෙහි එළිය. **පරිත්තානි ච රූපානීති** ස්වල්ප කමටහනෙහි රූප. විපර්යාසයෙන් දෙවැනි වාරය දත යුතුයි. **පරිත්තො සමාධීති** ස්වල්ප වූ පරිකර්ම එළියයි. ඕභාස පරිත්තබව සඳහා මෙම පරිකර්ම සමාධි පරිත්ත යැයි කියන ලදි. **පරිත්තං තස්මිං සමයෙති** ඒ කාලයෙහි දිවැස ද ස්වල්ප වෙයි. අප්‍රමාණ වාරයෙහි ද මේ ක්‍රමයයි. **අතක්කම්පි විචාරමත්තන්ති** පංචකවිනයෙහි දෙවන ධ්‍යාන සමාධියයි. **අතක්කම්පි අවිචාරන්ති** චතුක්කවිනයෙහි ද පංචකවිනයෙහි ද ධ්‍යානත්‍රය සමාධියයි. **සප්පීතිකන්ති** දෙවන හා තුන්වන සමාධියයි. **නිප්පීතිකන්ති** තුන්වන හා හතරවන ධ්‍යාන සමාධියයි. **සාතසහගතන්ති** තුන්වන හා හතරවන ධ්‍යාන සමාධියයි. **උපෙක්ඛා සහගතන්ති** හතරවන ක්‍රමයෙහි හතරවන ධ්‍යාන සමාධියයි. පස්වන ක්‍රමයෙහි පස්වන ධ්‍යාන සමාධියයි. කවරකලෙක බුදුරදුන් මේ ත්‍රිවිධ සමාධිය වැඩුයේ ද? මහ බෝ මුල වැඩ සිටියේ පශ්චිම යාමයෙහිය. බුදුරදුන්ට පළමු මාර්ගය ප්‍රථම ධ්‍යානය විය. දෙවන ආදිය ද්‍විතිය තෘතීය චතුර්ථ ධ්‍යාන වූහ. පස්වන ක්‍රමයෙහි පංචම ධ්‍යානයට මාර්ගය නැත. **සො ලොකියො අහොසීති** ලෞකික ලෝකෝත්තර මිශ්‍රබව සඳහා මෙය කියන ලදි. ඉතිරිය සියලු තැන්හි ම ප්‍රකටය.

**උපක්කිලෙස සූත්‍ර වර්ණනාව නිමි.**

# 3.4.9

**එවමෙමසුතනති** මා විසින් බාලපණ්ඩිත සූත්‍රය මෙසේ අසන ලදි. එහි **බාලලකඛණානීති** මේ තෙමේ බාලයා යැයි මෙයින් පෙනෙන්නේ ද දක්නට ලැබෙන්නේ ද බාල ලක්‍ෂණයයි. ඒවා ඔහුගේ හැඳිනීමට කාරණාවන්ය. **බාලනිමිත්තානි** බාලයාගේ හැසිරීමයි. **බාලාපදානාති** බාලයාගේ ජීවිත කථාවයි. **දුච්චින්තිතචින්තීති** සිතන්නේ අභිධ්‍යා ව්‍යාපාද බොරු දැකීම් වශයෙන් නපුරු වචනයක් ම කියයි. **දුක්කත කම්මකාරීති** කරන්නේ ද සතුන් මැරීමාදී වශයෙන් නරක කටයුත්තක් ම කරයි. **තත්‍ර චෙති** යම්තැනක සිටියේ එතැන **තජ්ජං තස්සාරුප්පනති** ඒ ජාතියෙහි එයට සුදුසු වූ පංච වෛරයන්ගේ මෙලොව පරලොව සම්බන්ධ දොස්වලින් යුක්තය යන අදහසයි. **තත්‍රාති** ඒ කථාවෙන් කියන කල්හි. **බාලනති** යනාදිය ෂට්ඨී අර්ථවත් ද්‍විතියා විභක්තියයි. **ඔලම්බන්තීති** වැටහෙත්. සෙසු පද දෙක ද එයට ම පර්යාය වචනයි. එල්බෙන ආකාරයෙන් ඒවා වැටහෙත්. එහෙයින් මෙසේ කියන ලදි. **පඨවියා ඔලම්බන්තීති** පොළොවෙහි පැතිරෙත්. සෙසු පද දෙක ද මෙයට ම පර්යාය වචනයි. මෙය පැතිරෙන ආකාරයයි.

**තත්‍ර භික්ඛවෙ බාලස්සාති** එහි වැටහෙන ආකාරයෙන් ඇසට හමු වූ කාලයෙහි බාලයාට මෙබඳු සිතක් වෙයි. **එතදවොචාති** අනුසන්ධියෙහි දක්‍ෂ භික්‍ෂුව නරකයට උපමා කරන්නට නොහැකිය. බුදුරදුන් නොකියයි. පහසු නොවේ යැයි කියයි. පහසු නැති කරන්නට හැකිය. එහෙයින් මම බුදුරදුන් උපමා කරවමියි සිතා මේ **සක්කා පන භනෙතති** යන වචනය කීය. **හනෙය්‍යුනති** විනිවිද යාම් වශයෙන් යම්සේ එකතැන පහර දෙකක් වැටෙත් ද එසේ නසන්නාහ. එහෙයින් ඔහුට වණමුඛ දෙසීයක් වෙත්. මෙයින් මත්තෙහි ද මේ ක්‍රමයයි. **පාණිමත්තනති** මීට ඇතුළෙහි තබන ලද පමණයි. **සංඛම්පි න උපෙතීති** ගණන් මාත්‍රයට ද නොපැමිණෙයි. **කලාභාගම්පීති** කලා සියයකට හෝ කලා දහසකට හෝ කලා ලක්‍ෂයකට හෝ පැමිණේයැයි කිවයුතු බවට නො පැමිණෙයි. **උපනිධිම්පීති** අත්හැරීම් පමණකට ද නොපැමිණෙයි. බලන අයට බැලීම් මාත්‍රයක් ද නැත. **තත්තං අයොඛීලනති** ගව් තුනක් ඇති ආත්මභාවය දිලිසෙන කල්හි ලෝහ පෘථිවියෙහි උඩුකුරුව සතපවා දකුණු අතෙහි තල් කඳක් ප්‍රමාණ යකඩ හුලක් ගසත්. වම් අත් ආදියෙහි ද එසේමය. යම්සේ උඩුකුරුව සතපවා මෙසේ බඩෙන් ද වම් පසින් ද දකුණු පසින් ද සතපවා ඒ කටයුත්ත කරත්මය. **සංවෙසිත්වාති** දිලිසෙන ලෝහ පොළොවෙහි ගව් තුනක් ඇති ආත්මය සතපවා. **කුඨාරීහීති** ගෙයක එක් පැත්තක පියස්සක් පමණ මහත්

කෙටේරිවලින් තලත්. ලේ ගඟක්ව ගලයි. ලෝහ පොළොවෙන් ගිනිදැල් නැග තලන ලද ස්ථානය ගනිත්. මහත් දුකක් උපදියි. තලන්නෝ වනාහි සූත්‍රයෙහි ආ පරිදි ලීයක මෙන් නූල් ගසා අටකට ද හයකට ද පලත්. **වාසීහීති** මහත් කුලු පමණ වෑවලින්. ඒවායින් සිදින්නාහු හමේ පටන් ඇට දක්වා වහා සිදිත්. සිදින සිදින ලද්ද නැවත ප්‍රකෘතිමත් වෙයි. රථෙ **යොජෙත්වාති** යුගයොත් මැදිරිය රෝද බෝමු ලීය යන මේවා සමඟ හැම ආකාරයෙන් දිලිසෙන රථයෙහි යොදා. **මහන්තන්ති** මහත් කුළුගෙවල් ප්‍රමාණ. **ආරොපෙන්තීති** දිලිසෙන යකඩ මුගුරුවලින් තලමින් නංවත්. **සකිම්පිඋද්ධන්ති** මනාකොට පැසුණු සැළියෙහි දමන ලද සහල් මෙන් උඩට යටට හරහට ද යයි. **භාගසොමිතොති** කොටස් තබ තබා බෙදන ලද්දේය. **පරියන්තොති** හාත්පසින් වට කරන ලද්දේ. **අයසාති** මතු යකඩයෙන් වසන ලද්දේ. **සමන්තායොජනසතං ඵරිත්වා තිට්ඨතීති** මෙසේ පැතිරී සිටියි. යම්සේ හාත්පස යොදුන් සීයක් තැන සිට බලන්නහුගේ ඇස් බෝල දෙකක් මෙන් නික්මෙත්. **න සුකරං අක්ඛානෙන පාපුණිතුන්ති** නිරය නම් මෙසේ ද දුක යැයි අවුරුදු සියයක් අවුරුදු දහසක් කියන්නේ ද අවසානයක් කොට කියන්නට පහසු නොවෙයි යන තේරුමයි. **දන්තුල්ලෙහකන්ති** දත්වලින් උලා සිදින ලදියි කියන ලද්දේ වෙයි. **රසාදොති** රස තෘෂ්ණාවෙන් අනුභව කරන ලද රස ඇති. **අඤ්ඤමඤ්ඤඛාදකාති** ඔවුනොවුන් අනුභව කිරීමයි. **දුබ්බණ්ණොති** නපුරු පැහැය ඇති. **දුද්දසිකොති** දරුවන්ගේ භය කිරීම පිණිස කරන ලද යකෙක් මෙන් නපුරු දැකීම් ඇති. **ඔකොටිමකොති** මිටි වූ බෙල්ල කොට වූ මහ බඩක් ඇති. **කාණොති** එක් ඇසක් හෝ ඇස් දෙකම හෝ කණ වූ. **කුණී▯වාති** එක් අතක් හෝ අත් දෙකම හෝ කුණු වූ. **පක්ඛහතොති** පැත්තක් නැසුණු. **සො කායෙනාති** මෙය ඔහුගේ දුක් ප්‍රබන්ධයාගේ දැක්වීම පිණිස අරඹන ලදි. **කලිග්ගහෙනාති** පැරදීමෙන්. **අනුබන්ධං නිගච්ඡෙය්‍යාති** යම් හෙයකින් බොහෝ කොට දිනන ලද ද ඔහුගේ සියලු සම්පත්තිය ද ප්‍රමාණයක් නොවෙයි. එහෙයින් තමා ද බැඳීමට පැමිණෙන්නේය. **කෙවලපරිපූරා බාලභූමීති** බාලයා ත්‍රිවිධ දුෂ්චරිතයන් සම්පූර්ණ කොට නිරයෙහි උපදියි. එහි පැසී ඉතිරිවීමෙන් මනුෂ්‍යත්වයට පැමිණියේ පහත් කුල පහක ඉපිද නැවත ත්‍රිවිධ දුෂ්චරිතයන් සම්පූර්ණකොට නිරයෙහි උපදීය යන මේ සියල්ල බාලභූමියෙහි සම්පූර්ණය.

**පණ්ඩිත ලක්ඛණානීති** යනාදිය ද කියන ලද ආකාරයෙන් ම දත යුතුය. **සුචින්තිතචින්තීති** යනාදිය මෙහි මනෝ සුචරිතාදීන් වශයෙන් යෙදිය යුතුය. **සීසං නහාතස්සාති** හිස සමඟ සුවඳ පැනින් ස්නානය කළහුගේ.

Scanned with CamScanner

**උපොසථිකස්සාති** සමාදන් වන ලද උපෝසථයාගේ **උපරි පාසාදවරගතස්සාති** උතුම් ප්‍රාසාදයාගේ මත්තට ගියහුට. යහපත් බොජුන් වළඳා උතුම් ප්‍රාසාදයෙහි මත්තෙහි මහතලයෙහි සිරියහනට පිවිස සිල් ආවර්ජනා කරන්නාහට. එකල රජතෙමේ උදෑසන ම ලක්‍ෂයක් වියදම් කොට මහත් දන් දී සුවඳ පැන් කළ දාසයකින් හිස සෝදා කරන ලද උදේ බත්කිස ඇත්තේ පිරිසිදු උතුරු සලුව ඒකාංස කොට මතුමහල් පහයෙහි සිරි යහනෙහි ආසනයක් බැඳ සිටියේ තමාගේ දානමය පින්කම් ගැන සිතමින් සිටියි. මේ සියලු සක්විති රජුන්ගේ ස්වභාවයයි. මෙසේ ආවර්ජනා කරන ඔවුන්ට කියන ලද ක්‍රමයෙන් පින්කම්වල ප්‍රත්‍යයෙන් සෘතුවෙන් හටගත් නිල් මැණික් සමූහයක් සමාන නැගෙනහිර ජලතලය සිඳින්නාක් මෙන් අහස අලංකාර කරන්නාක් මෙන් දිව්‍ය චක්‍රරත්නය පහළ වෙයි. ඒ මේ දිව්‍ය ආනුභාවයෙන් යුතු බැවින් දිබ්බං යැයි කියන ලදි.

මොහුගේ ගරාදි දහසක් හෙයින් **සහස්සාරං** නම්. නිම්වළල්ලක් සහිත නාභියක් ඇති හෙයින් **සනෙමිකං සනාභිකං** නම්. සියළු ආකාරයෙන් සම්පූර්ණ හෙයින් **සබ්බකාරපරිපූරං** නම්. එහි චක්‍රය ද එයයි. ඇල්ම වඩවන අර්ථයෙන් රත්නය ද එයයි. චක්‍රරත්නය නම්. යම්සේ ඒ නාභියෙන් යුතුහෙයින් **සනාභිකං** යැයි කියන ලදි. එය ඉඳුනිල් මැණිකෙන් කරන ලද්දේ වෙයි. එහි මැද රිදියෙන් කරන ලද පිරිසිදු සිතිඳු සංඛ දත් සමූහයෙන් සිනහසෙන්නාක් මෙන් බබළයි. මැදින් සිදුරක් මෙන් සඳ මඬලින් බාහිර අභ්‍යන්තර දෙපැත්තෙහි ම රිදී පට්ටාවලින් කරන ලද්දක් වෙයි.

**සුතං ඛො පන මෙතන්ති** මේ ආදි සිතීම සිතීමයි. **දීඝාන රඤ්ඤො ඛත්තියස්ස-පෙ- අස්සං නු ඛො අහං රාජා චක්කවත්තීති** යන්න එහෙයින් කියන ලදි. එහි **සො හොති රාජා චක්කවත්තීති** කොපමණ කාලයකින් සක්විති රජ වන්නේ ද? අඟල් එකක් දෙකක් ප්‍රමාණවත් තැනින් චක්‍රරත්නය අහසට පැන නැගී පැවැති කල්හි දූන් එහි පැවැත්ම සඳහා යමක් කළ යුතුද? එය දක්වන්නේ **අථ ඛො භික්ඛවෙති** යනාදිය කීය. එහි **උට්ඨායාසනාති** හුන් ආසනයෙන් නැගිට චක්‍රරත්නය සමීපයට ඇවිත් **භිංකාරං ගහෙත්වාති** ඇත් සොඬක් හා සමාන ප්‍රණාලිය ඇති රන් කෙණ්ඩිය ඔසවා වම් අතින් ජලය ගෙන පින්වත් චක්‍රරත්නය පවතීවා යි පින්වත් චක්‍රරත්නය දිනේවා යි. **අන්වදෙව රාජා චක්කවත්ති සද්ධිං චතුරංගනියා සෙනායාති** සියලු සක්විති රජුන්ගේ ජලයෙන් විහිදුවා පින්වත් චක්‍රරත්නය දිනේවා යි වචනයට අනතුරුව අහසට පැන නැගී චක්‍රරත්නය පවතියි. යම්කාලයක් එය පවතී ද ඒ සියලු කාලයෙහි ම ඒ රජු සක්විති රජු වෙයි. චක්‍රරත්නය පැවැති කල්හි ම එය අනුබඳින්නේ ම සක්විති රජ තෙමේ

උතුම් යානාවට නැඟී අහසට පැන නගියි. එකල ඔහුට සේසත් සෙමර ආදිය ගත් අත් ඇති පිරිවර ජනයා ද ඇතුල්පුර ජනයා ද එයින් නොයෙක් ආකාර සන්නාහ සන්නද්ධ යුද්ධ සැට්ට ආදියෙන් සැරසුණා වූ නොයෙක් ආභරණයන්ගෙන් දිලිසෙන ඔසවන ලද ධජපතාකයන්ගෙන් සැදුම්ලත් තමතමන්ගේ බල සෙනඟ සමඟ යුවරජ සේනාපති ආදී කොට ඇත්තෝ අහසට පැන නැඟී රජු ම පිරිවරා ගණිත්. රාජකාරියෙහි යෙදුණෝ ජනතාවගේ සංග්‍රහය පිණිස නුවර වීදිවල බෙර හසුරුවත්. දරුවෙනි, අපේ රජ්ජුරුවන්ට චක්‍රරත්නයක් උපන්නේය. තමතමන්ට පුළුවන් හැටියෙන් සැරසිළි ඇතිව රැස් වෙවයි. මහා ජනයා ප්‍රකෘතියෙන් චක්‍රරත්නයාගේ ශබ්දයෙන් ම සියළු වැඩ අත්හැර සුවඳ මල් ආදිය ගෙන රැස්වූනේ ම ඒ සියලු දෙනාම අහසට නැග රජු ම පිරිවරා ගණිත්. යම් කෙනෙකු රජු සමඟ යාමට කැමැති වේ ද ඒ ඒ තෙමේ අහසින් ම ගියේ වෙයි.

මෙසේ දිගින් හා පළලින් දොළොස් යොදුනක් පිරිස වෙයි. එහි එක් පුරුෂයෙක්වත් සිඳුණු බිඳුණු ශරීර ඇත්තේ හෝ කිලිටි වස්ත්‍ර ඇත්තේ හෝ නොවෙයි. සක්විති රජ තෙමේ පිරිසිදු පිරිවර ඇත්තේ වෙයි. සක්විති රජුගේ පිරිස නම් විද්‍යාධර පිරිස් මෙන් අහසින් යන්නේ ඉඳුනිල් මැණික් තලයක විසුරුවන ලද මැණික් හා සමාන වෙයි. එහෙයින් කියන ලදි. සක්විති රජ සිවුරඟ සේනාව සමඟ අනුව යාම වෙයි. ඒ චක්‍රරත්නය ද ගස්වල මුදුනෙහි ඉතා උස් නොවී අහසේ පවතී. යම්සේ ගස්වල මල් ගෙඩි දළු කැමැති වූවාහු ද ඒවා සැපසේ ගන්නට හැකි වෙත්. බිම සිටියාහු මේ රජුය මේ සෙනෙවියාය යැයි සළකන්නට හැකිවෙත්. සිටීම් ආදී ඉරියව් අතරින් යමෙක් යමකින් කැමැති වේද ඔහු එයින් ම යයි. චිත්‍රකර්ම ආදී ශිල්පවල යෙදුනාහු එහි තම තමන්ගේ කටයුතු කරන්නාහු ම යත්. බිම යම්සේ ද එසේම ඔවුන්ගේ සියලු වැඩ අහසෙහි සමෘද්ධ වෙත්. මෙසේ සක්විති පිරිස ගෙන ඒ චක්‍රරත්නය වම් පැත්තෙන් මහමෙර හැර මුහුදට මතුභාගයෙන් අටදාහක් යොදුන් ප්‍රමාණ පූර්ව විදේහයට යයි. එහි යමෙක් උසින් දොළොස් යොදුන් වූ ද වටින් යොදුන් තිස්හයක් වූ ද පිරිසෙහි විසීම යහපත් ය. ආහාර උපකරණ සුලභය. සෙවණින් හා වතුරෙන් සම්පූර්ණය. පිරිසිදු සමතලාය. භූමිභාගය සිත්කළුය. එහි මතුකොටසෙහි ඒ චක්‍රරත්නය අලවංගුවක ගැසුවක් මෙන් සිටියි.

එකල්හි ඒ සංඥාවෙන් මහජනයා බැස කැමැති පරිද්දෙන් නෑම අනුභව කිරීමාදි සියලු කටයුතු කරන්නේ විසීම කරයි. එහෙයින් කියන ලදි. මහණෙනි, යම් පෙදෙසක චක්‍රරත්නය පිහිටා ද එහි සක්විති රජ

සිවුරඟ සේනාව සමඟ වාසය කරයි. මෙසේ සක්විති රජ වාසය කරන කල්හි එහි යම් රජ කෙනෙක් අන්‍ය චක්‍රයක් ආවේ යැයි අසා ද ඔවුහු බල සෙනඟ රැස්කොට යුද්ධයට නොසැරසෙත්. චක්‍රරත්නයේ ඉපදීමට අනතුරුව සතුරු සත්වයෙක් නැත. යමෙක් සතුරු කල්පනාවෙන් රජුන් අරබයා ආයුධයක් ඔසවන්නට නොඉවසන්නේ ද මේ චක්‍රරත්නයේ ම ආනුභාවයයි.

ඒ රජුගේ චක්‍රයේ ආනුභාවයෙන් සියලු ම සතුරෝ දමනයට පැමිණෙත්. එහෙයින් එය චක්‍රය යැයි කියයි.

එහෙයින් ඒ සියලු රජවරු තමාගේ රාජශ්‍රීයට අනුව පඬුරු ගෙන ඒ රජු කරා පැමිණ තමාගේ ඔටුණුවල මැණික් කාන්තියෙන් අභිෂේක කිරීම නැමැයි පා පූජාව කරන්නේ එහි බො මහාරාජාති යනාදී වචනයන්ගෙන් ඔහුගේ කීකරු බවට පැමිණෙත්. එහෙයින් කියන ලදි. **යෙ බො පන භික්ඛවෙ පුරත්ථිමාය දිසාය -පෙ- අනුසාස මහාරාජාති එහි සවාගතනති** යහපත් පැමිණීමයි. සමහරු ආ කල්හි ශෝක කරත්. ගිය කල්හි සතුටු වෙත්. ඇතැමෙක් ආ කල්හි සතුටු වෙත්. ගිය කල්හි ශෝක කරත්. එබඳු වූ ඔබගේ පැමිණීම සතුටකි. යාම ශෝකයකි. එහෙයින් ඔබගේ පැමිණීම යහපත් පැමිණීමක් යැයි කියන ලදි. මෙසේ කී කල සක්විති රජු විසින් මට සුදුසු පූජාව මෙපමණකින් එළවව් යැයි කියයි. අනිකකුගේ සම්පතක් නොසිඳීම අනිකෙකුට දෙයි. තමාගේ ධර්ම රාජ බවට සුදුසු නුවණින් ප්‍රාණඝාතය සෙවිනා ලද්දේ වඩන ලද්දේ බොහෝ සේ වඩනා ලද්දේ නිරයට යාමට හේතුවෙයි ආදී ක්‍රමයෙන් බණ කියා ප්‍රාණය නොනැසිය යුතු යැයි අවවාද දෙයි. එහෙයින් කියන ලදි. **රාජා චක්කවත්ති එවමාහ. පාණො න හන්තබ්බො -පෙ- යථාභුත්තඤ්ච භුඤ්ජථාති** කිමෙක් ද? සියල්ලෝ ම රජුගේ මේ අවවාදය ගණිත් ද? බුදුරදුන්ගේ ද ඒතාක් සියල්ලෝ ම නොගණිත්. රජුගේ අවවාදය කුමක්හෙයින් ගන්නාහු ද? එහෙයින් යම් පණ්ඩිත කෙනෙක් වෙත් ද ඔවුහු ගණිති. සියල්ලෝ ම අනුව පැවැත්තාහු වෙත්.

එහෙයින් **යෙ බො පන භික්ඛවෙති** යනාදිය කීය. එකල්හි ඒ චක්‍රරත්නය මෙසේ පූර්වවිදේහ වැසියන්ට අවවාද දුන් කළ කරන ලද උදෑසන බත්කිස ඇත්තේ සක්විති බලයෙන් අහසට නැග උතුරුදිග මුහුද අළලයි. යම්සේ එය අළලා ද එසේ බෙහෙත් සුවඳ ආඝ්‍රාණය කොට හකුලන ලද පෙනය ඇති නාග රාජයෙකු මෙන් හකුළන ලද රළ ඇතිව බසින මහත් මුහුදු වතුර යොදුනක් පමණ මැඩගෙන මුහුද ඇතුළත

වෛරෝඩි බිත්තියක් මෙන් සිටියි. ඒ මොහොතෙහි ම ඒ රජුගේ පුණ්‍යශ්‍රිය දකිනු කැමැත්තාක් මෙන් මහ මුහුදෙහි විසිරුණු නොයෙක් මැණික් ඒ ඒ ස්ථානයෙන් අවුත් ඒ ප්‍රදේශය පුරවත්. එකල්හි ඒ රාජ පිරිස නොයෙක් මැණික්වලින් පිරුණු මුහුදු තලය දැක කැමැති පරිද්දෙන් ඇලපත් ආදියෙන් ගනියි. කැමැති පරිදි ගන්නා ලද මැණික් ඇති පිරිසෙහි ඒ චක්‍රරත්නය නවතියි. එය නවතින කල්හි පිරිස ඉදිරියෙහි වෙයි. රජතුමා මැදය. චක්‍රරත්නය කෙළවරෙහිය. එය ද මුහුදු ජලය ප්‍රලෝභය කරන්නාක් මෙන් චක්‍රරත්නයේ ශෝභාව නොඉවසන්නාක් මෙන් එයින් වෙන් වූ නිම්වළලු මණ්ඩල අවසානයේ පීඩාකර නිතර ම යයි. මෙසේ සක්විති රජු උතුරුදිග මුහුද කෙළවර ඇති පූර්ව විදේහය ජයගෙන දකුණු මුහුද කෙළවර කොට ඇති දඹදිව දිනනු කැමැත්තේ චක්‍රරත්නයාගේ කීමෙන් දකුණුදිග මුහුදට අභිමුඛව යයි. එහෙයින් කියන ලදි. **අථ ඛො තං භික්ඛවෙ චක්කරතනං පුරත්ථිමං සමුද්දං අජ්ඣොගහෙත්වා පච්චුත්තරිත්වා දක්ඛිණදිසං පවත්තතීති** මෙසේ පවත්වනු ලබන ඔහු පවත්වන විධානය සේනාවගේ සන්නිවාසය, ප්‍රතිරාජ ගමන, ඔවුන්ගේ අනුශාසන නිෂ්පාදනය, දකුණු මුහුද අළලා මුහුදු ජලයෙහි රත්න දානය යන සියල්ල පළමුව කී ක්‍රමයෙන් ම දත යුතුයි.

ඒ දසදහසක් යොදුන් ප්‍රමාණ දඹදිව දකුණු මුහුදින් ද එතරව හත්දාහක් යොදුන් ප්‍රමාණ අපරගෝයානය ජය ගැනීමට පෙර කියන ලද ක්‍රමයෙන් ම ගොස් එහි මුහුදු කෙළවර ද එසේම ජයගෙන පශ්චිම මුහුදින් ද එතරව යොදුන් අටදාහක් ප්‍රමාණ උතුරු දිවයින ජය ගන්නට එසේම ගොස් මුහුද කෙළවර කොට ඇති එය ද එසේම ජයගෙන උතුරු මුහුදින් ද එතර වෙයි.

මෙපමණකින් සක්විති රජු විසින් කෙළවර හතරක් ඇති පෘථිවියෙහි අධිපතිබවට පැමිණියේ වෙයි. හෙතෙම මෙසේ දිනන ලද විජයශ්‍රිය අත්තේ තමාගේ රජසිරි සැප දැකීම පිණිස පිරිස් සහිතව උඩ අහසට පැන නැගී මනාකොට පිපුන පියුම් රත් නෙළුම් වනයෙන් විසිතුරු විල් හතරක් මෙන් පන්සීය පන්සීය කුඩා දිවයින් පිරිවරා ඇති සතර මහද්වීප බලා චක්‍රය කියන ලද මාර්ගයෙන් පිළිවෙළින් තමාගේ රාජධානියට ම ආපසු එයි. එකල ඒ චක්‍රරත්නය ඇතුළු නුවර දොරටුව මෙන් සිටියි. ඒ චක්‍රරත්නය මෙසේ සිටි කල්හි රජුගේ ඇතුළු නුවර උල්කාවලින් හෝ පහන්වලින් හෝ කිසිකටයුත්තක් නොවෙයි. චක්‍රරත්නයේ ආලෝකයෙන් ම රාත්‍රියේ කළුවර නසයි. යමෙකුට කළුවර අවශ්‍ය ද ඔහුට කළුවර වෙයි. එහෙයින් කියන ලදි. **දක්ඛිණසමුද්දං අජ්ඣොගහෙත්වා -පෙ- එවරූපං චක්කරතනං**

**පාතුභවතීති** මෙසේ පහළ වූ සක්විති රජුගේ ඇමතියෝ ප්‍රකෘති මඟුල් ඇතුගේ ස්ථානය පිරිසිදු භූමිභාගයක් කරවා සඳුන් ආදී දිව්‍ය සුවඳින් ආලේප කොට යට විසිතුරු පැහැය ඇති දිව්‍ය මලින් යුක්තව මත්තෙහි රන් තාරකාවන්ගේ අතරතුර ඔසවන ලද යහපත් මලින් සැරසුණු වියන්වලින් දිව්‍ය විමානයක් මෙන් සකස්කොට දේවයනි, මෙබඳු හස්ති රත්නයකගේ පැමිණීම සිතව් යැයි කියත්.

රජු පෙර කියන ලද ක්‍රමයෙන් මහ දන් දී සීලයන් සමාදන් ව ඒ පුණ්‍ය සැපත ආවර්ජනා කරමින් හිඳියි. එකල ඔහුගේ පුණ්‍ය තේජසින් චෝදනා කරන ලද්දේ ඡද්දන්ත කුලයෙන් හෝ උපෝස්ථ කුලයෙන් හෝ ඒ සත්කාර විශේෂය අනුභව කරනු කැමැති තරුණ සූර්ය මණ්ඩලය මෙන් රතු පාද බෙල්ල මුඛය යන මෙයින් සැදුම් ලද පිරිසිදු වූ විශේෂයෙන් සුදු ශරීර ඇති සතකින් පිහිටි මනාකොට පිහිටි අංගප්‍රත්‍යංගයන්ට වාසස්ථාන වූ පිපුණු රත් පියුම් ඇති සෘද්ධිමත් තවුසෙක් මෙන් අහසින් යාමට සමත් වූ හිරියල් කුඩු කෙළවර ගෑවාක් මෙන් රිදී පර්වතයක් වූ ශ්‍රේෂ්ඨ ඇතා ඒ ප්‍රදේශයේ පිහිටයි. ඒ ඇතා ඡද්දන්ත කුලයෙන් එන්නේ සියල්ලන්ට ම කනිටු වී එයි. උපෝසථ කුලයෙන් සියල්ලන්ට ම වැඩිමහල් වී එයි. පෙළෙහි උපෝසථ හස්ති රාජයා ම එයි. ඒ මේ තෙමේ පුරන ලද චක්‍රවර්ති ව්‍රත ඇත්තේ චක්කවත්ති සූත්‍රයෙහි කියන ලද ක්‍රමයෙන් සිතන්නවුන්ට එයි. අන්‍යයන්ට නැත. තෙමේම ප්‍රකෘති මඟුල් ඇතාගේ ස්ථානයට පැමිණ මඟුල් ඇතා පහකොට එහි සිටියි. එහෙයින් කියන ලදි. **පුන ච පරං භික්ඛවෙ -පෙ- නාගරාජාති** මෙසේ පහළ වූ ඒ හස්ති රත්නය දැක ඇත්ගොව්වා ආදීහු තුටු පහටුව වහා ගොස් රජුට කියත්. රජතුමා වහා වහා අවුත් ඌ දැක සතුටු සිත් ඇත්තේ පින්වත්නි, ඇත් යානය හොඳය. ඉදින් සංසිඳීමට පමුණුවන්නේ යැයි සිතන්නේ අත දිගු කරයි. එකල්හි ඌ ගෙදර දෙනගේ වස්සෙකු මෙන් කන් එල්ලා මනාව ඇලුණු බව දක්වන්නේ රජු වෙත පැමිණෙයි. රජු ඌගේ පිට නගිනු කැමැත්තේ වෙයි. එකල ඔහුගේ පිරිවර ජනයා ඒ අදහස දැන ඒ හස්ති රත්නය රන් ධජවලින් රන් අලංකාරයන්ගෙන් රන් දැල්වලින් වසා පමුණුවයි. රජු එහි නොහිඳ ම සත්රුවනින් කරන ලද හිණිමගෙන් නැග අහසින් යාමට නැමුණු සිත් ඇත්තේ වෙයි. ඔහු සිතූ අදහස සමඟම ඒ හස්ති රාජයා රාජ හංසයෙක් මෙන් ඉඳුනිල් මැණික් ජාලයෙන් නිල්වන් වූ අහසට පැන නගියි.

නැවත චක්‍ර චාරිකාවෙහි කියන ලද ක්‍රමයෙන් සියලු පිරිස් සමඟ රජතෙමේ උදේ ආහාරය ඇතුළත සියලු පොළොව අනුව ගමන් කොට රාජධානියට නැවත එයි. මෙසේ මහත් සෘද්ධි ඇති සක්විති රජුගේ හස්ති රත්නය වෙයි. එහෙයින් කියන ලදි. **දීඝාන-පෙ-පසීදතීති** මෙසේ පහළ වූ හස්ති රත්නය ඇති සක්විති රජුගේ පිරිස ප්‍රකෘති මඟුල් අශ්වයාගේ ස්ථානය පිරිසිදුව සමතලා කොට අලංකාර කොට පළමු කී ක්‍රමයෙන් ම රජුහට ඌගේ ඒමට සිතීම පිණිස උත්සහය උපදවත්. රජු පළමු කී ක්‍රමයෙන් ම කරන ලද දාන සත්කාර ඇත්තේ සමාදන් වූ සිල් ඇත්තේ ප්‍රසාද ස්ථානයෙහි සිටියේ පුණ්‍ය සම්පත්තිය සිහිකරයි. එකල ඔහුගේ පුණ්‍ය ආනුභාවයෙන් චෝදනා කරන ලදුව සෛන්ධව කුලයෙන් විදුලියෙන් නසන ලද සරත් කාලයෙහි සුදු වළාකුලින් සශ්‍රික වූ රත් පාද ඇති රත් තුඩ ඇති චන්ද්‍රප්‍රභා පුංජයක් හා සමාන අතිශයින් සිනිඳු පවිත්‍ර ශරීරයක් ඇති කවුඩාගේ බෙල්ල වැනි ඉඳුනිල් මැණිකක් බඳු කළු පැහැති හිසින් යුක්ත හෙයින් කවුඩු හිසක් ඇති මනාකොට සිතා තබන ලද මුං සමාන සියුම්ව වට වූ කෙළින් ගමන් ඇති කෙස්වලින් යුතු බැවින් මුංජ කෙස් ඇති අහසින් යන වළාහක නම් අශ්ව රාජයා අවුත් එතන සිටියි. සෙසු සියල්ල හස්ති රත්නයෙහි කියන ලද ක්‍රමයෙන් දතයුතුය. මෙබඳු අශ්වරත්නය උදෙසා බුදුරදුන් පුන ච පරං යනාදිය කීය. මෙසේ පහළ වූ අශ්වරත්නය වනාහි සක්විති රජුගේ අතින් හතර රියනක් දිග ගැල් නාභිය හා සමාන ප්‍රමාණ ඇති දෙකෙළවර කර්ණිකා කෙළවරින් නික්මුණු ඉතා පිරිසිදු මුතු කලාප ඇති රන් පියුම් දෙකකින් සරසන ලද අසූහාර දහසක් මැණික් පිරිවර කොට ඇති තාරකා සමූහයා විසින් පිරිවරණ ලද පූර්ණ චන්ද්‍රයාගේ ශෝභාව පැතිරෙන්නාක් මෙන් වේපුල්ල පර්වතයෙන් මැණික් රත්නය එයි. මෙසේ පැමිණි එය මුතු දැලක තබා උණගස් පරම්පරාවෙන් සැට රියන් ප්‍රමාණ අහසට නැගෙමින් සිටිය දී රාත්‍රී කාලයෙහි හාත්පස යොදුනක් පමණ තැන් එළිය පැතිරෙයි. යමකින් සියලු එළිය අරුණ නැගෙන වේලාවෙහි මෙන් හටගත්තේ ලෝකය වෙයි. එහෙයින් ගොවියෝ ගොවිතැන් වැඩ ද වෙළෙන්දෝ සල්පිල් ඇරීම ද ඒ ඒ ශිල්පීහු ඒ ඒ කර්මාන්තයන්හි යෙදෙත්. දහවල් යැයි සිතත්. එහෙයින් කියන ලදි. **පුන ච පරං භික්ඛවෙ -පෙ- මණිරතනං පාතුභවතීති** පහළ වූ මණිරත්නය ඇති සක්විති රජුගේ විෂය සැපයට විශේෂ කාරණා වූ ස්ත්‍රී රත්නය පහළ වෙයි. ඔහුට මද්දිරාජ කුලයෙන් හෝ අගමෙහෙසියක් ගෙනඑත්. උතුරුකුරු දිවයිනෙන් හෝ පින් අනුහසින් තෙමේම පැමිණෙයි. ඉතිරිය ඇයගේ සම්පත්තියයි. **පුන ච පරං භික්ඛවෙ රඤ්ඤො චක්කවත්තිස්ස ඉත්ථිරතනං පාතුභවති අභිරූපා දස්සනීයාති** යනාදි ක්‍රමයෙන් පෙළෙහි ආවාය. එහි

පිහිටීම සම්පූර්ණ හෙයින් අධික රූපය මැයට ය යනු **අභිරූපා** නම්. දකින්නී ද ඇස් පිනවයි. එහෙයින් අනෙත් වැඩ හැර දැකිය යුත්තිය යනු **දස්සනීයා** නම්. දකිනු ලබන කල්හි සතුටු වශයෙන් සිත පැහැදෙන්නිය යනු **පාසාදිකා** නම්. **පරමායාති** මෙසේ ප්‍රසාදය එළවනු සුළු උත්තමාවයි. **වණ්ණපොක්ඛරතායාති** පැහැයෙන් යහපත් ය. **සමන්නාගතාති** යුක්ත වූ. යම්හෙයකින් ඉතා උස නැති ද ඉතා මිටි නැති ද දැකුම්කළුය. යම්සේ ඉතා මහත නැති ද ඉතා කෙට්ටු නැති ද දැකුම්කළුය. යම්සේ ඉතා කළු නොවෙයි ද ඉතා සුදු නොවෙයි ද උතුම් වර්ණ සෞන්දර්යයෙන් යුක්ත වූවා වේ. යම්සේ මිනිස් පැහැය ඉක්මවා දිව්‍ය පැහැයට නොපැමිණියා ද මිනිසුන්ගේ පැහැයේ ආලෝකය පිටට නොනික්මෙයි. දෙවියන්ගේ පැහැය ඉතා දුරට නික්මෙයි. දොළොස් රියන් පමණ ප්‍රදේශයක ඇගේ ශරීර පැහැය බබළයි. **නාතිදීඝාදි** යනාදි පළමු යුගලයෙන් ඇයගේ ආරෝහ සම්පත්තිය ද දෙවැනි යුගලයෙන් පරිනාහ සම්පත්තිය ද තෙවැනි යුගලයෙන් වර්ණ සම්පත්තිය ද කියන ලදි. මේ හයෙන් ශරීර විපත්තියක් නොවෙයි. **අතික්කන්තා මානුසං වණ්ණන්ති** මෙයින් ශරීර සම්පත්තිය කියන ලදි.

**තූලපිචුනො වා කප්පාය පිචුනො වාති** ගිතෙල්වල බහා තබන ලද සිය වරක් පොලොන ලද ඉඹුල් පුළුන් හෝ කපු පුළුන් හෝ බඳු කාය ස්පර්ශය වෙයි. **සීතෙති** රජුට ශීතල කාලහි **උණ්හෙති** රජුට උෂ්ණ කාලයෙහි, **චන්දන ගන්ධොති** නිතර ම මනාව ඉසින ලද අළුතින් සිවු දෑ සුවඳින් යොදන යහපත් සඳුන් සුවඳ ශරීරයෙන් වහනය වෙයි. **උප්පලගන්ධොති** සිනාසෙන කථාකරන කාලයෙහි එකෙණෙහි පිපුණු මහනෙල් මල්වලින් නික්මෙන සුවඳ මුඛයෙන් වහනය වෙයි. මෙබඳු ස්පර්ශ ඇති සුවඳ සම්පත්තියෙන් යුක්ත වූ ඇයගේ ශරීර සම්පත්තියෙහි සුදුසු වූ ආචාර දක්වන්නට **තං ඛො පනාති** යනාදිය කියන ලදි. එහි රජු විසින් දැක හුන් ආසනයෙන් ගින්නෙන් දවන ලද්දාක් මෙන් පළමුවෙන් නැගිටින්නේ යනු **පුබ්බුට්ඨායිනී** නම්. ඔහු එහි සිටි කල්හි තල් වැටෙන් පවන් සැලීම් ආදී කටයුතු කොට පසුව වැටෙයි. හිඳින්නේ යනු **පච්ඡානිපාතිනී** නම්. දේවයන් වහන්ස, කුමක් කරම් ද? වචනයෙන් කීකරු බව දක්වන්නේ යනු **කිංකාරපටිස්සාවිනී** නම්. රජුහට මනාප වූ දෙයෙහිම හැසිරෙයි. කරයි යනු **මනාපචාරිණී** නම්. යමක් රජුට ප්‍රියයි ද එයම කියයි යනු **පියවාදිනී** නම්. දැන් ඇයගේ ඒ ආචාරයන් ස්වභාවයෙන් ම පිරිසිදුය. කපටිබවක් නොවේ යැයි දක්වන්නට **තං ඛො පනාති** යනාදිය කීය. **තත්‍ර නො අතිචරතීති** නොඉක්මවා හැසිරෙයි. රජු හැර අන් පුරුෂයෙක්

සිහින්වත් නොපතයි යැයි කියන ලද්දේ වෙයි. එහි ඇයගේ මුල දී අභිරූප ආදී ගුණ ද අවසානයෙහි පුබ්බුට්ඨායිනී ආදී ගුණ ද කියන ලද්දාහු ඒවා ප්‍රකෘති ගුණයෝමය. මිනිස් පැහැය ඉක්මවා යනාදි සක්විති රජුගේ පින් නිසා චක්‍රරත්නය පහළවීමේ පටන් පළමු කර්මානුභාවයෙන් උපදිත් යැයි දතයුතුයි. චක්‍රරත්නයේ පහළවීමේ පටන් අභිරූපතාදිය දක්වා සියල්ල සියළු ආකාරයෙන් සම්පූර්ණ විය. මෙසේ ස්ත්‍රීරත්නය පහළවූයේ යැයි එහෙයින් කියන ලදි.

මෙසේ ස්ත්‍රීරත්නය පහළ වූ සක්විති රජුහට මුදල් කටයුතු මැනවින් කරන්නට ගෘහපති රත්නය පහළ වෙයි. හෙතෙම ප්‍රකෘතියෙන් ම මහත් භෝග ඇති මහාභෝග කුලයෙහි උපන්නේය. රජුට ධනරාසිවඩ්ඪක සිටුතෙමේ ගෘහපති වෙයි. චක්‍රරත්නයේ ආනුභාව ඇති ඔහුට කර්ම විපාකයෙන් වූ දිවැස පහළ වෙයි. යමකින් පොළොව යට යොදුනක් ඇතුළත නිධානයක් දකී ද හෙතෙම ඒ සම්පත්තිය දැක සතුටු සිත් ඇත්තේ ගොස් රජුට ධනයෙන් පවරා සියලු ධනය පිළිබඳ කටයුතු සම්පාදනය කරයි. එහෙයින් කියන ලදි. **පුන ච පරං භික්ඛවෙ -පෙ- එවරූපං ගහපතිරතනං පාතුභවතීති** මෙසේ පහළ වූ ගෘහපති රත්නය ඇති සක්විති රජුට සියලු කටයුතු සම්පාදනයෙහි සමත් පරිනායක රත්නයක් පහළ වෙයි. ඔහු රජුට වැඩිමහල් පුතා වෙයි. ප්‍රකෘතියෙන් ම පණ්ඩිත වියත් නුවණ ඇත්තෙකි. රජුගේ පින් අනුහසින් හා ඔහුගේ කර්මානුභාවයෙන් පරසිත්දන්නා නුවණ උපදියි. යමකින් දොළොස් යොදුන් රජ පිරිසෙහි සිත් ආකාර දැන රජුට හිතවත් ද අහිතවත් දැයි නිශ්චය කිරීමට සමත් වෙයි. ඔහු තමාගේ ඒ ආනුභාවය දැක සතුටු සිත් ඇතිව රජුගේ සියලු කටයුතුවලට අනුශාසනා කිරීමෙන් පවරයි. එහෙයින් කියන ලදි. **පුන ච පරං -පෙ- පරිණායක රතනං පාතුභවතීති ඨපෙතබ්බං ඨපෙතුන්ති** ඒ ඒ තනතුරෙහි තබන්නට තැබිය යුතුයි. **සමවෙපාකිනියාති** යනාදිය යට කියන ලද්දේමය. **කටග්ගහෙනාති** ජය ගැනීමෙන්. **මහන්තං භොගක්ඛන්ධන්ති** එක පහරින් ම දෙලක්ෂයක් තුන්ලක්ෂයක් හෝ **කෙවලා පරිපූරා පණ්ඩිතභූමීති** පණ්ඩිතතෙමේ ත්‍රිවිධ සුචරිතයන් පුරා ස්වර්ගයෙහි උපදියි. එයින් මිනිස් ලොවට එන්නේ කුලය රූපය භෝග යන සම්පත්තියෙහි උපදියි. එහි සිටියේ ත්‍රිවිධ සුචරිතයන් පුරා නැවත ස්වර්ගයෙහි උපදියි. මේ සියල්ලෙන් සම්පූර්ණ පණ්ඩිත භූමියයි. ඉතිරිය සියලු තැන්හි ම ප්‍රකටය.

**බාලපණ්ඩිත සූත්‍ර වර්ණනාව නිමි.**

# 3.4.10

**එවමෙමසුතනති** මා විසින් දේවදූත සූත්‍රය මෙසේ අසන ලදි. එහි **ද්වෙ අගාරාති** යනාදිය අස්සපුර සූත්‍රයෙහි විස්තර කරන ලදි. **නිරයං උපපනනාති** බුදුරදුන් කිසිතැනෙක දේශනාව නරකයෙන් පටන් ගෙන දෙව්ලොවින් අවසන් කරත්. කිසියම් තැනක දෙව්ලොවින් පටන්ගෙන නරකයෙන් අවසන් කරයි. ඉදින් ස්වර්ග සම්පත්තිය විස්තර කොට කියන්නට කැමැති වෙති. නරකයෙහි දුක එක් දේශයකින් කියත්. තිරිසන් යෝනි දුක ප්‍රේත විෂය දුක මිනිස්ලොව සැපත එක් දේශයකින් කියත්. ස්වර්ග සැපත ම විස්තර කරත්. ඉදින් නරකයෙහි දුක විස්තර කොට කියන්නට කැමති වෙත් ද දිව්‍ය ලෝක මනුෂ්‍ය ලෝකයන්හි සැපත ද තිරිසන් යෝනි ප්‍රේත විෂයන්හි දුක ද එක් දේශයකින් කියත්. නරකයෙහි දුක ම විස්තර කරත්. උන්වහන්සේ මේ සූත්‍රයෙහි නරකයෙහි දුක විස්තර කරනු කැමැත්තේ එහෙයින් දෙව්ලොවින් පටන්ගෙන දේශනාව නරකයෙන් අවසන් කරත්. දිව්‍යලෝක මනුෂ්‍යලෝකයන්හි සැපත ද තිරිසන් යෝනි ප්‍රේතවිෂයන්හි දුක ද එක් දේශයකින් කියා නරකයෙහි දුක ම විස්තර කරන්නට **තමෙනං භික්ඛවෙ නිරයපාලාති** යනාදිය කීහ.

එහි සමහර තෙරවරු නිරය පාලයෝ නම් නැත. යන්ත්‍රරූපමව කර්ම කාරණය ම කරන්නේ යැයි කියත්. එය "නරකයෙහි නිරයපාලයෝ සිටිත් ද? එසේයඃ යන්ත්‍රරූපම කරන කටයුතු කරන්නෝ ඇත. යනාදී ක්‍රමයෙන් අභිධර්මයෙහි නිරය පාලයන් නැත යන්න වළකන ලද්දේම ය. යම්සේ මනුෂ්‍ය ලෝකයෙහි කරවන්නෝ ඇත් ද එසේම නරකයෙහි නිරයපාලයෝ ඇත. **යමසස රඤ්ඤොති** යමරජ දිව්‍යනාට්‍යාංගනා ආදී සැප අනුභව කරයි. එක් කලෙක කර්ම විපාක සැප අනුභව කරයි. මොහු ධාර්මික රජකෙනෙක් නො වෙයි. දොරටු හතරේ ජනයෝ හතර දෙනෙක් වෙත්. **නාද්දසනති** තමා සමීපයෙන් යවන ලද කිසි දේවදූතයෙකුගේ අභාවය සඳහා මෙසේ කියයි. එකල යමරජ විසින් කියන ලද අර්ථය නොසැළකේ යැයි දැන හඟවනු කැමැත්තේ **අමොහාති** යනාදිය කීය. **ජාතිධම්මොති** ඉපදීම් ස්වභාවයයි. ඉපදීමෙන් නොමිදුනෙමි. ඉපදීම නම් මාගේ ඇතුළත පවතියි. අනෙක් **ජරාධම්මොති** යනාදිය ද මේ ක්‍රමයයි. **පඨමං දෙවදූතං සමනුයුඤ්ජිත්වාති** මෙහි ළදරු කුමරුවා අර්ථ වශයෙන් මෙසේ කියයි. පින්වත්නි, බලව්, මට ද තොපට මෙන් අත් පා ඇත. ස්වකීය මළමූත්‍රයෙහි ගැළුනෙමි. තමන්ගේ ශක්තියෙන් නැගිට නාන්නට නො හැක්කෙමි. මම කිළිටි වෙමි. මා නාවන්න යැයි කියන්නට ද නො හැක්කෙමි. ඉපදීමෙන්

නො මිදුණු හෙයින් මෙසේ වීමි. මා පමණක් නොව තොපි ද ඉපදීමෙන් නො මිදුණාහුය. මට යම්සේ ද එසේම තුඹලාට ද ඉපදීම එන්නේ ය. එහෙයින් ඉපදීම එන්නට පෙර කුසල් කරව්. එහෙයින් මේ දේවදූතයා වෙයි. වචනයෙහි අර්ථය මඛාදේව සූත්‍රයෙහි කියන ලද්දේය.

**දුතියං දෙවදූතනති** මෙහි ද මහළු දිරුණු සත්වයා යන අර්ථයෙන් මෙසේ කියන්නේ වෙයි. පින්වත්නි, බලව්, මම ද තුඹලා මෙන් තරුණ වූයෙමි. කලවා අත් බාහු ජවයෙන් පිරුණේය. ඒ මාගේ ශක්තිය අතුරුදහන් විය. අත් පා තිබුණත් වැඩ නොකරත්. ජරාවෙන් නොමිදුණු හෙයින් මෙසේ වීමි. මා පමණක් නොව තොපි ද ජරාවෙන් නොමිදුණාහුය. මට යම්සේ ද එසේම තුඹලාට ද ජරාව එන්නේ ය. එහෙයින් ජරාව එන්නට පෙර කුසල් කරව් එහෙයින් මේ දේවදූතයා වෙයි.

**තතියං දෙවදූතනති** මෙහි ද ලෙඩ ඇති සත්වයා යන අර්ථයෙන් මෙසේ කියන්නේ වෙයි. පින්වත්නි, බලව මම ද තුඹලා මෙන් නිරෝගී වූයෙමි. ඒ මම දැන් ලෙඩෙන් මඩනා ලදුව සිය මළමූත්‍රයෙහි ඇලුණේ නැගිටින්න ද නොහැක්කෙමි. අත් පා තිබුණත් වැඩ නොකරත්. ලෙඩින් නොමිදුණු හෙයින් මෙසේ වීමි. මා පමණක් නොව තොපි ද ලෙඩින් නොමිදුණාහුය. මට යම්සේ ද එසේම තුඹලාට ද ලෙඩ එන්නේය. එහෙයින් ලෙඩ එන්නට පෙර කුසල් කරව්. එහෙයින් මේ දේවදූතයා වෙයි.

**චතුත්‍ථං දෙවදූතං** මෙහි කර්ම කිරීම හෝ කරවීම දේවදූතයයි. එහි කර්ම කරන පක්ෂයෙහි තිස්දෙකක් ඒ තාක් කර්ම කාරණා, අර්ථයෙන් මෙසේ කියත්. අපි උපන්නාහු ගසක හෝ ගලක හෝ නූපන්නෙමු. තුඹලා වැනි අයගේ ශරීරයේ උපන්නෙමු. මෙසේ අපේ ඉපදීමට පෙර පින් කරව්. එහෙයින් මේ දේවදූතයා වෙයි. කර්ම කරන්නා ද අර්ථයෙන් මෙසේ කියත්. අපි තිස්දෙකක් කර්ම කාරණා කරන්නෝ ගස් ආදියෙහි නොකරමු. තුඹලා වැනි සතුන් අතරෙහි ම කරමු. එහෙයින් අපේ කර්ම කිරීමට පළමුව තුඹලා කුසල් කරව්. එහෙයින් ඔහු ද දේවදූතයා නම්.

**පඤ්චමං දෙවදූතනති** එහි මළ සත්වයා අර්ථයෙන් මෙසේ කියයි. පින්වත්නි, මා බලව්. අමු සොහොනෙහි දැමීමට ඉදිමුම් ආදියට පැමිණියාහුය. මරණයෙන් නොමිදුණු හෙයින් මෙසේ වීමි. මා පමණක් නොව තොපි ද මරණයෙන් නොමිදුණාහුය. මට යම්සේ ද එසේම තුඹලාට ද මරණය එන්නේ ය. එහෙයින් මරණය එන්නට පෙර කුසල් කරව්.

එහෙයින් මේ දේවදූතයා වෙයි. මේ දේවදූතානුයෝගය කවරෙක් ලබා ද කවරෙක් නොලබා ද යමෙක් බොහෝ පාපයන් කරන ලද ද හෙතෙම ගොස් නරකයෙහි උපදියි. යමෙක් පාපයන් ටිකක් කරන ලද්දේ ද හෙතෙම ලබයි. යම් සේ බඩු සහිත සොරා ගෙන කළ යුත්ත ම කරත්. හෙතෙම විනිශ්චය ලබයි. මෙසේ මේ උපමාවයි. ඉතිරි කර්මය තමන්ගේ ස්වභාවයෙන් ම සිහි කරත්. සිහි කරවන්නාහු ද සිහි කරත්. එහි දී දීඝ ජයන්ත දෙමළ තෙමේ තමාගේ ස්වභාවයෙන් ම සිහි කළේය. ඒ දෙමළ තෙමේ සුමනගිරි වෙහෙර අහස් චෛත්‍යය රතු වස්ත්‍රයෙන් පිදීය. එකල නරකයෙහි උස්සදයට සමීපයෙහි උපන්නේ ගිනි දැල්වල ශබ්දය අසා තමා පුදන ලද වස්ත්‍රය සිහි කළේය. ඔහු ගොස් ස්වර්ගයෙහි උපන්නේය.

තවත් අයෙක් ද තරුණ භික්ෂුවකට බලි වස්ත්‍රයක් දෙන්නේ පාමුල තැබීය. තබන කාලයෙහි ම නිමිත්ත ගත්තේය. ඒ තෙමේ ද උස්සද සමීපයෙහි උපන්නේ ගිනිදැල් ශබ්දයෙන් ඒ සළුව සිහිකොට ස්වර්ගයෙහි උපන්නේය. තමාගේ ස්වභාවයෙන් සිහි නොවන විට දේවදූත පස්දෙනාගෙන් විචාරයි. එහි කිසිවෙක් පළමු දේවදූතයාගෙන් සිහි කරයි. කිසිවෙක් දෙවන දේවදූතයා ආදීන්ගෙන් සිහි කරයි. යමෙක් පස් දෙනාගෙනුත් සිහි නො කරයි නම් යමරජු විසින් තෙමේම සිහි කරයි. එක් ඇමතියෙක් සමන්මල් සැළියකින් මහසෑය පුදා යමරජුට පින් දුන්නේය. අකුසල කර්මයකින් නරකයෙහි උපන් ඔහු යමරජු සමීපයට පැමිණවූහ. ඔහු දේවදූතයන් පස් දෙනාගෙනුත් කුසල කර්මයක් සිහි නොකරන කල්හි යමරජු තෙමේම බලන්නේ නුඹ සමන්මල් සැළියකින් මහසෑය පූජා කොට මට පින් දුන්නෙහි නොවේදැයි සිහි කරවූයේය. ඔහු ඒ කාලයෙහි සිහිකොට දෙව්ලොවට ගියේය. යමරජු තෙමේම බලා නොදකින්නේ නම් මේ සත්ව තෙමේ මහා දුක් විඳින්නේ යැයි නිඃශබ්ද වෙයි.

මහානිරයෙහි අවීචි මහා නරකයෙහි එහි ප්‍රමාණය කෙතෙක් ද? ඇතුළත දිගින් පළලින් යොදුන් සියයකි. ලෝහ පොළවය. ලෝහ පියැසිය. එක් එක් බිත්තිය නව නව යොදුන්ය. නැගෙනහිර බිත්තියෙන් නැගී ගිනි දැල්ල බස්නාහිර බිත්තිය ගෙන එය විදගෙන ඇතින් යොදුන් සියයක් යයි. සෙසු දිශාවන්හි ද මේ ක්‍රමයයි. මෙසේ ගිනි ජාලාවන්ගේ අවසාන වශයෙන් දිගට පැතිරීමෙන් දහ අට යොදුන් අධික කොට ඇති යොදුන් තුන්සියකි. යොදුනක වටින් යොදුන් නව සියයක් ද පණස් හතර යොදුනක් ද වෙත්. හාත්පස උස්සද සමඟ යොදුන් දහ දාහක් වෙයි. **උබ්භතං තාදිසමෙව හොතීති** මෙහි පාගන ලද පාදය ඇට දක්වා දන ලද්දේ

උගුලන්නට නොහැක. මෙහි මේ තේරුමයි. යට පටන් දැවෙයි. උඩ පටන් දැවෙයි. මෙසේ පාගන කාලයෙහි දැවෙනු ලබන්නේ පෙනෙයි. උගුලන ලද කාලයෙහි ද එසේමය. එහෙයින් මෙසේ කියන ලදි. බහුසම්පත්තොති බොහෝ අවුරුදු ලක්‍ෂ ගණන් ඉක්ම ගියේය. කුමක් හෙයින් මේ නරකය අවීචිය යැයි නමට ගියේ ද ? වීචි නම් අතර යැයි කියයි. ගිනි දැල්වල හෝ සත්වයන්ගේ හෝ දුකෙහි හෝ අතරක් නැත. එහෙයින් එය අවීචිය යන නමට ගියේය. එහි නැගෙනහිර බිත්තියෙහි ගිනිදැල් නැග මසන්නාක් මෙන් යොදුන් සියයක් ගොස් බස්නාහිර බිත්තිය විද එතරින් යොදුන් සියයක් යයි. සෙසු දිශාවන්හි ද මේ ක්‍රමයයි. මේ ගිනිජාලා හයක් මැද උපන් දේවදත්ත තෙමේ ඔහුගේ යොදුන් සියයක් පමණ ආත්ම භාවයයි. පාදෙක වළලුකර තෙක් ලෝහ පොළොවෙහි පිවිසියේය. අත්දෙක මැණික් කටුව තෙක් ලෝහ බිත්තියෙහි පිවිසියේය. හිස ඇස් බැම දෙක තෙක් ලෝහ පියැස්සෙහි පිවිසියේය. අධෝමාර්ගයෙන් එක් ලෝහ හුලක් පිවිස ශරීරය විනිවිද ගොස් පියැස්සෙහි වැදුණේය. නැගෙනහිර බිත්තියෙන් නික්මුණු හුල හෘදය විනිවිද ගොස් බස්නාහිර බිත්තියේ වැදුණේය. උතුරු බිත්තියෙන් වැදුණු හුල ඉල ඇට විනිවිද ගොස් දකුණු බිත්තියේ වැදුණේය. නිශ්චල වූ බුදුරදුන් කෙරෙහි කිපුණු බැවින් නිශ්චලව පැසෙවයි කර්මයට සමාන බැවින් මෙබඳු වූයේය. මෙසේ ජාලාවන්ගේ නිතර පැවැති හෙයින් අවීචි නම් වේ. එහි ඇතුළත යොදුන් සියයක් ගිය තැන සැළියෙහි කොටා පුරවන ලද ඊයම් පිටි මෙන් සත්වයන්ගේ අතරක් නැත. මේ ස්ථානයේ සත්වයෙක් ඇත. මේ ස්ථානයේ සත්වයෙක් නැතැයි නොකිව යුතුයි යන සිටින හිඳින සැතපෙන පැසෙන මොවුන්ගේ කෙළවරක් නැත යන කල්හි ද සිටින කල්හි ද හිඳින කල්හි ද සැතපෙන කල්හි ද පැසෙන කල්හි ද ඔවුනොවුන් බාධා නොකරති. මෙසේ සත්වයන්ගේ නිරන්තර බැවින් අවීචි නම් වේ.

කායද්වාරයෙහි උපේක්‍ෂා සහගත සිත් හය උපදිත්. එකක් දුක් සහගතය. මෙසේ ඇති කල්හි යම් සේ දිව අග මී පැණි බින්දුවක් තබා එක තඹ ලෝහ බින්දුවක් තැබූ කල්හි දැවීම බලවත් හෙයින් එයම පෙනෙයි. අනෙක් ඒවා ගණන් නොගත යුතු ඒවා වෙත්. මෙසේ දැවීමේ බලවත් බැවින් මෙහි දුක ම නිරතුරුය. අනෙක් ඒවා ගණන් නොගත යුතු ඒවා යැයි මෙසේ දුකෙහි අතරක් නැති හෙයින් අවීචි නම් වේ.

මහනෙතාති යොදුන් සියයක හෙතෙම එහි වැටෙනුයේ එක් පාදයක් මහා නරකයෙහි වෙයි. එකක් ගූථ නරකයෙහි වැටෙයි. සූචිමුඛාති

ඉදිකටු හා සමාන මුඛය. ඔවුහු ඇතුන්ගේ බෙල්ල ප්‍රමාණය. එක් දෝණයක නැවක් පමණ හෝ වෙත්. කුක්කුලනිරයොති යොදුන් සියයක් පමණය. ඇතුළත කුළුගෙවල් පමණ අඟුරු පිරුණු ගිනිගෙන දිලිසෙන අළු නරකයයි. යම් තැනක වැටුණු වැටුණු සත්වයෝ කුරක්කන් ගොඩක් මතුයෙහි දවන ලද වෑතල ආදිය මෙන් යට කොටස ම ගනිත්. ආරොපෙන්තීති යකඩ පොලුවලින් ගසන්නාහු නංවත්. ඔවුන් නංවන කාලයෙහි ඒ කටු යටිකුරු වෙත්. බසින කල උඩුකුරු වෙත්. වාරිතානීති කර්මයෙන් හටගත් සුළඟින් සෙලවෙත්. හත්‍ථම්පි ඡින්‍දන්තීති ලැල්ලෙහි මස් මෙන් කොටමින් ම සිඳිත්. ඉදින් නැගිට පැන යයි ද යකඩ පවුරෙහි හැපී වැටෙයි. යට දැලිපිහියා පිහිටයි. ඛාරොදිකා නදීති වේතරණී නම් තඹ ලෝහ නදියයි. එය යකඩින් කරන ලද අළු වැල්වලින් යුතුය. පියුම් කොළය යට දැලි පිහිය. ඉවුරු දෙපස වේවැල් ද කුසතණ ද වේ. සො තත්‍ථ දුක්ඛාතිපාතී ඔහු එහි උඩට ද යටට ද ඉල්පෙන්නේ පියුම් පෙතිවල ඇලෙයි. කතිරයක් සටහන්ව ඇති අලවැල් වූ කටුවලින් විදියි. දැලැපිහියා සමූහයෙන් පැලෙයි. දෙපැත්තේ ඉවුරුවල කුසතණවලින් ඉරෙයි. වේවැල්වලින් අදියි. තියුණු ආයුධවලින් පලයි. තත්තෙන අයොසංකුනාති එයින් බඩගිනි යැයි කී කල මහත් ලෝහ පැසක් ලෝහ ගුලිවලින් පුරවා පමුණුවත්. ඔහු ලෝහගුලි බව දැන දත් තද කරයි. එවිට රත් වූ යකඩ අඬුවෙන් කට අරවත්. තඹලෝහ ධාරාවන්ගෙන් මහත් වූ ලෝහ කටාහයෙන් තඹලෝහ පමුණුවා මෙපරිදි ම කරත්. පුන මහානිරයෙහි මෙසේ පස් ආකාර බන්ධනයන්ගෙන් පටන් තඹලෝහ පානය යම්තාක් ද තඹලෝහ පානය පටන් පස් ආකාර බන්ධනයන් යම්තාක් කරවා මහා නරකයෙහි බහාලත්. එහි කිසිවෙක් පංච බන්ධනයන්ගෙන් මිදෙත්. ඇතමෙක් දෙවන එකෙන් ද ඇතැමෙක් තෙවැනි එකෙන් ද මිදෙත්. සමහරෙක් තඹලෝහ පානයෙන් මිදෙත්. කර්ම නොගෙවුන කල නැවත මහා නරකයෙහි බහාලත්.

මේ සූත්‍රය ගන්නේ එක් තරුණ භික්ෂුවක් ස්වාමීනි, මෙතෙක් දුක් අනුභව කරන ලද සත්වයා නැවත මහා නරකයෙහි බහාලත්දැයි ඇසීය. ඇවත, එසේය, කර්මය ක්‍ෂය නොවූ කල නැවත නැවත මෙසේ කරත්ය. ස්වාමීනි, උද්දේශය සිටීවා. මට කමටහනක් දෙවයි කමටහන කියවා සෝවාන් වී පැමිණ උද්දේශය ගත්තේය. මේ පෙදෙසෙහි උද්දේශය තබා රහත් වූ අන්‍යයන්ගේ ගණනක් නම් නැත. සියලු බුදුවරයන්ගේ මේ සූත්‍රය නොහරින ලදි. හීනකායූපගාති හීන වූ කයට පැමිණ, උපාදානෙති තෘෂ්ණා දෘෂ්ටි ගැනීමෙහි ජාතිමරණසම්භවෙති ඉපදීමට ද මැරීමට ද

කාරණ වූ අනුපාදාති සතර උපාදානයන්ගෙන් අල්වා නොගෙන ජාතිමරණ සංඛයෙති ජාති මරණ නම් නිවනෙහි මිදෙත්. දිට්ඨධම්මාභිනිබ්බුතාති ඇස් ඉදිරිපිට මේ ආත්ම භාවයෙහි සියලු කෙළෙස් නිවීමෙන් නිවුනාහ. සබ්බදුක්ඛං උපච්චගුන්ති සියලු දුක් නැති කළාහු වෙත්.

දේවදූත සූත්‍ර වර්ණනාව නිමි.

තුන්වන සුඤ්ඤත වර්ගය සමාප්තයි.

# 4.4.1

**එවමෙසුතනති** මාවිසින් භද්දේකරත්ත සූත්‍රය මෙසේ අසන ලදි. එහි **භද්දෙකරත්තස්සාති** විදර්ශනා භාවනාවෙහි යුක්ත යහපත්ව ඇළුනහුගේ **උද්දෙසනති** මාතෘකාවයි. **විභංගනති** විස්තර බෙදිය යුතු. **අතීතනති** පසුගිය ස්කන්ධ පසෙහි **නාන්වාගමෙය්‍යාති** තෘෂ්ණා දෘෂ්ටිවලින් අනුව නො යන්නේය. **න පටිකංඛෙති** තෘෂ්ණා දෘෂ්ටියෙන් ප්‍රාර්ථනා නො කරන්නේය. **යදතීතනති** මෙහි මේ කාරණා වචනයයි. යම් හෙයකින් යමක් පසුගියේ ද එය ප්‍රහීනය. නිරුද්ධය. අස්තයට ගියේය. එහෙයින් එය අනුව නො යන්නේය. යම්හෙයකින් යමක් නො පැමිණියේ ද එය නො පැමිණියේය. නො ඇතිවිය. නො ඉපදුණේය. එහෙයින් එය ද නො පතන්නේය. **තත්ථ තත්ථාති** වර්තමාන වූ ධර්මයක් යම් යම් තැනක උපදී ද එහි එහිම එය අනිත්‍යානුපස්සනාදී වූ සප්ත අනුපස්සනාවන්ගෙන් යමෙක් විදර්ශනා කරයි. ආරණ්‍යයෙහි හෝ ඒ ඒ තැන විදර්ශනා කරයි. **අසංහිර අසංකුප්පනති** මෙය විදර්ශනාව දක්වීම පිණිස කියන ලදි. විදර්ශනාව වනාහි රාගාදීන්ගෙන් වෙනස් නොවෙයි. අසංහීර අසංකුප්ප නම් වේ. එය වර්ධනය කරන්නේ යැයි කියන ලදි. නොහොත් නිවන රාගාදීන්ගෙන් වෙනස් නොවෙනුයේ යැයි අසංහීර අසංකුප්ප නම් වේ. එය දන පණ්ඩිත මහණ තෙමේ නැවත නැවත ඒ අරමුණ ඵල සමාපත්තියට පමුණුවමින් වඩන්නේ ය යන තේරුමයි. එය වඩන්නහුගේ අර්ථය පිණිස **අජ්ජෙව කිච්චං ආතප්පනති** කෙලෙසුන්ගේ තැවීමෙන් ආතප්ප යැයි ලබන ලද නම වීර්ය කළ යුතු යැයි දක්වයි. **කො ජඤ්ඤා මරණං සුවෙති** හෙට මරණය හෝ ජීවත්වීම හෝ කවරෙක් දනී ද? අද දන් හෝ දෙමි. සිල් හෝ රකිමි. වෙනත් කුසලයක් හෝ කරන්නෙමි. අද ප්‍රමාදයක් ඇත. හෙට හෝ වෙන දවසක හෝ දන ගන්නෙමි. සිත නූපදවා අද අද ම කරන්නෙමියි මෙසේ වීර්ය කළ යුතු යැයි දක්වයි.

**මහාසෙනෙනාති** ගිනි විස ආයුධ ආදී නොයෙක් මරණයට හේතු වූ ඒ සේනාවයි. ඒ මහත් සේනාව වශයෙන් මහාසේන නමි. මෙබඳු මාරයා සමඟ දවස් කිහිපයක් බලාපොරොත්තු වෙව. යම්තාක් මම බුද්ධ පූජා ආදී වූ තමාට අවශ්‍ය කර්ම කරමි. මෙසේ මිත්‍රයෙකු ආකාරයැයි කියන ලද මේ සියය හෝ දහස හෝ ගෙන කිහිප දවසක් බලාපොරොත්තු වෙවයි මෙසේ අල්ලස් දීමකින් හෝ යම් සෙනගෙන් ප්‍රතිබාහනය කරමියි හෝ මෙසේ බල සමූහයයි කියන ලද යුද්ධයක් හෝ නැත. **සංගාරොති**

මිත්‍රයෙකු ආකාර යැයි කියන ලද මෙය අල්ලස් දීමකින් හෝ මේ සෙනගෙන් හෝ එහෙයින් මේ අර්ථයෙන් කියන ලදි. **අතන්දිතන්ති** අනලස්ව උත්සාහයෙන්, මෙසේ පිළිපන්න බැවින් යහපත් ඇලීම මොහුගේ යනු **භද්දෙකරත්තො** යන්නයි. මෙසේ පිළිපන්න ඒ පුද්ගලයා මේ භද්දෙකරත්තයයි. රාගාදියෙන් සංසිඳුණු හෙයින් ශාන්ත වූ බුදුරදුන් කියයි. **එවං රූපොති** යනාදියෙහි කාලයට සමාන ඉඳුනිල් මැණිකක් පැහැය වූයෙමියි. මෙසේ මනෝඥරූප වශයෙන් මෙබඳු වූයෙමි. කුසල් සැප සොම්නස් විඳීම් වශයෙන් ම මෙසේ වේදනා නම්. එය යුක්ත සංඥා ආදීන්ගේ වශයෙන් මෙසේ සංඥාවන්ය. සංස්කාරය ද මෙසේමය. විඥානය ද මෙසේමය. අතීත කාලය වූයෙමි. එහි **නන්දිං සමන්වානෙතීති** ඒ රූපාදීන්හි තෘෂ්ණාවෙන් සමන්විතයි. දෘෂ්ටිය අනුව පවතියි. හීනරූපාදී වශයෙන් ද මෙබඳු විය. - පෙ - මෙසේ විඥානය වේ යැයි නොසිතයි. **නන්දිං න සමන්වානෙතීති** තෘෂ්ණාව හෝ තෘෂ්ණාවෙන් යුක්ත දෘෂ්ටිය හෝ අනුව නොපවතියි. **එවංරූපො සියන්ති** ආදියෙහි ප්‍රණීත මනෝඥ රූපාදී වශයෙන් තෘෂ්ණාදෘෂ්ටි පැවතීම් සංඛ්‍යාත නන්දිය ම සමන්විත යැයි දත යුතුයි. **තත්‍ථ තත්‍ථ භික්ඛවෙ පච්චුප්පන්නෙසු ධම්මෙසු සංහීරතීති** මේ වර්තමාන වූ යම් ධර්මයක් ඒ ඒ තැන්වල විදර්ශනා කරයි. **අසංහීරං අසංකුප්පන්ති** උද්දේශයාගේ නිර්දේශය පිණිස කියන ලදි. මෙහි කාමය ද මහණෙනි, කෙසේද? වර්තමාන වූ ධර්ම විදර්ශනා නොකෙරේ ද? යනාදිය කිව යුතුයි. යම්හෙයකින් අසංහීරය ද අසංකුප්පය ද විදර්ශනාවෙන් කියන ලදි. එහෙයින් එහි මෙසේ නොවීම ද වීම ද දක්වන්නට **සංහීරති නසංහීරති** යන මාතෘකා ගෙන විස්තර වශයෙන් කියන ලදි. එහි සංහීරති යන්න විදර්ශනාව නොවැඩීමෙන් තෘෂ්ණා දෘෂ්ටියෙන් අදියි. නසංහීරති යන්න විදර්ශනාව වැඩීමෙන් තෘෂ්ණා දෘෂ්ටියෙන් නොඅදියි. ඉතිරිය සියලු තැන්හි ම ප්‍රකටය.

**භද්දේකරත්ත සූත්‍ර වර්ණනාව නිමි.**

## 4.4.2

එවමෙමසුතනති මා විසින් ආනන්‍දභද්දේකරත්ත සූත්‍රය මෙසේ අසන ලදී. එහි පටිසල්ලාණා වුට්ඨිතොති එලසමවතින් නැගිට්යේ. කො නු බො භික්ඛවෙති දත්තේ ම කථාසමුට්ඨානය පිණිස ඇසීය. සාධු සාධූති තෙරුන්ට සාදුකාර දුන්නේය. සාධු බො ත්වනති පරිමණ්ඩල වූ පදබ්‍යංජනයන්ගෙන් පිරිසිදුව කියන ලද හෙයින් දේශනාවට ප්‍රශංසා කරමින් කීය. ඉතිරිය සියලු තැන්හි ම ප්‍රකටය.

ආනන්‍දභද්දේකරත්ත සූත්‍ර වර්ණාව නිමි.

## 4.4.3

එවමෙමසුතනති මා විසින් මහාකච්චානභද්දේකරත්ත සූත්‍රය මෙසේ අසන ලදී. එහි තපොදාරාමෙති රත් වූ ජලය ඇති හෙයින් මෙසේ ලබන ලද නම් ඇති ආරාමයෙහි වේභාර පර්වතයේ යට භූම්‍යස්ථ නාගයන්ගේ පන්සියයක් යොදුන් වූ නාගභවන දිව්‍යලෝකය හා සමානයි. මැණික්වලින් කරන ලද තලයෙන් ද ආරාම උද්‍යානවලින් ද සමන්විතයි. එහි නාගයන් ක්‍රීඩා කරන ස්ථානයෙහි මහත් ජල විලකි. එයින් තපෝදා නම් ගංගාව ගලා බසියි. කර්කෂ උණු වතුරය. කුමක් හෙයින් මෙසේ වුවා ද? රජගහනුවර පිරිවරා මහත් ප්‍රේත ලෝකයකි. එහි මහා ලොහුකුම්භ නරක දෙක අතරින් මේ තපෝදා ගංගාව එයි. එහෙයින් එය කර්කශව ගලා බසියි. මෙය කියන ලදී. මහණෙනි, යම් ස්ථානයකින් තපෝදාව ගලා බසියි ද ඒ විල පිරිසිදු ජලය ඇත්තේ ද සිහිල් ජලය ඇත්තේ ද ශීතල ජලය ඇත්තේ ද සුදු ජලය ඇත්තේ ද මනාකොට පිහිටි තොටුපලවල් ඇත්තේ ද සිත්කළු ද බොහෝ මත්ස්‍යයන් කසුබුවන් ඇත්තේ ද වේ. පියුම් පිපෙත්. එතෙකුදු වුවත් මේ තපෝදාව මහා නිරය දෙක අතරින් එයි. එහෙයින් මේ තපෝදාව කර්කෂව ගලා බසියි. මේ ආරාමයට ඉදිරියෙහි මහත් ජල විලක් වූයේය. ඒ වශයෙන් මේ ආරාමය තපෝදාරාමය යැයි කියයි.

සමිද්ධීති ඒ තෙරුන්ගේ ආත්මභාවය සමෘද්ධිමත්ය. රූපය ප්‍රසාද එළවන්නේය. එහෙයින් සමිද්ධි යන නමට පැමිණියේය. ආදිබ්‍රහ්මචරියකොති මාර්ග බ්‍රහ්මචර්යාවට පූර්වභාග ප්‍රතිපත්ති වූයේය. ඉදං වත්වා සුගතො උට්ඨායාසනාති මේ ආදිය මධුපිණ්ඩික සූත්‍රයෙහි කියන ලද ක්‍රමයෙන් විස්තර කළ යුතුයි. ඉති මෙ චක්ඛුන්ති මේ සූත්‍රයෙහි බුදුරදුන් දොළොස් ආයතන වශයෙන් මාතෘකා තැබීය. තෙරුන් වහන්සේ ද බුදුන් විසින් යට අසූ උපරි චතුත්ථෙචාති යන මේ සූත්‍ර තුනෙහි පංචස්කන්ධ වශයෙන් මාතෘකාව ද විභංගය ද කරන ලදි. මෙහි වනාහි දොළොස් ආයතන වශයෙන් බෙදීම පිණිස මාතෘකාව තබන ලද්දේ යැයි නය ලබා මෙසේ කීය. මේ ක්‍රමය ලබන්නා වූ තෙරුන් විසින් බැරෑරුම් කරන ලදි. පදයක් නැති තැන පදයක් දක්වන ලදි. අහසෙහි පදයක් කරන ලදි. එහෙයින් බුදුරදුන් මෙම සූත්‍රය සඳහා ම ඔහු මහණෙනි, මාගේ ශ්‍රාවක භික්ෂූන් අතරෙන් කෙටියෙන් කියන ලද්දට විස්තරාර්ථ බෙදීම් වශයෙන් මහාකච්චායන අග්‍රස්ථානය යැයි අගතනතුරෙහි තැබීය. මෙහි චක්ඛුන්ති චක්ෂුර් ප්‍රාසාදයයි. රූපාති සතර සමුට්ඨානික රූපයෝය. මේ ක්‍රමයෙන් සෙසු ආයතනයෝ ද දත යුතුයි. විඤ්ඤාණන්ති බලවත් විඥානයයි. තදභිනන්දතීති ඒ ඇස ද රූපය ද තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් සතුටු වෙයි. අන්වාගමෙති තෘෂ්ණා දෘෂ්ටිය අනුව යයි. ඉති මෙ මනො අහොසි ඉති ධම්මාති මෙහි සිත නම් භවාංග සිතයි. ධම්මාති ත්‍රෛභූමික ධර්මාරම්මණයයි. පණිදහතීති ප්‍රාර්ථනාව තැබීය. පණිධානපච්චයාති ප්‍රාර්ථනාව තබන කාරණයයි. ඉතිරිය සියලු තැන්හි ම ප්‍රකටය.

**මහාකච්චානභද්දේකරත්ත සූත්‍ර වර්ණනාව නිමි.**

# 4.4.4

**එවමෙමසුතන්ති** මා විසින් ලොමසකංගියභද්දේකරත්ත සූත්‍රය මෙසේ අසන ලදි. එහි **ලොමසකංගීයොති** යනු මේ අංග නම් තෙරුන් වහන්සේගේ ශරීරයේ ඊතල ආකාර ලෝම ඇති හෙයින් ලොමසකංගිය යැයි ප්‍රසිද්ධ විය. **චන්‍දනො දෙවපුත්තොති** මොහු කාශ්‍යප බුදුරදුන්ගේ කාලයෙහි මහත් ධනය ඇති චන්දන නම් උපාසකයෙක් විය. තෙරුවන්ට සිව්පසයෙන් උපස්ථාන කොට දිව්‍ය ලෝකයෙහි උපන්නේ ය. පළමු නමින් ම චන්දන දේවපුත්‍රයා යන නමට ගියේය. **පණ්ඩුකම්බලසිලායනති** රතු කම්බිලි ගලෙහි. ඒ රතුකම්බිලිය දැ සමන් මල් සමූහයකගේ පැහැය ඇති බැවින් පණ්ඩුකම්බලසිලාය යැයි කියයි. කවරදාක එහි බුදුරදුන් වැඩි සිටියේ ද? බුද්ධත්වයෙන් හත්වන වර්ෂයෙහි සැවැත්නුවර ඇසළ පොහොයේ දී දෙළොස් යොදුන් පිරිස මැද යමාමහ පෙළහර කොට බැස ගණ්ඩබ්බ අඹගස මුල පණවන ලද බුද්ධාසනයෙහි වැඩහිඳ දහම් දෙසීමෙන් මහජනයා මහත් දුකින් උදුරා බුදුවරු නම් යම්හෙයකින් පෙළහර කොට මිනිස් පථයෙහි නොවසත්. එහෙයින් ඒ ජනයා බලාසිටිය දී ම ත්‍රිපද වික්‍රමය කොට තව්තිසා භවනෙහි පරසතුගස මුල පඬුපුල් ගලෙහි වස් එළඹියේය. ඒ කාලයෙහි විසීය.

**තත්‍ර භගවාති** බුදුරදුන් එහි වසන්නේ. බොහෝ සෙයින් දස දහසක් සක්වළින් රැස් වූ දෙවියන් විසින් පිරිවරණ ලද්දේ මව කාය සාක්ෂිකොට අභිධර්ම පිටකය දේශනා කරන්නේ ගැඹුරු වූ සියුම් වූ ත්‍රිලක්ෂණ සහිත වූ රූපාරූප පරිච්ඡේද කථාව අවබෝධ කරන්නට නොහැකි වූ දෙවියන්ට සංවේග ඉපදවීම පිණිස අතරතුර භද්දේකරත්තයෙහි උද්දේශය ද විභංගය ද දේශනා කළේය. එහි මේ දෙව්පුත් තෙමේ ඉගෙන ගන්නේ මේ ගාථා සමඟ විභංගය ඉගෙන ගත්තේය. දිව්‍ය පුත්‍රයා වනාහි ප්‍රමාද අධිෂ්ඨාන හෙයින් දිව්‍ය අරමුණු වලින් මඩිනු ලබන්නේ පිළිවෙළින් සූත්‍රය මුළා වූයේ ගාථා පමණක් දැරීය. එහෙයින් කීය. **එවං ඛො අහං භික්ඛු ධාරෙමි භද්දෙකරත්තියො ගාථාති උග්ගණ්හාහි ත්වන්ති** ආදියෙහි නිබ්ශබ්දව හිඳගෙන අසමින් ඉගෙන ගනියි. වචනයෙන් සජ්ඣායනා කරන්නේ ඉගෙන ගත්තේ නම්. අනුන්ට කියවන්නේ දරයි නම්. ඉතිරිය ආනන්ද භද්දේකරත්තය හා සමානය.

**ලොමසකංගියභද්දේකරත්ත සූත්‍ර වර්ණනාව නිමි.**

# 4.4.5

එවමෙමසුතනති මා විසින් සුභ සූත්‍රය මෙසේ අසන ලදි. එහි සුභොති ඔහු වනාහි ප්‍රසාද එළවන දකුම්කළු වූයේ වෙයි. එහෙයින් ඔහුට ශරීරාවයවයන් හොඳ බැවින් සුභ යන නම විය. මාණවොති ඔහු තරුණ කාලයෙහි ව්‍යවහාර කළාහ. ඔහු මහළු කාලයේ ද ඒ ව්‍යවහාරයෙන් ම ව්‍යවහාර කරයි. තොදෙය්‍යපුත්තොති තෝදෙය්‍ය නම් පසේනදී රජුගේ පුරෝහිත බමුණාගේ පුතායි. සැවැත්නුවරට සමීපයෙහි තුදි නම් ගමක් ඇත. එයට අධිපති හෙයින් තෝදෙය්‍ය යන නමට ගියේය. අසූහත් කෝටියක් පමණ මහත් වස්තු ඇත්තෙකි. ඉතා ලෝභීය. දෙන්නාගේ වස්තුව ක්‍ෂය නොවීමක් නම් නැතැයි සිතා කිසිවෙකුට කිසිවක් නොදෙයි. මෙය කියන ලදි.

අඳුන් ක්‍ෂයවීමත් වේයන්ගේ රැස් කිරීමත් මී මැස්සන්ගේ එකතු කිරීමත් දැක පණ්ඩිතයා ගිහිගෙයි වසන්නේය.

මෙසේ නොදීම ම ඉගැන්වීය. ළඟ විහාරයෙහි වැඩ වසන බුදුරදුන්ට කැඳ ටිකක්වත් බත් හැන්දක්වත් නොදී ධන ලෝභයෙන් මැරී ඒ ගෙදර ම බල්ලෙක් ව උපන්නේ ය. සුභ තෙමේ ඒ බල්ලාට ඉතා ප්‍රියයි. තමා කන ආහාර ම කවයි. ඔසවා හොඳ සයනාසනවල ම සතපයි. එකල්හි බුදුරදුන් එක් දවසක් උදෑසන ලොව බලන්නේ ඒ බල්ලා දැක තෝදෙය්‍ය බමුණා ධන ලෝභයෙන් තමන්ගේ ගෙදර ම බල්ලෙක් ව උපන්නේ ය. අද මා සුභගේ ගෙට ගිය කල්හි මා දැක බල්ලා බුරන්නේ ය. එකල මම ඌට එක වචනයක්වත් කියන්නේ ය. ඌ ශ්‍රමණ ගෞතමයෝ මා හැඳින ගත්තේ යැයි දැන ගනියි. එසේ දැන ගොස් ලිප් බොක්කෙහි ලගින්නේ ය. ඒ කාරණයෙන් සුභට මා සමඟ එක් කථාසල්ලාපයක් වන්නේ ය. ඔහු බණ අසා සරණයන්හි පිහිටන්නේය. බල්ලා මැරී නරකයෙහි උපදින්නේ ය. මේ තරුණයා සරණයෙහි පිහිටන බව දැන බුදුරදුන් ඒ දවසෙහි සිරුර පිළිදුගුම් කොට තනිවම ගමට පිවිස මාණවකයා නික්මුණු කල්හි ඒ ගෙට පිඬු පිණිස වැඩියේය.

බල්ලා බුදුරදුන් දැක බුරමින් බුදුරදුන් ළඟට ගියේය. එයින් බුදුරදුන් ඌට මෙසේ කීය. තෝදෙය්‍ය, නුඹ පෙර ද මට භෝ භෝ යි නින්දා කොට බල්ලෙක් විය. දැන් ද බුරා අවීචියට යන්නෙහිය. බල්ලා එය අසා

ශ්‍රමණ ගෞතමයන් මා දනී යැයි විපිළිසර වී බෙල්ල නමාගෙන ලිපේ අළු අතරෙහි ලැග්ගේය. මිනිස්සු ඔසවා සයනෙහි සතපවන්නට උත්සාහ කළත් නොහැකි වූහ. සුභ තෙමේ ඇවිත් කවරෙක් මේ බල්ලා සයනයෙන් ඉවත් කරන ලද්දේදැයි ඇසීය. මිනිස්සු කිසිවෙක් නෙවෙයි කියා ඒ විස්තරය කීහ. තරුණයා එය අසා මාගේ පියා බඹලොව උපන්නේය. තෝදෙය්‍ය නම් බල්ලෙක් නැත. ශ්‍රමණ ගෞතමයන් පියා බල්ලෙක් කරයි. මොහු යම්කිසිවක් කටට ආ පමණින් කියයි. කිපී බුදුරදුන්ට මුසාවාදයෙන් නිග්‍රහ කරනු කැමැත්තේ විහාරයට ගොස් ඒ ප්‍රවෘත්තිය ඇසීය.

බුදුරදුන් ඔහුට ද මෙසේ ම කියා වාද නොකිරීම පිණිස මෙසේ කීය. මාණවකය, නුඹගේ පියා විසින් නොකියන ලද ධනයක් ඇත් ද? භවත් ගෞතමය, ඇත. ලක්ෂයක් වටිනා රන් මාලය, ලක්ෂයක් වටිනා රන් මිරිවැඩිසඟල, ලක්ෂයක් වටිනා රන් තැලිය. ලක්ෂයක් කහවණු ඇත. යව, ඒ බල්ලා දිය නැති කිරිබතින් කවා සයනයෙහි නංවා ටිකක් නිදිගත කල්හි අසව. සියල්ල නුඹට කියන්නේය. එකල්හි මොහු මාගේ පියා යැයි දැන ගනුව. මාණවකයා ඉදින් සැබෑ නම් ධනය ලබමි, නොවේනම් ශ්‍රමණ ගෞතමයන් මුසාවාදයෙන් නිග්‍රහ කරන්නෙමියි කාරණා දෙකකින් සතුටු වූයේ ගොස් එසේ කළේය. බල්ලා මොහු විසින් දැන ගත්තේ යැයි දැන බුං බුං යැයි බුරමින් ධනය නිධන් කළ තැනට ගොස් පයින් පොළොව හාරා සංඥාවක් දුන්නේය. තරුණයා ධනය ගෙන භවයෙන් වැසුණු මෙබඳු සියුම් ප්‍රතිසන්ධීන් ශ්‍රමණ ගෞතමයන්ට ප්‍රකටය. මේ තෙමේ ඒකාන්තයෙන් සර්වඥය යැයි බුදුරදුන් කෙරෙහි පැහැදුණු සිත් ඇත්තේ ප්‍රශ්න දහ හතරක් ඇසුවේය. මොහු අංගවිජ්ජා පාඨකයෙකි. එහෙයින් ඔහුට මෙබඳු සිතක් විය. මේ දහම් පඬුරු ගෙන ශ්‍රමණ ගෞතමයන්ගෙන් ප්‍රශ්න අසන්නෙමියි දෙවැනි ගමනෙන් යෙන භගවා තෙනුපසංකමීති ඔහු විසින් අසන ලද ප්‍රශ්න එක පහරින් ම පළමුව විසඳන්නේ **කම්මස්සකාති** යනාදිය කීය. එහි කර්මය මොවුන්ට දායාදය යනු **කම්මදායාදා** නම්. කර්මය මොවුන්ට දායාදය යනු කම්මදායාදා නම්. කර්මය මොවුන්ට දායාදය භාණ්ඩයන්ය යන තේරුමයි. කර්මය මොවුන්ට කාරණාවය යනු **කම්මයොනි** නම්. කර්මය මොවුන්ට නෑදෑයෝය යනු **කම්මබන්ධු** නම්. කර්මය ඥාතීය යන තේරුමයි. කර්මය මොවුන්ට පිළිසරණය. පිහිට වෙයි යනු **කම්මපටිසරණා** නම්. **යදිදං හීනපණීතතායාති** යමෙක් මෙහි නුඹ පහත්ය. නුඹ උසස්ය. නුඹ අල්පායුෂය. නුඹ දීර්ඝායුෂය. - පෙ - නුඹ නුවණ තැනැත්තෙකි. නුඹ නුවණ ඇත්තෙකි. මෙසේ උස් පහත් බව බෙදීම අනෙකෙක් විසින් නොකරයි. කර්මය ම මෙසේ සත්වයන් බෙදයි යන තේරුමයි. තරුණයා

කියන ලද්දෙහි තේරුම දන නොගත්තේය. සන රෙදි පටකින් ඔහුගේ මුඛය බැඳ මිහිරි දෙයක් ඉදිරියේ තබන ලද්දාක් මෙන් විය. මෙතෙම මාන්නක්කාර පණ්ඩිතමානි අයෙකි. දමා බලයි. එකල ඔහුට ශ්‍රමණ ගෞතමයන් කුමක් කියයි ද? මම යමක් දනිම් ද එයම කියයි. මේ මානය නොවේවායි මානය බිඳුණු පිණිස බුදුරදුන් මුල පටන් අවබෝධ නොවන සේ කොට කියන්නෙමියි එයි. භවත් ගෞතමයනි, මම නොදනිමි. මට ප්‍රකට වන සේ විස්තර කොට කියවයි මාගෙන් ඉල්ලන්නේය. එකල ඔහු ඉල්ලූ කළ මම කියන්නෙමියි. මෙසේ ඔහුට සාර්ථක වන්නේ යැයි අවබෝධ නොවන සේ කොට කීය. දන් ඔහු තමන්ගේ නොදන්නා බව ප්‍රකාශ කරන්නේ න ඛො අහනති යනාදිය කීය.

**සමත්තෙනාති** සම්පූර්ණ වූ, **සමාදිණ්ණෙනාති** ගන්නා ලද උතුම් අර්ථයෙන් **අප්පායුකසංවත්තනිකා එසා මාණව පටිපදාති** යම් යම් ප්‍රාණඝාතයක් වේද යම් යම් ප්‍රාණඝාත කර්මයක් වේද මෙය අල්පායුෂ පිණිස පවතින ප්‍රතිපදාවයි. කෙසේ මෙය අල්පායුෂ ඇති කෙරේ ද? උපපීළක, උපච්ඡේදක, ජනක, උපස්ථම්භක යැයි කර්ම හතරකි. බලවත් කර්මයකින් ඉපදුණේ උපපීළක කර්මය ඇවිත් අර්ථ වශයෙන් මෙසේ කියයි. ඉදින් මම පළමුවෙන් දන්නව නම් නුඹට මෙහි උපදින්නට නොදෙන්නෙමි. සතර අපායන්හි ම නුඹ උපදවන්නෙමි. එසේ වේවා. නුඹ යම්කිසි තැනක උපදියි ද මම උපපීළක කර්මය නම් නුඹ පෙළා ඕජස් නැති කසටයක් කරන්නෙමි. එතැන් පටන් නුඹ එබන්දක් කරයි. කුමක් කරයි ද? දුක් පමුණුවයි. වස්තුව විනාශ කරයි. එහි දරුවන්ගේ මව්කුස උපන් කාලයේ පටන් මවට හුස්ම ගැනීමට හෝ සැටියක් නැත. මව්පියන්ට පීඩාවක් ම උපදියි. ගෙහි වස්තුව ජලය පැමිණි ලුණු මෙන් රජවරු ආදීන්ගෙන් නැසෙත්. කළයක් කිරි දොවන දෙන්නු කිරි නොදෙත්. මෙහෙකරුවෝ වචන අනුව වැඩ නොකරත්. වපුරණ ලද ගොයම් හට නොගනියි. ගෙට ගියේ ගෙහි ද කැළයට ගියේ කැළයෙහි ද නැසෙත්. පිළිවෙළින් කන බොන දේ ද අඩු වෙයි. ගැබ් පෝෂණය නොවෙයි. ප්‍රසූත කාලයෙහි මවගේ කිරි සිඳෙයි. දරුවා පෝෂණය නොලැබ පීඩිතව ඕජස් නැතිව කර්කශ වෙයි. මේ උපපීළක කර්මය නම්. දීර්ඝායුෂ කර්මයකින් උපන්නාහට උපච්ඡේදක කර්මය ඇවිත් ආයුෂ සිඳියි.

යම්සේ පුරුෂයෙක් උසභ අටක් යාමට හැකි කොට ඊයක් දමන්නේ ද අනෙකක් එය දුන්නෙන් මිදුණු මොහොතේ ම මුගුරකින් ගසා එහි වට්ටවන්නේ ද මෙසේ දීර්ඝායුෂ කර්මයකින් උපන්නාගේ

උපච්ඡේදක කර්මය ආයුෂ සිඳියි. කුමක් කරයි ද? සොරු සිටින කැළයට පිවිසවයි. වල්මත්ස්‍යයන් සිටින වතුරට බස්සවයි. අන්‍ය වූ උවදුරු සහිත තැනකට පමුණුවයි. මෙය උපච්ඡේදක කර්මය නම්. උපඝාතක යැයි ද මෙයට ම නමකි.

ප්‍රතිසන්ධිය උපදවන කර්මය ජනක කර්මයයි. සම්පත් නැති කුලාදීන්හි උපන්නහුට භෝග සම්පත් දීමාදියෙන් උපකාරී වීම උපස්ථම්භක කර්මය නම්. මේ කර්ම හතර අතුරෙන් පළමු දෙක අකුසල්මය. ජනක කර්මය කුසල් ද අකුසල් ද වෙයි. උපස්ථම්භක කර්මය කුසල්මය. එහි ප්‍රාණඝාත කර්මය උපච්ඡේදක භාවයෙන් අප්පායුකසංවත්තනික වෙයි. ප්‍රාණඝාතයෙන් හෝ කරන ලද කුසල කර්මය මහත් නොවෙයි. දීර්ඝායුෂව උපදවන්නට නොහැකියි. මෙසේ ප්‍රාණඝාතය අල්පායුෂ ගෙන දෙයි. ප්‍රතිසන්ධිය නියම කොට ආයුෂ අඩු කරයි. යටහත් චේතනාවෙන් හෝ නරකයෙහි උපදියි. පූර්වාපර චේතනාවෙන් ද කියන ලද ක්‍රමයෙන් අල්පායුෂ කරයි. දීඝායුකසංවත්තනිකා එසා මාණව පටිපදාති මෙහි ස්වල්ප කර්මයකින් උපන්නේ පැවති කල්හි ම ප්‍රාණඝාතයෙන් විරති කර්මය ඇවිත් අර්ථ වශයෙන් මෙසේ කියයි. ඉදින් මම පළමුවෙන් දන්නව නම් නුඹට මෙහි උපදින්නට නොදෙන්නෙමි. නුඹ දෙව්ලොව උපදවන්නෙමි. එසේ වේවා, නුඹ යම්කිසි තැනක උපදියි ද මම උපස්ථම්භක කර්මය නම් නුඹට උපස්ථම්භය කරන්නෙමි. කුමක් කරයි ද? උපද්‍රවය නසයි. වස්තුව උපදවයි. එහි දරුවගේ මව්කුස ඉපදුණු කාලයේ පටන් මව්පියන්ට සැපය ම වෙයි. මිනිසුන්ට ප්‍රකෘතියෙන් යම්කිසි කරදරයක් ඇත් ද එය පහ කරත්. දරුවා මව්කුස උපන් කාලයේ පටන් ගෙදර වස්තුව අප්‍රමාණ වෙයි. නිධාන ගෙයි දෙපැත්තෙන් පෙරළී එයි. මව්පියෝ අනුන්ට දුන් ධනය සම්බවෙත්. දෙනුන්ගේ කිරි වැඩි වෙත්. ගොන්නු කීකරුව සුවසේ වසත්. වැපුරු ගොයම් හොඳින් පැසෙයි. තාවකාලිකව දෙන ලද ධනය කරදර නැතිව ඒ අයම ගෙනත් දෙත්. කම්කරුවෝ කීකරු වේ. කර්මාන්ත නොපිරිහෙයි. දරුවා ගැබෙහි පටන් පෝෂණය ලබයි. වෛද්‍ය ප්‍රතිකාර හිතවත් වෙත්. ගෘහපති කුලයක උපන්නේ සිටු තනතුරු ද අමාත්‍ය කුලයක උපන්නේ සේනාපති තනතුරු ද ලබයි. මෙසේ සම්පත් උපදවයි. ඔහු කරදර නැතිව සම්පත් සහිතවම බොහෝ කල් ජීවත් වෙයි. මෙසේ ප්‍රාණඝාතය නොවන කර්මය දීර්ඝායුෂ සඳහා පැවතීම ඇති කරයි. ප්‍රාණඝාතය නොවන දෙයින් කරන ලද අන්‍ය කුසල ද මහත් වෙයි. දීර්ඝායුෂ ප්‍රතිසන්ධිය දීමට කැමති වෙයි. මෙසේ දීඝායුකසංවත්තනිකය වෙයි. ප්‍රතිසන්ධිය නියම කොට හෝ දීර්ඝායුෂ ලබා දෙයි. යටහත්

චේතනාවෙන් හෝ දිව්‍ය ලෝකයෙහි උපදවයි. පූර්වාපර චේතනාවෙන් කියන ලද ක්‍රමයෙන් දීර්ඝායුෂ වෙයි. මේ ක්‍රමයෙන් සියලු ප්‍රශ්න විසඳීමෙහි තේරුම දත යුතුයි. විහෙඨන කර්මාදිය ද පැවති කල්හි ඇවිත් අර්ථ වශයෙන් එසේම කියන්නාහු උපපීළක කර්මයෙන් බෝග නැති බවට නොපමුණුවා පිළිගැනීම් නොලබන්නහුට ලෙඩ ඉපිදවීම් ආදී වෙහෙස ආදියෙන් කරන ලද කුසල්වල මහත්බව නැති හෙයින් පළමුවෙන් ම ප්‍රතිසන්ධි නියමයෙන් කියන ලද ක්‍රමයෙන් ම හෝ පූර්වාපර චේතනා වශයෙන් හෝ බොහෝ ලෙඩ රෝගාදිය කරත්. **අපාණාතිපාතය** මෙන් වෙහෙස නොවන රෝග නොවන ආදියයි.

මෙහි වනාහි **ඉස්සාමනකොති** ඊර්ෂ්‍යාවෙන් යුත් සිතයි. **උපදුස්සතීති** ඊර්ෂ්‍යා වශයෙන් ආක්‍රෝශ කරමින් දූෂ්‍ය වෙයි. **ඉස්සං බන්ධතීති** යව කරල් මිටියක් බඳින්නාක් මෙන් යම්සේ නොනසී ද එසේ බැඳ තබයි. **අප්පෙසක්ඛොති** ස්වල්ප පිරිසයි. අව පක්ෂයෙහි රාත්‍රියේ විදින ලද ඊයක් මෙන් නොපෙනෙයි. ඉඳුල් අතින් හිඳ වතුර දීමට ද අයෙක් නොලබයි. **න දාතා හොතීති** මසුරු බැවින් නොදෙන ලද්දේ වෙයි. **තෙන කම්මෙනාති** ඒ මසුරු කර්මයෙන්, **අභිවාදෙතබ්බන්ති** බුදුරදුන්ට හෝ පසේ බුදුරදුන්ට හෝ ආර්ය ශ්‍රාවකයාට හෝ වැඳීමට සුදුසු හුනස්නෙන් නැගිටීම් ආදියෙහි ද මේ ක්‍රමයමයි. මේ ප්‍රශ්න විසඳීමෙහි උපපීළක උපස්ථම්භක කර්මයෝ නොගත යුත්තාහ. පහත් කුල හෝ උසස් කුළ යැයි කිරීමට නොහැකිය. පහත් කර්ම පහත් කුළයෙහි උපදවයි. උසස් කර්ම උසස් කුළයෙහි උපදවයි. **පරිපුච්ඡිතා හොතීති** මෙහි වනාහි නොවිචාරීමෙන් නරකයෙහි උපදියි. නොවිචාරන තැනැත්තා මේ කළයුත්තය. මේ නොකළයුත්තය යැයි නොදනියි. නොදන්නා කළ යුත්ත නොකරයි. නොකළයුත්ත කරයි. එහෙයින් නරකයෙහි උපදියි. අනෙකා ස්වර්ගයේය. මෙසේ තරුණය, යම් මේ උස් පහත් බවක් බුදුරදුන් දේශනාව අනුසන්ධියට පැමිණ වූයේය. ඉතිරිය සියලු තැන්හි ම ප්‍රකටය.

**සුභසූත්‍ර වර්ණනාව නිමි.**

**චූල්ලකම්මවිභංග සූත්‍රය යැයි ද කියයි.**

# 4.4.6

**එවමෙමසුතනති** මා විසින් මහාකම්මවිභංග සූත්‍රය මෙසේ අසන ලදි. එහි **මොඝනති** හිස් ඵල රහිත **සච්චනති** එසේ වූයේය. මෙය ද මොහු විසින් සම්මුඛයෙන් නොඅසන ලදි. උපාලි සූත්‍රයෙහි මනෝ කර්මය මහා සාවද්‍ය යැයි පණවමි. පාප කර්මයාගේ ක්‍රියාවෙන් පාප කර්මයාගේ පැවැතීමෙන් කාය කර්මය එසේ නොවේ. වාක් කර්මය ද එසේ නොවේ. බුදුරදුන් විසින් කියන ලද දේ ඇත. ඒ කථාව අන්‍ය තීර්ථකයන් අතර ප්‍රකට විය. එය ගෙන මොහු කියයි. **අත්‍ථි ච සා සමාපත්තීති** ඉමං පින්වත, මෙය කෙසේ අභිඥානිරෝධය වේද? පොට්ඨපාද සූත්‍රයෙහි උපන් අභිඥානිරෝධ කථාව සඳහා කියයි. **න කිඤ්චි වෙදීයතීති** එක වේදනාවක් ද නොවිඳියි. **අත්‍ථි ච ඛොති** තෙරුන් වහන්සේ නිරෝධ සමාපත්තිය සඳහා අනුදනියි. **පරිරක්ඛිතබ්බනති** ගර්හාවෙන් මිදීමෙන් රැකිය යුතුයි. මනා චේතනාව මොහුට ඇත්තේ යැයි සංචේතනක නම්. ඒ සමඟ මනා චේතනාවෙන් කර්මය කොට යන තේරුමයි. **දුක්ඛංසොති** තෙරුන් වහන්සේ අකුසලය ම සඳහා පරිබ්‍රාජකයා විචාරයි යන කල්පනාවෙන් මෙසේ කියයි. **දස්සනම්පි ඛො අහනති** බුදුරදුන් සිව් අංගයකින් යුතු අඳුරෙහි හාත්පස යොදුනක් තැන්හි තල ඇටයද්‍ද මසැසින් දකියි. මේ පරිබ්‍රාජකයා දුරින් ගව්වක පමණ ඇතුළත නොවසයි. කුමක්හෙයින් බුදුරදුන් මෙසේ කීයේ ද? සමාගම දැක්වීම සඳහා මෙසේ කීය.

**උදායීති** ලාළුදායී තෙමේය. **තං දුක්ඛස්මිං** ඒ සියල්ල දුක්මය. මෙසේ මේ සංසාර දුක, කෙලෙස් දුක, සංස්කාර දුක සඳහා ඉදින් කියන ලද්දේ නම් බුදුරදුන් විචාරයි. **උම්මඟ්ගනති** ප්‍රඥාවයි. **උම්මුජ්ජමානොති** හිස ඔසවන්නේ. **අයොනිසො උම්මුජ්ජිස්සතීති** උපායකින් තොරව හිස ඔසවන්නේ ය. මෙය බුදුරදුන් දැන ගත්තේ දිවැසින් නොවෙයි. චේතෝපරියාය ඥානයෙන් නොවෙයි. සර්වඥතා ඥානයෙන් නොවෙයි. අදහසින් ම දැන ගත්තේය. කථාකරන්නහුගේ අදහස නම් මනාකොට වූයේ වෙයි. කියනු කැමැත්තේ බෙල්ල දැඩිකොට ගනියි. හනු සොළවයි. ඔහුගේ මුඛය සෙලවෙයි. ඉඳීමට බැරිවෙයි. බුදුරදුන් ඔහුගේ මේ ආකාර දැක මේ උදායිට ඉන්නට නොහැකි වෙයි. යමක් නොවේ ද එයම කියන්නේ යැයි බලා දැන ගත්තේය. **ආදිසොවාති** ආදියෙහි ම **තිසෙසා වෙදනාති** කිමද? ඔහු විඳී ද? අසන්නහු විසින් ත්‍රිවිධ වේදනාවන් අසන්නෙමියි මෙසේ ද නියම කොට ත්‍රිවිධ වේදනාවන් අසන ලදි. **සුඛවෙදනීයනති** සුඛ වේදනාවට

ප්‍රත්‍ය වූ සෙසු තැන්හි ද මේ ක්‍රමයයි. මෙහි ද කාමාවචර කුසලයෙන් සොම්නස් සහගත සිතින් යුක්ත සතර වේදනා යට ත්‍රිකධ්‍යාන චේතනා යැයි මෙසේ ප්‍රතිසන්ධියෙන් පැවැති සුබ වේදනාවෙන් උපදින හෙයින් සුබ වේදනීය කර්මය නම්.

මෙහි කාමාවචරය ද ප්‍රතිසන්ධියෙහි ඒකාන්තයෙන් සැපය උපදවයි. පැවැති ඉෂ්ට මධ්‍යස්ථ අරමුණෙහි අදුක්ඛමසුඛ වූ ද අකුසල චේතනා ප්‍රතිසන්ධියෙන් පැවැති දුක ම ඉපදීම දුක්ඛවේදනීය කර්මය නම්. කායද්වාරය පවත්නා කල්හි ම ඒකාන්තයෙන් මේ දුක උපදවයි. අනෙත් තැන්හි අදුක්ඛමසුඛයයි. එය වේදනා ඉෂ්ට අනිෂ්ට මධ්‍යස්ථ අරමුණුවල උපදින හෙයින් දුකම වෙයි. කාමාවචර කුසලයෙන් උපේක්‍ෂා සහගත සිතින් යුක්ත චේතනා හතර රූපාවචර කුසලයෙන් චතුර්ථධ්‍යාන චේතනාවයි. මෙසේ ප්‍රතිසන්ධිය පැවැති කල්හි තුන්වන වේදනාවේ ඉපදීමෙන් අදුක්ඛමසුඛ වේදනීය කර්ම නම්. මෙහි කාමාවචර ප්‍රතිසන්ධියෙන් ඒකාන්තයෙන් ම අදුක්ඛමසුඛය උපදවයි. ඉෂ්ටාරම්මණ සැපය පවතියි. තව ද සුඛ වේදනීය කර්ම ප්‍රතිසන්ධි පැවතීම් වශයෙන් වටියි. එසේ අදුක්ඛමසුඛ වේදනීය කර්ම ද දුක්ඛ වේදනීය කර්ම ද පැවතීම් වශයෙන් වටියි. මේවායේ සියලු වශයෙන් පැවතීම් වශයෙන් වටියි. භාග්‍යවතුන් වහන්ස යැයි ඒ තෙරුන්වහන්සේ බුදුරදුන් විසින් මහාකම්මවිභංගය කීම පිණිස බුදුරදුන් ගෙන් ඉල්ලා මහාකම්මවිභංග ඥානය භික්‍ෂු සංඝයාට ප්‍රකට කරන්නෙමියි සිතා අනුසන්ධියෙහි දක්‍ෂ බැවින් මෙසේ කීහ.

එහි **මහාකම්මවිභඞ්ගන්ති** යනු මහා කර්මයන් බෙදන ලද කවර හතරක් ද යත්? ආනන්ද, මේ ලෝකයෙහි සමහර පුද්ගලයෙක් - පෙ - නරකයෙහි උපදියි. මෙය මහා කර්ම විභංගඥානය බෙදීම පිණිස මාතෘකා නොතැබීමය. ආනන්ද, මෙලොව ඇතැම් ශ්‍රමණයෙක් හෝ මෙම අනුසන්ධියයි. මේ බුදුරදුන් මහණ බමුණන් දිවැස් ඇත්තෝය. මෙය අරමුණු කොට මේ ප්‍රත්‍යය ලැබ මේ දර්ශනය නොගත් යැයි ප්‍රකාශ කිරීමට පටන් ගත්තේය. එහි **ආතප්පන්ති** ආදී වූ පහ වීර්යයට ම නම්ය. **චෙතොසමාධින්ති** දිවැස් සමාධියයි. **පස්සතීති** ඒ සත්වයා කොහි උපන්නේදැයි බලන්නේ දකියි. යෙ **අඤ්ඤථාති** යමෙක් දශ කුසල කර්ම පථයන් පුරන ලද හෙයින් නරකයෙහි උපදියි දනිත් ද ඔවුන්ගේ ඥානය මිථ්‍යාවයි කියත්. මේ ක්‍රමයෙන් සියලු වාරයන්හි තේරුම් දත යුතුයි. **විදිතන්ති** ප්‍රකටය. **ථාමසාති** දෘෂ්ටියේ උත්සාහයෙන් **පරාමස්සාති** දෘෂ්ටි

පරාමාසයෙන් සෙවුනා ලද්දේ වොහරතීති අධිෂ්ඨාන කොට ව්‍යවහාර කරයි. තත්‍රානන්‍දාති මෙය ද මහා කර්ම විභංගඥානයේ බෙදීම නොවෙයි. ඉක්බිතිව මේ එහි මාතෘකා තැබීමයි. මෙහි දිවැස් ඇති මොවුන්ගේ වචනයෙහි දැන ගන්නෝ මෙපමණකය දැන නොගන්නෝ මෙපමණකය යැයි මෙය දක්වන ලදි. එහි තත්‍රා යනු ඒ සතර මහණ බමුණන් කෙරෙහි ඉදමස්සාති ඔහුගේ මේ වචනයයි. අඤ්ඤථාති අන්‍ය ආකාරයකින් මෙසේ මේ මහණ බමුණන්ගේ වාදයෙහි දෙතැනක දැන ගැනීමය තුන් තැනක දැන නොගැනීමය යැයි මෙසේ සියලු තැන්හි දැන ගැනීම දැන නොගැනීම දත යුතුයි. මෙසේ දිවැස් ඇත්තවුන්ගේ වචනයෙහි දැන ගැනීම ද දැන නොගැනීම ද දක්වා දැන් මහා කර්ම විභංගඥානය බෙදන්නේ තත්‍රානන්‍දයඩායං පුග්ගලොති යනාදිය කීය. පුබ්බෙවාස්ස තං කතං හොතීති මේ දිවැස් ඇත්තහු විසින් යම් කර්මයක් කරන්නේ දක්නා ලද්දේ ද එයට පෙර කරන ලදි. පෙර කරන ලද දෙයින් ද නරකයෙහි උපදියි. පසුව කරන ලද දෙයින් ද උපදියි. මැරෙන කාලයෙහි ද ස්කන්ධය ශ්‍රේෂ්ඨය ඊශ්වරයා ශ්‍රේෂ්ඨය මහා බ්‍රහ්මයා ශ්‍රේෂ්ඨය ඊශ්වරාදී ලෝකය හෝ ශ්‍රේෂ්ඨය යනාදී මිථ්‍යා දර්ශනයෙන් උපදීමයි. දිට්ඨෙවා ධම්මෙති එහි යමක් දෘෂ්ඨධර්ම වේදනියක් වේ ද එහි ඉහතාත්මයෙහිය. යම් උපපජ්ජවේදනියයක් වේ ද එයගේ ඉපදී යම් අපරාපරිය වේදනියයක් වේද එහි අනෙක් ක්‍රමයෙහි විපාකය විඳියි. මෙසේ මේ ශ්‍රමණයා හෝ බ්‍රාහ්මණයා හෝ එක් කර්ම රාශියක් ද එක් විපාක රාශියක් ද දක්කේය. බුදුරදුන් විසින් මොවුන් විසින් නොදකින ලද කර්ම රාශි තුනක් ද විපාක රාශි දෙකක් ද දක්කේය. මොවුන් විසින් දකින ලද ද නොදකින ලද ද කර්ම රාශි හතරක් විපාක රාශි තුනක් ද දක්කේය. මේ ස්ථාන හත දැන ගන්නා නුවණ බුදුරදුන්ගේ මහාකම්ම විභංගනුවණ නම්. දෙවැනි වාරයෙහි දිවැස් ඇත්තා විසින් කිසිවක් නොදකින ලදි. මුල් කර්ම රාශි තුන ද විපාක රාශි දෙක ද දක්කේ යැයි මේ ස්ථාන පහ දන්නා නුවණ බුදුරදුන්ගේ මහාකම්ම විභංගනුවණ නම්. සෙසු වාර දෙකෙහි ද මේ ක්‍රමයයි. අභබ්බන්ති සුදුසු නොවුණු අකුසලයයි. අභබ්බභාසන්ති සුදුසු නොවුණු අකුසලය මැඩ පවත්වයි. ප්‍රතිබාහනය යන තේරුමයි. බොහෝ අකුසල කර්ම රැස් කළ කල්හි බලවත් කර්මය දුබල කර්මයාගේ විපාකය ප්‍රතිබාහනය කොට තමාගේ විපාකයට අවකාශ කරයි. මේ අභබ්බය අභබ්බභාස නම්. අකුසලය රැස්කොට ආසන්නයේ කුසලයක් කෙළේ වේ ද එය අකුසලයේ විපාකය ප්‍රතිබාහනය කොට තමාගේ විපාකයට අවකාශ කරයි. මේ අභබ්බය අභබ්බභාස නම්. බොහෝ කුසල් රැස්කොට ආසන්නයේ අකුසලයක් කරේ වේද එය අකුසලයේ විපාකය ප්‍රතිබාහනය කොට තමාගේ විපාකයට

අවකාශ කරයි. මෙය භබ්බය ද භබ්බභාසය ද වේ. එසේ වුවත් මෙහි උපස්ථානාකාරයෙන් තේරුම දත යුතුයි. මෙය කියන ලද්දේ වෙයි. අභබ්බ වශයෙන් උපස්ථාන කරන්නේ අභබ්බභාස නම්. එහි යම් යම් පුද්ගලයෙක් මෙලොව ප්‍රාණඝාතාදී ක්‍රමයෙන් පුද්ගලයෝ හතර දෙනෙක් කියන ලදි. ඔවුන්ගේ ප්‍රථමයාගේ කර්මය අභබ්බය අභබ්බභාසය එය අකුසල් හෙයිනි. අභබ්බය එහිද නරකයෙහි උපදින හෙයින් එහි උපදින ආකාර වූ අකුසල් වැටහෙයි. දෙවැන්නාගේ අභබ්බය භබ්බාසය. එය අකුසල හෙයින් අභබ්බය එහි ස්වර්ගයෙහි ඉපදීමට කරුණු වූ කුසලයන්ට වැටහෙයි. අනෙක් කර්ම දෙකෙහි ද මෙම ක්‍රමයයි. ඉතිරිය සියලු තැන්හි ප්‍රකටය.

**මහා කම්මවිභංග සූත්‍ර වර්ණනාව නිමි.**

## 4.4.7

**එවමෙමසුතනති** මා විසින් සළායතනවිභංග සූත්‍රය මෙසේ අසන ලදි. එහි **වෙදිතබ්බානීති** විදර්ශනා මාර්ගයෙන් දත යුතුයි. **මනොපවාරාති** විතර්ක විචාරයෝය. මෙහි මන නම් විතර්ක උපදවන සිත යැයි අදහස් කරන ලදි. සිතේ උපචාරයෝ මනෝපචාරා නම්. සත්ත පදයෝ වට්ට විවට්ට නිශ්‍රිත සත්වයන්ගේ පද නම්. මෙහි **අට්ඨාරසවට්ඨපදා** නම් දහ අටක් විවට්ට පද නම්. ඒවා ද විදර්ශනා මාර්ගය සමඟ ම දත යුතුයි. **යොගාචරියානනති** හස්ති යෝගාදී හැසිරවීම හික්මවන්නන්ගේ දමනය කළ යුතු දමකයන්ගේ යන තේරුමයි. ඉතිරිය විභංගයෙහි එන්නේය. **අයමුද්දෙසොති** මේ මාතෘකා තැබීමයි. චක්ෂුර් ආයතනාදිය විසුද්ධිමාර්ගයෙහි විස්තර කරන ලදි. **චක්ඛු විඤ්ඤාණනති** කුසලාකුසල විපාකයෙන් චක්ෂුර් විඥාන දෙකයි. සෙසු ප්‍රසාද විඥානයන්හි ද මේ ක්‍රමයයි. මේ දහය හැර මෙහි සෙස්ස මනෝවිඥාන නම්.

**චක්ඛුසම්ඵස්සොති** ඇසෙහි ස්පර්ශයයි. චක්ෂුර් විඥානයෙන් යුක්ත ස්පර්ෂයට මෙය නමකි. සෙසු තැන්හි ද මේ ක්‍රමයයි. **චක්ඛුනා රූපං දිස්වාති** චක්ෂුර් විඥානයෙන් රූපය දැක සියලු තැන්හි ම මේ ක්‍රමයයි.

**සොමනස්සට්ඨානීයන්ති** සොම්නසට අරමුණු වශයෙන් කාරණා වූ **උපවිචරතීති** එහි විචාර පැවතීමෙන් හැසිරෙයි. විතර්කය එය හා යුක්ත වූයේ ද යන මේ ක්‍රමයෙන් දහ අටක් විතර්ක විචාර නම් මනෝපචාරයෝ දත යුතුයි. **ඡසොමනස්සූපචාරාති** මෙහි සොම්නස සමඟ හැසිරෙන්නේය යනු සෝමනස්සූපචාර නම්. සෙසු දෙකෙහි ද මේ ක්‍රමයයි. **ගෙහසිතානීති** කාම ගුණ ඇසුරු කළ **නෙක්ඛම්මසිතානීති** විදර්ශනාව ඇසුරු කළ **ඉට්ඨානන්ති** සොයන්නවුන්ගේ **කන්තානන්ති** කැමතිවුන්ගේ **මනොරමානන්ති** සිත මොවුන් කෙරෙහි ඇලෙනුයේ **මනෝරමානි** නම්. එහි ඇලුණුවන්ගේ **ලොකාමිසපටිසංයුත්තානං** තෘෂ්ණාවෙන් යුක්ත වූවන්ගේ **අතීතනං** ලැබුවා වූ වර්තමානය අරබයා සතුට උපදින්නට අතීතයෙහි කෙසේ උපදීදැයි අතීතයෙහි යම්සේ මම ඉෂ්ට අරමුණු අනුභව කරම් ද පෙරත් එසේම අනුභව කළෙම් යැයි සිහි කරන්නා හට බලවත් සතුටක් උපදියි. **අනිච්චතං** අනිත්‍යාකාරය. **විපරිනාම විරාගනිරොධං** ප්‍රකෘතිය හැරීමෙන් විපරිනාමයයි. පහවීමෙන් විරාගයයි. නිරුද්ධයෙන් නිරෝධයයි. **පඤ්ඤායාති** විදර්ශනා ප්‍රඥාවෙන් **ඉදං වුච්චති නෙක්ඛම්මසිතං සොමනස්සං** මෙය රජුගේ ශ්‍රී සම්පත්තිය බලමින් සිටිය දී මෙන් විදර්ශනාව පිහිටුවා සිටියහුගේ සංස්කාරයන්ගේ බිඳීම බලන්නේ සංස්කාරගත තියුණු දක්ෂ විදර්ශනා ඥානයන් උසුලන කල්හි උපන් සතුට නෙක්ඛම්මසිත සෝමනස්සය යැයි කියයි. මෙය කියන ලදි.

ශූන්‍යාගාරයට පිවිසුණු ශාන්ත සිතැති මනාකොට ධර්මය බලන භික්ෂුවට මනුෂ්‍ය නොවන ඇලීමක් වෙයි. යම් පරිද්දකින් ස්කන්ධයාගේ උදයව්‍යය සිහි කෙරේ ද? ඒ අමෘතය දන්නාහුන් ප්‍රීති ප්‍රමෝද ලබත්.

**ඉමානි** මේ ෂට් ද්වාරයන්හි ඉෂ්ටාරම්මණයෙන් ඇස් හමු වූ කල්හි අනිත්‍යාදී වශයෙන් විදර්ශනා වඩා සිටියහුට ඉපදුණු භය වැදෑරුම් නෛෂ්ක්‍රම්‍ය ඇසුරු කල සෝමනස්සයයි. **අතීතං** වර්තමානය ඒ තාක් ප්‍රාර්ථනා කොට නොලබන්නා හට නොසතුට උපදීවා. අතීතයෙහි කෙසේ උපදීදැයි අතීතයෙහි මම දැන් යම් සේ ද ඉෂ්ටාරම්මණය පතා නොලබමි. මෙසේ පෙරත් පතා නොලබත්. සිහිකරන්නා හට බලවත් නොසතුට උපදියි. **අනුත්තරෙසු විමොක්ඛෙසූති** උතුම් විමෝක්ෂය නම් රහත් බවට පැමිණීමය. ප්‍රාර්ථනාව තබන්නහුගේ යන තේරුමයි. **ආයතන** යනු රහත් බවට හේතු වූ **පිහං උපට්ඨාපයතොති** ප්‍රාර්ථනාව තබන්නාට ඒ මේ ප්‍රාර්ථනාව තබන්නාට උපදයි. (ප්‍රාර්ථනා කොට නොලබන්නාට ද උපදියි). මෙසේ ප්‍රාර්ථනාව මුල් හෙයින් කැමති වන්නේ උවටැන් කරන්නේ යැයි

කියයි. **ඉමානි ඡ නෙක්ඛම්මසිතානි දොමනස්සානීති** මේවා මෙසේ ෂට් ද්වාරයන්හි ඉෂ්ට අරමුණු ඇස් හමු වූ කල රහත් බවෙහි සතුටු වන්නේ පිහිටා එය අවබෝධය පිණිස අනිත්‍යාදී වශයෙන් විදර්ශනාව පිහිටුවා මන්දෝත්සාහී වීමට නොහැකි වන තැනැත්තාට මේ පක්ෂය මේ මාසය මේ වර්ෂය රහත් බවට පැමිණීමට නොහැකිවෙත්. ශෝක කිරීමෙන් ග්‍රාමන්ත පබ්භාර වාසී මහාසිව තෙරුන්ට මෙන් කඳුළු ධාරා පැවැත්වීම් වශයෙන් උපන් දොම්නසය ෂට් නෛෂ්ක්‍රම්‍ය ඇසුරු කළ දොම්නස යැයි දත යුතුයි. කථා වස්තුව සුමංගලවිලාසිනි දික්සඟි අටුවාවෙහි සක්කපඤ්හ වර්ණනාවෙහි විස්තර කරන ලදි. කැමැත්තහු විසින් එයින් දත යුතුයි.

**උපජ්ජති උපෙක්ඛාති** මෙහි උපේක්ෂා නම් රහත්බව අනුව බැලීමයි. **අනොධිජිනස්සාති** කෙලෙස් නැමැති මුහුද දිනා සිටි බැවින් රහතන් වහන්සේ ඔධිජින නම් වෙයි. එහෙයින් රහත් නොවූ අයගේ යන තේරුමයි. **අවිපාකජිනස්සාති** මෙහි ද මතු විපාකය දිනා සිටි බැවින් රහතන් වහන්සේ විපාකජින නම් වේ. එහෙයින් රහත් නොවූ අයගේ යන තේරුමයි. **අනාදීනවදස්සාවිනොති** ආදීනවය උපද්‍රවය නොබලන්නහුගේ **ඉමා ඡ ගෙහසීති උපෙක්ඛාති** මෙසේ ෂට් ද්වාරයන්හි මේ ඉෂ්ට අරමුණු ඇස් හමුවට පැමිණි කල්හි හකුරු පිඬක සැඟවුණු මැස්සන් මෙන් රූපාදීන් නොහික්මවා එහි ලැග උපන් අපේක්ෂාව ඡ ගේහසිත් උපේක්ෂාව යැයි දත යුතුයි. **රූපංසාඅතිවත්තතීති** එහි නියම වශයෙන් නොසිටියි. **ඉමා ඡ නෙක්ඛම්මසිතා උපෙක්ඛාති** මෙසේ ෂට් ද්වාරයන්හි මේ ඉෂ්ට අරමුණු ඇස් හමුවට පැමිණි කල්හි ඉෂ්ටයෙහි නොඇලෙන අනිෂ්ටයෙහි දූෂ්‍ය නොවන්නහුගේ නොබැලීමෙන් මුළා නොවන්නහුට උපන් විදර්ශනාවයි. නුවණින් යුතු ෂට් නෛෂ්ක්‍රම්‍ය සිත උපේක්ෂාව යැයි දත යුතුයි. **තත්‍ර ඉදං නිස්සාය ඉදං පජහථාති** ඒ තිස්හයක් ශාන්ත පදයන්හි දහඅට නිසා දහඅට හරිව් යන තේරුමයි. එහෙයින් **තත්‍ර භික්ඛවෙ යානි ඡ නෙක්ඛම්මසිතානීති** යනාදිය කීය. **නිස්සාය** ආගම්මා පැවතීම් වශයෙන් නිසා ද පැමිණ ද **එවමෙතෙසං සමතික්කමො හොති** මෙසේ නෛෂ්ක්‍රම්‍ය සිතේ පැවතීමෙන් ගේහසිතයන් ඉක්මුණාහු වෙත්. මෙසේ සරික්ඛයෙන් සාදෘශ්‍යය හැර දූන් බලවතා විසින් දුබලයා හරින්නේ නැවත **තත්‍ර භික්ඛවෙ යානි ඡ නෙක්ඛම්මසිතානි සොමනස්සානීති** යනාදිය කීය. මෙසේ නෛෂ්ක්‍රම්‍ය ඇසුරු කළා වූ සොම්නසින් නෛෂ්ක්‍රම්‍ය ඇසුරු කළා වූ දොම්නසින් නෛෂ්ක්‍රම්‍ය ඇසුරු කළා වූ උපේක්ෂාවෙන් නෛෂ්ක්‍රම්‍ය ඇසුරු කළා වූ සොම්නසින් හරින බලවතා විසින් දුබලයා හරින ලද යැයි කියන ලදි.

මෙහි සිට උපේක්ෂා කථාව දත යුතුයි. අෂ්ට සමාපත්තීන්හි ප්‍රථම ආදී ධ්‍යාන තුන සුද්ධ සංස්කාරයන් පාදක කොට විදර්ශනාව පටන් ගන්නා ලද සතර භික්ෂූන්ගේ පූර්වභාග විදර්ශනාව සොම්නස් සහගතබව හෝ වේද උපේක්ෂා සහගත හෝ වේද උට්ඨානගාමිනීය සෝමනස්ස සහගත බවමය. චතුර්ථධ්‍යාන ආදිය පාදක කොට විදර්ශනාව පටන් ගන්නා ලද පස් දෙනාගේ පූර්වභාග විදර්ශනාවෝ පළමු පරිදිම උට්ඨානගාමිනී උපේක්ෂා සහගත වෙයි. මේ සඳහා යම් සය වැදෑරුම් නෛෂ්ක්‍රම්‍ය ඇසුරු කළා වූ සෝමනස්සය හරිව් යැයි කියන ලදි. හුදෙක් නොවෙයි. මෙසේ පිළිපන් භික්ෂුව මේ විදර්ශනාව වේදනා වශයෙන් විශේෂ වෙයි. ආර්ය මාර්ගයෙහි ධ්‍යානාංග බොජ්ඣංග මාර්ගාන්ගයන්ගේ ද විශේෂ වෙයි. කවරෙක් මේ විශේෂය නියම කෙරේ ද? සමහරෙක් පළමුව තෙරුන් වහන්සේ විදර්ශනා පාදක ධ්‍යානය නියම කෙරේ යැයි කියත්. සමහරෙක් විදර්ශනාවෙන් අරමුණු වූ ස්කන්ධයෝ නියම කරත් යැයි කියත්. සමහරෙක් පුද්ගල අදහස් නියම යැයි කියත්. ඔවුන්ගේ වාදයෙහි මේ පූර්වභාගයෙහි වුට්ඨානගාමිනී විදර්ශනාව නියම යැයි දත යුතුයි. මෙහි විනිශ්චය කථාව විසුද්ධිමාර්ගයෙහි සංස්කාර උපේක්ෂා නිර්දේශයෙහි කියන ලදි.

**නානත්තා** නොයෙක් ආකාරය. **නානත්තසිතා** නොයෙක් නොයෙක් අරමුණු ඇසුරු කළ **එකත්තා** එක. **එකත්තසිතා** එක් අරමුණක් ඇසුරු කළ **කතමාපනායං උපෙඛා** යට පළමු කොට අඤ්ඤානුපේක්ෂාව කියන ලදි. මතු ඡළංගුපේක්ෂාව කියන ලදි. මෙහි සමථ උපේක්ෂාව විදර්ශනා උපේක්ෂාව යන උපේක්ෂා දෙක ගන්නා ලද්දාහ. එහි යම් හෙයකින් රූපයෙහි අන්‍ය උපේක්ෂාවක් ද ශබ්ද ආදියෙහි අනිකක් ද නැත. රූපයෙහි යම් උපේක්ෂාවක් ද එහි ශබ්දාදියෙහි වෙයි. රූපයෙහි උපේක්ෂාව මෙසේ ද අන්‍ය වූ පඨවි කසිණය අරමුණු කොට උපදියි. අනෙත් වායෝ කසිනාදිය අරමුණු කරයි. එහෙයින් නානත්තතාවය නානත්තසිතය යැයි බෙදන්නේ **අත්‍ථි භික්ඛවෙ උපෙඛා රූපෙසු** යනාදිය කීහ. යම්හෙයකින් දෙකක් හෝ තුනක් හෝ ආකාසානඤ්චායතනයෝ හෝ විඤ්ඤානඤ්චායතනයෝ හෝ නැත් ද එසේ හෙයින් එකත්තය එකත්තසිතය යැයි බෙදන්නේ **අත්‍ථි භික්ඛවෙ උපෙඛා ආකාසානඤ්චායතනනිස්සිතාති** යනාදිය කීය. එහි ආකාසානඤ්චායතනය උපේක්ෂාව සම්ප්‍රයුක්ත වශයෙන් ආකාසානඤ්චායතන නිශ්‍රිතයෙන් ආකාසානඤ්චායතන ස්ඛන්ධයෙහි විදර්ශනා කරනහුගේ විදර්ශනා උපේක්ෂාව අරමුණු වශයෙන් ආකාසානඤ්චායතනය නිශ්‍රිතයි සෙසු තැන්හි ද මේ ක්‍රමයයි. **තං පජහථාති** එහි අරූපාවචර සමාපත්ති උපේක්ෂාවෙන් රූපාවචර සමාපත්ති උපේක්ෂාව හරවයි. අරූපාවචර

විදර්ශනා උපේක්ෂාවෙන් රූපාවචර විදර්ශනා උපේක්ෂාව හරවයි. **අතම්මයතන්ති** මෙහි තම්මයත නම් තෘෂ්ණාවයි. එයින් ගැනීමෙන් වුට්ඨානුගාමිනී විදර්ශනාව අතම්මයතාව යැයි කියයි. **තං පජහථාති** මේ වුට්ඨානගාමිනී විදර්ශනාවන් අරූපාවචර සමාපත්ති උපේක්ෂාව ද විදර්ශනා උපේක්ෂාව ද හරවයි. **යදරියොති** යම් කෙනෙක් සතිපට්ඨානයෙහි ආර්ය ද බුදුරදුන් සේවනය කරයි. එහි ස්ථාන තුනක සිහිය තබන්නේ සතිපට්ඨානයෙහි ආර්ය ද බුදුරදුන් සේවනය කරයි. එහි ස්ථාන තුනක සිහිය තබන්නේ සතිපට්ඨානයන් සේවනය කරයි යැයි දත යුතුයි. **න සුස්සූසන්තීති** අදහා අසන්නට නොකැමැති වෙත්. **න අඤ්ඤාති** දැන ගැනීම පිණිස සිත නොඑලවත්. අසන්නට නොකැමැති වෙත්. **න අඤ්ඤාති** දැන ගැනීම පිණිස සිත නොඑලවත්. **වොක්කම්මාති** ඉක්මවා **සත්ථුසාසනන්ති** බුදුරදුන්ගේ අවවාදයයි. නොගත යුතුය. නොපිරිය යුතුය යනුවෙන් සිතත් යන තේරුමයි. **න චෙව අත්තමනො** ස්වකීය සිත නොවේ. මෙහි ගේහසිත දෝමනස්ස වශයෙන් අප්පති වේ යැයි මෙසේ තේරුම නොදත යුතුය. පිළිනොපදින්නවුන් කෙරෙහි ද සතුටු වන බව කාරණා නොවීමෙන් මෙය කියන ලදි.

**අනවස්සුතොති** ක්‍රෝධයේ අනවශ්‍යයෙන් අනවස්සුත නම්. **සතො සම්පජානොති** සිහියෙන් ද නුවණින් ද යුක්ත වූ **උපෙඛකොති** සයවැදෑරුම් උපේක්ෂාවෙන් උපේක්ෂක වූ **අත්තමනොති** මෙහි ද ගේහසිත සෝමනස්ස වශයෙන් බිය ගන්වයි යන තේරුම මෙසේ නොදත යුතුය. පිළිපන්නවුන් කෙරෙහි නොසතුටු බව කාරණා නොවීමෙන් මෙය කියන ලදි. **අනවස්සුතොති** රාගයාගේ අනවශ්‍යයෙන් අනවස්සුත නම්. **සාරිතොති** දමුණා වූ **එකංයෙව දිසං ධාවතීති** නො ඉක්මවා දුවන්නේ එකම දිශාවකට දුවයි. නැවතී වෙනත් දිශාවකට දුවන්නට හැකිවෙයි. **අට්ඨදිසා විධාවතී** එක් පළඟකින් සිටියේ ශරීරයෙන් නොනැවතී විමෝක්ෂ වශයෙන් එක් පහරින් ම අට දිශාවන්ට දුවයි. නැගෙනහිරට අභිමුඛව හෝ දකුණු දිශාව ආදී එක්තරා දිශාවකට අභිමුඛව හෝ හිඳ අෂ්ට සමාපත්තීන්ට සමවැදිය යන තේරුමයි. ඉතිරිය සියලු තැන්හි ම ප්‍රකටය.

**සළායතන විභංග සූත්‍ර වර්ණනාව නිමි.**

## 4.4.8

**එවමෙමසුතනති** යනු මා විසින් උද්දේසවිභංග සූත්‍රය මෙසේ අසන ලදි. එහි **උද්දෙසවිභංගනති** උද්දේශය ද විභංගය ද බෙදීම ද යන තේරුමයි. **උපපරික්ඛෙය්‍යාති** ප්‍රමාණය කරන්නේ ය. තීරණය කරන්නේ ය. පිරිසිඳින්නේ ය. බහිද්ධාති පිට අරමුණුවල **අවික්ඛිත්තං අවිසටනති නිකනති** වශයෙන් අරමුණෙහි පිහිටන වික්ඛිත්තය විසට නම් වෙයි. එය අවබෝධ කරන්නේ මෙසේ කීය. **අජ්ඣත්තං අසණ්ඨිතනති** ගෝචර අධ්‍යාත්මයෙහි **නියනති** වශයෙන් නොසිටින ලද **අනුපාදාය න පරිතස්සෙය්‍යාති** ඒ විඥානය නොගෙන පීඩිත නොවන්නේ ය. යම්සේ විඥානය පිටත නොහරින ලද අධ්‍යාත්මය නොසිටින ලද තැති නොගන්නේ ය. මෙසේ භික්ෂුව පරීක්ෂා කරන්නේ යැයි කියන ලදි. **ජාති, ජරා, මරණ, දුක්ඛ, සමුදය, සම්භවො** ජාති ජරා මරණයාගේ ද අවශේෂ දුක්ඛයාගේ ද ඉපදීම නොවේ යැයි යන තේරුමයි. **රූපනිමිත්තානුසාරීති** රූප නිමිත්ත සිහි කරයි. රූපනිමිත්තානුසාරි නම් වේ. **එවං ඛො අවුසො අජ්ඣත්තං අසණ්ඨිතනති** නියන්ති වශයෙන් නොසිටින ලද හානභාගිය නොවෙයි. විශේෂභාගිය වෙයි. **අනුපාදාපරිතස්සනාති** බුදුරදුන් ඛන්ධක වර්ගයෙහි මහණෙනි, තුඹලාට උපාදා පරිතස්සය දේශනා කරන්නෙමි. අනුපාදා පරිතස්සය ද දේශනා කරන්නෙමි. මෙසේ ගෙන පරිතස්සය නොගෙන ම අපරිතස්සය කියන ලදි. එය මහ තෙරුන් උපාදා පරිතස්සය ම අනුපාදා ග්‍රහනය කළ අත්තක් කොට පෙන්වන්නේ මෙසේ කීය. කෙසේ නම් අනුපාදා පරිතස්සය වේද නොවීමෙනි. ඉදින් කිසි සංස්කාරයක් නිත්‍ය හෝ ස්ථිර හෝ ආත්මය හෝ අත්තනිය හෝ යැයි ගත යුත්තක් නොවන්නේ ය. මේ පරිතස්සනාව උපාදා පරිතස්සනාව වන්නේය. යම් හෙයකින් මෙසේ උපාදා සංස්කාරයක් නම් නැත. එහෙයින් රූපය ආත්මය යැයි ආදී ක්‍රමයෙන් රූපාදීහු උපාදින්න ද අනුපාදින්න ද වෙත්. මෙසේ මෙය දෘෂ්ටි වශයෙන් උපාදා පරිතස්සනාව හා සමාන වේ යැයි දත යුතුයි.

**අඤ්ඤථා හොති** පෙරළෙයි. ප්‍රකෘති හැරීමෙන් නැසෙයි. **රූපවිපරිණාමානුපරිවත්තීති** මාගේ රූපය පෙරලුණේ යැයි හෝ යමෙක් වූයේ ද එයම ඒකාන්තයෙන් නැතැයි හෝ ආදී ක්‍රමයෙන් කර්මයේ දැනීම රූපයේ භේදානුපරිවත්තය වෙයි. විපරිණාම පරිවත්තය ජාති විපරිණාමයාගේ අනුපරිවර්තනයෙන් විපරිණාමාරම්මණ සිතින් විය.

**පරිතස්සනා ධම්මසමුප්පාදා** තෘෂ්ණා පරිතස්සනාව අකුසල ධම්මසමුප්පාදය ද වෙයි. **චිත්තං පරියාදාය තිට්ඨන්තීති** කුසල් සිත ගෙන ක්‍ෂය කොට සිටිත්. **උත්තාසවාති** බියෙන් තැති ගැනීම සඋත්‍රාසය නම්. තෘෂ්ණාවෙන් තැති ගැනීම ද උත්‍රාසය නම්. **විඝාතවාති** දුක් සහිතය. **අපෙක්ඛවාති** ආලය සහිතය. **එවං ඛො ආවුසො අනුපාදාපරිතස්සනා හොතීති** මෙසේ මැණික් කරඬු සංඥාවෙන් හිස් කරඬුවක් ගෙන එය නැසුණු කල්හි පසුව දුකට පැමිණෙන්නාහු මෙන් නොගෙන තැවීම වෙයි. **න රූපවිපරිණාමානුපරිවත්තීති** රහතන් වහන්සේලාට කර්ම විඥානය නැත. එහෙයින් රූපභේදානුපරිවත්තිය නොවෙයි කියන්නට වටියි. ඉතිරිය සියලු තැන්හි ම ප්‍රකටය.

**උද්දේස විභංග සූත්‍ර වර්ණනාව නිමි.**

## 4.4.9

**එවමෙමසුතන්ති** යනු මා විසින් අරණවිභංග සූත්‍රය මෙසේ අසන ලදි. එහි **නෙවුස්සාදෙය්‍ය න අපසාදෙය්‍යාති** ගේහසිත වශයෙන් කිසි පුද්ගලයෙක් උසස් පහත් නො කරන්නේ ය. **ධම්මමෙව දෙය්‍යාති** ස්වභාවය ම කියන්නේ ය. **සුඛ විනිච්ඡයන්ති** විනිශ්චය කරන ලද සැපයයි. **රහො වදන්ති** නොඉදිරියෙහි නුගුණ කේළාම් කියත් යන තේරුමයි. **සම්මුඛා න ඛිණන්ති** ඉදිරියෙහි ක්‍ෂයවීම් ආකීර්ණ වූ කිළිටි වචන නො කියන්නේ ය. **නාභිනිවෙසෙය්‍යාති** අධිෂ්ඨාන කොට ගෙන ව්‍යවහාර නො කරන්නේ ය. **සමඤ්ඤන්ති** ලෝක පැණවීමයි. **නාතිධාවෙය්‍යාති** නො ඉක්මවන්නේ ය. **කාමපටිසන්ධි සුඛිනොති** කාම ප්‍රතිසන්ධියෙන් කාමයෙන් යුතු සැපයෙන් සැපයට පැමිණියහුගේ **සදුක්ඛොති** විපාක දුකෙන් ද දුක් සහිතය.

**සඋපඝාතොති** විපාකයන් නැසීම ද ක්ලේශයන් නැසීම ද සඋපඝාත නම්. සපරිළාහ යනු ද එසේමය. **මිච්ඡාපටිපදාති** අකුසල් ප්‍රතිපදාවයි. **ඉත්ථෙකෙ අපසාදෙතීති** මෙසේ ගේහසිත වශයෙන් ඇතැම් පුද්ගලයන් අප්‍රසාදනය කරයි. උස්සාදනයෙහි ද මේ ක්‍රමයයි. **භවසංයොජනන්ති** භවයෙහි බැඳීම් ඇති කරන තෘෂ්ණාව මෙයට නමකි. සුභූති තෙරුන් මේ

චතුෂ්කය නිසා අගතනතුරෙහි සිටියේය. බුදුරදුන්ට ධර්ම දේශනා කරන පුද්ගලයන්ගේ උස්සාදන පසාදන පෙනෙත්. සැරියුත් තෙරුන් ආදීන්ගේ ද එසේමය. සුභූති තෙරුන්ට ධර්ම දේශනා කිරීමේ දී මේ පුද්ගලයා නො පිළිපන්නෙකි. සිත් නො ගත්තෙකි යි හෝ මොහු සිල් ඇත්තෙකි. ගුණ ඇත්තෙකි. ලජ්ජා සහිත කෙනෙකි. ආචාර සම්පන්න කෙනෙකි යි හෝ නැත. උන්වහන්සේගේ ධර්ම දේශනාවෙන් මේ මිථ්‍යා ප්‍රතිපදාවය මේ සම්‍යක් ප්‍රතිපදාවය යැයි පෙනෙයි. එහෙයින් බුදුරදුන් මාගේ ශ්‍රාවක භික්ෂූන්ගෙන් සුභූති තෙරුන් අරණවිහාරීන් අතර අග්‍රස්ථානය යැයි කීය.

**කාලඤ්ඤූ අස්සාති** නොපැමිණි කාලයෙහි නොකියා දූන් කියනු ලබන්නේ මහජනතාව ගන්නේ යැයි යුතු කාලය දනගෙන ම ඉදිරියෙහි අගුණ කියනනේ ය. බීණාවාදයෙහි ද මේ ක්‍රමයයි. **උපහඤ්ඤතීති** නසනු ලබයි. **සරොපි හඤ්ඤතීති** ශබ්දය ද බිඳෙයි. **ආතුරියතීති** ආතුරව ගිලන් බවට පැමිණියේ වෙයි. **තදෙවාති** ඒ භාජනයයි. **අභිනිවිස්ස වොහරතීති** හඳුනන දනව්වකට ගොස් භාජනය ගෙනෙව් සෝදව් යැයි අසා අඳ බාල පෘථග්ජනයා මේ භාජනය නොවෙයි. මේ තැලිය නොවෙයි. මෙසේ කියවයි. අභිනිවේසයට ව්‍යවහාර කරයි. මෙසේ සියලු පදයන් හා යෙදිය යුතුයි. **අතිසාරොති** අධිකව දුවයි. **තථා තථා වොහරති අපරාමසන්ති** අපේ දනව්වෙහි භාජනයට තලිය යැයි කියයි. මොහු වනාහි එය පාත්‍රය යැයි කියත් ද එතැන් පටන් ජනපද ව්‍යවහාරය මුදා පාත්‍රය පාත්‍රය යැයි පරාමර්ශනය නොකිරීමෙන් ව්‍යවහාර කරයි. සෙසු පදයන්හි ද මේ ක්‍රමයයි. දූන් සීමාවන් බෙදන්නේ **තත්‍ර භික්ඛවෙති** යනාදිය කීය. එහි **සරණොති** කෙලෙස් සහිතය. **අරණොති** කෙලෙස් රහිතය. **සුභූති ච පන භික්ඛවෙති** මේ තෙරුන් වහන්සේ දෙතැනක අග්‍රස්ථානයට නැංවීය. අරණ විහාරීන්ගෙන් යම් මේ සුභූති කෙනෙක් වේ ද දක්ෂිණාහර්යයන්ගෙන් යම් මේ සුභූති කෙනෙක් වේද ධර්මසේනාධිපතීන් වහන්සේ වස්තුව ශුද්ධ කරයි. සුභූති තෙරුන් දක්ෂිණාව පිරිසිදු කරයි. එසේමය. ධර්මසේනාධිපතීන් වහන්සේ පිඩු පිණිස හැසිරෙන්නේ ගෙහි දොරටුවෙහි සිටියේ යම්තාක් ආහාර ගෙනෙත් ද ඒ තාක් පූර්වභාගයෙන් පිරිසිඳ නිරෝධ සමාපත්තියට සමවදියි. නිරෝධයෙන් නැගිට දෙය්‍යධර්මය පිළිගනියි. සුභූති තෙරුන් ද එසේම මෛත්‍රී ධ්‍යානයට සමවදියි. මෛත්‍රී ධ්‍යානයෙන් නැගිට දෙය්‍යධර්මය පිළිගනියි. මෙසේ කරන්නට හැකි වේද? එසේය හැකිය. මෙය පුදුමයක් නොවෙයි. යම් හෙයකින් මහා අභිඥාවන්ට පැමිණි ශ්‍රාවකයෝ මෙසේ කරන්නාහු ද මේ ලංකා ද්වීපයෙහි පුරාණ රජ කාලයේ පිංගල බුද්ධරක්ඛිත තෙරුන් උතුරු ගමෙහි විසූහ. එහි කුල

සීයක් වෙත්. එකම කුල ද්වාරයක්වත් නැත. යම්තැනක තෙරුන්ට සමවතට නොපැමිණුනේය. ඉතිරිය සියලු තැන්හිම ප්‍රකටය.

අරණවිභංග සූත්‍ර වර්ණනාව නිමි.

# 4.4.10

**එවමෙමසුතනති** යනු මා විසින් ධාතුවිභංග සූත්‍රය මෙසේ අසන ලදි. එහි **චාරිකනති** ඉක්මණින් යන හැසිරීමය. **සචෙ තෙ අගරූති** ඉදින් නුඹට බැරිරුම් නැති නම් අපහසු කිසිවක් නැත. **සචෙ සො අනුජානාතීති** භග්ගවයාට මෙබඳු සිතක් විය. පැවිද්දෝ නම් නොයෙක් අදහස් ඇත්තෝය. කෙනෙක් සමූහයා වෙත ඇලෙයි. කෙනෙක් තනිව සිටීමේ ඇලෙයි. ඉදින් ඔහු හුදකලාවෙහි ඇලෙන්නේ ය නම් 'ඇවත නොපිවිසෙව මා විසින් ශාලාව ලබන ලද යැයි කියයි. මෙසේ ඇති කල්හි මම දෙදෙනාගේ විවාදය කරවන ලද්දේ වන්නෙමි. දුන්දෙය නම් දෙන ලද්දේ ම වටියි. කරන ලද්ද කරන ලද්දේම යැයි එහෙයින් කියන ලදි. **කුලපුත්තො** ජාති කුලපුත්‍රයා ද ආචාර කුලපුත්‍රයා ද වෙයි. **වාසූපගතො** විසීමට පැමිණියේ. **කුතො ආගතොති** තක්ෂිලා නුවරින්, එහි මේ පිළිවෙළ කථාවයි. මධ්‍යම දේශයෙහි රජගහනුවර බිම්බිසාර රජතුමා රාජ්‍ය කරවන කල්හි ප්‍රත්‍යන්තයෙහි තක්ෂිලා නුවර පුක්කුසාති නම් රජකෙනෙක් රාජ්‍ය කරවීය. එකල තක්ෂිලා නුවරින් බඩු ගෙන වෙළෙන්දෝ රජගහ නුවරට පැමිණියාහු පඬුරු ගෙන රජු හමුවූහ. රජතුමා ඔවුන් වැඳ සිටි කල්හි නුඹලා කොහේ වාසය කරන්නේදැයි ඇසීය. දේවයන් වහන්ස, තක්ෂිලා නුවර වාසීහුය. එකල රජතුමා ඔවුන්ගෙන් ජනපදවල නිරුපද්‍රිත බව සුභික්ෂිත බව ද නගරයන්හි ප්‍රවෘත්තීන් ද අසා නුඹලාගේ රජුගේ නම කුමක් දැයි ඇසීය. දේවයන් වහන්ස, පුක්කුසාති නම් වෙයි. ධාර්මික ද? එසේය, දේවයන් වහන්ස, ධාර්මිකයෙකි. සතර සංග්‍රහ වස්තුවෙන් ජනතාවට සංග්‍රහ කරයි. ලෝකයාගේ මව්පිය තනතුරෙහි සිටියේය. උකුලෙහි ඉන්නා දරුවා මෙන් ජනතාව සතුටු කරයි. කොපමණ වයස් වේද? එකල ඔහුගේ වයස කීහ. වයසින් බිම්බිසාර රජු හා සමාන වයස් විය. ඉක්බිතිව රජු ඔවුන්ට කීය. දරුවෙනි, නුඹලාගේ රජු ධාර්මික වෙයි. වයසින් ද මාගේ වයස් ප්‍රමාණය.

නුඹලාගේ රජු මා හා මිත්‍ර කරන්නට හැකි වෙත් ද? දේවයන් වහන්ස, හැක්කෙමු. රජ තෙමේ ඔවුන්ට අයබදු හැර ගෙයක් දෙවා යව්. බඩු විකුණා යන කාලයෙහි මා දක යව් යැයි කීය. ඔවුන් එසේ කොට යන කාලයෙහි රජු හමුවූහ. යව් නුඹලාගේ රජු මාගේ වචනයෙන් නැවත නැවත නිරෝගීකම විචාරා නුඹ වහන්සේ සමඟ මිතුරු බව කැමැති යැයි කියවයි කීය. ඔවුහු යහපති යි පිළිතුරු දී ගොස් බඩු තැන්පත් කොට අනුභව කළ උදේ ආහාරය ඇත්තේ රජු වෙත ගොස් වැන්දාහ. රජ තෙමේ සගයෙනි, නුඹලා මෙතෙක් කල් කොහි ගියේදැයි ඇසීය. ඔවුහු සියලු විස්තරය දැන්වූහ. රජතුමා හොඳය දරුවනි, නුඹලා නිසා මා මධ්‍යම දේශයෙහි රජු හා මිත්‍ර බව ලද්දෙමියි සතුටු විය.

මෑත කාලයෙහි රජගහ නුවර වෙළෙන්දෝ තක්ෂිලාවට ගියාහ. ඔවුහු පඬුරු ගෙන පැමිණි කල්හි පුක්කුසාති රජතෙමේ කවර තැනකින් පැමිණියේදැයි අසා රජගහ නුවරින් යැයි අසා මාගේ මිත්‍රයාගේ නුවරින් නුඹලා ආවාහු ද? දේවයන් වහන්ස එසේය, මාගේ මිත්‍රයාගේ නිරෝගීකම කෙසේදැයි නිරෝගීබව අසා අද පටන් මාගේ මිත්‍රයාගේ නුවරින් පයින් හෝ කරත්තවලින් හෝ වෙළෙන්දෝ එත් ද? ඒ සියලු දෙනාටම මාගේ විජිතයට පැමිණි කාලයේ පටන් වසන තැන්හි ගෙවල් ද රාජ භාණ්ඩාගාරයෙන් ආහාර ද දෙත්වා. අයබදු හරීවා. කිසිදු උවදුරක් නොකරත්වායි බෙර හැසිරවීය.

බිම්බිසාර රජ තෙමේ ද තමන්ගේ නුවර එසේම බෙර හැසිරවීය. එකල්හි බිම්බිසාර රජතෙමේ පුක්කුසාති රජුට ලියුමක් යැවීය. ප්‍රත්‍යන්ත දේශයෙහි මුතු මැණික් ආදී රත්නයන් උපදිත්. මාගේ මිත්‍රයාගේ රාජ්‍යයෙහි දැකුම්කළු හෝ ඇසිය යුතු හෝ යම් රත්නයක් උපදී ද එහි මට මසුරු බවක් නොවේවා. පුක්කුසාති තෙමේ ද මධ්‍යම දේශයෙහි මහා ජනපදයකි. එහි මෙබඳු වූ යම් රත්නයක් උපදියි ද එහි මාගේ මිත්‍රයා මසුරු නොවේවා යි පිළිතුරු ලියුමක් යැවීය. මෙසේ කල් යන කළ ඔවුනොවුන් නොදැක ම දැඩි මිත්‍රයෝ වූහ. මෙසේ කතිකා කොට වසමින් සිටිය දී පළමු කොට පුක්කුසාති රජුට පඬුරක් උපන්නේය. රජු වර්ණ පහකින් යුත් වටිනා කම්බිලි අටක් ලැබීය. මේ කම්බිලි ඉතා යහපත්ය. මම මේවා මාගේ යහළුවාට යවන්නෙමියි ලාකඩ ගුලි මෙන් මට්ටම් වූ අරටු කරඬු අටක් ලියවා ඒ කම්බිලි එහි බහා ලාකඩවලින් වට කරවා සුදු වස්ත්‍ර ඔතා කරඬුවල බහා වස්ත්‍ර ඔතා රාජ මුද්‍රා තබා මාගේ මිත්‍රයාට දෙවයි ඇමතියන් යැවීය. පණිවිඩයක් ද දුන්නේය.

මේ පඬුර නුවර මැද ඇමති ආදීන් පිවරණ ලදුව දත යුතුය. ඔවුහු ගොස් බිම්බිසාර රජුට දුන්හ. ඔහු පණිවිඩය අසා ඇමති ආදීහු රැස්වෙත්වයි බෙර හසුරුවා නුවර මැද ඇමති ආදීන් පිරිවරණ ලදුව සේසත් ධරමින් උතුම් ආසනයෙහි සිටියේ මුද්‍රාව බිඳ වස්ත්‍රය ඉවත්කොට කරඬුව ඇර ඇතුළත බඩු මුදා ලාකඩ දැක මාගේ මිත්‍ර පුක්කුසය මාගේ මිත්‍ර දූතය යැයි සිතමින් පඬුරු එවීයැයි සිතමියි එක ගුලියක් ගෙන අතින් පෙරළා ප්‍රමාණය කරන්නේ ම ඇතුලේ රෙදි පොදියක් ඇතැයි දැන ගත්තේය. එකල එය අසුනෙහි පාමුල ගැසීය. එකෙණෙහි ම ලාකඩ වැටුණේය. ඔහු නියෙන් කරඬුව හැර ඇතුළෙහි පලස් රත්නය දැක අනෙක් ඒවා ද ඇරවීය. සියල්ල ම පලස් වූහ. එකල ඒවා දිගු ඒවා වර්ණවත්ය. ස්පර්ශයෙන් යුතුය. දිගින් දහසය රියන්ය. හරහට අට රියන්ය. මහජනතාව දැක පුදුම විය. අපගේ රජුට මිත්‍ර පුක්කුසාති තෙමේ මෙබඳු පඬුරු එවීයැයි සතුටු විය. රජු එක කම්බිලියක් මිළ කරවීය. සියල්ල අනර්ඝ වූහ. එයින් හතරක් බුදුරදුන්ට යවා හතරක් තමාගේ ගෙදර තැබීය. පසුව සිතීය. පසුව යවන්නහු විසින් පළමුව එවන ලද පඬුරට වැඩියෙන් යවන්නට වටියි. මිත්‍රයා විසින් ද මට වටිනා පඬුරු එවන ලදි. කුමක් යවම් ද? කිම රජගහ නුවර ඊට වඩා අධික රත්නයක් නැත් ද? නැත්තේ නොවෙයි. රජු මහා පින් ඇත්තෙකි. ඔහු සෝවාන් වූ කාලයේ පටන් ත්‍රිවිධ රත්නය හැර අනෙක් රත්නයක් සතුට උපදවන්නට සමත් නොවෙයි. ඔහු රත්නයන් සොයන්නට පටන් ගත්තේය. රත්නයන් නම් සවිඤ්ඤානක අවිඤ්ඤානක යැයි දෙයාකාර යි. එහි අවිඤ්ඤානක නම් රන් රිදී ආදියයි. සවිඤ්ඤානක නම් ඉන්ද්‍රිය ප්‍රතිබද්ධයි. අවිඤ්ඤානකය සවිඤ්ඤානකයට අලංකාර වශයෙන් පරිභෝග පිණිස වෙයි. මේ රත්න දෙක අතුරෙන් සවිඤ්ඤානක රත්නය ශ්‍රේෂ්ඨයි. සවිඤ්ඤානක තිරිසන් ගත රත්නය මනුෂ්‍ය රත්නය යැයි දෙවිධයි. එහි තිරිසන්ගත නම් ඇත් අස් ආදී රත්නයන්ය. ඒවාද මිනිසුන්ට පරිභෝග පිණිස ම උපදිත්. මෙසේ මේ දෙකෙන් ද මනුෂ්‍ය රත්නය ශ්‍රේෂ්ඨය. මනුෂ්‍ය රත්නය ද ස්ත්‍රී රත්නය පුරුෂ රත්නය යැයි දෙයාකාරයි. සක්විති රජුට උපන් ස්ත්‍රී රත්නය ද පුරුෂ රත්නයේ පරිභෝගය පිණිසම උපදිත්. මෙසේ මේ දෙකින් ද පුරුෂ රත්නය ශ්‍රේෂ්ඨය. පුරුෂ රත්නය ද අගාරික අනගාරික යැයි දෙවිධියි. එහි අගාරික රත්නය අතුරෙන් සක්විති රජු ද එදවස් පැවිදි වූ සාමණේරයාට ද පසඟ පිහිටුවා වඳියි. එහෙයින් මේ රත්න දෙකෙන් ද අනගාරික රත්නය ශ්‍රේෂ්ඨය. අනගාරික රත්නය ද සේඛ අසේඛ යැයි දෙයාකාරයි. එහි ලක්‍ෂයක් සේඛයන් ද අසේඛයාගේ කොටසකටවත් නොපැමිණෙයි. මේ දෙකෙන් ද අසේඛරත්නය ශ්‍රේෂ්ඨය. එය ද බුද්ධරත්නය ශ්‍රාවකරත්නය යැයි දෙවිධයි. ලක්‍ෂයක් ශ්‍රාවකයන් ද

බුද්ධරත්නයේ කොටසකටවත් නොපැමිණෙයි. මේ දෙකෙන් ද අසේඛරත්නය ශ්‍රේෂ්ඨය. එය ද බුද්ධරත්නය ශ්‍රාවක රත්නය යැයි දෙවිධියි. ලක්ෂයක් ශ්‍රාවකයන් ද බුද්ධරත්නයේ කොටසටවත් නොපැමිණෙයි. මේ දෙකෙන් ද බුද්ධ රත්නය ශ්‍රේෂ්ඨය. බුද්ධරත්නය ද පසේ බුද්ධරත්නය සර්වඥ බුද්ධරත්නය යැයි දෙයාකාරයි. එයින් ද ලක්ෂයක් පසේ බුදුවරුන්ට සර්වඥ බුද්ධරත්නයේ කොටසකටවත් නොපැමිණෙයි. මේ දෙකෙන් ද සර්වඥ බුද්ධරත්නය ශ්‍රේෂ්ඨය. දෙවියන් සහිත ලෝකයෙහි බුද්ධරත්නය හා සමාන රත්නයක් නම් නැත. එහෙයින් අසමාන වූ රත්නයක් මාගේ යහළුවාට යවන්නෙමියි සිතා තක්ෂිලා නුවර වැසියන්ගෙන් ඇසීය. දරුවනි, නුඹලාගේ ජනපදයෙහි බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නය දකිත් ද? මහරජතුමනි, එහි හඬවත් නැත. දැකීමක් කොයින් ද? හොඳයි දරුවනියි, රජු සතුටුව සිතීය. ජනතාවගේ සංග්‍රහ පිණිස මාගේ මිත්‍රයා වසන ස්ථානයට බුදුරදුන් යවන්නට නොහැකි වන්නේය. සැරියුත් මුගලන් ආදී මහා ශ්‍රාවකයන් යවන්නට හැකි වන්නේය. මා විසින් තෙරවරුන්ගේ ප්‍රත්‍යන්තයෙහි වසත් යැයි අසා ද මිනිසුන් යවා උන්වහන්සේලා තමන් සමීපයට ගෙන්වා උපස්ථාන කරන්නට වටියි. එහෙයින් තෙරවරුන්ට ද යන්නට නොහැකිය. යම් ආකාරයකින් පණිවිඩයක් යැවූ කළ බුදුරදුන් ද මහා ශ්‍රාවකයෝ ද යන්නට නොහැකිය. යම් ආකාරයකින් පණිවිඩයක් යැවූ කළ බුදුරදුන් ද මහා ශ්‍රාවකයෝ ද ගියා වැනි වෙත්. ඒ ආකාරයෙන් පණිවිඩයක් යවමියි සිතා හතර රියනක් දිග ඇති වියතක් පළල ඇති ඉතා තුනී නොවූ ඉතා ඝණ නොවූ රන්පතක් කරවා එහි අද අකුරු ලියන්නෙමියි උදෑසනම ස්නානය කොට පෙහෙවස් ඉටා උදේම අනුභව කොට පහ කරන ලද සුවඳ මල් ආභරණ ඇත්තේ රන් කෙණ්ඩියෙන් රත් හිරියල් ගෙන යට පටන් දොරවල් වසමින් ප්‍රාසාදයට නැග නැගෙනහිර අභිමුඛව සීමැදුර කවුළුව හැර අහස්තලයෙහි හිඳ රන් පටෙහි අකුරු ලියන්නේ මේ ලෝකයෙහි බුදුරදුන් උපන්නේය. උන්වහන්සේ අරහත්ය. සම්‍යක් සම්බුද්ධය. විද්‍යාචරණ සම්පන්නය. සුගතය. ලෝකවිදූය. අනුත්තරය. දෙව්මිනිසුන්ට ශාස්තෘය. බුද්ධය. භාග්‍යවත්ය. බුදුගුණ පළමු කොට එක් දේශයකින් ලිවීය. එයින් මෙසේ දස පාරමිතා පුරා තුසිත දිව්‍ය ලෝකයෙන් චුතව මව්කුස පිළිසිඳ ගත්තේය. මෙසේ ලෝක විවරණය විය. මව්කුස වසන කල්හි මේ නම විය. ගෙහි වසන කල්හි මේ නම විය. මෙසේ මහා අභිනිෂ්ක්‍රමණයෙන් නික්මෙන්නේ මහත් වීර්ය කළේය. දුෂ්කරතා ක්‍රියා කොට මහ බෝ මැඩ පහරදීමක් නැති ආසනයෙහි සිටියේ සර්වඥතා ඥානය අවබෝධ කළේය. සර්වඥතා ඥානය අවබෝධ කරන්නහුට මෙසේ ලෝකය විවරණය විය. දෙවියන් සහිත ලෝකයෙහි මෙබඳු වෙනත් රත්නයක් නැත.

මේ ලෝකයෙහි හෝ පරලොව හෝ ස්වර්ගයෙහි හෝ යම්කිසි වස්තුවක් උතුම් රත්නයක් ඇත් ද ඒවා බුදුරදුන් හා සමාන නොවෙයි. මේ බුද්ධරත්නය ම උතුම්ය. මේ සත්‍යයෙන් යහපතක් ම වේවා.

මෙසේ එක් දේශයකින් බුදුගුණ ලියා දෙවනුව ධර්ම රත්නයට ස්තුති කරන්නේ බුදුරදුන්ගේ ධර්මය ස්වාක්ඛාතය - පෙ - නුවණැත්තන් විසින් වෙන වෙනම දත යුතුය. සතර සතිපට්ඨානය - පෙ - ආර්ය අෂ්ටාංගික මාර්ගය යැයි බුදුරදුන් විසින් දේශනා කරන ලද ධර්මය නම් මෙබඳු සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන් එක් දේශයකින් ලියා උතුම් බුදුරදුන් විසින් සියුම් වූ යම් ධර්මයක් ඒ ඒ තැන්වල දී වර්ණනා කළේ ද? ඒ ධර්මය ආනන්තරීය සමාධිය යැයි කීහ. ඒ සමාධිය හා සමාන සමාධියක් නොවෙයි. මේ ධර්ම රත්නයම උතුම්ය. මේ සත්‍යයෙන් යහපතක්ම වේවා.

මෙසේ එක් දේශයකින් ධර්ම ගුණ ලියා එයින් තුන්වෙනි සංඝ රත්නය ස්තුති කරන්නේ බුදුරදුන්ගේ ශ්‍රාවක සංඝයා සුපටිපන්නය - පෙ - ලෝකයාට පුණ්‍ය ක්ෂේත්‍රයකි. කුල පුත්‍රයෝ නම් බුදුරදුන්ගේ ධර්ම කථා අසා ගිහි ගෙයින් නික්මී පැවිදි වෙත්. සමහරෙක් රජකම ද හැර පැවිදි වෙත්. සමහරෙක් යුව රජකම ද සමහරෙක් සෙනෙවි තනතුරු ආදිය ද හැර පැවිදි වෙත්. පැවිදි වී මේ පිළිවෙත් පුරත්. චූලසීල මධ්‍යමසීල මහාසීල ආදිය එක් දේශයකින් ලියා සදොර සංවරය ද සතිසම්පජඤ්ඤය ද සිව්පසෙහි සන්තෝසය ද භාවනාවෙහි ඇලීම ද නව වැදෑරුම් සෙනසුන් ද නීවරණ ප්‍රහීණ පරිකර්ම ධ්‍යාන අභිඥා තිස් අටක් කමටහන් යන මේවා කෙලෙස් ක්ෂය කිරීම දක්වා එක් දේශයකින් ලිවීය. ආනාපානසති කමටහන විස්තර වශයෙන් ලියා බුදුරදුන්ගේ ශ්‍රාවකසංඝයා නම් මෙබඳු ගුණයන්ගෙන් යුක්තය.

යම් අෂ්ටාංගික පුද්ගලයෙක් ප්‍රශංසා කරන ලද්දේ ද ඔවුහු යුගල වශයෙන් හතරක් වෙත්. ඒ බුදුරදුන්ගේ ශ්‍රාවකයෝ දක්ෂිණාර්හය. ඔවුන් දෙන ලද්ද මහත් ඵල වෙයි. මේ සංඝරත්නය උතුම්ය. මේ සත්‍යයෙන් යහපතක්ම වේවා.

මෙසේ එක් දේශයකින් සඟගුණ ලියා බුදුරදුන්ගේ අනුශාසනය මනාකොට දේශනා කරන ලදි. නෛර්යානිකය. ඉදින් මාගේ මිත්‍රයා හැකිනම් නික්මී පැවිදි වේවයි ලිවීය. ලියා රන්පට අකුලා සියුම් කම්බිලියකින් වෙලා කරඬුවක බහා ඒ කරඬුව රන් කරඬුවක ද රන්

කරඬුව රිදී කරඬුවක ද රිදී කරඬුව මැණික් කරඬුවක ද, මැණික් කරඬුව එක් ප්‍රවාල එකක ද ප්‍රවාල එක ලෝහිතංකයක ද ලෝහිතංකය මසාරගල්ලයෙහි ද මසාරගල්ලය ඵලිතයෙහි ද ඵලිතය දන්තමය එකක ද දන්තමය එක රුවන් කරඬුවක් ද, රුවන් කරඬුව කලාල වලින් කරන ලද පෙට්ටියක ද එය සාර කරඬුවෙහි ද තැබීය. නැවත සාර කරඬුව රන්කරඬුවකැයි පළමු ක්‍රමයෙන් ම ගෙන ගොස් වස්ත්‍ර වෙලා රාජ මුද්‍රිකාව ගස්වා ඇමතියන්ට අණ කළේය. මාගේ අණ පවතින ස්ථානයෙහි මාර්ගය සරසව් මඟුල් ඇතා සරසවා ඌගේ පිටෙහි ආසනයක් සාදා සේසත් ඔසවා නුවර වීදි නොයෙක් ආකාරයෙන් සරසා තම තමාගේ අනෙත් පළාත්වල මෙසේ පූජා කරන්නාහ. අභ්‍යන්තර රහස් දූතයෙක් යවා තමා සර්වාකාරයෙන් සැරසී බලසේනා පිරිවරා පඬුරු යවන්නෙමියි තමාගේ ප්‍රදේශයේ කෙළවරට ගොස් ඇමතියන්ට ප්‍රධාන හස්න දුන්නේය.

දරුවනි, මාගේ මිත්‍ර පුක්කුසාති තෙමේ මේ පඬුර වැසුණේ අන්තඃපුර ස්ත්‍රීන් මැද විවෘත නොකර මහළට නැග භාරගනීවායි මෙසේ හස්න දී ප්‍රත්‍යන්ත දේශයට බුදුරදුන් වඩී යයි පසඟ පිහිටුවා වැඳ නැවතුණේය. අභ්‍යන්තර ආරක්‍ෂකයෝ ඒ ක්‍රමයෙන් මාර්ගය පිළියෙළ කොට පඬුරු පැමිණ වූහ. පුක්කුස තෙමේ ද තමාගේ රාජ්‍ය සීමාවේ පටන් ඒ ක්‍රමයෙන් මාර්ගය පිළියෙළ කොට නුවර සරසවා පඬුරුවලට පෙර ගමන් කළේය. පඬුර තක්ෂිලාවට පැමිණෙන්නේ පොහෝ දවස ද පැමිණුනේය. පඬුර ගෙන ගිය ඇමතියා රජු කී පණිවිඩය දැන්විය. රජු එය අසා පඬුර සමඟ පැමිණි අයට කළ යුතු වැඩ විචාරා පඬුර රැගෙන මහළට ගොස් මෙහි කිසිවෙක් නොපැමිණේවයි දොර රැකවල් කරවා සීමැඳුර හැර පඬුර උස් ආසනයක තබා තෙමේ පහත් ආසනයක හිඳ මුද්‍රාව බිඳ වස්ත්‍රය ඉවත් කොට කළාල පෙට්ටිය පටන් පිළිවෙළින් අරින්නේ අරටුවෙන් කළ කරඬුව දැක මෙසේ සිතීය. මහා ආරක්‍ෂාවකි. මෙය වෙන රත්නයක් නොවේ. ඒකාන්තයෙන් මධ්‍ය දේශයේ උපන් රත්නයක් යැයි ඇසිය යුත්තාහ. ඉක්බිතිව ඔහු කරඬුව හැර රාජ මුද්‍රාව බිඳ සියුම් කම්බිලිය දෙපැත්තෙන් අයින් කොට රන්පත්‍රය දැක්කේය. ඔහු එය දිගු කොට අකුරු ලස්සනය. සම හිස්ය. සම පෙළවල්ය. හතරැස් අංශය මුල පටන් කියවන්නට පටන් ගත්තේය. මෙහි බුදුරදුන් උපන්නේය යනුවෙන් බුදුගුණ කියවන ඔහුට බලවත් සතුටක් ඇතිවිය. අනූනව දහසක් ලෝම කූපයෝ උඩුකුරු වූහ. තමා සිටින බව හෝ හිඳින බව හෝ නො දනියි. එකල ඔහුට කල්ප කෝටි ලක්‍ෂයකින්වත් අසන්නට නො ලැබෙන දුර්ලභ හස්නක් මිත්‍රයා නිසා අසන්නට ලැබුණේ යැයි බලවත් සේ සතුටු විය. මතු කියවන්නට

නොහැකි වන්නේ ප්‍රතිවේගය නිසා හිඳ ඊළඟට ස්වාක්ඛාතො භගවතා ධම්මො යන ධර්ම ගුණයන් පටන් ගත්තේය. එහි ඔහුට එසේම විය. එකල්හි සියලු ගුණ අවසානයෙහි ආනාපානසති කමටහන කියවා හතරවැනි පස්වැනි ධ්‍යාන ඉපදවීය. ඔහු ධ්‍යාන සුවයෙන් කල් යවයි. රජුට කිසිවෙක් දැකීමට නැත. එක් උපස්ථායකයෙක් පිවිසෙයි. මෙසේ මාසයෙන් අඩක් ඉක්මවීය. නුවරවැසියෝ රජ මිදුලට රැස්ව ඔල්වරසන් දුන්හ. පඬුරු භාරගත් දින පටන් සේනාව දකීමක් හෝ නාට්‍යාංගනාවන් දකීමක් හෝ නැත. නඩු ඇසීමක් නැත. රජු මිත්‍රයා එවන ලද පඬුරු යමෙක් කැමති ද ඔහුට දක්වා සමහර රජවරු පඬුරු දී වංචා කොට රාජ්‍ය තමාගේ කර ගැනීමට උත්සාහ කරත්. අපගේ රජු කුමක් කෙරේ ද? රජතුමා ඔල්වරසන් හඬ අසා රාජ්‍යය දරම් ද නැතහොත් බුදුරදුන් දැයි සිතීය. එකල්හි ඔහුට මෙබඳු සිතක් විය. රාජ්‍යය කරපු ආත්මයන්හි ගණනක් නැත. ඇමතිකම් ද ගණනක් නැත. ශාස්තෘශාසනය දරන්නෙමියි සයනෙහි තිබූ කඩුව ගෙන කෙස් සිඳ සීමැදුරු හැර මෙය ගෙන රාජ්‍ය කරවයි සිළුමිණ සහිත කෙස් වැටිය පිරිස් මැද දමීය. මහජනයා එය ඔසවා මිත්‍රයාගේ වෙතින් ලැබූ පඬුරු නම් දේවයන්වහන්ස, රජවරු නුඹ හා සමාන වෙත්. එකපාරටම හැඬුවේය. රජුගේ කෙස් රැවුල් දෑඟුලක් පමණ විය. බෝසතුන්ගේ පැවිද්ද හා සමාන විය.

ඉක්බිතිව සුළු උපස්ථායකයා යවා සල්පිළෙන් කසාවත් දෙකක් ද මැටි පාත්‍රයක් ද ගෙන්වා ලොව යම් රහත් කෙනෙක් වෙත් ද මාගේ පැවිද්ද ඔවුන් උදෙසා යි බුදුරදුන් උදෙසා එක් කසාවතක් හැඳ එකක් පොරවා පාත්‍රය වම් අංශයෙහි කොට මාගේ පැවිද්ද යහපත් ද අයහපත්දැයි මහා තලයෙහි කිහිප වරක් සක්මන් කොට මාගේ පැවිද්ද යහපත් යැයි දොර හැර ප්‍රාසාදයෙන් බැස්සේය. බසින්නා වූ ඔහු නාට්‍යාංගනාවෝ දැක ද හඳුනා නොගත්හ. එක් පසේ බුදු කෙනක් අපේ රජුට බණ කියන්නට පැමිණියේ යැයි සිතුහ. මතු ප්‍රාසාදයට නැග රජු සිටින හිඳින තැන් දැක රජතුමා ගියේ යැයි දැන මුහුද මැද දිය සිඳුණු නැවක මිනිසුන් මෙනේ එක්විට ම හැඬූහ. කුලපුත්‍රයා බිමට බැස්ස මොහොතෙහි ම දහ අටක් සේනාවන් ද සියලු නුවර වැසියෝ ද බල සෙනඟ ද පිරිවරා මහත් හඬින් හැඬූහ. ඇමතියෝ ඔහුට මෙසේ කීහ. දේවයන් වහන්ස, මධ්‍යම දේශයෙහි රජවරු බොහෝ මායා දන්නෝය. හස්නක් යවා ලොව බුද්ධ රත්නය උපන් බව හෝ නූපන් බව හෝ දැන යන්න. දේවයන් වහන්ස, එතෙක් නවතින්න. මම අදහමි. ඒ මාගේ මිත්‍රයාට මා සමඟ යුද්ධයක් නැත. නුඹලා සිටිවු. ඔවුහු අනුව යත්මය. කුලපුත්‍රයා සැරයටියෙන් ඉරක් ඇඳ

මේ රාජ්‍යය කාටදැයි ඇසීය. දේවයන් වහන්ස, නුඹ වහන්සේටමය. යමෙක් මේ ඉරෙන් ඇතුළත් වේ ද රාජ්‍ය කළ යුතු යැයි මහා ජනක ජාතකයෙහි බෝසතුන් විසින් කරන ලද ඉර සීවලී බිසව ඇතුළු කරන්නට නොහැකි වන්නී වැටෙමින් ගියාය. ඈ ගිය මඟ මහජනයා ගියේය. ඒ ඉර ඇතුල් කරන්නට මහජනයාට නොහැකි විය. ඉර ඉසෙහි කොට පෙරළෙමින් ඇඬූහ.

කුල පුත්‍රයා මා ගිය තැන මට දැහැට්ටක් හෝ මුවදෝනා පැන් හෝ දෙන්නේ යැයි යටත් පිරිසෙන් සේවකයෙක් වත් නොගෙන ගියේය. ඔහුට මෙබඳු සිතක් විය. මාගේ ශාස්තෘන් වහන්සේ මහබිනික්මන් කොට හුදකලාව ම පැවිදි වී යැයි හුදකලාවම ගියේය. ශාස්තෘන් වහන්සේට ලැජ්ජා වෙන්නේ යැයි ශාස්තෘන් වහන්සේ පැවිදි වී යානාවකට නොනැංගේ යැයි යටත් පිරිසෙන් එක් පටක් ඇති පාවහන්වලට ද නොනැංගේය. කුඩයක් ද නොදැරුවේය. මහජනයා ගස් ප්‍රාකාර අට්ටාලවලට නැගී අපේ රජතුමා මොහු මෙසේ යන්නේ යැයි බැලීය. කුලපුත්‍රයා දුර යා යුතුය. හුදකලාව මග ගෙවන්නට නොහැකිය. එක් වෙළෙන්දෙක් ලුහුබැන්දේය. සියුමැලි කුලපුත්‍රයා යද්දී පොළොව කර්කශ බැවින් කකුල්වල බිබිලි නැග බිදෙත්. දුක් වේදනා උපදිත්. කරත්තකරු කඳවුරු බැඳ සිටි කල කුලපුත්‍රයා මාර්ගයෙන් ඉවත්ව එක් ගස්මුලක හිඳියි. සිටිතැන පාද පිරිකමක් හෝ පිට පිරිකමක් හෝ කිරීමක් නැත. කුලපුත්‍රයා ආනාපානසති හතරවන ධ්‍යානයට සමවැද මාර්ගදාහය නැතිකොට ධ්‍යානයෙහි ඇලීමෙන් කල් යවයි. දෙවන දවසහි අරුණ නැගුණු කල්හි සිරුර පිළිදැගුම් කොට නැවත කරත්තකරු ලුහුබඳියි. උදෑසන ආහාර ගන්නා කාලයෙහි කුලපුත්‍රයාගේ පාත්‍රය ගෙන කන බොන දෑ පාත්‍රයෙහි බහා දෙත්. එය අමුසහල් ද බෙරිවෙලා ද ගල් ඇති ද ලුණු වැඩි ද කුලපුත්‍රයා ලැබුණු සැටි සිහිකර අමෘතයක් මෙන් අනුභව කොට මේ ක්‍රමයෙන් අටක් අඩු දෙසියක් යොදුන් ගියේය. ජේතවන දොරටු කොටුවේ සමීපයෙන් යන්නේ ද බුදුරදුන් කොහේ වාසය කරන්නේදැයි නොඇසීය. කුමක් හෙයින් ද? බුදුරදුන්ට හා රජු විසින් එවන ලද හසුනට ගෞරව වශයෙනි. රජු විසින් බුදුරදුන් මේ ලෝකයෙහි උපදී යැයි බුදුරදුන් රජගහනුවර උපන්නාක් මෙන් කොට හසුන එවන ලදි. එහෙයින් නොවිචාරාම පන්සාළිස් යොදුන් මඟ ගෙවා ඉක්මවන්නේ ඔහු ඉර බසින වේලාවෙහි රජගහනුවරට පැමිණ බුදුරදුන් කොහේ වසන්නේ දැයි ඇසීය. නුඹ කොහේ සිට ආවෙහි ද? මෙහි සිට උතුරෙන්ය. බුදුරදුන් නුඹ ආ මගෙහි මෙයින් පන්සාළිස් යොදුනක් මත්තහි සැවැත් නුවර නම් නුවරක්

ඇත. බුදුරදුන් එහි වාසය කරති. කුලපුත්‍රයා සිතීය. දැන් කල් නොවේ. යන්නට නොහැකිය. අද මෙහිම වැස හෙට බුදුරදුන් ළඟට යන්නෙමියි ඉක්බිතිව නොකල්හි පැමිණෙන පැවිද්දෝ කොහි වෙසෙත් දැයි ඇසීය. ස්වාමීනි, මේ කුඹල්හලෙහිය. එකල්හි ඔහු කුඹල්කරුගෙන් ඉල්ලා එහි විසීම පිණිස පිවිස හුන්නේය. බුදුරදුන් ද එදින අළුයම් කාලයෙහි ලොව බලන්නේ පුක්කුසාති තෙමේ දැක සිතීය. මේ කුලපුත්‍රයා මිත්‍රයා විසින් එවන ලද හසුන පමණක් කියවා යොදුන් සීයකටත් වැඩි මහාරාජ්‍යය හැර මා උදෙසා පැවිදි වී අටක් අඩු යොදුන් දෙසීයක් ඉක්මවා එක් රැයක් විසීමෙන් අනාථව කළුරිය කරන්නේය. මා ගිය කල්හි ශ්‍රාමණ්‍යඵල තුන අවබෝධ කරන්නේය. ජනසංග්‍රහ පිණිස මා විසින් කල්ප ලක්‍ෂයක් අධික කොට ඇති සාරාසංඛ්‍යයක් පාරමිතා පුරන ලදි. ඔහුට සංග්‍රහ කරන්නෙමියි උදෑසනම සිරුර පිළිදැගුම් කොට භික්‍ෂු සංඝයා පිරිවරන ලද්දේ සැවත් නුවර පිඬු පිණිස හැසිර පසුබත් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැළකුණේ ගඳකිළියට පිවිස මොහොතක් වෙහෙස සංසිඳුවා කුලපුත්‍රයා මා කෙරෙහි ගෞරවයෙන් අපහසු දෙයක් කළේය. යොදුන් සීයකටත් වැඩි මහාරාජ්‍යය හැර යටත් පිරිසෙන් මුවදෝවනා භාජනයක් ද නොගෙන හුදකලාව නික්මුණේ යැයි සැරියුත් මුගලන් ආදීන් අතුරෙන් කිසිවෙකුටත් නොකියා තමන් වහන්සේම පාසිවුරු ගෙන හුදකලාව යන්නේ අහසින් නොගියේය. පොළොව සංක්‍ෂේප නොකළේය. කුලපුත්‍රයා මට ලැජ්ජාවෙන් ඇත් අස් ආදී එක යානාවකවත් නොහිඳ යටත් පිරිසෙන් එක් එකපට පාවහන් වලටවත් නොනැග කුඩයක්වත් නොගෙන නික්මුණේය. මා ද පා ගමනින් ම යාම වටී යැයි සිතා පා ගමනින්ම වැඩියේය. උන්වහන්සේ අසූවක් අනුව්‍යංජන බඹයක් පමණ ප්‍රභාව දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණ යන මේ බුද්ධශ්‍රීය වසා වළාකුළින් වැසුණු පූර්ණ චන්ද්‍රයා මෙන් වෙනත් භික්‍ෂුවකගේ වේශයෙන් යන්නේ එක් පසු බතකින් පන්සාළිස් යොදුන් ඉක්මවා හිරු බසින වේලාවෙහි කුල පුත්‍රයා පිවිසි කල්හි ම ඒ කුඹල්හලට පැමිණුනි. ඒ සඳහා කියන ලදි. **තෙන ඛො පන සමයෙන පුක්කුසාති නාම කුලපුත්තො භගවන්තං උද්දිස්ස සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතො සො තස්මිං කුම්භකාරනිවෙසනෙ පඨමං වාසූපගතො හොතීති** මෙසේ ගොස් බුදුරදුන් මම වෙමියි වහා කුඹල් හලට නොපිවිස දොරටුවෙහි සිටියේ කුලපුත්‍රයාට ඉඩ ලබා දෙන්නේ **සචෙ තෙ භික්ඛූති** යනාදිය කිය. **උරුන්දන්ති සම්බාධන්ති විහරතායස්මා යථාසුඛන්ති** යම් යම් ඉරියව්වකින් සැපය වේද ඒ ඒ ඉරියව්වෙන් සැපය වූ පරිද්දෙන් ආයුෂ්මත් තෙමේ වෙසේවා යි අවකාශ කළේය. යොදුන් සීයකටත් වැඩි මහා රාජ්‍යයක් හැර පැවිදි වූ කුලපුත්‍රයා අනුන්ගේ හැර දමන ලද කුඹල්හල කුමක් නිසා අනෙත් පැවිද්දන්ට

දෙන්නේ මසුරු වෙත් ද? ඇතැම් හිස් පුරුෂයෝ සසුනෙහි පැවිදිව ආවාස මසුරුකම් ආදියෙන් මැඩුණාහු තමා වෙසෙන තැන මාගේ කුටිය මාගේ පිරිවෙණ යැයි අනුන් නොවිසීමට උත්සාහ කරත්. නිසිදීති අතිශයින් සියුමැලි වූ බුදුරදුන් දිව්‍ය විමානයක් හා සමාන වූ ගඳ කිළිය හැර තැන් තැන්වල අළු වැටුණු බිඳුණු බඳුන් ඇති තණකොළ පිදුරු කුකුල් උෟරු වසුරු ආදී නොයෙක් විදියේ අපිරිසිදු කුඹල්හලෙහි තණ ඇතිරිල්ලක් අතුරා පාංශුකූල සිවුර පණවා දිව්‍ය විමානයක් හා සමාන ගඳ කිළියෙහි වැඩ ඉන්නාක් මෙන් වැඩ සිටියේය.

මෙසේ බුදුරදුන් ද බිඳීමක් නැති මහා සම්මත වංශයෙහි උපන්නේ ය. කුල පුත්‍රයා ද ක්‍ෂත්‍රිය ගැබෙහි වැඩුණේය. බුදුරදුන් ද හේතු සම්පන්නය. කුලපුත්‍රයා ද එසේමය. බුදුරදුන් රාජ්‍ය හැර පැවිදි විය. කුල පුත්‍රයා ද එසේමය. බුදුරදුන් රන්වන් සිරුර ඇත්තෙකි. කුලපුත්‍රයා ද ක්‍ෂත්‍රියයෝය. දෙදෙනාම හේතු සම්පත් ඇත්තෝය. දෙදෙනාම රාජකීය පැවිද්දෝය. දෙදෙනාම රන්වන් සිරුරු ඇත්තෝය. දෙදෙනාම සමාපත්තීන් ලාභීහුය. කුඹල්හලට පැමිණ සිටියේ ඔවුනොවුන්ගෙන් කුඹල්හල අතිශයින් බැබලුණේය. සිංහයන් දෙදෙනෙක් ගුහාවට පිවිසියාක් මෙන් ගෙන දක්විය යුතුයි. මේ දෙන්නා අතුරෙන් බුදුරදුන් සියුමැලිය. මම ඉතා සියුමැලිය. ඒ පසුබත් වේලාවින් පන්සාළිස් යොදුනක් ආවේ යැයි මොහොතක් පළමුකොට සිංහ සෙයපාව කොට මාර්ග විඩාව සංසිඳවමියි සිතක්වත් නූපදවා සිටියේ ඵලසමවතට සමවැදුණේය. කුලපුත්‍රයා ද යොදුන් එකසිය අනූ දෙකක් ආවෙමියි මොහොතක් පළමුව වැදහොවී මාර්ග වීඩා සංසිඳවන්නෙමියි සිතක් නූපදවා සිටියේ ආනාපානසති හතරවන ධ්‍යානයට සමවැඳුණේය. ඒ සඳහා අථ ඛො භගවා බහුදෙවරත්තිනති යනාදිය කියන ලදි. බුදුරදුන් කුලපුත්‍රයාට ධර්මය දේශනා කරමියි වැඩියේ නොවේ ද? කුමක් නිසා දේශනා නොකළේ ද? කුලපුත්‍රයාගේ මාර්ග වීඩාව නොසංසිඳුණේ ධර්ම දේශනාව පිළිගන්නට නොහැකි වන්නේය. පළමුව ඔහුගේ වීඩාව සංසිඳේවායි දේශනා නොකළහ. එහි බහුදෙ වරත්තිකනති යාම එකහමාරක් පමණ එතදහොසීති බුදුරදුන් ඵලසමවතින් නැගිට දිව්‍ය විමානයක මැණික් සීමැදුරක් අරින්නාක් මෙන් ප්‍රසාද පහකින් සමන්විත ඇස් දල්වා බැලීය. එකල්හි ඔහුගේ අත් පා හිස සෙළවීමකින් තොරව නිශ්චල රන්පිළියමක් මෙන් සැතපෙන කුලපුත්‍රයා දැක එතං පාසාදිකං නු ඛොති යනාදිය කීය. එහි පාසාදිකනති ප්‍රසාදයෙන් යුතු මේ ප්‍රසාද ඉරියව්වෙන් යම් යම් ඉරියව්වක් ප්‍රසාද වෙයි ද මෙසේ ඒ ඒ ඉරියව්වම යන තේරුමයි. හතර ඉරියව් අතුරෙන් ඉරියව් තුනක් යහපත්

නොවෙත් යන්නහුගේ අත් පා හිස සෙළවෙත්. සිටියහුගේ ශරීරය තද වෙයි. සැතපෙන්නහුගේ ඉරියව් මනාප නොවෙයි. පසුබතින් දිවාස්ථානය හැමද පත්කඩය පණවා පිරිසිදු අත් පා හතර එකතු කොට පළඟක් බැඳ සිටින්නහුගේ ඉරියව් යහපත්ය. මේ කුලපුත්‍රයා ද පළඟක් බැඳ ආනාපානසති හතරවන ධ්‍යානයට පැමිණ සිටියේය. මෙසේ ඔහුගේ ඉරියව්වලින්ම පැහැදුණු බුදුරදුන් පාසාදිකං නු ඛොති යන්න මෙනෙහි කළේය. යන්නූනාහං පුච්ඡෙය්‍යන්ති කුමක් හෙයින් අසයි ද? කිම? බුදුරදුන් තමා උදෙසා පැවිදි වූ බව නොදන්නේද? නොදන්නේ නොවේ. නො ඇසූ කල්හි කථාවක් නොපිහිටන්නේය. කථාව නොපිහිටි කල්හි කථාව හට නොගනියි. කථාව පිහිටීම පිණිස ඇසීය. දිස්වා චාහං න ජානෙය්‍යන්ති බුදුරදුන් බුද්ධශ්‍රීයෙන් හැසිරෙන්නේ මේ බුදුරදුන් යැයි සියල්ලෝ ම දනිත්. මෙය පුදුමයක් නොවේ. බුද්ධශ්‍රීය වසාගෙන එක්තරා පිණ්ඩපාතිකයෙකුගේ වේශයෙන් හැසිරෙන්නේ දැන ගැනීමට අපහසු වෙයි. මෙසේ ආයුෂ්මත් පුක්කුසාති තෙමේ නොදන්නේ යැයි ස්වභාවයෙන් ම කීවේය. එසේම එකම කුඹල්හලක සිටියේ ද නොදනියි. එතදහොසීති ගමන් විධාව සංසිඳුණු බව දැන ගත්තේ වෙයි. මෙසේ ඇවැත්නියි කුල පුත්‍රයා මිත්‍රයා විසින් එවන ලද හසුන්පත කියවා රාජ්‍යය හැර බුදුරදුන්ගේ මිහිරි ධර්ම දේශනාව අසන්නට ලැබෙන්නෙමියි පැවිදි විය. පැවිදි වී එපමණක් මාර්ගයෙහි එන්නේ ධම්මනෙත භික්ඛු දෙසෙස්සාමීති පදයක් පමණක් කියන්නෙක් නොලැබුවෙමි. උන්වහන්සේ ධර්මය ඔබට දේශනා කරන්නෙමියි කී කළ කිම මනා කොට නොඅසන්නේ ද? පිපාසිතයෙක් මෙන් පිපාසිත ඇතෙක් මෙන් මනාකොට අසා අවබෝධ කරන්නේ එවමාවුසොති යි කීය. ඡධාතුරො අයන්ති බුදුරදුන් කුලපුත්‍රයාට පූර්වභාග ප්‍රතිපදාව නොකියා මුල පටන් රහත් වීමට හේතු වූ ඒකාන්තයෙන් හිස් වූ විදර්ශනා ලක්ෂණයම කියන්නට පටන් ගත්තේය. යමෙකුගේ පූර්ව භාග ප්‍රතිපදාව අපිරිසිදු වෙයි. ඔහුගේ පළමුකොට සීල සංවරය ඉන්ද්‍රියන්හි වසන ලද දොර ඇති බව ආහාරයෙහි පමණ දැනීම නිදිවැරීමේ යෙදෙන බව සප්ත ධර්මයන්හි ධ්‍යාන හතර ද යන මේ පූර්ව භාග ප්‍රතිපදාව කියයි. යමෙකුගේ මේ පිරිසිදු බව ඔහුට ඒ කථාව නොකියා රහත් වීමට විදර්ශනාව ම කියයි. කුලපුත්‍රයාගේ පූර්වභාග ප්‍රතිපදාව පිරිසිදුයි. එසේම මේ තෙම හසුන කියවා ප්‍රාසාදයට නැගුණේ ආනාපානසති හතරවන ධ්‍යානය ඉපදවීය. මොහු යොදුන් නව දහස් දෙසීයක් ආවාහු යානකිස සැදීය. සාමණේර සීලය ද පරිපූර්ණය. එහෙයින් පූර්වභාග ප්‍රතිදාව නොකියා රහත්වීමට අතිශයින් හිස් විදර්ශනාව ම කියන්නට පටන් ගත්තේය. එහි ඡධාතුරොති ධාතු හය විද්‍යාමානයි. පුරුෂයා විද්‍යමාන නොවෙයි. බුදුරදුන් සමහරවිට

දී විද්‍යාමානයෙන් අවිද්‍යාමානය දක්වයි ද? සමහරවිට දී අවිද්‍යාමානයෙන් විද්‍යාමානය දක්වන්නේ මෙසේ කීය. ඉදින් බුදුරදුන් පුරිසොති යන පැණවීම විසඳා ධාතූන් මෙබඳු යැයි කියා සිත තැබවීය. කුලපුත්‍රයා සංසන්දනය කරන්නේය. සම්මෝහයට පැමිණියේය. දේශනාව අවබෝධ කරන්නට නොහැකි වන්නේය. එහෙයින් බුදුරදුන් පිළිවෙළින් පුරිසොති පැණවීම හැර සත්වයා හෝ පුරුෂයා හෝ පුද්ගලයා හෝ පැණවීම් පමණකින් ම පරමාර්ථයන් සත්වයෙක් නම් නැත. ධාතු මාත්‍රයෙහි පමණක් සිත තබවා ත්‍රිවිධ ඵලයන් අවබෝධ කරවන්නෙමියි සූත්‍රයෙහි කියන ලද භාෂාන්තර දක්ෂතාවයෙන් ඒ ඒ භාෂාවන්ගෙන් ශිල්ප උගන්වන ගුරුවරයෙක් මෙන් මෙසේ කීය. එහි ධාතු හය අස්සාදයයි. **ඡද්ධාතුරො** යන මෙය කියන ලද්දේ වෙයි. නුඹ පුරුෂයෙක් යැයි හඳුනයි ද ඔහු ධාතු හයෙන් ධාතු මාත්‍රයක් ම යැයි මෙහි පරමාර්ථයෙන් ඇත. පුරිසොති පැණවීම් මාත්‍රයයි. සෙසු පදයන්හි ද මේ ක්‍රමයයි. **චතුරාධිට්ඨානොති** මෙහි අධිෂ්ඨානය නම් පිහිටීම යැයි කියයි. පිහිටීම් හතර යන තේරුමයි. මෙය කියන ලද්දේ වෙයි. මේ භික්ෂුව පුරුෂයා ධාතු හයේ ස්පර්ශායතනයෙන් අටළොස් මනෝ විචාරයෙන් ඔහු පමණකින් පෙරලී උතුම් සිද්ධිය වූ රහත්බව ගන්නේ මේ ස්ථාන හතරෙහි පිහිටීම් ගන්නේ චතුරාධිෂ්ඨානයයි. **යත්ථ ඨිතන්ති** යම් අධිෂ්ඨානයක පිහිටියේය. **මඤ්ඤුස්ස වා නප්පවත්තන්තීති** මානයේ උසස් බව හෝ නො පැවතීමයි. **මුනි සන්තොති වුච්චතීති** ක්ෂීණාශ්‍රව මුනි තෙමේ ශාන්ත පිරිනිවුණේ යැයි කියයි. **පඤ්ඤං නප්පමජ්ජෙය්‍යාති** අර්හත්ඵල නුවණින් අවබෝධය පිණිස මුල පටන් සමාධි විදර්ශනා නුවණට ප්‍රමාද නො වන්නේය. **සච්චමනුරක්ඛෙය්‍යාති** පරමාර්ථ සත්‍ය වූ නිවන අවබෝධ කිරීම පිණිස මුල පටන් වාග් සත්‍ය රකින්නේය. **චාගමනුබ්‍රෑහෙය්‍යාති** රහත් මාර්ගයෙන් සියලු කෙලෙස් හැරීමට මුල පටන් කෙලෙස් හැරීම වඩන්නේය. **සන්තිමෙව සො සික්ඛෙය්‍යාති** රහත් මාර්ගයෙන් සියලු කෙලෙස් සංසිඳවීම පිණිස මුල පටන් කෙලෙස් සංසිඳීමට හික්මෙන්නේය. මෙසේ ප්‍රඥා අධිෂ්ඨානාදීන්ගේ අධිගමයට මේ සමථ විදර්ශනා ප්‍රඥාවෝ පූර්වභාග අධිෂ්ඨානයෝ යැයි කියන ලදි. **ඵස්සායතනන්ති** ස්පර්ශයට උප්පත්ති ස්ථාන යන තේරුමයි. **පඤ්ඤාධිට්ඨානන්ති** ආදියෙහි පෙර කියන ලද අර්හත්ඵල ප්‍රඥාදීන්ගේ වශයෙන් දත යුතුයි. **පඤ්ඤං නප්පමජ්ජෙය්‍යාති** යනාදිය කීය. එහි කවරෙක් ප්‍රඥාවට ප්‍රමාද වේ ද? කවරෙක් ප්‍රමාද නොවෙයි ද? යමෙක් මේ ශාසනයෙහි පැවිදිව වෙදකම් කිරීම් ආදී වශයෙන් එක්විසි වැදෑරුම් අන්වේෂණයෙන් පැවිද්දට අනුරූපයෙන් සිත උපදවන්නට තබන්නට නොහැකි වෙත්. මේ ප්‍රඥාවේ ප්‍රමාදය නම්. යමෙක් ශාසනයෙහි පැවිදිව

සීලයෙහි පිහිටා බුද්ධ වචනය ඉගෙන ගැළපෙන ධූතාංගයක් සිතට කැමති කමටහනක් ගෙන විවේක සෙනසුනක් ඇසුරු කොට කසින පරිකර්මයක් කොට සමාපත්තියක් උපදවා අද ම රහත් බව යැයි විදර්ශනා වඩා හැසිරේ ද? මේ තෙමේ ප්‍රමාද නොවේ නම්, මේ සූත්‍රයෙහි ධාතු කර්මස්ථාන වශයෙන් මේ ප්‍රඥාව අප්‍රමාදය යැයි කියන ලදි. මෙහි ධාතු කර්මස්ථානයෙහි යමක් කිව යුතුයි. එය යට හත්ථිපදෝපම සූත්‍රාදියෙහි කියන ලද්දේමය. **අථාපරං විඤ්ඤාණං** යෙව **අවසිස්සතීති** මෙහි මේ වෙන් වෙන් අනුසන්ධියයි. යට දී රූප කර්මස්ථානය කියන ලදි. දැන් අරූප කර්මස්ථානය වේදනා වශයෙන් නිබ්බේදනය දක්වන්නට මේ දේශනාව පටන් ගත්තේය. මේ යම් භික්ෂුවක් පෘථිවිධාතු ආදියෙහි විදර්ශනා වශයෙන් කර්ම කාරක විඥානය ඒ විඥානය වශයෙන් භාජනය කොට දක්වන්නේ මේ දේශනාව පටන් ගත්තේය. එහි **අවසිස්සතීති** කුමක් පිණිස ඉතිරි වූයේ ද? බුදුරදුන්ට කීම පිණිස ද කුලපුත්‍රයාගේ අවබෝධය පිණිස ද ඉතිරි වන්නේය. **පරිසුද්ධන්ති** උපක්ලේශ රහිත **පරියොදනන්ති** බැබළීමයි. **සුඛන්තිපි විජානාතීති** සුඛ වේදනාවෙන් විඳිනු ලබන්නේ සැප වේදනාව විඳීම දනියි. සෙසු පද දෙකේ ද මේ ක්‍රමයයි. ඉදින් මේ වේදනා කථාව යට නොකියන ලද්දේය. මෙහි සිට කියන්නට වටින්නේය. සතිපට්ඨානයෙහි කියන ලද ක්‍රමයෙන් දත යුතුයි. **සුඛවෙදනීයන්ති** වේදනාවෙන් විඳිනු ලබන්නේ සෙසු පදයන්හි ද මේ ක්‍රමයයි. **උපෙක්ඛායෙව අවසිස්සතීති** මෙපමණකින් යම් සේ දක්ෂ මැණික් කරන ගුරුවරයෝ වජ්‍රය ඉදිකටුවෙන් විද සම් කඩෙහි දම දමා දෙන මුතු ගෝලයා අරගෙන නූලෙහි අමුණන්නේ මුතු එල්ලෙන මුතුදූල් ආදිය කෙරේ ද? එසේම බුදුරදුන් කිය කියා දෙන කමටහන මේ කුලපුත්‍රයා මෙනෙහි කරමින් ප්‍රගුණ කළේය. රූපකර්මස්ථාන ද අරූපකර්මස්ථාන ද ප්‍රගුණ විය. ඉක්බිතිව බුදුරදුන් පසුව **උපෙඛායෙව අවසිස්සතීති** කීය. කුමක් පිණිස ඉතිරි වූයේ ද? බුදුරදුන්ට කීමට හා කුලපුත්‍රයාට අවබෝධ පිණිස යැයි කියත්. එය නොගත යුතුයි. කුලපුත්‍රයා විසින් මිත්‍රයාගේ හසුන කියවා ප්‍රාසාද මහළෙහි සිටගෙන ම ආනාපානසති හතරවන ධ්‍යාන උපදවන ලදි. යම් හෙයිකින් ඔහුගේ මෙතෙක් මාර්ගය එමින් සිටිය දී යාන කිස සිදු කළේය. එහෙයින් බුදුරදුන්ගේ කීම පිණිස ම ඉතිරි වූයේය. මේ ස්ථානයෙහි බුදුරදුන් කුලපුත්‍රයාට රූපාවචර ධ්‍යානයෙහි ගුණ කීය. මෙය ද කියන ලද්දේ වෙයි. මහණ නුඹට මේ රූපාවචර හතරවන ධ්‍යානය ප්‍රගුණ පිරිසිදු යැයි යනාදිය ඒ උපේක්ෂාවේ ගුණ කීමයි. **උක්කමුඛංබන්ධෙය්‍යාති** අඟුරු කබලක් හදන්නේය. **ආලිම්පෙය්‍යාති** එහි අඟුරු හා ගිනි දී නළයකින් පිඹින්නේ ගිනි ගන්වන්නේ ය. **උක්කාමුඛෙ පක්ඛිපෙය්‍යාති** අඟුරු එක් කර අඟුරු

උඩ හෝ තබන්නේ ය. උණුසුමෙහි හෝ දමන්නේ ය. **නීහටනති** වරද හරින ලද **නීහටකසාවනති** පහ කරන ලද කසට ඇති එවමෙව බොහි ඒ රත්තරන් යම් සේ කැමති ආභරණ විකෘතිය පිණිස පවතියි ද එසේම මෙය ඒතාක් හතරවන ධ්‍යාන උපේක්‍ෂා විදර්ශනා අභිඥා නිරෝධ භාවෝක්කන්තිය යන මොවුන් අතුරෙන් යමක් කැමති ද ඒ පිණිස වේ යැයි ගුණ කීය. කුමක්හෙයින් බුදුරදුන් මේ රූපාවචර හතරවන ධ්‍යානයෙහි ගෙනයත්. පර්යාදානය පිණිස නුගුණ නොකියා වර්ණනාව කළේය. කුලපුත්‍රයාට හතරවන ධ්‍යානයෙහි ගෙනයාම ද පරියුට්ඨානය ද බලවත් වේ යැයි ඉදින් අගුණ කියන්නේ ය. මාගේ පැවිදි වී නවදහස් දෙසීයක් ජනතාව ආවාහුගේ මේ හතරවන ධ්‍යාන යාන කිස සැදීය. මම මෙපමණක් මාර්ගයෙහි එන්නේ ධ්‍යාන සුවයෙන් ධ්‍යානයෙහි ඇලී පැමිණියේ මෙබඳුනම් ප්‍රණීත ධර්මයට අගුණ කියයි. දැනගෙන කියයි ද නොදැන කියයි ද? කුලපුත්‍රයා සැකයට මෝහයට පැමිණෙන්නේ ය. එහෙයින් බුදුරදුන් ගුණ කීවේය. **තදනුධමමනති** මෙහි අරූපාවචර ධ්‍යාන කර්ම නම්. එය අනුව ගිය හෙයින් රූපාවචර ධ්‍යාන අනුධර්ම යැයි කියන ලදි. විපාක ධර්ම හෝ කුසල ධර්ම හෝ අනුධර්මයි. **තදුපාදානාති** ඒ ගැනීමෙන්. **චිරං දීඝමද්ධානනති** කල්ප විසි දහසක් විපාක වශයෙන් කියන ලදි. මෙයින් මතු ද මේ ක්‍රමයයි. මෙසේ වාර හතරකින් අරූපාවචර ධ්‍යානයාගේ ගුණ කියා දැන් එහිම දෝෂය දක්වන්නේ **සො එවං පජානාතීති** යනාදිය කීය. එහි **සංඛතමෙතනති** ඉදින් මෙහි කල්ප විසිදහසක් ආයුෂ ඇත. මෙය වනාහි සංඛතය පකප්පිතය ආයුෂ සහිත කිරීමෙන් කරයි. නිත්‍ය නොවේ. ශාස්වත නොවේ. තාවකාලික වචන භේදයෙන් විනාශ වන ස්වභාවයෙන් ඉපදීමෙන් අනුව ගිය ජරාවෙන් මරණයෙන් දුකෙහි පිහිටන ලදි. විඥානඤ්චායතනයෙහි ද මේ ක්‍රමයයි. දැන් රහත්බව දේශනාවෙන් ගන්නේ **සො නෙව අභිසංඛරොතීති** යනාදිය කීය. යම් සේ දක්‍ෂයෙක් විෂ විකාරය දැක වමනය කර විෂ ස්ථානයෙන් නැතිකොට මතුවට නංවා කඳ හෝ හිස හෝ ගන්නට නොදීම විෂ ඔතා පොළොවට හෙළන්නේය. මෙපරිද්දෙන් බුදුරදුන් කුලපුත්‍රයාට අරූපධ්‍යානයෙහි ගුණ කීවේය. එය අසා කුලපුත්‍රයා රූපාවචර ධ්‍යානයෙහි නියන්තිය හාත්පසින් ගෙන අරූපාවචර ධ්‍යානයෙහි ප්‍රාර්ථනාව තැබූයේය. බුදුරදුන් එය දැන ඒ නොපැමිණි නොලද භික්‍ෂුවට මේ ආකාසානඤ්චායතනයෙහි පැමිණීම නම් ඔවුන්ගේ පළමු බඹලොව කල්ප විසි දහසක් ආයුෂයි. දෙකෙහි හතළිහයි. තුනෙහි හැටයි. හතරෙහි කල්ප අසූහාර දහසයි. එය නිත්‍ය නැත. ස්ථිර නැත. ශාස්වත නැත. තාවකාලිකයි. කීම වැටීම බිඳීම නැසීම ස්වභාව කොට ඇත. ඉපදීම අනුව ගියේය. ජරාවෙන් පැතුරුණේය. පිහිටක්

Scanned with CamScanner

නැත. මරණයෙන් නසන ලදි. දූකෙහි පිහිටියේය. ආරක්ෂක ස්ථානයක් නැත. පිහිටක් නැත. මෙතෙක් කලක් එහි සැප විඳ පෘථග්ජනයා කළුරිය කොට නැවත නැවත සතර අපායෙහි වැටිය යුතු යැයි මේ සියලු දෝෂය එකම පදයෙන් ම **සංඛතමෙතං** යැයි කියන ලදි. කුලපුත්‍රයා එය අසා අරූපාවචර ධ්‍යානයෙහි ආශාව ගත්තේය. බුදුරදුන් ඔහුගේ රූපාවචරයෙන් අරූපාවචරයෙහි ආශාව ගත්බව දැන රහත් බව ගන්නේ **සො නෙව අභිසංඛරොතීති** යනාදිය කීය.

යම්සේ එක මහා යෝධයෙක් එක රජෙක් සිත් ගෙන ලක්ෂයක් උපදින උතුම් ගමක් ලබන්නේය. ඉක්බිතිව රජතුමා ඔහුගේ ආනුභාවය සිහිකොට යෝධයා මහත් ආනුභාව ඇත්තේය. තා විසින් ලබන ලද්දේ ටික යැයි දරුව, නුඹට මේ ගම සුදුසු නැත. ලක්ෂ හතරක් උපදින වෙන ගමක් ගණුවයි දෙන්නේය. ඔහු යහපත දේවයන් වහන්ස, යැයි ඒ ගම අතහැර අනෙත් ගමට යන්නේය. රජතුමා නොපැමිණියේය. කුමක් නිසාද? එහි අභිවාතක රෝගය උපදියි. ඔහු කැඳවා අසවල් තැන මහත් නුවරක් ඇත. එහි සේසත නංවා රජ කරවයි යවන්නේය. ඔහු එසේ කරන්නේය. එහි රජුන් මෙන් බුදුරදුන් දත යුතුය. පුක්කුසාති කුලපුත්‍රයා යෝධයා මෙනි. පළමුව ලද ගම ආනාපානසති හතරවන ධ්‍යාන මෙන් ද එය හැර අනෙත් ගම ගනුවයි කී කාලය මෙන් ආනාපානසතියෙහි ආශාව ගැනීම කරවා අරූපධ්‍යානය කීම ද ඒ ගමට නොපැමිණියා වූ ඔහු කැඳවා තට එයින් කම් කිම් ද? මෙහි අභිවාතක රෝගය උපදියි. අසවල් තැන නුවරක් ඇත. එහි සේසත නංවා රජ කරවයි කියන ලද කලය මෙන් අරූපයෙහි මේ සංඛතය යැයි වරද කීමෙන් නොපැමිණ ඒ සමාපත්තීන් ප්‍රාර්ථනා කිරීම වළක්වා මත්තෙහි රහත්බව පිණිස දේශනා ගන්නේ එහි **අභිසංඛරොතීති** නො කැඳවයි. රැස් නොකරයි. **න අභිසඞ්චෙතයතීති** නොසිතයි **භවාය වා විභවායවාති** වැඩීම පිණිස හෝ පිරිහීම පිණිස හෝ ශාස්වත උච්ඡේද වශයෙන් යෙදිය යුතුයි. **න කිඤ්චිලොකෙ උපාදියතීති** ලෝකයෙහි රූපාදීන් අතුරෙන් කිසි එකද ධර්මයක් තෘෂ්ණාවෙන් නොගනියි. නොඅල්ලයි. **නාපරං ඉත්ථත්තායාති පජානිතීති** බුදුරදුන් තමාගේ බුද්ධ විෂයෙහි සිට දේශනාවෙන් රහත් බවෙහි මුදුන ගත්තේය. කුලපුත්‍රයා තමාගේ බුද්ධ විෂයෙහි සිට දේශනාවෙන් රහත් බවෙහි මුදුන ගත්තේය. කුලපුත්‍රයා තමාගේ හේතු සම්පත්තිය අනුව ත්‍රිවිධ ශ්‍රාමණ්‍ය ඵලයන් අවබෝධ කළේය. යම් පරිදි රජ තෙමේ රත්තරන් භාජනයෙන් නොයෙක් රසවත් ආහාර අනුභව කරන්නේ තමාගේ පමණට පිඩු වටකොට ඇකයෙහි සිටි රාජකුමාරයා විසින් පිඩු ගැන ආශාව දැක්වූ කල්හි ඒ පිඩු පිරිනමන්නේ

ය. කුමාරයා තමාගේ මුඛයේ ප්‍රමාණයට අනුභව කරන්නේය. ඉතිරිය රජතුමා තමා හෝ අනුභව කරන්නේය. තැලියෙහි හෝ දමන්නේය. එසේම ධර්ම රාජ වූ බුදුරදුන් තම පමණින් රහත් මුදුන ගන්නේ දේශනා කළ සේක. කුලපුත්‍රයා තමාගේ හේතු සම්පත් අනුව ත්‍රිවිධ ශ්‍රාමණ්‍ය ඵලයන් අවබෝධ කළේය. මෙයින් පෙර ඔහුට ස්කන්ධ ධාතු ආයතනාදිය මෙබඳු අතිශයින් ශූන්‍යතා ලක්‍ෂණයෙන් යුතු යැයි කියන්නහුගේ කථාව සැකයක් නොවිණි. විමතියක් නොවිණි. මෙසේ මට ඒ ගුරුවරයා විසින් කියන ලදි. ඇතැම් තැන්හි බුදුරදුන් වෙනත් වේෂයකින් හැසිරෙත්. මොහු සම්මා සම්බුද්ධදැයි සැකයක් විමතියක් විය. යම්සේ මොහු විසින් අනාගාමී ඵලය අවබෝධ කළේ ද එකල්හි මේ මාගේ ශාස්තෘන් වහන්සේ යැයි නිෂ්ඨාවට ගියේය. යම්සේ මෙසේ කුමක් හෙයින් ද වරද දේශනා නොකරන්නේ ද? අවකාශ වශයෙනි. බුදුරදුන් බහාලන ලද මාතෘකාවන්ගෙන් නොසිඳී වාර කොට අහස් ගඟ බසින්නාක් මෙන් දේශනා කළ සේක. **සොති** ඒ රහතන් වහන්සේ **අනජ්ඣොසිතාති** ගිල අවසානයක් කරන්නට නොහැකි යැයි දනියි. **අනභිනන්දිතාති** තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් සතුටු කරන්නට නොහැකි යැයි දනියි. **විසංයුත්තො තං න වෙදයතීති** ඉදින් ඔහුගේ සැප විඳීම අරබයා රාගානුසයෙන් දුක් විඳීම අරබයා ද පටිඝානුසයෙන් අනෙත් විඳීම් අරබයා ද අවිද්‍යානුසයක් උපදින්නේය. කෙටියෙන් විඳීම නම් නූපදීමෙන් වෙන්ව මිදුණේ නොවිඳියි. **කායපරියන්ති** ශරීරය කෙළවර කොට ඇති. යම්තාක් ශරීරය පවතින්නේ ද ඉපදී එයින් පසුව නූපදින විඳීම යැයි යන තේරුමයි. දෙවන පදයෙහි ද මේ ක්‍රමයයි. **අනභිනන්දිතානි සීතිභවිස්සන්තීති** දොළොස් ආයතනයන්හි කෙළෙසුන්ගේ විශේෂයක් නැත. එයින් නොසතුටු වී මෙහි දොළොස් ආයතනයන්හි නිරුද්ධ වන්නේය. කෙලෙසුන්ගේ නිවීම පැමිණ නිරුද්ධය ද යම්තැනක උපන් හෙයින් එහි නිරුද්ධවේ යැයි කියත්. ඒ මෙහි තේරුමයි. මෙහි මේ තෘෂ්ණාවේ නිරුද්ධවීම නිරුද්ධය යැයි සමුදය ප්‍රශ්නයෙන් දක්විය යුතුයි. එහෙයින් බුදුරදුන් නිවනට පැමිණ සිහිල් වූ බැවින් මෙහි ද **සීතිභවිස්සන්තීති** යි කීය. මෙහි විඳීම කෙළෙස් යැයි නොකියන ලදි. විඳීම යනු කෙලෙස් ස්වභාවයෙන් සිහිල් වීම යි. අනෙත් තැන්වල සිහිල්වීමක් නම් නැතැයි මනාකොට මෙය කියන ලදි.

**එවමෙම බොති** මෙහි මේ උපමා සංසන්දනයයි. යම් සේ එක් පුරුෂයෙක් තෙල් පහනක් දල්වන්නේ තෙල් සිඳුණු කල්හි තෙල් දමයි. වැටිය සිඳුණු කල්හි වැටියක් දමයි. මෙසේ පහන් දැල්ල නොසිඳෙන්නේ වෙයි. මෙපරිද්දෙන් ම පෘථග්ජන තෙමේ එක් භවයක සිටියේ කුසල්

අකුසල් කරයි. ඔහු එයින් සුගතියෙහි ද අපායෙහි ද උපදියි. මෙසේ වේදනාවන්ගේ නොසිදීම වෙයි. යම්සේ එක් පහන් වැටියක් නිවීමට ආසන්න වූයේ මේ පුරුෂයා පැමිණ පහන්සිල නොදල්වයි. සැඟවී ඔහුගේ හිස සිඳින්නේය. මෙසේ වැටිය ද තෙල් ක්‍ෂය වී පහන් දල්ල නිවෙයි. මෙපරිද්දෙන් පවතින කල්හි යෝගාවචර තෙමේ අර්හත් මාර්ගයෙන් කුසලය සම්පූර්ණයෙන් ම සිඳියි. සම්පූර්ණයෙන් කෙලෙස් සිඳින ලද රහත් භික්‍ෂුව කාබුන් මරණින් පසු නැවත විඳීමක් නො උපදිත්. **තස්මාති** යම්හෙයකින් පළමුව සමාධි විදර්ශනා නුවණින් අර්හත් ප්‍රඥාව උත්තරීතරය. එහෙයින් **එවං සමන්නාගතොති** මේ උතුම් අර්හත්ඵල ප්‍රඥාවෙන් අධිෂ්ඨානයෙන් සමන්විත වූ සියලු දුක් ක්‍ෂය කිරීමේ නුවණ නම් අර්හත් මාර්ග ඥානයයි. මේ සූත්‍රයෙහි වනාහි අර්හත්ඵල ඥානය අදහස් කරන ලදි. එහෙයින් කීය. **තස්ස සා විමුත්තිසච්චෙ ඨිතා අකුප්පා හොතීති** යි කීය. **විමුත්තීති** අර්හත්ඵල විමුක්තියයි. **සච්චන්ති** පරමාර්ථ සත්‍ය නම් නිර්වාණයයි. **අකුප්පා** අරමුණු කරණයෙන් අකුප්පාති යැයි කියන ලදි. **මුසාති** මුසාවාද වූ **මොසධම්මන්ති** නැසෙන ස්වභාවයයි. **තං සච්චන්ති** ඒ අවිතථ ස්වභාවයයි. **අමොසධම්මන්ති** විනාශ නොවන ස්වභාවයයි. **තස්මාති** යම් හෙයකින් මුල පටන් සමථ විදර්ශනා වශයෙන් වාග් සත්‍යයෙන් දුක්ඛ සත්‍යයෙන් ද සමුදය සත්‍යයෙන් ද පරමාර්ථ සත්‍යය නිර්වාණය මෙන්ම උතුමිය. එහෙයින් **එවං සමන්නාගතොති** මේ උතුම් පරමාර්ථ සත්‍ය අධිෂ්ඨානයෙන් සමන්විත වූ **පුබ්බෙති** පෘථග්ජන කාලයයි. **උපධිහොන්තීති** ස්ඛන්ධ උපධි කෙලෙස් උපධි අභිසංඛාර උපධි පංචකාම උපධි යන මේ උපධීහු වෙත්. **සමත්තා සාමාදිණ්ණාති** සම්පූර්ණයෙන් ගත්තාහු පරාමට්ඨයයි. **තස්මාති** යම්හෙයකින් මුල පටන් සමථ විදර්ශනා වශයෙන් ක්ලේශ පරිත්‍යාගයෙන් සෝවාන් මාර්ගාදියෙහි ද ක්ලේශ පරිත්‍යාගයෙන් අර්හත් මාර්ගයෙන් ම ක්ලේශ පරිත්‍යාගය උතුම්ය. එහෙයින් **එවං සමන්නාගතොති** මේ උතුම් ත්‍යාග අධිෂ්ඨානයෙන් සමන්විත වූ **ආඝාතොති** යනාදියෙහි අඝාත කරන වශයෙන් ආඝාත නම්. ක්‍රෝධ කිරීම් වශයෙන් බ්‍යාපාදො යයි. ද්වේශ කිරීම් වශයෙන් සම්පදොසො පද තුනෙන් අකුසල් මුල්ම කියන ලදි. **තස්මාති** යම් හෙයකින් මුල පටන් සමථ විදර්ශනා වශයෙන් ක්ලේශ වූපසමනයෙන් සෝවාන් මාර්ගාදියෙහි ක්ලේශ වූපසමනයෙන් ද අර්හත් මාර්ගයෙන්ම ක්ලේශ වූපසමනය උතුම්ය. එහෙයින් **එවං සමන්නාගතොති** මේ උතුම් උපසමාධි අධිෂ්ඨානයෙන් සමන්විත වූ **මඤ්ඤිතමෙතන්ති** තෘෂ්ණාමඤ්ඤනාව මානමඤ්ඤනාව දෘෂ්ටිමඤ්ඤනාව තුන්වැදෑරුම් ව වටියි. **අයමහමස්මීති** මෙහි වනාහි එක තෘෂ්ණා මඤ්ඤනාව ම වටියි. **රොගොති** ආබාධ

අර්ථයෙන් රෝග නම්. ඇතුළත දෝෂාර්ථයෙන් ගණ්ඩෝ අනුපිවිසෙන අර්ථයෙන් **සල්ලං මුනි සන්තෝති වුච්චතීති** ක්ෂීණාශ්‍රව මුනිතෙමේ ශාන්තව නිවුණේ යැයි කියයි. **යත්ථට්ඨිතන්ති** යම් තැනක සිටී. **සංඛිත්තේනාති** බුදුවරයන්ගේ සියලු ධර්ම දේශනා කෙටියි. විස්තර දේශනා නම් නැත. සමන්තපට්ඨාන කථාව ද කෙටිය. මෙසේ බුදුරදුන් දේශනාව අනුසන්ධියට පැමිණවීය. උග්ඝටිතඤ්ඤූ යනාදී පුද්ගලයන් හතර දෙනාගෙන් පුක්කුසාති කුලපුත්‍රයා විපචිතඤ්ඤූ යැයි බුදුරදුන් මේ ධාතුවිභඞ්ග සූත්‍රය කීහ. **න ඛො මෙ භන්තෙ පරිපුණ්ණං පත්තචීවරන්ති** කුමක් හෙයින් කුලපුත්‍රයාට සෘද්ධිමය පාසිවුරු නො උපන්නේ ද? පෙර අටපිරිකර නොදෙන ලද නිසාය. කුලපුත්‍රයා දෙන ලද දන් ඇත්තේය. කරන ලද මූල ප්‍රාර්ථනා ඇත්තේය. නොදෙන ලද්දේ යැයි නොකිව යුතුයි. සෘද්ධිමය පාසිවුරු ප්‍රශ්චිම භවිකයන්ට ම උපදියි. මොහු ප්‍රතිසන්ධි සහිතය. එහෙයින් නොඋපන්නේය. එකල්හි බුදුරදුන් තෙම්ම සොයා කුමක් හෙයින් උපසම්පදා නොකළේ ද? අවකාශයක් නැති හෙයිනි. කුලපුත්‍රයාගේ ආයුෂ ගෙවීය. සුද්ධාවාසයෙහි වසන අනාගාමී මහා බ්‍රහ්මයා කුඹල්හලට පැමිණ සිටින්නාක් මෙන් විය. එහෙයින් තෙමේම නොසෙව්වේය.

**පත්තචීවරං පරියෙසිතුං පක්කාමීති** ශරීර වස්ත්‍ර සඳහා ගියේය. අරුණ නැගි කාලයේ බුදුරදුන් ධර්ම දේශනාව අවසාන වීම ද අරුණ නැගීම ද රැස් විහිදීම ද එකණෙහිම විය. බුදුරදුන් දේශනාව නිමවා ෂට්වර්ණ රශ්මිය විහිදවීය. සියලු කුඹල්හල එකම එළියක් විය. ෂට්වර්ණ රශ්මි ජාලාව දූල්ව දූල්ව ගුලිව ගුලිව දවන්නාහු සියලු දිශාවන් රන් සමූහයෙන් බබළන්නාක් මෙන් විය. බුදුරදුන් නුවරවැසියෝ මා දිකිත්වායි අධිෂ්ඨාන කළේය. නුවරවැසියෝ බුදුරදුන් දැක බුදුරදුන් වැඩම කොට කුඹල්හලෙහි වැඩහිඳි යැයි ඔවුනොවුන්ට කියා රජුට දැන්වූහ. රජතුමා ගොස් බුදුරදුන් වැඳ ස්වාමීනි, කුමන වේලාවක වැඩියේ දැයි ඇසීය. මහරජතුමනි, ඊයේ හිරු බසින වේලාවේය. ස්වාමීනි, කුමන කටයුත්තක් සඳහා ද? නුඹගේ මිත්‍ර පුක්කුසාති රජු නුඹ විසින් යවන ලද හසුන අසා නික්මී පැවිදි විය. මා උදෙසා එන්නේ සැවැත්නුවර ඉක්මවා පන්සාළිස් යොදුනක් ඇවිත් මේ කුඹල්හලට පැමිණ සිටියේය. මම ඔහුට සංග්‍රහ පිණිස පැමිණ ධර්ම කථාවක් කීමි. මහරජතුමනි, කුලපුත්‍රයා තුන්ඵලය අවබෝධ කළේය. ස්වාමීනි, දැන් කොහේ ද? උපසම්පදාව ඉල්ලා සම්පූර්ණ නොවූ පා සිවුරු ඇති හෙයින් පාසිවුරු සෙවීමට ගියේය. රජතුමා කුලපුත්‍රයා ගිය දිශාවට ගියේය. බුදුරදුන් අහසින් අවුත් දෙව්රමෙහි ගඳකිළියෙහි ම පහළ විය. කුලපුත්‍රයා ද පාසිවුරු සොයන්නේ බිම්බිසාර

රජු ළඟට ද තක්ෂිලා නුවර වෙළෙන්දන් ළඟට ද නොගියේය. ඔහුට මෙසේ සිතක් විය. කුකුලෙක් මෙන් එක එක තැන ඇවිද පාසිවුරු සෙවීම මට සුදුසු නැත. මහත් නුවර හැර ගං ඉවුරු සොහොන් කසල ගොඩවල් ඇතුල් විදිවල සොයන්නෙමියි ඇතුල් විදියේ කසල ගොඩවල්වල කඩරෙදි සොයන්නට පටන් ගත්තේය.

ජීවිතා වොරොපෙසීති එක් කසල ගොඩක කඩරෙද්දක් බලන්නහු තරුණ වස්සෙකු ඇති දෙනක් දිවවිත් අඟෙන් ඇන මැරීය. කුලපුත්‍රයා උඩදී ම මරණයට පත්ව වැටුණේය. කුණු ගොඩේ මුව යටිකුරුව රන් පිළිමයක් මෙන් විය. මරණයට පත්ව අවිහ බඹලොව උපන්නේය. උපන් මොහොතෙහි ම රහත් විය. අවිහ බඹලොව උපන් මොහොතේ ම හත්දෙනෙක් රහත් බවට පැමිණුනාහ මෙය කියන ලදි.

මිනිස්බව අතහැර භික්ෂූන් හත් දෙනෙක් අවිහ බඹලොව ඉපිද රාග ද්වේශයන් ක්ෂය කොට විසත්තික ලෝකයෙන් එතරව මාරයාගෙන් මිදී එතර කිරීමට අපහසු වූ සසරින් මිදී රහත් වූහ.

උපකය, පලගණ්ඩය, පුක්කුසාතිය, භද්දිය ය, කුණ්ඩදේවය ය, බාහුදන්තිය ය, පිංගිය ය යන හත්දෙනාය.

බිම්බිසාර තෙමේ මාගේ මිත්‍රයා මා විසින් යවන ලද හසුන පමණක් කියවා තමා සතු රාජ්‍යය හැර මෙතෙක් දුර පැමිණියේය. කුලපුත්‍රයා විසින් අමාරු දෙයක් කරන ලදි. පැවිද්දන්ට කරන සත්කාරයක් කරන්නෙමියි මාගේ මිත්‍රයා සොයව් ඒ ඒ තැන්වල යැවීය. මිනිස්සු කසල ගොඩෙහි වැටුණහු දැක ඇවිත් රජුට දැන්වූහ. රජතුමා ගොස් කුලපුත්‍රයා දැක මිත්‍රයාට සත්කාර කරන්නට නොලැබුනෙමි. මාගේ මිත්‍රයා අනාථ වූයේ යැයි හඬා කුලපුත්‍රයා ඇඳකින් ගෙන්වා සුදුසු තැනක තබා අනුපසම්පන්න ආදීන් කැඳවා හිස් සෝදා සුදු ඇඳුම් අන්දවා රාජ වේශයෙන් සරසවා රන්සිවිකාවකට නංවා සියලු දෙයින් පූජා කරවා නුවරින් ගෙන ගොස් සුවඳ දරවලින් චිතකයක් කොට සිරුර කිස කොට ධාතු ගෙන සෑයක් පිහිට විය. ඉතිරිය සියලු තැන්හි ප්‍රකටය.

**ධාතුවිභංග සූත්‍ර වර්ණනාව නිමි.**

# 4.4.11

**එවමෙතංසුතන්ති** මාවිසින් සච්චවිභංග සූත්‍රය මෙසේ අසන ලදි. එහි **ආචික්ඛනාති** මේ දුක්ඛාර්ය සත්‍ය නම්. -පෙ- මේ දුක්ඛනිරෝධ ගාමිනි පටිපදාර්ය සත්‍ය නම්. සෙසු පදයන්හි ද මේ ක්‍රමයයි. තව ද මෙහි **පඤ්ඤපනාති** නම් දුක්ඛ සත්‍යාදීන්ගේ දර්ශන තැබීමයි. අසුනක් තබන්නේ අසුන් පැණවීම යැයි කියයි. **පට්ඨපනාති** තැබීමයි. **විවරණාති** විවෘත කිරීමයි. **විභජනාති** විභාග කිරීමයි. **උත්තානිකම්මන්ති** ප්‍රකට කිරීමයි. **අනුග්ගාහකාති** ආමිස සංග්‍රහයෙන් ධර්ම සංග්‍රහයෙන් යන දෙකින් අනුග්‍රහ කිරීමයි. **ජනෙත්තීති** උපදවන ලද මවය. **ආපාදෙතාති** පෝෂ්‍ය කරන. පෝෂණය කරන ලද මව මෙන් මුගලන් තෙරුන් දක්වයි. ජනික මව මාස නවයක් හෝ මාස දහයක් හෝ ලුණු ඇඹුල් ආදිය පරිහරණය කරමින් කුසෙහි දරුවා දරාගෙන කුසින් නික්මුණු කළ පෝෂ්‍ය කරන ලද මව කිරිමව පිළිගනියි. ඕතොමෝ කිරි මෝරු ආදිය පොවා වර්ධනය කරයි. ඔහු වැඩීමට පැමිණ සැප වූ පරිදි හැසිරෙයි. මෙපරිද්දෙන් ම සැරියුත් තෙරුන් තමාගේ හෝ අනුන්ගේ ලඟ පැවිදි වූවන් සංග්‍රහ දෙකෙන් සංග්‍රහ කරන්නේ ලෙඩවූවනට පිළිදගුම් කරමින් කමටහනෙහි යොදවා සෝවාන් බව දත අපාය බියෙන් නැගිටි කාලයේ පටන් දැන් වෙන වෙනම පුරුෂකාරයෙන් මතුමාර්ගයෙහි උපදවන්නාහු යැයි ඔවුන් කෙරෙහි බලාපොරොත්තු නැතිව අනෙත් නවකයන්ට අවවාද කරති.

මුගලන් තෙරුන් ද තමාගේ හෝ අනුන්ගේ ලඟ පැවිදි වූවන්ට එසේම සංග්‍රහ කොට කමටහනෙහි යොදවා යට ත්‍රිවිධ ඵලයන්ට පැමිණි කළ අපේක්ෂා රහිතබවට නොපැමිණෙයි. කුමක්හෙයින් ද? උන්වහන්සේට මෙබඳු අදහසක් වෙයි. බුදුරදුන් කියන ලදි. මහණෙනි, යම්සේ ස්වල්ප වූ අසූචි ද මූත්‍ර ද කෙළ ද සැරව ද ලේ ද දුගඳ ම වෙයි. එසේම මහණෙනි, මේ භවය ද මම ස්වල්පයක්වත් වර්ණනා නොකරමි. යටත් පිරිසෙයින් අසුරගසන පමණක්වත් ය. එහෙයින් යම්තාක් අර්හත්වය දක්වා නොපැමිණෙත්. ඒතාක් ඒවායෙහි අපේක්ෂාවක් නැතිව නොපැමිණ අර්හත්වයට පැමිණෙයි. එහෙයින් බුදුරදුන් කීය. **සෙය්‍යථාපි භික්ඛවෙ ජනෙත්ති එවං සාරිපුත්තො සෙය්‍යථාපි ජාතස්ස ආපාදෙතා එවං මොග්ගල්ලානො සාරිපුත්තො භික්ඛවෙ සොතාපත්තිඵලෙ විනෙති. මොග්ගල්ලානො උත්තමත්ථෙති. පහොතීති** හැකියි. **දුක්ඛෙ ඤාණන්ති** ඇසීම විමසීම අවබෝධ කරන නුවණයි. එසේම දුක්ඛසමුදයෙහි ද දුක්ඛනිරෝධයෙහි ද ඇසීම

අවබෝධ කිරීමේ නුවණ වටියි. එසේම දුක්ඛනිරෝධගාමිනීපටිපදායෙන් නෛෂ්ක්‍රම්‍ය සංකල්පාදියෙහි කාම ප්‍රත්‍යයෙන් කාමයෙන් නිසට බැවින් හෝ කාමයන් විමසීමෙන් උපන් හෝ කාමඝාතනය කාමය සංසිඳීම කරන්නේ ඉපදීම හෝ වෙයි. නෙක්ඛම්ම සංකප්පො සෙසු පදයන්හි ද මේ ක්‍රමයයි. මේ සියල්ලෙහි පූර්වභාගයෙහි නොයෙක් නොයෙක් සිත්වල මාර්ගක්ෂණයෙහි එක්සිතක් ලබත්. එහි මිථ්‍යා සංකල්පනා චේතනාවන් සමූල ඝාතනය කරන එකම සංකල්පයකි. නම් තුනක් ලබයි. සම්මාවාචාදිය ද පූර්වභාගයෙහි නොයෙක් නොයෙක් සිත්වල කියන ලද ලද ක්‍රමයෙන් ම මාර්ගක්ෂණයෙහි එකම සිතක් ලබත්. මේ මෙහි සංක්ෂේපයයි. විස්තර සත්‍යකථා විසුද්ධිමාර්ගයෙහි ද සම්මාදිට්ඨි සූත්‍රයෙහි ද කියන ලද්දේමය.

**සච්චවිභංග සූත්‍ර වර්ණනාව නිමි.**

## 4.4.12

**එවමෙමසුතනති** මා විසින් දක්ඛිණාවිභංග සූත්‍රය මෙසේ අසන ලදී. එහි **මහාපජාපතීගොතමීති** ගොතමී නම් ගෝත්‍රයයි. ඇයට නම් තබන දවසෙහි ලබන ලද සත්කාර ඇති බමුණෝ ලකුණු සම්පත් දැක ඉදින් මැය දුවක් ලබන්නේ නම් සක්විති රජෙකුට අගමෙහෙසියක් වන්නේය. ඉදින් පුතෙක් ලබන්නේ නම් සක්විති රජ වන්නේය. දෙවිදියකින් ම ඇයට මහත් වූ ප්‍රජාව වන්නේ යැයි ප්‍රකාශ කළාහ. එහෙයින් ඇයට මහා ප්‍රජාපතී යන නම කළාහ. මෙහි ගෝත්‍රය හා ගලපා මහාප්‍රජාපතී ගෝතමී යැයි කියන ලදි. **නවනති අළුත් සාමං වායිතනති** සිය අතින් ම වියන ලද එක් දවසක කිරි මච්චරු පිරිවරා ශිල්පීන් වියන ස්ථානයට අවුත් රෙදි වියන දඬු කෙළවර ගෙන විවීම කළේය. ඒ සඳහා මෙය කියන ලදී. කවරදාක ගෞතමියට බුදුරදුන්ට වස්ත්‍ර යුගලක් දෙන්නට සිතක් උපන්නේ ද? බුද්ධත්වයට පැමිණ පළමු ගමනින් කිඹුල්වතට පැමිණි කාලයෙහිය. එකල්හි බුදුරදුන්ගේ රූප ශෝභාව දැක මහාප්‍රජාපතී ගෞතමිය සිතීය. මාගේ පුතාගේ ආත්මය හොබනේ යැයි අයට මහත් සතුටක් උපණ එයින් සිතීය. මාගේ පුතාට අවුරුදු විසි නවයක් ගිහිගෙදර වාසය කරද්දී යටත් පිරිසෙන් පුවක් ගෙඩියක් පමණකුදු මා විසින් නොදෙන ලද්දේය. දැන් ඔහුට පිණිස සළුවක් දෙන්නෙමියි මේ රජගහනුවර බොහෝ වටිනා

වස්ත්‍ර ඇත. ඒවා මා සතුටු නොකරත්. සිය අතින් කරන ලද්ද ම මා සතුටු කරයි. සිය අතින් කොට දෙන්නෙමියි සිතක් ඉපදවීය.

ඉක්බිතිව කඩයෙන් කපු ගෙන්වා සිය අතින් නෙළා තලා සියුම් නූල් කැටීම් කර ඇතුළෙහි ම ශාලාවක් කරවා ශිල්පීන් කැඳවා ඔවුන්ට ආහාර පාන දී වියවූයේය. කලින් කල කිරිමව්වරුන් පිරිවරා ගොස් දඬු කෙළවර ගත්තේය. නිමි කල්හි ශිල්පීන්ට බොහෝ සත්කාර කර වස්ත්‍ර යුගලය සුවඳ කරඬුවක දමා සුවඳ ගන්වා මාගේ පුතාට සිවුරු පිණිස වස්ත්‍රයක් ගෙන යන්නෙමියි රජුට දැන්වීය. රජු මාර්ගය පිළියෙළ කරවීය. වීදි හැමද පුන්කලස් තබා කොඩි සේසත් ඔසවා රජ ගෙදර දොරටුව පටන් නිග්‍රෝධාරාමය දක්වා මාර්ගය පිළියෙළ කරවා මලින් ගැවසීම් කළාහ. මහාප්‍රජාපතිය සියලු ආභරණයන්ගෙන් සැරසී කිරිමව්වරුන් විසින් පිරිවරණ ලදුව කරඬුව හිසෙහි තබා බුදුරදුන් ළඟට ගොස් **ඉදමෙම භන්තෙ නවං දුස්සයුගන්ති** යනාදිය කීය. **දුතියම්පි** බොහි ගෞතමිය සංඝයාට දෙවයි කී කල්හි ස්වාමීනි, මම රෙදි කොටුවෙන් භික්ෂූන් සීයකට ද දහසකට ද ලක්ෂයකට ද සිවුරු සඳහා රෙදි දෙන්නට පොහොසත් වෙමි. ස්වාමීනි, මෙය බුදුරදුන් උදෙසා ම මා විසින් වියන ලදී. මා විසින් කටින ලදි. ස්වාමීනි, එහෙයින් එය මා උදෙසා පිළිගනිත්වායි කීවාය. මෙසේ තුන්වරක් දක්වා ඉල්ලීය. බුදුරදුන් ද ප්‍රතික්ෂේප කළේය. කුමක් නිසා බුදුරදුන් තමන්ට දෙනු ලබන්න භික්ෂු සංඝයාට දෙන්න යැයි කීවේ ද? මව කෙරෙහි අනුකම්පාවෙනි, උන්වහන්සේට මෙබඳු සිතක් ඇති විය. මැයට මා අරබයා පූර්ව චේතනාව මුඤ්චනචේතනාව අපරචේතනාව යැයි චේතනා තුනක් ඉපදුනාහ. මැයට භික්ෂු සංඝයා කෙරෙහි ද එබඳු සිතක් උපදීවා. මෙසේ ඇයට චේතනා හය එක්ව බොහෝ කලක් හිතසුව පිණිස පවතින්නේ ය යනුයි. විතණ්ඩවාදීහු මෙසේ කීහ. සංඝයාට දීම මහත්ඵල වේ යැයි කියන්නෙහි ද? එසේ යැයි කියමි. සූත්‍රය ගෙනෙයි. ගෞතමිය සංඝයාට දෙව. තා විසින් සංඝයාට දුන් කළ මම ද පුදන ලද්දේ වන්නෙමියි. සූත්‍රයෙහි ද මේ තේරුමයි. මෙය එසේ නම් ආනන්ද, කුසගිනි වූවන්ට කැවුම් දෙවයි. හකුරු දෙවයි යනුවෙන් වචනයෙන් කුසගිනි වූවන්ට දෙන ලද්දක් මහත්ඵල වේද බුදුරදුන් තමාට දෙන ලද්ද දෙවයි කීය. රාජ රාජ මහාමාත්‍යයෝ ද තමාට ගෙනෙන පඬුරු ඇත්ගොව්වන් ආදීන්ට දෙවයි කීවත් ඔවුන් රජුන්ට වඩා මහත් වන්නාහු ද? එහෙයින් එසේ නොගනුව.

මේ ලෝකයෙහි හෝ පරලෝකයෙහි හෝ බුදුරදුන් හා සමාන ශ්‍රේෂ්ඨයෙක් නොවෙයි. යමෙක් ආහුනෙය්‍ය වේද ඔවුන් අතරෙන් අග්‍ර බවට ගියේය. පින් කැමැත්ත වූවන්ට මහත් ඵලයක් වෙයි.

වචනයෙන්වත් බුදුරදුන්ට වඩා උතුම් දක්ෂිණාර්හ කෙනෙක් නැත. මෙසේ චේතනා හය එකතුව බොහෝ කලක් හිතසුව පිණිස පවතිත්. කුමක් සඳහා තුන්වරක් බැහැර කොට සංඝයාට දෙවයි කීවේ ද? පශ්චිම ජනයාට සංඝයා කෙරෙහි ගෞරව ඇතිවීම පිණිසයි. මෙසේ කීය. මෙසේ ද සිතක් විය. මම සජීවි දීර්ඝ නොවෙමි. මාගේ ශාසනය සංඝයා කෙරෙහි පිහිටන්නේය. පශ්චිම ජනතාව සංඝයා කෙරෙහි ගෞරව උපදවා යි තුන් වරක් ප්‍රතික්ෂේප කොට සංඝයාට දෙවීය. මෙසේ ඇති කල්හි බුදුරදුන් තමාට දෙන ලද්ද සංඝයාට දෙවීය. සංඝයා දක්ෂිණාර්හය ය. පශ්චිම ජනතාව සංඝයා කෙරෙහි ගෞරව උපදවා සිව්පසය දිය යුතු යැයි සිතන්නේය. සංඝයා සිව්පසයෙන් ක්ලාන්ත නොවී බුද්ධ වචනය ඉගෙණ මහණකම කරන්නේය. මෙසේ මාගේ ශාසනය අවුරුදු පන්දහසක් පිහිටන්නේ ය.

**පතිගණ්හාතු භන්තෙ භගවාති** යන වචනයෙන් ද මෙය දත යුතුයි. බුදුරදුන්ට වඩා උතුම් දක්ෂිණාර්හ කෙනෙක් නැත. ආනන්ද තෙරුන්ට මහා ප්‍රජාපතිය කෙරෙහි ක්‍රෝධයක් හෝ වෛරයක් නැත. තෙරුන් වහන්සේ ඇයගේ දක්ෂිණාව මහත්ඵල වේවයි කැමති නැතිව නොවේ. තෙරුන් පණ්ඩිතය. බහුශ්‍රැතය. සේඛ පටිසම්භිදා පැමිණියේය. උන්වහන්සේ බුදුරදුන්ට දෙන ලද්දෙහි මහත්ඵල බව බලන්නේ ස්වාමීනි, බුදුරදුන් පිළිගනීවායි ගැනීම පිණිස ඉල්ලීය. නැවත විතණ්ඩවාදීහු කීහ. තා විසින් සංඝයාට දෙන ලද කල්හි ද මම ද පුදන ලද්දේ වන්නෙමි. කී හෙයින් බුදුරදුන් සංඝයාට ඇතුළත්ය. ඔහු කිව යුතුයි. සරණ කොපමණ ද ගුණ දූන පැහැදීම් කොපමණ දැයි දන්නේ තුනයයි කියත්. නැවත කිව යුතුයි. නුඹගේ පිළිගැනීමෙන් බුදුරදුන් සංඝ පර්යාපන්න බැවින් දෙකක් ම වෙත්. එසේ ඇති කල්හි මහණෙනි, සරණාගමන තුනෙන් පැවිද්ද ද උපසම්පදාව ද අනුදනිමියි මෙසේ අනුදක්නා ලද පැවිද්ද ද උපසම්පදාව ද නොපිහිටයි. එහෙයින් නුඹ පැවිද්දෙක් ද ගිහියෙක් ද නොවන්නෙහිය. බුදුරදුන් ගඳ කිළියේ වැඩ සිටින කල්හි භික්ෂූන් පොහොය ද පවාරණය ද සංඝ කර්ම ද කරත්. ඒවා බුදුරදුන් සංඝ පර්යාපන්න බැවින් කෝප්‍ය වන්නාහු නොවෙත්. එහෙයින් බුදුරදුන් සංඝ පර්යාපන්න යැයි නොකිය යුතුයි. ආපාදිකාති වඩන ලද්දාහු. නුඹගේ අත්පාවල අත්පා කිස සිදු නොවන කල්හි අත්පා වඩා පෝෂ්‍ය කළාහ යන තේරුමයි. පොසිකාති

දවසට දෙතුන්වර නාවා කවා පොවා බෝසතුන් පෝෂණය කළාය. **ථඤ්ඤං පායෙසීති** නන්ද කුමරු බෝසතුන්ට දවස් කිහිපයකින් බාලය. ඔහු ඉපදූන කළ මහා ප්‍රජාපතිය තමාගේ පුතා කිරි මව්වරුන්ට දී තමා බෝසතුන්ට කිරිමව් වී කටයුතු කරන්නේ තමාගේ කිරි පෙව්වාය. ඒ සඳහා තෙරුන් වහන්සේ මෙසේ කීය. මෙසේ මහා ප්‍රජාපතියගේ බොහෝ උපකාර බව කියා දූන් බුදුරදුන්ගේ බොහෝ උපකාර බව දක්වන්නේ **භගවාපි භන්තෙති** යනාදිය කීය. එහි **භගවන්තං භන්තෙ ආගම්මාති** බුදුරදුන් නිසාය. එකල්හි බුදුරදුන් උපකාර දෙකෙන් තා වැඩි එක අනුමෝදන් කරන්නේ **එවමෙතන්ති** යනාදිය කීය. එහි **යංහානන්ද පුග්ගලො පුග්ගලං ආගම්මාති** යම් ආචාර්ය පුද්ගලයො හෝ අන්තේවාසික පුද්ගලයා හෝ පැමිණ **ඉමස්සානන්ද පුග්ගලස්ස ඉමිනා පුග්ගලෙනාති** මේ ආචාර්ය පුද්ගලයාට මේ අන්තේවාසික පුද්ගලයා විසින් **නසුප්පතිකාරං වදාමීති** ප්‍රත්‍යුපකාරය ලෙහෙසි යැයි නොකියමි. වැඳීම් ආදියෙහි ගුරුවරයා දූක වැඳීම් කිරීම **අභිවාදන** නමි. යම් දිශාවක ගුරුවරයා වාසය කරයි ද ඉරියව් හෝ කරන්නේ එයට අභිමුඛව වැඳ යයි. වැඳ සිටියි. වැඳ සැතපෙයි. ගුරුවරයා දුරදීම දූක නැගිට පෙර ගමන් කිරීම **පච්චුපට්ඨානං** නමි. ගුරුවරයා දූක ඇඳිලි බැඳ හිසේ තබා ගුරුවරයා වඳියි. යම් දිශාවක ඔහු වාසය කරයි ද එයට අභිමුඛව එසේම වඳියි. යන්නේ ද සිටින්නේ ද හිඳින්නේ ද සැතපෙන්නේ ද ඇඳිලි බැඳ වැඳගෙනමය. මෙය **අඤ්ජලිකම්මං** නමි. සුදුසු කර්මයන්ගේ කිරීම **සාමීචිකම්මං** නමි. සිවුරු අතරෙන් සිවුරක් දෙන්නේ නම් ඒ සිවුරක් නොදී මා හැඟි සීයක් වටිනා එකක් ද පන්සීයක් වටිනා දහසක් වටිනා එකක් ම දෙන්නේමය. පිණ්ඩපාතාදියෙහි ද මේ ක්‍රමයයි. බොහෝ කීමෙන් කිම? ප්‍රණීත සිව්පසයෙන් සක්වළ අතර පුරවා මහමෙරින් කුළු ගන්වා දෙන්නේ ද ගුරුවරයාට සුදුසු ක්‍රියාවක් කරන්නට නොහැක්කේමය. **චුද්දස ඛො පනිමාති** කුමක් නිසා ඇරඹියේ ද? මේ සූත්‍රය පුද්ගලික දානය අරභයා නැංගේය. ආනන්ද තෙරුන් ද **පතිගණ්හාතු භන්තෙ භගවාති** පුද්ගලික දානය ම සමාදන් කරවයි. දහ හතර තැනෙක දෙන දානය පුද්ගලික දානය නම් වේ යැයි දක්වන්නට මේ දේශනාව ආරම්භ කළේය. **අයං පඨමාති** මේ දානය ගණන් වශයෙන් පළමුවෙනිය. වැඩිමහළු වශයෙන් ද එසේමය. මෙය පළමුවෙනිය. අග්‍රය. ජ්‍යෙෂ්ඨය. මේ දානයේ ප්‍රමාණයක් නම් නැත. දෙවන තුන්වන දානය ද උතුම් දාන වේ. සෙසු ඒවා උතුම් දාන බවට නොපැමිණෙත්. **බාහිරකෙ කාමෙසු වීතරාගෙති** කර්මවාදීන් ක්‍රියාවාදීන් කෙරෙහි ලෞකික පංචාභිඥාවන් කෙරෙහි **පුථුජ්ජනසීලවන්තෙති** පෘථග්ජන සීල ඇත්තේ නම් ගෝසීල ස්වභාව ඇත්තේ වෙයි. කෛරාටික නැත. මායා නැත. අනුන් නොපෙළා

දෑහැමෙන් සෙමෙන් සී සෑමෙන් හෝ වෙළඳාමින් හෝ ජීවිකාව කරන අයයි. පුථුජ්ජන දුස්සීලෙති පෘථග්ජන දුශ්ශීලයෝ නම් කෙවුල් මත්ස්‍යයන් බඳින ආදීහුය. අනුන්ට පීඩා කොට ජීවිකාව ගෙන යන අයයි. දූන් පුද්ගලික දානයේ විපාක දන්නාහුය. **තත්‍රානන්‍දාති** යනාදිය කීය. එහි **තිරච්ඡානගතෙති** යම් ගුණ වශයෙන් උපකාර වශයෙන් පෝෂණය පිණිස දෙන ලද මෙය නොගන්නා ලදි. යම් පිඩක් පිඬු භාගයක් දෙන ලද ද එය නොගන්නා ලදි. යම් හෙයකින් බලු ඌරු කවුඩු යනාදීන් අතුරෙන් යම්කිසි පැමිණි සතෙකුට අනුසස් කැමැත්තෙන් යම් පමණ දෙන ලදද මෙය සඳහා කියන ලදි. **තිරච්ඡානගතෙ දානං දත්වාති සතගුණාති** අනුසස් සීයකි. **පාටිකංඛිතබ්බාති** කැමතිවිය යුතුයි. මෙය කියන ලද්දේ වෙයි. මේ දානය ආයුෂ සීයක් ද වර්ණ සීයක් ද සැප සීයක් ද බල සීයක් ද නුවණ සීයක් දැයි පන්සීයක් ආනිසංස දෙයි. ආත්ම සීයක ආයුෂ දෙයි. වර්ණය බලය සැපය නුවණ දෙයි. මේ ක්‍රමයෙන් සියලු තැන්හි ම දත යුතුය. **සොතාපත්තිඵල සච්ඡිකිරියාය පටිපන්නෙති** මෙහි යට කෙළවරින් තිසරණ ගිය උපාසකයා ද සෝවාන් ඵලය සාක්ෂාත් කිරීම පිණිස පිළිපන්නේ වෙයි. ඔහුට දෙන ලද දානය ද සංඛ්‍යාවක් නැත. ප්‍රමාණයක් නැත. පන්සිල්හි පිහිටියා හට ද එයින් මත්තෙහි දස සිල්හි පිහිටියා හට ද එයින් මත්තෙහි එදවස පැවිදි වූ සාමණේරයා හට ද එයින් මත්තෙහි උපසම්පන්නයා හට ද එයින් මත්තෙහි උපසම්පන්න වත්සම්පූර්ණ කරන්නා හට ද එයින් මත්තෙහි උතුම් කෙළවරින් මාර්ග සමන්විත සෝවාන් ඵලය සාක්ෂාත් කිරීමට පිළිපන්නේ නම් වෙයි. මොහුට දුන් දානය එයින් මත්තෙහි මහත්ඵල වෙයි. කිමෙක් ද? මාර්ගයෙන් යුක්තයාට දන් දෙන්නට හැකි ද? එසේය. හැකිය. පටන් ගන්නා ලද විදර්ශනා ඇත්තේ පා සිවුරු ගෙන පිඬු පිණිස හැසිරෙයි. ඔහු ගෙහි දොරටුවෙහි සිටියාහුගේ අතින් පාත්‍රය ගෙන ආහාරපාන බහාලත්. එකෙණෙහි ම භික්ෂුවගේ මාර්ගයෙන් නැගිටීම වෙයි. මේ දානය මාර්ගයෙන් යුක්ත පුද්ගලයාට දෙන ලද නම් වෙයි. අනෙත් ක්‍රමයකින් මේ තෙමේ විහාරයෙහි හෝ ආසන ශාලාවෙහි හෝ සිටියේ වේ ද උපාසකයෝ පාත්‍රය ගෙන තමන්ගේ නිවසට ගොස් ආහාරපාන බහාලත්. ඒ මොහොතෙහි ඔහුගේ මාර්ගයෙන් නැගිටීම වෙයි. මේ දානය ද මාර්ගයෙන් යුක්ත වූවාට දුන්නේ වෙයි. එහි දෙනියෙහි ජලය මෙන් සෝවාන් ඵලය සාක්ෂාත් කිරීම පිණිස පිළිපදින්නා කෙරෙහි දෙන ලද දානයේ ආනිසංස අසංඛෙය්‍ය බව දත යුතුය. ඒ ඒ මහානදීන්හි ද මහමුහුදෙහි ද ජලය මෙන් සෝවාන් ආදීන් කෙරෙහි දෙන ලද දානය උතුම් වශයෙන් අසංඛෙය්‍ය බවෙන් දත යුතුය. පොළොවෙහි බල මාත්‍රයක් ප්‍රදේශයෙහි පස් ආදී කොට පොළොවේ යම් පමණ පස් ද එතෙක් අප්‍රමාණ බව ප්‍රකාශ කොට දැක්විය යුතුයි.

**සත්ත බො පනිමාති** කුමක් නිසා ආරම්භ කළේ ද? ගෞතමීය සංඝයාට දෙව තා විසින් සංඝයාට දුන් කල්හි මම ද සංඝයා ද පුදන ලද්දේ වෙයි. පුදන ලද්දේ වෙමියි කියන ලදි. එහි ස්ථාන හතක දෙන ලද දානය සංඝයාට දෙන ලද්දේ නම් වෙයි. දක්වන්නට මේ දේශනාව පටන් ගත්තේය. එහි **බුද්ධපමුඛෙ උභතො සංඝෙති** එක් පැත්තකින් භික්ෂු සංඝයා ද එක් පැත්තකින් භික්ෂුණී සංඝයා ද බුදුරදුන් මැද ද වැඩ සිටියේ වෙයි ද මේ බුද්ධ ප්‍රමුඛ උභතෝ සංඝ නමි. **අයං පඨමාති** මේ දානයට ප්‍රමාණයෙන් සම වන දානයක් නම් නැත. දෙවන දානාදිය මෙයට වඩා උතුම් බවට නොපැමිණෙත්. කිමෙක් ද? බුදුරදුන් පිරිනිවි කල්හි බුද්ධ ප්‍රමුඛ උභතෝ සංඝයාට දන් දෙන්නට හැකි ද? හැකිය. කෙසේ ද? උභතෝ සංඝයා ඉදිරියෙහි ධාතු සහිත ප්‍රතිමාවක් ආසනයෙහි තබා දක්ෂිණෝදය මුල්කොට සියල්ල පළමුව බුදුරදුන්ට පූජා කොට උභතෝ සංඝයාට දිය යුතුයි. මෙසේ බුද්ධ ප්‍රමුඛ උභතෝ සංඝයාට දානය දෙන ලද්දේ නම් වෙයි. එහි යමක් බුදුරදුන්ට දුන්නේ ද එයට කුමක් කළ යුතු ද? යමෙක් වතින් සම්පූර්ණව බුදුරදුන්ට පිළිදගුම් කරයි ද ඒ භික්ෂුවට දිය යුතුයි. පියා සන්තක දේ පුතා වෙත පැමිණෙයි. භික්ෂු සංඝයාට දෙන්නට ද වටියි. ගිතෙල් තෙල් ගෙන පහන් දැල්විය යුතුයි. වස්ත්‍ර ගෙන කොඩි නැංවිය යුතුයි.

**භික්ඛුසංඝෙති** පිරිසිඳීමක් නැති මහා භික්ෂු සංඝයා **භික්ඛුණීසංඝෙපි** මේ ක්‍රමයමයි. **ගොත්‍රභුනොති** ගෝත්‍රය පමණක්ම අනුභව කරන නාම මාත්‍ර ඇති ශ්‍රමණයෝය යන තේරුමයි. **කාසාව කණ්ඨාති** කාසාව කණ්ඨක යන නම් ඇත්තෝය. ඔවුහු එක් කහරෙදි කඩක් අතේ හෝ බෙල්ලේ බැඳ හැසිරෙත්. ඔවුන්ගේ ගෙදර අඹු දරුවෝ සීසෑම් වෙළඳ කටයුතු ප්‍රකෘතියෙන් ම කරත්. **තෙසුදුස්සීලෙසු සංඝං උද්දිස්ස දානං දස්සන්තීති** මෙහි දුශ්ශීල සංඝයා යැයි නොකියන ලදි. සංඝයා අතර දුශ්ශීලයෝ නැත. දුශ්ශීලයෝ නම් උපාසකයෝය. ඒ දුශ්ශීලයන්ට භික්ෂු සංඝයා උදෙසා දෙමු යැයි දන් දෙත් ද මෙසේ බුදුරදුන් බුද්ධ ප්‍රමුඛ භික්ෂුසංඝයාට දෙන ලද දානයෙහි ද මෙහි ද ආනිසංස සංඛ්‍යාවෙන් අසංඛ්‍ය යැයි කියන ලදි. කාසාව කණ්ඨක සංඝයාට දෙන ලද දානයෙහි ද ආනිසංස සංඛ්‍යාවෙන් අසංඛ්‍ය යැයි කියන ලදි. සංඝගත දක්ෂිණාව නම් සංඝයා වෙත ගෞරව කිරීමට හැකි අයටම වෙයි. සංඝයාට ගෞරව කිරීම දුෂ්කරය. යමෙක් සංඝගත දක්ෂිණාවක් දෙන්නෙමියි දෙය්‍යධර්මය පිළියෙළ කොට විහාරයට ගොස් ස්වාමීනි සංඝයා උදෙසා එක් තෙරුන් කෙනෙක් දෙවයි යැයි වෙනසකට පැමිණේ ද ඔහුගේ දක්ෂිණාව සංඝගත නොවෙයි. මහතෙර නමක් ලැබ

මා විසින් මහතෙර නමක් ලද්දේ යැයි සතුට උපදවන්නා හට ද නොවේමය. යමෙක් සාමණේරයෙක් හෝ උපසම්පන්නයෙක් හෝ දහරයෙක් හෝ පණ්ඩිතයෙක් හෝ යම් කිසිවෙක් සංඝයාගෙන් ලැබ විමතියක් නොවේ නම් සංඝයාට දෙමියි සංඝයා කෙරෙහි ගරු කරන්නට හැක්කේ ද ඔහුගේ දක්ෂිණාව සංඝගත වෙයි.

මුහුදෙන් එතෙර වාසීහු මෙසේ කරත්. එක් වෙහෙර හිමි කෙළෙඹියෙක් දානයක් දෙන්නෙමියි සංඝයා උදෙසා එක් භික්ෂුවක් දෙව් යැයි ඉල්ලීය. ඔහු එක් දුශ්ශීල භික්ෂුවක් ලැබ හිඳින ස්ථානය පිරිසිදු කොට ආසනයක් පණවා උඩුවියන් බඳවා සුවඳ මලින් පුදා පා දෙවා තෙල් ගා බුදුරදුන්ට ආදරය කරන්නාක් මෙන් සංඝයා කෙරෙහි ආදරයෙන් දෙය්‍යධර්මය දුන්නේය. ඒ භික්ෂුව බතින් පසු විහාරය පිළිදගුම් කිරීමට උදැල්ලක් දෙවයි ගෙදරට පැමිණියේය. උපාසකයා හුන්නේ ම උදැල්ල පයින් දමා ගණුවයි දුන්නේය. ඔහුට මිනිස්සු මෙසේ කීහ. නුඹ විසින් උදේ ඔහුට කරන ලද සත්කාර කියන්නට නොහැක. දැන් උපචාර මාත්‍රයක් වත් නැත. මෙයට හේතුව කුමක් ද? උපාසක තෙමේ ඒ සත්කාර සංඝයාටය. මොහුට නොවේ යැයි කීය. කාසාවකණ්ඨකයාට දෙන ලද දානය කවරෙක් පිරිසිදු කෙරේ ද? සැරියුත් මුගලන් ආදී අසූමහා තෙරවරු පිරිසිදු කරත්. තව ද? තෙරවරු පිරිනිවි බොහෝ කල් ගියහ. තෙරවරුන් ආදී කොට අද දක්වා වැඩ සිටින භික්ෂූන් රහතුන් වෙනුවෙන් පිරිසිදු කරත්.

**න ත්වෙවාහං ආනන්ද කෙනචි පරියායෙන සංඝගතාය දක්ඛිණායාති** මෙහි බුද්ධ ප්‍රමුඛ සංඝයා ඇත. දැන් සංඝයා ඇත. අනාගතයෙහි කාසාව කණ්ඨක සංඝයා ඇත. බුද්ධ ප්‍රමුඛ සංඝයා දැන් සංඝයා හා උපමා නොකට යුතුයි. දැන් සංඝයා අනාගතයෙහි කාසාව කණ්ඨක සංඝයා හා උපමා නොකට යුතුයි. එයින් ඒ කාලය හි කිව යුතුයි. සංඝයාගෙන් උදෙසා ගත් පෘථග්ජන ශ්‍රමණයා කෙරෙහි දුන් දෙය ද මහත් ඵලය උදෙසා ගන්නා ලද සෝවාන් පුද්ගලික සකෘදාගාමී ආදීන් කෙරෙහි ද මේ ක්‍රමයයි. සංඝයා කෙරෙහි ගෞරව කරන්නට හැකි අයට රහතන් වහන්සේට දෙන ලද දානයෙන් ද උදෙසා ගත් දුශ්ශීලයාට දුන් දෙයින් ද විශේෂ විපාක ඇතිවෙයි. යමක් වනාහි කියන ලද ද මහරජ සිල්වතාට දෙන ලද දෙය මහත් ඵලය. දුශ්ශීලයාට එසේ නැත. ඒ මේ ක්‍රමය හැර **චතස්සො ඛො ඉමා ආනන්ද දක්ඛිණාවිසුද්ධියොති** මේ චතුෂ්කය දත යුතුයි. **දායකතො විසුජ්ඣතීති** මහත්ඵල භාවයෙන් පිරිසිදු වෙයි. මහත් විපාක වේ යන තේරුමයි. **කල්‍යාණ ධම්මොති** පිරිසිදු ස්වභාවයයි. **පාප ධම්මොති** ලාමක

ධර්මයයි. දායකතො විසුජ්ඣතීති මෙහි වෙස්සන්තර මහ රජු කිව යුතුයි. ඔහු ජූජක බමුණාට දරුවන් දී පොළොව කම්පා කරවීය. පටිග්ගාහකතො විසුජ්ඣතීති මෙහි කැළණි නදී මුවදොර වාසී කෙවුළා කිව යුතුයි. ඔහු දීඝසුම්ම තෙරුන්ට තුන් වරක් පිණ්ඩපාතය දී මරණ ඇඳෙහි හොත්තේ දීඝසුම්ම තෙරුන්ට දුන් පිණ්ඩපාතය මා උද්ධරාවායි කීය. නෙව දායකතොති මෙහි වඩ්ඪමාන වාසී වැද්දා කිව යුතුය. ඔහු ප්‍රේතයන්ට දක්ෂිණාව දෙන්නේ එක් දුශ්ශීලයෙකුට තුන් වරක් දුන්නේය. තුන්වන වාරයෙහි අමනුෂ්‍යයා දුශ්ශීලයෙක් මා පැහැර ගනී යැයි හැඬීය. එක් සිල්වත් භික්ෂුවකට දී පින් පැමිණ වූ කළ ලැබුණේය. දායකතො චෙව විසුජ්ඣතීති මෙහි අසදෘශ දානය කිව යුතුයි. සා දක්ඛිණා දායකතො විසුජ්ඣතීති මෙහි යම්සේ දක්ෂ ගොවියෙක් නිසරු කුඹුරක් ලැබ කාලයෙහි සී සා පස් ඉවත් කොට සාරවත් ඇට පිහිටුවා දිවා රාත්‍රී රැකවල් කොට අනෙත් සරු කුඹුරකට වඩා ධාන්‍ය ලබයි. එසේම සිල් ඇති පුද්ගලයා දුශ්ශීලයාට දී ද මහත් විපාකයට පැමිණෙයි. මේ ක්‍රමයෙන් සියලු පදයන්හි සුද්ධිඅසුද්ධි බව දත යුතුයි. වීතරාගො වීතරාගෙසූති මෙහි වීතරාගියා නම් අනාගාමියා ය. රහතන් වහන්සේ ඒකාන්තයෙන් විතරාගීමය. එහෙයින් රහත්හු විසින් රහතුන්ට දෙන දානය ම උතුම්ය. කුමක්නිසා ද? භවයාගේ ඇලීමක් හෝ භවයාගේ පැතීමක් නොමැති හෙයිනි. රහතන් වහන්සේ දාන ඵලය අදහන්නේ නොවේ ද? දාන ඵලය අදහන්නෝ රහතන් වහන්සේ හා සමාන වෙත්. රහතන් වහන්සේ විසින් කරන ලද කර්මය නිච්ඡන්දරාග බැවින් කුසල් හෝ අකුසල් හෝ නොවෙයි. ක්‍රියා ස්ථානයේ සිටියි. එහෙයින් උන්වහන්සේගේ දානය උතුම් වේ යැයි කියත්. කිමෙක් ද? බුදුරදුන් විසින් සැරියුත් තෙරුන්ට දුන් දෙය මහත් ඵල ද නොහොත් සැරියුත් තෙරුන් විසින් බුදුරදුන්ට දුන් දෙය මහත් ඵල ද? බුදුරදුන් විසින් සැරියුත් තෙරුන්ට දුන් දෙය මහත් ඵල වේ යැයි කියත්. කුමක් හෙයින් ද? බුදුරදුන් හැර දානයෙහි විපාක දැනීමට සමත් අනෙකෙක් නම් නැත. දානය සම්පත් හතරෙන් දීමට හැකි තැනැත්තාට ඒ ආත්ම භාවයෙදීම විපාකය දෙයි. එහි මේ සම්පදාවන්ය. දෙය්‍යධර්මයාගේ දැහැමෙන් සෙමෙන් අනුන් නොපෙළා උපන් බවය. පූර්ව චේතනාදී වශයෙන් චේතනාවන්හි මහත් බවය. ක්ෂීණාශ්‍රව වශයෙන් ගුණ වැඩි බවය. එදවස නිරෝධ සමාපත්තියෙන් නැගිටි බැවින් යුතු බවය.

**දක්ඛිණවිභංග සූත්‍ර වර්ණනාව නිමි.**

**හතරවැනි විභංග වර්ගය සමාප්තයි.**

# 5.4.1

එවමෙමෙසුතනති මාවිසින් අනාථපිණ්ඩිකොවාද සූත්‍රය මෙසේ අසන ලදි. එහි **බාළ්හගිලානොති** ඉතා ගිලන් වූ මරණ සෙය්‍යාවට පැමිණි. **ආමනෙතසීති** ගෘහපතියාගේ පාද යම්තාක් දවසක් කර්මණ්‍යව පැවතියේ ද, ඒතාක් දිනපතා වරක් හෝ දෙවරක් හෝ තුන්වරක් හෝ බුද්ධෝපස්ථානය නොකඩවා කළේය. ඔහු යම්පමණ බුදුරදුන්ට උපකාර වීද ඒතාක් ම මහතෙරවරුන්ට ද උපකාර විය. ඔහු අද ගමන සිඳුණු හෙයින් නොනැගිටින සයනයට පැමිණියේය. හසුනක් යවනු කැමැත්තේ එක්තරා පුරුෂයෙකු ඇමතීය. **තෙනුපසඞකමීති** බුදුරදුන් විචාරා හිරු බසින වේලාවෙහි පැමිණියේය. **පටික්කමනතීති** පසු බසිත්. **අභික්කමනතීති** අතිශයින් වර්ධනය වෙත්. බලවත් වෙත්. **අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමොති** යම්කලෙක මරණාසන්තික වේදනාව උපදියි ද සුළං මතුයෙහි දල්වන ගින්නක් මෙන් වෙයි. යම්තාක් උණුසුම නොගන්නේ ද ඒතාක් මහත් උපක්‍රමයෙන් සංසිඳුවන්නට නොහැක. උණුසුම හාත්පසින් ගත් කළ සංසිඳෙයි. එකල සැරියුත් තෙරුන් සිතීය. මහසිටුතුමාගේ මේ වේදනාව මාරාන්තිකය. සංසිඳුවන්නට නොහැක. සෙසු කථා වැඩක් නැත. ඔහුට ධර්ම කථාවක් කියන්නෙමි. එකල එය කියන්නේ **තස්මාතිහාති** යනාදිය කීය.

මෙහි **තස්මාති** යම්හෙයකින් ඇස තුන් ගැනීමෙන් ගන්නේ ඉපදුණු මාරාන්තික වේදනාව හරින්නට සමතෙක් නම් නැත. එහෙයින් **න චක්ඛුං උපාදියිස්සාමීති** ඇස තෘෂ්ණාදීන් ගැනීමෙන් නොගන්නෙමි. **න ච මෙ චක්ඛුනිස්සිතනති** මාගේ විඥානය ද චක්ෂුර් නිශ්‍රිත නො වන්නේ ය. **න රූපනති** යට ආයතන රූපය කියන ලදි. මේ ස්ථානයෙහි සියලු ම කාමභව රූප කියන්නේ මෙය කීය. **න ඉධ ලොකනති** වසන තැනක් හෝ කෑම ඇඳීම හෝ තෘෂ්ණාවෙන් හඳුනාගතිම් යන තේරුමයි. මෙය ප්‍රත්‍යයන්හි නොතැවීම පිණිස කියන ලදි. **න පරලොකනති** මෙහි මිනිස්ලොව හැර සෙසු ඒවා පරලෝක නම්. මොහු අසවල් දෙව්ලොව ඉපදී අසවල් තැන වසන්නෙමි. මේ නමයි. කන්නෙමි අනුභව කරන්නෙමි හිඳින්නෙමි පොරවන්නෙමි මෙබඳු නැවීම හැරීම පිණිස කියන ලදි. එය ද නො උපදවන්නෙමි. **න ච මෙ තං නිස්සිතං විඤ්ඤාණං භවිස්සතීති** මෙසේ තෘෂ්ණා ගැනීම්වලින් මුදා තෙරුන්ගේ දේශනාව රහත්බව කුළුගැන්වීමෙන් ම නිම වූයේය. **ඔලියසීති** තමන්ගේ සම්පත් දක අරමුණුවල බැඳෙන්නෙහි ය. මෙසේ ආයුෂ්මත් ආනන්ද තෙරුන් මේ නම් ඇති ගෘහපතියා මෙසේ

ශ්‍රද්ධා ඇත්තේ ය. පැහැදුණේය. මරණ බියට බියවෙයි. වෙනත් කවරෙක් බිය නොවෙයි ද? සිතන්නේ ඔහුට දැඩිකොට අවවාද දෙන්නේ මෙසේ කීය. **න ච මෙ එවරූපි ධම්මි කථා සුතපුබ්බාති** මේ උපාසක තෙමේ බුදුරදුන් වෙතින් ද මෙබඳු බණ කථාවක් නොඅසන ලද විරූයැයි කියයි. කිමෙක් ද? බුදුරදුන් මෙබඳු සියුම් ගැඹුරු කථාවක් නොකියයි ද? නොකියන්නේ නොවෙයි. මෙසේ අධ්‍යාත්මික ආයතන හය ද බාහිර හය ද විඥාන කයෙහි හය ද ස්පර්ශ කයෙහි හය ද වේදනා කයෙහි හය ද ධාතු හය ද අරූප හතර ද මෙලොව ද පරලොව ද පෙන්වා දිට්ඨ සුත මුත විඥාන වශයෙන් රහත්බවෙහි බහා කියන ලද කථාවක් මොහු විසින් පෙර නොඅසන ලදි. එහෙයින් මෙසේ කියයි. එසේවුවත් උපාසක තෙමේ දීමෙහි ඇලුණේය. බුදුරදුන් වෙත යන්නේ ද හිස් අතින් නොවේ. පෙරබත් කාලයෙහි යන්නේ කැඳ කැවිලි ආදිය ගෙන්වාගෙන යයි. පසුබත් කාලයෙහි යන්නේ නම් ගිතෙල් මී පැණි ආදිය ද ඒවා නැතිකල්හි වැලි ගෙන්වාගෙන ගඳ කිළියෙහි විසුරුවයි. මේ උපාසක තෙමේ බෝසත් ගති ඇත්තෙකි. එහෙයින් බුදුරදුන් අවුරුදු විසිහතරක් උපාසකයාට බොහෝසෙයින් දාන කථාවන් ම කීය. උපාසකයා මේ දානය නම් බෝසත්වරු ගිය මාර්ගයයි. මා ගිය මාර්ගයයි. මාවිසින් කල්ප ලක්ෂයක් අධික කොට ඇති සාරාසංඛෙය්‍යයක් දන් දෙන ලදි. නුඹ මා ගිය මාර්ගය ම අනුව යන්නෙහි ය. ධර්මසේනාපති ආදී මහා ශ්‍රාවකයන් ද තමාගේ සමීපයට පැමිණි කළ ඔහුට දාන කථාව ම කියත්. එහෙයින් කීය. **න ඛො ගහපති ගිහීනං ඔදාතවසනානං එවරූපි ධම්මි කථා පටිභාතීති** මෙය කියන ලද්දේ වෙයි. ගෘහපතිය ගිහියන් නම් කෙත්වතු රන්රිදී දැසිදැස්සන් අඹුදරුවන් ආදියෙහි ආශාව තියුණුය. ආලය තියුණුය. මෙහි ආලය නොකටයුතුයි. **යෙන භගවා තෙනුපසංකමීති** කුමක් හෙයින් පැමිණියේ ද? ඔහු තුසිත භවනෙහි උපන් මොහොතෙහි ම තුන්ගව් පමණ රත්තරන් කඳක් මෙන් බබළන ආත්මය ද උයන් විමන් ආදී සම්පත් ද දැක මාගේ මේ සම්පත් මහත්ය. මාවිසින් මනුෂ්‍ය ලෝකයේ දී කිනම් කර්මයක් කරන ලද්දේ දැයි බලන්නේ තුනුරුවන්හි ගෞරවය දැක සිතීය. දේවදත්තයා ප්‍රමාද වූයේ මෙහි ය. මාගේ මේ සැපත කෙරෙහි සතුටු වන්නාට සිහිමුළා වන්නේය. මම ඒකාන්තයෙන් ගොස් මගේ ජේතවනයට ද සංඝයාගේ ද බුදුරදුන්ගේ ද ආර්ය මාර්ගයේ ද සැරියුත් තෙරුන්ගේ ද ගුණ කියා නැවත අවුත් සැප අනුභව කරමියි ඔහු එසේම කළේය. එය දක්වන්නට **අථ ඛො අනාථපිණ්ඩිකොති** යනාදිය කියන ලදි. එහි **ඉසිසංඝසෙවිතනති** භික්ෂුසංඝයා විසින් සෙවුනා ලද. මෙසේ පළමු ගාථාවෙන් ජේතවනයේ ගුණ කියා දූන් ආර්ය මාර්ගයේ ගුණ කියන්නේ **කම්මං විජ්ජාදාති** යනාදිය

කීය. එහි **කම්මන්ති** මාර්ග චේතනාවයි. **විජ්ජාති** මාර්ග ප්‍රඥාවයි. **ධම්මොති** සමාධි පාක්ෂික ධර්මයයි. **සීලං ජීවිත මුත්තමන්ති** සීලයෙහි පිහිටියහුගේ ජීවිතය උතුම් යැයි දක්වයි. නොහොත් **විජ්ජාති** දෘෂ්ටි සංකප්පයයි. **ධම්මොති** වායාම සති සමාධි සංකප්පයන්ය. **සීලන්ති** වාචා කම්මන්ත ආජීව සංකප්පයන්ය. **ජීවිතමුත්තමන්ති** මේ සීලයෙහි පිහිටියහුගේ ජීවිතය නම් උතුම් ය. **එතෙන මච්චා සුජ්ඣන්තීති** මේ අෂ්ටාංගික මාර්ගයෙන් සත්වයෝ පිරිසිදු වෙත්. **තස්මාති** යම් මාර්ගයකින් පිරිසිදු වෙත් ද ගෝත්‍රවලින් ධනයෙන් නොවේ. එහෙයින් **යොනිසො විචිනෙ ධම්මන්ති** උපායෙන් සමාධි පාක්ෂික ධර්ම සොයන්නේ ය. **එවං තත්ථ විසුජ්ඣතීති** මෙසේ ඒ ආර්ය මාර්ගයෙහි පිරිසිදු වෙයි. නොහොත් **යොනිසො විචිනෙ ධම්මන්ති** උපායෙන් පංචස්කන්ධ ධර්ම සොයන්නේ ය. **එවං තත්ථ විසුජ්ඣතීති** මෙසේ ඒ සත්‍යයන් හතරෙහි පිරිසිදු වෙයි. දැන් සැරියුත් තෙරුන්ගේ ගුණ කියන්නේ **සාරිපුත්තො වාති** යනාදිය කීය. එහි සාරිපුත්තො වාති අවධාරණ වචනයයි. මේ ප්‍රඥාදීන්ගෙන් සැරියුත් තෙරුන් ම උතුම් යැයි කියයි. **උපසමෙනාති** කෙලෙස් සංසිඳවීමෙන්. **පාරගතොති** නිවනට ගියේය. යම්කිසි භික්ෂුවක් නිවනට පැමිණියේ ද ඒ භික්ෂුව **එතාව පරමො** සියා තෙරුන් හා උතුම් අයෙක් නැතැයි කියයි. ඉතිරිය සියලු තැන්හි ම ප්‍රකටය.

අනාථපිණ්ඩිකොවාද සූත්‍ර වර්ණනාව නිමි.

## 5.4.2

**එවමෙමෙසුතන්ති** මා විසින් ඡන්නෝවාද සූත්‍රය මෙසේ අසන ලදී. එහි **ඡන්නොති** මෙබඳු නමක් ඇති තෙරුන්ය. අභිනිෂ්ක්‍රමණයේ දී නික්මුණු තෙරුන් නොවේ. **පටිසල්ලානාති** ඵලසමවතින්. **ගිලානපුච්ඡකාති** ගිලානෝපස්ථානය නම් බුදුරදුන් විසින් ප්‍රශස්තය. වර්ණිතය. එහෙයින් මෙසේ කීය. **සත්ථන්ති** ජීවිතය තොර කරන ආයුධයි. **නාවකඞ්ඛාමීති** නොකැමැත්තෙමි. **අනුපවජ්ජන්ති** ඉපදීමක් නැති. ප්‍රතිසන්ධියක් නැති. **එතං මමන්ති** ආදිය තෘෂ්ණා දෘෂ්ටි මාන ගැනීම් වශයෙන් කියන ලදී. **නිරොධං දිස්වාති** ක්ෂයවන බව වැයවන බව දැන. **නෙතං මම නෙසො හමස්මි න මෙසො අත්තාති සමනුපස්සාමීති** අනිත්‍ය දුක්ඛ අනාත්ම යැයි

බලන්නෙමි. **තසමාති** යම්හෙයකින් මාරාන්තික වේදනාව ඉවසීමට නොහැක්කේ ආයුධයක් ගෙණවයි කියයි. එහෙයින් පෘථග්ජන ආයුෂ්මතුන් වහන්සේ එයින් මෙය ද සිහි කරවයි දක්වයි. **නිච්චකප්පනති** නිතර ම. **නිස්සිතස්සාති** තෘෂ්ණා දෘෂ්ටියෙන් යුක්ත වූ. **චලිතනති** කම්පා වෙයි. **පස්සද්ධිති** කායචිත්ත පස්සද්ධිය ක්ලේශ පස්සද්ධිය වේ යැයි යන තේරුමයි. **නතීති** තෘෂ්ණාවයි. **නතියා අසතීති** භවය පිණිස ආශාවේ නැගිටීම නැත.

**ආගති ගති නහොතීති** පිළිසිඳීම් වශයෙන් ආගති නම් වෙයි. චුතවීම් වශයෙන් ගමන නම් නොවෙයි. **චුතූපපාතොති** වචන වශයෙන් චුතියයි. ඉපදීම් වශයෙන් උපපාතයයි. **නෙවිධ න හුරං න උභයමන්තරෙනාති** මෙලොව නොවෙයි. පරලොව නොවෙයි. දෙලොවෙහි ම නොවෙයි. **එසෙවන්තො දුක්ඛස්සාති** වට්ටදුක්ඛයාගේ හා ක්ලේශදුක්ඛයාගේ මේ අන්තයයි. මේ පිරිසිඳීමයි. පරිවටුමබව වේවයි මෙයම මෙහි තේරුමයි. දෙකක් අතර යන වචන ගෙන අතර භවයක් කැමැති වෙත්. ඔවුන්ගේ මේවාට පිළිතුරු යට කියන ලදි. **සත්ථං ආහරෙසීති** ජීවිතය තොර කරන ආයුධයක් ගෙනාවේය. ගෙළ නාලය සින්දේය. එකළ ඔහුට මරණ භය වූයේය. ගති නිමිත්ත එළඹියේය. ඔහු තමාගේ පුහුදුන් බව දැක සංවේගයට පැමිණුනේ විදර්ශනා උපදවා සංස්කාරයන් විමර්ශනය කරමින් රහත්බවට පැමිණ සමසීසව පිරිනිවීය. **සම්මුඛායෙව අනුපවජ්ජතා ව්‍යාකතාති** ඉදින් තෙරුන්ගේ පුහුදුන් කාලයෙහි ප්‍රකාශයක් වෙයි. මේ ප්‍රකාශයෙන් ඔහුගේ අන්තර පිරිනිවීම විය. එහෙයින් බුදුරදුන් ඒ ප්‍රකාශය ගෙන කීය. **උපවජ්ජකුලානීති** එළඹිය යුතු කුලයෝය. මෙයින් තෙරුන් වහන්සේ ස්වාමීනි, මෙසේ උපස්ථායකයන් ද උපස්ථායිකාවන් ද ඇති කළ ඒ භික්ෂුව නුඹගේ සසුනෙහි පිරිනිවන් පාන්නේදැයි ඇසීය. එකල බුදුරදුන් ඔහුට කුලයන්හි සංසර්ගබව දක්වන්නේ **හොනති හෙතෙ සාරිපුත්තාති** යනාදිය කීය. මේ ස්ථානයෙහි තෙරුන්ගේ කුලයන්හි නොඇලෙන බව ප්‍රකට විය. ඉතිරිය සියලු තැන්හිම ප්‍රකටය.

ජන්නෝවාද සූත්‍ර වර්ණනාව නිමි.

# 5.4.3

**එවමෙමසුතනති** මා විසින් පුණ්ණෝවාද සූත්‍රය මෙසේ අසන ලදි. එහි **පටිසල්ලානාති** හුදකලා බවෙන් **තඤ්චති** ඒ ඇස ද රූපය ද. **නන්දිසමුදයා දුක්ඛසමුදයොති** නන්දිරාග සහගත තෘෂ්ණාව හා එක්වීමෙන් පංචස්කන්ධ දුකෙහි එක්වීම වෙයි. මෙසේ ද්වාර හයෙහි දුක්ඛ සමුදය යැයි සත්‍ය දෙකක් වශයෙන් සසර මස්තකප්‍රාප්ත කොට දැක්වීය. දෙවන න්‍යායෙහි නිරෝධ මාර්ගය යැයි සත්‍ය දෙකක් වශයෙන් විවට්ටය මස්තකප්‍රාප්ත කොට වෙනම දැක්වීය. **ඉමිනා ච ත්වං පුණ්ණාති** වෙනම ගැළපීමයි. මෙසේ ඒතාක් දේශනාව වට්ටවිවට්ට වශයෙන් රහත්බවෙහි බහා දූන් පුණ්ණ තෙරුන් හත් තැනක සිංහනාදය නාද කරවන්ට **ඉමිනා ච ත්වනති** යනාදිය කීය. **චණ්ඩාති** දුෂ්ටය. **ඵරුසාති** කර්කශය. **අක්කොසිස්සන්තීති** දශ ආක්‍රෝශ වස්තූන්ගෙන් ආක්‍රෝශ කරන්නාහ. **පරිභාසිස්සන්තීති** කිමෙක් ද? නුඹ ශ්‍රමණ නම් වෙහි ද? නුඹට මෙය කරන්නෙමියි තර්ජනය කරන්නාහ. **එවමෙත්ථාති** මෙහි මට මෙසේ වන්නේය. **දණ්ඩෙනාති** හතර රියන් දණ්ඩෙන් හෝ මුගුරෙන් හෝ **සත්ථෙනාති** එක පැත්තක මුවහත ඇති ආදියෙන්. **සත්ථහාරකං පරියෙසන්තීති** ජීවිතය තොර කරන ආයුධ සොයත්. මේ තෙරුන් තුන්වන පාරාජිකා වස්තුවෙහි අසුභ කථාව අසා ආත්මභාවය පිළිකුල් කරන අයට ආයුධ ගෙනඒම සෙවීම සඳහා කීය. **දමුපසමෙනාති** මෙහි දමොති යනු ඉන්ද්‍රිය සංවරාදීන්ට මේ නමකි.

**සච්චෙන දන්තො දමසා උපෙතො වෙදන්තගූ වුසිත බ්‍රහ්මචරියොති** මෙහි ඉන්ද්‍රිය සංවරය දමොති යැයි කියන ලදි.

**යදි සච්චා දමා චාගා ඛන්ත්‍යාභියො‍යා න විජ්ජතීති** මෙහි ප්‍රඥාව දමොති යැයි කියන ලදි. **දානෙන දමෙන සංයමෙන සච්චවචනෙනාති** මෙහි උපෝසථ කර්මය දමොති යැයි දත යුතුයි. **උපසමොති** එයට ම පර්යාය වචනයයි. **අථඛො ආයස්මා පුණ්ණොති** මේ පුණ්ණ තෙමේ කවරෙක් ද? කුමක් හෙයින් එහි යාමට කැමැති වී ද? මොහු සූනාපරන්ත වැසියෙකි. සැවැත් නුවර සැප නොවන විහරණ සළකා එහි යාමට කැමැති විය. එහි මේ පිළිවෙළ කථාවයි.

සූනාපරන්ත රටෙහි එක් වෙළඳ ගමක මේ සහෝදරයන් දෙදෙනා වූහ. ඔවුන්ගෙන් වැඩිමහළා කිසිකලෙක කරත්ත පන්සියයක් ගෙන ජනපදයට ගොස් බඩු ගෙනෙයි. සමහර කලෙක බාලයා ද බඩු ගෙනෙයි.

මේ කාලයෙහි බාලයා ගෙදර තබා වැඩිමහළු සහෝදරයා ගැල් පන්සියය ගෙන ජනපද චාරිකාවෙහි හැසිරෙන්නේ පිළිවෙළින් සැවැත් නුවරට පැමිණ දෙව්රමට නුදුරෙහි ගැල් නවත්වා අනුභව කරන ලද උදෑසන බත්කිස ඇත්තේ පිරිවර ජනයා පිරිවරණ ලද්දේ පහසු තැනක සිටියේය.

එකල්හි සැවැත් නුවර වැසියෝ අනුභව කරන ලද උදෑසන බත් කිස ඇත්තේ අදිටන් කරන ලද උපෝසථය ඇත්තේ සුදු උතුරුසළු ඇත්තේ සුවඳමල් ගත් අත් ඇත්තේ බුදුරදුන් යම් තැනක ද ධර්මය යම්තැනක ද සංඝයා යම්තැනක ද එයට නැමුණේ දකුණු දොරටුවෙන් නික්මී දෙව්රමට යත්. ඔහු ඔවුන් දැක මොවුන් කොහි යන්නේ දැයි එක් මිනිහෙකුගෙන් ඇසීය. කිමෙක් ද? ආර්යෙනි. ලෝකයෙහි බුද්ධ ධම්ම සංඝ රත්නයන් උපන් බව නුඹ නොදන්නෙහි ද? මෙසේ මේ මහජනයා බුදුරදුන් සමීපයෙහි බණ කථාවක් අසන්නට යන්නේය. බුද්ධ යන වචනය ඔහුගේ සම් ආදිය සිඳ ඇටමිදුළු දක්වා පැතිරගෙන සිටියේය. එකල තමාගේ පිරිස විසින් පිරිවරණ ලද්දේ ඒ පිරිස සමඟ විහාරයට ගොස් මිහිරි හඬින් ධර්මය දේශනා කරන බුදුරදුන්ගේ පිරිස කෙළවර සිටියේ ධර්මය අසා පැවිද්දට සිත් ඉපදවීය.

එකල බුදුරදුන් කාලය දැන පිරිස යැවූ කල්හි බුදුරදුන් කරා එළඹ වැඳ හෙට දානය සඳහා ආරාධනා කොට දෙවන දවසෙහි මඩුවක් කරවා අසුන් පණවා බුදුරදුන් ප්‍රමුඛ මහාසංඝයාට දානයක් දී උදෑසන අනුභව කොට උපෝසථ අංගයන් අදිටන් කොට භාණ්ඩාගාරිකයා කැඳවා මෙපමණක් බඩු වියදම් කරන ලදි. මෙපමණක් බඩු වියදම් නොකරන ලදි. සියල්ල කියා මේ වස්තුව බාල සහෝදරයාට දෙවයි සියල්ල පවරා දී බුදුරදුන් ළඟ පැවිදි වී කමටහන් පිළිසරණ විය. එකල්හි කමටහන මෙනෙහි කරන ඔහුට කමටහන නොවැටහෙයි. එයින් සිතීය. මේ ජනපදය මට කැප නොවේ. මම බුදුරදුන් සමීපයෙන් කමටහන් ගෙන සිය රටට ම යන්නේ නම් ඉතා යෙහැක. එකල්හි පිඬු පිණිස හැසිර සවස් කාලයෙහි එලසමවතින් නැගිට බුදුරදුන් වෙත එළඹ කමටහන කියවා හත් වරක් සිංහනාදය කර ගියේ ය. එයින් කියන ලදි. අථ ඛො ආයස්මා පුණ්ණො - පෙ- විහරතීති කොහි වාසය කළේ ද? හතර තැනක වාසය කළේය. සුනාපරන්ත රටට පිවිස අම්බහට්ඨ පර්වතයෙහි වැස වෙළඳ ගමට පිඬු පිණිස ගියේය. එකල ඔහුගේ බාල සහෝදරයා හැඳින දානය දී ස්වාමීනි. වෙන තැනක නොගොස් මෙහි වාසය කරවයි ප්‍රතිඥා කරවා එහිම වාසය කරවීය. එයින් සමුද්‍රගිරි විහාරයට ගියේ ය. එහි අයස්කාන්ත ගලින් පිරිසිදු කරන ලද සක්මනක් ඇත. එහි සක්මන් කරන්නට කිසිවෙක් සමත්

නොවෙයි. එහි මුහුදු රළ ඇවිත් අයස්කාන්ත ගල්වල හැපී මහත් ශබ්ද නගත්. තෙරුන් වහන්සේ කමටහන මෙනෙහි කරන්නවුන්ට පහසු විහරණ වේවයි මුහුද නිශ්ශබ්ද කරවීය. එයින් මාතුළ පර්වතයට ගියේ ය. එහි පක්ෂි සමූහයා උත්සන්නව රාත්‍රී දහවල් දෙකේ ම ශබ්ද එකට බැඳුණේ වෙයි. තෙරුන් වහන්සේ මෙතැන අපහසු යැයි එයින් මකුලකාරාම විහාරයට ගියේය. එය වෙළඳ නගරයට ඉතා දුර නොවෙයි. ඉතා සමීප ද නොවෙයි. යාම් ඒම් සම්පූර්ණය. නිශ්ශබ්දය. විවේකීය. තෙරුන් වහන්සේ මෙතන පහසු යැයි එහි රාත්‍රී ස්ථාන දිවා ස්ථාන සක්මන ආදීන් කර වස් එළඹියේය. මෙසේ ස්ථාන හතරක විසීය. නැවත එක් දවසක් ඒ වස් කාලයෙහි ම පන්සීයක් වෙළෙන්දෝ මුහුදෙන් එතරව යමුයි නැවකට බඩු පැටවූහ. නැවට නගින දවසෙහි තෙරුන් වහන්සේගේ බාල සහෝදරයා තෙරුන් වහන්සේ වළඳවා තෙරුන් වහන්සේගෙන් සිල්පද ගෙන වැඳ යන්නේ ස්වාමිනි, මහ මුහුද නම් ඇදහිය නොහැක. නොයෙක් අන්තරා ඇත්තේය. අප සිහි කරවයි කියා නැවට නැංගේය.

නැව ඉතා වේගයෙන් යන්නේ වෙනත් දිවයිනකට පැමිණුනේය. මිනිස්සු බත් කිස කරන්නෙමියි දිවයිනට බැස්සේය. ඒ දිවයිනෙහි වෙනත් කිසිවක් නැත. සඳුන් වනයක් ම විය. එකල එක් අයෙක් වෑයෙන් ගසකට කොටා රත් සඳුන් බව දැන කීය. පින්වත්නි, අපි ලාභය පිණිස පරසමුද්‍රයට යමු. මෙයින් මතු ලාභයක් නම් නැත. අඟල් හතරක ගුලියක් ලක්‍ෂයක් වටින්නේය. ගතයුතු බඩු පමණක් ගෙන සඳුන් පටවමු. ඔවුහු එසේ ම කළාහ. සඳුන් වනයට අධිගෘහිත අමනුෂ්‍යයෝ කිපී මොවුන් අපේ සඳුන් වනය නසන ලද්දේ ය. ඔවුන් මරන්නෙමියි සිතා මෙහි මළ කල්හි මේ සියලු වනය එකම කුණුපයක් වන්නේය. මුහුද මැද දී ඔවුන්ගේ නැව ගිල්වන්නෙමියි කීහ. එකල ඔවුන් නැවට නැග මොහොතක් ගිය කාලයෙහි ම (සුළිසුළං) ඉපදීමක් නංවා ඒ අමනුෂ්‍යයෝ තමන්ම භයානක රූප පෙන්වූහ. බියවූ මිනිස්සු තම තමන්ගේ දෙවියන් වඳිත්. තෙරුන්ගේ බාල සහෝදර චූලපුණ්ණ කෙළඹියා මාගේ සහෝදරයා පිහිට වේවායි තෙරුන්ගේ නම සිහි කරමින් සිටියේ ය. තෙරුන් ද ඒ මොහොතෙහිම සිහිකර ඔවුන්ගේ කරදරය දැන අහසට නැගී ඉදිරියෙහි සිටියේය.

අමනුෂ්‍යයෝ තෙරුන් දැක ආර්ය වූ පුණ්ණ තෙරුන් එන්නේ යැයි ඉවත් වූහ. උපද්‍රවය සංසිඳුණේය. තෙරුන් වහන්සේ බිය නොවවයි ඔවුන් අස්වසා කොහි යනු කැමැතිදැයි ඇසීය. ස්වාමීනි, අපගේ සිය ස්ථානයට ම යමු'යි කීහ. තෙරුන් නැවෙහි තලය පාගා මොවුන් කැමති තැනට යේවායි අධිෂ්ඨාන කළහ. වෙළෙන්දෝ සිය ස්ථානයන්ට ගොස්

Scanned with CamScanner

ඒ ප්‍රවෘත්තිය අඹුදරුවන්ට කියා එව්. තෙරුන් සරණ යමු යි පන්සියය ම තමන්ගේ පන්සියක් ස්ත්‍රීන් සමඟ තිසරණෙහි පිහිටා උපාසක බව දැන්වූහ. ඉක්බිතිව නැවෙන් බඩු බා තෙරුන්ට එක් කොටසක් කොට ස්වාමීනි, මේ නුඹගේ කොටසයැයි කීහ. තෙරුන් වහන්සේ මට වෙනම කොටසකින් වැඩක් නැත. නුඹලා විසින් බුදුරදුන් දක්නා ලද්දේ ද? නැත ස්වාමීනි. එසේනම් මෙයින් බුදුරදුන්ට මණ්ඩල මාලයක් කරව්. මෙසේ බුදුරදුන් දකින්නාහුය. ඔවුහු ස්වාමීනි. යහපත් යැයි ඒ කොටසින් ද තමන්ගේ කොටසින් ද මණ්ඩල මාලයක් කරන්නට පටන් ගත්හ. බුදුරදුන් ද ආරම්භ කළ කාලයේ පටන් පරිභෝග කළ හ. ආරක්‍ෂක මිනිස්සු රාත්‍රියෙහි එළිය දැක මහේශාක්‍ය දෙවියෙක් ඇතැයි සංඥා කළහ. උපාසකයෝ මණ්ඩල මාලය ද සංඝයාට සෙනසුන් ද නිමවා දාන සම්භාරය ද සාදා ස්වාමීනි, අප විසින් තමන්ගේ කටයුතු කරන ලදි. බුදුරදුන් වැඩමවන්න යැයි තෙරුන්ට දැන්වූහ. තෙරුන් වහන්සේ සවස් කාලයේ ඍද්ධියෙන් සැවැත් නුවරට ගොස් ස්වාමීනි, වෙළඳගම වැසියෝ නුඹ වහන්සේ දකිනු කැමැත්තෝ ය. ඔවුන්ට අනුකම්පා කරන්න යැයි බුදුරදුන්ගෙන් ඉල්ලීය. බුදුරදුන් ඉවසූහ. තෙරුන් බුදුරදුන්ගේ ඉවසීම දැන සිය ස්ථානයට ම නැවත පැමිණියහ. බුදුරදුන් ද ආනන්ද තෙරුන් ඇමතූහ. ආනන්දය හෙට සුනාපරන්තයෙහි වෙළඳ ගමෙහි පිඬු පිණිස හැසිරෙන්නෙමු. නුඹ එකක් අඩු පන්සියක් භික්ෂූන්ට සළාක දෙවයි ස්වාමීනි යහපති යැයි භික්ෂු සංඝයාට ඒ කාරණාව දන්වා අහසින් යන භික්ෂූන් සළාකය ගනිත්වායි කීහ.

ඒ දවසෙහි කුණ්ඩධාන තෙරුන් පළමු සළාකය ගත්හ. වෙළඳගම් වැසියෝ ද හෙට බුදුරදුන් වඩින්නේ යැයි ගම මැද මණ්ඩපයක් කොට දානය සැදූහ. බුදුරදුන් උදෑසන සිරුර පිළිදැගුම් කොට ගඳ කිළියට පිවිස එලසමවතට වැදී සිටියහ. ශක්‍රයාගේ පඩුපුල් අස්න උණුවිය. ඔහු මේ කුමක්දැයි සිහිකොට බුදුරදුන්ගේ සුනාපරන්ත ගමන දැක විශ්වකර්මයා ඇමතීය. දරුව, බුදුරදුන් අද තුන්සියක් පමණ යොදුන් පිණ්ඩපාතයෙහි වඩිති. පන්සියක් කූටාගාර මවා දෙව්රමෙහි දොරටුව මස්තකයෙහි ගමනට සූදානම් කොට තබව. ඔහු එසේ කළේය. බුදුරදුන්ගේ කූටාගාරයෙහි මුඛ හතරක් විය. අගසව් දෙනමට දොරටු දෙකක් ද සෙසු අයට එක දොරටු ද විය. බුදුරදුන් ගඳකිළියෙන් නික්මී පිළිවෙළින් තබන ලද කුළුගෙවල් අතුරෙන් උතුම් කූටාගාරයට පිවිසියහ. අගසව් දෙනම ආදී කොට එකක් අඩු පන්සියක් භික්ෂූහු ද කුළුගෙවල්වලට ගියාහ. එක් භික්ෂු කුළුගෙයක් විය. කුළුගෙවල් පන්සීය ම අහසෙහි පැන නැංගහ. බුදුරදුන් සච්චබද්ධ

නම් මිථ්‍යාදෘෂ්ටික තාපස තෙමේ මහ ජනයාට මිථ්‍යා දෘෂ්ටිය උගන්වන්නේ ලාභයෙන් හා කීර්තියෙන් අගතැන්පත්ව වාසය කරයි. ඔහුගේ ඇතුළත සැළියේ ඇතුළත පහනක් මෙන් රහත්වීමට හේතු බබළයි. එය දැක ඔහුට බණ කියන්නෙමියි ගොස් බණ කීය. තාපසයා දේශනාව අවසානයේ රහත් විය. ඔහුට මාර්ගයෙන් ම අභිඥාව පැමිණියේය. ඔහු ඒහිභික්ෂුබව ලැබ ඍද්ධියෙන් පාත්‍ර සිවුරු ඇතිව කුළුගෙයට පිවිසියේය. බුදුරදුන් කුළුගෙවල්වලට පැමිණි පන්සීයක් භික්ෂූන් සමඟ වෙළඳ ගමට ගොස් කුළුගෙවල් අදෘශමාන කොට වෙළඳ ගමට පිවිසියහ. වෙළෙන්දෝ බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට මහ දන්දී බුදුරදුන් මකුලකාරාමයට වැඩමවූහ. බුදුරදුන් මණ්ඩල මාලයට පිවිසියහ. මහජනයා බුදුරදුන් ශරීරවිඩාව යම්තාක් සංසිඳුවායි උදෑසන බත්කිස කොට පෙහෙවස් සමාදන්ව බොහෝ සුවඳමල් ආදිය ගෙන බණ ඇසීම පිණිස ආරාමයට නැවත ගියේය. බුදුරදුන් බණ කීහ. මහජනයාගේ බැඳීම් නිදහස් විය. මහත් බුද්ධ කෝලාහලය විය. බුදුරදුන් මහජනයාට සංග්‍රහය පිණිස කිහිප දවසක් එහි විසීය. අරුණ මහා ගඳ කිළියෙහිම නැංවීය. එහි කිහිප දවසක් වැස වෙළඳ ගමෙහි පිඬු පිණිස හැසිර නුඹ මෙහි ම වසවයි පුණ්ණ තෙරුන් නවතා නැවත වැඩම වන අතරෙහි නර්මදා නම් ගඟක් ඇත. එහි ඉවුරට වැඩියහ. නර්මදා නා රජු බුදුරදුන්ට පෙර ගමන් කොට නාග ලෝකයට පමුණුවා තුනුරුවන්ට සත්කාර කළේය.

බුදුරදුන් ඔහුට බණ කියා නාග භවනෙන් නික්මුණහ. ඔහු ස්වාමීනි, මට පිදිය යුත්තක් දෙවයි ඉල්ලීය. බුදුරදුන් නර්මදා ගං ඉවුරෙහි පා සළකුණක් පෙන්වීය. එය රැළ ආකළ වැසෙයි. ගිය කළ ඇරෙයි. මහත් සත්කාරයට පැමිණියේය. බුදුරදුන් එයින් නික්මී සච්චබද්ධ පර්වතයට ගොස් සච්චබද්ධයාට බණ කීය. නුඹ විසින් මහජනයා අපාය මාර්ගයට බස්සවන ලදි. නුඹ මෙහි ම වාසය කොට මොවුන්ගේ ලබ්ධිය හැර නිවන් මගෙහි පිහිටුව. ඔහු ද පිදිය යුත්තක් ඉල්ලීය. බුදුරදුන් ඝණ ගල්පිඬෙහි තෙත මැටි පිඬෙක සළකුණක් මෙන් පාද සළකුණ දක්වීය. එතනින් දෙව්රමට ම වැඩියේය. ඒ කාරණය සඳහා තෙනෙවන්තරවසොනාති යනාදිය කියන ලදි. පරිනිබ්බායීති පුණ්ණ තෙරණුවෝ අනුපදිසේස නිර්වාණ ධාතුවෙන් පිරිනිවීය. මහජනයා තෙරුන්ට දවස් හතක් ශරීර පූජා කොට බොහෝ සුවඳ දර එක්කොට සිරුර දවා ධාතු ගෙන සෑයක් කළේය. සම්බහුලා භික්ඛූති තෙරුන්ගේ සොහොනෙහි සිටි භික්ෂූන්, ඉතිරිය සියලු තැන්හි ම ප්‍රකටය.

පුණ්ණෝවාද සූත්‍රය නිමි.

# 5.4.4

එවමෙමසුතනති මා විසින් නන්දකොවාද සූත්‍රය මෙසේ අසන ලදි. එහි තෙන බො පන සමයෙනාති බුදුරදුන් මහාප්‍රජාපතිය විසින් ඉල්ලන ලද්දේ භික්ෂුසංඝයා යවා භික්ෂුසංඝයා රැස් කරවා ස්ථවිර භික්ෂූන් වාරයෙන් වාරයට භික්ෂුණීන්ට අවවාද කරත්වා යි සංඝයාට භාර කළහ. ඒ සඳහා මෙය කියන ලදි. එහි පරිසායෙනාති වාරයෙන් න ඉච්ඡතීති තමාගේ වාරය පැමිණි කල්හි දුර ගමකට හෝ ගොස් ඉදිකටු කර්මාදිය හෝ අරඹා මේ නම් ඇත්තාහට ප්‍රමාදය යැයි කියවයි. මේ අවවාද කාර්යය බුදුරදුන් නන්දක තෙරුන්ට ම භාර කළේය. කුමක් හෙයින් ද? මේ භික්ෂුණීන්ට තෙරුන් දූක සිත එකඟ වෙයි. පැහැදෙයි. එහෙයින් මේ භික්ෂුණීහු උන්වහන්සේගේ අවවාද පිළිගැනීමට කැමැත්තාහ. (ධර්ම කථා අසන්නට කැමැත්තාහ) එහෙයින් බුදුරදුන් නන්දක තෙමේ තමන්ගේ වාරය පැමිණි කල්හි අවවාද දෙන්නේය. ධර්ම කථා කියන්නේය. වාරයෙන් අවවාද කළේය.

තෙරුන් තමන්ගේ වාරය නොකරයි. ඒ කුමක් නිසාද? ඒ භික්ෂුණීන් පෙර දඹදිව තමන් රාජ්‍ය කරවන කල්හි තෙරුන්ගේ අන්තඃපුර ස්ත්‍රීහු වූහ. තෙරුන් වහන්සේ පූර්වේනිවාසානුස්සතියෙන් ඒ කාරණය දැන සිතීය. මේ භික්ෂුණීසංඝයා මැද සිටින්නා වූ මා උපමා ද කරුණු ද ගෙනහැර දක්වා බණ කියන්නාහු දූක වෙනත් පූර්වේනිවාසානුස්සති ඥානය ඇති භික්ෂුවක් මේ කාරණය බලා ආයුෂ්මත් නන්දක තෙමේ අද දක්වාත් අන්තඃපුර ස්ත්‍රීන් අත් නොහරියි. ආයුෂ්මත් තෙමේ අන්තඃපුර ස්ත්‍රීන් විසින් පිරිවරණ ලද්දේ හෙබීයයි කිවයුතු යැයි සිතන්නේය. මේ කාරණය බලන්නේ තෙරුන් වහන්සේ තමන්ගේ වාරය නොකරයි. මේ භික්ෂුණීන්ට තෙරුන්ගේ ම දේශනාව සප්පාය වන්නේ යැයි දැන ඉක්බිතිව බුදුරදුන් නන්දක ඇමතීය. පෙර ඒ භික්ෂුණීන් ඔහුගේ අන්තඃපුර ස්ත්‍රීන් බව දැනගැනීමට මේ කථා වස්තුවයි. පෙර බරණැස් නුවර පන්සීයක් දාසයෝ ද පන්සීයක් දාසියෝ ද දහසක් එකට වැඩ කරමින් එකම තැන විසීය. මේ නන්දක තෙරුන් එකල වැඩිමහල් දාසයාය. ගෞතමිය වැඩිමහල් දාසියයි. පණ්ඩිත ව්‍යක්ත ඇය වැඩිමහල් දාසයාට භාර්යාව විය. ඒ දහසක් දෙනා ම පින්කම් කරන්නේ එකට ම කරයි. එකල වස්වසන කාලයෙහි පසේබුදුවරුන් පස්නමක් නන්දමූලක පබ්භාරයෙන් ඉසිපතනයට බැස නගරයෙහි පිඬු පිණිස හැසිර ඉසිපතනයට ම ගොස් වස්විසීමට කුටියක් පිණිස හස්ත කර්මය ඉල්ලමුයි සිවුරු පොරවා සවස් කාලයෙහි නගරයට

පිවිස සිටුතුමාගේ ගේදොර සිටියාහ. වැඩිමහල් දාසිය කලය ගෙන පැන් තොටට යන්නී නගරයට වඩින පසේබුදුවරයන් දක්කාය. සිටුතෙමේ උන්වහන්සේලා පැමිණි කාලයෙහි කාරණය අසා අපට ඉඩ නැත යෙත්වායි කීය.

එකල්හි නගරයෙන් නික්මෙන උන්වහන්සේලා කළය අරගෙන පිවිසෙන වැඩිමහල් දාසිය දක කළය තබා නැමී වැඳ මුව වසාගෙන ආර්යයන් වහන්සේලා නගරයට පිවිසි මොහොතෙහි ම නික්මෙන්නාහුය. හේතු කවරේදැයි ඇසීය. වස්විසීමට හස්ත කර්මයක් ඉල්ලීමට පැමිණියෙමු. ස්වාමීනි. ලැබුනෙහි ද? උපාසිකාවෙනි නැත. කිමෙක් ද? ඒ කුටි අධිපතියන් විසින් ම කළ යුතු ද? දිළින්දන්ටත් කළ හැකි ද? යම්කිසිවෙකුට කළ හැකිය. යහපති ස්වාමීනි අපි කරන්නෙමු යි හෙට මාගේ භික්‍ෂාව පිළිගනුවයි ආරාධනා කොට වතුර ගෙන ගොස් නැවත කළය ගෙන ඇවිත් පැන්තොට මාර්ගයෙහි සිට පැමිණි අනෙත් දාසීහු මෙහි ම වෙව් යැයි කියා සියලු දෙනාම පැමිණි වේලාවෙහි කීවාය. දරුවෙනි, නිතර ම අනුන්ට දාසකම් කරහු ද නොහොත් දාස බවින් මිදීමට කැමැත්තු ද? ආර්යාවෙනි අද ම මිදෙන්ට කැමැත්තෙමු. ඉදින් එසේ නම් හස්තකර්ම නොලැබුණු පසේබුදුවරුන් පස්නමකට මා විසින් හෙට දින දනට ආරාධනා කරන ලදි. නුඹලාගේ ස්වාමියන් විසින් එක් දවසක් හස්තකර්මය දෙව. ඔවුහු යහපති යැයි පිළිගෙන සවස කැලයෙන් ආ කල්හි ස්වාමිවරුන්ට කීවාහ. ඔවුහු ද යහපති යැයි වැඩිමහල් දාසයාගේ ගෙදරට රැස් වූහ. එකල වැඩිමහල් දාසිය ඔවුන්ට දරුවෙනි හෙට පසේබුදුවරුන්ට හස්තකර්මය දෙවයි අනුසස් කියා යමෙක් අකැමති ද ඔවුන්ට දැඩි ව අවවාද කළාය. ඇය දෙවන දවසෙහි පසේබුදුවරුන්ට දන් දී සියලු දාස පුත්‍රයන්ට සංඥා දුන්නීය. ඔවුන් ඒ මොහොතේම කැලයට ගොස් ද්‍රව්‍ය සම්භාරයන් එකතු කොට සියය සියය වී එක එක කුටිය සක්මන් මළු ආදිය පරිවාර කොට ඇඳ පුටු ද පැන් බොන පරිහරණය කරන භාජන ආදිය ද තබා පසේබුදුවරයන්ට තුන්මාසයක් එහි වාසය කිරීමට ආරාධනා කොට වාර දානය ද පිහිටවූහ. යමෙකුට තමාගේ වාරයේ දී නොහැකි වෙයි ද එම වාරය වැඩිමහල් දාසිය සිය ගෙයින් ගෙනවිත් දෙයි. මෙසේ තුන්මාසයක් උපස්ථාන කොට වැඩිමහල් දාසිය එක එක දාසයාට එක එක සළුව දුන්නේය. මහත් සළු පන්සීයක් විය. ඒවා සකස් කර පසේබුදුවරයන්ට තුන්සිවුරු කොට දුන්නේය. පසේබුදුවරු පහසු තැනකට වැඩියාහ.

එම දහසක් දෙනා ද එකට කුසල් කොට මරණින් මතු දිව්‍ය ලෝකයෙහි උපන්හ. ඒ පන්සීයක් ස්ත්‍රීහු කලින් කල ඒ පන්සීයක්

පුරුෂයන්ගේ ගෙවල්වල උපන්නාහ. සමහර කාලවල සියලු දෙනාම වැඩිමහල් දාසයාගේ ගෙයි වෙත්. නැවත එක් කාලයක වැඩිමහල් දාසයා දෙව්ලොවින් චුතව රජ කුලයෙහි උපන්නේය. ඒ පන්සියක් දිව්‍ය ස්ත්‍රීහු ද මහත් සම්පත් ඇති කුලවල ඉපදී රාජ්‍යයෙහි සිටි ඔහුගේ ගෙට ගියාහ. මේ ක්‍රමයෙන් සැරිසරන්නෝ අපේ බුදුරදුන්ගේ කාලයෙහි කෝලිය නුවර ද දෙව්දහ නුවර ද ක්ෂත්‍රිය කුලවල උපන්නාහ. නන්දක තෙරුන් පැවිදිව රහත් විය. වැඩිමහල්දාසි දියණිය වයසට පැමිණ සුද්ධෝදන මහරජුගේ අගමෙහෙසි තනතුරෙහි සිටියාය. අනෙත් අය ද ඒ ඒ රාජපුත්‍රයන්ගේ ගෙවල්වලට ම ගියාහ. ඔවුන්ගේ ස්වාමි වූ රාජ කුමාරවරු පන්සිය දෙනා ජලය බෙදාගැනීම් කෝළාහලයෙහි දී බුදුරදුන්ගේ බණ අසා පැවිදි වූහ. රාජ දියණියෝ ද ඔවුන්ගේ කළකිරුණු බවට හසුනක් යැවීය. කළකිරුණු ඔවුන් බුදුරදුන් විසින් කුණාලවිලට පමුණුවා සෝවාන් ඵලයෙහි පිහිටුවා මහාසමය සූත්‍රය දේශනා කරන දවසෙහි රහත්බවෙහි පිහිටවීය. ඒ පන්සියක් රාජ දියණියෝ ද නික්මී මහාප්‍රජාපතිය සමීපයෙහි පැවිදි වූහ. ආයුෂ්මත් නන්දක තෙමේ ඒ භික්ෂුණීහු ඒ අයමයි මෙසේ මේ කථාව දත යුතුයි.

**රාජකාරාමොති** පසේනදි රජු විසින් කරවන ලද නුවරට දකුණින් ථූපාරාමය හා සමාන තැන්හි විහාරයයි. **සම්මප්පඤ්ඤාය සුදිට්ඨන්ති** හේතු කාරණයෙන් විදර්ශනා ප්‍රඥාවෙන් අවකාශ වූ පරිදි දකින ලද. **තජ්ජං තජ්ජන්ති** ඒ ඒ ස්වභාවය. අර්ථ වශයෙන් ඒ ඒ ප්‍රත්‍ය නිසා ඒ ඒ වේදනාවෝ උපදිත් යැයි කියන ලද්දේ වෙයි. **පගෙවස්ස ඡායාති** මුල් ආදිය නිසා උපන් සෙවන පළමුකොට ම අනිත්‍යයයි. **අනුපහච්චාති** අනුව ගසා එහි මස් පිඬු පිඬු කොට හම අලලමින් මාංශ ශරීරය නසත්. හම වටකොට මස් අලලන්නේ හම් ශරීරය නසත්. මෙය නොකොට. **විලිමං නහාරු බන්ධනන්ති** හමෙහි ඇළුණු සියල්ල විලිමංස නම්. **අන්තර කිලෙස සංයොජනං බන්ධනන්ති** සියල්ල අන්තර ක්ලේශයන් සඳහා කියන ලදි. **සත්ත බො පනිමෙති** කුමක් හෙයින් කීවේ ද? යම් ප්‍රඥාවක් මේ කෙලෙස් සිඳී යයි කියන ලද්දේ ද ඕතොමෝ තනිවම සිය ස්වභාවයෙන් සිඳින්නට නොහැකිය. යම්සේ කෙටේරියට හැක්කේ ද එසේමය. කෙටේරිය යම්සේ තමාගේ ස්වභාවයෙන් සිඳිය යුත්ත නොසිඳයි. පුරුෂයාගේ උත්සාහය නිසා සිඳියි. එසේම බොජ්ඣංග හය හැර ප්‍රඥාවෙන් කෙලෙස් සිඳින්නට නොහැකිය. එහෙයින් මෙසේ කීය. **තෙනහීති** යම්කාරණයකින් නුඹ විසින් අධ්‍යාත්මික හය ආයතන හය බාහිර හය විඥානකයෙහි පහන් උපමාව ද වෘක්ෂ උපමාව ද ගව උපමාව ද පෙන්වා බොජ්ඣංග හතෙන් ආශ්‍රව

ක්ෂයකිරීමෙන් දේශනාව නිමවන ලදි. ඒ කාරණයෙන් නුඹ හෙට ද ඒ භික්ෂුණීන්ට ඒ අවවාදයෙන් ම අවවාද කරවයි යනුයි.

**සා සොතාපන්නාති** යම් ඒ තැනැත්තියක් ගුණවලින් සියල්ලට පසුවූවා ද ඇය සෝවාන් විය. සෙසු අය සකෘදාගාමි ද අනාගාමි ද රහත් ද වූහ. ඉදින් මෙසේ නම් කෙසේ අදහස සම්පූර්ණ වූවා ද? යම් භික්ෂුණියකට මෙබඳු සිතක් විය. කවරකලෙක මම නන්දක ආර්යන් වහන්සේගේ බණක් අසන්නේ ද? ඒ ආසනයෙහි ම සෝවාන්ඵලය පසක් කරන්නේය. ඇය සෝවාන් ඵලය පසක් කළාය. යම් තැනැත්තියකට සකෘදාගාමි ඵලය රහත් ඵලය විය. ඇය රහත්බව පසක් කළාය. එහෙයින් බුදුරදුන් **අත්තමනාචෙව පරිපුණ්ණසංකප්පා** චාති යන්න කීය.

**නන්දකෝවාද සූත්‍රය නිමි.**

## 5.4.5

**එවමෙමෙසුතන්ති** මා විසින් රාහුලෝවාද සූත්‍රය මෙසේ අසන ලදි. එහි **විමුත්තිපරිපාචනීයාති** විමුත්තිය මේරීම විමුත්ති පරිපාචනීය නම්. **ධම්මාති** පසොළොස් ධර්මයයි. ඒවා සද්ධා ඉන්ද්‍රිය ආදීන්ගේ පිරිසිඳුවීමට කාරණා වශයෙන් දත යුතුයි. එහෙයින් කියන ලදි.

සද්ධාව නැති පුද්ගලයා අත්හැරීමය. සද්ධාව ඇති පුද්ගලයා සේවනය කිරීම ප්‍රසාදය ඇති විය යුතු සූත්‍රය සිහිකිරීම මේ ආකාර තුනෙන් සද්ධා ඉන්ද්‍රිය පිරිසිදු වෙයි.

කුසීත පුද්ගලයා අත්හරින්නාහටය. අරඹන ලද වීර්ය ඇති පුද්ගලයා සේවනය කරන්නාහටය. සම්‍යක්ප්‍රධානය සිහිකරන්නාහටය. මේ ආකාර තුනෙන් වීර්ය ඉන්ද්‍රිය පිරිසිදු වෙයි.

සිහිමුළා වූ පුද්ගලයා අත්හරින්නාහටය. එළඹ සිටි සිහිය ඇති පුද්ගලයා ඇසුරු කරන්නාහටය. සතිපට්ඨානය සිහිකරන්නාහටය. මේ ආකාර තුනෙන් සති ඉන්ද්‍රිය පිරිසිදු වෙයි.

නොසංසිඳුණු පුද්ගලයා අත්හරින්නාහටය. සංසිඳුණු පුද්ගලයා ඇසුරු කරන්නාහටය. ධ්‍යාන විමෝක්‍ෂයන් සිහිකරන්නාහටය. මේ ආකාර තුනෙන් සමාධි ඉන්ද්‍රිය පිරිසිදු වෙයි.

නුවණ නැති පුද්ගලයා අත්හරින්නාහටය. නුවණ ඇති පුද්ගලයා ඇසුරු කරන්නාහටය. ගැඹුරු ප්‍රඥාව ඇති ආචාර්යන් සිහිකරන්නාහටය. මේ ආකාර තුනෙන් පඤ්ඤා ඉන්ද්‍රිය පිරිසිදු වෙයි.

මෙසේ පංච පුද්ගලයින් අත්හැරීමෙන් පංච පුද්ගලයන් ඇසුරු කිරීමෙන් පංච සූත්‍රස්ඛන්ධයන් සිහිකිරීමෙන් යන මේ පසළොස් ආකාරයෙන් මේ පංච ඉන්ද්‍රියෝ පිරිසිදු වෙත්. විමුත්තිය මුහුකුරා යන තවත් පසළොස් ධර්මයක් වෙත්. සද්ධාව පස්වෙනි මේ ඉන්ද්‍රියෝය. අනිත්‍ය සංඥාව. අනිත්‍යයෙහි දුක් සංඥාව. දුකෙහි අනන්ත සංඥාව. ප්‍රහාණ සංඥාව. විරාග සංඥාව යන මේ පහ නිබ්බේධියභාග සංඥාවන්ය.

මේඝිය තෙරුන්ට කියන ලද කළ්‍යාණ මිත්‍රතාව ආදී පංච ධර්මයෝය. කුමන වේලාවක බුදුරදුන්ට මේ අදහස වීද? උදෑසන ලෝකය බලන කාලයේය. **අනෙකානි දෙවතාසහස්සානීති** ආයුෂ්මත් රාහුලයන් විසින් පදුමුත්තර බුදුරදුන්ගේ පාමුල පාලිත නාගරාජ කාලයෙහි ප්‍රාර්ථනාවක් තබන්නවුන් සමඟ ප්‍රාර්ථනාව තබන ලද දෙවියෝය. ඔවුන් අතරෙන් සමහරෙක් භූමාටු දෙවියන්ය. සමහරෙක් ආකාශස්ථ දෙවියන්ය. සමහරෙක් චාතුම්මහාරාජිකයෝය. සමහරෙක් දිව්‍ය ලෝකයෙහි සමහරෙක් බ්‍රහ්ම ලෝකයෙහි උපන්නාහ. මේ දවසෙහි සියල්ලෝ ම එකතැන අන්ධවනයෙහි ම රැස්වූහ. **ධම්මචක්ඛුන්ති** උපාලිඔවාද දීඝනඛ සූත්‍රයන්හි පළමු මාර්ගය ධර්ම චක්‍ෂුෂ යැයි කියන ලදි. බ්‍රහ්මායු සූත්‍රයෙහි තුන් ඵලයෝය. මේ සූත්‍රයෙහි මාර්ග හතර ද ඵල හතර ද ධර්ම චක්‍ෂුෂ යැයි දත යුතුයි. එහි සමහර දෙවියෙක් සෝවාන් විය. සමහරෙක් සකෘදාගාමී විය. අනාගාමී අර්හත් වූහ. ඒ දෙවියන් මෙපමණකැයි කියා ගණන් වශයෙන් පිරිසිඳීමක් නැත. ඉතිරිය සියලු තැන්හි ම ප්‍රකටය.

**රාහුලොවාද සූත්‍ර වර්ණනාව නිමි.**

# 5.4.6

**එවමෙමසුතනති** මා විසින් ඡ ඡක්ක සූත්‍රය මෙසේ අසන ලදි. එහි **ආදිකලාාණනති** මුල යහපත්ය. හොඳය. දෝෂ නැති කොට දේශනා කරන්නෙමි. මැද ද කෙළවර ද මේ ක්‍රමයමයි. මෙසේ බුදුරදුන් අරියවංස පද නවයකින් ද මහාසතිපට්ඨානය හතකින් ද මහා අස්සපුරය පද හතකින් ද ස්තුති කළේය. මේ සූත්‍රය පද නවයකින් ස්තුති කළේය. **වෙදිතබ්බානීති** විදර්ශනා සහිත මාර්ගයෙන් දතයුතුයි. මනායතනයෙන් ත්‍රෛභූමික සිත ම කියන ලදි. ධර්මායතනයෙන් බාහිර ත්‍රෛභූමික ධර්මයෝ ද මනෝ විඥානයෙන් දෙකක් හැර පංච විඥානයෙන් ද සෙසු විසිදෙවැදෑරුම් ලෞකික විපාක සිත ද ස්පර්ශ වේදනාව යථෝක්ත විපාක විඥානය හා යුක්ත වන්නේය.

**තණ්හාති** විපාක වේදනා ප්‍රත්‍යයෝ ජවන ක්‍ෂණයෙහි උපන් තෘෂ්ණාවයි. **චක්ඛුං අත්තාති** වෙන්වූ අනුසන්ධියයි. යට කියන ලද සත්‍ය දෙකෙහි අනාත්මබව දක්වීම පිණිස මේ දේශනාව පටන් ගන්නා ලදි. එහි **න උපපජ්ජතීති** නොයෙදෙයි. **වෙතීති** පහවෙයි. නිරුද්ධ වෙයි. **අයං ඛො පන භික්ඛවෙති** මෙය ද එක් වූ අනුසන්ධියයි. මේ දේශනාව තුන් ආකාර ග්‍රහණයන්ගේ වශයෙන් වෘතය යැයි කියන්නේමය. **එතං මමාති** යනාදියෙහි තෘෂ්ණා මාන දෘෂ්ටීන්ගේ ගැනීම දත යුතුයි. **සමනුපස්සතීති** ගැනීම් වශයෙන් දකියි. මෙසේ වෘතය දක්වා දූන් ගැනීම් තුනෙහි ප්‍රතික්ෂේපකිරීම් වශයෙන් නිරෝධය මාර්ගය යැයි මේ සත්‍ය දෙකෙහි විවර්තය දක්වන්නට **අයං ඛො පනාති** යනාදිය කීය.

**නෙතං මමාති** යනාදිය තෘෂ්ණාදීන්ගේ ප්‍රතිෂේධ වචනයෝය. **සමනුපස්සතීති** අනිත්‍ය දුක්ඛ අනාත්මය යැයි දකියි. මෙසේ විවර්තය දක්වා දූන් තුන් අනුසයන්ගේ වශයෙන් නැවත විවර්තය දක්වන්නට **චක්ඛුඤ්ච භික්ඛවෙති** යනාදිය කීය. එහි **අභිනන්දතීති** යනාදිය තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් ම කියන ලදි. **අනුසෙතීති** ප්‍රහීන නොවූයේ වෙයි. **දුක්ඛස්සාති** සංසාර දුක හා කෙලෙස් දුක්ඛයාගේ. මෙසේ තුන් අනුසයන්ගේ වශයෙන් වෘතය කියා දූන් ඔවුන්ට විරුද්ධ වශයෙන් විවර්තය දක්වන්නේ නැවත **චක්ඛුඤ්චාති** යනාදිය කීය. **අවිජ්ජං පහායාති** සසර මූලික අවිද්‍යාව හැර. **විජ්ජනති** අර්හත් මාර්ග විද්‍යාව උපදවා. **ඨානමෙතං විජ්ජතීති** මෙතෙක් කථා මාර්ගයෙන් වට්ටවිවට්ට වශයෙන් දේශනාව මස්තකයට පමුණුවා නැවත එයම පිඬුකොට දක්වන්නේ **එවං පස්සං භික්ඛවෙති** යනාදිය කීය. **සට්ඨීමත්තානං භික්ඛූනනති** මෙහි මෙය පුදුමයක් නොවෙයි. යම්කාලයක

බුදුරදුන් දේශනා කළ කල්හි භික්ෂූන් හැටක් රහත් වූහ. මේ සූත්‍රය ධර්මසේනාපති තෙරුන් දේශනා කළ කල්හි භික්ෂූන් හැටක් රහත් වූහ. මහ මුගලන් තෙරුන් දේශනා කළ කල්හි ද අසූ මහතෙරවරුන් දේශනා කළ කල්හි ද රහත් වූහ. මෙය පුදුමයක් නොවේ. ඒ ශ්‍රාවකයෝ මහා අභිඥා ලාභීහුය. මෑත කාලයෙහි ලංකාද්වීපයෙහි මලියදේව තෙරුන් වහන්සේ ලෝවාමහාප්‍රාසාදයෙහි මේ සූත්‍රය වදාළහ. එකල්හි ද භික්ෂූන් හැටක් රහත් වූහ. ලෝවාමහාප්‍රාසාදයේ යම්සේ ද තෙරුන් වහන්සේ එසේම මහා මණ්ඩපයෙහි ද මේ සූත්‍රය වදාළහ. මහා විහාරයෙන් නික්මී සෑගිරියට වැඩියාහ. එහි ද වදාළහ. එයින් ශාක්‍යවංශ විහාරයෙහි ද කූටාලි විහාරයේ ඇතුල් ගෙහි ද මුතියංගණයෙහි ද වාතක පර්වතයෙහි නැගෙනහිර ගෙහි ද දීඝවාපියෙහි ද ලෝකන්දරයේ ග්‍රාමමණ්ඩපයෙහි ද වදාළහ. ඒ ඒ ස්ථානයන්හි භික්ෂූන් හැට හැටනමක් බැගින් රහත් වූහ. එයින් නික්මී තෙරුන් වහන්සේ සිතුල්පව්වට වැඩියහ.

එකල්හි සිතුල්පව්ව විහාරයෙහි හැට වයස් වැඩි මහා තෙරුන් වහන්සේ මහා පොකුණෙහි කුරුවක තීර්ථ නම් වැසුණු ස්ථානයෙක් ඇත. එහි තෙරුන් ස්නානය කරන්නෙමියි බැස්සේ මලියදේව තෙරුන් ද උන්වහන්සේ ළඟට ගොස් ස්වාමීනි, ස්නානය කරවන්නෙහිද ඇසීහ. තෙරුන් වහන්සේ කථාවෙන් ම මලියදේව නම් රහත් කෙනෙක් ඇතැයි කියත්. මේ ඔහු වන්නේ යැයි දන නුඹ දේව දැයි ඇසීහ. එසේය ස්වාමීනි. ඇවත මට හැට වයස්ය. කිසිවෙකුට ශරීරය අතින් ස්පර්ශ කරන්නට නොලැබුණේය. නුඹ නාවවයි ගොඩ වී ඉවුරෙහි සිටියේය. තෙරුන් සියලු අත් පා ආදී පරිකර්ම කොට මහතෙරුන් නැහැවීය. එදවස බණ අසන දිනයක් වෙයි. ඉක්බිතිව මහතෙරුන් දේවය. අපට ධර්ම දානය දීමට වටියි යැයි කීහ. තෙරුන් ස්වාමීනි යහපතියි පිළිගත්තේය. ඉර බැසගත් කල්හි ධර්ම ශ්‍රවණය සඳහා ඝෝෂා කළහ. ඉක්මුණා වූ හැට වයස් ඇති මහතෙරවරුන් හැට නමක් ධර්ම ශ්‍රවණය පිණිස ගියාහ. දේව තෙරුන් පද කීමේ අවසානයේ දී මේ සූත්‍රය පටන් ගත්තේය. සූත්‍රය අවසානයේ මහතෙරවරුන් හැටනම රහත් වූහ. එයින් තිස්ස මහාවිහාරයට ගොස් වදාළහ. එහිදී ද තෙරවරුන් හැටනමක් රහත් වූහ. එයින් කැළණියට ගොස් නාගමහා විහාරයෙහි කාලකච්ඡ ගමෙහි වදාළහ. එහිදී ද තෙරවරුන් හැටනමක් රහත් වූහ. එයින් දහහතර වන දිනයෙහි යට ප්‍රාසාදයෙහි වදාළහ. එහිදී ද තෙරවරුන් හැටනමක් රහත් වූහ. පොහොය දවසෙහි මතු ප්‍රාසාදයෙහි වදාළහ. එහිදී ද තෙරවරුන් හැටනමක් රහත් වූහ. මෙසේ දේවතෙරුන් විසින් මේ සූත්‍රය දෙසන කල්හි හැට තැනක හැට

Scanned with CamScanner

හැටදෙනා බැගින් රහත් වූහ. අම්බිල විහාරයෙහි ත්‍රිපිටක චූළනාග තෙරුන් විසින් මේ සූත්‍රය කියන කල්හි මිනිස් පිරිස ගව්වක් විය. දෙව් පිරිස යොදුනක් විය. සූත්‍රය අවසානයේ දහසක් භික්ෂූහු රහත් වූහ. දෙවියන් අතරෙන් එක් අයෙක් පමණක් පෘථග්ජන විය.

ඡ ඡක්ක සූත්‍ර වර්ණනාව නිමි.

## 5.4.7

**එවමෙමසුතනති** මා විසින් මහාසළායතනික සූත්‍රය මෙසේ අසන ලදි. එහි **මහාසළායතනිකනති** මහත් ආයතන හයේ ප්‍රකාශ කරන ධර්ම පර්යායයි. **අජානනති** විදර්ශනාව සමඟ මාර්ගය නොදන්නේ. **උපචයං ගච්ඡනතිති** වැඩීමට යත්. වසඟයට යත් යන තේරුමයි. **කායිකාති** පංච ද්වාරයෙහි දූවෙන බවයි. **චෙතසිකාති** මනෝ ද්වාරයෙහි දූවෙන බවයි. **සනතාපාදිසුපි** මේ ක්‍රමයමයි. **කායසුඛනති** පංච ද්වාරයන්හි සැපය. **චෙතොසුඛනති** මනෝ ද්වාරයන්හි සැපය. මෙහි ද පංච ද්වාරික ජවන සිතින් පැමිණීම හෝ නැගිටීම හෝ නැත. ඉපදීම් මාත්‍රයක් ම වෙයි. මනෝ ද්වාරයෙන් සියල්ල ම වෙයි. මේ මාර්ගයෙන් නැගිටින ලද්දහුට ප්‍රත්‍ය වූ බලවත් විදර්ශනාවයි. එය මනෝ ද්වාරයෙන් ම වෙයි. **යථාභූතසසාති** කුසල සිත හා සම්පයුක්ත චිත්ත සැපයෙන් යුතු. **පුබ්බෙව ඛො පනසසාති** මේ භික්ෂුවගේ වාග් කර්මාන්ත ආජීවයන්ට පූර්වයෙහි සුද්ධිකා නම් මුලපටන් පිරිසිදු ම වෙත්. දෘෂ්ටි සංකල්ප වායාම සති සමාධි කියන ලද පංචාංග සියලු තැන්හි කරවන අංග නම් වෙත්. මෙසේ ලෝකෝත්තර මාර්ගය අංග අටකින් හෝ හතකින් හෝ වෙයි. විතණ්ඩවාදීහු වනාහි **යථාභූතසස දිට්ඨීති** මෙම සූත්‍ර ප්‍රදේශය ගෙන ලෝකෝත්තර මාර්ගය අංග පහකින් යුක්ත යැයි කියයි.

එය **එවමසසායං අරියො අට්ඨංගිකො මගෙගා භාවනා පාරිපූරිං ගච්ඡතීති** මේ අනතුරු වචනයෙන් ම වැළකිය යුතුය. මත්තෙහි මෙසේ හැඟවිය යුතුයි. ලෝකෝත්තර මාර්ගය පංචාංගික නම් නැත. මේ පහ සියලු තැන කාරාපකාංගයෝය. මාර්ග ක්ෂණයෙහි විරති වශයෙන් පුරත්. යමෙක් වාග් දුශ්චරිත හතරෙන් වැළකෙයි. මෙසේ කියන ලද විරති

අතුරෙන් මිථ්‍යා වචනය දුරු කරයි. සම්‍යක් වචනය වඩයි. මෙසේ සම්‍යක් වචනය වඩන පුද්ගලයාට මේ පංචාංගයෝ තොර නොවී විරතිය සමඟ ම සම්පූර්ණ වෙත්. සම්‍යක් කර්මාන්ත ආජීවයෙහි ද මේ ක්‍රමයයි. මෙසේ වාග් කර්මාදිය මුලපටන් පිරිසිදු වූයේ ම වටිත්. මෙසේ මේ කාරාපංගයෝ පහ විරති වශයෙන් සම්පූර්ණ වෙත්. පංචාංගික මාර්ගය නම් නැත. සුභද්ද සූත්‍රයෙහි මෙය කියන ලදි. සුභද්‍රයෙනි. යම් ධර්ම විනයෙක්හි ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි. වෙනත් නොයෙක් සියගණන් සූත්‍රවල අෂ්ඨාංගික මාර්ගය ආවේය.

**චත්තාරොපි සතිපට්ඨානාති** මාර්ගයෙන් සම්ප්‍රයුක්ත සතිපට්ඨාන හතරයි. සම්‍යක් ප්‍රධානාදියෙහි ද මේ ක්‍රමයයි. **යුගනද්ධාති** ඒ මොහොතෙහි යුගනන්ධයෝය. මොවුන්ගෙන් වෙනත් මොහොතෙහි සමාපත්තිය අනිකක් කෙරෙහි විදර්ශනාවය. මෙසේ නොයෙක් නොයෙක් ක්ෂණික වෙත්. ආර්ය මාර්ගයෙහි එක් ක්ෂණිකයයි. **විජ්ජා ච විමුත්ති චාති** අර්හත් මාර්ග විද්‍යාව ද ඵල විමුක්තිය ද වෙයි. ඉතිරිය සියලු තැන්හි ම ප්‍රකටය.

**මහාසළායතනික සූත්‍ර වර්ණනාව නිමි.**

## 5.4.8

**එවමෙමසුතන්ති** මා විසින් මෙසේ නගරවිඤෙය්‍ය සූත්‍රය අසන ලදි. එහි **සමවිසමං චරන්තීති** කලකින් සමව ද කලකින් විසමව ද හැසිරෙත්. **සමචරියම්පි හෙතන්ති** මෙය සමාන චරියාව ද වෙයි. **කෙ ආකාරාති** කුමන කාරණා ද? **කෙ අන්වයාති** කුමන බුද්ධීහු ද? **නත්ථි බො පන තත්ථාති** කුමක්හෙයින් කීයේ ද? කැළයෙහි නිල්තණ සපු වනාදීන්ගේ වශයෙන් ඉතා මනෝඥ රූපාදී පංච කාමගුණයන් ඇත්තේ නොවේ ද? නැත්තේ නොවෙයි. මෙය වනාහි වන ලැහැබක් සඳහා නොකියන ලදි. ස්ත්‍රී රූපාදිය සඳහා මෙය කියන ලදි. එය පුරුෂයාගේ සිත හාත්පසින් වැළඳගෙන ගෙන සිටිත්. යම්හෙයකින් කීය. මහණෙනි, මම මෙසේ පුරුෂයාගේ සිත හාත්පසින් ගෙන සිටින යම් ස්ත්‍රී රූපයක් වේ ද එබඳු වෙනත් එකම රූපයක්වත් නොදකිමි. මහණෙනි, මෙසේ ස්ත්‍රී රූපය

Scanned with CamScanner

පුරුෂයාගේ සිත හාත්පසින් ගෙන සිටියි. යනුවෙන් විස්තර කළ යුතුයි. ඉතිරිය සියලු තැන්හි ම ප්‍රකටය.

නගරවින්දෙය්‍ය සූත්‍ර වර්ණනාව නිමි.

# 5.4.9

**එවමෙමසුතනති** මා විසින් පිණ්ඩපාතපාරිසුද්ධි සූත්‍රය මෙසේ අසන ලදි. එහි **පටිසල්ලානාති** ඵල සමවතින් **විප්පසන්නානීති** අවකාශ වශයෙන් මෙය කියන ලදි. ඵල සමවතින් නැගිටින ලද්දහුගේ පංච ප්‍රාසාදයන්ගෙන් පිහිටන අවකාශය ප්‍රසන්න වෙයි. ඡවි වර්ණය පිරිසිදුය. එහෙයින් මෙසේ කීය. **සුඤ්ඤත විහාරෙනාති** ශූන්‍යතා ඵල සමාපත්ති විහරණයෙන්. **මහාපුරිස විහාරොති** බුදු පසේ බුදු මහාශ්‍රාවක මහා පුරුෂයන්ගේ විහරණයයි. **යෙනචාහං මගෙනාති** යනාදියෙහි විහාරයේ පටන් ගමේ ඉන්ද්‍රඛීලයට යම්තාක් ද මේ පිවිසෙන මාර්ගය නමි. ඇතුළු ගමට පිවිස පිළිවෙළින් හැසිර නුවර දොරින් නික්මීම යම්තාක් ද මේ චරිත ප්‍රදේශය නමි. පිටත ඉන්ද්‍රඛීලයේ පටන් විහාරය යම්තාක් ද මේ පටික්කන්ත මාර්ගය නමි. **පටිඝං වාපි චෙතසොති** සිතෙහි ඇනෙන කෙලෙස් ඉපදීමයි. කිසිවක් ඇත්තේ ද නැත්තේ ද? **අහොරත්තානුසික්ඛිනාති** දහවල් ද රාත්‍රියෙහි ද හික්මෙන්නා විසින්. **පහීනා නුඛො මෙ පඤ්චකාමගුණාති** යනාදියෙහි එක භික්ෂුවකගේ ප්‍රත්‍යවේක්ෂාව නොයෙක් ආකාරයයි. නොයෙක් භික්ෂූන්ගේ ප්‍රත්‍යවේක්ෂාව නොයෙක් ආකාරයි. කෙසේ ද? එක භික්ෂුවක් බතින් පසුකාලයේ පිණ්ඩපාතයෙන් වැළකුණේ පාසිවුරු තැන්පත් කොට විවේකී අවකාශයක සිටියේ ප්‍රත්‍යවේක්ෂා කරයි. මාගේ පංච කාමගුණයෝ ප්‍රහීන විද? ඔහු ප්‍රහීන නොවී යැයි දැන වීර්ය ගෙන අනාගාමී මාර්ගයෙන් පංච කාමගුණයන්ගේ රාගය විනාශ කොට මාර්ගයට අනතුරුව ඵලය ද ඵලයට අනතුරුව මාර්ගය ද එයින් නැගිට සිහිකරන්නේ ප්‍රහීන යැයි දැනගනියි.

නීවරණාදියෙහි ද මේ ක්‍රමයයි. මොවුන්ගේ රහත් මාර්ගයෙන් ප්‍රහීනාදිය වෙත්. මෙසේ එක් භික්ෂුවකගේ නොයෙක් ප්‍රත්‍යවේක්ෂණා වෙයි. මේ ප්‍රත්‍යවේක්ෂාවන්හි වෙනත් භික්ෂුවක් එකක් ප්‍රත්‍යවේක්ෂා කරයි.

තවෙකෙක් වෙනත් එකක් ප්‍රත්‍යවේක්‍ෂා කරයි. මෙසේ නොයෙක් භික්‍ෂූන්ගේ නොයෙක් ප්‍රත්‍යවේක්‍ෂණා වෙයි. ඉතිරිය සියලු තැන්හි ම ප්‍රකටය.

පිණ්ඩපාතපාරිසුද්ධි සූත්‍ර වර්ණනාව නිමි.

## 5.4.10

**එවමෙමසුතනති** මා විසින් ඉන්ද්‍රියභාවනා සූත්‍රය මෙසේ අසන ලදි. එහි **කජංගලායනති** මේ නම ඇති නියම් ගමෙහි. **මුබෙලුවනෙති** මුබේළු නම් ගස් වර්ගයකි. එයින් සැදුම් ලත් මහා වන ලැහැබකි. එහි වාසය කරති. **චකඛුනා රූපං න පසසති සොතෙන සදං න සුණාතීති** ඇසින් රූප නොදකිය යුතුය. කනින් ශබ්ද නොඇසිය යුතුය. මෙසේ දේශනා කළේය යන අදහසින් කියයි. **අඤඤථා අරියසස විනයෙති** මෙයින් බුදුරදුන් තමාගේ ශාසනයෙහි අසමාන වූ ඉන්ද්‍රිය භාවනාවක් කීම පිණිස කැමැති වූහ. එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙමේ බුදුරදුන්ගේ කැමැත්ත දක්වයි. එහෙයින් මම මේ පිරිසෙහි භික්‍ෂුසංඝයාට ඉන්ද්‍රිය භාවනා කථාව කරවමියි බුදුරදුන්ගෙන් ඉල්ලන්නේ එතස්ස භගවාති යනාදිය කීය.

එකල බුදුරදුන් ඉන්ද්‍රිය භාවනාව දෙසන්නාහු **තෙනහානනදාති** යනාදිය වදාළහ. එහි **යදිදං උපෙඛාති** යම් මේ විදර්ශනා උපේක්‍ෂාවක් නම් වේද? එය ශාන්තය. එය ප්‍රණීතය. තෘප්තිය නැත යන තේරුමයි. මෙසේ මේ භික්‍ෂුව චක්‍ෂුර් ද්වාරයෙහි රූපාරම්මණය ද ඉෂ්ට අරමුණෙහි මනාපය ද අනිෂ්ටයෙහි අමනාපය ද මධ්‍යස්ථයෙහි මනාප අමනාප දෙක ද ඔහුගේ සිත රැඳෙන්නට හෝ දූෂ්‍ය වෙන්නට හෝ මුළා වෙන්නට හෝ නොදී විශේෂයෙන් ගෙන විදර්ශනාව මධ්‍යස්ථ බවෙහි තබයි. **චකඛුමාති** පිරිසිදු ඇස් ඇති, ආබාධ ඇස් ඇත්තහුගේ ඉක්මන් නැති පියවීම් ඇරීම් වෙයි. එහෙයින් එය නොගන්නා ලදි. **ඊසක පණෙති** රියෙහි දණ්ඩ මෙන් නැගී සිටි කල්හි. **පටිකකුලෙ අපපටිකකුලසඤඤීති** යනාදියෙහි පිළිකුලෙහි මෛත්‍රීය පැතිරවීමෙන් හෝ ධාතු වශයෙන් උපසංහාරයෙන් හෝ අප්පටිකූල සංඥාවෙන් වාසය කරයි. අප්පටිකූලයෙහි අශුභය පැතිරවීමෙන් හෝ අනිත්‍යයෙන් හෝ උපසංහාරයෙන් හෝ පටිකකූල සංඥාවෙන් වාසය කරයි. සෙසු පදයන්හි ද මෙම ක්‍රමයයි.

**තදුභයං අභිනිවජ්ජෙත්වාති** මධ්‍යස්ථව වාසය කරනු කැමැත්තේ කුමක් කරන්නේ දැයි ඉෂ්ට අනිෂ්ටයන් හමු වූ කළ සතුටු ද නොවෙයි. දොම්නස් ද නොවෙයි. මෙය කියන ලදි. කෙසේ ද? **පටික්කූලෙ අප්පටික්කූලසඤ්ඤී විහරති** අනිෂ්ට වස්තුවෙක්හි මෛත්‍රියෙන් හෝ පතුරවයි. අනිත්‍ය වශයෙන් හෝ සංසිඳුවයි. මෙසේ අප්පටිකූලයෙහි පටික්කූල සංඥාවෙන් වාසය කරයි. **පටික්කූලෙ ච අප්පටික්කූලෙ ච අප්පටික්කූලසඤ්ඤී විහරති** අනිෂ්ට වස්තුවෙක්හි මෛත්‍රියෙන් හෝ පතුරවයි. ධාතු වශයෙන් හෝ සංසිඳුවයි. මෙසේ පටික්කූලයෙහි අප්පටිකූල සංඥාවෙන් වාසය කරයි. **අප්පටික්කූලෙ පටික්කූලසඤ්ඤී විහරති** ඉෂ්ට වස්තුවෙක්හි අශුභයෙන් හෝ පතුරවයි. අනිත්‍ය වශයෙන් හෝ සංසිඳුවයි. මෙසේ අප්පටිකූලයෙහි ද පටික්කූලයෙහි ද පටික්කූල සංඥාවෙන් වාසය කරයි.

කෙසේ ද? **පටික්කූලඤ්ච අප්පටික්කූලඤ්ච තදුභයං** නො ඇලී උපේක්ෂාවෙන් සිහි ඇතිව වාසය කරයි. මේ සසුනෙහි භික්ෂුව ඇසින් රූප දැක සතුටු නොවෙයි. අසතුටු ද නොවෙයි. උපේක්ෂාවෙන් සිහි ඇතිව වාසය කරයි. -පෙ- මනසින් ධර්මය දැන සතුටු නොවෙයි. අසතුටු ද නොවෙයි. උපේක්ෂාවෙන් සිහි ඇතිව වාසය කරයි. මෙසේ පටික්කූලයෙහි ද අප්පටිකූලයෙහි ද මධ්‍යස්ථව වාසය කිරීමට කැමැතිව නො ඇලී සිහි ඇතිව උපේක්ෂාවෙන් වාසය කරයි. මේ තුන් ක්‍රමයන්හි පළමු ක්‍රමයෙහි මනාපය අමනාපය මනාපාමනාපය යි කෙලෙස් වටියි. කෙලෙස් නැති බව ද වටියි. දෙවන ක්‍රමයෙහි කෙලෙස් ද තුන්වන ක්‍රමයෙහි කෙලෙස් ද නිකෙලෙස් ද වටියි. නැවත කියන ලදි. පළමු කෙලෙස් වටියි. දෙවැනි කෙලෙස් ද නිකෙලෙස් ද තුන්වැනි නිකෙලෙස් ම වටියි. ඉතිරිය සියලු තැන්හි ම ප්‍රකටය.

**ඉන්ද්‍රියභාවනා සූත්‍ර වර්ණනාව නිමි.**

**පස්වන සළායතන වර්ගය සමාප්තයි.**

**උපරිපණ්ණාසකය නිමියේය.**